පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ
භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා
http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# දීඝ නිකාය

## 3

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පෑලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රීසුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ සංඝරාජ විහාරස්ථ ශික්ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විශුද්ධාලොක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්‍ය්‍ය ආර්‍ය්‍යරත්න රේරුකාන මහතා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# දීඝ නිකාය

# 3

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.
http://pitaka.lk

පටුන



ප්‍රථම මුද්‍රණය - 1953
දෙවැනි මුද්‍රණය - 2012

**ත්‍රිපිටකය**

**දීඝ නිකාය** 3

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
ගොඩගේ පොත් මැඳුර

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.
http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2012 සැප්තැම්බර්.

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


| | පිට |
|---|---|
| 22. මහා සතිපට්ඨාන සූත්‍රය | 909 |
| 23. පායාසි සූත්‍රය | 948 |
| 24. පාථික සූත්‍රය | 996 |
| 25. උදුම්බරික සීහනාද සූත්‍රය | 1036 |
| 26. චක්කවත්ති සීහනාද සූත්‍රය | 1064 |
| 27. අග්ගඤ්ඤ සූත්‍රය | 1087 |
| 28. සම්පසාදනීය සූත්‍රය | 1113 |
| 29. පාසාදික සූත්‍රය | 1134 |
| 30. ලක්ඛණ සූත්‍රය | 1171 |
| 31. සිගාලක සූත්‍රය | 1211 |
| 32. ආටානාටිය සූත්‍රය | 1225 |
| 33. සංගීති සූත්‍රය | 1249 |
| 34. දසුත්තර සූත්‍රය | 1330 |

# සංඥාපනය

සිංහල ත්‍රිපිටක ධර්ම පොත් පෙළේ තුන්වෙනි පොතෙන් දීඝනිකාය අවසාන කෙළෙමු. මීලඟට ප්‍රසිද්ධ කරන්නේ මජ්ඣිම නිකායයි. මේ පොත් පිළියෙළ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා බොහෝ හිතවත් ලෙස ආධාර දීම ප්‍රීතියට කාරණයක් වේ. අපේ බලාපොරොත්තුව ත්‍රිපිටක ධර්ම පොත් සිංහලෙන් ලියා බුද්ධ වර්ෂ 2500 වර්ෂයට ප්‍රථම අච්චුගස්වා ප්‍රසිද්ධ කිරීම වේ.

ත්‍රිපිටක ධර්මය සම්පූර්ණයෙන් කියවා තිබෙන එකම උපාසිකාවක් හෝ උපාසකයෙක් අද්දින ලංකාවේ නොසිටීම මෙරට බෞද්ධයින්ට අවනම්බුවක් බව මතක් කරමු. මේ පොත් ප්‍රසිද්ධ කර අවසාන වූ කල දාස් ගණන් ගෑනු පිරිමි ළමයින්ට පවා ත්‍රිපිටක ධර්මය විවේකව කියවීමට ඉඩ ලැබීම ගැන සැකයක් නැත.

මේ පොත් පෙළේ මත භේද ඇති තැන් දක්වා එවීමෙන් ඒ මත උපග්‍රන්ථයට ඇතුලත් කිරීමට ඉඩ ලබාදීම ධර්ම ප්‍රචාරයට කරණ සේවයක් බව මතක් කරමු.

බොහෝ වැඩ කටයුතුවලයෙදී සිටින කාලයක තමන්ට වැඩි සනීපයක් නැතුව සිටි නමුත් ඒ හිරිහැර ගැන කිසිසේත් නොසලකා ශාසන ආලයෙන් ආචාර්ය්‍ය ආර්ය්‍යරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාරය මහත් බව දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආර්ය්‍යරත්න රේරුකාන මහත්මයාගේ ආධාර ලැබුනා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර නායක ස්ථවිරයන් වහන්සේද, බද්දේගම පණ්ඩිත විමලවංස ස්ථවිරයන් වහන්සේද, බලපිටියේ පණ්ඩිත විසුද්ධාලොක ස්ථවිරයන් වහන්සේද, අහුන්ගල්ලේ පණ්ඩිත විමලකීර්ති තිස්ස නායක ස්ථවිරයන් වහන්සේද, පින්කන්දේ පණ්ඩිත පඤ්ඤාවාස ස්ථවිරයන් වහන්සේද, තලල්ලේ පණ්ඩිත ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේද, කෝන්ගල ධීරාලන්කාර ස්වාමින් වහන්සේද ආධාර කළෝය.

ශොධ්‍ය පත්‍ර බැලීමාදියෙන් උපකාර කළ ගුණපාල වීරසේකර මහත්මයාටද, අමරදාස පියසිරි මහත්මයාටද, සෝමා සේනානායක මහත්මියටද, ආර්ය්‍යවතී පෙරේරා මහත්මියටද, අපේ අවංක ස්තුතිය සඳහන් කරමු.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත්, බෞද්ධ උපාසක පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

474- ගාලු පාර, කොල්ලුපිටිය

1-3-53

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# දීඝ නිකාය
## (තුන්වැනි කොටස)

---

### 22. මහා සතිපට්ඨාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුරු ජනපදයෙහි කල්මාසදම්‍ය නම්වූ කුරු රට වැස්සන්ගේ නියම් ගම වාසය කළාහුය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට, "මහණෙනියි" කථා කළෝය. භික්ෂූහු "ස්වාමින් වහන්ස,"යි භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ දේශනා කළාහුය.

මහණෙනි, යම් මේ සතර සතිපට්ඨාන ධර්මකෙනෙක් ඇද්ද ඒ සතර සතිපට්ඨාන ධර්මයෝ සත්වයන්ගේ පිරිසිදුවීම පිණිසද, සෝක කිරීමය, වැළපීමය යනාදීන්ගේ ඉක්මවීම පිණිසද, කයෙහි හටගන්නා දුක්ය, සිතෙහි හටගන්නා දුක්ය යන මොවුන්ගේ දුරලීම පිණිසද ඥාය නම් ලද ආර්ය මාර්ගයට පැමිණීම පිණිසද, නිර්වාණය අවබොධ කිරීම පිණිසද එකම මාර්ගය වන්නේයයි" දේශනා කළාහුය.

ඒ සතර (සතිපට්ඨාන ධර්මයෝ) කවරහුදයත්? මහණෙනි, මේ සස්නෙහි මහණ තෙම කෙලෙස් තවන වීර්යය ඇතුව යහපත් ප්‍රඥා ඇතුව, සිහියෙන් යුක්තව මේ ශරීරයෙහි, ලෝභයද ක්‍රෝධයද සංසිඳුවා ගෙන, මේ ශරීරයෙහි ශරීරය අනුව දක්නා ස්වභාව ඇතිව වාසය කෙරේද, කෙලෙස් තවන වීර්යය ඇතුව යහපත් ප්‍රඥා ඇතුව සිහි ඇතුව විඳීම් රාශියෙහි, ලෝභය, හා දොම්නස (ක්‍රෝධය) සංසිඳුවාගෙන විඳීම් කෙරෙහි විඳීම් අනුව දක්නා ස්වභාව ඇතිව වාසය කෙරේද, කෙලෙසුන් තවන වීර්යය ඇත්තේ යහපත් ප්‍රඥා ඇතුව සිහි ඇතුව සිත් සමනයෙහි ලෝභය හා දොම්නස (ක්‍රොධය) සංසිඳුවාගෙන සිත් කෙරෙහි සිත් අනුව

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

දක්නා ස්වභාව ඇතිව වාසය කෙරේද, කෙලෙසුන් තවන වීර්යය ඇතිව, සිහි ඇතිව, යහපත් ප්‍රඥා ඇතිව, නීවරණාදි ධර්ම රාශියෙහි ලෝභය හා දොම්නස (ක්‍රොධය) සංසිඳුවා ගෙන ධර්මයන් කෙරෙහි ධර්ම අනුව සිහි කරමින් වාසය කරන්නේය. (මේ සතර සතිපට්ඨාන ධර්මයෝ නම් වෙත්.)

**2.** මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් කයෙහි කය අනුව බලමින් වාසය කරන්නේදයත්, මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම කැලයකට ගියේ හෝ ගසක් මුලකට ගියේ හෝ, හිස් ගෙයකට ගියේ හෝ, පර්යංකය බැඳ (අරමිනිය ගොතා ගෙන) ශරීරය කෙළින් පිහිටුවා ගෙන සිහිය ඉදිරිපත් කොට තබා ගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආශ්වාස කරන්නේය, සිහියෙන්ම ප්‍රශ්වාස කරන්නේය, දීර්ඝ කොට (කල්ගනිමින්-හෙමින් හෙමින්) ආශ්වාස කරන්නේ හෝ 'දීර්ඝ කොට (කල් ගනිමින්) ආශ්වාස කරන්නෙමි'යි දන්නේය. දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නේ හෝ දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නෙමියි' දන්නේය. ලුහුඬු කොට (ඉක්මනින්) ආශ්වාස කරන්නේ හෝ 'ලුහුඬුකොට ආශ්වාස කරන්නෙමියි' දන්නේය. ලුහුඬු කොට ප්‍රශ්වාස කරන්නේ හෝ 'ලුහුඬු කොට ප්‍රශ්වාස කරන්නෙමියි' දන්නේය. මුල මැද අග යන සියලු ආශ්වාසය ප්‍රකට කරගන්නෙමියි යන අදහසින් 'ආශ්වාස කරන්නෙමියි' පුරුදු කරන්නේය. මුල මැද අග යන සියලු ප්‍රශ්වාසය දැන ප්‍රකට කරගන්නෙමියි යන අදහසින් ප්‍රශ්වාස කරන්නෙමියි' පුරුදු කරගන්නේය. ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි' පුරුදු කරන්නේය. ආශ්වාස ප්‍රශ්වාස සංසිඳුවමි යන අදහසින් ප්‍රශ්වාස කරන්නෙමියි පුරුදු කරන්නේය.

මහණෙනි, දක්ෂවූ ලියන වඩුවෙක් හෝ වඩුවෙකුගේ අත වැස්සෙක් හෝ දික් කොට අදින්නේ හෝ, 'දික් කොට අදිනෙමියි' කියා යම්සේ දනීද, ලුහුඬුව අදින්නේ හෝ එසේ ලුහුඬු කොට අදිනෙමියි කියා යම්සේ දනීද, එපරිද්දෙන්ම මහණෙනි, මහණ තෙමේ දීර්ඝ කොට ආශ්වාස කරන්නේ හෝ 'දීර්ඝ කොට

ආශ්වාස කරන්නෙමියි' දන්නේය. දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නේ හෝ 'දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නෙමියි' දන්නේය. ලුහුඬු කොට ආශ්වාස කරන්නේ හෝ 'ලුහුඬුකොට ආශ්වාස කරන්නෙමියි' දන්නේය. ලුහුඬුකොට ප්‍රශ්වාස කරන්නේ හෝ 'ලුහුඬු කොට ප්‍රශ්වාස කරන්නෙමියි' දනියි. මුල මැද අග යන සියලු ආශ්වාස ප්‍රශ්වාස දැනගනිමියි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි පුරුදු කරන්නේය. මුල මැද අග යන සියලු ප්‍රශ්වාස දැනගනිමි යන අදහසින් ප්‍රශ්වාස කරන්නෙමියි' පුරුදු කරන්නේය. ආශ්වාස ප්‍රශ්වාස සංසිඳුවමි යන අදහසින් 'ආශ්වාස කරන්නෙමියි' පුරුදු කරන්නේය. සියලු ආශ්වාස ප්‍රශ්වාස සංසිඳුවමි යන අදහසින් 'ප්‍රශ්වාස කරන්නෙමියි' පුරුදු කරන්නේය.

මෙසේ තමාගේ (ආශ්වාස ප්‍රශ්වාස) ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ, ආශ්වාස ප්‍රශ්වාස ශරීරයෙහි හෝ (ආශ්වාස ප්‍රශ්වාස) ශරීරය අනුව නුවණින් බලමින් වාසය කරන්නේය. අනුන්ගේ, හා තමන්ගේ (ආශ්වාස ප්‍රශ්වාස) ශරීරයෙහි හෝ (ආශ්වාස ප්‍රශ්වාස) ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ හටගැනීම බලමින් හෝ වාසය කරන්නේය. ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ නැතිවීම බලමින් හෝ වාසය කරන්නේය. කලෙක හටගැනීම කලෙක විනාශය බලමින් හෝ වාසය කරන්නේය. ඥානයේ වැඩීම පිණිසද සිහියේ වැඩීම පිණිසද පවතී. ආශ්වාස ප්‍රශ්වාස දෙකම ඇත්තේය. (එයින් පිටත් සත්වයෙක් පුද්ගලයෙක් නැත්තේයයි) මනාකොට සිහිය පිහිටියේ වෙයි. තණ්හා දෘෂ්ටියෙන් දුරුව වසන්නේද වේ. එහෙයින් සත්ව ලෝකයෙහි, කිසි රූපාදියක් (ආත්මාදි වශයෙන්) නොගන්නේය. මහණෙනි, මෙසේද මහණ තෙම ශරීරයෙහි, ශරීරය අනුව බලමින් වාසය කරන්නේය."

3. "මහණෙනි, නැවතද මහණ තෙම යන්නේ හෝ 'යන්නෙමියි' දන්නේය. සිටියේ හෝ 'සිටියෙමියි' දන්නේය. හුන්නේ හෝ 'හුන්නෙමියි' දන්නේය. ශයනය කරන්නේ හෝ 'සයනය කරන්නෙමියි' දන්නේය. ඔහුගේ කය වනාහි යම් යම්

ඉරියව්වකින් පිහිටුවන ලදද ඒ ඒ ආකාරයෙන් දන්නේය. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි හටගන්නා ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. කලෙක ශරීරයෙහි හටගන්නා ස්වභාව හා කලෙක විනාශ වීම් ස්වභාව දක්නේ හෝ වාසය කරන්නේය. ඒ භික්ෂුවට වනාහි (සත්වයෙක් පුද්ගලයෙක් නොවූ) ශරීර ඉරියව් පමණක් ඇත්තේය කියා සිහිය එළඹ සිටියේ වේද එය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද වෙයි. තණ්හා දෘෂ්ටියෙන් (දුරුව) වාසය කරන්නේය. මේ සත්ව ලෝකයෙහි කිසි රූපාදියක් (ආත්මාදි වශයෙන්) නොගනියි. මහණෙනි, භික්ෂු තෙම මෙසේද ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

4. 'මහණෙනි, නැවතද මහණ තෙමේ ඉදිරියට යාමෙහිද ආපසු ඊමෙහිද සිහියෙන් දැන කරන්නේ වෙයි. ඉදිරිපිට බැලීමෙහිද සරස බැලීමෙහිද ප්‍රඥාවෙන් දැන කරන්නේ වෙයි. අත්පා හැකිළීමෙහිද දිගු කිරීමෙහිද ප්‍රඥාවෙන් දැන කරන්නේය. පාත්‍රා, දෙපට සිවුරු, තනිපට සිව්රු දැරීමෙහිද ප්‍රඥාවෙන් දැන දරන්නේය. අනුභව කිරීමෙහිද පානය කිරීමෙහිද, කඩා කෑමෙහිද රස බැලීමෙහිද නුවණින් දැන කරන්නේය. මලමුත්‍ර පහ කිරීමෙහිද නුවණින් දැන කරන්නේය. යාමෙහිද, සිටීමෙහිද, හිඳීමෙහිද, නිදීමෙහිද, නිදි දුරු කිරීමෙහිද, කථා කිරීමෙහිද, කථා නොකිරීමෙහිද, ප්‍රඥාවෙන් දැන ඒ ඒ කෘත්‍ය පවත්වන්නේ මෙසේ තමාගේ ශරීරයෙහි හෝ කය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ කය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ කය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම බලමින් හෝ වාසය කරන්නේය. විනාශය බලමින් හෝ වාසය කරන්නේය. කලෙක ඉපදීම, කලෙක නැතිවීම බලමින් හෝ වාසය කරන්නේය. මේ යොගාවචරයාහට වනාහි සත්වයෙක්

පුද්ගලයෙක් නොවූ කය පමණක් ඇත්තේයයි සිහිය එළඹ සිටියේවේද, (ඒ සිහිය) ඥානයාගේ වෘද්ධිය පිණිසද, සිහිය වැඩීම පිණිසද වෙයි. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙනාගෙන් දුරුවද වාසය කරන්නේය. ශරීර ලෝකයෙහි කිසිවක් ආත්ම වශයෙන් නොගන්නේය. මහණෙනි, භික්ෂූව මෙසේද මේ කයෙහි කය අනුව බලමින් වාසය කරන්නේය.

5. නැවතද මහණෙනි, යොගාවචරතෙම පාදාන්තයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට සම කෙළවර කොට ඇති නානාවිධ අසුචියෙන් පිරීසිටි මේ ශරීරයම සිහි කරන්නේය. (කෙසේද යත්) මේ ශරීරයෙහි හිසකෙස්ය, ලොම්ය, නියපොතුය, දෙතිස් දත්ය, හමය, මස් පිඩුය, නහරය, ඇටය, ඇටමිදුලුය, වකුගඩුවය, අක්මාවය, හෘදයමාංසය, දළබුවය, බඩදිවය, පෙණහැලිය, බඩවැලය, අතුණුබහණය නොදිරූ අහාරය, මලය, හිස් මොලය, පිතය, සෙමය, සැරවය, ලෙහෙය, ඩහදියය, මේද තෙලය, කඳුලුය, වුරුණු තෙලය, කෙලය, සොටුය, සඳ මිදුලුය, මුත්‍රය, (යනමේ කුණපයෝ) ඇත්තාහ. මහණෙනි, නොයෙක් ආකාරවූ ධාන්‍යයන්ගෙන් පුරවනලද උඩ යට දෙපැත්තෙන් කටවල් දෙකක් ඇති මල්ලක් වේද, කිනම් ධාන්‍යවලින් යුත් මල්ලක්දයත්? හැල්වීය, මහවීය, මුංය, මෑය, තලය, සහල්ය, (යනමේ ධාන්‍යවලිනි) ඇස් ඇති පුරුෂයෙක් ඒ ධාන්‍ය පිරූ මල්ල (මුදා) ලිහා මේ හැල්ය, මේ මහවීය, මේ මුංය, මේ මෑය, මේ තලය, මේ සහල්යයි යම්සේ මෙනෙහි කරන්නේද, එපරිද්දෙන්ම මහණෙනි, යොගාවචර තෙම පාදයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට සම කෙළවර කොට ඇති නොයෙක් ආකාර අසුචි වලින් පිරුණාවූ මේ ශරීරයම සිහි කරන්නේය. ඒ කෙසේදයත්. නියපොතුය, දත්ය, සමය මස්පිඩුය, නහරය, ඇටය, ඇටමිදුළුය, වකුගඩුය, හෘදය. මාංසය, අක්මාව, සැරවය, දළබුවය, බඩදිවය, පෙණහැලිය, අතුණුය, අතුණු බහණය, නොපැසුණු ආහාරය, මලය, හිස්මොළය, පිතය, සෙමය, සැරවය, ලේය, ඩහදියය, මේද තෙලය, කඳුළුය, වුරුණු තෙලය, කෙළය, සොටුය, සඳමිදුලුය, මුත්‍රය (යන මේ කුණපයෝ) මේ ශරීරයෙහි ඇත්තාහ. කියායි. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින්

වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඉපදීම් ස්වභාවය බලමින් හෝ වාසය කරන්නේය. ශරීරයෙහි විනාශවීම් ස්වභාවය අනුව බලමින් හෝ වාසය කරන්නේය, කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාව හා කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාව හෝ අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්ව පුද්ගල වශයෙන් නොව) ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටුවන ලද්දේය. ඒ සිහිය ඥාණයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී. කෙලෙස් කරණ කොට කිසිවක් ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය, මේ ලෝකයෙහි කිසිවක් ආත්මාදි වශයෙන් නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

**6.** මහණෙනි, නැවතද භික්ෂුව මේ ශරීරය යම්සේ සිටියේද යම්සේ පිහිටුවන ලදද, එසේ ධාතු වශයෙන් සිහි කරන්නේය. මේ ශරීරයෙහි පෘථිවිධාතුය, (තදගතිය) ආපෝ ධාතුය, (දියවන ගතිය) තේජෝ ධාතුය, (උණු ගතිය) වායො ධාතුය, (විහිදෙන ගතිය) (යන ධාතූහු) ඇත්තේය කියායි.

මහණෙනි, දක්ෂවූ ගවයන් මරන්නෙක් හෝ, ගවයන් මරන්නෙකුගේ අතවැසියෙක් හෝ ගවයෙකු මරා සතර මං සන්ධියෙක්හි කොටස් වශයෙන් වෙන් වෙන් කොට බෙදා යම්සේ උන්නේද, එපරිද්දෙන්ම මහණෙනි, භික්ෂුව මේ ශරීරය යම්සේ සිටියේද යම්සේ පිහිටුවන ලදද, එසේ ධාතු වශයෙන් සිහිකරන්නේය. කෙසේදයත්, මේ ශරීරයෙහි පඨවි ධාතුය, අපෝ ධාතුය, තෙජො ධාතුය, වායොධාතුය, (යනමේ ධාතූහු) ඇතැයි කියායි. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයාගේ ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කරන්නේය. ශරීරයාගේ නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්ව පුද්ගල වශයෙන් නොව) ධාතු මාත්‍රව ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටුවන ලද්දේය. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. කෙලෙස් කරණ කොට කිසිවක් ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය. ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

7 මහණෙනි, නැවතද භික්ෂුව මැරී එක දවසක් ගියාවූ හෝ දෙදවසක් ගියාවූ හෝ තුන්දවසක් ගියාවූ හෝ ඉදිමුනාවූ නිල්වූ (පූයා) සැරව වැගිරෙන්නාවූ සොහොනෙහි දමනලද මළ මිනියක් යම්සේ දකින්නේද ඒ භික්ෂුව තම ශරීරයම නුවණින් බලන්නේය. කෙසේද මේ ශරීරය මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳුවූ ස්වභාවයට පැමිණෙන්නේය. මෙබඳුවූ ස්වභාව නොයික්ම සිටියේය කියායි. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය, අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම ස්වභාවය දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාවය දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාව හා කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්ව පුද්ගල නොව) ශරීරය පමණක් ඇත්තේය යන සිහිය පිහිටුවන ලද්දීය. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී. කෙලෙස් කරණකොට කිසිවක් ආශ්‍රයකොට නොගෙන වාසය කරන්නේය. ලෝකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි,

භික්ෂුව මෙසේද ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

8. මහණෙනි, නැවතද භික්ෂුව කවුඩන් විසින් කඩාගනු ලබන්නාවූ හෝ උකුසන් විසින් කඩාකනු ලබන්නාවූ හෝ ගිජු ලිහිණියන් විසින් කඩා කනු ලබන්නාවූ හෝ බල්ලන් විසින් කඩා කනු ලබන්නාවූ හෝ හිවලුන් විසින් කඩා කනු ලබන්නාවූ හෝ නොයෙක් සතුන් විසින් කඩා කනු ලබන්නාවූ හෝ අමු සොහොනෙහි දමනලද මළ මිනියක් යම්සේ දක්නේද ඒ භික්ෂුව විසින් තමාගේ ශරීරයම නුවණින් බලන්නේය. කෙසේදයත් මේ ශරීරයද මෙබඳුවූ ස්වභාව ඇත්තේය. මෙබඳුවූ ස්වභාවයට පැමිණෙන්නේය. මෙබඳුවූ ස්වභාවය නොයික්ම සිටියේය කීයාය. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසයකරන්නේය. තමාගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසයකරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුවබලමින් වාසයකරන්නේය. කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාව හා කලෙක ශරීරයෙහි විනාසවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්වයෙක් පුද්ගලයෙක් නොව) ශරීරය පමණක් ඇත්තේය යන සිහිය මනා කොට පිහිටුවන ලද්දීය. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී. කෙලෙසුන් කරණකොට කිසිවක් ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනියි. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

9. මහණෙනි, නැවතද භික්ෂුව ලේ මස් සහිතවූ නහර වලින් බැඳුන ඇට සැකිල්ලක්වූ සොහොනෙහි දමනලද මළමිනියක් යම්සේ දක්නේ වේද ඒ භික්ෂුව මේ ශරීරයම නුවණින් බලන්නේය. මේ (මගේ) ශරීරයද මෙබඳු ස්වභාව

ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොඉක්මවන ලද්දේය කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාව ද කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාවද දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්ව පුද්ගල නොව) ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටුවන ලද්දීය.

ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. කෙලෙස් කරණකොට කිසිවක් ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනියි. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

මහණෙනි, නැවතද භික්ෂුව මස් නැති ලෙයින් වැකුණු නහරින් බැඳුන ඇට සැකිල්ලක්වූ සොහොනෙහි දමනලද මළ මිනියක් යම්සේ දක්නේද, ඒ භික්ෂුව මේ (තම) ශරීරයම නුවණින් බලන්නේය. මේ (මාගේ) ශරීරයද මෙබඳු ස්වභාව පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොයික්මවන ලද්දේය කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්ව පුද්ගල නොව) ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටුවන ලද්දීය. ඒ සිහිය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. කෙලෙස් කරණකොට කිසිවක් ආශ්‍රයකොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරනනේය.

මහණෙනි, නැවතද භික්ෂුව මස්, ලේ දෙකින් පහවූ නහරින් බැඳුන ඇට සැකිල්ලක්වූ සොහොනෙහි දමනලද මළමිනියක් යම්සේ දක්නේද, ඒ භික්ෂුව මේ (තම) ශරීරයම නුවණින් බලන්නේය. මේ (මාගේ) ශරීරයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොඉක්මවන ලද්දේය කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාව ද කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාවද දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්ව පුද්ගල නොව) ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටුවන ලද්දීය. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. කෙලෙස් කරණකොට කිසිවක් ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

මහණෙනි, නැවතද භික්ෂුව නහර බැඳුම්වලින් වෙන්වූදිශා අනුදිශාවන්හි විසුරුණු ඇට කැබලිද, වෙන දිශාවක විසුරුණු පාඇටද, වෙන දිශාවක විසුරුණු කෙණ්ඩා ඇටද, වෙන දිශාවක විසුරුණු කලවා ඇටද, වෙන දිශාවක විසුරුණු කටි ඇටද, වෙනදිශාවක විසුරුණු පිටකටුද, වෙනදිශාවක විසුරුණු

හිස්කැබලිද ඇතිව සොහොනෙහි දමනලද මළමිනිය යම්සේ දකීද, ඒ භික්ෂුව (තම) ශරීරයම නුවණින් බලන්නේය. මේ (මාගේ) ශරීරයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොඉක්මවන ලද්දේය. කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාවද කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාවද දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්ව පුද්ගල නොව) ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටුවන ලද්දේය. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. කෙලෙස් කරණකොට කිසිවක් ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය.

මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

10. මහණෙනි, නැවතද භික්ෂුව සක්ගෙඩියක, පාටට සමාන ස්වභාව ඇති සුදුවූ ඇට ඇත්තාවූ සොහොනෙහි දමන ලද මළ මිනියක් යම්සේ දක්නේද, ඒ භික්ෂුව (තම) ශරීරයම නුවණින් බලන්නේය. මේ (මාගේ) ශරීරයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොඉක්මවන ලද්දේය කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි හටගන්නා ස්වභාවය දක්නේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාවය දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාවද කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාවද දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්ව පුද්ගල නොව) ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටුවන ලද්දීය. ඒ සිහිය ඥාණයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී. කෙලෙස් කරණකොට කිසිවක් ආශ්‍රයකොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

මහණෙනි, නැවතද භික්ෂුව අවුරුදු ගණන් ඉක්මගිය ඇට ගොඩක්වූ සොහොනෙහි දමනලද මළ මිනියක් යම්සේ දක්නේද, ඒ භික්ෂුව (තම) ශරීරයම නුවණින් බලන්නේය. මේ (මාගේ) ශරීරයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොඉක්මවන ලද්දේය කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාව දන්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්ව පුද්ගල නොව) ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටුවන ලද්දීය. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. කෙලෙස් කරණකොට කිසිවක් ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය. මේ ලෝකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

මහණෙනි, නැවතද භික්ෂුව කුණුවූ, සුණුවූ ඇට කැබලිවලට පැමිණි සොහොනෙහි දමනලද මළමිනියක් යම්සේ දක්නේද,

ඒ භික්ෂුව (තම) ශරීරයම නුවණින් බලන්නේය. මේ (මාගේ) ශරීරයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොඉක්මවන ලද්දේය කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය, අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාව හා කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්ව පුද්ගල නොව) ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටුවන ලද්දීය. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී. කෙලෙස් කරණකොට කිසිවක් ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

11. මහණෙනි, භික්ෂුව විඳීම් කෙරෙහි විඳීම් අනුව බලමින් කෙසේ වාසය කරන්නේද? මහණෙනි, මේ සස්නෙහි භික්ෂුව සැප වෙදනාවක් විඳින්නේ, සැප වේදනාවක් විඳිමියි දැනගනී. දුක් වේදනාවක් විඳින්නේ, දුක් වේදනාවක් විඳිමියි දැනගනී. දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවක් විඳින්නේ දුක්ද නොවූ, සැපද නොවූ වේදනාවක් විඳිමියි දැනගනී. කාමාසාවන් පිළිබඳවූ සැප වේදනාවක් විඳින්නේ හෝ කාමාසාවන් පිළිබඳවූ සැප වේදනාවක් විඳිමියි දැනගනී. කාමාසාවන් පිළිබඳ නොවූ සැප වේදනාවක් විඳින්නේ හෝ කාමාසාවන් පිළිබඳ නොවූ සැප වේදනාවක් විඳිමියි දැනගනී. කාමාසාවන් පිළිබඳවූ දුක් වේදනාවක් විඳින්නේ හෝ කාමාසාවන් පිළිබඳවූ දුක් වේදනාවක් විඳිමියි දැනගනී. කාමාසාවන් පිළිබඳ නොවූ දුක් වේදනාවක්

විඳින්නේ හෝ කාමාසාවන් පිළිබඳ නොවූ දුක් වේදනාවක් විඳිමියි දැනගනී. කාමාසාවන් පිළිබඳවූ දුක්ද නොවූ සැපද නොවූ (උපෙක්ෂා) වෙදනාවක් විඳින්නේ හෝ කාමාසාවන් පිළිබඳවූ දුක්ද නොවූ සැපද නොවූ වේදනාවක් විඳිමියි දැනගනී. කාමාසාවන් පිළිබඳ නොවන දුක්ද නොවූ සැපද නොවූ වේදනාවක් විඳින්නේ හෝ කාමාසාවන් පිළිබඳ නොවන දුක්ද නොවූ සැපද නොවූ වේදනාවක් විඳිමියි දැනගනී. මෙසේ තමන්ගේ විඳීම් කෙරෙහි හෝ විඳීම් අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ විඳීම් කෙරෙහි හෝ විඳිම්, අනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ විඳීම් කෙරෙහි හෝ විඳීම් අනුව බලමින් වාසය කරන්නේය. වෙදනාවන්හි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ වෙදනාව අනුව බලමින් වාසය කරන්නේය. වෙදනාවන්හි නැතිවීම් ස්වභාව දක්නේ හෝ වෙදනාව අනුව බලමින් වාසය කරන්නේය. කලෙක වෙදනාවන්හි ඇතිවීම් ස්වභාව හා කලෙක වෙදනාවන්හි නැතිවීම් ස්වභාව දක්නේ හෝ වෙදනාව අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්ව පුද්ගල නොව) වෙදනා (විඳීම්) ඇත්තේය යන සිහිය හොඳින් පිහිටුවන ලද්දීය. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. කෙලෙස් කරණ කොට කිසිවක් ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද විඳීම් කෙරෙහි විඳීම් අනුව බලමින් වාසය කරන්නේය.

මහණෙනි, භික්ෂුව කෙසේනම් සිතෙහිසිත අනුව බලමින් වාසය කෙරේද යත්? මහණෙනි මේ ශාසනයෙහි භික්ෂුතෙමේ සරාග (අටවැදෑරුම් ලොභ සහගත) සිත හෝ රාග සහිත සිතයයි දැනගනී. වීතරාග (ලෞකික කුසල් විපාක ක්‍රියා) සිත හෝ වීතරාග සිතයයි දැනගනී. සදොස (දෙවදෑරුම් දොසමූල) සිත හෝ සදොස සිතයයි දැනගනී. වීතදොස (ලෞකික කුසල් විපාක ක්‍රියා) සිත හෝ වීතදොස සිතයයි දැනගනී. සමොහ (දෙවැදෑරුම් මෝහමූලවූ හෝ දෙළොස් අකුසල්වූ හෝ) සිත සමොහ සිතයයි දැනගනී වීතමොහ (ලෞකික කුසල් විපාක ක්‍රියා) සිත හෝ

වීත මොහ සිතයයි දැනගනී. සංඛිත්ත (ථීනමිද්ධයන් - චිත්ත චෛතසිකයන්ගේ ගිලන් ස්වභාවය - හා යෙදුණ) සිත හෝ සංඛිත්ත සිතයයි දැනගනී. වික්ඛිත්ත (උද්ධච්චය-සිතේ විසිරයාම - හා යෙදුණ) සිත හෝ වික්ඛිත්ත සිතයයි දැනගනී. මහග්ගත (රූපාවචර අරූපාවචර) සිත හෝ මහග්ගත සිතයයි දැනගනී. අමහග්ගත (කාමාවචර) සිත හෝ අමහග්ගත සිතයයි දැන ගනී. සඋත්තර (කාමාවචර) සිත හෝ සඋත්තර සිතයයි දැනගනී. අනුත්තර (රූපාවචර අරූපාවචර) සිත හෝ අනුත්තර සිතයයි දැනගනී, සමාහිත (අපර්ණා සමාධි උපචාර සමාධියෙන් යුත්) සිත හෝ සමාහිත සිතයයි දැනගනී. අසමාහිත (අර්පණා සමාධි උපචාර සමාධියෙන් තොරවූ) සිත හෝ අසමාහිතයයි දැනගනී. විමුත්ත (තදඞ්ග විෂ්කම්භන විමුක්තීන්ගෙන් මිදුණ) සිත විමුත්ත සිතයයි දැනගනී, අවිමුත්ත (තදඞ්ග විෂ්කම්භන විමුක්තීන්ගෙන් නොමිදුණු) සිත හෝ අවිමුත්ත සිතයයි දැනගනී.

මෙසේ තමාගේ සිත කෙරෙහි හෝ සිත අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ සිත කෙරෙහි හෝ සිතඅනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ සිත කෙරෙහි හෝ සිත අනුව බලමින් වාසය කරන්නේය. සිතෙහි ඉපදීම් ස්වභාව දක්නේ හෝ සිත අනුව බලමින් වාසය කරන්නේය. විනාශවීම් ස්වභාව දක්නේ හෝ සිත අනුව බලමින් වාසය කරන්නේය. කලෙක ඉපදීම් හා කලෙක විනාශවීම් දක්නේ හෝ සිතඅනුව බලමින් වාසය කරන්නේය. ඔහු සත්වපුද්ගල නොවූ සිත ඇත්තේය යන සිහිය හොඳින් පිහිටුවන ලද්දේය. ඒ සිහිය ඥාණයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී ඒ භික්ෂුව කෙලෙසුන් කරණකොට කිසිවක් ආශ්‍රය කොට නොගෙන වාසය කෙරේ. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද සිත කෙරෙහි සිත අනුව බලමින් වාසය කරන්නේය.

13. මහණෙනි, භික්ෂුව කෙසේ නම් ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කෙරේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව පංච නීවරණ ධර්මයන් (කුසල් ආවරණය

කරන කරුණු පස) කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසයකෙරේ. මහණෙනි, භික්ෂුව පංචනීවරණ ධර්මයන් කෙරෙහි (ඒ නීවරණ) ධර්මයන් අනුව බලමින් කෙසේ වාසය කෙරේද? මේ ශාසනයෙහි භික්ෂුව තමා කෙරෙහි ඇත්තාවූ හෝ, කාමච්ඡන්දය, (පස්කම් සැපයෙහි ආසාව) මා තුළ කාමච්ඡන්දය ඇතැයි දැනගනී. තමා කෙරෙහි නැත්තාවූ හෝ කාමච්ඡන්දය, මා තුළ කාමච්ඡන්දය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන්නාවූ කාමච්ඡන්දයාගේ ඉපදීම වේද, ඒ කාරණය දැනගනී. යම් කරුණකින් උපන්නාවූ කාමච්ඡන්දයාගේ දුරුකිරීම වන්නේද ඒ කාරණයද, දැනගනී. යම් කරුණකින් දුරු කරනලද කාමච්ඡන්දයාගේ නැවත ඉපදීමක් නොවේද, ඒ කාරණයද දැනගනී.

ඇත්තාවූ හෝ අධ්‍යාත්මිකවූ (තමා තුළවූ) ව්‍යාපාදය (ක්‍රොධය) මා තුළ අධ්‍යාත්මික ව්‍යාපාදය ඇතැයි දැනගනී. තමා තුළ නැත්තාවූ, හෝ ක්‍රොධය, මා තුළ ක්‍රොධය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන්නාවූ ක්‍රොධයේ ඉපදීම වේද, ඒ කරුණද දැනගනී. යම් කරුණකින් උපන්නාවූ ක්‍රොධයේ දුරුවීම වන්නේද, එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ ක්‍රොධයේ නැවත ඉපදීමක් නොවේද, එයද දැනගනී.

තමා තුළ ඇත්තාවූ හෝ ථිනමිද්ධය (චිත්තචෛතසිකයන්ගේ මැලිබව) මා තුල ථිනමිද්ධය ඇතැයි දැනගනී. තමා තුළ නැත්තාවූ හෝ ථිනමිද්ධය, මා තුළ ථිනමිද්ධය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන් ථිනමිද්ධයාගේ ඉපදීම වේද එයද දැනගනී. යම් කරුණකින් උපන් ථිනමිද්ධයාගේ දුරුවීම වන්නේද එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ ථිනමිද්ධයාගේ නැවත ඉපදීමක් නොවේද එයද දැනගනී.

තමාතුළ ඇත්තාවූ හෝ උද්ධච්චකුක්කුච්චය (නොසන්සුන්කම හා පසුතැවිල්ල) මා තුළ උද්ධච්චකුක්කුච්චය ඇතැයි දැනගනී. තමාතුළ නැත්තාවූ හෝ උද්ධච්චකුක්කුච්චය මා තුළ උද්ධච්චකුක්කුච්චය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන් උද්ධච්චකුක්කුච්චයාගේ ඉපදීම වේද එයද දැනගනී.

යම් කරුණකින් උපන් උද්ධච්චකුක්කුච්චයාගේ දුරුකිරීම වන්නේද, එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ උද්ධච්චකුක්කුච්චයාගේ නැවත ඉපදීමක් නොවේද, එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ හෝ විචිකිච්ඡාව, (බුද්ධාදි අට තැන්හි සැකය) මා තුළ විචිකිච්ඡාව ඇතැයි දන්නේය. තමා කෙරෙහි නැත්තාවූ හෝ විචිකිච්ඡාව මා තුළ විචිකිච්ඡාව නැතැයි දන්නේය. යම් කරුණකින් නූපන් විචිකිච්ඡාවගේ ඉපදීම වන්නේද, එයද දන්නේය. යම් කරුණකින් උපන් විචිකිච්ඡාවගේ දුරුකිරීම වන්නේද, එයද දන්නේය. යම් කරුණකින් දුරුවූ විචිකිච්ඡාව නැවත නූපදින්නේද, එයද දන්නේය.

මෙසේ තමා තුළවූ හෝ (පංච නීවරණ) ධර්මයන් කෙරෙහි ඒ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. බාහිරව පවත්නාවූ හෝ (අනුන් පිළිබඳවූ) (නීවරණ) ධර්මයන් කෙරෙහි ඒ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. තමන් පිළිබඳවූද, අනුන් පිළිබඳවූද ධර්මයන් කෙරෙහි හෝ ඒ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය.

ඒ ධර්මයන්ගේ ඉපදීම් ස්වභාව හෝ දකිමින් වාසය කරන්නේය. ඒ ධර්මයන්ගේ නැතිවීම් ස්වභාව හෝ දකිමින් වාසය කරන්නේය. විටක ඉපදීම් ස්වභාව හා විටක නැතිවීම් ස්වභාව හෝ බලමින් වාසය කරන්නේය. ඔහු විසින් (සත්වයෙක් පුද්ගලයෙක් නොව) නීවරණ ධර්මයෝ ඇත්තාහුය යන සිහිය මනා කොට පිහිටුවන ලද්දීය. ඒ සිහිය නුවණ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. ඔහු කෙලෙසුන් ඇසුරු නොකොට වසන්නේය. ලොකයෙහි කිසිවක් (මමය මාගේයයි) ගැනීම නොකරන්නේය. මහණෙනි, (ඒ යොගාවචර) භික්ෂුව මෙසේ පඤ්ච නීවරණ ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය.

14. මහණෙනි, (භාවනා කරන) භික්ෂුව නැවතද පස් ආකාර උපාදාන ස්කන්ධ (රූප, වෙදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාන) ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ.

මහණෙනි, භික්ෂුව පස් ආකාර උපාදාන ස්කන්ධ ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් කෙසේ වාසය කරන්නේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව මේ රූපරාශියයි, මේ රූපයාගේ පහළ වීමේ හේතුවයි, මේ රූපයාගේ විනාශයයිද, මේ වෙදනාවය (විඳීමය) මේ වෙදනාවගේ පහළ වීමේ හේතුවය, මේ වේදනාවගේ විනාශයයිද, මේ සංඥාවය, මේ සංඥාවගේ පහළ වීමේ හේතුවය. මේ සංඥාවගේ විනාශයයිද, මේ සංස්කාරයය, මේ සංස්කාරයාගේ පහළවීමේ හේතුවය. මේ සංස්කාරයාගේ විනාශයයයිද, මේ විඥ්ඥාණයය, මේ විඥ්ඥාණයාගේ පහළ වීමේ හේතුවය. මේ විඥ්ඥාණයාගේ විනාශයයිද මෙසේ තමා තුළවූ (පංචස්කන්ධ) ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. බාහිරවූ (අනුන්තුළවූ) හෝ ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. තමන් කෙරෙහිවූ හෝ අනුන් කෙරෙහිවූ හෝ ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. ධර්මයන්ගේ ඇතිවීම් ස්වභාව හෝ දකිමින් වාසය කරන්නේය. ධර්මයන්ගේ විනාශවීම් ස්වභාවය හෝ බලමින් වාසය කරන්නේය. කලෙක ධර්මයන්ගේ පහළවීම හා කලෙක ධර්මයන්ගේ විනාශවීම හෝ බලමින් වාසය කරනේය. ඔහු විසින් (සත්වපුද්ගල නොව) ස්කන්ධ ධර්මයෝ ඇත්තාහුය (යන) සිහිය හොඳින් පිහිටුවන ලද්දීය. (ඒසිහිය) නුවණ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. ඔහු කෙලෙසුන් ඇසුරු නොකොට වාසය කරයි. (පංචස්කන්ධ) ලෝකයෙහි (කිසිවක් මමය මාගේයයි) ගැනීමක් නොකරන්නේය. මහණෙනි, භික්ෂුව මෙසේ පංචඋපාදානස්කන්ධයන් කෙරෙහි, ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය.

15. මහණෙනි, නැවතද භික්ෂුව තමන් තුළවූ සය ආකාර ආයතනයන්ද (ඇස, කණ, නාසය, දිව, කය, සිත) පිටතවූ සය ආකාර ආයතනයන්ද (රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ධර්ම) යන ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. මහණෙනි, භික්ෂුව තමන් තුළවූද, පිටතවූද සයාකාර ආයතනයන් කෙරෙහි ධර්මයන් අනුව කෙසේ නම් බලමින්

වාසය කරයිද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව ඇසද දැනගනී. රූපයන්ද දැනගනී. ඒ දෙදෙනාගේ එක්වීම හේතුකොටගෙන යම් සංයෝජනයක් උපදින්නේද එයද දැනගනී. යම් කරුණකින් නූපන් සංයෝජනයාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන් සංයෝජනයාගේ දුරුවීම වේද, එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ සංයෝජනයාගේ නැවත ඉපදීමක් නොවේද, එයද දැනගනී. කණද දැනගනී. ශබ්දයද දැනගනී. ඒ දෙදෙනාගේ එක්වීමෙන් යම් සංයොජනයක් උපදින්නේද, එයද දැනගනී. යම් කරුණකින් නූපන් සංයොජනයාගේ ඉපදීමක් වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන් සංයොජනයාගේ දුරුවීම වේද, එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ සංයොජනයාගේ නැවත ඉපදීමක් නොවේද, එයද දැනගනී.

දිවද දැනගනී. රසයන්ද දැනගනී. ඒ දෙදෙනාගේ එක්වීමෙන් යම් සංයොජනයක් උපදින්නේද එයද දැනගනී. යම් කරුණකින් නූපන් සංයොජනයාගේ උපදීමක් වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන් සංයොජනයාගේ දුරුවීම වේද, එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ සංයොජනයාගේ නැවත ඉපදීමක් නොවන්නේද, එයද දැනගනී.

කයද දැනගනී. ස්පර්ශයද දැනගනී. ඒ දෙදෙනාගේ එක්වීමෙන් යම් සංයොජනයක් උපදින්නේද, එයද දැනගනී. යම් කරුණකින් නූපන් සංයොජනයාගේ ඉපදීමක් වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන් සංයොජනයාගේ දුරුවීමක් වේද, එයද දැනගනී, යම් කරුණකින් දුරුවූ සංයොජනයාගේ නැවත ඉපදීමක් නොවන්නේද, එයද දැනගනී.

සිතද දැනගනී, ධර්මයන්ද දැනගනී. ඒ දෙදෙනාගේ එක් වීමෙන් යම් සංයොජනයක් උපදින්නේද, එයද දැනගනී. යම් කරුණකින් නූපන් සංයොජනයාගේ ඉපදීමක් වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන් සංයොජනයාගේ දුරුවීමක් වේද, එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ සංයොජනයාගේ නැවත ඉපදීමක් නොවන්නේද, එයද දැනගනී.

මෙසේ තමා තුළවූ (ආයතන) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ. පිටත්හිවූ ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ. තමන් තුළවූද, පිටත්හිවූද ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ. ධර්මයන්ගේ ඉපදීම් ස්වභාව හෝ බලමින් වාසය කෙරේ. ධර්මයන්ගේ විනාශ වීම් ස්වභාව හෝ බලමින් වාසය කෙරේ. කලෙක ධර්මයන්ගේ ඉපදීම හා කලෙක විනාශවීම බලමින් හෝ වාසය කෙරේ. ඔහු විසින් (සත්ව පුද්ගලනොව) ආයතන ධර්මයෝ ඇත්තාහුය යන සිහිය මනාකොට පිහිටුවන ලද්දීය. (එය) නුවණ වැඩීම පිණිසද, සිහිය දියුණු වීම පිණිසද පවතී. ඔහු කෙලෙසුන් ඇසුරු නොකොට වාසය කරන්නේය. (ආයතන ධර්ම) ලොකයෙහි කිසිවක් (මමය, මාගේයයි) ගැනීම නොකෙරේ. මහණෙනි, ඒ භික්ෂුව මෙසේ තමන් තුළවූද, පිටත්හිවූද දොළොස් ආයතන ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ.

**16** මහණෙනි, නැවතද භික්ෂුව සප්තබොද්ධ්‍යංග (අවබොධයට හේතුවන අවයව හත) ධර්මයන්හි ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ. මහණෙනි, භික්ෂුව සත්වැදෑරුම් බොධ්‍යංග ධර්මයන් අනුව කෙසේ බලමින් වාසය කෙරේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව තමාතුළ ඇත්තාවූ හෝ සති සම්බොජ්ඣංගය, (සිහිය) මා තුළවූ සතිසම්බොජ්ඣංගය, ඇතැයි දැනගනී. තමාතුළ නැත්තාවූ හෝ සති සම්බොජ්ඣංගය මා තුළ සති සම්බොජ්ඣංගය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන් සතිසම්බොජ්ඣංගයාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන්නාවූ සති සම්බොජ්ඣංගයාගේ වැඩීම වේද, එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ හෝ ධම්මවිචය (ප්‍රඥාව) සම්බොජ්ඣංගය, මාතුළ ධම්මවිචය සම්බොජ්ඣංගය ඇතැයි දැනගනී. තමා කෙරෙහි නැත්තාවූ හෝ ධම්මවිචය සම්බොජ්ඣංගය, මාතුළ ධම්මවිචය සම්බොජ්ඣංගය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන් ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම්

කරුණකින් උපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ වැඩීම වේද, එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ හෝ විරිය (වීර්යය) සම්බොජ්ඣංගය, මා තුළ විරිය සම්බොජ්ඣංගය ඇතැයි දැනගනී. තමා කෙරෙහි නැත්තාවූ හෝ විරිය සම්බොජ්ඣංගය මාතුළ විරිය සම්බොජ්ඣංගය නැතැයි දැනගනී.

යම් කරුණකින් නූපන් විරියසම්බොජ්ඣංගයාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන්නාවූ විරිය සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීම වේද, එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ පීති (ප්‍රීතිය) සම්බොජ්ඣඞ්ගය, හෝ මාතුළ පීති සම්බොජ්ඣඞ්ගය ඇතැයි දැනගනී. තමා කෙරෙහි නැත්තාවූ හෝ පීති සම්බොජ්ඣඞ්ගය, මාතුළ පීති සම්බොජ්ඣඞ්ගය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන් පීති සම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීමක් වේද, එයද දැන ගනී. යම් කරුණකින් උපන්නාවූ පීති සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීම වේද, එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ හෝ පස්සද්ධි (සංසිඳීම) සම්බොජ්ඣඞ්ගය මාතුළ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය ඇතැයි දැනගනී. තමා කෙරෙහි නැත්තාවූ හෝ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය මා තුළ පස්සද්ධි සම්බොජ්ඣංගය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන් හෝ පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීම වේද, එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ හෝ සමාධි (සිත එකඟ කිරීම) සම්බොජ්ඣඞ්ගය, මා තුළ සමාධි සම්බොජ්ඣඞ්ගය ඇතැයි දැනගනී. තමා කෙරෙහි නැත්තාවූ හෝ සමාධි සම්බොජ්ඣඞ්ගය, මා තුළ සමාධි සම්බොජ්ඣඞ්ගය නැතැයි දැන ගනී. යම් කරුණකින් නූපන්නාවූ සමාධි සම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම්

කරුණකින් උපන්නාවූ සමාධි සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීම වේද, එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ හෝ උපෙක්ඛා (මැදහත් බව) සම්බොජ්ඣඞ්ගය, මා තුළ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය ඇතැයි දන්නේය. තමා කෙරෙහි නැත්තාවූ හෝ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය, මාතුළ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීම වේද, එයද දැනගනී.

මෙසේ තමා කෙරෙහි ඇත්තාවූ හෝ (සප්ත බොධ්‍යංග) ධර්මයන් කෙරෙහි, ධර්මයන් අනුව බලමින් වාසය කරයි. අනුන් පිළිබඳවූ (සප්තබොද්ධ්‍යංග) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරයි. තමන් පිළිබඳවූද, අනුන් පිළිබඳවූද ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරයි. ධර්මයන්ගේ ඉපදීම් ස්වභාව හෝ බලමින් වාසය කරයි. විනාශවීම් ස්වභාව හෝ බලමින් වාසය කරයි. කලෙක ඉපදීම හා කලෙක විනාශවීම හෝ බලමින් වාසය කරයි.

ඒ භික්ෂුවට (සත්ව පුද්ගල නොව) බොද්ධ්‍යංග ධර්මයෝ ඇතැයි යන සිහිය හොඳින් එළඹෙන ලද්දීය. (ඒ සිහිය) ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. (ඒ භික්ෂුව) කෙලෙසුන්ගෙන් දුරුව වාසය කරයි. ලෝකයෙහි කිසිවක් ආත්ම වශයෙන් ගැනීම නොකරයි. මහණෙනි, භික්ෂුව මෙසේ සප්ත බොද්ධ්‍යංග ධර්මයන් කෙරෙහි, ධර්මයන් අනුව බලමින් වාසය කරයි.

17. මහණෙනි, භික්ෂුව නැවතද චතුරාර්‍ය්‍යසත්‍යය (උතුම් සත්‍ය හතර) ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරයි. මහණෙනි, භික්ෂුව චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් කෙසේ වාසය කරයිද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව මේ දුකයයි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් ඉපදීමේ හේතුවයයි ඇති සැටියෙන් දැනගනී. මේ දුක්

නැති කිරීම යයි ඇති සැටියෙන් දැනගනී. මේ දුක්නැති කිරීමේ මාර්ගය යයි ඇති සැටියෙන් දැනගනී.

පළමුවෙනි බණවර නිමියේය.

**2.**

18. මහණෙනි, දුඃඛාර්‍ය සත්‍යය නම් කවරේද? ඉපදීමද දුකය. දිරීමද (මහලුවීම) දුකය. රෝගයද දුකය. මරණයද දුකය. ශොක කිරීමය, වැළපීමය, කයෙහි දුකය, සිතෙහි දුකය, ශොක කිරීමෙන් වන වෙහෙසය යන මොවුහු දුක් වන්නාහුය. අකමැති දෙය හා එක්වීමද දුක්වන්නේය. කැමති දෙයින් වෙන්වීමද දුක් වන්නේය. යම් කැමති දෙයක් නොලැබීමද දුක්වන්නේය. කොටින් කියතොත් උපාදානස්කන්ධ පසම දුක් වන්නේය.

මහණෙනි, ජාතිය (උත්පත්තිය) නම් කවරේද? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව වර්ගයන්හි ඉපදීමක් වේද, හටගැන්මක් වේද, (උත්පත්තියට) ඇතුළත් වීමක් වේද, විශෙෂයෙන් ඉපදීමක් වේද, ස්කන්ධයන්ගේ පහළ වීමක් වේද, ආයතනයන්ගේ ලැබීමක් වේද මහණෙනි, මෝ තොමෝ ජාතිය (ඉපදීම) යයි කියනු ලැබේ.

මහණෙනි, ජරාව (මහලු වීම) නම් කවරේද? ඒ ඒ සත්ව වර්ගයන්හි ඒ ඒ සත්වයන්ගේ යම් ජරාවක් වේද, දිරන බවක් වේද කැඩුණු (වැටුනු) දත්ඇති බවක් වේද, පැසී සුදුවූ කෙස් ඇති බවක් වේද, (හම) රැලි වැටීමක් වේද ආයුෂයාගේ පිරිහීමක්වේද, ඉන්ද්‍රියයන්ගේ මේරීමක් වේද, මේ ජරාවයයි කියනු ලැබේ.

මහණෙනි, මරණය නම් කවරේද? ඒ ඒ සත්වවර්ගයන්හි ඒ ඒ සත්වයන්ගේ චුතවීමක් වේද, වෙන්වීමක් වේද, බිඳීමක් වේද, අතුරුදන් වීමක් වේද, මිය යාමක් වේද, කාලක්‍රියාවක් වේද, ස්කන්ධයන්ගේ බිඳීමක් වේද, ශරීරයාගේ බැහැර දැමීමක් වේද, මහණෙනි, මෙය මරණයයි කියනු ලැබේ.

මහණෙනි, සොකය නම් කවරේද? යම් යම් විපතකින් යුක්තවූ සත්වයාගේද, යම් යම් දුකකට පැමිණි සත්වයාගේද

ශොකයක් වේද, ශොකකරන බවක් වේද, ශොක කිරීමක් වේද, ඇතුළත වියලන ස්වභාවයක් වේද, ඇතුළත විශෙෂයෙන් වියලන ස්වභාවයක් වේද මහණෙනි, මෙය ශොකයයි කියනු ලැබේ.

මහණෙනි, පරිදෙවය නම් කුමක්ද? යම් යම් විපතකින් යුක්තවූව හුගේද යම් යම් දුකකට පත්වූවහුගේද යම් වැලපීමක් වේද, විලාප කීමක් වේද, නම් කිය කියා හැඬීමක් වේද, ගුණ කිය කියා හැඬීමක් වේද, යම් හැඬීම් බවක් වේද, යම් විලාප කීමක් වේද, මහණෙනි, මෙය පරිදෙවයයි කියනු ලැබේ.

මහණෙනි, දුක නම් කවරේද? මහණෙනි, කයෙහිවූ යම් දුකක් ඇද්ද, කයෙහිවූ යම් නොසැපක් වේද කායස්පර්ශයෙන් හටගත්තාවූ දුකක්වේද නොසැපවූ විඳීමක් වේද මහණෙනි, මෙය දුකයයි කියනු ලැබේ.

මහණෙනි, දොම්නස නම් කවරක්ද? මහණෙනි, සිතෙහි හටගත්තාවූ යම් දුකක් වේද, සිතෙහිවූ යම් අමිහිරි බවක් වේද, සිතේ ස්පර්ශ නිසා හටගත් යම්දුකක් වේද, සැපනොවූ යම් විඳීමක් වේද මහණෙනි, මෙය දොම්නසයයි කියනු ලැබේ.

මහණෙනි, උපායාස නම් කවරේද? යම් යම් විපතකින් යුක්ත වූවහුගේද, යම් යම් දුකකින් යුක්තවූවහුගේද යම් දැඩි වෙහෙසක් ඇත්තේද යම් ක්ලාන්ත වීමක් වේද, යම් බලවත් ක්ලාන්ත වීමක් ඇත්තේද මෙය මහණෙනි, උපායාසයයි කියනු ලැබේ.

මහණෙනි, "කැමතිවූ යමක් නොලබාද එයද දුක් වන්නේය" යනු කවරේද? මහණෙනි, ඉපදීම ස්වභාව කොට ඇති සත්වයන්ට මෙබඳු කැමත්තක් (ආසාවක්) උපදී. (කෙසේද?) "අනේ! අපි සසර උපදින ස්වභාව නැත්තෝවෙමු නම්, ඒකාන්තයෙන් සසර හටගැන්ම අපවෙත නොඑන්නේ නම් ඉතා හොඳය" යනුවෙනි. මේ කාරණය කැමැත්තෙන් (ආසාවෙන්) පැමිණිය හැක්කක් නොවේ. මෙයද ආසා කරන යමක් නොලැබීමේ දුකකි.

මහණෙනි, දිරීම (මහළුවීම) ස්වභාව කොට ඇති සත්වයන්ට මෙබඳු ආසාවක් උපදී. (කෙසේද?) "අනේ අපි මහලු වන ස්වභාව නැත්තෝවෙමු නම්, එකානත්යෙන් මහලුවීම අපවෙත නොඑන්නේ නම් ඉතා හොඳය" කියායි. මේ කාරණය ආසාවෙන් පැමිණිය හැක්කක් නොවේ. මෙයද ආසා කරන යමක් නොලැබීමේ දුකකි.

මහණෙනි, රෝගයන්ගෙන් පෙළෙන ස්වභාව ඇති සත්වයන්ට මෙබඳු ආසාවක් උපදී. (කෙසේද?) "අනේ අපි රොගීවන ස්වභාව නැත්තෝ වෙමු නම්! ඒකාන්තයෙන් අපවෙත රෝග නොඑන්නේ නම් ඉතා හොඳය" කියාය. මේ කාරණය ආසාවෙන් පැමිණිය හැක්කක් නොවේ. මෙයද ආසා කරන යමක් නොලැබීමේ දුකකි.

මහණෙනි, මරණයට පැමිණෙන ස්වභාව ඇත්තාවූ සත්වයන්ට මෙබඳු ආසාවක් උපදී. (කෙසේද?) "අනේ අපි මැරෙණ ස්වභාව නැත්තෝ වෙමු නම්, එකාන්තයෙන් මරණය අප වෙත නොඑන්නේ නම් ඉතා හොඳය" (කියායි.) මේ කාරණය ආසාවෙන් පැමිණිය හැක්කක් නොවේ. මෙයද ආසා කරන යමක් නොලැබීමේ දුකකි.

මහණෙනි, ශොකයට (කනගාටුවට) පැමිණීම ස්වභාව කොට ඇති සත්වයන්ට මෙබඳු ආසාවක් උපදී. (කෙසේද?) "අනේ අපි ශොකයට පැමිණෙන ස්වභාව නැත්තෝ වෙමු නම් එකාන්තයෙන් ශොකය අප වෙත නොඑන්නේ නම් ඉතා හොඳය" කියායි, මේ කාරණය ආසාවෙන් පැමිණිය හැක්කක් නොවේ. මෙයද ආසා කරන යමක් නොලැබීමේ දුකකි.

මහණෙනි, වැළපීමට පැමිණෙන ස්වභාව ඇති සත්වයන්ට මෙබඳු ආසාවක් උපදී. (කෙසේද?) "අනේ අපි වැළපීමට පැමිණෙන ස්වභාව නැත්තෝ වෙමු නම්, එකාන්තයෙන් වැළපීම අපවෙත නොපැමිණෙන්නේ නම් ඉතා හොඳය" කියායි, මේ කාරණය ආසාවෙන් පැමිණිය හැක්කක් නොවේ. මෙයද ආසා කරන යමක් නොලැබීමේ දුකකි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මහණෙනි, දුකට (කායිකදුක) පැමිණෙන ස්වභාව ඇති සත්වයන්ට මෙබඳු ආසාවක් උපදී. (කෙසේද?) "අනේ අපි දුකට පැමිණෙන ස්වභාව නැත්තෝ වෙමු නම්, එකාන්තයෙන් දුක අප වෙත නොඑන්නේ නම් ඉතා හොඳය" කියායි. මේ කාරණය ආසාවෙන් පැමිණිය හැක්කක් නොවේ. මෙයද ආසා කරන යමක් නොලැබීමේ දුකකි.

මහණෙනි, දොම්නසට (සිතේ දුකට) පැමිණෙන ස්වභාව ඇති සත්වයන්ට මෙබඳු ආසාවක් උපදී. (කෙසේද?) "අනේ! අපි දොම්නසට පැමිණෙන ස්වභාව නැත්තෝ වෙමු නම්, එකාන්තයෙන් දොම්නස අප වෙත නොඑන්නේ නම් ඉතා හොඳය" කියායි. මේ කාරණය ආසාවෙන් පැමිණිය හැක්කක් නොවේ. මෙයද ආසා කරන යමක් නොලැබීමේ දුකකි.

මහණෙනි, උපායාසයට (බලවත් වෙහෙසට) පැමිණෙන ස්වභාව ඇති සත්වයන්ට මෙබඳු ආසාවක් උපදී. (කෙසේද?) "අනේ! අපි උපායාසයට පැමිණෙන ස්වභාව නැත්තෝ වෙමු නම්, ඒකාන්තයෙන් අප වෙත උපායාසය නොඑන්නේ නම් ඉතා හොඳය" කියායි. මේ කාරණය ආසාවෙන් පැමිණිය හැක්කක් නොවේ, මෙයද ආසා කරනයමක් නොලැබීමේ දුකකි.

මහණෙනි, සංක්ෂෙපයෙන් දුක්වූ පඤ්ච උපාදානස්කන්ධයෝ නම් කවරහුද? හේ මෙසේයි. රූප උපාදානස්කන්ධය, වෙදනා උපාදානස්කන්ධය, සංඥාඋපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඥානඋපාදානස්කන්ධය, යන මොහුයි. මහණෙනි සංක්ෂෙපයෙන් දුක් වන්නාහු යම් පඤ්ච උපාදානස්කන්ධයෝයි. මහණෙනි මෙය දුඃඛයාර්‍ය්‍යසත්‍යයයි කියනු ලැබේ.

**19** මහණෙනි දුක්ඛ සමුදය (දුක් ඉපදීමේ හේතුව) ආය්‍ය්‍ය සත්‍යය කවරේද? නැවත නැවත සත්වයාගේ ඉපදීම ඇතිකරන්නාවූ, ඇලීම් සහගතවූ ඒ ඒ උපන් ආත්මභාවයෙහි ඇලෙන්නාවූ යම් තණ්හාවක් (ආසාවක්) වේද, ඒ කවරේදයත්! කාම තණ්හාය (පංචකාමයන් කෙරෙහි ඇති ආසාව) භව තණ්හාය (ශාස්වතදෘෂ්ටිය සමග ඇති ආශාව) විභව තණ්හාය

(උච්ඡේදදෘෂ්ටිය සමග පවත්නා ආශාව) යන මොහුයි. මහණෙනි ඒ මේ තණ්හාව උපදිනු ලබන්නේ, කවර තැනෙක්හි උපදීද? පවතිනු ලබන්නේ කවර තැනක පවතීද?

ලොකයෙහි යමක් ප්‍රිය ස්වභාව ඇත්තේද, සැප ස්වභාව ඇත්තේද එහි උපදිනු ලබන්නාවූ මේ තණ්හාව උපදී පවතිනු ලබන්නාවූ මේ තණ්හාව පවතී.

ලොකයෙහි කුමක් නම් ප්‍රියස්වභාවය ඇත්තේද? සැප ස්වභාව ඇත්තේද? ලොකයෙහි ඇස ප්‍රියස්වභාවය ඇත්තේය. සැපස්වභාවය ඇත්තේය, උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී, පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී.

ලොකයෙහි කණ ප්‍රියස්වභාව ඇත්තේය. සැප ස්වභාවය ඇත්තේය. උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී. පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී. ලොකයෙහි නාසය ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී. පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී. ලොකයෙහි දිව ප්‍රිය ස්වභාවය ඇත්තේය. සැප ස්වභාවය ඇත්තේය. උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී. පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී. ලොකයෙහි ශරීරය ප්‍රියස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී. පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී. ලොකයෙහි සිත ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී. පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී.

ලොකයෙහි රූපයද, ලොකයෙහි ශබ්දයද, ලොකයෙහි සුවඳද, ලොකයෙහි රසයද, ලොකයෙහි ස්පර්ශයද, ලොකයෙහි ධර්මයද ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී.

ලොකයෙහි චක්ඛු විඤ්ඤාණයද, (රූපය දැන ගන්නා සිත) ලොකයෙහි සොත විඤ්ඤාණයද, (ශබ්දය දැන ගන්නා සිත)

ලොකයෙහි ඝාණ විඤ්ඤාණයද, (ගඳ සුවඳ දැන ගන්නා සිත) ලොකයෙහි ජිව්හා විඤ්ඤාණයද, (රස දැන ගන්නා සිත) ලොකයෙහි කාය විඤ්ඤාණයද, (ස්පර්ශ දැන ගන්නා සිත) ලොකයෙහි මනො විඤ්ඤාණයද, (චක්ඛුවිඤ්ඤාණාදියෙන් අන්‍යවූ සිත) ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී. පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී.

ලොකයෙහි චක්ඛුසම්ඵස්සයද, (චක්ඛුද්වාරයෙහි ස්පර්ශය) ලොකයෙහි සොත සම්ඵස්සයද (සොත ද්වාරයෙහි ස්පර්ශය) ලොකයෙහි ඝාන සම්ඵස්සයද (ඝාන ද්වාරයෙහි ස්පර්ශය) ලොකයෙහි ජිව්හා සම්ඵස්සයද (ජිව්හා ද්වාරයෙහි ස්පර්ශය) ලොකයෙහි කාය සම්පස්සයද (කායද්වාරයෙහි ස්පර්ශය) මනො සම්පස්සයද (මනඃ ස්පර්ශයද) ප්‍රියස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී. පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී.

ලොකයෙහි ඇස හා රූපය ස්පර්ශ වීමෙන් ඇතිවන විඳීමද, ලොකයෙහි කණ හා ශබ්දය ස්පර්ශ වීමෙන් ඇතිවන විඳීමද, ලොකයෙහි නාසය හා ගඳ සුවඳ ස්පර්ශ වීමෙන් ඇතිවන විඳීමද, ලොකයෙහි දිව හා රසය ස්පර්ශ වීමෙන් ඇතිවන විඳීමද, ලොකයෙහි කය හා ස්පර්ශය එක් වීමෙන් ඇතිවන විඳීමද, ලොකයෙහි සිත හා ධර්මයන් ස්පර්ශවීමෙන් ඇතිවන විඳීමද, ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී. පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී.

ලොකයෙහි රූප සංඥාවද, ලොකයෙහි ශබ්ද සංඥාවද, ලොකයෙහි ගන්ධ සංඥාවද, ලොකයෙහි රස සංඥාවද, ලොකයෙහි ස්පර්ශ සංඥාවද, ලොකයෙහි ධර්ම සංඥාවද, ප්‍රිය ස්වභාව ඇත්තේය, සැප ස්වභාව ඇත්තේය, උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී, පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී.

ලොකයෙහි රූපය නිසා පවත්නා චෙතනාවද, ලොකයෙහි ශබ්දය නිසා පවත්නා චෙතනාවද, ලොකයෙහි ගඳ සුවඳ නිසා

පවත්නා චෙතනාවද, ලොකයෙහි ස්පර්ශය නිසා පවත්නා චෙතනාවද, ලොකයෙහි ධර්මය නිසා පවත්නා චෙතනාවද ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී. පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී.

ලොකයෙහි රූප තණ්හාවද, ලොකයෙහි ශබ්ද තණ්හාවද, ලොකයෙහි ගන්ධ තණ්හාවද, ලොකයෙහි රස තණ්හාවද, ලොකයෙහි ස්පර්ශ තණ්හාවද, ලොකයෙහි ධර්ම තණ්හාවද, ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී. පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී.

ලොකයෙහි රූපය නිසා හටගන්නා විතර්කයද ලොකයෙහි ශබ්දය නිසා හටගන්නා විතර්කයද ලොකයෙහි ගන්ධය නිසා හටගන්නා විතර්කයද, ලොකයෙහි රස නිසා හටගන්නා විතර්කයද, ලොකයෙහි ස්පර්ශය නිසා හටගන්නා විතර්කයද, ලොකයෙහි ධර්ම අරමුණු නිසා හටගන්නා විතර්කයද ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. උපදිනු ලබන්නාවූ තණ්හාව මෙහි උපදී. පවතිනු ලබන්නාවූ තණ්හාව මෙහි පවතී.

ලොකයෙහි රූපය නිසා හටගන්නා විචාරයද, ලොකයෙහි ශබ්දය නිසා හටගන්නා විචාරයද, ලොකයෙහි ගන්ධය නිසා හටගන්නා විචාරයද, ලොකයෙහි රසය නිසා හටගන්නා විචාරයද, ලොකයෙහි ස්පර්ශය නිසා හටගන්නා විචාරයද, ලොකයෙහි ධර්ම අරමුණු නිසා හටගන්නා විචාරයද, ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. උපදිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි උපදී. පවතිනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පවතී.

මහණෙනි මේදුක්ඛ සමුදය නම්වූ ආර්‍ය්‍යසත්‍යය යයි.

**20.** මහණෙනි දුක් නැති කිරීම නම් වූ උතුම් සත්‍යය (නිවන) කවරේද? එම තණ්හාවගේම ඉතුරු නොවන යම් නොඇලීම නම්වූ නිරුද්ධ (නැති) කිරීමක් වේද, අත්හැරීමක්

වේද, සම්පූර්ණයෙන් දුරලීමක් වේද, මිදීමක් (ගැලවීමක්) වේද, ආලය නොකිරීමක් වේද එයයි.

මහණෙනි පහවනු ලබන්නාවූ මේ තණ්හාව කවර තැනෙක්හි පහවන්නේද? නැතිවන්නාවූ මේ තණ්හාව කවර තැනෙක නැති (නිරුද්ධ) වේද? ලොකයෙහි යමක් ප්‍රිය ස්වභාව ඇත්තේද, යමක් සැප ස්වභාව ඇත්තේද පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවේ. නැතිවන්නාවූ මේ තණ්හාව මෙහි නැතිවේ. ලොකයෙහි කුමක් නම් ප්‍රිය ස්වභාව ඇත්තේද? කුමක් නම් සැප ස්වභාව ඇත්තේද? ලොකයෙහි ඇස ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවේ. නැතිවන්නාවූ මේ තණ්හාව මෙහි නැතිවේ.

ලොකයෙහි කණද, ලොකයෙහි නාසයද, ලොකයෙහි දිවද, ලොකයෙහි කයද, ලොකයෙහි සිතද, ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නේය. නැතිවන්නාවූ මේ තණ්හාව මෙහි නැතිවේ.

ලොකයෙහි රූපයද, ලොකයෙහි ශබ්දයද, ලොකයෙහි ගඳ සුවඳද, ලොකයෙහි රසයද, ලොකයෙහි ස්පර්ශයද ලොකයෙහි ධර්මයද ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවේ. නැතිවන්නාවූ මේ තණ්හාව මෙහි නැතිවේ.

ලොකයෙහි චක්ඛුවිඤ්ඤාණයද, (රූපදක්නා සිතද) ලොකයෙහි සොතවිඤ්ඤාණයද, (ශබ්ද අසනා සිතද) ලොකයෙහි ඝාණවිඤ්ඤාණයද, (ගඳ සුවඳ දැන ගන්නා සිතද) ලොකයෙහි ජිව්හා විඤ්ඤාණයද, (රස දැන ගන්නා සිතද) ලොකයෙහි කාය විඤ්ඤාණයද, (පහස දැන ගන්නා සිතද) ලොකයෙහි මනො විඤ්ඤාණයද (එම සිත් පසින් අන්‍ය සිත්ද) ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවේ. නැතිවන්නාවූ මේ තණ්හාව මෙහි නැතිවේ.

ලොකයෙහි චක්ෂු ස්පර්ශ (ඇස නිසා හටගන්නා ස්පර්ශය) ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහ වන්නේය. නැතිවන්නාවූ මේ තණ්හාව මෙහි නැති වන්නේය. ලොකයෙහි ශ්‍රොත ස්පර්ශයද (කණ නිසා උපදින ස්පර්ශය) ලොකයෙහි ඝ්‍රාණ ස්පර්ශයද, (නාසය නිසා උපදින ස්පර්ශයද) ලොකයෙහි ජිව්හා ස්පර්ශයද (දිව නිසා උපදින ස්පර්ශයද) කාය ස්පර්ශයද (කය නිසා උපදින ස්පර්ශයද, ලොකයෙහි මනඃ ස්පර්ශයද (සිත නිසා ඇතිවන ස්පර්ශයද) ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නේය. නැති වන්නාවූ මේ තණ්හාව මෙහි නැති වන්නේය

ලොකයෙහි ඇස හා රූපය ගැටීමෙන් උපදින වේදනාව (විඳීම) ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නේය, නැතිවන්නාවූ මේ තණ්හාව මෙහි නැති වන්නේය. ලොකයෙහි කණ හා ශබ්දය ගැටීමෙන් උපදින වේදනාවද, නාසය හා ගන්ධය ගැටීමෙන් උපදින වෙදනාවද, දිව හා රසය ගැටීමෙන් උපදින වේදනාවද, කය හා ස්පර්ශය ගැටීමෙන් උපදින වේදනාවද, සිත හා අරමුණු ගැටීමෙන් උපදින වේදනාවද ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නේය. නැතිවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි නැතිවන්නේය.

ලොකයෙහි රූපය යන හැඟීම ප්‍රියස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නේය. නැතිවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි නැති වන්නේය. ලොකයෙහි ශබ්දය යන හැඟීමද, ලොකයෙහි ගන්ධය යන හැඟීමද ලොකයෙහි රසය යන හැඟීමද ලොකයෙහි ස්පර්ශය යන හැඟීමද ලොකයෙහි ධර්මය යන හැඟීමද ප්‍රියස්වභාව ඇත්තේය. සැපස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නීය. නැතිවන්නාවූ මේ තණ්හාව මෙහි නැති වන්නීය.

ලොකයෙහි රූපයෙහි පැවති සිත ප්‍රියස්වභාව ඇත්තේය. සැපස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නීය. නැතිවන්නාවූ මේ තණ්හාව මෙහි නැති වන්නීය.

ලොකයෙහි ශබ්දයෙහි පැවති සිතද, ලොකයෙහි ගන්ධයෙහි පැවති සිතද, ලොකයෙහි රසයෙහි පැවති සිතද, ලොකයෙහි ස්පර්ශයෙහි පැවති සිතද, ලොකයෙහි ධර්මයෙහි පැවති සිතද ප්‍රියස්වභාව ඇත්තේය, සැපස්වභාව ඇත්තේය, පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නීය නැති වන්නාවූ මේ තණ්හාව මෙහි නැති වන්නීය.

ලොකයෙහි රූප තණ්හාව (රූපයට ආශාව) ප්‍රියස්වභාව ඇත්තේය. සැපස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නීය, නැතිවන්නාවූ මේ තණ්හාව මෙහි නැතිවන්නීය. ලොකයෙහි ශබ්ද තණ්හාවද (ශබ්දයට ආශාව) ලොකයෙහි ගන්ධ තණ්හාවද (සුවඳට ආශාව) ලොකයෙහි රස තණ්හාවද (රසයට ආශාව) ලොකයෙහි ස්පර්ශ තණ්හාවද (පහසට ආශාව) ලොකයෙහි ධර්ම තණ්හාවද (රූපාදියෙන් අන්‍යදේට ආශාව) ප්‍රියස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නීය, නැති වන්නාවූ මේ තණ්හාව මෙහි නැති වන්නීය.

ලොකයෙහි රූපය නිසා උපදින චෙතනාව (සිත මෙහෙය වන ස්වභාවය) ද, ලොකයෙහි ශබ්දය නිසා උපදින චෙතනාව (සිත මෙහෙයවන ස්වභාවය) ද, ලොකයෙහි ගන්ධය නිසා උපදින චෙතනාව (සිත මෙහෙයවන ස්වභාවය) ද, ලොකයෙහි රසය නිසා උපදින චෙතනාව (සිත මෙහෙයවන ස්වභාවය) ද, ලොකයෙහි ස්පර්ශය නිසා උපදින චෙතනාව (සිත මෙහෙයවන ස්වභාවය) ද, ලොකයෙහි රූපාදි අරමුණු පසින් අනික් අරමුණක් නිසා උපදින චෙතනාව (සිත මෙහෙයවන ස්වභාවය) ද, ප්‍රියස්වභාව ඇත්තේය, සැපස්වභාව ඇත්තේය, පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නීය. නැතිවන්නාවූ මේතණ්හාව මෙහි නැතිවන්නීය.

ලොකයෙහි රූපයෙහි පැවති විතර්කය ද, (කල්පනාවද) ලොකයෙහි ශබ්දයෙහි පැවති කල්පනාවද, ලොකයෙහි

ගන්ධයෙහි පැවති කල්පනාවද, ලොකයෙහි රසයෙහි පැවති කල්පනාවද, ලොකයෙහි ස්පර්ශයෙහි පැවති කල්පනාවද, ලොකයෙහි ධර්මයෙහි පැවති කල්පනාවද, ප්‍රියස්වභාව ඇත්තේය සැපස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නීය. නැතිවන්නාවූ මේතණ්හාව මෙහි නැතිවන්නීය. මහණෙනි මෙය දුක්ඛ නිරොධ ආර්‍ය්‍ය සත්‍යයයි කියනු ලැබේ.

**21.** මහණෙනි, දුඃඛනිරොධගාමිනි ප්‍රතිපදා ආර්‍ය්‍ය සත්‍යය නම් කවරේද? මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයමයි. ඒ කවරේද? සත්‍යය ඇති සැටියෙන් දක්නා ප්‍රඥාවය, යහපත් වචනය, හෙවත් වාග් දුශ්චරිතයෙන් වැළකීමය, යහපත් කල්පනාවය, හෙවත් මනො දුශ්චරිතයෙන් වැළකීමය යහපත් කර්මාන්තය හෙවත් කාය දුශ්චරිතයෙන් වැළකීමය, යහපත් ජීවිකාව හෙවත් දුශ්චරිතයෙන් වැළකුණ දිවි පැවැත්වීමය, යහපත් උත්සාහය හෙවත් අකුසල් නොකිරීමෙහිත් කුසල්කිරීමෙහිත් උත්සාහය, යහපත් සිහිය, යහපත් සමාධිය, යනුයි.

මහණෙනි, යහපත් ප්‍රඥාව නම් කවරේද, මහණෙනි, දුක පිළිබඳ යම් දැනීමක් වේද, දුකට හේතුව පිළිබඳ යම් දැනීමක් වේද, දුක නිරුද්ධ කිරීම පිළිබඳ යම් දැනීමක් වේද, දුක් නැති කිරීමට පමුණුවන මාර්ගය පිළිබඳ යම් දැනීමක් වේද, මහණෙනි, මේ සම්මා දිට්ඨි (යහපත් ප්‍රඥාව) යයි කියනු ලැබේ.

මහණෙනි, සම්‍යක් සංකල්පය (යහපත් කල්පනාව) නම් කවරේද? නෛෂ්ක්‍රම්‍ය (ගිහි සැප අත්හැරීමේ) සංකල්පනාවය, අව්‍යාපාද (ක්‍රොධ නොකිරීමේ) සංකල්පනාවය, අවිහිංසා (හිංසා නොකිරීමේ) සංකල්පනාවය යන මෙය සම්‍යක් සංකල්ප (යහපත් කල්පනාව) යයිකියනු ලැබේ.

මහණෙනි, සම්‍යක් වචනය කවරේද? බොරු කීමෙන් වැළකීමය, කේළාම් කීමෙන් වැළකීමය, රළු වචන කීමෙන් වැළකීමය, හිස් කථා කීමෙන් වැළකීමය, යන මේ සම්‍යක් වචනයයි කියනු ලැබේ.

මහණෙනි, සම්‍යක් කර්මාන්තය නම් කවරේද යත්? සතුන් මැරීමෙන් වැළකීමය, අන්සතුවූ නුදුන්දෙය ගැනීමෙන් වැළකීමය, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීමය, යන මේ සම්‍යක්කර්මාන්තයයි කියනු ලැබේ.

මහණෙනි, සම්‍යක්ආජීවය නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙම වරද සහිතවූ ජීවත්වීම හැර නිවරදවූ අන්දමින් ජීවිකාව කෙරේද, මහණෙනි, මේ සම්‍යක් ආජීවයයි කියනුලැබේ. මහණෙනි, සම්‍යක් ව්‍යායාමය (යහපත් උත්සාහය) නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම නූපන් අකුසල ධර්මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවාද උත්සාහකෙරේද, වීර්‍ය්‍ය ආරම්භ කෙරේද, සිත දැඩි කොට ඔසවයිද, බලවත්සේ උත්සාහ කෙරේද, උපන්නාවූ අකුසල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස කැමැත්ත උපදවාද, උත්සාහ කෙරේද, වීර්‍ය්‍යය පටන්ගනීද, සිත දැඩිකොට ඔසවයිද, බලවත් උත්සාහ කෙරේද, නූපන්කුසල ධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවාද, වීර්‍ය්‍යය පටන්ගනීද, සිත දැඩිකොට ඔසවයිද, බලවත් ලෙස උත්සාහ කෙරේද, උපන් කුසල ධර්මයන්ගේ පැවතීම පිණිසද, මුළා නොවීම පිණිසද වැඩීම පිණිසද, මහත්බව පිණිසද භාවනාවන් සම්පූර්ණ කිරීම පිණිසද කැමැත්ත උපදවාද, උත්සාහ කෙරේද, වීර්‍ය්‍යය පටන්ගනීද, සිත දැඩි කොට ඔසවයිද, බලවත් ලෙස උත්සාහ කෙරේද, මහණෙනි, මෙය යහපත් උත්සාහයයි (සම්මා වායාමයයි) කියනු ලැබේ.

මහණෙනි, සම්‍යක්ස්මෘතිය (යහපත් සිහිය) කවරේදයත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව මේ ශරීරයෙහි ශරීරය අනුව දක්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව මේ ශරීර නම්වූ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවාගෙන වාසය කෙරේද, විඳීම් කෙරෙහි විඳීම් අනුව දක්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව මේ වේදනාස්කන්ධනම්වූ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවාගෙන වාසය කෙරේද, සිතෙහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

සිත අනුව දක්නේ කෙලෙසුන් තවන වීර්යය ඇතිව නුවණින් යුතුව සිහියෙන් යුක්තව මේ විඥානස්කන්ධ නම් ලෝකයෙහි ලෝභයද ද්වේෂයද සංසිඳුවාගෙන වාසය කෙරේද, ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව දක්නේ කෙලෙස් තවන වීර්යය ඇතිව සිහියෙන් යුක්තව නුවණින් යුක්තව මේ සංස්කාර ස්කන්ධ නම් ලෝකයෙහි ලෝභයද ද්වේෂයද සංසිඳුවාගෙන වාසයකෙරේද මහණෙනි, මෙය සම්‍යක් ස්මෘතියයි (යහපත් සිහියයි) කියනු ලැබේ.

මහණෙනි, සම්‍යක් සමාධිය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව පංචකාම ගුණයන්ගෙන් වෙන්වම අකුසලයන්ගෙන් දුරුව විතර්ක සහිතවූ, විචාර සහිතවූ විවේකයෙන් ඇතිවන ප්‍රීතිය හා සැප ඇත්තාවූ පළමුවන ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් සිත පහදවන්නාවූ සිත එකඟ කරන්නාවූ විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් උපන් ප්‍රීති සැප ඇත්තාවූ දෙවැනි ධ්‍යානයට පැමිණ වාසය කරයිද, යම් ධ්‍යානයක් පිළිබඳව ආර්‍ය්‍යයෝ උපෙක්ෂාවෙන් යුක්තව සිහියෙන් යුක්තව සැපයෙන් වාසය කෙරේයයි කියත්ද ප්‍රීතියෙන් වෙන්ව සිහියෙන් යුක්ත වූයේ නුවණින් යුක්ත වූයේ සැපය කයින් විඳිමින් ඒ තුන්වැනි ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, සුඛය පහ කිරීමෙන්ද දුඃඛය පහකිරීමෙන්ද සොම්නස් දොම්නස් දෙදෙනා දුරුකිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ෂාවගේද සිහියගේද පිරිසිදු භාවය ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කෙරේද මහණෙනි, මෙය සම්‍යක් සමාධියයි කියනු ලැබේ. මහණෙනි, මෙය (දුක් නැතිකිරීම සඳහා පිළිපැදීම නම්වූ) දුඃඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාආර්‍ය්‍ය සත්‍යයයි කියනු ලැබේ.

මෙසේ තමන්තුළවූ (චතුරාර්‍ය්‍ය සත්‍ය) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. අනුන් පිළිබඳවූ (චතුරාර්‍ය්‍යසත්‍ය) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. තමන් පිළිබඳවූ හා අනුන් පිළිබඳවූ (චතුස්සත්‍ය) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින්

වාසය කරන්නේය. (චතුරාර්‍ය්‍ය සත්‍යය) ධර්මයන්ගේ ඇතිවීමට හේතුවූ (ප්‍රත්‍යය) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. (චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන්ගේ) විනාශයට හේතුවූ (ප්‍රත්‍ය) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසයකරන්නේය. කලෙක චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන්ගේ උත්පත්තියද කලෙක විනාශයද දක්නේ හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්වපුද්ගල නොව) චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයෝ ඇත්තාහ යන එළඹසිටි සිහිය ඇත්තේවෙයි. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද සිහියගේ වැඩීමපිණිසද පවතී. (ඒ භික්ෂුව) කෙලෙසුන් කරණ කොට කිසිවක් ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය. ලෝකයෙහි කිසිවක් (ආත්මවශයෙන්) නොගනී. මහණෙනි, මෙසේ භික්ෂුව (චතුරාර්‍ය්‍ය සත්‍ය) ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය.

**22.** මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨාන ධර්මයන් සත් අවුරුද්දක් මුළුල්ලෙහි මෙසේ වඩන්නේ නම් මේ ආත්මයේදීම අර්හත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාර ඵලයන් අතුරෙන් එක්තරා ඵලයකට පැමිණීම කැමතිවිය යුතුය. (ලැබිය යුතුය)

මහණෙනි, සත්වර්ෂයක් කල් තිබේවා, මහණෙනි, යම්කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් හය අවුරුද්දක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම්, මේ ආත්මයේදීම රහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාර ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුය. (ලැබිය යුතුය)

මහණෙනි, සාවුරුද්දක් කල් තිබියේවා යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් පස් අවුරුද්දක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් මේ ආත්මයේදීම රහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාර ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුය. (ලැබිය යුතුය)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මහණෙනි, පස් වසක් කල් තිබේවා. මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් සතර අවුරුද්දක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් මේ ආත්මයේදීම රහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇතිකල්හි අනාගාමි ඵලයට පැමිණීම යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුය. (ලැබිය යුතුය)

මහණෙනි, සතර අවුරුද්දක් තිබේවා, මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් තුන් අවුරුද්දක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් මේ ආත්මයේදීම රහත් බවට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුය.

මහණෙනි, තුන් අවුරුද්දක් තිබේවා. මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් අවුරුදු දෙකක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් මේ ආත්මයේදීම රහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි. (ලැබිය යුතුය)

මහණෙනි, අවුරුදු දෙකක් තිබේවා. මහණෙනි, යම්කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් එක් අවුරුද්දක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් මේ ආත්මයේදීම රහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරිබවක් ඇති කල්හි අනාගාමී ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි. (ලැබිය යුතුය)

මහණෙනි, එක් අවුරුද්දක් තිබේවා, මහණෙනි යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨාන ධර්මයන් සත් මසක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් මේ ආත්මයේදීම රහත්ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි. (ලැබිය යුතුය)

මහණෙනි, සත් මසක් කල් තිබේවා. මහණෙනි, යම්කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් හය මසක් මුළුල්ලෙහි

මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන මේ දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි. (ලැබිය යුතුය)

මහණෙනි, හය මාසයක් තිබේවා, මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් පස්මසක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරිබවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමැතිවිය යුතුයි. (ලැබිය යුතුය)

මහණෙනි, පස් මාසයක් තිබේවා. මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් සාරමසක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමැතිවිය යුතුය. (ලැබිය යුතුය)

මහණෙනි, සාරමසක් තිබේවා. මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් තුන්මාසයක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි වීමක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමැතිවිය යුතුය. (ලැබිය යුතුය)

මහණෙනි, තුන්මාසයක් තිබේවා. මහණෙනි, යම් කිසිවෙක් මේ සතරසතිපට්ඨානයන් මාසදෙකක් මුළුල්ලෙහි මෙසේ භාවනාකරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරිබවක් ඇතිකල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමැති විය යුතුය. (ලැබිය යුතුය)

මහණෙනි, මාස දෙකක් තිබේවා. මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් එක මාසයක් මුළුල්ලෙහි මෙසේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුය. (ලැබිය යුතුය)

මහණෙනි, මාසයක් තිබේවා. මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨාන ධර්මයන් පසළොස් දිනක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම අර්හත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරිවීමක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමැති විය යුතුය. (ලැබිය යුතුය)

මහණෙනි, පසළොස් දිනක් තිබේවා, මහණෙනි, යම්කිසිවෙක් මේ සතර සතිපට්ඨාන ධර්මයන් සත් දවසක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම අර්හත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමැතිවිය යුතුයි. (ලැබිය යුතුය.)

මහණෙනි, රාගාදි කෙලෙස් නැතිව සත්වයන්ගේ පිරිසිදු වීම පිණිසද ශෝක පරිදෙව දුඃඛයන්ගේ දුරුකිරීම පිණිසද දුක් දොම්නස් නැතිකිරීම පිණිසද ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයාගේ ලැබීම පිණිසද, නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද යම් මේ සතර සතිපට්ඨාන ධර්මයෙක් ඇද්ද එය එකම මාර්ගය වන්නේයයි මෙසේ යම් ඒ ධර්මයක් වදාරණ ලද්දේද මේ ධර්මය ඒ කාරණ පිණිස වදාරණ ලද්දේය.

භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්සේ මේ සතරසතිපට්ඨාන සූත්‍ර ධර්ම දේශනාව මෙසේ දේශනා කොට වදාළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම කථාව සතුටින් පිළිගත්හ.

**මහා සතිපට්ඨාන සූත්‍රය නිමියේය.**

---

# 23. පායාසි සූත්‍රය.

මා විසින් මේ සූත්‍රය මෙසේ අසන ලදී. එක් කලෙක ආයුෂ්මත්වූ කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ භික්ෂූන් පන්සියයක් පමණවූ මහත් භික්ෂුසංඝයා සමග කොසොල් ජනපදයෙහි සැරිසරා වඩින සේක් කොසොල් ජනපද වාසීන්ගේ සෙතව්‍යා නම් නුවර යම් තැනකද එතැනට පැමිණියහ. එහි වූකලී ආයුෂ්මත් කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ සෙතව්‍යා නම් නුවරට උතුරු දිශාවෙහිවූ ඇට්ටේරිය වනයෙහි වසන්නාහ.

ඒ කාලයෙහි පායාසි නම් රාජන්‍යයා (උප රජු) පසේනදි කොසොල් රජු විසින් දෙන ලද නොයෙක් සතුන්ගෙන් ගැවසී ගත්තාවූ, තණ, දර දිය හා ධාන්‍ය (වී ආදිය) සහිතවූ, රජු ගෙන් ලබනලද හෙයින් අනුභව කළයුතුවූ, රජුගේ තෑග්ගක්වූ උසස් වශයෙන් දෙනලද සෙතව්‍යා නම් නුවර අධිපතිව වසයි.

2. එකල්හි පායාසි රාජන්‍යයාට (උප රජුට) මේ මේ කාරණයෙන් (මෙලොව මිස) පරලොවක් නැත. මැරී උපදිනා (ඕපපාතික) සත්වයෝ නැත්තාහුය. කුසල අකුසල කර්මයන් ගේ ඵල විපාකයක් නැත්තේයයි මෙබඳුවූ ලාමක දෘෂ්ටියක් (පහත් දැකීමක්) උපන්නේ වෙයි.

ඉක්බිති සෙතව්‍යා නුවර වැසි බ්‍රාහ්මණ ගෘහපතීහු, "පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකවූ (ගොලයෙක්වූ) කුමාර කාශ්‍යප ශ්‍රමණයෝ පන්සියයක් පමණ භික්ෂූන්වූ මහත් භික්ෂු සංඝයා සමග කොසොල් ජනපදයෙහි සැරිසරා යමින් සෙතව්‍යා නුවරට පැමිණ සෙතව්‍යා නුවර ලඟවූ සෙතව්‍යා නුවරට උතුරු දිශාවෙහිවූ ඇට්ටේරිය වනයෙහි වාසය කරන්නාහ. ඒ කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පණ්ඩිතය, කථාවෙහි දක්ෂය, නුවණ ඇත්තේය. බොහෝ උගත්ය. ලක්ෂණ කථා ඇත්තේය. යහපත් වැටහීම් ඇත්තේය. දියුණුවූ නුවණ ඇත්තේය. රහත් බවෙන්ද යුක්තයහ" යි ඒ පින්වත් කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පිළිබඳවූ මෙබඳු මහත් කීර්ති ශබ්දයක්

පැන නැංගේය. එබඳු රහතුන්ගේ දැකීම යහපත්ය යන මේ කාරණය ඇසුවාහුය.

ඉක්බිති සෙතව්‍යා නුවර වැසි බ්‍රාහ්මණ ගෘහපතිකයෝ රාශි රාශිව සමූහ සමූහව සෙතව්‍යා නුවරින් නික්ම උතුරු දෙසට හැරී ඇට්ටේරිය වනය යම් තැනකද එතැනට පැමිණෙත්.

3. එවේලෙහි පායාසි රාජන්‍යතෙමේ ප්‍රාසාදයේ උඩුමහල් තලයෙහි දවල් නින්දට පැමිණියේ වෙයි. එවිට රාශි රාශිව සමූහ සමූහව සෙතව්‍යා නුවරින් නික්ම උතුරුදෙසට හැරී ඇට්ටේරිය වනය යම් තැනකද එතැනට යන්නාවූ සෙතව්‍යා නගර වාසී බ්‍රාහ්මණ ගෘහපතියන් පායාසි රාජන්‍යතෙමේ දුටුවේය. දැක, ඇසූ ප්‍රශ්නයට උත්තර දීමෙහි දක්ෂවූ ඛත්ත නම් අමාත්‍යයාට කථා කළේය. පින්වත් ඛත්තය සෙතව්‍යා නුවරවාසී බ්‍රාහ්මණගෘහපතිකයෝ බොහෝසෙයින් රැස්වූ සමූහයා ඇතිව එක්ව සෙතව්‍යා නුවරින් නික්ම උතුරු දිශාවට හැරී ඇට්ටේරිය වනය යම් තැනකද එහි කුමට යද්දැයි ඇසුවේය. පින්වත, එයට කාරණයක් ඇත්තේය. ගෞතම ශ්‍රමණයන්ගේ ශ්‍රාවකවූ කුමාරකාශ්‍යප නම් ශ්‍රමණ තෙමේ පන්සියයක් පමණ මහත්වූ භික්ෂු සංඝයා සමග කොසොල් ජනපදයෙහි සැරිසරා යමින් සෙතව්‍යා නගරයට පැමිණ, සෙතව්‍යා නුවර සමීපයෙහි ඒ සෙතව්‍යා නුවරට උතුරු දිශාවෙහිවූ ඇට්ටේරිය වනයෙහි වාසය කරයි. ඒ කුමාරකාශ්‍යප ස්ථවිර තෙම පණ්ඩිතය, නුවණ ඇත්තේය, බොහෝ උගත්ය, ලක්ෂණ කථා ඇත්තේය, වැඩුනු නුවණින් හා අර්හත්වයෙන්ද යුක්තයයි ඒ පින්වත් කුමාර කාශ්‍යප ස්ථවිරයන් පිළිබඳව මෙබඳු කීර්ති ශබ්දයක් පැන නැංගේය. ඒ පින්වත් කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ දැකීම පිණිස ඔවුහු යන්නාහයි කීය.

එසේ වීනම් පින්වත් ඛත්තය සෙතව්‍යා නගර වාසී බ්‍රාහ්මණ ගෘහපතීන් යම් තැනකද එතැනට යව. ගොස් සෙතව්‍යා නගර වාසී බ්‍රාහ්මණ ගෘහපතීන්ට මෙසේ කියව. පින්වත්නි, පායාසි රාජන්‍ය තෙමේ මෙසේ කියයි. පායාසි රාජන්‍යතෙමේද කුමාරකාශ්‍යප මහණහු දැකීමට එන්නේය. පින්වත්හු ඒ තාක්

නවතිත්වායි" කියායි. 'කුමාරකාශ්‍යප ශ්‍රමණ තෙමේද නුවණ නැති (මෝඩවූ) කථාවෙහි අදක්ෂවූ සෙතව්‍යා නගර වැසි බ්‍රාහ්මණ ගෘහපතියන්ට මේ මේ කාරණයෙන් පරලොවක් ඇත්තේය, (මැරී උපදින) ඔපපාතික සත්වයෝ ඇත්තාහුය. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක ඇත්තේයයි අවබෝධ කරවයි. පින්වත් ඛත්තය, පරලොවක් නැත්තේය. මැරී උපදින (ඔපපාතික) සත්වයෝ නැත්තාහුය. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාකයක් නැත්තේය" යි කීය. එවිට ඒ ඛත්ත නම් ඇමතියා 'පින්වත එසේය'යි පායාසි රාජන්‍යාගේ වචනය පිළිගෙන සෙතව්‍යා නුවර වැසි බ්‍රාහ්මණ ගෘහපතීන් යම් තැනකද එතැනට ගියේය. ගොස් සෙතව්‍යා නුවර වැසි බ්‍රාහ්මණ ගෘහපතීන්ට මේ කාරණය කීයේය. පින්වත්නි, පායාසි රාජන්‍ය තෙමේ මෙසේ කියයි.

"පායාසි රාජන්‍යතෙමේද කුමාරකාශ්‍යප මහණහු දැකීමට එන්නේය. පින්වත්හු ඒතාක් නවතිත්වා" කියායි.

4. ඉක්බිති පායාසි රාජන්‍යතෙමේ සෙතව්‍යා නගර වාසී බ්‍රාහ්මණ ගෘහපතීන් විසින් පිරිවරන ලදුව ඇට්ටේරිය වනය යම් තැනකද, ආයුෂ්මත් කුමාරකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු වියයුතුවූද සිහි කටයුතුවූද කථාව කොට නිමවා එක පැත්තක උන්නේය. සෙතව්‍යා නගරවාසී බ්‍රාහ්මණ ගෘහපතීන්ගෙන්ද සමහර දෙනෙක් ආයුෂ්මත් කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ හොඳින් වැඳ එක පැත්තක උන්නාහුය. සමහර දෙනෙක් ආයුෂ්මත් කුමාරකාශ්‍යප ස්ථවිරයන් සමග සතුටු වූවාහුය. සතුටු විය යුතුවූද, සිහි කටයුතුවූද, කථාකොට නිමවා එක පැත්තක උන්නාහුය. සමහරු ආයුෂ්මත් කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ යම් තැනකද ඒ දෙසට ඇඳිලි බැඳගෙන එක පැත්තක උන්නාහුය. සමහරු තමන්ගේ නම් ගොත් කියා එක පැත්තක උන්නාහුය. සමහරු නිශ්ශබ්දවම එක පැත්තක උන්නාහුය.

5. එක පැත්තක උන්නාවූ පායාසි රාජන්‍යතෙමේ ආයුෂ්මත් කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට මේ කාරණය කීය. පින්වත්

කාශ්‍යපය, මම වනාහි මෙසේ කියන්නෙක්මි මෙබඳු දැකීම් (දෘෂ්ටි) ඇත්තෙක්මි. (කෙසේද) මේ මේ කාරණයෙන්ද පරලොවක් නැත්තේය. මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේය කියායි. 'රාජන්‍යය මම වනාහි මේ මේ කාරණයෙන්ද පරලොවක් නැත, මැරී උපදින සත්වයෝද නැත්තාහුය, කරන ලද කුසල අකුසල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි මෙසේ කියන්නෙකු හෝ දැකීම් ඇත්තෙකු හෝ නොදුටුවෙමි නොඇසුවෙමි. කෙසේ නම් මෙසේ කියන්නේද? රාජන්‍යය එසේ වීනම් මේ කාරණය තගෙන්ම අසන්නෙමි. යම් විදියකින් තට වැටහෙන්නේද ඒ විදියට උත්තර දෙව.

රාජන්‍යය ඒ කුමකැයි සිතන්නෙහිද? මේ චන්ද්‍ර සූර්‍ය්‍යයෝ මේලොකයෙහි හෝ වෙද්ද? පරලොකයෙහි හෝ වෙද්ද? ඔවුහු දෙවියෝ හෝ වෙද්ද? මනුෂ්‍යයෝ හෝ වෙද්දැයි" ඇසූහ. එවිට රාජන්‍යතෙමේ "පින්වත් කාශ්‍යපය, මේ චන්ද්‍ර සූර්‍ය්‍යයෝ පරලොකයෙහි වෙත්. මේ ලොකයෙහි නොවෙත්. මේ චන්ද්‍ර සූර්‍ය්‍යයෝ දෙවියෝ වෙත්, මනුෂ්‍යයෝ නොවෙත්" යයි කීය, "රාජන්‍යය මේ කාරණයෙන්ද තට මෙබඳු සිතක් ඇතිවේවා මේ කාරණයෙන්ද පරලොවක් ඇත්තේය, මැරී උපදින සත්වයෝ ඇත්තාහුය. කරන ලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක ඇත්තේය" කියායි.

**6.** "පින්වත්වූ කාශ්‍යපයෝ යම් කාරණයක් සලකා මෙසේ කියත්ද. එහෙත් මේ කාරණයෙහි මගේ අදහස මෙසේයි. මේ කාරණයෙන්ද පරලොවක් නැත. මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේය" කියායි.

"රාජන්‍යය මේ කාරණයෙන්ද පරලොවක් නැත්තේය. මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි තට යම් කාරණයකින් මෙබඳු සිතක් ඇතිවේද ඊට කාරණයක් ඇත්තේදැයි" ඇසූහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"පින්වත් කාශ්‍යපය මේ කාරණයෙන්ද පරලොවක් නැත්තේය. මැරී උපදින සත්වයෝ නැත්තාහුය. කරන ලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේය'යි කියා යම් කාරණයකින් මට මෙබඳු සිතක් වේද ඊට කාරණයක් ඇත්තේය"යි කීය.

"රාජන්‍යය ඒ කිනම් කාරණයක්ද?"

"පින්වත් කාශ්‍යපය, සතුන් මරන්නාවූද, සොරකම් කරන්නාවූද, වැරදිලෙස කාමයෙහි හැසිරෙන්නාවූද, බොරු කියන්නාවූද, පරුෂවචන කියන්නාවූද, හිස්වචන කියන්නාවූද විෂම ලොභය ඇත්තාවූද, ක්‍රොධ සිත් ඇත්තාවූද, මිථ්‍යාදෘෂ්ටි (වැරදි දැකීම්) ඇත්තාවූද, මාගේ දන්නා අඳුනන අයද සහ ලේනෑයෝද ඇත්තාහ. ඔවුහු පසුකලෙක ලෙඩවූවාහු දුකට පැමිණියාහු දැඩිගිලන් බැව් ඇත්තාහු වෙද්ද මොව්හු මේ අසනීපයෙන් නොනැගිටින්නාහුයයි' (සුවපත් නොවන්නාහු යයි) යම් කලක මම දනිම්ද, එකල මම ඔවුන් ලඟට ගොස් මෙසේ කියමි. පින්වත්නි යම් ඒ සත්ව කෙනෙක් සතුන් මරන්නෝද සොරකම් කරන්නෝද වැරදිලෙස කාමයන්හි හැසිරෙන්නෝද බොරු කියන්නෝද, කේලාම් කියන්නෝද, පරුෂ වචන කියන්නෝද, ක්‍රොධසිත් ඇත්තාහුද මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූද, ඔවුහු ශරීරය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොරවූ නපුරු ගති ඇත්තාවූ, නපුරුකොට වැටීමක් ඇති නරකයෙහි උපදින්නාහුයයි කියන්නාවූ, මෙබඳු දැකීම් ඇත්තාවූ සමහර ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහුය.

පින්වත්හු සතුන් මරන්නෝය, සොරකම් කරන්නෝය, කාමයන්හි වරදවා හැසිරෙන්නෝය, බොරු කියන්නෝය, කේලාම් කියන්නෝය, පරුෂ වචන කියන්නෝය, හිස් වචන කියන්නෝය, විෂම ලෝභය බහුල කොට ඇත්තාහුය. ක්‍රොධ සිත් ඇත්තාහුය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහුය, ඉදින් ඒ පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ කීම ඇත්ත නම්, මේ පින්වත්හු ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි සැපතින් පහවූ, නපුරුකොට වැටීමක් ඇත්තාවූ නරකයෙහි උපදින්නාහුය.

පින්වත්නි, ඉදින් ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි සැපතින් පහවූ, නපුරු ගති ඇත්තාවූ, නපුරුකොට වැටීමක් ඇති නරකයෙහි උපදින්නාහු නම්, මේ කාරණයෙන්ද පරලොව ඇත්තේය, මැරී උපදින සත්වයෝ ඇත්තාහ, කරන ලද කුසල අකුසල කර්මයන්ගේ විපාක ඇත්තේයයි යම් පරිද්දෙකින් මා කරා අවුත් දන්වව්. පින්වත්හු මට ඇදහියයුතු වචන ඇත්තාහුය. විශ්වාස කටයුතු වචන ඇත්තාහුය. පින්වතුන් විසින් යමක් දක්නා ලදද මෙය මෙසේ වන්නේයයි තමා විසින්ම දක්නා ලද්දකි කියායි. ඔවුහු මාගේ වචනය පිළිගෙන (මැරීගොස් නැවත) අවුත් නොකියත්. පණිවුඩ කාරයෙකු හෝ නොඑවත්. පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ, කරන ලද කුසල අකුසල කර්මයන්ගේ විපාක නැත්තේයයි කියා යම් කාරණයකින් මට මෙබඳු සිතක් ඇතිවේද මෙයද ඊට එක් කරුණක් වේයයි" කීය.

7. "රාජන්‍යය එසේනම් මේ කාරණය තාම විචාරන්නෙමි (තගෙන්ම අසන්නෙමි) යම් පරිද්දකින් තට කැමති වන්නේද, එපරිද්දෙන් එය කියව, රාජන්‍යය ඒ කුමකැයි සිතන්නේද මෙහි තාගේ පුරුෂයෝ අපරාධ කරන්නවුන් අල්වාගෙන 'ස්වාමීනි මොහු අපරාධ කරන්නාවූ සොරෙක යම් දඬුවමක් කැමැත්තෙහිද මොහුට එය පමුණුවන්න' කියා දක්වන්නාහු නම් එකල ඔබ ඒ පුරුෂයන්ට මෙසේ කියන්නෙහිය. "පින්වත්නි එසේනම් මේ පුරුෂයා දැඩිවූ රැහැණින් අත්දෙක පිටි අතට තියා තදින් බැඳ දැලිපිහියෙන් හිස මුඬු කොට නපුරුවූ නාදඇති වදබෙර ගසමින් වීදියෙන් වීදියටද, සතරමං සන්ධියෙන් සතරමං සන්ධියටද, ගෙනගොස් දකුණු දොරෙන් නික්මවා නුවරට දකුණු දිගින් පිහිටි (මිණිසුන්) මරණතැනදී හිස් කපව්" යයි කියායි. ඔවුහු යහපතැයි පිළිගෙන ඒ සොරා දැඩිවූ රැහැණින් අත්දෙක පිටිකරට තියා තදින් බැඳ දැළි පිහියෙන් හිස මුඬු කොට, නපුරු නාද ඇති වදබෙර ගසමින් වීදියෙන් වීදියටද, සතරමං සන්ධියෙන් සතරමං සන්ධියටද ගෙන ගොස් දකුණු දොරින් නික්මවා නුවරට දකුණු දිගින් පිහිටි (මිනිසුන්) මරණ ගැන හිඳුවන්නාහු නම් ඒ සොරා සොරු මරන්නන්ට, පින්වත් චොරඝාතකයනි, අසවල්

ගමෙහි හෝ නියම් ගමෙහි හෝ මගේ දන්නා අඳුනන්නෝද සහ ලේ නෑයෝද ඇත්තාහුය. යම්තාක් මම ඔවුන්ට (තමන්ද තැන්පත් කළයුතු බඩුද) දක්වා එම්ද ඒතාක් නවතිත්වායි කියානම් ඔහුට ඊට ඉඩලැබේද, නැතහොත් චොරඝාතකයන් විසින් ඔහු විලාප කියද්දීම හිස සිඳ දමනු ලබද්දැ”යි (ඇසූහ)

පින්වත් කාශ්‍යපය, ඒ සොරා සොරු මරන්නන්ට පින්වත් චොරඝාතකයෙනි, අසවල් ගමෙහි හෝ අසවල් නියම් ගමෙහි හෝ මාගේ දන්නා අඳුනන්නෝද සහ ලේ නෑයෝද ඇත්තාහුය. යම්තාක් කල් මම ඔවුන්ට (තමන්ද, තැන්පත් කළයුතු බඩුද) දක්වා එම්ද ඒතාක් කල් නවතිත්වා”යි කියාද, ඔහු අවකාශයක් නොලබන්නේය. එකල්හි ඔහු විලාප කියද්දීම චොරඝාතකයෝ හිස සිඳින්නාහුය”යි කීය, රාජන්‍යය ඒ සොරාද මනුෂ්‍යයෙකි. මනුෂ්‍යවූ චොරඝාතකයන්ගෙන්, පින්වත් චොරඝාතකයෙනි, අසවල් ගමෙහි හෝ අසවල් නියම් ගමෙහි හෝ මගේ දන්නා අඳුනන්නෝද සහ ලේ නෑයෝද ඇත්තාහ. මම යම්තාක් (තමන්ද, තැන්පත්කළ යුතු බඩුද) දක්වා එම්ද ඒතාක් කල් ඉවසත්වායි ඉඩක් නොලබන්නේනම්, කිමෙක්ද සතුන් මරන්නාවූ, සොරකම් කරන්නාවූ, කාමයන්හි වරදවා හැසිරෙන්නාවූ, බොරු කියන්නාවූ කේලාම් කියන්නාවූ, පරුෂ වචන කියන්නාවූ හිස් වචන කියන්නාවූ, විෂම ලොභය බහුලකොට ඇත්තාවූ, ක්‍රොධ සිත් ඇත්තාවූ මිථ්‍යාදෘෂ්ටිකවූ තගේ දන්නා අඳුනන්නෝද සහ ලේ නෑයෝද ශරීරය බිඳීමෙන් මරණින්මත්තෙහි සැපතින් පහවූ, නපුරුලෙස වැටෙන්නාවූ නරකයෙහි උපන්නාහු, නිරය පාලයන්ගෙන්, පින්වත් නිරයපාලයෙනි, යම්තාක් කල් අපි පායාසි රාජන්‍යයා ලඟට ගොස්, මේ කාරණයෙන්ද පරලොව ඇත්තේය, මැරී උපදින සත්වයෝ ඇත්තාහ, කරන ලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක ඇත්තේයයි කියා ඔහුට දන්වන්නමෝද ඒතාක් කල් බලාපොරොත්තු වෙත්වායි කෙසේ නම් ඉඩක් ලබන්නාහුද? රාජන්‍යය තොපට මේ කාරණයෙන්ද පරලොවක් ඇත්තේය, මැරී උපදින සත්වයෝ ඇත්තාහ. කරණලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක ඇත්තේය යන මෙබඳු සිතක් ඇතිවේවායි කීහ.

8. පින්වත්වූ කාශ්‍යප තෙමේ කොහොම නමුත් මෙසේ කියයි. එහෙත් මේ කාරණයෙහි මගේ අදහස මෙබඳු වෙයි. මේ කාරණයෙන්ද පරලොවක් නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරන ලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේය යනුවෙනි. රාජන්‍යය නම් කාරණයෙන්ද පරලොවක් නැත්තේය. මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරණලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේය කියා යම් කරුණකින් තොපට මෙබඳු සිතක් ඇතිවේද ඊට කාරණයක් ඇත්තේදැයි (කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ඇසූහ)

පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොවක් නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරන ලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේය කියා යම් කාරණයකින් මට මෙබඳු සිතක් ඇතිවේද, ඊට කාරණයක් ඇත්තේයයි කීය.

"රාජන්‍යය ඒ කවර කරුණක් දැ"යි ඇසූහ.

පින්වත් කාශ්‍යපය මෙහි සතුන් මැරීමෙන් වැළකුනාවූ, සොරකම් කිරීමෙන් වැළකුනාවූ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාවූ කේලාම් කීමෙන් වැළකුනාවූ පරුස වචන කීමෙන් වැළකුනාවූ බහුලවූ විසම ලොභය නැත්තාවූ ක්‍රොධ සහිත සිත් නැත්තාවූ සම්‍යක් දෘෂ්ටි (හරි දැකීම්) ඇත්තාවූ මගේ දන්නා අඳුනන්නන් හා සහ ලේ නෑයෝ වෙද්ද, ඔවුහු පසු කාලයෙක අසනීප වූවාහු දුකට පැමිණියාහු, දැඩි ගිලන් බැව් ඇත්තාහු වෙද්ද, යම් කලක මොවුහු දැන් මේ ආබාධයෙන් නොනැගිටින්නාහුයයි දනිම්ද, එකල මම ඔවුන් ලඟට ගොස් මෙසේ කියමි. පින්වත්නි යම් ඒ කෙනෙක් සතුන් මැරීමෙන් වැළකුනාහුද, සොරකම් කිරීමෙන් වැළකුනාහුද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාහුද, බොරු කීමෙන් වැළකුනාහුද, කේලාම් කීමෙන් වැළකුනාහුද, පරුස වචන කීමෙන් වැළකුනාහුද, හිස් වචන කීමෙන් වැළකුනාහුද, බහුලවූ විෂම ලොභය නැත්තාහුද, ක්‍රොධ සිත් නැත්තාහුද, සම්‍යක්දෘෂ්ටි ඇත්තාහුද ඔවුහු ශරීරය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති

ඇත්තාවූ දිව්‍ය ලොකයෙහි උපදින්නාහුයයි මෙසේ කියන්නාවූ, මෙසේ දෘෂ්ටි ඇත්තාවූ සමහර ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ඇත්තාහුමය.

පින්වත්හු වනාහි සතුන් මැරීමෙන් වැළකුනාහුය. සොරකම් කිරීමෙන් වැළකුනාහුය කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාහුය. බොරු කීමෙන් වැළකුනාහුය. කේලාම් කීමෙන් වැළකුනාහුය, පරුස වචන කීමෙන් වැළකුනාහුය, හිස් වචන කීමෙන් වැළකුනාහුය, බහුලවූ විෂම ලොභය නැත්තාහුය, ක්‍රොධ සිත් නැත්තාහුය. සම්‍යක්දෘෂ්ටි ඇත්තාහුය. ඉදින් ඒ පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයන්ගේ වචනය ඇත්ත නම් පින්වත්හු ශරීරය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදින්නාහුය.

පින්වත්නි ඉදින් ශරීරය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදින්නාහු නම්, යම් හෙයකින් මේ කරුණින්ද පරලොවක් ඇත්තේය, මැරී උපදින සත්වයෝ ඇත්තාහුය, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක ඇත්තේයයි මා කරා පැමිණ මට කියන්නාහු නම් යහපති. පින්වත්හු වනාහි ඇදහිය යුතු වචන ඇත්තාහුය. විශ්වාස කටයුතු වචන ඇත්තාහුය. පින්වතුන් විසින් යමක් දක්නා ලද්දේ නම් එය තමා විසින්ම දක්නා ලද්දක් හෙයින් එසේම වන්නේයයි කියාය. ඔවුහු "හොඳයි" කියා මාගේ වචන පිළිගෙන (නැවත මා වෙත) අවුත් නොම දන්වත්, පණිවිඩ කාරයෙකුත් නොම එවත්.

පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොවක් නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේය'යි මට මෙබඳුවූ අදහසක් වේද, මේද ඊට එක් කරුණකියි කීය.

**9.** රාජන්‍යය එසේ වීනම් තොපට (මේ කාරණය ගැන) උපමාවක් කරන්නෙමි. මේ ලොකයෙහි සමහර නුවණ ඇති පුරුෂයෝ උපමාවෙන්ද කියන ලද වචනයේ තේරුම දැන ගනිත්.

රාජන්‍යය යම්සේ පුරුෂයෙක් අසුචි වලක හිසත් සමගම ගිලුනේ වේද එකල තොපි පින්වත්නි! එසේවීනම් ඒ පුරුෂයා අසුචි වළෙන් ගොඩ ගනිව්යයි (තොපගේ) පුරුෂයන්ට අණකරන්නහුය. ඔවුහු යහපතැයි උත්තරදී අසුචි වළෙහි ගිලුණාවූ ඒ පුරුෂයා අසුචි වළෙන් ගොඩ ගන්නාහුය, එවිට තොපි, පින්වත්නි, එසේ වීනම් ඒ පුරුෂයාගේ ශරීරයෙහි අසුචි උණ පතුරුවලින් හොඳින් ඉවත් කරව්යි කියා (තොපගේ) පුරුෂයන්ට කියන්නහුය, ඔවුහු යහපතැයි උත්තරදී ඒ පුරුෂයාගේ ශරීරයෙහිවූ අසුචි උණ පතුරුවලින් හොඳින් ඉවත් කරන්නාහුය. එවිට තොපි ඔවුන්ට පින්වත්නි, එසේ වීනම් ඒ පුරුෂයාගේ ශරීරය පඬුවන් මැටියෙන් තුන්වරක් හොඳින් අතුල්ලව්යි කියන්නහුය. ඔවුහු ඒ පුරුෂයාගේ ශරීරය පඬුවන් මැටියෙන් තුන්වරක් අතුල්ලන්නාහුය. එවිට තොපි ඔවුන්ට මෙසේ කියන්නහුය.

පින්වත්නි, එසේ වීනම් ඒ පුරුෂයා තෙල් ගල්වා සියුම් චූර්ණයෙන් තුන්වරක් හොඳින් සුද්ධ කරව්යි කියන්නහුය. ඔවුහු ඒ පුරුෂයා තෙල් ගල්වා සියුම්වූ චූර්ණයෙන් තුන්වරක් හොඳින් ශුද්ධ කරන්නාහුය. නැවත තොපි ඒ පුරුෂයන්ට මෙසේ කියන්නහුය. පින්වත්නි, එසේ වීනම් ඒ පුරුෂයාගේ ඉසකේ හා දැළි රැවුල් කපා සරසව්යයි කියාය. ඔවුහු ඒ පුරුෂයාගේ ඉසකේ හා දැළි රැවුල් කපා සරසන්නාහුය. නැවත තොපි ඔවුන්ට මෙසේ කියන්නහුය. පින්වත්නි, එසේ වීනම් ඒ පුරුෂයාහට මාහැඟිවූ මල්ද, මාහැඟිවූ සුවඳ විලවුන්ද මාහැඟිවූ ඇඳුම්ද ගෙන දෙව්යයි කියායි. ඔව්හු ඒ පුරුෂයාට මාහැඟිවූ මල්ද, මාහැඟිවූ සුවඳවිලවුන්ද මාහැඟිවූ ඇඳුම්ද ගෙන දෙන්නාහුය.

තොපි ඔවුන්ට මෙසේ කියන්නහුය, පින්වත්නි, එසේ වීනම් ඒ පුරුෂයා ප්‍රාසාදයට නංවා පස්කම් සැප පිළියෙල කර දෙවයි කියාය. ඔවුහු ඒ පුරුෂයා ප්‍රාසාදයට නංවා පස්කම් සැප සූදානම් කර දෙන්නාහ. රාජන්‍යය ඒ කුමකැයි සිතන්නෙහිද? කිමෙක්ද? හොඳින් ඉස්නානය කරනලද්දාවූ, හොඳින් සුවඳ සුණු තවරණ ලද්දාවූ ඉසකේ හා දැළිරැවුල් කපා සරසන ලද්දාවූ, මල් හා

ආභරණ පළඳින ලද්දාවූ, සුදු වස්ත්‍ර අඳින ලද්දාවූ, උතුම්වූ ප්‍රාසාදයේ උඩුමහල් තලයට පැමිණියාවූ, පංචකාම සැපයෙන් පිනාගියාවූ, එයින්ම යුක්තවූ ඒ පුරුෂයා නැවතත් අසුචි වළෙහි ගිලෙන්ට කැමති වන්නේදැයි ඇසූහ. පින්වත් කාශ්‍යපය, එසේ කැමති නොවන්නේය. ඊට කාරණා කවරේද? පින්වත් කාශ්‍යපය, අසුචි වළ මනාප නොවෙයි අසුචියක්ම වෙයි. දුර්ගන්ධ වෙයි. දුර්ගන්ධයයි සම්මත වූයේද වෙයි, පිළිකුල් කටයුතු වෙයි. පිළිකුල්යයි සම්මත වූයේද වෙයි. දැකීමෙන්ම පිළිකුල් වෙයි. දැකීමෙන් පිළිකුල්යයි සම්මත වූයේද වේයයි කීය.

රාජන්‍යය එමෙන්ම මනුෂ්‍යයෝ දෙවියන්ට අසුචියක් වෙයි, අසුචියකැයි සම්මත වෙත්, දුර්ගන්ධ වෙත්, දුර්ගන්ධයයි සම්මතවෙත්, පිළිකුල් කටයුතු වෙත්, පිළිකුල් කටයුතුයයි සම්මතවෙත්, දැකීමෙන්ම පිළිකුල්වෙත්, දැකීමෙන්ම පිළිකුල් කටයුතුයයි සම්මත වෙත්. රාජන්‍යය, යොදුන් සියයක් දුර මනුෂ්‍ය ගඳ දෙවියන්ට පීඩා කරයි. කිමෙක්ද? සතුන් මැරීමෙන් වැළකුනාවූ සොරකම් කිරීමෙන් වැළකුනාවූ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාවූ, බොරු කීමෙන් වැළකුනාවූ, කේලාම් කීමෙන් වැළකුනාවූ, නපුරු වචන කීමෙන් වැළකුනාවූ, හිස් වචන කීමෙන් වැළකුනාවූ, විෂම ලොභය බහුලකොට නැත්තාවූ, ක්‍රොධ සිත් නැත්තාවූ, සම්‍යක්දෘෂ්ටි ඇත්තාවූ තොපගේ දන්නා අඳුනන්නෝද සහ ලේ නෑයෝද ශරීරය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලොකයෙහි උපන්නාහු මේ කාරණයෙන්ද පරලොව ඇත්තේය. මැරී උපදින සත්වයෝ ඇත්තාහුය. කරනලද කුසල අකුසලයන්ගේ ඵල විපාක ඇත්තේයයි කෙසේ නම් ඇවිත් දන්වන්නාහුද? රාජන්‍යය මේ කාරණයෙන්ද පරලොව ඇත්තේය, මැරී උපදනා සත්වයෝ ඇත්තාහ, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක ඇත්තේය යන මෙබඳු සිතක් තොපට වේවායි කීය.

**10.** කෙසේ හෝ පින්වත් කාශ්‍යපයෝ මෙසේ කියන්නාහුය. එසේ වුවත්, මේ කාරණයෙහි මගේ අදහස මෙබඳු වෙයි. මේ කාරණයෙන්ද පරලොව නැත. මැරී උපදින සත්වයෝ නැත්තාහ.

කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි කියායි.

රාජන්‍යය, මේ කරුණින්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහුය. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි යම් කරුණකින් තොපට මෙබඳු සිතක් ඇති වේද ඊට කරුණක් ඇත්තේ දැයි ඇසූහ. පින්වත් කාශ්‍යපය, මේ කරුණින්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහුය. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි යම් කරුණකින් මට මෙබඳු සිතක් ඇත්තේ වේද ඊට කාරණයක් ඇත්තේ යයි කීය. 'රාජන්‍යය, ඒ කෙබඳු කරුණක්දැ'යි ඇසූහ.

පින්වත් කාශ්‍යපය, මෙහි සතුන් මැරීමෙන් වැළකුනාවූ, සොරකම් කිරීමෙන් වැළකුනාවූ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාවූ, බොරු කීමෙන් වැළකුනාවූ, මත්වීමට හා ප්‍රමාදයට කාරණවූ රහමෙර පානයෙන් වැළකුනාවූ මාගේ හිත මිතුරන්ද සහලේනෑයෝද වෙද්ද, ඔවුහු පසු කාලෙක ලෙඩ වූවාහු, දුකට පැමිණියාහු දැඩි ගිලන් බැව් ඇත්තාහු වෙද්ද, යම් කලක මම මොවුහු දැන් මේ අසනීපයෙන් නොනැගිටින්නාහු යයි (සනීප නොවන්නාහුයයි) දනිම්ද එකල මම ඔවුන් ලඟට ගොස් මෙසේ කීවෙමි. පින්වත්නි, යම් ඒ සත්ව කෙනෙක් සතුන් මැරීමෙන් වැළකුනාහුද, සොරකම් කිරීමෙන් වැලකුනාහුද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාහුද බොරු කීමෙන් වැළකුනාහුද, මත්වීමට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානයෙන් වැළකුනාහුද ඔවුහු ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලොකයෙහි තව්තිසා වැසි දෙවියන් හා එක්ව උපදිත්යයි කියන්නාවූ, මෙසේ දෘෂ්ටි (දැකීම්) ඇත්තාවූ සමහර ශ්‍රමණබ්‍රාහ්මණයෝ ඇත්තාහුය.

පින්වත්හු සතුන් මැරීමෙන් වැළකුනාහුය, සොරකම් කිරීමෙන් වැළකුනාහුය, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාහුය, බොරුකීමෙන් වැළකුනාහුය, මත්වීමට හා ප්‍රමාදයට හෙතුවූ රහමෙර පානයෙන් වැළකුනාහුය, ඉදින් ඒ

පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ වචනය සත්‍ය වීනම්, පින්වත්හු ශරීරය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලොකයෙහි තව්තිසා වැසි දෙවියන් හා එක්ව උපදින්නාහුය. පින්වත්නි, ඉදින් ශරීරය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලොකයෙහි තව්තිසා වැසි දෙවියන් හා එක්ව ඉපදුනාහු නම් යම් පරිද්දකින් අවුත් මේ කාරණයෙන්ද පරලොව ඇත්තේය, මැරී උපදින සත්වයෝ ඇත්තාහුය. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක ඇත්තේයයි මට දන්වව්. පින්වත්හු වනාහි ඇදහිය යුතු වචන ඇත්තාහුය, විශ්වාස කටයුතු වචන ඇත්තාහුය. පින්වත්හු විසින් යමක් දක්නා ලද්දේද, මා විසින් දක්නා ලද්දක් යම්සේද එපරිද්දෙන් වන්නේයයි කියායි. ඔවුහු මට යහපතැයි උත්තරදී, නැවත ඇවිත් නොකියත්, දූතයෙකුත් නොම එවත්. පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහුය, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි, මට මෙබඳු අදහසක් වේද, මෙයද ඊට එක් කාරණයක් වෙයි.

11. රාජන්‍යය එසේ නම් මේ කාරණයෙහි තොපම විචාරන්නෙමි. යම් පරිද්දකින් තොප කැමති වන්නේද, එපරිද්දෙන් කියව, රාජන්‍යය මනුෂ්‍යයන් පිළිබඳ යම් අවුරුදු සියයක් වේද, ඒ අවුරුදු සියය තව්තිසා වැසි දෙවියන්ට එක් රැයක් හා එක් දවාලක් වෙයි. ඒ රාත්‍රියෙන් රාත්‍රි තිහක් තව්තිසා වැසි දෙවියන්ට එක් මාසයක් වෙයි, ඒ මාසයෙන් දොළොස් මසක් අවුරුද්දක් වෙයි. ඒ අවුරුද්දෙන් දිව්‍යවූ අවුරුදු දහසක් තව්තිසා වැසි දෙවියන්ගේ ආයුෂ ප්‍රමාණය වෙයි.

සතුන් මැරීමෙන් වැළකුනාවූ, සොරකම් කිරීමෙන් වැළකුනාවූ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාවූ, බොරු කීමෙන් වැළකුනාවූ, මත්වීමට හා ප්‍රමාදයට හේතුවූ රහමෙර පානයෙන් වැළකුනාවූ තොපගේ යම් හිත මිතුරු සහ ලේ නෑ කෙනෙක් වෙද්ද ඔවුහු ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි තව්තිසා වැසි දෙවියන් හා එක්ව උපන්නාහුද. ඉදින් ඔවුන්ට, අපි රෑ දාවල් (දවස්)

දෙකක් හෝ තුණක් හෝ දිව්‍යවූ පංචකාම ගුණයෙන් යුක්තව එයින් සතුටු වෙමින් හැසිරෙමුයයිද, ඉන්පසු අපි පායාසි රාජන්‍යාගේ සමීපයට ගොස්. 'මේ කාරණයෙන්ද පරලොව ඇත්තේය, මැරී උපදින සත්වයෝ ඇත්තාහ, කරන ලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක ඇත්තේයයි' 'දන්වන්නෙමුයි යන මෙබඳු සිතක් වන්නේ නම්, කිමෙක්ද ඔව්හු (මෙහි) ඇවිත් මේ කාරණයෙන්ද පරලොව ඇත්තේය, මැරී උපදින සත්වයෝ ඇත්තාහ, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක ඇත්තේයයි අවුත් කියන්නාහුද? පින්වත් කාශ්‍යපය, මේ කාරණය නොවන්නේමය, පින්වත් කාශ්‍යපය (ඔවුන් එනවිට) අපමැරී බොහෝ කල් වන්නේය.

තව්තිසා වැසි දෙවියෝ ඇත්තාහුයයි කියා හෝ මෙසේ තව්තිසා වැසි දෙවියෝ දීර්ඝ ආයුෂ ඇත්තෝයයි කියා හෝ කවරෙක් මේ කාරණය පින්වත් කාශ්‍යපයන්ට කීයේද? තව්තිසා වැසි දෙවියෝ ඇත්තාහුයයි හෝ, තව්තිසා වැසි දෙවියෝ දීර්ඝ ආයුෂ ඇත්තෝය යි හෝ කියන පින්වත් කාශ්‍යපයන්ගේ වචනය අපි විශ්වාස නොකරමු.

රාජන්‍යය යම්සේ උත්පත්තියෙන්ම අන්ධවූ පුරුෂයෙක් කළු සුදු රූපයන් නොදක්නේද, නිල්පාට රූපයන් නොදක්නේද, කහ පාට රූපයන් නොදක්නේද, මදට පාට රූපයන් නොදක්නේද, සම විසම බව නොදක්නේද, තාරකා රූපයන් නොදක්නේද, ඉර හඳ නොදක්නේද, උත්පත්තියෙන් අන්ධවූ ඒ පුරුෂයා මෙසේ කියන්නේය. කළු සුදු රූපයෝ නැත්තාහුය, කළු සුදු රූපයන් දකින්නෙක් නැත. නිල් පාට රූපයෝ නැත්තාහුය, නිල්පාට රූපයන් දකින්නෙක් නැත. කහ පාට රූපයෝ නැත්තාහ. කහපාට රූපයන් දකින්නෙක් නැත. රතුපාට හෙවත් (ලේපාට) රූපයෝ නැත්තාහ, රතුපාට රූපයන් දකින්නෙක් නැත. මදට පාට රූපයෝ නැත්තාහ, මදට පාට රූපයන් දකින්නෙක් නැත. සම විසම බව නැත්තේය, සම විසමවූ දේ දකින්නෙක් නැත. තාරකා රූපයෝ නැත්තාහ, තාරකා රූපයන් දකින්නෙක් නැත. ඉර හඳ නැත්තාහ, ඉරහඳ

දකින්නෙක් නැත. මම මෙය නොදනිමි. මම මෙය නොදකිමි. (ඒ නිසා) එය නැත. රාජාන්‍යය මෙසේ කියන්නාවූ ඒ ජාත්‍යන්ධ (උත්පත්තියෙන් අන්ධ) පුරුෂයා හොඳ කීමක් (ඇත්තක්) කියන්නේ දැයි ඇසූහ.

පින්වත් කාශ්‍යපය, මේ වනාහි මනා කොට කියනලද කාරණයක් නොවෙයි කළු, සුදු රූපයෝ ඇත්තාහ. කළු, සුදු රූපයන් දකින අය ඇත්තාහ. නිල්පාට රූප ඇත්තාහ. නිල්පාට රූපයන් දකින අය ඇත්තාහ. කහපාට රූපයෝ ඇත්තාහ. කහපාට රූපයන් දකින අය ඇත්තාහ. රතුපාට රූපයෝ ඇත්තාහ, රතුපාට රූපයන් දකින අය ඇත්තාහ. මදට පාට රූපයෝ ඇත්තාහ, මදට පාට රූපයන් දකින අය ඇත්තාහ, සමවිසම බව ඇත්තේය. සම විසම බව දකින අය ඇත්තාහ. තාරකා රූපයෝ ඇත්තාහ, තාරකා රූපයන් දකින අය ඇත්තාහ. ඉර හඳ ඇත්තේය, ඉර හඳ දකින අය ඇත්තාහ, යමෙක් මම මෙය නොදනිමි මම මෙය නොදකිමි. (එබැවින්) නැත්තේ යයි කියාද, පින්වත් කාශ්‍යපය, මෙසේ කියන්නාවූ ඔහු මනාකොට කියන්නේ (ඇත්ත කියන්නේ) නොවේ යයි කීය.

රාජන්‍යය, තොප ජාත්‍යන්ධයෙකු මෙන් මට වැටහෙන්නේය. 'තව්තිසා වැසි දෙවියෝ ඇත්තාහුයයි කියා හෝ මෙසේ තව්තිසා වැසි දෙවියෝ දීර්ඝ ආයුෂ ඇත්තෝය කියා හෝ මේ කාරණය කවරෙක් පින්වත් කාශ්‍යපයන්ට කීයේද? තව්තිසා වැසි දෙවියෝ ඇත්තාහුය කියා හෝ තව්තිසා වැසි දෙවියෝ මෙසේ දීර්ඝ ආයුෂ ඇත්තෝය කියා හෝ අපි පින්වත් කාශ්‍යපයන්ගේ වචනය විශ්වාස නොකරමුයි' මෙසේ යමක් තොපි මට කීවහුද, රාජන්‍යය තොප මේ මස් ඇසින් දකින්නාක් මෙන් පරලොව නොදත යුතුයි. රාජන්‍යය, යම් ඒ ශ්‍රමණබ්‍රාහ්මණ කෙනෙක් නිශ්ශබ්දවූ ඝොෂා රහිතවූ අරණ්‍ය සේනාසනද මහ වනලැහැබ් ඇති ඉතා දුරවූ වන සේනාසනද සේවනය කෙරෙද්ද, ඔවුහු එහි අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, තමා ගැන ආලයක් නැතිව වසමින් දිව්‍ය ඇස සොධනය කෙරෙත් (ලබත්) ඔවුහු මනුෂ්‍ය ඇස ඉක්ම පවත්නාවූ පිරිසිදු දිවැසින් මෙලොවද පරලොවද මැරී උපදින සත්වයන්ද දකිත්. රාජන්‍යය,

මෙසේ පරලොව දත යුතුයි. යම්සේ තොපි මේ මසැසින් දකින්නහුද එපරිද්දෙන් නොදත යුතුමය. රාජන්‍යය මේ කාරණයෙන්ද තොපට පරලොව ඇත්තේය. මැරී උපදින සත්වයෝ ඇත්තාහ. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක ඇත්තේය, යන මෙබඳු සිතක් ඇතිවේවා.

**12.** පින්වත් කාශ්‍යපයෝ යම්සේ මෙබන්දක් කියද්ද, එසේද වුවත් මේ කාරණයෙහි මගේ අදහස මෙසේය. මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහුය, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේය කියා යි.

රාජන්‍යය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය. මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේය යි, යම් කාරණයකින් තොපට මෙබඳු සිතක් ඇති වේද, ඊට කාරණයක් ඇත්තේ දැයි ඇසූහ.

'පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි යම් කාරණයකින් මට මෙබඳු සිතක් ඇති වේද, ඊට කාරණයක් ඇත්තේයයි කීය,' 'රාජන්‍යය ඒ කෙබඳු කාරණයක් දැයි' ඇසූහ.

'පින්වත් කාශ්‍යපය, මම මෙහි සිල්වත්වූ යහපත් ධර්ම ඇත්තාවූ, ජීවත්වීමට කැමතිවූ, මැරෙන්ට අකමැතිවූ, සැපට කැමතිවූ, දුකට පිළිකුල් කරන්නාවූ ශ්‍රමණබ්‍රාහ්මණයන් දකිමි. පින්වත් කාශ්‍යපය, එසේ දකින්නාවූ මට මෙබඳු සිතක් වෙයි. ඉඳින් සිල්වත්වූ, යහපත් ධර්ම ඇත්තාවූ, පින්වත් මේ ශ්‍රමණබ්‍රාහ්මණයෝ මෙලොවින් මැරුණාවූ අපට පරලොව සැප වන්නේයයි මෙසේ දන්නාහුනම් දැන් සිල්වත්වූ යහපත් ධර්ම ඇත්තාවූ පින්වත්වූ මේ ශ්‍රමණබ්‍රාහ්මණයෝ විෂ හෝ කන්නාහුය, ආයුධවලින් හෝ කපා ගන්නාහුය, බෙල්ලේ වැල් ලාගෙන හෝ මැරෙන්නාහුය, ප්‍රපාතයක හෝ වැටෙන්නාහුය යම් හෙයකින් වනාහි සිල්වත්වූ යහපත් ධර්ම ඇත්තාවූ මේ පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ, මෙලොවින් මැරුණාවූ අපට පරලොව සැප

වන්නේයයි මෙසේ නොදනිද්ද, එහෙයින් සිල්වත්වූ, යහපත් ධර්ම ඇත්තාවූ ජීවත් වීමට කැමැත්තාවූ, මැරෙන්ට අකැමැතිවූ, සැපට කැමතිවූ, දුකට පිළිකුල් කරන්නාවූ මේ පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තමා නොමරත්යයි කියායි. 'පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි, කියා මෙබඳු අදහසක් මට යම් කාරණයකින් වේද, මෙයද ඊට එක් කාරණයක් වෙයි' කීය.

13. රාජන්‍යය, එසේවී නම් තොපට උපමාවක් කරන්නෙමි. (කියන්නෙමි) උපමාවෙන්ද මේ ලොකයෙහි සමහර නුවණැති පුරුෂයෝ කියනලද වචනයෙහි තේරුම දැනගනිත්. රාජන්‍යය, එහෙයින් පෙර සිදුවූ දෙයක් කියමි. එක් බ්‍රාහ්මණයෙකුට භාර්‍ය්‍යාවන් දෙදෙනෙක් වූවාහුය. එක් භාර්‍ය්‍යාවකට දස ඇවිරිදි හෝ දොළොස් ඇවිරිදිවූ හෝ පුතෙක් විය. එක් භාර්‍ය්‍යාවක් ගර්භිනී වූවා වදනකාලය ලංව ඇත්තේ විය. ඒ කාලයේ ඒ බමුණා මැරුණේය. එකල්හි මාණවකයා (ළමයා) සැතිරියවූ (කුඩා) මවුට මේ කාරණය කීය. පිනැත්තිය යම් මේ ධනයක් හෝ ධාන්‍යයක් හෝ රිදී හෝ රත්රන් හෝ ඇද්ද ඒ සියල්ල මගේ වෙයි. මේ වස්තුව අතුරෙන් කිසිත් තිට නැත්තේය. පිනැත්තිය, පියාගේ දායාදයවූ මේ වස්තුව මට පාවා දෙවයි කීය. එසේ කී කල ඒ බැමිණිය ඒ මාණවකයාට (ළමයාට) මේ වචනය කීය. 'පුත්‍රය, යම්තාක් මම වදම්ද ඒතාක් බලාපොරොත්තු වෙව. ඉඳින් කුමාරයෙක් වන්නේ නම් ඕහටද එක් කොටසක් වන්නේය, ඉඳින් කුමාරියක් වන්නී නම් ඕ තොපට උපස්ථාන කරන්නියක් වන්නී"යයි කියායි.

දෙවනුවද මාණවකයා සැතිරිවූ (කුඩා) මවට මේ කාරණය කීය, "පිනැත්තිය, යම් මේ ධනයක් හෝ ධාන්‍යයක් හෝ රිදී හෝ රත්රන් හෝ ඇද්ද ඒ සියල්ල මගේ වෙයි. මේ වස්තුව අතුරෙන් කිසිවක් තිට නැත්තේය. පිනැත්තිය පියාගේ මේ දායාදය වූ වස්තුව මට පාවා දෙව"යි කියායි. දෙවනුවද ඒ බැමිණිය ඒ මාණවකයාට මේ වචන කීය. 'පුත්‍රය, යම්තාක් මම

වදම්ද ඒ තාක් කල් බලාපොරොත්තු වෙව, ඉදින් පුතෙක් වන්නේ නම් ඔහුටද එක් කොටසක් වන්නේය, ඉදින් දුවක් වේනම් ඕ තොපට උපස්ථාන කරන්නියක්වන්නීය”යි කියායි.

තුන් වෙනිවද ඒ මාණවකයා සැතිරියවූ (කුඩා) මවට මේ කාරණය කීය. “පිනැත්තිය යම් මේ ධනයක් හෝ ධාන්‍යයක් හෝ රිදී හෝ රත්රන් හෝ ඇද්ද ඒ සියල්ලම මගේ වෙයි. මේ වස්තුවෙහි කිසිත් තිට නැත්තේය, පිනැත්තිය පියාගේ දායාදය මේ මට පාවා දෙව”යි කීය. එවිට බැමිණි ආයුධයක් ගෙන ඇතුල් ගෙට (ගබඩාවට) ඇතුල්වී, මෙහි ඉදින් කුමාරයෙක් හෝ වේද? කුමාරියක් හෝ වේද? කියා දැනගනිමි”යි බඩ පැලුවාය. ඈ තම ජීවිතයද, ගර්භයද, වස්තුවද නැසුවාය. යම් සේ අඥානවූ, අදක්ෂවූ තැනැත්තී වැරදි විදියෙන් වස්තුව සොයන්නී ඒ මහත්දුකට පැමිණියාද රාජන්‍යය, එපරිද්දෙන්ම අඥානවූ අදක්ෂවූ තෝ නුනුවණින් පරලොව සොයන්නේ මහත් දුකට පැමිණෙන්නෙහිය. අඥානවූ, අදක්ෂවූ ඒ බැමිණි වැරදි විදියෙන් වස්තුව සොයන්නී යම්සේ මහත් දුකට පැමිණියාද එමෙනි.

රාජන්‍යය, සීලවන්තවූ උතුම් ගුණ ධර්මයෙහි පිහිටියාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නොමේරූ අවසන් නොවූ ආයුෂය අතරකදී නොසිඳිත්. එසේද වුවත් පණ්ඩිතයෝ ආයුෂයාගේ මූකිරීම බලාපොරොත්තු වෙති. රාජන්‍යය සීලවන්තවූ උතුම් ගුණධර්මයෙහි පිහිටියාවූ ශ්‍රමණබ්‍රාහ්මණයන්ගේ ජීවිතයෙන් ප්‍රයොජන ඇත්තේමය.

රාජන්‍යය, සිල්වත්වූ උතුම් ගුණධර්ම ඇත්තාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඉතා දීර්ඝ කාලයක් සිටිත්ද, ඒ තාක් ඒ ඒ ආකාරයෙන් බොහෝ පින් රැස් කෙරෙත්, බොහෝ දෙනාගේ හිත පිණිසද, බොහෝ දෙනාගේ සැප පිණිසද, ලොකයාට අනුකම්පා පිණිසද පිළිපදිත්. දෙවි මිනිසුන්ට වැඩ පිණිසද, හිත පිණිසද, සැප පිණිසද, පිළිපදිත්. රාජන්‍යය, මේ කාරණයෙන්ද තොපට මෙබඳු සිතක් ඇති වේවා. මේ කාරණයෙන්ද පරලොව ඇත්තේය, මැරී උපදින සත්වයෝ ඇත්තාහ. කරන ලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක ඇත්තේය කියායි.

14. යම්සේ පින්වත් කාශ්‍යපයෝ මෙසේ කියද්ද, එසේ නමුත් මේ කාරණයෙහි මගේ අදහස මෙබඳුයි. මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාකයක් නැත්තේ යයි කියායි. රාජන්‍යය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි යම් කාරණයකින් තොපට මෙබඳු සිතක් ඇති වේද, ඊට කාරණයක් ඇත්තේදැයි ඇසූහ.

පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ, කරණලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි යම් කාරණයකින් මට මෙබඳු සිතක් ඇතිවේද, ඊට කාරණයක් ඇත්තේ යයි කීය. රාජන්‍යය, ඒ කෙබඳු කාරණයක්දැයි ඇසූහ.

පින්වත් කාශ්‍යපය, මෙහි මාගේ පුරුෂයෝ අපරාධ කරන්නාවූ සොරෙකු අල්වාගෙන ස්වාමීනි, මේ ඔබවහන්සේගේ (අණට විරුද්ධව) අපරාධ කරණ සොරෙකි. මොහුට යම් දඬුවමක් දෙනු කැමැත්තේ නම් එය දෙනු මැනවැයි දක්වද්ද, එකල ඒ පුරුෂයන්ට මම මෙසේ කියමි. පින්වත්නි, එසේ වීනම් ජීවත් වන්නාවූම (පණ තිබෙද්දීම) මේ පුරුෂයා හැලියක දමා කට වසා, තෙත්වූ සම්වලින් වෙලා. තෙත් මැටියෙන් ඝණව ආලේප කොට ලිපේ තබා ගිනි දල්වව් කියායි. ඔවුහු යහපතැයි මගේ වචනය පිළිගෙණ ජීවත්වන්නාවූම ඒ සොර පුරුෂයා හැලියක දමා කට වසා තෙත්වූ සම්වලින් වෙලා තෙත්වූ මැටියෙන් ඝනව ආලේප කොට ලිපේ තබා ගිනි දල්වත්. යම් වේලාවක අපි ඒ පුරුෂයා මැරුණේයයි දනිමුද, එවිට හැලිය බා තබා මැටි ආලේපය බිඳ කට ඇර (එයින්) පිට වෙන්නාවූ මොහුගේ ජීවිතය දක්නමු නම් යෙහෙකැයි කියා වහා බලමුද අපි පිට වෙන ඔහුගේ ජීවිතය නොදකුම්හ.

පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය. මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි යම් කාරණයකින් මට මෙබඳු අදහසක් වේද මෙයද ඊට එක් කාරණයක් වෙයි.

**15.** රාජන්‍යය, එසේ වීනම් තොපගෙන්ම මේ කරුණ අසන්නෙමි. යම් පරිද්දෙකින් තොපි කැමති වන්නහුද, එපරිද්දෙන් එය කියවයි කීහ. රාජන්‍යය, තොප දවල් නිදාගන්ට යහනට ගියවිට සිත් අලවන්නාවූ උයන්ද සිත් අලවන්නාවූ වනාන්තරද සිත් අලවන්නාවූ පොකුණුදැයි යන මේවා ගැන සිහිනයක් දුටු බවක් මතක ඇත්තේදැයි ඇසූහ. 'පින්වත් කාශ්‍යපය, මම දවල් සයනයට පැමිණියෙම් සිත් අලවන්නාවූ උයන්ද, සිත අලවන්නාවූ වනාන්තරද, සිත් අලවන්නාවූ භූමිද, සිත් අලවන්නාවූ පොකුණුද සිහිනෙන් දැක මතක ඇත්තෙමියි' කීය. ඒ වේලාවෙහි කුදුස්ත්‍රීහුද, මිටිස්ත්‍රීහුද, බාලස්ත්‍රීහුද, තරුණ දැරියෝද තොප ආරක්ෂා කිරීමෙහි යෙදී සිටියා හුදැයි ඇසූහ. 'පින්වත් කාශ්‍යපය, එසේමය, ඒවේලාවෙහි කුදුස්ත්‍රීහුද, මිටිස්ත්‍රීහුද, බාලස්ත්‍රීහුද, තරුණ දැරියෝද මා ආරක්ෂා කිරීමෙහි යෙදී සිටියාහුයයි' කීය. ඒ ස්ත්‍රීහු ඇතුල් වන්නාවූද, පිටවන්නාවූද, තොපගේ ජීවිතය දකිත්දැයි ඇසූහ. 'පින්වත් කාශ්‍යපය, මේ කාරණය නොවේමයයි' කීය.

රාජන්‍යය, ජීවත්වන්නාවූ ඒ ස්ත්‍රීහු, ජීවත්වන්නාවූ තොපගේ ඇතුල්වන්නාවූද, පිටවන්නාවූද ජීවිතය නොම දකින්නාහු නම් කිමෙක්ද තොපි මැරුණ තැනැත්තහුගේ ඇතුල් වන්නාවූද, පිට වන්නාවූද ජීවිතය කෙසේ නම් දකින්නහුද? රාජන්‍යය, මේ කාරණයෙන්ද තොපට මෙබඳු සිතක් ඇතිවේවා. මේ කාරණයෙන්ද පරලොව ඇත්තේය. මැරී උපදින සත්වයෝ ඇත්තාහ, කරණලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක ඇත්තේය කියායි.

**16.** කෙසේ හෝ පින්වත් කාශ්‍යපයෝ මෙසේ කියති. එහෙත් මේ කාරණයෙහි මාගේ අදහස මෙබඳු වෙයි. මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේය කියායි. රාජන්‍යය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි යම් කාරණයකින් තොපට මෙබඳු සිතක් ඇතිවේද, ඊට කාරණයක් ඇත්තේදැයි ඇසූහ.

පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරණලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි යම් කාරණයකින් මට මෙබඳු සිතක් ඇතිවේද, ඊට කාරණයක් ඇත්තේ යයි කීය. 'රාජන්‍යය, ඒ කෙබඳු කාරණයක්දැයි' ඇසූහ.

පින්වත් කාශ්‍යපය, මෙහි මාගේ පුරුෂයෝ අපරාධයෙහි හැසිරෙන්නාවූ සොරෙකු අල්වා ගෙනවුත්, ස්වාමීනි, මේ ඔබ වහන්සේගේ (අණට විරුද්ධව) අපරාධ කරමින් හැසිරෙන සොරෙකු, මොහුට යම් දඬුවමක් කරණු කැමැත්තෙහි නම් එය කරනු මැනවැයි මට දක්වද්ද, එවිට මම ඔවුන්ට මෙසේ කියමි. පින්වත්නි, එසේ වීනම් ජීවත්වන්නාවූ (ජීවිතය තිබියදීම) මේ පුරුෂයා තරාදියෙන් කිරා දුනු දියෙන් (දුනු ලනුවෙන්) බෙල්ල වෙලා හුස්ම ගැණීම නැතිකොට මරා නැවතත් තරාදියෙන් කිරා බලවයි කියායි. යහපතැයි ඔව්හු මාගේ වචන පිළිගෙන ජීවත් වන්නාවූම ඒ පුරුෂයා තරාදියෙන් කිරා දුනුදියෙන් බෙල්ල වෙලා හුස්ම ගැනීම නැති කොට මරා නැවතත් තරාදියෙන් කිරත්.

යම් කලක ඒ පුරුෂයා ජීවත්වේද, එකල ඉතා සැහැල්ලු වූයේද වෙයි, ඉතා මොලොක් වූයේද වෙයි. කටයුතුවලට ඉතා සුදුසු වූයේද වෙයි, යම් කලක ඔහු මැරුණේද, එකල්හි ඉතා බර වූයේද වෙයි, ඉතා දැඩි වූයේද වෙයි, කටයුත්තට ඉතා නුසුදුසු වූයේද වෙයි, පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය. මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි මෙබඳු සිතක් යම් කාරණයකින් මට ඇතිවීද මෙයද ඊට එක් කාරණයකියි කීවේය.

17. රාජන්‍යය, එසේ වීනම් තොපට උපමාවක් කරන්නෙමි. (පෙන්වමි) උපමාවෙන්ද මේ ලොකයෙහි නුවණ ඇති පුරුෂයෝ කියනලද කථාවෙහි තේරුම දැන ගනිත්. රාජන්‍යය, යම්සේ පුරුෂයෙක් දවස මුළුල්ලෙහි රත් කරන ලද්දාවූ, ගිනිගෙන ඇවිලෙන්නාවූ, හොඳින් ඇවිලෙන්නාවූ එකම ගිනි ජාලාවක්වූ

යකඩ ගුලියක් තරාදියෙන් කිරන්නේද, පසුව සීතලවූ නිමුනාවූ ඒ යකඩගුලිය තරාදියෙන් කිරන්නේද යම් කලෙක වනාහි ඒ යගුලිය ගිනිගෙන ඇවුලුනේ වේද, මනාකොට ඇවුලුනේ වේද, එකම ගිනි ජාලාවක් වේද, යම් කලක හෝ සීතල වේද, නිවුනේ වේද යන මේ අවස්ථා දෙක අතරින් කවර අවස්ථාවක ඒ යකඩගුලිය ඉතා සැහැල්ලු වූයේ හෝ වේද, ඉතා මොලොක් වූයේවේද කටයුතුවලට ඉතා සුදුසු වූයේ වේදැයි ඇසුවේය.

පින්වත් කාශ්‍යපය, යම් කලක ඒ යකඩගුලිය ගිනි සහිත වූයේ වේද වාතය සහිත වූයේද ගිනිගෙන ඇවුලුනේ වේද, මනාකොට ඇවුලුනේ වේද, එකම ගිනි ජාලාවක් වූයේ වේද එකල්හි ඉතා සැහැල්ලු වූයේද වෙයි, ඉතා මොලොක් වූයේද වෙයි, කටයුතුවලට ඉතා සුදුසු වූයේද වෙයි. යම් කලක ඒ යඩකගුලිය ගිනිරහිත වූයේද, වාතය රහිත වූයේද, සීතල වූයේද, නිවුනේ වේද, එකල්හි ඉතා බර වූයේද ඉතා දැඩි (තද) වූයේද වෙයි, කටයුතුවලට ඉතා නුසුදුසු වූයේද වෙයි කීය.

රාජන්‍යය, එමෙන්ම මේ ශරීරය යම් කලක ආයුෂ සහිත වූයේ වේද, උෂ්ණය සහිත වූයේ වේද එකල්හි ඉතා සැහැල්ලු වූයේද වෙයි, ඉතා මොලොක් වූයේද වෙයි, කටයුත්තට ඉතා සුදුසු වූයේද වෙයි, යම් කලක මේ ශරීරය ආයුෂ සහිත නොවූයේද, උෂ්ණය සහිත නොවූයේද, විඥානය සහිත නොවූයේද එකල්හි ඉතා බර වූයේද ඉතා දැඩි වූයේද කටයුත්තට ඉතා නුසුදුසු වූයේද වෙයි.

රාජන්‍යය, මේ කාරණයෙන්ද, තොපට මෙබඳු සිතක් ඇති වේවා, මේ කාරණයෙන්ද පරලොව ඇත්තේය, මැරී උපදින සත්වයෝ ඇත්තාහ. කරණලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක ඇත්තේය කියායි.

18. කෙසේ හෝ පින්වත් කාශ්‍යපයෝ මෙසේ කියති. එසේ නමුත් මේ කාරණයෙහි මගේ අදහස මෙසේයි. මේ කාරණයෙන්ද පරලොව නැත්තේය. මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේය කියායි.

රාජන්‍යය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි යම් කාරණයකින් තොපට මෙබඳු සිතක් ඇතිවේද, ඊට කාරණයක් ඇත්තේදැයි, ඇසූහ.

පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ, කරණලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි යම් කාරණයකින් මට මෙබඳු සිතක් ඇත්තේවේද, එයට කාරණයක් ඇත්තේයයි කීය.

රාජන්‍යය, ඒ කෙබඳු කාරණයක්දැයි ඇසූහ.

පින්වත් කාශ්‍යපය, මෙහි මාගේ පුරුෂයෝ අපරාධ කරමින් හැසිරෙන්නාවූ සොරෙකු අල්වාගෙනවුත් ස්වාමීනි, මොහු (ඔබ වහන්සේගේ අණට විරුද්ධව) අපරාධ කරමින් හැසිරෙන සොරෙක. මොහුට යම් දඬුවමක් පමුණුවනු කැමැත්තෙහි නම් එය කරනු මැනවැයි මට දක්වද්ද, එවිට මම ඔවුන්ට මෙසේ කියමි.

"පින්වත්නි, එසේ වීනම් සිවියද, සමද, මස්ද, නහරද, ඇටද, ඇටමිදුලුද විනාශ නොකොට මේ පුරුෂයා ජීවිතයෙන් තොර කරව් (මරව්) මොහුගේ ජීවිතය නික්මෙනු බලනු සඳහාය කියායි. ඔවුහු මගේ වචනය පිළිගෙන සිවියද, සමද, මස්ද, නහරද, ඇටද, ඇටමිදුලුද විනාශ නොකොට ඒ පුරුෂයා ජීවිතයෙන් තොර කරත් (මරත්.) යම් කලක ඒ පුරුෂයා නොමළේ වේද, එකල ඒ පුරුෂයන්ට මම මෙසේ කියමි. පින්වත්නි, එසේ නම් මේ පුරුෂයා උඩුකුරු කොට හෙලව්. මොහුගේ නික්මෙන්නාවූ ජීවිතය දක්නමෝ නම් යෙහෙකැයි කියායි. ඔවුහු ඒ පුරුෂයා උඩුකුරුකොට හෙලත්. මොහුගෙන් නික්මෙන්නාවූ ජීවිතයක් අපි නොදකුම්හයි කියත්. එකල මම ඔවුන්ට මෙසේ කියමි. පින්වත්නි, එසේ නම් මේ පුරුෂයා යටිකුරු කොට හෙලව්. පැත්තකට හෙලව්, අනික් පැත්තට හෙලව්, උඩුඅතට තබව්, යටි අතට තබව්, අතින් ගසව්, ගස්වලින් ගසව්, දණ්ඩෙන් ගසව්, මෙහාට පෙරලව්, එහාට පෙරලව්, එහා මෙහා පෙරලව්, මොහුගේ නික්මෙන්නාවූ ජීවිතය දක්නමෝ නම් යෙහෙකැයි

කියායි. ඔහු ඒ පුරුෂයා මෙහාට පෙරලත්, එහාට පෙරලත්, එහා මෙහා පෙරලත්, අපි මොහුගේ නික්මෙන්නාවූ ජීවිතයක් නොදකුම්හ. ඔහුගේ එම ඇසම වෙයි, ඒ රූපයෝම වෙත්, එම ඇසින් එම රූපායතනය ප්‍රකාශ නොකරයි. එම කණම වෙයි, එම ශබ්දයෝම වෙත්, ඒ කණින් ශබ්දායතනය ප්‍රකාශ නොකරයි. එම නාසයම වෙයි. එම ගඳ සුවඳම වෙත්. ඒ නාසයෙන් ගන්ධායතනය ප්‍රකාශ නොකරයි. එම දිවම වෙයි, එම රසයෝම වෙත්, එම දිවෙන් රසායතනය ප්‍රකාශ නොකරයි. එම කයම වෙයි. එම ස්පර්ශයෝම වෙත්, එම කයින් ඵස්සායතනය ප්‍රකාශ නොකරයි.

පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි මෙබඳුවූ සිතක් යම් කාරණයකින් ඇතිවේද, මෙයද ඊට එක් කාරණයකි.”

**19.** රාජන්‍යය, එසේ නම් තට උපමාවක් දක්වන්නෙමි. මේ ලෝකයෙහි සමහර නුවණ ඇති පුරුෂයෝ උපමාවෙන්ද කියනලද වචනයේ තේරුම දැන ගනිත්. රාජන්‍යය පෙර වූවක් කියමි.

“එක්තරා සක් පිඹින්නෙක් හක්ගෙඩියක් ගෙන පිටිසර පළාතකවූ ජනපදයකට ගියේය. ඔහු එක්තරා ගමක් යම් තැනකද, එතැනට ගියේය. ගොස් ගම මැදදී වේගයෙන් තුන් වරක් සක් ගෙඩිය පිඹ එය බිම තබා, එක පැත්තක උන්නේය. රාජන්‍යය එවිට ඒ පිටිසර පලාතේ උපන්නාවූ මිනිසුන්ට මෙබඳු සිතක් වූයේය. පින්වත්නි, මෙසේ (සිත්) ඇලවිය යුතුවූ, මෙසේ කැමතිවිය යුතුවූ, මෙසේ මත්විය යුතුවූ, මෙසේ බැඳිය යුතුවූ, මෙසේ ක්ලාන්ත විය යුතුවූ මේ ශබ්දය කවරෙකුගේද කියායි. නැවත ඒ පිටිසර ජනපද වැසි මනුෂ්‍යයෝ රැස්වී ඒ සක් පිඹින්නාට මේ කාරණය කීවෝය.

පින්වත, මෙසේ සිත් ඇලවිය යුතුවූ, මෙසේ කැමැති විය යුතුවූ මෙසේ මත්විය යුතුවූ, මෙසේ බැඳිය යුතුවූ, මෙසේ ක්ලාන්ත විය යුතුවූ මේ ශබ්දය කවරෙකුගේද කියායි. මෙසේ

සිත් ඇලවිය යුතුවූද, මෙසේ කැමති විය යුතුවූද, මෙසේ මත්විය යුතුවූද, මෙසේ බැඳිය යුතුවූද මෙසේ ක්ලාන්ත විය යුතුවූද, මේ ශබ්දය යමෙකුගේද පින්වත්නි, එය වනාහි සක් ගෙඩිය යන නම ඇත්තේයයි කීය.

එවිට ඒ පිටිසර ජනපද වැසි මනුෂ්‍යයෝ පින්වත් සක් ගෙඩිය, නාදකරව, පින්වත් සක්ගෙඩිය, නාදකරවයි කියමින් සක් ගෙඩිය උඩු අතට පෙරලුවාහුය. ඒ සක්ගෙඩිය සබ්ද නොකළේමය. නැවතද ඒ පුරුෂයෝ පින්වත් සක්ගෙඩිය, නාදකරව, පින්වත් සක්ගෙඩිය, නාද කරවයි කියමින් ඒ සක් ගෙඩිය යටිඅතට පෙරලුවාහුය, පැත්තට පෙරලුවාහුය, දෙවැනි පැත්තට පෙරලුවාහුය, උඩුකුරු කොට තැබුවාහුය, යටිකුරු කොට තැබුවාහුය, අතින් ගැසුවාහුය, ගල්වලින් ගැසුවාහුය, ලීවලින් ගැසුවාහුය, ආයුධයෙන් ගැසුවාහුය, මෑතට පෙරලුවාහුය, ඈතට පෙරලුවාහුය, එහා මෙහා පෙරලුවාහුය, ඒ සක්ගෙඩිය නාද නොකළේමය. රාජන්‍යය, එවිට ඒ සක් පිඹින්නාහට මෙබඳු සිතක් වූයේය. පිටිසර උපන්නාවූ මේ මනුෂ්‍යයෝ මෝඩයෝ වෙත්. (ඔවුහු) කෙසේ නම් නුනුවණින් සක් හඬ සොයන්නාහු දැයි කියායි.

(එසේ සිතා සක් පිඹින්නා) ඔවුන් බලා සිටිද්දීම සක් ගෙඩිය ගෙන තුන්වරක් සක්ගෙඩිය පිඹ සක්ගෙඩියක් රැගෙන ගියේය.

රාජන්‍යය, එවිට ඒ පිටිසර ජනපද වැසි මිනිසුන්ට මෙබඳු සිතක් වූයේය. පින්වත්නි, යම් කලෙක මේ සක්ගෙඩිය පුරුෂයෙක් සමග (එක්ව) පැවැත්තේද, උත්සාහය සමග පැවැත්තේද සුලඟ සමග පැවැත්තේද එකල්හි මේ සක නාද කරයි. යම්කලක මේ සක පුරුෂයෙකු සමග නොපවත්නේද උත්සාහය සමග නොපවත්නේද, සුලඟ සමග නොපවත්නේද එකල්හි මේ සක ශබ්ද නොකෙරේයයි කියායි.

රාජන්‍යය, එපරිද්දෙන්ම මේ ශරීරය ආයුෂ සහිත වූයේද, උෂ්ණය සහිත වූයේද, විඥානය සහිත වූයේද එකල මේ (ශරීරය) ඉදිරියටද යයි, ආපසුද යයි, සිටීමද කෙරෙයි, හිඳීමද කෙරෙයි, නිදාගැනීමද කරයි, ඇස කරණකොටගෙන රූපයද දකියි, කණ

කරණකොටගෙන ශබ්දයද අසයි, නාසය කරණකොටගෙන ගඳ සුවඳද දැනගනියි, දිව කරණකොට ගෙන රස විඳියි, කය කරණකොටගෙන ස්පර්ශද කෙරෙයි. සිත කරණකොටගෙන ධර්ම අරමුණුද දනියි. යම් කලක වනාහි මේ ශරීරය ආයුෂ සමග නොපවත්නේ වේද, උෂ්ණය සමග නොපවත්නේ වේද, විඥානය සමග නොපවත්නේ වේද, එකල්හි මේ (ශරීරය) ඉදිරියට යාමද නොකරයි, ආපසුයාමද නොකරයි, සිටීමද නොකරයි. හිඳීමද නොකරයි, නිදා ගැනීමද නොකරයි, ඇසින්ද රූපය නොදකී. කණින්ද ශබ්දය නොඅසයි, නාසයෙන්ද ගඳ සුවඳ නොදනියි. දිවෙන්ද රස විඳීම නොකරයි, ශරීරයෙන්ද ස්පර්ශය නොවිඳියි, සිතින්ද ධර්මාරමුණු නොදනී, රාජන්‍යය, මේ කාරණයෙන්ද තොපට මෙබඳු සිතක් ඇතිවේවා, මේ කාරණයෙන්ද පරලොව ඇත්තේය, මැරී උපදින සත්වයෝ ඇත්තාහ. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵලවිපාක ඇත්තේය කියායි.

**20.** පින්වත් කාශ්‍යපයෝ කෙසේ හෝ මෙසේ කියන්නාහුද, එහෙත් මේ කාරණයෙහි මගේ අදහස මෙසේ වන්නේය. මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ, කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේය කියායි.

රාජන්‍යය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය. මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි යම් කාරණයකින් තොපට මෙබඳු සිතක් ඇතිවේද, ඊට කාරණයක් ඇත්තේදැයි ඇසූහ. පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ. කරනලද කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි යම් කාරණයකින් මට මෙබඳු සිතක් ඇතිවේද, ඊට කාරණයක් ඇත්තේයයි කීය.

"රාජන්‍යය, ඒ කෙබඳු කාරණයක්දැ"යි ඇසූහ.

පින්වත් කාශ්‍යපය, මෙහි මගේ පුරුෂයෝ අපරාධ කරමින් හැසිරෙන සොරෙකු අල්වා ගෙනවුත්, ස්වාමීනි, මොහු නුඹ

වහන්සේගේ අණට විරුද්ධව අපරාධ කරමින් හැසිරෙන සොරෙකි. මොහුට යම් දඬුවමක් දෙනු කැමැත්තෙහිනම් එය නියම කරනු මැනවැයි මට දක්වද්ද, එකල මම ඔවුන්ට මෙසේ කියමි. එසේ නම් මොහුගේ සිවිය සිඳිව්, මොහුගේ ජීවිතය දකින්නමු නම් යෙහෙකැයි කියායි. ඔවුහු ඒ පුරුෂයාගේ සිවිය සිඳිත්, "අපි මේ පුරුෂයාගේ ජීවිතය නොදකුම්හ" එකල මම ඔවුන්ට මෙසේ කියමි පින්වත්නි, එසේ නම් මොහුගේ ජීවිතය දකින්නමු නම් යෙහෙක ඒ සඳහා මේ පුරුෂයාගේ සම සිඳිව්, මස සිඳිව්, නහර සිඳිව්, ඇට සිඳිව්, ඇට මිදුලු සිඳිව්යයි කියායි. ඔව්හු ඒ පුරුෂයාගේ සමද සිඳිත්, මසද සිඳිත්, නහරද සිඳිත්, ඇටද සිඳිත්, ඇට මිදුලුද සිඳිත් අපි මේ පුරුෂයාගේ ජීවිතය නොදකුම්හයි කියති. පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ. කුසල අකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි, මට මෙබඳු සිතක් යම් කාරණයකින් වේද, මේද ඊට එක්කාරණයකි.

21. රාජන්‍යය, එසේවී නම් තට උපමාවක් දක්වන්නෙමි. මේ ලෝකයෙහි සමහර නුවණැති පුරුෂයෝ උපමායෙන්ද කියනලද වචනයාගේ අර්ථය දැනගනිත්. රාජන්‍යය, පෙරවූ කරුණක් කියමි. ගිනි දෙවියා පුදන්නාවූ එක්තරා ජටිලයෙක් අරණ්‍යයෙහි කොළවලින් සෙවිලි කරණලද පැලක වෙසෙයි. රාජන්‍යය, ඉක්බිත්තෙන් එක්තරා වෙළඳ පිරිසක් ජනපද ප්‍රදෙශයකින් පිටත්විය. අනතුරුව ඒ වෙළඳ පිරිස ඒ ගිනි දෙවියා පුදන්නාවූ ජටිලයාගේ ආවාසය අවට එක් රැයක් වාසය කොට ගියේය. ඊට පසුව ඒ ගිනිදෙවියා පුදන්නාවූ ජටිලයාට මෙබඳු සිතක් වූයේය. "ඒ වෙළඳ පිරිසගේ වාසය යම් තැනකද මම එහි යන්නෙම් නම් යෙහෙකැයිද එහි කිසි යම් දෙයක් ලබන්නෙම් නම් මැනවැ"යිද කියාය. ඉක්බිතිව ඒ ගිනි පුදන ජටිලතෙම උදයම නැගිට ඒ වෙළඳ සමූහයා යම් තැනක සිටියේද එහි පැමිණියේය. පැමිණ ඒ වෙළඳ සමූහයාගේ වාසස්ථානයෙහි දමන ලද්දාවූ උඩුකුරුවූ සයනය කරන්නාවූ බාලවූ ළදරු කුමාරයකු දුටුයේය. දැක ඔහුට මෙබඳු සිතක් පහළ වූයේය. මා බලා සිටියදීම මනුෂ්‍ය වූවෙකු මැරෙන්ට හැරීම මට සුදුසු

නොවෙයි. මම මේ ළදරුවා ආශ්‍රමයට ගෙන ගොස් හදන්නෙම් නම් වඩන්නෙම් නම් පොෂ්‍යය කරන්නෙම් නම් යෙහෙකැයි කියායි.

ඉක්බිති ගිනිදෙවියා පුදන්නාවූ ඒ ජටිල තෙමේ ඒ ළදරුවා ආශ්‍රමයට ගෙනවුත් ඇතිදැඩි කළේය, පෝෂ්‍යය කෙළේය. වර්ධනය කළේය. යම් කලෙක ඒ ළමයා දස අවුරුදු හෝ දොළොස් අවුරුදු වයස් ඇත්තේද, එකල ගිනි දෙවියා පුදන්නාවූ ඒ ජටිලයාට ජනපදයෙහි කිසියම් කටයුත්තක් උපන්නේය. අනතුරුව ගිනිදෙවියා පුදන්නාවූ ඒ ජටිල තෙම ඒ ළමයාට කථාකොට "පුත්‍රය, මම ජනපදයට යන්ට කැමැත්තෙමි. පුත, තෝ, ගිනි පුදව, තාගේ ගිනි නොනිවව. ඉදින් තාගේ ගිනි නිවුනේ නම් මේ වෑයයි, මේ දරය, මේ ගිනි ගානා දඬු දෙකය, ගිනි උපදවා ගිනි පුදව"යි කීය. ඉක්බිති ඒ ගිනිදෙවියා පුදන ජටිලතෙම ඒ ළමයාට මෙසේ අනුසාසනා කොට ජනපදයට ගියේය. සෙල්ලම් කිරීමෙහි යෙදුනාවූ ඒ ළමයාගේ ගිනි නිවී ගියේය. ඊට පසුව ඒ ළමයාට මෙබඳු සිතක් වූයේය. පිය තෙමේ මට "පුත්‍රය, ගිනි පුදව" තාගේ ගිනි නොනිවව. ඉදින් තාගේ ගිනි නිවුනේ නම් මේ වෑයය, මේ දරය, මේ ගිනිගානා දඬු දෙකය, ගිනි උපදවා ගිනි පුදව"යි කියා ගියේය. මම ගිනි උපදවා ගිනි පුදන්නෙම් නම් යෙහෙකැයි සිතීය. ඉක්බිතිව ඒ ළමයා ගිනි උපදවා ගිනි දෙවියා පුදන්නෙම් නම් යෙහෙකැයි සිතා ගිනි ගානා දඬු දෙක වෑයෙන් සැස්සේය. හෙතෙම ගිනි නොලැබීය. ගිනි ගානා දඬු දෙක දෙකට පැලුයේය. තුනට පැලුයේය. සතරට පැලුයේය. පහට පැලුයේය. දහයට පැලුයේය. සියයකට පැලුයේය. කැබලි කැබලි කෙළේය. කැබලි කැබලි කොට වනෙහි ලා කෙටුයේය, වනෙහි ලා කොටා මහා සුලඟෙහි පිඹ හැරියේය. හෙතෙම ගිනි නොලැබුයේමය. ඊට පසුව ගිනි පුදන ඒජටිල තෙම ජනපදයෙහි ඒ කටයුත්ත අවසාන කොට තමන්ගේ ආශ්‍රමය යම් තැනකද එහි පැමිණියේය. පැමිණ 'පුත්‍රය, කිමෙක්ද තාගේ ගිනි නොනිවුනේ දැ"යි ඇසීය. පියානෙනි, මෙහි මා සෙල්ලම් කරමින් සිටිද්දී මාගේ ගිනි නිවියේය. එකල මට 'මාගේ පියතෙම වනාහි පුත්‍රය, තෝ ගිනි පුදව, තාගේ ගිනි

නොනිවච, ඉදින් තාගේ ගිනි නිවුනේ නම් මේ වෑයය, මේ දරය, මේ ගිනි ගානා දඬු දෙකය, ගිනි උපදවා ගිනි පුදව”යි කීයේය. එබැවින් මම ගිනි උපදවා ගිනි පුදන්නෙම් නම් යෙහෙකැයි සිතුවෙමි. පියාණෙනි, ඉක්බිතිව ගිනි ලබන්නෙම් නම් යෙහෙකැයි කියා ගිනි ගානා දඬු දෙක වෑයෙන් සැස්සෙමි. මම ගිනි නොලැබුයෙමි. ගිනි ගානා දඬු දෙක දෙකට පැලුයෙමි. තුනට පැලුයෙමි. සතරට පැලුයෙමි. පහට පැලුයෙමි. දහයට පැලුයෙමි. සියයකට පැලුයෙමි, කැබෙලි කැබලි කෙළෙමි. කැබලි කැබලි කොට වනෙහි ලා කෙටූයෙමි. වනෙහි ලා කොටා මහ සුලඟෙහි පිඹ හැරියෙමි. මම ගිනි නොලැබුයෙමියි කීය. ඊට පසුව ගිනි පුදන්නාවූ ඒ ජටිලයා මේ ළදරු තෙම අඥානය, අදක්ෂය. කෙසේ නම් නුනුවණින් ගිනි සොයන්නේදැයි සිතා ඔහු බලා සිටියදීම ගිනි ගානා දඬු දෙක ගෙන ගිනි උපදවා, ඒ ළමයාට මෙසේ කීයේය. “පුත්‍රය, මෙසේ ගිනි ඉපදවිය යුතුය අඥානවූ අදක්ෂවූ තොප මෙන් නුනුවණින් ගිනි නොසොයන්නෙහිය” යි කීයේය. රාජන්‍යය, එපරිද්දෙන්ම අඥානවූ අදක්ෂවූ තෝ නුනුවණින් පරලොව සොයන්නෙහිය. රාජන්‍යය, මේ ලාමකවූ දෘෂ්ටිය දුරුකරව, රාජන්‍යය, මේ ලාමක දෘෂ්ටිය දුරුකරව, තට දීර්ඝ කාලයක් අහිත පිණිස දුක් පිණිස නොවේවායි කීයේය.

22. “කෙසේ හෝ පින්වත් කාශ්‍යපයෝ මෙසේ කියති. එසේවී නමුත් මේ ලාමකවූ දෘෂ්ටිය හරින්ට නොහැකි වෙමි. පසේනදි කොසොල් රජතෙමේද වෙනත් ජනපදවල රජවරුද “පායාසි රාජන්‍ය තෙමේ මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදිනා සත්වයෝ නැත්තාහුය, කුසලාකුසල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේය යන වාද ඇත්තෙකැයිද දෘෂ්ටි ඇත්තෙකැයිද දනිත්. පින්වත් කාශ්‍යපය, ඉදින් මම මේ ලාමක දෘෂ්ටිය හරින්නෙම් නම් මට මෙසේ කියන්නෝ වන්නාහුය. “පායාසි රාජන්‍ය තෙමේ අඥාන වෙයි, අව්‍යක්ත වෙයි, වරදවා ගන්නා ලද්දක් ගන්නෙක් වෙයි කියාය. යම් කෙනෙක් මට අව්‍යක්තය යනාදි වශයෙන් මෙසේ කියද්ද, ඔවුන් කෙරෙහි උපදින කෝපයෙන්ද ඒ දෘෂ්ටිය ගෙන හැසිරෙන්නෙමි. ඔවුන්

කෙරෙහි උපදින ගුණමකු කමින්ද මේ දෘෂ්ටිය ගෙන හැසිරෙන්නෙමි. එකට එක කිරීමක් වශයෙන්ද මේ දෘෂ්ටිය ගෙන හැසිරෙන්නෙමියි” කීයේය.

23. රාජන්‍යය, එසේ වීනම් තට උපමාවක් කියන්නෙමි. උපමාවෙන්ද මේ ලෝකයෙහි සමහර නුවණැති පුරුෂයෝ කියනලද වචනයේ තේරුම දැනගනිත්. රාජන්‍යය, පෙරවූ දෙයක් කියමි. ගැල් දහසකින් යුක්තවූ මහත් ගැල් සමූහයක් නැගෙනහිර ජනපදයෙන් බටහිර ජනපදයට ගියේය. ඒ ගැල් සමූහය යම් යම් මාර්ගයකින් යාද, ඒ ඒ මාර්ගයෙහි තණද, දරද, දියද (අවසන් වෙයි) යටත්පිරිසෙයින් නිල් තණකොළ පමණකුදු ඉතිරි නොවෙයි. එකෙක් ගැල් පන්සියයකටද, තවත් එකෙක් අනික් ගැල් පන්සියයකටදැයි ඒ ගැල් සමූහයෙහි ගැල්නායකයෝ දෙදෙනෙක් වූහ. අනතුරුව ඒ ගැල් නායකයන්ට මෙබඳු සිතක් ඇතිවිය. මේ වනාහි ගැල් දහසකින් යුක්තවූ මහත් ගැල් සමූහයෙක් වෙයි. ඒ අපි යම් මාර්ගයකින් යන්නමෝද, ඒ මාර්ගයන්හි තණද, දරද, දියද (අවසන් වෙයි) යටත්පිරිසෙයින් තණකොල පමණකුත් ඉතිරි නොවෙයි. අපි එක් කොටසකට ගැල් පන්සියය බැගින් මේ ගැල් සමූහය දෙකට බෙදන්නමු නම් හොඳයයි සිතීය. ඔව්හු එක් කොටසකට ගැල් පන්සියයක්ද අනික් කොටසට ගැල් පන්සියයක්දැයි දෙකට බෙදුවාහුය. එක් ගැල් නායකයෙක් බොහෝ තණද, දරද, දියද, ගැල්වල පටවාගෙන ගැල් සමූහය පැදවූයේය. දෙතුන් දිනක් ගියාවූ ඒ ගැල් සමූහය මඩ තැවරුණාවූ රෝදවලින් යුක්තවූ යහපත්වූ රථයකින් ඉදිරි මාර්ගයට එන්නාවූ රතුපාටවූ ඇස් ඇති දරනලද දුනු ඊතල ඇති බෙල්ලෙහි පළඳිනලද මානෙල් මල් මාලා ඇත්තාවූ තෙත්වූ වස්ත්‍ර ඇත්තාවූ තෙත්වූ ඉසකෙස් ඇති කළුපාටවූ පුරුෂයෙකු දුටුයේය. දැක, පින්වත, කිනම් ජනපදයකින් එන්නෙහිදැයි ඇසීය. අසවල් ජනපදයනැයි කීයේය. කොතැනට යන්නෙහිදැයි ඇසුවේය. මෙ නම් ජනපදයටයයි කීයේය. පින්වත, කිමෙක්ද, ඉදිරි කාන්තාරයෙහි මහාවැස්සක් වැස්සේ දැයි ඇසීය. පින්වත, එසේය. ඉදිරි කාන්තාරයෙහි මහාවැස්සක් වැස්සේය. පාරවල් වතුරෙන් පිරී

ඇත. බොහෝවූ තණද, දරද, දියද ඇත්තේ වෙයි. පින්වත, පරණවූ තණද, දරද, දියද අහක දමව්. සැහැල්ලු බර ඇති ගැල්වලින් යුක්තව වහ වහා යව්. ගවයන් මහන්සි නොකරව්යයි කීයේය. ඉක්බිතිව ඒ ගැල් ප්‍රධානියා ගැල් සමූහයෙහි සිටියවුන්ට කථා කෙළේය. පින්වත්නි, මේ පුරුෂයා මෙසේ කියයි. 'ඉදිරි කාන්තාරයෙහි මහාවැස්සක් වැස්සේය. පාරවල් වතුරෙන් පිරී ඇත. බොහෝ දියද දරද තණද ඇත්තේය. පින්වත්නි, පරණවූ තණද, දියද, දරද, අහකදමව්. ගැල් වල බර අඩු කොට ගෙන වහා යව්. ගවයන් මහන්සි නොකරව්' යයි කියායි. එහෙයින් පින්වත්නි, පරණවූ තණද දරද දියද අහක දමව්. ගැල්වල බර අඩු කර පදවව්යයි, කීයේය. පින්වත, එසේය කියා ඒ ගැල් සමූහයෙහි සිටි පුරුෂයෝ ඒ ගැල් ප්‍රධානියාට පිළිතුරුදී පරණවූ තණද දරද, දියද අහක දමා ගැල්වල බර අඩුකර ගෙන පැදවූහ. ඔවුහු පළමුවන නවාතැන්පලෙහිද, තණ හෝ දර හෝ දිය හෝ නුදුටුවාහුය. දෙවැනි නවාතන්පලෙහිද, තණ හෝ දර හෝ දිය හෝ නුදුටුවාහුය. තුන්වන නවාතැන්පලෙහිද, තණ හෝ දර හෝ දිය හෝ නුදුටුවාහුය. සතරවන නවාතැන් පලෙහිද, දර හෝ තණ හෝ දිය හෝ නුදුටුවාහුය. පස්වන නවාතැන් පලෙහිද, තණ හෝ දර හෝ දිය හෝ නුදුටුවාහුය. සයවන නවාතැන්පලෙහිද තණ හෝ දර හෝ දිය හෝ නුදුටුවාහුය. සත්වන නවාතැන් පලෙහිද තණ හෝ දර හෝ දිය හෝ නුදුටුවාහුය. ඒ සියල්ලෝම මහත් විනාශයට පැමිණියාහුය. මනුෂ්‍යාවූද තිරිසන්වූද යම් කෙනෙක් ඒ ගැල් සමූහයෙහි වූවාහුද, ඒ සියල්ලෝම අමනුෂ්‍යවූ යකුන් විසින් කාදමන ලද්දාහ. ඇට පමණක් ඉතිරි කළෝය. දෙවන ගැල් ප්‍රධානියා ඒ ගැල්සමූහය දැන් නික්ම බොහෝ කල් ගියේයයි යම් කලෙක දැන ගත්තේද එකල බොහෝ තණද දියද දරද ගැල්වලට පටවා ගෙණ ගැල්සමූහය පැදවූයේය. මේ ගැල් සමූහයද තුන් දිනක් ගියපසු හෙතෙම මඩ තැවරුණාවූ රෝදවලින් යුක්තවූ යහපත්වූ රථයකින් ඉදිරි මාර්ගයට එන්නාවූ රතුපාට ඇස් ඇති දරණ ලද දුනු ඊතල ඇති බෙල්ලෙහි පළඳිනලද මානිල්මල්මාලා ඇති තෙත්වූ වස්ත්‍ර ඇති තෙත්වූඉසකෙස් ඇති කළුපාට

පුරුෂයෙකුදුටුවේය. දැක පින්වත, කිනම් ජනපදයකින් එන්නෙහි දැයි ඇසීය. අසවල් ජනපදයෙනැයි කීවේය. කොතැනට යන්නෙහි දැයි ඇසීය. මෙනම් ජනපදයටයි කීයේය. පින්වත, කිමෙක්ද ඉදිරි කාන්තාරයෙහි මහාවැස්සක් වැස්සේදැයි ඇසීය. පින්වත, එසේය, ඉදිරි කාන්තාරයෙහි මහාවැස්සක් වැස්සේය. මාර්ග වතුරෙන් පිරීගොස්ය. බොහෝවූ තණද දරද දියද ඇත්තේය. පින්වත, පරණවූ තණද දරද දියද බැහැර දමව්. ගැල්වල බර අඩුකර ගෙන වහා වහා යව්. මේ ගවයන් මහන්සි නොකරවියයි කීයේය. ඊට පසුව ඒ ගැල් ප්‍රධානියා ගැල් සමූහයෙහි නියුක්තයන්ට කථා කෙළේය.

පින්වත්නි, මේ පුරුෂයා මෙසේ කියයි. "ඉදිරි කාන්තරයෙහි මහවැස්සක් වැස්සේය. මාර්ග ජලයෙන් පිරී ගොස්ය. බොහෝවූ තණද, දරද, දියද, ඇත්තේය. පින්වතුනි, පරණවූ තණද, දරද, දියද, අහකදමව්. ගැල්වලබර අඩුකර ගෙන වහා වහා යව්. ගවයන් මහන්සි නොකරවිය" යි කියායි. පින්වත්නි, මේ පුරුෂතෙම වනාහි අපගේ මිත්‍රයෙක් නොවෙයි. සහලේනෑයෙක්ද නොවෙයි. අපි කෙසේ නම් මොහු ගැන විශ්වාසයෙන් යන්නමුද, පරණවූ තණද, දරද, දියද, අහක නොදැමිය යුත්තාහුය. තණ ආදිය හා බඩුද තැන්පත් කරණ ලද පරිද්දෙන්ම ගැල් සමූහය පදවව්. අපගේ පුරාණවූ තණ ආදිය බැහැර නොදමවියයි කීයේය.

පින්වත, එසේයයි ඒ ගැල් සමූහයෙහි නියුක්ත වූවෝ ඒ නායකයාට පිළිතුරුදී තැන්පත් කර තබන ලද භාණ්ඩ ඇති පරිදිම ගැල් සමූහය පැදෙව්වාහුය. ඔවුහු පළමුවන නවාතැනෙහිද තණ හෝ දර හෝ දිය හෝ නුදුටුවාහුය. දෙවෙනි නවාතැනෙහිද තණ හෝ දර හෝ දිය හෝ නුදුටුවාහුය. තුන්වන නවාතැනෙහිද තණ හෝ, දර හෝ, දිය හෝ නුදුටුවාහුය. සතරවන නවාතැනෙහිද තණ හෝ දර හෝ, දිය හෝ නුදුටුවාහුය. පස්වන නවාතැනෙහිද තණ හෝ දර හෝ, දිය හෝ නුදුටුවාහුය. සයවන නවාතැනෙහිද තණ හෝ, දර හෝ, දිය හෝ නුදුටුවාහුය. සත්වන නවාතැනෙහිද තණ හෝ, දර හෝ, දිය හෝ නුදුටුවාහුය. මහා විනාශයට පැමිණියාවූ ඒ ගැල් සමූහය දුටුයේය. ඒ ගැල් සමූහයෙහි යම් මනුෂ්‍යයෝ හෝ

සිවුපාවෝ හෝ වූවාහුද අමනුෂ්‍යවූ ඒ යක්ෂයා විසින් කාදමනලද ඔවුන්ගේ ඇට පමණක්ම දුටුවාහුය. ඊට පසුව ඒ ගැල් නායක තෙම ඒ ගැල් සමූහයෙහි නියුක්තයන්ට කථා කළේය.

පින්වත්නි, මේ ගැල් සමූහය ඒ අඥානවූ ගැල් නායකයා නිසා මෙසේ මහාවිනාශයට පැමිණියේය.

පින්වත්නි, එහෙනම් අපගේ ගැල් සමූහයෙහි අඩුවූ අගය ඇති යම් භාණ්ඩයෝ වෙද්ද, ඒ භාණ්ඩයන් අහක දමා මේ ගැල් සමූහයෙහි වැඩිවූ අගය ඇති යම් භාණ්ඩයෝ වෙද්ද, ඒ භාණ්ඩයන් ගනිව්යයි' කීයේය.

පින්වත, එසේය කියා ඒ ගැල් නායකයාට පිළිතුරුදී තමන්ගේ ගැල්වල අඩුවූ වටිනාකම් ඇති යම් භාණ්ඩයෝ වෙද්ද ඒ භාණ්ඩයන් බැහැර දමා ඒ ගැල් සමූහයෙහි වැඩිවූ වටිනාකම් ඇති යම් භාණ්ඩයෝ වෙද්ද ඒ භාණ්ඩයන් ගෙණ පණ්ඩිතවූ ඒ ගැල්නායකයා යම්සේ ඒ කාන්තාරය සැපසේ එතෙර කළාහුද, රාජන්‍යය, එපරිද්දෙන්ම අඥානවූ අව්‍යක්තවූ නුනුවණින් පරලොව සොයන්නාවූ තෝ මහා විනාශයට පැමිණෙන්නෙහිය. මෙසේ ඒ අඥානවූ ගැල්නායකයා නිසා ගැල් සමූහය මහාවිනාශයට පැමිණියේද එමෙන්ම යම් කෙනෙක් තාගේ වචනම ඇසිය යුතුයයිද, ඇදහිය යුතුයයිද, සිතන්නාහුද, ඔව්හුද ඒ ගැල් සමූහයෙහි නියුක්තයන් මෙන් විනාශයට පැමිණෙන්නාහුය. රාජන්‍යය මේ ලාමකවූ මිථ්‍යා දෘෂ්ටිය දුරුකරව, රාජන්‍යය, මේ ලාමකවූ මිථ්‍යාදෘෂ්ටිය දුරු කරව, තොපට දීර්ඝකාලයක් මුළුල්ලෙහි අහිත පිණිස දුක් පිණිස නොවේවා.

**24.** කිසිසේත් භවත් කාශ්‍යපතෙමේ කියයිද එසේවුවත් මේ ලාමකවූ දෘෂ්ටිය දුරුකළ නොහැක්කෙමි. පසේනදි කොසොල් රජතෙමේද අනික් පිට රාජ්‍යවල රජවරුද "පායාසි රාජන්‍ය තෙමේ මේ කාරණයෙන්ද පරලොව නැත්තේය. මැරී උපදනා සත්වයෝ නැත්තාහුය කුසලාකුසල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියන්නෙකැයිද මෙබඳු දෘෂ්ටි ඇත්තෙකැයිද දන්නාහුය. පින්වත් කාශ්‍යපය, ඉඳින් මම මේ

ලාමකවූ දෘෂ්ටිය අත්හරින්නෙම් නම් පායාසි රාජන්‍ය තෙම අඥානයෙක, වැරදිමත ගන්නෙකැයි කියන්නෝ වන්නාහුය. යම් කෙනෙක් මට අව්‍යක්තය යනාදීන් කියද්ද, ඔවුන් කෙරෙහි උපදනා කෝපයෙන්ද, ඒ මේ දෘෂ්ටිය ගෙණ හැසිරෙන්නෙමි. ඔවුන් කෙරෙහි ඇතිවන්නාවූ ගුණමකුකමින්ද ඒ මේ දෘෂ්ටිය ගෙණ හැසිරෙන්නෙමි, ඔවුන්ට එකට එක කිරීම් වශයෙන්ද ඒ මේ දෘෂ්ටිය ගෙණ හැසිරෙන්නෙමි"යි කීයේය.

**25.** රාජන්‍යය, එසේ නම් තට උපමාවක් දක්වන්නෙමි. මේ ලෝකයෙහි සමහර නුවණැති පුරුෂයෝ උපමායෙන්ද කියන ලද වචනයාගේ අර්ථය දැන ගනිත්, රාජන්‍යය, පෙරවූ දෙයක් නම් ඌරන් ඇතිකරන්නාවූ එක් පුරුෂයෙක් සිය ගමින් අන් ගමකට ගියේය. ඒ ගමෙහි දමනලද බොහෝවූ වියලී ගියාවූ අසුචි දුටුයේය. ඒ වියලි අසුචි දුටු ඔහුට මෙබඳු සිතක් වූයේය. මේ දමනලද වියලුනු අසුචි බොහෝ ඇත්තේය, මාගේ හූරෝද ආහාර නැත්තාහුය, මෙයින් වියලි අසුචි ගෙණ යන්නෙම් නම් යෙහෙකැයි කියාය. හෙතෙම උතුරුසලුව දිගහැර බොහෝ වියලි අසුචි අවුලා පොදියක් බැඳ හිසෙහි තබා ගෙණ ගියේය. එසේ යන කල්හි අතර මග මහත් අකාල වර්ෂාවක් වැස්සේය. හෙතෙම පාදයෙහි නියපොතු අග දක්වා උඩින් වැගිරෙන්නාවූද යටින් පෙරෙන්නාවූද අසුචියෙන් තැවරුණේ ගූ ආහාරය ගෙණ ගියේය. මනුෂ්‍යයෝ ඒ පුරුෂයා දැක මෙසේ කීවාහුය. කිමෙක්ද බොළ තෝ පිස්සෙක්ද විකල සිත් ඇත්තෙක්ද නිය අග දක්වා උඩින් වැගිරෙන්නාවූද යටින් පෙරෙන්නාවූද ගූයෙන් තැවරී ගූ ආහාරය ගෙණ යන්නෙහිදැයි ඇසූහ. බොලව්, මේ කාරණයෙහි තොපිම උම්මත්තකයෝය, විකල සිත් ඇත්තෝය, එසේද වුවත් මාගේ ඌරන්ට කෑම නැත්තාහුයයි ඔහු කීය, රාජන්‍යය, එපරිද්දෙන්ම තෝ ගූ ආහාරය ගෙණ ගියාවූ ඒ පුරුෂයා වැනියයි වැටහෙන්නේය, රාජන්‍යය, මේ ලාමකවූ දෘෂ්ටිය දුරුකරව රාජන්‍යය, මේ ලාමකවූ දෘෂ්ටිය දුරුකරව, තට දීර්ඝකාලයක් මුළුල්ලෙහි අහිත පිණිසද දුක් පිණිසද නොවේවායි" කීයේය.

**26.** "කිසිසේත් පින්වත් කාශ්‍යප තෙමේ මෙසේ කියද්ද එසේ වී නමුත් මේ ලාමක දෘෂ්ටිය හරින්ට නොහැක්කෙමි,

පසේනදි කොසොල් රජතෙමේද අන්‍ය ජනපදවල රජවරුද පායාසි රාජන්‍ය තෙමේ මේ කාරණයෙන්ද පරලොව නැත්තේය, මැරී උපදනා සත්වයෝ නැත්තාහුය, කුසලාකුසලකර්මයන්ගේ ඵලවිපාකයෙක් නැත්තේයයි කියන්නෙකැයිද මෙබඳු දෘෂ්ටි ඇත්තෙකැ"යිද මා දනිත්, පින්වත් කාශ්‍යපය, ඉදින් මම මේ ලාමකවූ දෘෂ්ටිය හරින්නෙම් නම් පායාසි රාජන්‍යතෙමේ අඥානයෙක, අව්‍යක්තයෙක, වැරදිමත ගන්නෙකැයි, මටකියන්නෝ වන්නාහුය, යම් කෙනෙක් මට අව්‍යක්තය යනාදීන් කියද්ද, ඔවුන් කෙරෙහි උපදනා කෝපයෙන්ද ඒ මේ දෘෂ්ටිය ගෙණ හැසිරෙන්නෙමි, ඔවුන් කෙරෙහි ඇති ගුණමකුකමින්ද ඒ මේ දෘෂ්ටිය ගෙණ හැසිරෙන්නෙමි, ඔවුන්ට එකටඑක කිරීම් වශයෙන්ද මේ දෘෂ්ටියගෙන හැසිරෙන්නෙමි"යි කීයේය.

27. "එසේ වීනම් තට උපමාවක් දක්වන්නෙමි. මේ ලෝකයෙහි නුවණැත්තාවූ සමහර මනුෂ්‍යයෝ උපමායෙන්ද කියන ලද වචනයාගේ අර්ථය දැනගණිත්, රාජන්‍යය, පෙරවූ දෙයක් කියමි. අක්ෂධූර්තයෝ (දූ කෙළින්නෝ) දෙදෙනෙක් දාදු කැටවලින් ක්‍රීඩා කළෝය. එයින් එකෙක් පරාදවන පරාද වන දාදු කැටය ගිලියි. දෙවැන්නා පරාද වන දාදු කැටය ගිලින්නාවූ ඒ දූ කෙළින්නා දුටුයේය. දැක, ඔහුට මෙසේ කීයේය. යහලුව, තෝ වනාහි ඒකාන්තයෙන් දිනන්නෙහිය. යහලුව, දාදු කැට මට දෙව, බලිකර්මයක් කරන්නෙමියි කියේය. යහලුව එසේයයි කියා ඒ දූ කෙළින්නා ඒ දෙවැනි දූ කෙළින්නාට දාදු කැට දුන්නේය. ඉක්බිත්තෙන් ඒ දෙවැනි දූ කෙළින්නාද දාදු කැට විෂයෙන් යොදා ඒ දූ කෙළින්නාට මෙසේ කීයේය. යහලුව එව දාදු කැටවලින් ක්‍රීඩා කරන්නෙමු යයි කියාය. යහලුව එසේය කියා ඒ දූ කෙළින්නා දෙවැනි දූ කෙළින්නාට පිළිතුරුදුන්හ, දෙවනුවද ඒ අක්ෂ ධූර්තකයෝ දෙදෙන පස ඇටවලින් ක්‍රීඩා කළෝය. දෙවැනි වතාවේද ඒ අක්ෂ ධූර්තක තෙම පැමිණි පැමිණි පරාජය ගුලිය ගිළියි, දෙවෙනි අක්ෂ ධූර්තක තෙම පැමිණි පැමිණි පරාජය ගුලිය ගිළින්නාවූ ඒ අක්ෂ ධූර්තකයා දුටුයේය. දැක ඒ අක්ෂ ධූර්තකයාහට මේ ගාථාව කීයේය.

"තියුණුවූ විෂයෙන් ගල්වන ලද පස ඇට ගිලින්නාවූ පුරුෂතෙම නොදනියි. එම්බල පුරුෂය, ගිළුව. පාපීවූ ධූර්තකය ගිලපිය, පසුව තට දරුණුවූ විපාක වන්නේයයි කියාය."

රාජන්‍යය, එපරිද්දෙන්ම තෝ දූ කෙළින්නෙකු වැනියයි වැටහෙන්නේය. රාජන්‍යය මේ ලාමකවූ දෘෂ්ටිය අත්හරුව, රාජන්‍යය, මේ ලාමක දෘෂ්ටිය අත්හරුව දීර්ඝ කාලයක් මුලුල්ලෙහි තට අහිතපිණිසද දුක් පිණිසද නොවේවායි කීයේය.

**28.** කිසිසේත් භවත් කාශ්‍යප තෙමේ මෙසේ කියන්නේය. එසේ වූයේ නුමුත් මේ ලාමකවූ දෘෂ්ටිය අත්හරින්ට නොහැක්කේ වෙමි. පසේනදි කොසොල් රජතෙමේද අනික් ජනපදවල රජවරුද "පායාසි රාජන්‍ය තෙමේ මේ කාරණයෙන්ද (මෙලොව සිටියාහට) පරලොව නැත්තේය. මැරී උපදනා සත්වයෝ නැත්තාහුය. කුසලාකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි කියන්නෙක මෙබඳු දෘෂ්ටි ඇත්තෙකැයි දනිත්යයි" කීයේය.

"පින්වත් කාශ්‍යපය, ඉදින් මම මේ ලාමකවූ දෘෂ්ටිය හරින්නෙම් නම් "පායාසි රාජන්‍යය තෙමේ අඥාන වෙයි, අව්‍යක්ත වෙයි, වරදවා ගන්නාලද දේ, ගන්නෙකැ"යි මට මෙසේ කියන්නෝ ඇතිවෙත්. යම් කෙනෙක් මට අව්‍යක්තය යනාදිය කියද්ද, ඔවුන් කෙරෙහි උපදනා කෝපයෙන්ද ඒ මේ දෘෂ්ටිය ගෙන හැසිරෙන්නෙමි, ඔවුන් කෙරෙහි උපදනා ගුණමකුකමින්ද, ඒ මේ දෘෂ්ටිය ගෙන හැසිරෙන්නෙමි, එකට එක කිරීම් වශයෙන්ද, මේ දෘෂ්ටිය ගෙන හැසිරෙන්නෙමියි" කීයේය.

**29.** රාජන්‍යය, එසේ නම් තට උපමාවක් කියන්නෙමි. උපමායෙන්ද මේ ලොකයෙහි සමහර නුවණැති පුරුෂයෝ කියනලද වචනයාගේ අර්ථය දැනගනිත්. රාජන්‍යය, පෙරවූ කාරණයක් කියමි. එක්තරා ජනපදයක් දියුණු වූයේය. අනතුරුව යහලුවෙක් යහලුවෙකුට කථා කෙළේය. යහලුව යමු. ඒ ජනපදය යම් තැනකද එතනට යමු. එහිදී යම් කිසි ධනයක් ලබන්නෙමු නම් යෙහෙකැයි කීය. යහලුව, එසේය කියා අනික් යහලු තෙම ඒ යහලුවාට පිළිතුරු දුන්නේය. ඔහු දෙදෙන ඒ ජනපදය යම් තැනකද එක්තරා දියුණු ගමක් යම්තැනකද එහි පැමිණියාහුය.

එහි දමනලද බොහෝවූ සණ වැහැරි දුටුවාහුය. යහලුතෙම අනික් යහලුවාට කථා කෙළේය. යහලුව, මේ බොහෝවූ සණවැහැරි දමන ලද්දේය. යහලුව, එහෙයින් තෝද, සණවැහැරි මිටියක් බැඳ ගණුව. මමද සණවැහැරි මිටියක් බැඳ ගන්නෙමි, දෙදෙනාම සණවැහැරි ගෙන යන්නම්හයි කීය, යහලුව, එසේයයි කියා අනික් යහලු තෙම යහලුවාට උත්තරදී සණවැහැරි මිටියක් බැන්දේය. ඔහු දෙදෙනම සණවැහැරි මිටි ගෙන එක්තරා දියුණු ගමක් යම් තැනකද, එහි පැමිණියාහුය. එහි දමන ලද බොහෝවූ හන නූල් දුටුවා හුය. දැක යහලු තෙම යහලුවාට කථා කෙළේය. යහලුව යමක් සඳහා සණවැහැරි කැමැති වන්නමෝද, මේ බොහෝවූ සණනූල් අහක දමන ලද්දේ වෙයි. යහලුව, එහෙයින් තෝද සණවැහැරි මිටිය ඉවත දමව. මමද සණවැහැරි මිටිය අහක දමන්නෙමි. දෙදෙනම සණනූල් මිටි ගෙනයන්නමෝ යයි කීයේය. දෙවැනි යහලුවා, මේ සණවැහැරි මිටිය මා විසින් දුරසිට ගෙනෙන ලද්දේද මනාලෙස බඳිනා ලද්දේද වෙයි. මට ප්‍රයෝජන නොවෙයි. තෝ දැනගනුව, හෙවත් ගනු කැමැත්තෙහි නම් ගනුවයි කීයේය, ඊටපසුව ඒ යහලු තෙම හණවැහැරි මිටිය අහක දමා හණනූල් මිටිය බැඳ ගත්තේය. ඔහු දෙදෙන එක්තරා දියුණු ගමක් යම් තැනකද එහි පැමිණියාහුය. එහි දමන ලද බොහෝවූ හණ පිළි දුටුවාහුය. දැක යහලු තෙම යහලුවාට කථා කෙළේය. යහලුව, යමක් සඳහා හන වැහැරි හනනූල් හෝ කැමැති වන්නමෝද මේ බොහෝ සණපිළි දමන ලද්දේය, යහලුව, එහෙයින් තෝද සණවැහැරි මිටිය අහක දමව, මමද හණනූල් මිටිය අහක දමන්නෙමි. දෙදෙනම හණ වස්ත්‍ර ගෙනයන්නෙමුයි කීයේය. යහලුව, මේ හණමිටිය මා විසින් දුර සිට ගෙණන ලද්දේද මනාකොට බඳනා ලද්දේද වෙයි. මට ප්‍රයෝජන නොවෙයි. තෝ දැන ගණුවයි කීය. ඊට පසුව ඒ යහලු තෙම හණ නූල් මිටිය අහකදමා හණ පිළි මිටියක් බැඳ ගත්තේය.

ඔහු දෙදෙන එක්තරා දියුණු ගමක් යම් තැනකද, එහි පැමිණියාහුය. එහි දමන ලද කොමු වැහැරි දුටුවාහුය. යහලු තෙම යහලුවාට කථා කළේය. යහලුව යමක් සඳහා හණ වැහැරි,

හණ නූල්, හණ පිළි කැමති වන්නෝමද, මේ බොහෝවූ කොමු වැහැරි අහක දමන ලද්දේය. යහලුව, එහෙයින් තෝද හන මිටිය අහක දමව, මමද හණ පිළි මිටිය අහක දමන්නෙමි. දෙදෙනම කොමු වැහැරි ගෙන යන්නෙමුයි, කීය. "යහලුව මේ හණ මිටිය මා විසින් බොහෝ දුර සිට ගෙනෙන ලද්දේද, හොඳින් බඳින ලද්දේද වෙයි. මට එයින් වැඩක් නැත තගේ කැමැත්තක් කරවයි" කීය. ඊට පසුව ඒ යහලු තෙම හණ පිළි මිටිය අහක දමා කොමු වැහැරි බරක් බැඳ ගත්තේය. ඔහු දෙදෙන (තවත්) එක්තරා දියුණු ගමකට පැමිණියාහුය. එහි දමන ලද බොහෝවූ කොමු වැහැරි නූල් දුටුවාහුය. දැක යහලු තෙම යහලුවාට කථා කළේය. "යහලුව යමක් සඳහා අපි හණ වැහැරි, හණ නූල්, හණ පිළි, කොමු වැහැරි කැමති වන්නමෝද, මේ බොහෝවූ කොමු වැහැරි නූල් අහක දමන ලද්දේය. යහලුව එහෙයින් තෝද හණ මිටිය අහක දමව මමද කොමු වැහැරි මිටිය අහක දමන්නෙමි. දෙදෙනම කොමු වැහැරි නූල් ගෙන යන්නෙමුයි" කීය. යහලුව මේ හණ මිටිය මා විසින් බොහෝ දුර සිට ගෙනෙන ලද්දේද, හොඳින් බඳින ලද්දේද වෙයි. මට එයින් කමක් නැත, තගේ කැමැත්තක් කරවයි" කීය. ඊට පසු ඒ යහලු තෙම කොමු වැහැරි මිටිය අහක දමා කොමු වැහැරි නූල් බරක් බැඳ ගත්තේය. ඔහු දෙදෙන (තවත්) එක්තරා දියුණු ගමකට පැමිණියාහුය. එහි දමනලද බොහෝවූ කොමු පිළි දුටුවාහුය. දැක යහලු තෙම යහලුවාට කථා කළේය.

"යහලුව, යමක් සඳහා අපි හණ වැහැරි, ගණ නූල්, හණපිළි, කොමුවැහැරි, කොමුවැහැරි නූල් කැමතිවන්නමෝද, මේ බොහෝවූ කොමුපිළි අහක දමන ලද්දේය යහලුව එහෙයින් තෝද හණ මිටිය අහක දමව, මම කොමු වැහැරි නූල් මිටිය අහක දමන්නෙමි. දෙදෙනම කොමු පිළි ගෙන යන්නෙමුයි" කීය.

"යහලුව, මේ හණමිටිය මා විසින් බොහෝ දුර සිට ගෙනෙන ලද්දේද, හොඳින් බඳින ලද්දේද වෙයි. මට ඒවායින් වැඩක් නැත. තගේ කැමැත්තක් කරවයි"යි කීය.

ඉන්පසු ඒ යහලු තෙම කොමු වැහැරි නූල් මිටිය අහක දමා කොමු පිළි බරක් බැඳ ගත්තේය.

ඔහු දෙදෙන (තවත්) එක්තරා දියුණු ගමකට පැමිණියාහුය. එහි දමනලද බොහෝවූ කපු පුලුන් දුටහ. දැක යහලු තෙම යහලුවාට කථා කළේය. යහලුව, යමක් සඳහා අපි හණ වැහැරි, හණනූල්, හණ පිළි, කොමුවැහැරි, කොමුවැහැරි නූල්, කොමු පිළි කැමති වන්නමෝද, මේ බොහෝවූ කපු පුලුන් අහක දමන ලද්දේය. යහලුව එහෙයින් තෝද හණ මිටිය අහක දමව, මමද කොමු පිළි අහක දමන්නෙමි. දෙදෙනම කපු පුලුන් ගෙනයන්නෙමු"යි කීය. "යහලුව මේ හණ මිටිය මා විසින් බොහෝ දුර සිට ගෙනෙන ලද්දේද, හොඳින් බඳින ලද්දේද වෙයි. මට ඒවායින් වැඩක් නැත. තගේ කැමැත්තක් කරවයි කීය.

ඉන්පසු ඒ යහලු තෙම කොමුපිළි මිටිය අහකදමා කපු පුලුන් බරක් බැඳ ගත්තේය.

ඔහු දෙදෙන (තවත්) එක්තරා දියුණු ගමකට පැමිණියහ. එහි දමනලද බොහෝවූ කපු නූල් දුටහ. යහලු තෙම යහලුවාට කථා කළේය. "යහලුව, යමක් සඳහා අපි හණ වැහැරි, හණ නූල්, හණ පිළි, කොමු වැහැරි නූල් කපුපුලුන්, කැමති වන්නෙමුද? මේ බොහෝවූ කපු නූල් අහක දමන ලද්දේය.

යහලුව, එහෙයින් තෝද හණ මිටිය අහක දමව, මමද කපු පුලුන් අහක දමන්නෙමි. දෙදෙනම කපු නූල් ගෙනයන්නෙමු"යි කීය.

"යහලුව, මේ හණමිටිය මා විසින් බොහෝ දුර සිට ගෙනෙන ලද්දේද, හොඳින් බඳින ලද්දේද වෙයි. මට ඒවායින් වැඩක් නැත. තගේ කැමැත්තක් කරවයි" කීය.

ඉන්පසු යහලු තෙම කපු පුලුන් මිටිය අහකදමා කපුනූල් බරක් බැඳ ගත්තේය.

ඔහු දෙදෙන (තවත්) එක්තරා ගමකට පැමිණියහ. එහි දමනලද බොහෝවූ කපු පිළි දුටහ. දැක යහලු තෙම යහලුවාට කථා කෙළේය.

"යහලුව, අපි යමක් සඳහා හණ වැහැරි, හණනූල්, හණ පිළි, කොමු වැහැරි, කොමුවැහැරි නූල්, කොමුපිළි, කපුපුලුන්, කපුනූල් කැමති වන්නමෝද, මේ බොහෝවූ කපුපිළි අහක දමන ලද්දේය. යහලුව, එහෙයින් තෝද හණ මිටිය අහක දමව, මමද කපුනූල් අහක දමන්නෙමි. දෙදෙනාම කපුපිළි ගෙන යන්නෙමුයි" කීය.

"යහලුව, මේ හණමිටිය මා විසින් බොහෝ දුර සිට ගෙනෙන ලද්දේද, හොඳින් බඳින ලද්දේද වෙයි. මට ඒවායින් කම් නැත. තගේ කැමැත්තක් කරවයි" කීය.

ඉන්පසු ඒ යහලු තෙම කපු නූල් අහක දමා, කපු පිළි බරක් බැඳ ගත්තේය.

ඔහු දෙදෙන තවත් එක්තරා ගමකට පැමිණියාහුය. එහි දමනලද බොහෝවූ යකඩ දුටහ. දැක යහලු තෙම යහලුවාට කථා කෙළේය.

"යහලුව, යමක් සඳහා හණවැහැරි, හණනූල්, හණපිළි, කොමුවැහැරි, කොමුවැහැරි නූල්, කොමුපිළි, කපුපුලුන්, කපු නූල්, කපුරෙදි, කැමති වන්නමෝද, මේ බොහෝවූ යකඩ අහක දමන ලද්දේය. යහලුව, එහෙයින් තෝද හණ මිටිය අහක දමව. මමද කපුපිළි අහක දමන්නෙමි. දෙදෙනම යකඩ ගෙන යන්නෙමුයි" කීය.

"යහලුව, මේ හණ මිටිය මා විසින් බොහෝ දුර සිට ගෙනෙන ලද්දේද, හොඳින් බඳින ලද්දේද වෙයි. මට ඒවායින් කමක් නැත. තොපගේ කැමත්තක් කරවයි" කීය.

එවිට ඒ යහලු තෙම කපු පිළි අහක දමා යකඩ බරක් බැඳ ගත්තේය.

ඔහු දෙදෙන (තවත්) දියුණු ගමකට පැමිණියහ. එහි දමනලද බොහෝවූ තඹ දුටහ. දැක යහලු තෙම යහලුවාට කථා කළේය. යහලුව යමක් සඳහා අපි හණ වැහැරි, හණ නූල්, හණ පිළි, කොමුවැහැරි, කොමු පිළි, කපු පුලුන්, කපු නූල්, කපුරෙදි, යකඩ කැමති වන්නමෝද, මේ බොහෝවූ තඹ අහක

දමන ලද්දේය. යහලුව එහෙයින් තෝද හණ මිටිය අහක දමව. මමද යකඩ අහක දමන්නෙමි. දෙදෙනාම තඹ ගෙනයන්නෙමු”යි කීය.

“යහලුව, මේ හණ මිටිය මා විසින් බොහෝ දුර සිට ගෙනෙන ලද්දේද, හොඳින් බඳින ලද්දේද වෙයි. මට ඒවායින් කමක් නැත. තගේ කැමැත්තක් කරවයි කීය.

එවිට ඒ යහලු තෙම යකඩ අහක දමා තඹ මිටියක් බැඳ ගත්තේය.

ඔහු දෙදෙන (තවත්) දියුණු ගමකට පැමිණියහ. එහි දමනලද බොහෝවූ සුදු රීයම් දුටහ. දැක යහලු තෙම යහලුවාට කථා කළේය.

“යහලුව, යමක් සඳහා අපි හණ වැහැරි, හණනූල්, හණ පිළි, කොමු, කොමු නූල්, කොමු පිළි, කපු, කපු නූල්, කපු පිළි යකඩ, තඹ කැමති වන්නමෝද, මේ බොහෝවූ සුදු රීයම් අහක දමන ලද්දේය. යහලුව එහෙයින් තෝද හණ මිටිය අහකදමව, මම තඹ අහක දමන්නෙමි. දෙදෙනාම සුදු රීයම් ගෙන යන්නෙමුයි” කීය.

“යහලුව මේ හණ මිටිය මා විසින් බොහෝ දුර සිට ගෙනෙන ලද්දේද, හොඳින් බඳින ලද්දේද වෙයි. මට ඒවායින් කමක් නැත. තගේ කැමැත්තක් කරවයි”කීය.

එවිට යහලු තෙම තඹ අහක දමා රීයම් බරක් බැඳ ගත්තේය.

ඔහු දෙදෙන (තවත්) දියුණු ගමකට පැමිණියහ. එහි දමනලද බොහෝවූ රිදී දුටහ. දැක යහලු තෙම යහලුවාට කථා කළේය.

“යහලුව, අපි යමක් සඳහා හණ, හණ නූල්, හණ පිළි, කොමු, කොමු නූල්, කොමු පිළි, කපු, කපු නූල්, කපු පිළි, යකඩ, තඹ, රීයම්, කැමති වන්නමෝද, මේ බොහෝවූ රිදී, අහක දමන ලද්දේය. යහලුව, එහෙයින් තෝද හණ මිටිය අහක දමව. මමද රීයම් අහක දමන්නෙමි. දෙදෙනාම රිදී ගෙන යන්නෙමු”යි කීය.

"යහලුව, මේ හණ මිටිය මා විසින් බොහෝ දුර සිට ගෙනෙන ලද්දේද, හොඳින් බඳින ලද්දේද වෙයි. මට ඒවායින් කමක් නැත. තගේ කැමැත්තක් කරව"යි කීය. එවිට යහලු තෙම ඊයම් අහක දමා රිදී බරක් බැඳ ගත්තේය.

ඔහු දෙදෙන (තවත්) දියුණු ගමකට පැමිණියහ. එහි දමනලද බොහෝවූ රන් මසු දුටහ. දැක යහලු තෙම අනික් යහලුවාට කථා කළේය. යහලුව අපි යමක් සඳහා හණ, හණ නූල් හණපිළි, කොමු, කොමුනූල්, කොමුපිළි, කපු, කපුනූල් කපුපිළි, යකඩ, තඹ, සුදු ඊයම්, රිදී කැමති වන්නමෝද, මේ බොහෝ රන් මසු අහක දමන ලද්දේය. යහලුව එහෙයින් තෝද හණ මිටිය අහක දමව, මමද රිදී බර අහක දමන්නෙමි. දෙදෙනාම රන් මසු ගෙන යන්නෙමු"යි කීය.

යහලුව, මේ හණමිටිය මා විසින් බොහෝ දුර සිට ගෙනෙන ලද්දේද, මනාකොට බඳනා ලද්දේද වෙයි. මට එයින් ප්‍රයෝජන නොවෙයි. ඉඳින් තෝ ගනු කැමැත්තෙහි නම් ගණුවයි කීයේය. ඊට පසුව යහලු තෙම රිදී බර අහක දමා රන් මසු බරක් බැඳ ගත්තේය. ඔහු දෙදෙන තමන්ගේ ග්‍රාමය යම් තැනකද එහි පැමිණියාහුය. එහි යම් යහලුවෙක් හණ මිටිය ගෙණ ගියේද, ඔහුගේ මව්පියෝ සතුටු නොවූහ. අඹු දරුවෝද සතුටු නොවූහ. යාළු මිත්‍රයෝද සතුටු නොවූහ. ඒ කරණකොට ගෙන හෙතෙම සැපතටද සතුටටද නොපැමිණියේය. යම් ඒ යහලුවෙක් වනාහි රන්මසු මිටිය රැගෙන ගියේද, ඔහුගේ මව්පියෝද සතුටු වූවාහුය. අඹුදරුවෝද සතුටු වූවාහුය. යාලු මිත්‍රයෝද සතුටු වූවාහුය. ඒ කරණකොට ගෙන සැපතටද සතුටටද පැමිණියේය. රාජන්‍යය, එපරිද්දෙන්ම තෝ හණ මිටිය ගෙන ගිය පුරුෂයා වැනියයි වැටහෙන්නේය, රාජන්‍යය, මේ ලාමකවූ දෘෂ්ටිය අත්හරුව, තට දීර්ඝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස නොවේවායි කීයේය.

30 "මම පළමු උපමාවෙන්ම පින්වත් කාශ්‍යපයන් කෙරෙහි සතුටු සිත් ඇත්තේ විශෙෂයෙන් පැහැදුනෙමි. එසේද වුවත් මම මේ විසිතුරු ප්‍රශ්න වැටැහීම් අසනු කැමැත්තෙම් මෙසේ

මම පින්වත් කාශ්‍යපයන්ට විරුද්ධව කරුණු දැක්විය යුතුයයි සිතුයෙමි. පින්වත් කාශ්‍යපය, ධර්ම දෙශනාව ඉතා මැනව, පින්වත් කාශ්‍යපය, ධර්මදෙශනාව ඉතා යහපති, පින්වත් කාශ්‍යපය, යටිකුරු කරන ලද්දක් උඩු කුරු කරන්නේ හෝ යම්සේද වැසුනාවූ දෙයක් විවෘත කරන්නේ හෝ යම්සේද මංමුළාවූවෙකු හට මාර්ගය කියන්නේ හෝ යම්සේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අන්ධකාරයෙහි තල් පහනක් දරන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම පින්වත් කාශ්‍යපයන් විසින් නොයෙක් පරිද්දෙන් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. පින්වත් කාශ්‍යපය, ඒ මම, ඒ භවත් ගෞතමයාණන් වහන්සේද නවලෝකෝත්තර ධර්මයද ආර්‍ය්‍ය භික්ෂු සංඝයාද සරණ කොට යමි. භවත් කාශ්‍යපයන් වහන්සේ අද පටන් දිවි හිමියෙන් සරණ ගියාවූ උපාසක යෙකැයි මා දරණ සේක්වා, පින්වත් කාශ්‍යපයන් වහන්ස මම මහා දානයක් දීමට කැමැත්තෙමි. පින්වත් කාශ්‍යපයන් වහන්සේ යමක් මට දීර්ඝ කාලයක් මුළුල්ලෙහි හිත පිණිස, සැප පිණිස වන්නේද එසේ මට අනුසාසනා කෙරේවා"යි කීයේය.

31. "රාජන්‍යය, යම් බඳුවූ යාගයෙක්හි ගවයෝ හෝ නසනු ලබද්ද, එළු බැටලුවෝ හෝ නසනු ලබත්ද කුකුළන් හා ඌරෝ හෝ නසනු ලබද්ද, නොයෙක් ප්‍රාණීහු විනාශයට පැමිණෙද්ද මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූ මිථ්‍යාසංකල්පනා ඇත්තාවූ මිථ්‍යාවචන ඇත්තාවූ මිථ්‍යාකර්මාන්ත ඇත්තාවූ මිථ්‍යාජීවිකා ඇත්තාවූ මිථ්‍යාව්‍යායාම ඇත්තාවූ මිථ්‍යාස්මෘති ඇත්තාවූ මිථ්‍යාසමාධි ඇත්තාවූ දන් පිළිගන්නෝ වෙද්ද, රාජන්‍යය, මෙබඳුවූ දානය තෙම මහත්ඵල ඇත්තේ නොවෙයි, මහානිසංස ඇත්තේ නොවෙයි, මහත් බැබලීම් ඇත්තේ නොවෙයි.

"රාජන්‍යය, යම්සේ ගොවියෙක්, බිජුවට හා නගුල ගෙන වනයට යන්නේද, හෙතෙම එහි කණු කටු ආදිය විනාශ නොකරනලද සම නොවූ බිම ඇති නිසරු කෙතෙහි කැඩුනාවූ, කුණුවූ, අව් සුළඟින් නසන ලද සහල් ඇටයෙන් යුක්තවූ හොඳින් තවානෙහි නොදමන ලද්දාවූ බීජයන් වපුරන්නේ නම්, වර්ෂාවද කලින් කල හොඳින් නොවසින්නේ නම් කිමෙක්ද? ඒ බීජයෝ

වැඩීමට, දියුණුවට, පැතුරුණු බවට පැමිණෙත්ද, ගොවියා හෝ මහත් ඵලයට (පොහොසත් බවට) පැමිණෙන්නේදැයි” ඇසූහ.

“පින්වත් කාශ්‍යපය, මේ කාරණය එසේ නොවේය”යි කීය. “රාජන්‍යය, එපරිද්දෙන්ම යම්බඳුවූ දානයෙක්හි ගවයෝ හෝ නසනු ලබත්ද, එළු බැටලුවෝ හෝ නසනු ලබත්ද, කුකුළන් හා ඌරෝ නසනු ලබත්ද නොයෙක්සතුන් විනාශයට පැමිණෙත්ද, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූ, මිථ්‍යා වචන ඇත්තාවූ, මිථ්‍යාකර්මාන්ත ඇත්තාවූ, මිථ්‍යාආජීව ඇත්තාවූ, මිථ්‍යාව්‍යායාම ඇත්තාවූ, මිථ්‍යා ස්මෘති ඇත්තාවූ, මිථ්‍යා සමාධි ඇත්තාවූ, ප්‍රතිග්‍රාහකයෝත් (දානය පිළිගන්නෝ) වෙද්ද, රාජන්‍යය මෙබඳුවූ දානය මහත් ඵල ඇත්තේ නොවෙයි මහානිසංස ඇත්තේ නොවෙයි. මහත්බැබලීම් ඇත්තේ නොවෙයි.

“රාජන්‍යය, එපරිද්දෙන්ම යම්බඳුවූ දානයෙක්හි ගවයෝ නසනු නොලබද්ද, කුකුළන් හා ඌරෝ නසනු නොලබද්ද, එළු බැටලුවෝ නසනු නොලබද්ද, නොයෙක් ප්‍රාණීහු විනාශයට නොපැමිණෙද්ද, සම්‍යක්දෘෂ්ටි ඇත්තාවූ, සම්‍යක්සංකල්පනා ඇත්තාවූ, සම්‍යක් වචන ඇත්තාවූ, සම්‍යක්කර්මාන්ත ඇත්තාවූ, සම්‍යක්ආජීවය ඇත්තාවූ, සම්‍යක්ව්‍යායාමය ඇත්තාවූ, සම්‍යක්ස්මෘති ඇත්තාවූ, සම්‍යක්සමාධියෙන් යුක්තවූ දන් පිළිගන්නෝත් වෙද්ද, රාජන්‍යය, මෙබඳුවූ දානය තෙම මහත් ඵල ඇත්තේ වෙයි, මහත් ආනිසංස ඇත්තේ වෙයි, මහත් බැබලීම් ඇත්තේ වෙයි, මහත් පැතිරීම් ඇත්තේ වෙයි,

“රාජන්‍යය, යම්සේ බිජුවට හා නගුල ගෙන ගොවියෙක් වනයට යන්නේද, හෙතෙම එහි නසනලද කණු කටු ඇති සමවූ භූමිඇති සරු කෙතෙහි නොකැඩුනාවූ කුණු නුවූ අව් සුලඟින් නොනසනලද සහල් ඇටයෙන් යුක්තවූ මනාකොට තවානෙහි දමනලද්දාවූ බීජයන් වපුරන්නේ නම්, වර්ෂාවද කලින් කල මනා කොට වර්ෂා කරන්නේ නම් කිමෙක්ද, ඒ බීජයෝ වැඩීමටද දියුණු බවටද, විපුල බවටද, පැමිණෙන්නාහුද ගොවි තෙම මහත් ඵල ලබන්නේ දැයි ඇසීය.

“පින්වත් කාශ්‍යපය, එසේය”යි කීයේය.

"රාජන්‍යය, එපරිද්දෙන්ම යම්බඳු දානයෙක ගවයෝ නසනු නොලැබෙද්ද, එළු බැටලුවෝ හෝ කුකුලන් හා ඌරෝ හෝ නසනු නොලැබෙද්ද, නොයෙක් ප්‍රාණීහු විනාශයට නොපැමිණෙද්ද සම්‍යක්දෘෂ්ටි ඇත්තාවූ, සම්‍යක්සංකල්පනා ඇත්තාවූ, සම්‍යක්වචන ඇත්තාවූ, සම්‍යක්කර්මාන්ත ඇත්තාවූ, සම්‍යක්ජීවිකාව ඇත්තාවූ, සම්‍යක්ව්‍යායාම ඇත්තාවූ, සම්‍යක්ස්මෘති ඇත්තාවූ, සම්‍යක්සමාධියෙන් යුක්තවූ ප්‍රතිග්‍රාහකයෝ වෙද්ද, රාජන්‍යය, මෙබඳුවූ දානය තෙම මහත් ඵල ඇත්තේ වෙයි, මහානිසංස ඇත්තේ වෙයි. මහත් බැබලීම් ඇත්තේ වෙයි, මහත් පැතිරීම් ඇත්තේ වේය"යි කීයේය.

**32.** ඊට පසුව පායාසි රාජන්‍ය තෙමේ ශ්‍රමණබ්‍රාහ්මණ දුගී මඟී යාචක යන මොවුන්ට දානය පිහිටෙව්වේය. ඒ දානයෙහි වනාහි කාඩි දෙවැනි කොට ඇති නිවුඩු හාලේ බතින් යුක්තවූ භෝජනයක් දෙනු ලැබේ. ගොඩවල් වශයෙන් සිටියාවූ මහත් දාවලු ඇති ගොරෝසු වස්ත්‍රද දෙනු ලැබෙත්. ඒ දානයෙහි වනාහි උත්තර නම් මාණවකයෙක් කටයුතුවල යෙදුනේය. හෙතෙම දන්දී මෙසේ නැවත නැවත කියයි, 'මේ දානයෙන් පායාසි රාජන්‍යයා සමග මේ ලෝකයෙහි එක්වූයෙමි. පරලොව ඔහු හා සමග එක් නොවේවා'යි කියාය.

උත්තර මානවකයා විසින් දන් දී කියනු ලබන "මේ දානය කරණ කොට මේ ලොකයේදී පායාසි රාජන්‍යයා හා සමග එක්වූ යෙමි, පරලොවදී එසේ එක් නොවෙම්වා"යි යන වචනය පායාසි රාජන්‍යයාට අසන්ට ලැබුනේය. ඊට පසුව පායාසි රාජන්‍ය තෙම උත්තර නම් මාණවකයාට කථා කොට 'පුත උත්තරය, තෝ දන්දී මේ දානයෙන් මේ ලෝකයෙහි පායාසි රාජන්‍යයා සමඟ එක්වූයෙමි, පරලොව පායාසි රාජන්‍යයා හා එක් නොවෙම්වායි කියන්නෙහිය යන වචනය සැබෑදැ'යි ඇසීය. 'පින්වත, එසේය'යි කීයේය. පුත උත්තරය, තෝ දන් දී මේ දානයෙන් මේ ලෝකයෙහි පායාසි රාජන්‍යයා හා සමග එක්වූයෙමි. පරලොව එක් නොවෙම්වායි යන මේ වචනය කුමක් සඳහා කියන්නෙහි දැයි ඇසීය. 'පුත උත්තරය, අපි පින් කැමැත්තෝ දානයාගේ ඵලය කැමති වන්නමෝ නොවමුදැ'යි

ඇසීය. 'පින්වතුන්වහන්සේගේ දානයෙහි කාඩි දෙවැනි කොට ඇති නිවුඩු සාලේ බත්යයි කියනලද මෙබඳුවූ භොජනයක් දෙනු ලැබේ. පින්වත් තෙමේ අනුභව කරනු තබා පාදයෙන් ස්පර්ශ කරන්ටත් කැමැති නොවන්නේද එබඳු ආහාරයක් දෙනු ලබන්නේය, යම් වස්ත්‍රයන් පින්වත් තෙමේ පරිභොග කරනු තබා පාදයෙන්වත් ස්පර්ශ කරන්ට කැමති නොවන්නේද එබඳු ගොඩවල් වශයෙන් පිහිටියාවූ මහත් දාවලු ඇති ඝන වස්ත්‍ර, දෙනු ලැබෙත්. පින්වත් තෙමේ අපට ප්‍රියවෙයි. මනාප වෙයි. කෙසේ නම් අපි ප්‍රියවූ මනාපවූ පින්වතුන් අමනාපයක් හා යොදවන්නමෝදැයි කීයේය. පුත උත්තරය, එසේවී නම් තෝ යම්බඳුවූ භොජනයක් මම අනුභව කරම්ද, එබඳුවූ භෝජනද මම යම් වස්ත්‍රයක් පරිභොග කරම්ද, එබඳුවූ වස්ත්‍රද දානයෙහි පිහිටුවව යයි කීයේය.

උත්තර නම් මාණවක තෙමේ 'පින්වත, එසේය'යි කියා පායාසි රාජන්‍යයාහට පිළිතුරු දී යම්බඳුවූ භෝජනයක් පායාසි රාජන්‍යතෙමේ අනුභව කරයිද, එබඳුවූ භෝජන දානයෙහි පිහිටෙව්වේය. යම් බඳුවූ වස්ත්‍රයන් පායාසි රාජන්‍ය තෙමේ පරිභොග කෙරේද එබඳුවූ වස්ත්‍රයන්ද දානයෙහි පිහිටෙව්වේය. ඉක්බිතිව පායාසිරාජන්‍ය තෙමේ සකස් නොකොට දන්දී සියඅතින් දන් නොදී අගෞරවයෙන් දන්දී බැහැර දමනු කැමැත්තෙකු මෙන් දන්දී ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු චාතුර්මහාරාජික දෙවියන් හා එක්වීමට ගියාවූ සිස්වූ සෙරිස්සක නම් විමානයෙහි උපන්නේය, උත්තර නම්වූ යම් මාණවකයෙක් ඒ පායාසි රාජන්‍යයාගේ දානයෙහි ව්‍යාවෘත වූයේද හෙතෙම සකස් කොට ශ්‍රද්ධායෙන් දන් දී ගෞරවයෙන් දන් දී නිරතුරුව දන් දී ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍යලොකයෙහි තව්තිසා වැසි දෙවියන් හා එක්වීමට පැමිණියේය.

33. එ සමයෙහි වනාහි ආයුෂ්මත් ගවම්පති ස්ථවිර තෙම නිරතුරුව සිස්වූ සේරිස්සක විමානයට දිවා විහරණය සඳහා වඩින්නේය. ඉක්බිතිව පායාසි දිව්‍යපුත්‍ර තෙම ආයුෂ්මත් ගවම්පති

ස්ථවිරතෙම යම් තැනකද, එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ගවම්පතිස්ථවිරයන් වැඳ එක පැත්තක සිටියේය. එකත් පසෙක සිටියාවූ පායාසි දිව්‍ය පුත්‍රයාට ආයුෂ්මත් ගවම්පතී ස්ථවිර තෙම මේ කාරණය කීයේය.

'ඇවැත්නි, තෝ කවරෙක් වූයෙහි දැ'යි කියාය, 'ස්වාමීනි, මම පායාසිරාජන්‍යයා වෙමි'යි කීයේය.

ඇවැත්නි, තෝ මේ කාරණයෙන්ද පරලොව නැත්තේය. මැරී උපදනා සත්වයෝ නැත්තාහුය, කුසලාකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේය යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙක් නොවෙහි දැයි ඇසීය. එසේය ස්වාමීනි, මම පරලොව නැත්තේය, මැරී උපදින සත්වයෝ නැත්තාහ. කුසලාකුසල කර්මයන්ගේ ඵල විපාක නැත්තේය යන මෙබඳුවූ දෘෂ්ටි ඇත්තේ වූයෙමි. එහෙත් මම කුමාරකාශ්‍යප ආයුෂ්මතුන් වහන්සේ විසින් මේ ලාමකවූ දෘෂ්ටියෙන් මුදනු ලැබුවෙමි.

ඇවැත්නි, තාගේ දානයෙහි ව්‍යාවෘතවූ උත්තර මාණවක තෙම කොහි උපන්නේ දැයි ඇසීය. ස්වාමීනි, මාගේ දානයෙහි යෙදුනාවූ උත්තර මානවක තෙම සකස් කොට ශ්‍රද්ධායෙන් දන් දී, සිය අතින් දන් දී, ගෞරවයෙන් දන් දී, නිරතුරුව දන් දී, පිරිසිදු කොට දන් දී ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු මනා ගති ඇති ස්වර්ග නම් තව්තිසා වැසි දෙවියන්ගේ එකී භාවයට පැමිණියේය. ස්වාමීනි, මම වනාහි සකස් නොකොට අශ්‍රද්ධාවෙන් දන්දී සියතින් දන්නොදී ගෞරවයෙන් දන්නොදී අහක දමනු කැමැත්තෙකුමෙන් දන් දී ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු චාතුර්මහාරාජික දෙවියන්ගේ එකී භාවයෙහිවූ සිස්වූ සෙරිස්සක නම් මේ විමනෙහි උපන්නෙමි. ස්වාමීනි, ගවම්පති ස්ථවිරයන්වහන්ස, එබැවින් නුඹ වහන්සේ මනුෂ්‍ය ලෝකයට ගොස් මෙසේ දැන්වුව මැනවි. සකස් කොට දන් දෙව්, සියතින් දන් දෙව්, සිතින් ගුණ සලකා දන් දෙව්, නිරතුරුව දන් දෙව්, පායාසිරාජන්‍ය තෙමේ සකස් නොකොට දන් දී, සිතින් ගුණ නොසලකා දන් දී, අහක දමනු කැමැත්තෙකු මෙන් දන් දී, ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු චාතුර්මහා රාජික

දෙවියන්ගේ එකී භාවයවන සිස්වූ සෙරිස්සක නම් විමානයෙහි උපන්නේය. උත්තර මානවකතෙම වනාහි ඒ පායාසි රාජන්‍යයාගේ දානයෙහි යෙදී සකස් කොට ශ්‍රද්ධායෙන් දන් දී, සිය අතින් දන් දී, සිතින් ගුණ සලකා දන් දී, ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු මනා ගතිඇති ස්වර්ග ලොකයෙහි තව්තිසා වැසි දෙවියන් හා එක්වීමට පැමිණියේය.

34. ඉන්පසු ආයුෂ්මත් ගවම්පතිස්ථවිරයන් වහන්සේ මිනිස් ලොවට අවුත් මෙසේ දැන්වූයේය. සකස් කොට (ශ්‍රද්ධායෙන්) දන් දෙව්, සියතින් දන් දෙව්, නිරතුරුව දන් දෙව්, සිතින් ගුණ සලකා දන් දෙව්, පායාසි රාජන්‍යතෙමේ සකස් නොකොට දන් දී, සියතින් දන් නොදී සිතින් ගුණ නොසලකා දන් දී, අහක දමනු කැමැත්තෙකුමෙන් දන් දී, ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු චාතුර්මහාරාජික දෙවියන්ගේ එකීභාවයෙහි සිස්වූ සෙරිස්සක නම් විමානයෙහි උපන්නේය. උත්තර නම් මාණවකතෙම ඒ පායාසිරාජන්‍යයාගේ දානයෙහි යෙදුනේ සකස් කොට දන් දී, සියතින් දන් දී, සිතින් ගුණ සලකා දන්දී ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු මනා ගති ඇති ස්වර්ග ලෝකයෙහි තව්තිසා වැසි දෙවියන් හා එක්වීමට පැමිණියේය කියායි.

**23 වෙනි පායාසි සූත්‍රය නිමවන ලදී.**

---

මහාපදාන සූත්‍රය, මහානිදාන සූත්‍රය, මහාපරිනිර්වාණ සූත්‍රය, මහාසුදස්සන සූත්‍රය, ජනවසභ සූත්‍රය, මහාගෝවින්ද සූත්‍රය, මහාසමයසූත්‍රය, සක්කපඤ්හ සූත්‍රය, මහා සතිපට්ඨාන සූත්‍රය, පායාසි සූත්‍රය යන මේ සූත්‍ර දසයෙන් මහා වර්ගය සංග්‍රහ වේ.

**දෙවැනි මහා වර්ගය සමාප්තයි.**

---

# 24. පාථික සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. (මාගේ ඇසීම මෙලෙසයි) එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ මල්ලරට අනුපිය නම්වූ මල්ලරජුන්ගේ නියම් ගම වැඩවාසය කළෝය.

එකල භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි සිවුරු හැඳපොරවා ගෙන පාත්‍රයද රැගෙන අනුපිය නම් නියම් ගමට පිඩු පිණිස පැමිණියෝය. එකල භාග්‍යවතුන්වහන්සේට මෙබඳු සිතෙක් පහළවිය, අනුපිය නම් නියම් ගමට පිඩු පිණිස යාම සඳහා තවකල් වැඩිය. (එබැවින්) මම භාර්ගවගොත්‍ර පිරිවැජියාගේ ආරාමය යම් තැනකද භාර්ගවගොත්‍ර පිරිවැජි තෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියෙම් නම් ඉතා යෙහෙකැයි'සිතීය. ඉක්බිති භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ භාර්ගවගොත්‍ර පරිබ්‍රාජකයාගේ ආරාමය යම් තැනකද එනම් පිරිවැජි තෙමේ යම් තැනකද එහි පැමිණියෝය.

එකල භාර්ගවගොත්‍ර පිරිවැජිතෙමේ (සාසනයෙන් පිට මහණවූ අය) භාග්‍යවතුන්වහන්සේට මෙසේ කීය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මෙහි පැමිණෙත්වා, ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේගේ පැමිණීම යහපත් වන්නේය. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ බොහෝ කලකින් මෙහි පැමිණියාහුය. ස්වාමීනි භාග්‍යවතුන්වහන්ස, මේ ආසනය පනවන ලද්දේය, මෙහි වැඩහිඳිනු මැනවැයි පිරිවැජි තෙමේ තමාගේ ආසනය පනවා දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩහුන්නෝය. (එසේ වැඩහුන්කල) භාර්ගවගොත්‍ර පිරිවැජියාද එක්තරා මිටි ආසනයක් ගෙන එක් පැත්තක හුන්නේය.

එක පැත්තක හුන්නාවූ භාර්ගවගොත්‍ර පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, පසුගිය දවසෙක වනාහි සුනක්ඛත්ත නම් ලිච්ඡවිපුත්‍රයා මම යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ මට මෙසේ කීයේය. භාර්ගවය, මා විසින් දැන් භාග්‍යවතුන් වහන්සේ ඉවත්කරන ලද්දාහ. මම භාග්‍යවතුන් වහන්සේ උදෙසා වාසය නොකරමියි' කීයේය.

"ස්වාමීන් වහන්ස, කිමෙක්ද? මේ කාරණය සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍රයා කී සේ වූවක්දැයි" ඇසුවේය.

'භාර්ගවය, මේ කාරණය සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයා යම්සේ කීයේද එසේ වූයේය.

භාර්ගවය, පසුගිය දවසෙක වනාහි සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයා මම යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ මට වැඳ එකපැත්තක හුන්නේය.

භාර්ගවය, එකත්පසෙක හුන්නාවූ සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රතෙමේ මට මෙසේ කීය.

"ස්වාමීන් වහන්ස, දැන් මම භාග්‍යවතුන් වහන්සේ අත් හැර දමමි. ස්වාමීන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ උදෙසා වාසය නොකරන්නෙමියි" කීය.

භාර්ගවය, සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයා මෙසේ කී කල්හි මම සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයාට මෙසේ කීමි.

"කිමෙක්ද, සුනක්ඛත්තය මම තාහට මාගේ ශ්‍රාවකයෙක්ව වාසය කරවයි කීයෙම්ද?"

"ස්වාමීන් වහන්ස, එබඳු කීමක් නැතැයි" කීය, "තෝ වනාහි මට "ස්වාමීන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක්ව වාසය කරන්නෙමි"යි කීයෙහිද?

"ස්වාමීන් වහන්ස, එබන්දක් නොකීමී"යි කීය.

සුනක්ඛත්තය, මෙසේ මම තාහට "එව තෝ මාගේ ශ්‍රාවකයෙක්ව වාසයකරව"යි නොකීයෙම් නම්, තෝද "ස්වාමීන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක්ව වාසය කරන්නෙමි"යි මට නොකීයෙහි නම්, හිස් පුරුෂය, කවරෙක් කවරෙකු ඉවත් කරන්නේදැයි ඇසීමි. හිස් පුරුෂය, තාගේ මේ අපරාධය කොතරම් මහත්ද කියා බලවය"යි කීමි.

ඉන් පසු හෙතෙම 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් තෙමේ මා හට මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම නොකරන්නේයයි" කීය.

"කිමෙක්ද? සුනක්ඛත්තය, මම තා හට "සුනක්ඛත්තය, එව තෝ මාගේ ශ්‍රාවකභාවයට පැමිණ වාසය කරව මම තාහට මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම කරන්නෙමි"යි කීයෙම්දැයි ඇසීමි.

"ස්වාමීන් වහන්ස, එසේ නොකීවේයයි කීය.

තෝද මට "ස්වාමීනි මම භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවකයෙක්ව වාසය කරමි භාග්‍යවතුන් වහන්සේ මට මනුෂ්‍ය ධර්මයට වඩා උතුම් ධර්මයෙන් ඍද්ධි දැක්වීම කරන්නේයයි කීයෙහිදැ"යි ඇසීමි. එසේ නොකීයෙමි යයි කීය.

"සුනක්ඛත්තය, තෝ වනාහි මාගේ ශ්‍රාවක භාවයට පැමිණ වාසය කරව, මම තා හට මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම කරන්නෙමි"යි මෙසේ මම තා හට නොකීයෙම් නම් තෝ ද මා හට "ස්වාමීන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක භාවයට පැමිණ වාසය කරන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ මාහට මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමක් කරන්නේය"යි නොකීයෙහි නම්, හිස් පුරුෂය, මෙසේ ඇති කල්හි කවරෙක් කවරෙකු ඉවත් කරන්නේදැයි ඇසීමි. සුනක්ඛත්තය, තෝ කුමක් සිතන්නෙහිද? මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමක් කළ කල්හි හෝ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමක් නොකළ කල්හි හෝ යම් දුක් නැතිකිරීමක් පිණිස මා විසින් ධර්මය දෙශනා කරන ලද්දේද, ඒ ධර්මය තෙමේ ඊට අනුව පිළිපදින පුද්ගලයාගේ සසර දුක් නැසීම පිණිස පවත්නේදැයි ඇසීමි."

ස්වාමීන් වහන්ස, මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමක් කළ කල්හි හෝ නොකළ කල්හි හෝ යම් දුක් නැතිකිරීමක් සඳහා භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය දෙශනා කරන ලද්දේද ඒ ධර්මය තෙමේ ඊට අනුව පිළිපදින පුද්ගලයාගේ සසර දුක් නැසීම පිණිස පවත්නේයයි කීය. මෙසේ සුනක්ඛත්තය මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධිදැක්වීම කළ කල්හි හෝ නොකළ කල්හි හෝ යම් දුක්නැති කිරීමක්සඳහා මා විසින්

ධර්මය දෙශනා කරන ලද්දේද ඒ ධර්මය තෙමේ ඊට අනුව පිළිපදින පුද්ගලයාගේ සසර දුක් නැති කිරීම පිණිස පවත්නේ නම් සුනක්ඛත්තය, එහි ලා මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමෙන් කවර ප්‍රයෝජනයෙක් වන්නේද? (ඒ ඍද්ධි දැක්වීම කළ කල්හිද නොකළ කල්හිද, මාගේ ශාසන පරිහානියෙක් නැත. මම වනාහි දෙවි මිනිසුන්ට අමාමහ නිවන් පැමිණවීම පිණිස පෙරුම් පිරුවා මිස ඍද්ධි දැක්වීම පිණිස නොවෙමියි එහි ප්‍රයෝජනය දක්වා වදාරා) හිස් පුරුෂය, තාගේ මේ කොතරම් මහත් වරදක් දැයි බලවයයි කීමි"

(එවිට හෙතෙම කියනුයේ) "ස්වාමීන්, වහන්ස භාග්‍යවතුන් වහන්සේ මාහට ලොක ප්‍රඥප්තිය (හෙවත් මෙය ලොව හට ගැනීමට සීමාව වන්නේයයිද යනාදි ලොකොත් පත්ති කථාව) ප්‍රකාශ නොකෙළේයයි කීය. කිමෙක්ද? සුනක්ඛත්තය, මම තාහට "සුනක්ඛත්තය එව තෝ මාගේ ශ්‍රාවක භාවයට පැමිණ වාසය කරව මම තාහට ලොව හට ගැනීමේ කථාව ප්‍රකාශ කරන්නෙම්ය"යි කීයෙම්ද?

"ස්වාමීන්වහන්ස, එසේ නොකීයේයයි කීය, "තෝ වනාහි මාහට "ස්වාමීන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකභාවයට පැමිණ වාසය කරන්නෙමි, මාහට භාග්‍යවතුන් වහන්සේ ලොකොත්පත්තිය (මෙය වනාහි ලොකයට සීමාව වන්නේයයි මෙසේ) පැනවීමත්, ප්‍රකාශ කරන්නේයයි කීයෙහි දැයි" ඇසී. ස්වාමීන්වහන්ස, එසේ නොකීයෙමැයි කීය, මෙසේ වනාහි සුනක්ඛත්තය, මම තාහට, "සුනක්ඛත්තය එව මාගේ ශ්‍රාවක භාවයට පැමිණ වාසය කරව, මම තාහට ලොකෝත් පත්තිය (මෙය ලොකයට සීමාව වන්නේයයි) ප්‍රකාශ කරන්නෙමියි නොකීයෙම් නම් තෝද මාහට "ස්වාමීන් වහන්ස, මම භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවක භාවයට පැමිණ වාසය කරන්නෙමි, භාග්‍යවතුන් වහන්සේ මට, ලොකෝත්පත්තිය හෙවත් මෙය වනාහි ලොකයට සීමාව වන්නේයයි මෙසේ පැනවීම ප්‍රකාශ කරන්නේයයි නොකීයෙහි නම්, හිස්පුරුෂය, මෙසේ ඇති කල්හි කවරෙක් කවරෙකු ඉවත් කරන්නේ දැයි ඇසී.

සුනක්ඛත්තය, තෝ කුමකැයි සිතන්නෙහිද? ලොව හට ගැනීමේ සීමාව (ලොකොත්පත්තිය) ප්‍රකාශ කළ කල්හි හෝ නොකළ කල්හි හෝ යම් දුක් නැසීමක් සඳහා මා විසින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේද, ඒ ධර්මය තෙමේ ඊට අනුව පිළිපදින්නාවූ පුද්ගලයාගේ සියලු දුක් නැතිකිරීම පිණිස පවත්නේ දැයි ඇසීමි.

"ස්වාමීන් වහන්ස, ලොව හටගැන්ම ප්‍රකාශ කළ කල්හි හෝ නොකළ කල්හි හෝ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් දුක් නැතිකිරීමක් සඳහා දහම් දෙසන්නේද, ඒ ධර්මය තෙමේ ඊට අනුව පිළිපදින පුද්ගලයාගේ දුක් නැතිකිරීම පිණිස පවත්නේයයි" කීය.

"සුනක්ඛත්තය, මෙසේ ලොව හටගැන්ම ප්‍රකාශ කළ කල්හි හෝ නොකළ කල්හි හෝ යම් දුක් නැති කිරීමක් සඳහා මා විසින් දහම් දෙසන ලද්දේද, ඒ ධර්මය තෙමේ ඊට අනුව පිළිපදින පුද්ගලයාගේ දුක් නැති කිරීම පිණිස පවතින්නේ නම්, සුනක්ඛත්තය, එහි ලා ලොව හටගැනීමේ තතු ප්‍රකාශ කිරීම කවර ප්‍රයෝජනයක් පිණිස වන්නේද? හිස් පුරුෂය, බලව තා විසින් කොතරම් මහත්වූ අපරාධයෙක් කරන ලද්දේ දැයි" ඇසීමී.

"සුනක්ඛත්තය, තා විසින් වජ්ජිග්‍රාමයෙහි (වැදෑරජුන්ගේ ගමෙහි) නොයෙක් ආකාරයෙන් මාගේ ගුණ වර්ණනා කරන ලද්දේය. (එනම්) ඒ භාග්‍යවතුන්වහන්සේ රහත්ය, සම්‍යක් සම්බුද්ධ වූහ, (එසේම) අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තවූ හෙයින් විද්‍යාචරණ සම්පන්නය, යහපත් ගමන් ඇත්තාහ, සියලුම ලොකය දන්නාහ. තමන්ට වඩා උසස් කෙනෙක් නැත. දමනය නොකළ හැකි පුරුෂයන් දමනය කරන්නෙකි, දෙවි මිනිසුන්ට අනුශාසනා කරන්නෙක. චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය අවබොධ කළ හෙයින් බුද්ධ නම් වූහ රාගාදි ක්ලෙශ ධර්මයන් විනාශ කළ හෙයින් භාග්‍යවත් නම් වන සේකැයි මෙසේ සුනක්ඛත්තය තා විසින් මෙයාකාරයෙන් වැදෑරජුන්ගේ ග්‍රාමයෙහිදී (විශාලා මහනුවරෙහිදී) මාගේ ගුණ වර්ණනාව කරන ලද්දේය.

එසේම සුනක්ඛත්තය, තා විසින් වැදෑරජුන්ගේ ග්‍රාමයවූ විශාලා මහනුවරදී නොයෙක් ආකාරයෙන් ධර්මරත්නය

පිළිබඳවද ගුණ කියන ලද්දේය, එ නම් භාග්‍යවත් බුදුරජුන් විසින් ධර්මය යහපත්කොට වදාරණලද්දේය, තමා විසින්ම දැකීම කළයුතු හෙයින් ස්වයංදෘෂ්ටික නම් වන්නේය. කල් නොයවා ඵල දෙන බැවින් ‘අකාලික’ නම් වන්නේය. එව බලව යන ආශ්චර්‍ය්‍ය විධියට සුදුසු හෙයින් ‘එහිපස්සික’ නම් වන්නේය. තමා සිත්හි එලවා තැබීමට සුදුසු හෙයින් ‘ඔපනයික’ නම් වන්නේය. නුවණැත්තන් විසින් වෙන් වෙන් වශයෙන් දත යුතු වන්නේයයි සුනක්ඛත්තය, මෙසේ වනාහි තා විසින් විශාලා මහනුවරදී ධර්මරත්නය පිළිබඳව ගුණ කියන ලද්දේය.

සුනක්ඛත්තය, තා විසින් (එම) විශාලා මහනුවරදී නොයෙක් ආකාරයෙන් සංඝයාගේ ගුණ කියන ලද්දේය. (එනම්,) භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවක සංඝතෙමේ මනාප්‍රති පත්තියෙන් පිළිපන්නේය. භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ ඍජුව (අවංකව) පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ උතුම්වූ නිර්වාණ ධර්මය සඳහා පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ ගෞරවාදරයට සුදුසුසේ පිළිපන්නේය. යම්බඳු මේ සෝවාන් ආදි මාර්ගස්ථ ඵලස්ථයනගේ වශයෙන් ආර්‍ය්‍ය පුද්ගලයෝ අටදෙනෙක් වෙත්ද, භාග්‍යවතුන්වහන්සේගේ ඒ මේ ශ්‍රාවක සංඝ තෙමේ දුරසිටද ගෙනවුත් දෙන ලද දානය පිළිගැනීමට සුදුසු හෙයින් ‘ආහුනෙය්‍ය’ නම් වන්නේය. සියල්ලට පළමුව එලවා දිය යුතු බැවින් ‘පාහුණෙය්‍ය’ නම් වන්නේය. පරලොව කම්පල අදහා දෙන්නාවූ දානය පිළිගැනීමට සුදුසුහෙයින් ‘දක්ඛිණෙය්‍ය’ නම් වන්නේය. දෙ අත් හිස තබා කරණු ලබන වැඳීම් ආදිය කිරීමට සුදුසු වන්නේය, උතුම්වූ පින්කෙතක් වූයේයයි සුනක්ඛත්තය, තා විසින් මෙසේ වනාහි වැදෑ රජුන්ගේ ග්‍රාමයවූ විශාලමහනුවරෙහිදී නොයෙක් ප්‍රකාරයෙන් සංඝයාගේ ගුණ වර්ණනා කොට කියන ලද්දේය.

සුනක්ඛත්තය, මම තාහට කියමි, සුනක්ඛත්තය, මම තාහට ප්‍රකාශ කරමි. සුනක්ඛත්තය, තට මෙසේ කියන්නෝ ඇතිවන්නාහුය. ‘සුනක්ඛත්තය’ ලිච්ඡවි පුත්‍ර තෙමේ ශ්‍රමණ භවත්

ගෞතමයන් වහන්සේ කෙරෙහි, බ්‍රහ්මචර්‍ය්‍යා නම්වූ ශ්‍රෙෂ්ඨ හැසිරීමට අපොහොසත් වූයේ ශ්‍රමණධර්මයෙන් ඉවත්ව ගිහි බවට පැමිණියේයයි, සුනක්ඛත්තය, මෙසේ තාහට කියන්නාවූ පුද්ගලයෝ ඇති වන්නාහයි කීමි.

භාර්ගවය, මෙසේ මා විසින් කියනු ලැබූ සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ යම්සේ අපායේ ඉපදීමට සුදුසු තිරි සතෙක් චුතව එහි යන්නේ වේද එසේම මේ ධර්ම විනය නම්වූ සාසනයෙන් පහ වූයේය.

"භාර්ගවය, මම එක් කලෙක ථූලූ නම් රට උත්තරකා නම් නියම් ගම වාසය කෙළෙමි. භාර්ගවය, එකල මම පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයා පසු ශ්‍රමණයා කොට ගෙන උත්තරකා නම් නියම් ගමට පිඬු පිණිස පැමිණියෙමි. ඒ කාලයෙහි වස්ත්‍ර හැඳීමක් නැති හෙයින් නිර්වස්ත්‍රවූ බලු ලීලාවෙන් යුත් එනම් බල්ලෙක් මෙන් දණ දෙකින් සහ වැලිමිටි දෙකින් ගොස් කෑම කන්නාවූද එසේ කෑම කා ලිප මුල නිදන්නාවූ හතර තැනකින් වකුටුවූ, එනම්ඃ දණ දෙක සහ වැලමිටි දෙක බිම තබමින් හැසිරීම කරන්නාවූ කොරක්ඛත්තිය නම් නිගණ්ඨයෙක් තෙමේ බිම දමනලද කෑම වර්ග කටින්ම කන්නේය. කටින්ම බොන්නේය, භාර්ගවය, සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ බළු ලීලාවෙන් යුත් දෙඅත් දෙපා වකුටු කරගත්, බිම දමනලද කෑම බල්ලෙක් මෙන් කටින්ම කන්නාවූ කොරක්ඛත්තිය නම් නිගණ්ඨයා දුටුවේය. එසේ දැක මේ සුනක්ඛත්තයාහට මෙබඳු සිතෙක් වීය. 'ඒකාන්තයෙන් මේ පින්වත්වූ රහත් ශ්‍රමණයා හා සමවූ අනික් ශ්‍රමණ කෙනෙක් නැත්තේය. කිසිවකට ආසාවක් නැති නිසා වස්ත්‍රයක් අඳින්නේ නැත. ප්‍රමාදයෙක් වන්නේයයි සිතා කෑමට භාජනයක්ද පාවිච්චි නොකරන්නේය. බිම දමන ලද දෙයක්ම කන්නේය. (මෙ තෙමේ නම් ශ්‍රමණයෙක්ම වන්නේය. අපි මොන ශ්‍රමණයෝ වෙමුදැයි මෙසේ සර්වඥ බුදු රජුන්ගේ පසු පස්සේ ගමන් කරමින්ම මේ ලාමක දෘෂ්ටියක්, වැටහීමක් ගත්තේය). භාර්ගවය, එසේ අදහස් කළ කල්හි මම සුනක්ඛත ලිච්ඡවි පුත්‍රයාගේ (සිතේ අදහස) මාගේ සිතින් පිරිසිඳ දැන මෙසේ කීමි.

"හිස් පුරුෂය, තෝද මම ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෙකැයි ප්‍රකාශ කරන්නෙහිදැ"යි ඇසීමි. 'ස්වාමීන් වහන්ස, කුමකට වනාහි මට භාග්‍යවතුන්වහන්සේ "හිස් පුරුෂය, තෝද මම ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෙකැයි කියන්නෙහිදැයි මෙසේ කීයෙහිදැ"යි ඇසීය.

සුනක්ඛත්තය, තා විසින් මේ බලුලීලාව ගත් බිම දමනලද කෑම බල්ලෙක් මෙන් කන කොරක්ඛත්තිය නම් නිර්වස්ත්‍ර නිගණ්ඨයා දැක මෙබඳු සිතක් පහළ කරන ලද්දේ නොවේද? ඒකාන්තයෙන්ම පින්වත්වූ මේ රහත් ශ්‍රමණ තෙමේ ඉතා යහපත් ස්වභාව ඇත්තෙක් වන්නේයයි මෙබඳු සිතක් වූයේ නොවේදැයි' ඇසීමි.

'ස්වාමීන් වහන්ස, එබඳු අදහසක් ඇත්තෙක් වීමියි' කීය. කිමෙක්ද? ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙසේ අනිකෙකු හට රහත් බව නොලැබේවායි, රහත් බවට මසුරු කරන සේක්දැයි' ඇසී. 'හිස් පුරුෂය, මම වනාහි රහත් බවට මසුරු නොකරමි. එතකුදු වුවත් තට මේ ලාමකවූ දෘෂ්ටියක් උපන්නේය, ඒ දෘෂ්ටිය දුරුකරව, එසේ නොරහත් අයෙක් රහතෙකැයි ගැනීම දුරු කරව, තට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිසද දුක් පිණිසද නොවන්නේය. සුනක්ඛත්තය, යම් බඳු මේ කොරක්ඛත්තිය නම් නිගණ්ඨයෙක් ඒකාන්තයෙන් යහපත්වූම රහත් ශ්‍රමණයෙකැයි සිතන්නෙහිද? හෙතෙමේ මෙයින් සත්වන දවසෙහි අලසක නම් රෝගයෙන් (ඉදිමී ගිය බඩ ඇතිව) කාල ක්‍රියා කරන්නේය. එසේ කළුරිය කොට කාලකඤ්ජික නම් ඉතා හීනවූ අසුර යෝනියෙහි උපදනේය. මැරුණාවූ ඔහු බිරණත්ථම්භක නම් සොහොනෙහි දමන්නාහුය.

සුනක්ඛත්තය, තෝ කැමති වනු ලබන්නේ නම් කොරක්ඛත්තිය, තමාගේ ගතිය (ඉපදුනු තැන) දන්නෙහිදැයි ගොස් අසව. යම් හෙයකින් තට, කොරක්ඛත්තිය නිගණ්ඨ තෙමේ ඇවත් සුනක්ඛත්තය, මාගේ ගතිය දනිමි. කාලකඤ්ජික නම් සියල්ලට හීනවූ අසුර නිකායක් වන්නේය 'එහි මම උපන්නෙමියි ප්‍රකාශ කරණ බවට කරුණු ඇත්තේ යයි කීවෙමි.

භාර්ගවය, එකල සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ කොරක්ඛත්තිය නම් නිගණ්ඨයා යම් තැනෙක්හිද එහි

පැමිණියේය. පැමිණ, කොරක්ඛත්තිය නම් නිවටාට මෙය කීයේය. ඇවත් කොරක්ඛත්තිය, ශ්‍රමණ භවත් ගෞතමයාණන් විසින් මෙසේ ප්‍රකාශ කරන ලද්දේය. 'කොරක්ඛත්තිය නම් නිගණ්ඨ තෙමේ සත්වන දවස අලසක නම් රෝගයෙන් මැරෙන්නේය. (එසේ) මැරී, කාලකඤ්ජික නම් සියල්ලට හීනවූ අසුර නිකායෙහි උපදින්නේය. මැරුණාවූ ඔහු බීරණත්ථම්භක නම් සොහොනෙහි දමන්නාහුයයි (මෙසේ ප්‍රකාශ කෙළේය).

ඇවැත් කොරක්ඛත්තිය, යම් හෙයකින් තොපි ප්‍රමාණවත්වූම කෑම කන්නහු නම පමණට වතුර බොන්නහු නම් ශ්‍රමණ භවත් ගෞතමයාගේ වචනය බොරුවක් වන්නේය එසේ පිළිපදිවයි කීය.

මෙසේ සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයා එපවත් කී කල කොරක්ඛත්තිය නිගණ්ඨ තෙමේ බල්ලෙක් මෙන් ලිප් දොර හොත්තේ, හිස ඔසවා ඇස් දල්වා බලමින්, 'කුමක් කියන්නෙහිද? ශ්‍රමණ බවත් ගෞතම තෙමේ වනාහි අපගේ විස භාග සතුරෙක් වන්නේය. ශ්‍රමණ භවත් ගෞතමයා උපන් කාලයෙහි අපි හිරු උදාවූකල කණාමැදිරියන් මෙන් වූවෙමු. සතුරාගේ කථාව වනාහි සැබෑ නොවන්නේය. තොපි යව්. මම මෙහි කටයුතු දන්නෙමියි කියා නැවතද ලිප මුල හොත්තේය.

"භාර්ගවය, එකල සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ තථාගතයන් වහන්සේගේ වචනය නොඅදහමින් එක්දවසක් ගතවීය, යනාදි වශයෙන් දවස් ගණිමින් සිටියේය. (මෙසේ ගණිමින් දවසට දෙතුන් වර විත් කියමින් සිටියදි ඒ කොරක්ඛත්තිය තෙමේ සුනක්ඛත්තයාගේ බස් අසා සත් දවස තුළ නිරාහාරවම සිටියේය. එකල සත්වන දවස එක් උපස්ථායකයෙක් තෙමේ කොරක්ඛත්තිය නිගණ්ඨයා අදට සත් දිනක් ගෙදරට නොපැමිණියේ අපහසුවක් දෝහෝයි ඌරුමස් සමග බත් තලියක් පිළියෙළ කරගෙන ගොස් ඔහු ඉදිරියේ බිම දැමීය. කොරක්ඛත්තිය නිගණ්ඨ තෙමේ ඒ දැක මෙසේ සිතී. ශ්‍රමණ භවත් ගෞතමයාගේ කථාව සැබෑ හෝ වේවා, බොරු හෝ වේවා, කෑම කා 'සතුටට පැමිණි මාගේ මරණයම යහපත්

මරණය වන්නේයයි" සිතා, දෙ අත් දෙ දණ බිම ඇන තබා බඩ පුරාම එය කෑවේය. ඔහුට රාත්‍රි කාලයෙහි එය දිරවන්ට නොහැකි වූයේ අලසක නම්-බඩ ඉදිමී ගිය රෝගය-සෑදුණේය.

"භාර්ගවය, එකල වනාහි කොරක්ඛත්තිය නම් නිගණ්ඨ තෙමේ සත්වන දවසෙහි අලසක නම් රෝගයෙන් මැරුණේය. මැරී කාලකඤ්ජික නම් සියල්ලෙන් පිරිහුනු අසුර නිකායෙක් වේද එහි උපන්නේය. ඔහුගේ මළ සිරුර බීරණත්ථම්භක නම් සොහොනෙහි දැමූහ.

භාර්ගවය, සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රතෙමේ කොරක්ඛත්තිය නම් නිගණ්ඨයා අලසක නම් රෝගයෙන් මැරී බීරණත්ථම්භක නම් සොහොනේ දමන ලද්දේයයි ඇසීය. භාර්ගවය, එකල වනාහි සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ බීරණත්ථම්භක නම් සොහොන යම් තැනෙක්හිද, කොරක්ඛත්තිය නම් නිගණ්ඨයාගේ මළසිරුර යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, කොරක්ඛත්තිය නම් නිගණ්ඨයාට තුන්වරක් අතින් ගැසුවේය. (අතින්ගසා) "ඇවැත් කොරක්ඛත්තිය, තමාගේ ගතිය (තම උපන් තැන) දන්නෙහිදැ?"යි ඇසී.

භාර්ගවය, එකල කොරක්ඛත්තිය නිගණ්ඨ තෙමේ අතින් පිට පිස දමමින් නැගිට්ටේය. (එසේ නැගිට) 'ඇවත්, සුනක්ඛත්තය, තමාගේ ගතිය දනිමි. සියල්ලෙන් පිරිහුණු කාලකඤ්ජික නම් අසුර නිකායෙක් වේද එහි මම උපන්නෙමියි' කියා එතැන්හිම උඩුකුරුව මළකඳ වැටුනේය.

භාර්ගවය, එකල වනාහි සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රතෙමේ මම යම් තැනෙක්හිද එහි පැමුණුනේය. පැමිණ, මට වැඳ එක පැත්තක හුන්නේය.

භාර්ගවය, මම එන පැත්තක හුන්නාවූ සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයාහට මෙසේ කීමි. "සුනක්ඛත්තය, තා කුමක් සිතන්නෙහිද? කොරක්ඛත්තිය නිගණ්ඨයා සඳහා යමක් කීයෙම්ද, එය එසේම වූයේද? අන් පරිද්දකින් වූයේදැයි' ඇසීමි. 'ස්වාමීන් වහන්ස, කොරක්ඛත්තිය නිගණ්ඨයා සඳහා භාග්‍යවතුන්වහන්සේ යම්

පරිද්දකින් මට කීවේද, ඒ විපාකය එපරිද්දෙන්ම වූයේය. අන් පරිද්දකින් නුවූයේයයි ප්‍රකාශ කෙළේය.

සුනක්ඛත්තය, තෝ කුමක් සිතන්නෙහිද? ඉදින් එසේ ඇති කල්හි මා විසින් මනුෂ්‍යධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම කරන ලද්දේවේද නොකරණ ලද්දේ වේදැයි’ ඇසීමි. ස්වාමීන්වහන්ස, එසේ ඇති කල්හි ඒකාන්තයෙන්ම මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම කරන ලද්දේය. නොකරණ ලද්දේ නොවේයයි’ කීය.

හිස් පුරුෂය, මෙසේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම කරන්නාවූ මාහට තෝ මෙසේ කීවෙහිය. ස්වාමීන් වහන්ස, මට භාග්‍යවතුන් වහන්සේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම නොකරන්නේයයි කීය. හිස් පුරුෂය, බලව, තා විසින් කොපමණ මහත් අපරාධයෙක් කරන ලද්දේදැයි’ කීමි.

භාර්ගවය, මෙසේද වනාහි මා විසින් කියනු ලබන්නාවූ සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රතෙමේ අපායට යන්නාවූ නිරිසතෙක් යම්සේද එසේ මේ ධර්මවිනය සංඛ්‍යාත ශාස්තෘ ශාසනයෙන් පහව ගියේමය.

භාර්ගවය, එක් කලෙක මම විසාලා මහනුවර සමීපයේ මහා වනයෙහිවූ කූටාගාර සාලාවෙහි වාසය කෙළෙමි. ඒ කාලයෙහි කෝරමට්ටක නම් නිගණ්ඨයෙක් ලාභයෙන් හා යසසින් අගතැන් පැමිණියේ විසාලා මහ නුවර වජ්ජී ග්‍රාමයෙහි වාසය කරයි. ඔහු විසින් සමාදන්ව පිළිපදින්නාවූ සත් වැදෑරුම් ව්‍රත පද කෙනෙක් වෙත්, එනම්: දිවි ඇතිතෙක් අචෙලකයෙක් වන්නෙමි වස්ත්‍රයක් නොහඳින්නෙමියිද, දිවි ඇති තෙක් බ්‍රහ්මචාරියෙක් වන්නෙමි මෛථුන්දම් සේවනය නොකරන්නෙමියිද, ජීවිතාන්තය දක්වා සුරාවෙන් සහ මාංසයෙන්ම යැපෙන්නෙමි බත් පිටි ආහාර අනුභව නොකරන්නෙමියිද, පෙර දිගින් විසාලාමහනුවර උදේනි නම් චෛත්‍යයෙක් වේද එය නොයික්මවන්නෙමියිද, දකුණුදිගින් විසාලාමහනුවර ගෞතම නම් චෛත්‍යයෙක් වේද එය

නොයික්මවන්නෙම්යීද, බටහිරදිගින් විසාලාමහනුවර සත්තම්බ නම් චෛත්‍යයෙක් වේද එය නොයික්මවන්නෙම්යීද, උතුරු දිගින් විසාලාමහනුවර බහුපුත්තක නම් චෛත්‍යයෙක් වේද එය නොයික්මවන්නෙම්යීද යන මේ ව්‍රත (පැවතුම්) සත සමාදන්වීම හෙතු කොට ගෙන හෙතෙමේ ලාභයෙන් හා යසසින් අග්‍රබවට පැමිණියේ විසාලාමහනුවර වාසය කරයි.

භාර්ගවය, එකල්හි සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ කොරමට්ටක නම් නිගණ්ඨතෙමේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, කොරමට්ටක නම් නිවටාගෙන් ප්‍රශ්න ඇසීය. කොරමට්ටක නිගණ්ඨයාට උත්තර දිය නොහැකි විය. උත්තර දිය නොහැකිවූ හෙතෙමේ කෝපයද ද්වෙෂයද නොසතුටු බවද ප්‍රකාශ කෙළේය.

භාර්ගවය, එකල සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයාහට මෙබඳු සිතෙක් වී. 'පින්වත, ඒකාන්තයෙන් උතුම් ගුණ ඇත්තාවූ මේ රහත් ශ්‍රමණයන්වහන්සේට මම අපරාධයක් කෙළෙමි. හේ මාහට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස දුක් පිණිස නොවේවායි ක්ෂමාව ඉල්වා ගත්තේය.

භාර්ගවය, එකල්හි සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ මම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, මාහට වැඳ එක පැත්තක හුන්නේය. භාර්ගවය, එක පැත්තක හුන්නාවූ සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයාහට මම මේකාරණය කීයෙමි.

'හිස් පුරුෂය, තෝ ශ්‍රමණශාක්‍යපුත්‍රයෙකු සේ පෙනී සිටින්නෙහිදැ'යි ඇසීමි. 'ස්වාමීනි, භාග්‍යවතුන්වහන්ස, කුමකට වනාහි භාග්‍යවතුන් වහන්සේ "හිස් පුරුෂය, තෝ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෙකු සේ පෙනී සිටින්නෙහිදැයි ඇසුවෙහි දැයි ඇසී. සුනක්ඛත්තය, තෝ කොරමට්ටක නම් නිගණ්ඨයා කරා පැමිණ ප්‍රශ්න ඇසුවේ නොවේද? ප්‍රශ්න අසන ලද්දාවූ ඒ කොරමට්ටක නම් නිගණ්ඨ තෙමේ නොසතුටුව කෝපයද ද්වෙෂයද නොසතුටු බවද පහළ කෙළේය. එකල තාහට මෙබඳු සිතෙක් වී. 'ඒකාන්තයෙන් යහපත් ගුණ ඇත්තාවූ පින්වත්වූ රහත් ශ්‍රමණයන් වහන්සේට අපරාධයක් කෙළෙමි. ඒකාන්තයෙන් මට බොහෝ

කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස නොවේවායි ක්ෂමා කරවා ගත්තේනොවේ දැයි' ඇසීමි. (එවිට සුනක්ඛත්ත තෙමේ) 'එසේය, ස්වාමීන් වහන්සැයි කියා, කිමෙක්ද? ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ රහත් බවට මසුරු කරන්නේදැයි" ඇසී.

හිස් පුරුෂය, මම වනාහි රහත් බවට මසුරු නොකරමි. එතකුදු වුවත් මේ ලාමක දෘෂ්ටියක් තොපට පහළවිය. තට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස දුක් පිණිස නොවීම සඳහා එය දුරුකරව, සුනක්ඛත්තය, ඒ කොරමට්ටක නම් නිගණ්ඨයා යහපත් රහත් ශ්‍රමණයෙකැයි සිතන්නෙහිද, ඒ නිගණ්ඨ තෙමේ නොබෝ දවසකින්ම ගිහි ඇඳුම් ඇඳ බිරිඳක් සහිතව බත් පිටි ආහාර අනුභව කරමින් විසාලා මහ නුවර සියලු චෛත්‍යස්ථානයන් ඉක්මවා ගොස් යසසින් පිරිහී මැරෙන්නේයයි කීවෙමි.

භාර්ගවය, ඉක්බිති කොරමට්ටක නම් නිගණ්ඨ තෙමේ නොබෝ දවසකින් ගිහිඇඳුම්ඇඳ බිරිඳක් සහිතව හැසිරෙමින් බත් පිටි ආහාර කමින් විසාලාමහනුවර සියලු චෛත්‍යස්ථානයන් ඉක්මවා ගොස් යසසින් පිරිහී මැරුණේය. භාර්ගවය, සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයාට කොරමට්ටක නම් නිඝණ්ඨ තෙමේ ගිහි ඇඳුම් ඇඳ බිරිඳක් සහිතව හැසිරෙමින් බත් පිටි ආහාර කමින් විසාලාමහනුවර සියලු චෛත්‍යස්ථානයන් ඉක්මවා ඇවිද යසසින් පිරිහි මැරුණේයයි' අසන්ට ලැබුණේය.

භාර්ගවය, එකල්හි සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ මම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, මට වැඳ එක පැත්තක හුන්නේය. භාර්ගවය, මම එක පැත්තක හුන්නාවූ සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍රයාට මේ කාරණය කීයෙමි. සුනක්ඛත්තය, තෝ කුමක් සිතන්නෙහිද? කොරමට්ටක නම් නිගණ්ඨයා ගැන තාහට මම යමක් ප්‍රකාශ කෙළෙම්ද, ඒ විපාකය එසේම වීද අන් පරිද්දකින් වීදැයි' ඇසීමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, කොරමට්ටක නම් නිවටා ගැන භාග්‍යවතුන් වහන්සේ යමක් ප්‍රකාශ කළේද, ඒ විපාකය එසේම වූයේය. අන් පරිද්දකින් නුවූයේයයි' කීය.

සුනක්ඛත්තය, තෝ කුමක් සිතන්නෙහිද? ඉදින් එසේ ඇති කල්හි මා විසින් මනුෂ්‍යධර්මයට වඩා උසස්ධර්මයෙන් ඍද්ධි දැක්වීමක් කරන ලද්දේද? නොකරන ලද්දේදැ?'යි ඇසීමි. 'ස්වාමීන් වහන්ස, එසේ ඇති කල්හි ඒකාන්තයෙන්ම මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමක් කරන ලද්දේය, නොකරන ලද්දේ නොවේයයි' කීය.

හිස් පුරුෂය, මෙසේද මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දක්වන්නාවූ මට තෝ මෙසේ කියන්නෙහිය. ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම නොකරන්නේ යයි' (කියායි). 'හිස් පුරුෂය, බලව තා විසින් කොතරම් මහත් අපරාධයක් කරන ලද්දේදැ'යි කීවෙමි.

භාර්ගවය, මෙසේද වනාහි මා විසින් කියනු ලබන්නාවූ සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර තෙමේ මේ ධර්මවිනයනම්වූ ශාසනයෙන් අපායෙහි වැටෙන්නාවූ නිරි සතෙක් යම් සේද එසේ පහවූයේයයි" කීවෙමි

"භාර්ගවය, මම එක් කලෙක ඒ විසාලා මහනුවරෙහිම මහාවනයෙහිවූ කූටාගාර සාලාවෙහිම වාසය කෙළෙමි. ඒ කාලයෙහි පාථික පුත්‍ර නම් නිගණ්ඨයෙක් තෙමේ විසාලා මහ නුවර වජ්ජි ග්‍රාමයෙහි ලාභයෙන් හා යසසින් අග්‍රබවට පැමිණ වාසය කරයි. ඒ පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේද විසාලා මහ නුවර පිරිස්වල මෙබඳු වචනයක් කියයි. 'ශ්‍රමණ භවත්ගෞතම තෙමේද ඥාණවාදියෙක (නුවණින් වාදකරන්නෙක). මමද ඥාණවාදියෙක් වෙමි. ඥාණවාදියෙක් ඥාණවාදියෙකු හා මනුෂ්‍යධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමට සුදුසු වන්නේය. ශ්‍රමණ භවත් ගෞතම තෙමේ (වාද කිරීම සඳහා) අඩ යොදුනක් එන්නේ නම් මමද අඩ යොදුනක් ඉදිරියට යන්නෙමි. ඒ අපි දෙදෙනම එහි මනුෂ්‍යධර්මයට වඩා උසස් ධර්මයන් ඍද්ධි දැක්වීම කරන්නෙමු. ඉදින් ශ්‍රමණභවත් ගෞතම තෙමේ එක් ඍද්ධියක් දක්වන්නේ නම් මම ඍද්ධි දෙකක් දක්වන්නෙමි.

ශ්‍රමණ භවත් ගෞතම තෙමේ ඍද්ධි දෙක දෙක දක්වන්නේ නම් මම ඍද්ධි සතරක් දක්වන්නෙමි. ශ්‍රමණ භවත් ගෞතම තෙමේ ඍද්ධි සතරක් බැගින් දක්වන්නේ නම් මම ඍද්ධි අටක් බැගින් දක්වන්නෙමි. මෙසේ ශ්‍රමණ භවත් ගෞතම තෙමේ ඍද්ධි දක්වන්නේද, මම ඊට දෙගුණයක් ඍද්ධි දක්වන්නෙමි කියායි.

"භාර්ගවය, එකල්හි සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ මම යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ මා හට වැඳ එක පැත්තක හුන්නේය. භාර්ගවය, එක පැත්තක හුන්නාවූ සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර තෙමේ මා හට මේ කාරණය කීයේය. "ස්වාමීන් වහන්ස, පාථික පුත්‍ර නම් නිගණ්ඨ තෙමේද විසාලා මහනුවර වජ්ජි ග්‍රාමයෙහි ලාභයෙන් හා යසසින් අගතැන් පැමිණ වෙසෙයි. හෙතෙමේ විසාලා මහනුවර පිරිස්වල මෙබඳු වචනයක් කියයි.

'ශ්‍රමණභවත්, ගෞතමතෙමේ නුවණින් වාදකරන්නෙක් වන්නේය. මමද නුවණින් වාද කරන්නෙක් වෙමි. නුවණින් වාද කරන්නෙක් නුවණින් වාද කරන්නෙකු හා ඍද්ධි දැක්වීමට සුදුසු වන්නේය.

"ශ්‍රමණ භවත්ගෞතම තෙමේ අඩ යොදුනක් දුරයේ නම් මමත් අඩ යොදුනක් යන්නෙම්යයිද ඒ අපි දෙදෙන එහි මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයන් ඍද්ධි දක්වන්නෙමු.

ශ්‍රමණභවත් ගෞතම තෙම, එක් ඍද්ධියක් දක්වන්නේ නම් මම දෙක බැගින් දක්වන්නෙම්යයිද දෙකක් දක්වන්නේ නම් මම සතරක් දක්වන්නෙම්යයිද මෙසේ දෙගුණයක් ඍද්ධි දක්වන බව කියන්නේය"යි කීය.

භාර්ගවය, මෙසේ කී කල්හි මම සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයාහට මෙසේ කීවෙමි,

'සුනක්ඛත්තය, පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහ නොකොට ඒ හිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත් නොහැර මා හමුවට එන්ට නුසුදුසු වන්නේමය. ඉදින් ඒ පාථික පුත්‍ර

නිගණ්ඨයාහට මෙබඳු සිතක් වන්නේ නම්, මම ඒ වචනය පහ නොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත් නොහැර ශ්‍රමණභවත් ගෞතමයන්ගේ සම්මුඛයට යන්නෙමැයි (සිතුයේ නම්) ඔහුගේ හිස සත් කඩකට පැළෙන්නේය'යි කීවෙමි.

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඒ වචනය රැක ගන්නා සේක්වා, සුගතයන් වහන්ස, ඒවචනය රැක ගන්නා සේක්වා'යි සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ කීය.

සුනක්ඛත්තය, තෝ මට "ස්වාමීනි, භාග්‍යවතුන්වහන්ස, ඒ වචනය රැක ගන්නාසේක්වා. සුගතයන් වහන්ස, ඒ වචනය රැක ගන්නා සේක්වා"යි, කුමක් හෙයින් කීයෙහිද? "ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන්වහන්සේ විසින් "පාථිකපුත්‍ර නිගණ්ඨ තෙමේ, ඒ වචනය පහ නොකොට ඒ හිත දුරු නොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර මා හමුවන්ට නුසුදුසු වන්නේමය. ඉදින් ඔහුට මෙබඳු සිතෙක් වේනම්, 'මම ඒ වචනය පහ නොකොට ඒ සිත දුරු නොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ හමුවට යන්නෙමි'යි සිතුයේ නම් ඔහුගේ හිස සත් කඩකට පැලෙන්නේය යන මේ වචනය ඒකාන්ත කොට කියන ලදී. 'ස්වාමීන් වහන්ස, පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ විසභාග රූපයකින් භාග්‍යවතුන් වහන්සේගේ හමුවට එන්නේ නම් භාග්‍යවතුන් වහන්සේගේ ඒ වචනය බොරුවන්නේයයි' කීය. 'කිමෙක්ද? සුනක්ඛත්තය, තථාගත තෙමේ යම් ඒ වචනයක් දෙපරිද්දකින් වන්නේද, එබඳු වචනයක් කියන්නේදැ'යි ඇසීමි.

ස්වාමීන් වහන්ස, කිමෙක්ද? භාග්‍යවතුන් වහන්සේ විසින් මේ කාරණය තමන් වහන්සේගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දන්නා ලද්දේද? "පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහ නොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය දුරු නොකොට මාගේ හමුවට එන්ට නුසුදුසු වන්නේය. ඉදින් ඔහුට මෙබඳු සිතක් වන්නේද, මම ඒ වචනය පහ නොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත් නොහැර ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ඉදිරියට යන්නෙමි යයි සිතුයේ නම් ඔහුගේ හිස සත්කඩකට පැළෙන්නේයයි (සිතින් පිරිසිඳ දන්නා ලද්දේද,) නැතහොත්

භාග්‍යවතුන් වහන්සේහට දෙවියෝ මෙකරුණ කීවාහුද? ස්වාමීන්වහන්ස, පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහනොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර භාග්‍යවතුන් වහන්සේගේ හමුවට එන්ට නුසුදුසු වන්නේය. ඉදින් ඒ පාථික පුත්‍ර නිගණ්ඨයා හට මම ඒ වචනය පහනොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර ශ්‍රමණභවත් ගෞතමයන්ගේ හමුවට යන්නෙමි යයි' මෙබඳු සිතක් වන්නේද ඔහුගේ හිස සත්කඩකට පැළෙන්නේයයි දෙවියන් විසින් දන්වන ලද්දේදැ'යි ඇසී.

සුනක්ඛත්තය, "පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහ නොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර මාගේ හමුවට එන්ට නුසුදුසු වන්නේයයිද ඉදින් එසේ ඒ නම් ඔහුගේ හිස සත්කඩකට පැළෙන්නේයයිද මාගේ සිතින්ද පිරිසිඳ දන්නා ලද්දේය. දේවතාවෝද මට මේ කරුණ දැන්වූහ. ස්වාමීන් වහන්ස, "පාථිකපුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහ නොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර භාග්‍යවතුන් වහන්සේගේ හමුවට එන්ට නුසුදුසු වන්නේය. ඉදින් ඒ නිගණ්ඨයාහට "මම ඒ වචනය පහ නොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර ශ්‍රමණභවත් ගෞතමයන්ගේ හමුවට යන්නෙමි යයි මෙබඳු සිතෙක් වන්නේ නම්, ඔහුගේ හිස සත්කඩකට පැළෙන්නේයයි දෙවතාවෝද කීවාහුය. ලිච්ඡවි රජුන්ගේ අජිත නම් සේනාපති තෙමේ නුදුරු කාලයෙහි මැරී තව්තිසා දෙව්ලොව උපන්නේය. ඒ දිව්‍යපුත්‍ර තෙමේද මා කරා පැමිණ මේ කරුණ දැන්නුවේය.

"ස්වාමීන් වහන්ස, පාථිකපුත්‍ර නම් නිගණ්ඨ තෙමේ ලජ්ජා නැත්තෙක. ස්වාමීන් වහන්ස, පාථික පුත්‍ර නම් නිගණ්ඨ තෙමේ බොරු කියන්නෙක් වන්නේය. ස්වාමීන් වහන්ස, පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ මටද වජ්ජි ග්‍රාමයෙහි ලිච්ඡවි රජුන්ගේ අජිත නම් සේනාපති තෙමේ මහා නරකයෙහි උපන්නේයයි කීය. ස්වාමීන් වහන්ස, මම වනාහි මහා නරකයෙහි නූපන්නෙමි. මම තව්තිසා දෙව්ලොව උපන්නේ වෙමි. ස්වාමීන් වහන්ස,

පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ ලජ්ජා නැත්තෙක් වන්නේය. ස්වාමීන් වහන්ස, පාථිකපුත්‍ර නිගණ්ඨ තෙමේ බොරු කියන්නෙක් වන්නේය. ස්වාමීන් වහන්ස, පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහ නොකොට, ඒ සිත පහ නොකොට, ඒ සිත පහ නොකොට ඒදෘෂ්ටිය අත් නොහැර භාග්‍යවතුන් වහන්සේගේ සම්මුඛයට එන්ට නුසුදුසු වන්නේය. ඉදින් ඒ වචනය පහ නොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ හමුවට යන්නෙමියි සිතී නම් ඔහුගේ හිස සත් කඩකට පැලී යන්නේයයි (ඒ අජිත නම් දෙවිතෙම) කීය.

සුනක්ඛත්තය, මෙසේ වනාහි මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳද දැන ගන්නා ලදී, පාථිකපුත්‍ර නිවට තෙමේ ඒ වචනය පහ නොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර මාගේ හමුවට එන්ට නුසුදුස්සෙක් වන්නේය. ඉදින් ඒ වචනය පහ නොකොට සිත ඒ පහ නොකොට ඒ දෘෂ්ටිය අත් නොහැර ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ හමුවට යන්නෙමියි, සිතී නම් ඔහුගේ හිස සත්කඩකට පැළී යන්නේය'යි (මා විසින්ද දන්නා ලදී) දේවතාවෝද මට මේ කාරණය කීවාහුය.

ස්වාමීන් වහන්ස, පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහ නොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර භාග්‍යවතුන් වහන්සේගේ හමුවට එන්ට නුසුදුස්සෙක් වන්නේය. ඉදින් ඒ නිගණ්ඨයාහට 'මම ඒ වචනය පහ නොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත් නොහැර ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ හමුවට යන්නෙමි'යි මෙබඳු සිතක් වූයේ නම් ඔහුගේ හිස සත්කඩකට පැළෙන්නේය'යි (දෙවතාවෝද කීවාහුය). මම විසාලා මහනුවර පිඬු පිණිස හැසිර පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් හැරී එන්නේ පාථික පුත්‍ර නිගණ්ඨයාගේ ආරාමය යම් තැනෙක්හිද දවල් කාලය ගත කරනු පිණිස එහි පැමිණෙන්නෙමි. පැමිණ සුනක්ඛත්තය, තෝ දැන් (මා හා ඍද්ධි දැක්වීමට පැමිණෙන ලෙස) යමෙකුට කියන්ට කැමැත්තෙහි නම් ඔහුට කියවයි කියන්නෙමි නම් යෙහෙකැයි සිතීමි.

"භාර්ගවය, එකල්හි වනාහි මම පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන විසාලාමහනුවරට පිඬු පිණිස පැමිණියෙමි. විසාලා මහනුවර පිඬු පිණිස හැසිර පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් හැරීඑන්නේ පාථික පුත්‍ර නිගණ්ඨයාගේ ආරාමය යම් තැනෙක්හිද දවල් කාලය ගතකරනු පිණිස එහි පැමිණියෙමි.

භාර්ගවය, එකල්හි සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ විසාලා මහනුවරට ගොස් ප්‍රසිද්ධ ප්‍රසිද්ධවූ ලිච්ඡවීහු යම් යම් තැන්හිද ඒ ඒ තැන්වලට පැමිණ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ලිච්ඡවීන්ට මෙපවත් කීයේය. ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර පිඬු පිණිස හැසිර පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් හැරීඑන්නේ පාථික පුත්‍ර නිගණ්ඨයාගේ ආරාමය යම් තැනෙක්හිද දවල් කාලයෙහි වාසය පිණිස එහි පැමිණියෝය. ආයුෂ්මත්නි, නික්ම යව්. ආයුෂ්මත්නි, නික්ම යව්, යහපත් ස්වභාව ඇති ශ්‍රමණයින්ගේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමක් වන්නේයයි කී.

භාර්ගවය, එකල්හි ප්‍රසිද්ධ ප්‍රසිද්ධවූ ලිච්ඡවි රජ දරුවන්ට මෙබඳු සිතෙක් වී. 'යහපත් ස්වභාව ඇත්තාවූ ශ්‍රමණයින්ගේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමක් වන්නේය. පින්වත්නි, එබැවින් ඒකාන්තයෙන්ම යන්නෙමු යයි සිතූහ. ප්‍රසිද්ධ ප්‍රසිද්ධ බ්‍රාහ්මණ මහසාර කුලිකයෝද මහත් ධනධාන්‍ය සම්පතින් යුත් ගෘහපතීහුද නොයෙක් තීර්ථකයෝද මහණ බමුණෝද යම් තැනෙක්හිද සුනක්ඛත්ත තෙමේ එහි පැමිණියේය. පැමිණ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ නොයෙක් තීර්ථකයන්ටද මහණ බමුණන්ටද මෙසේ කීය. 'ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර පිඬු පිණිස හැසිර පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් හැරී එන්නේ පාථික පුත්‍ර නිගණ්ඨයාගේ ආරාමය යම් තැනෙක්හිද දවල් කාලයෙහි වාසය පිණිස එහි වැඩියේය.

ඇවැත්නි, නික්ම යව්, ඇවැත්නි, නික්ම යව්, යහපත් ශ්‍රමණයින්ගේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි

දැක්වීමක් වන්නේයයි කීය. භාර්ගවය, එකල ප්‍රසිද්ධ ප්‍රසිද්ධවූ නොයෙක් තීර්ථකයන්ටද මහණබමුණන්ටද මෙබඳු සිතෙක් වී, 'පින්වත්නි, යහපත්වූ ශ්‍රමණයින්ගේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමක් වන්නේය. පින්වත්නි, එබැවින් ඒකාන්තයෙන්ම එහි යන්නෙමුයි සිතූහ. භාර්ගවය, එකල ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ලිච්ඡවීහුද ප්‍රසිද්ධ ප්‍රසිද්ධ බ්‍රාහ්මණ මහාසාර කුලිකයෝද මහත් ධන ධාන්‍ය සම්පත්තින් යුත් ගෘහ පතීහුද නොයෙක් තීර්ථකයෝද මහණ බමුණෝද පාථිකපුත්‍ර නිගණ්ඨයාගේ ආරාමය යම් තැනෙක්හිද එහි පැමිණියාහුය.

භාර්ගවය, ඒ මේ පිරිස් නොයෙක් සිය ගණන්වූහ, නොයෙක් දහස් ගණන් වූහ. භාර්ගවය, පාථික පුත්‍ර නිගණ්ඨයාට වනාහි ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ලිච්ඡවි රජ දරුවෝද ප්‍රසිද්ධ ප්‍රසිද්ධ බ්‍රාහ්මණ මහාසාර කුලිකයෝද මහත් ධන ධාන්‍ය සම්පතින් යුත් ගෘහපතීහුද නොයෙක් තීර්ථකයෝද මහණ බමුණෝද පැමිණියාහුය. ශ්‍රමණ භවත් ගෞතම තෙමේද මාගේ ආරාමයෙහි දිවා විහරණය පිණිස වැඩ හුන්නේයයි අසන්ට ලැබුනේය. ඒ අසා ඒ පාථික පුත්‍ර නිගණ්ඨියාහට භයක්ද, තැති ගැන්මක්ද, ලොමු ඩැහැ ගැනීමක්ද ඇති විය.

භාර්ගවය, එකල පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ බියපත් වූයේ තැතිගන්නා ලද්දේ ලොමු ඩැහැගන්නා ලද්දේ තින්දුක ඛාණු පිරිවැජියාගේ ආරාමය යම් තැනෙක්හිද එහි පැමිණියේය. භාර්ගවය, ඒ පිරිස පාථිකපුත්‍ර නිගණ්ඨ තෙමේ බිය පත්ව තැති ගෙන ලොමු ඩැහැගන්නා ලදුව තින්දුකඛාණු පිරිවැජියාගේ ආරාමය යම් තැනෙක්හිද එහි පැමිණියේයයි ඇසුවාය.

භාර්ගවය, එකල ඒ පිරිස 'එම්බා පුරුෂය, තෝ මෙහි එවයි එක්තරා පුරුෂයෙකු කැඳවූයේය. කැඳවා ඔහුට කියනුයේ 'පින්වත්පුරුෂය, තින්දුකඛාණු පිරිවැජියාගේ ආරාමය යම් තැනෙක්හිද පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ යම් තැනෙක්හිද එහි යව, ගොස් පාථික පුත්‍ර නිගණ්ඨයාහට මෙසේ කියව. 'පාථික පුත්‍රය, නික්ම යව, ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ලිච්ඡවි රජ දරුවෝද පැමිණියාහුය. ප්‍රසිද්ධ ප්‍රසිද්ධ බ්‍රාහ්මණ මහාසාර කුලිකයෝද

මහත් ධන ධාන්‍ය සම්පත්තින් යුත් සිටුවරුද නොයෙක් තීර්ථකයෝද මහණ බමුණෝද පැමිණියාහුය. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේද ආයුෂ්මත්හුගේ ආරාමයෙහි දවල්කාලය ගතකිරීම පිණිස වැඩහුන්නේය. පාථික පුත්‍රය, තා විසින් විශාලා මහනුවර පිරිස්වලදී මෙබඳු බස් කියන ලද්දේමය. ශ්‍රමණ භවත් ගෞතම තෙමේද ඥානවාදියෙක් වන්නේය. මමද ඥාන වාදියෙක් වෙමි. ඥානවාදියෙක් තෙමේ ඥානවාදියෙකු හා මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමට සුදුසු වන්නේය. ඉදින් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ අඩ යොදුනක් යේ නම් මමද අඩ යොදුන් මාර්ගයක් යන්නෙමි. ඒ අපි දෙදෙනාම එහි මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම කරන්නෙම්, ඉදින් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම් එකක් කරන්නේ නම් මම දෙකක් කරන්නෙමි. ශ්‍රමණ භවත් ගෞතම තෙමේ ඍද්ධි දැක්වීම් දෙකක් කරන්නේ නම් මම සතරක් කරන්නෙමු. ඉදින් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ ඍද්ධි දැක්වීම් සතරක් කරන්නේ නම් මම අටක් කරන්නෙමි. මෙසේ යම්තාක් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම් කරන්නේ වේද මම ඊට දෙගුණයක් දෙගුණයක් බැගින් ඍද්ධි දැක්වීම් කරන්නෙමියි කීය. ඇවත් පාථික පුත්‍රය, ශ්‍රමණභවත් ගෞතමයන් ආ මාර්ගයෙන් බාගයක් දුර යාමට නික්මෙව. සියල්ලන්ට පළමුවෙන්ම ශ්‍රමණභවත් ගෞතම තෙමේ ආයුෂ්මත්හුගේ ආරාමයට වැඩමවා දවල් කාලය ගතකරනු පිණිස වැඩ හුන්නේය’යි කියවයි කීවාහුය.

“භාර්ගවය, ඒ පුරුෂ තෙමේ ‘එසේය පින්වතැ’යි කියා ඒ පිරිසට උත්තර දී තින්දුකඛාණු පරිබ්‍රාජකයාගේ ආරාමය යම් තැනෙක්හිද පාථිකපුත්‍ර නිගණ්ඨතෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ පාථික පුත්‍ර නිගණ්ඨයාට මෙසේ කීයේය. ‘ඇවැත් පාථික පුත්‍රය, ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ලිච්ඡවි රජ දරුවෝද පැමිණියාහුය. ප්‍රසිද්ධ ප්‍රසිද්ධ බ්‍රාහ්මණ මහාසාර කුලිකයෝද ගෘහපතීහුද නොයෙක් තීර්ථකයෝද මහණ බමුණෝද

පැමිණියාහුය. ශ්‍රමණභවත් ගෞතම තෙමේද ආයුෂ්මත්හුගේ ආරාමයෙහි දවල් ගතකිරීම පිණිස හුන්නේය. ඇවැත් පාථික පුත්‍රය, තා විසින් විශාලා මහනුවර පිරිස්හි මෙබඳු වචනයක් කියන ලද්දේය. ‘ශ්‍රමණභවත් ගෞතම තෙමේද ඥානවාදියෙක මමද ඥානවාදියෙක්මි. ඥානවාදියෙක් තෙමේ ඥානවාදියෙකු හා මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමට සුදුසු වන්නේය.

ඉදින් ශ්‍රමණභවත් ගෞතම තෙමේ අඩ යොදුනක් යේ නම් මමද අඩ යොදුන් මාර්ගයක් යන්නෙමි. ඒ අපි දෙදෙනාම එහි මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම කරන්නෙමු, ඉදින් ශ්‍රමණභවත් ගෞතම තෙමේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම් එකක් කරන්නේ නම් මම දෙකක් කරන්නෙමි. ශ්‍රමණභවත් ගෞතම තෙමේ ඍද්ධි දැක්වීම් දෙකක් කරන්නේ නම් මම සතරක් කරන්නෙමි. ඉදින් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ ඍද්ධි දැක්වීම් සතරක් කරන්නේ නම් මම අටක් කරන්නෙමි. මෙසේ යම් තාක් ශ්‍රමණභවත් ගෞතම තෙමේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම් කරන්නේ වේද මම ඊට දෙගුණයක් දෙගුණයක් බැගින් ඍද්ධි දැක්වීම් කරන්නෙමි’යි කියායි. එබැවින් ඇවැත් පාථික පුත්‍රය, එහි යාමට නික්මෙව. සියල්ලන්ට පළමුකොටම වනාහි ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ වැඩමවා ආයුෂ්මත්හුගේ ආරාමයෙහි දිවාවිහරණය පිණිස වැඩහුන්නේයයි’ කී.

“භාර්ගවය, මෙසේ කී කල්හි පාථික පුත්‍ර තෙමේ ‘ඇවත, එන්නෙමි. ඇවත, එන්නෙමි’යි කියමින් එහිම ලැගෙන්නේය, හුනස්නෙන් නැගිටින්ටද නොහැකි වන්නේය.

“භාර්ගවය, එකල ඒ පුරුෂ තෙමේ පාථික පුත්‍ර නිගණ්ඨයාට මේ කරුණ කීයේය. ‘ඇවැත් පාථිකපුත්‍රය, කිමෙක්ද? තාගේ තට්ටම් හිඳිනා අසුනෙහි ඇලුනාහුද නොහොත් අසුන වනාහි තාගේ තට්ටම්වල ඇලුනේද, ‘එන්නෙමි ඇවත, එන්නෙමි ඇවතය’යි කියමින් එහිම ලැගෙන්නේය, හුනස්නෙන් නැගිටින්ටද නොහැකි වන්නේයයි කීය.

"භාර්ගවය, යම් කලෙක ඒ පුරුෂ තෙමේ මේ පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ පැරදුනු ස්වභාව ඇතිව 'එම් ඇවත, එම්, ඇවතය'යි කියමින් එහිම ලැගෙන්නේය, හුනස්නෙන් නැගිටින්ටද නොහැකි වන්නේයයි දැනගත්තේද එසේ ඇති කල්හි ඒ පිරිසට අවුත් 'පින්වත්නි, ඒ පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ එම් ඇවත, එම් ඇවත'යි කියමින් එහිම ලැගෙන්නේය, හුනස්නෙන් නැගිටින්ටද නොහැකි වන්නේය, පැරදුනු ස්වභාව ඇත්තෙක් වූයේය'යි කී.

"භාර්ගවය, මෙසේ කී කල්හි මම ඒ පිරිසට මෙසේ කීවෙමි, 'ඇවැත්නි, පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහ නොකොට ඒ සිත පහනොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර මාගේ ඉදිරියට එන්ට අසමර්ථ වන්නේය. ඉඳින් වනාහි ඔහුට 'මම් ඒ වචනය පහනොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර ශ්‍රමණභවත් ගෞතමයන්ගේ ඉදිරියට යන්නෙමියි' මෙබඳු සිතෙක් වූයේ නම් ඔහුගේ හිස සත් කඩකට පැලෙන්නේයයි කීවෙමි.

## පළමුවෙනි බණ වරයි

භාර්ගවය, එකල්හි වනාහි එක්තරා ලිච්ඡවි මහාමාත්‍යයෙක් තෙමේ හුනස්නෙන් නැගිට ඒ පිරිසට මෙසේ කීයේය. 'එසේවී නම් පින්වත්නි, යම්තාක් මම එන්නෙම්ද ඒ තාක් මොහොතක් කල් ඉවසව්. මමද පාථිකපුත්‍ර නිගණ්ඨයා මෙහි ගෙනඑන්ට හැකිවන්නෙම් නම් ඉතා යහපත් වන්නේය'යි කීය. භාර්ගවය, එකල්හි ඒ ලිච්ඡවි මහාමාත්‍ය තෙමේ තින්දුකඛාණු පිරිවැජියාගේ ආරාමය යම් තැනෙක්හිද පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, පාථිකපුත්‍ර නිගණ්ඨයාට මෙසේ කීයේය. 'ඇවැත් පාථිකපුත්‍රය, නික්මෙව, තාගේ නික්ම යාම ඉතා යහපත් වන්නේය. ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ලිච්ඡවි රජදරුවෝද පැමිණියාහුය. ප්‍රසිද්ධ ප්‍රසිද්ධ බ්‍රාහ්මණ මහසාර කුලිකයෝද, ගෘහපතිහුද, නොයෙක් තීර්ථකයෝද, මහණ බමුණෝද පැමිණියාහුය. ශ්‍රමණභවත් ගෞතම තෙමේද ආයුෂ්මත්හුගේ ආරාමයෙහි දවල් කාලය සඳහා හුන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඇවැත් පාථිකපුත්‍රය, තා විසින් විශාලා මහනුවර පිරිස්හි මෙබඳු වචනයක් කියන ලද්දේය, 'ශ්‍රමණභවත් ගෞතම තෙමේ ඥානවාදියෙක් වන්නේය. මමද ඥානාවදියෙක් වෙමි. ඥානවාදියෙක් තෙමේ ඥානවාදියෙකු හා මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමට සුදුසු වන්නේය.

ඉදින් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ අඩ යොදුනක් යේ නම් මමද අඩ යොදුන් මාර්ගයක් යන්නෙමි. ඒ අපි දෙදෙනාම එහි මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම කරන්නෙමු, ඉදින් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම් එකක් කරන්නේ නම් මම දෙකක් කරන්නෙමි. ශ්‍රමණ භවත් ගෞතම තෙමේ ඍද්ධි දැක්වීම් දෙකක් කරන්නේ නම් මම සතරක් කරන්නෙමි. ඉදින් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ ඍද්ධි දැක්වීම් සතරක් කරන්නේ නම් මම අටක් කරන්නෙමි. මෙසේ යම්තාක් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම් කරන්නේ වේද, මම ඒ ප්‍රාතිහාර්‍ය්‍ය දෙගුණයක් දෙගුණයක් වශයෙන් කරන්නෙමි' යි කියායි. ඇවැත් පාථිකපුත්‍රය, මාර්ගයෙහි බාගයක් යාමට නික්මෙව, සියල්ලට පළමුව ශ්‍රමණභවත් ගෞතම තෙමේ ආයුෂ්මත්හුගේ ආරාමයෙහි දිවාවිහරණය පිණිස හුන්නේය. ඇවැත් පාථිකපුත්‍රය, ශ්‍රමණභවත් ගෞතමයන් විසින් පිරිසෙහි මෙබඳු වචන ප්‍රකාශ කරන ලද්දේය. පාථිකපුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහ නොකොට ඒ සිත පහ නොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර මාගේ සම්මුඛයට එන්ට නුසුදුස්සෙක් වන්නේමය. ඉදින් වනාහි ඔහුට 'යන්නෙමියයි' මෙබඳු සිතෙක් වීනම් ඔහුගේ හිස සත්කඩකට පැළෙන්නේයයි' කියායි.

(එබැවින් ඇවැත් පාථික පුත්‍රය), නික්මෙව, නික්ම යාමෙන්ම තට ජයක් කරන්නෙමු. ශ්‍රමණභවත් ගෞතමයාහට පරාජය වන්නේයයි' කී.

මෙසේ කී කල්හි පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ 'ඇවත එන්නෙමියි' කියා එහිම ලැගෙන්නේය. හුනස්නෙන් නැගිටින්ටද

නොහැකි වන්නේය, භාර්ගවය, එකල්හි ලිච්ඡවි මහාමාත්‍යතෙමේ පාථිකපුත්‍ර නිගණ්ඨයාට මෙසේ කීයේය. ‘ඇවැත් පාථිකපුත්‍රය කිමෙක්ද? තාගේ තට්ටම් ආසනයෙහි ඇලුනාහුද නොහොත් තාගේ තට්ටම්වල ආසනය ඇලුනේද? ‘එම් ඇවත, එම් ඇවතැයි’ කියමින් එහිම ලැගෙන්නේය, හුනස්නෙන් නැගිටින්ටද නොහැකි වන්නේය’යි කී. භාර්ගවය, මෙසේද, කියනු ලැබූ පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ එම් ඇවත, එම් ඇවතැ’යි කියා, එහිම ලැගෙන්නේය, නැගිටින්ටද නොහැකි වන්නේය, භාර්ගවය, යම් කලෙක ඒ ලිච්ඡවි මහාමාත්‍ය තෙමේ පාථිකපුත්‍ර නිගණ්ඨ තෙමේ පැරදුනු ස්වභාව ඇත්තේ ‘එම් ඇවත, එම් ඇවත’යි කියමින් එහිම ලැගෙයි, හුනස්නෙන් නැගිටින්නටත් නොහැකි වන්නේයයි දැනගත්තේද, එසේ දැනගත් කල්හි ඒ පිරිස කරා ගොස් මෙසේ කීයේය.

“පින්වත්නි, පාථිකපුත්‍ර නිගණ්ඨ තෙමේ පැරදුනු ස්වභාව ඇත්තේ ‘එම් ඇවත, එම් ඇවත’යි කියමින් එහිම ලැගෙන්නේය. හුනස්නෙන් නැගිටින්ටත් නොහැකි වන්නේය”යි කීය.

“භාර්ගවය, මෙසේ කී කල්හි මම ඒ පිරිසට මෙසේ කීවෙමි. ‘ඇවැත්නි, පාථිකපුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහ නොකොට ඒ සිත පහනොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර ශ්‍රමණභවත් ගෞතමයන්ගේ ඉදිරියට යන්නෙම්යයි සිතීනම් ඔහුගේ හිසද සත් කඩකට පැළෙන්නේය.’ ඉදින් ආයුෂ්මත් ලිච්ඡවි රජදරුවන්ට මෙබඳු සිතෙක් වන්නේද ‘අපි පාථික පුත්‍ර නිගණ්ඨයා වරපටවලින් බැඳ සියයක් පමණවූ හෝ දහසක් පමණවූ හෝ ගොන්බාන්වලින් අදින්නෙමුය’යි අදින්නාහු නම් ඒ වරපටවල් හෝ (රැහැන්) සිඳී යන්නාහුය, පාථිකපුත්‍ර තෙමේ හෝ සිඳී යන්නේය, පාථිකපුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහනොකොට, ඒ සිත පහනොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර මා හමුවට පැමිණීමට නුසුදුසු වන්නේය. ඉදින් ඔහුට මෙබඳු සිතෙක් වේනම් ‘මම ඒ වචනය පහනොකොට ඒ සිත පහනොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ඉදිරියට (හමුවීමට) යන්නෙම්ය’යි සිතී නම් ඔහුගේ හිස හත්කඩකට පැළෙන්නේයයි ප්‍රකාශ කෙළෙමි.

"භාර්ගවය, එකල්හි වනාහි දාරුපත්තික නම් කෙනෙකුගේ අතවැසි ජාලිය නම් තැනැත්තෙක් හුනස්නෙන් නැගිට ඒ පිරිසට මෙසේ කීයේය.

'පින්වත්නි, එසේවී නම් යම්තාක් මම ගොස් එන්නෙම්ද ඒතාක් මොහොතක් පමණ කල් නවතිව්, මමද පාථික පුත්‍ර නිගණ්ඨයා මෙහි ගෙනඑන්ට හැකි වන්නෙම් නම් ඉතා යහපත් වන්නේයයි' කී. භාර්ගවය, එකල්හි දාරුපත්තික අතවැසි ජාලිය නම් තැනැත්තේ තින්දුකඛාණු පරිබ්‍රාජකාරාමය යම් තැනෙක්හිද පාථික පුත්‍ර නම් නිගණ්ඨ තෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ පාථික පුත්‍ර නිගණ්ඨයාට මේ වචනය කීයේය. 'ඇවැත් පාථික පුත්‍රය, නික්ම යව. තොපගේ නික්ම යාම යහපත් වන්නේය. ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ලිච්ඡවි රජදරුවෝද ප්‍රසිද්ධ ප්‍රසිද්ධ බ්‍රාහ්මණ මහාසාර කුලිකයෝද මහත් ධන ධාන්‍ය සම්පතින් යුත් සිටුවරුද නොයෙක් තීර්ථකයෝද මහණ බමුණෝද පැමිණියාහුය. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේද ආයුෂ්මත්හුගේ ආරාමයෙහි දවල් කාලය ගතකිරීම පිණිස හුන්නේය. ඇවැත් පාථික පුත්‍රය, තා විසින් විශාලා මහනුවර පිරිස්වල මෙබඳු බස් කියන ලද්දේය. 'ශ්‍රමණ භවත් ගෞතම තෙමේත් ඥානවාදියෙක් වන්නේය. මමද ඥානවාදියෙක් වෙමි. ඥානවාදියෙක් ඥානවාදියෙකු හා මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීමට සුදුසු වන්නේය.

ඉදින් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ අඩ යොදුනක් යේ නම් මමද අඩ යොදුන් මාර්ගයක් යන්නෙමි. ඒ අපි දෙදෙනාම එහි මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම කරන්නෙමු, ඉදින් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම් එකක් කරන්නේ නම් මම දෙකක් කරන්නෙමි. ශ්‍රමණ භවත් ගෞතම තෙමේ ඍද්ධි දැක්විම් දෙකක් කරන්නේ නම් මම සතරක් කරන්නෙමි. ඉදින් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ ඍද්ධි දැක්වීම් සතරක් කරන්නේ නම් මම අටක් කරන්නෙමි. මෙසේ යම්තාක් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම් කරන්නේ වේද, මම ඊට දෙගුණයක් දෙගුණයක්

වශයෙන් ඍද්ධි දැක්වීම් කරන්නෙමි'යි කියායි. ඇවැත් පාඨිකපුත්‍රය, අඩ දුරක් මඟ නික්මයේවා. සියල්ලන්ට පළමු කොටම ශ්‍රමණ භවත් ගෞතම තෙමේ අවුත් ආයුෂ්මත්හුගේ ආරාමයෙහි දවල් කාලය ගතකිරීම පිණිස හුන්නේය. ඇවැත් පාඨිකපුත්‍රය, ශ්‍රමණ භවත් ගෞතමයන් විසින් තාහට පිරිස්වල මේ වචනය කියන ලද්දේය. 'පාඨිකපුත්‍ර නිගණ්ඨතෙමේ ඒ වචනය පහනොකොට ඒ සිත පහනොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර මා හමුවට පැමිණීමට නුසුදුසු වන්නේය. ඉදින් ශ්‍රමණභවත් ගෞතමයන්ගේ හමුවට යන්නෙමියයි සිතීනම් ඔහුගේ හිස සත්කඩකට පැළෙන්නේය'යිද ඉදින් ආයුෂ්මත් ලිච්ඡවීන්ට මෙබඳු සිතෙක් වන්නේ නම් 'අපි පාඨිකපුත්‍ර නිගණ්ඨයා වරපටවලින් බැඳ සියගණන් ගොන්බාන්වලින් ඇද එන්නෙමුයයි (උත්සාහ කෙළේ නම්) ඒ වරපටවල් හෝ පාඨිකපුත්‍රයා හෝ සිඳීයන්නේය. පාඨික පුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහනොකොට ඒ සිත පහනොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර මාගේ හමුවට එන්ට නුසුදුස්සෙක් වන්නේය. ඉදින් එසේ නොකොට ශ්‍රමණ භවත් ගෞතමයින්ගේ හමුවට යන්නෙමියි සිතී නම් ඔහුගේ හිස සත්කඩකට පැළෙන්නේය' යි ප්‍රකාශ කළහ. 'පාඨිකපුත්‍රය' නික්ම යව, පාඨිකපුත්‍රය, නික්ම යාමෙන්ම තාහට ජය අත්කර දෙන්නෙමු, ශ්‍රමණභවත් ගෞතමයන් පරදවන්නෙමුය'යි කී.

භාර්ගවය, මෙසේ කී කල්හි පාඨිකපුත්‍ර තෙමේ 'ඇවත, යමි' 'ඇවත, යමි' කියා එහිම ලැගෙන්නේය, හුනස්නෙන් නැගිටින්ටද නොහැකි වන්නේය. භාර්ගවය, එකල්හි වනාහි දාරුපත්තික අතවැසි ජාලියතෙමේ පාඨිකපුත්‍ර නිගණ්ඨයාහට මේ වචනය කීය. 'කිමෙක්ද? තාගේ තට්ටම් අසුනෙහි ඇලුනේද? නොහොත් තාගේ තට්ටම්වල ආශනය ඇලුනේද?' යමි ඇවත, යමි ඇවතැයි කියමින් එහිම ලැගෙන්නේය, හුනස්නෙන් නැගිටින්ටද නොහැකි වන්නේය'යි කී. භාර්ගවය, යම් කලෙක ජාලිය නම් දාරුපත්තික අතවැසි තෙමේ මේ පාඨික පුත්‍ර නිගණ්ඨ තෙමේ 'යමි ඇවැත, යමි ඇවතැයි' කියමින් එහිම ලැගෙන්නේය නැගිටින්ටද නොහැකි වන්නේය (මොහු) පැරදුනු

ස්වභාව ඇත්තෙක් වන්නේයයි දැනගත්තේද එසේ ඇතිකල්හි ඔහුට මෙසේ කීයේය.

'ඇවැත් පාථිකපුත්‍රය, පෙර කලෙක මෘගයන්ට රජවූ සිංහයෙකුට මෙබඳු අදහසක් විය. මම එක්තරා වන ලැහැබක් ඇසුරුකොට පවත්නා ගුහාවෙක වාසය කරන්නෙම් නම්, එහි වාසය කොට සවස් කාලයෙහි එතැනින් නික්මෙන්නෙම් නම්, නික්ම ශරීරය ගසා හෙළන්නෙම් නම්, ශරීරය ගසාහෙළා හාත්පස සිව් දිසාවන් බලන්නෙම් නම්, හාත්පස සිව් දිසාවන් බලා තුන්වරක් සිංහනාද කරන්නෙම්නම්, තුන්වරක් සිංහනාදකොට ගොදුරු පිණිස යන්නෙම් නම් ගොස් හොඳ හොඳ මුව සමූහයා මරා මෘදු මෘදු මස් කා එම ගුහාවට පැමිණෙන්නෙම් නම් යෙහෙකැ'යි සිතීය. එකල ඒ සිංහරාජතෙමේ එක්තරා වන ලැහැබක් ඇසුරුකොට ගුහාවක වාසය කෙළේය. එහි වාසයකොට සවස් කාලයෙහි එතැනින් නික්මුනේය. නික්ම ඒ හාත්පස සතරදිසාවන් අනුව බැලුවේය. හාත්පස සිව්දිසාවන් බලා තුන්වරක් සිංහනාද කෙළේය. තුන් වරක් සිංහනාද කොට ගොදුරු පිණිස නික්ම ඒ සිංහරාජ තෙමේ හොඳ හොඳ මුව සමූහයා මරා මෘදු මෘදු මස් කා එම ස්ථානයටම පැමුණුනේය. ඇවැත් පාථික පුත්‍රය, එම සිංහයාගේම ඉඳුල් කා වැඩුනාවූ ජර සිවලෙක් මහත්වූ ශරීර ඇත්තේ බලසම්පන්නයෙක් වීය. ඇවත, එකල ඒ සිවලාහට මෙබඳු සිතෙක් විය. 'මම කවරෙක් වෙම්ද? ඒ සිංහරාජයා කවරෙක්ද? මමද එක්තරා වන ලැහැබක් නිසා වාසය කරන්නෙම් නම්, එහි වාසය කොට සවස් කාලයෙහි එතැනින් නික්මෙන්නෙම් නම්, නික්ම කය ගසාදමන්නෙම් නම්, කය ගසාදමා හාත්පස සිව්දිසා බලන්නෙම් නම්, හාත්පස සිව් දිසාවන් බලා, තුන්වරක් සිංහනාද කරන්නෙම් නම්, තුන් වරක් සිංහනාද කොට ගොදුරු පිණිස යන්නෙම් නම්, ඒ මම හොඳ හොඳ මුව සමූහයා මරා මෘදු මෘදු මස් කා එම ආශ්‍රය ස්ථානයටම පැමිණෙන්නෙම් නම් යෙහෙකැයි සිතීය. ඇවත එකල්හි වනාහි ඒ ජර සිවලා එක්තරා වන ලැහැබක් නිසා වාසය කෙළේය. එහි වාසයකොට සවස් කාලයෙහි එතැනින් නික්ම කය ගසා හෙලුයේය. කය ගසා හෙළා හාත්පස

සිව් දිසා බැලීය. හාත්පස සිව්දිසා බලා තුන්වරක් සිංහනාද කරන්නෙමියි සිවල් නාදයක්ම කෙළේය. අප්‍රිය අමනාප නාදයක්ම කෙළේය. නින්දිත සිවලා කවරෙක්ද? සිංහනාදය නම් කවරේද? ඇවත් පාථිකපුත්‍රය, එපරිද්දෙන්ම තෝ බුදුරදුන්ට දෙන සිව්පසයෙන් ඉතිරිදේ කා ජීවත්වෙමින් තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධවූ බුදුරදුන් හා සමවිය හැක්කකු සේ සිතුයෙහිද? නින්දිතවූ පාථිකපුත්‍ර තෙමේ කවරෙක්ද? තථාගතවූ රහත්වූ සම්‍යක් සම්බුදුරදුන් හා සමානවන්ට යාම කුමක්දැ'යි කීය.

භාර්ගවය, යම් හේතුවකින් ජාලිය නම් දාරුපත්තික අතවැසි තෙමේ මේ උපමාවෙන්ද පාථික පුත්‍ර නිගණ්ඨයා ඒ ආසනයෙන් සොලවන්ට නොහැකි වූයේමය.

ඉන්පසු ඔහුට (මේ ගාථාව කීවේය) 'තමන් සිංහරාජයෙක්යයි සිතා සිවල් තෙමේ (සිංහරාජයාගේ ඉඳුල්, මස්, කා වැඩීමෙන් මහත්වූ තම ශරීරය පැන්වළෙක්හිදී ඡායාවෙන් දැක) මම මෘගරාජයෙක් වෙමියි, නැවත මෙනෙහි කෙළේය. (අදහස් කෙළේය) එසේ අදහස්කොට සිංහරාජයෙක්යයි නාදකරන්නාවූ හෙතෙමේ සිවල් නාදයක් කෙළේය. නින්දිතවූ සිවල්නාදය කවරක් වන්නේද? උතුම් සිංහනාදය කවරක් වන්නේද?

ඇවැත් පාථික පුත්‍රය, එසේම 'තෝ සුගත්වූ බුදුරදුන්ට දෙන සිව්පසයෙන් ඉතිරි බොජුන් කා ජීවත්වන්නේ තථාගතවූ අර්හත්වූ සම්‍යක් සම්බුදුරදුන් හා සමවිය හැක්කකු සේ සිතන්නෙහිද? නින්දිතවූ පාථික පුත්‍ර තෙමේ කවරෙක්ද? තථාගත අර්හත් සම්‍යක් සම්බුදුන් හා සමවීම කවරක්ද? භාර්ගවය, යම් හේතුවකින් ජාලිය නම් දාරුපත්තික අතවැසි තෙමේ මේ උපමාවෙන්ද පාථිකපුත්‍ර නිගණ්ඨයා ඒ ආසනයෙන් ඉවත් කරන්ට නොහැකි වූයේමය. නැවතද ඔහුට මෙසේ කීයේය.

සිවල් තෙමේ වනයෙහි ඇවිදින්නේ සිංහයාගේ ඉඳුල් මස් කා වැඩුනු තමාගේ මහත්වූ ශරීරය දිය වළෙක්හි ඡායාවෙන් දැක තමා සිංහරාජයෙකැයි නැවත සිතුයේය. යම්තාක් තමාගේ ශරීරය නොදනීද ඒතාක් තමා සිංහරාජයෙකැයි සිතන්නේය.

එසේම ඒ සිවල්තෙමේ සිවල්නාදයම කරන්නේය. නින්දිත සිවල්තෙම කවරෙක්ද? සිංහනාදය කවරක්දැයි, කී.

ඇවැත් පාථික පුත්‍රය, මෙපරිද්දෙන්ම තෝ සුගත්වූ බුදුරදුන්ට දෙන සිව්පසයෙන් ඉතිරි බොජුන් කමින් ජීවත් වන්නේ තථාගත අර්හත් සම්‍යක් සම්බුදුරදුන් හා සමවිය යුත්තෙකු කොට සිතන්නෙහිද? නින්දිත පාථික පුත්‍රතෙමේ කවරෙක්ද? තථාගත අර්හත් සම්‍යක් සම්බුදුරදුන් හා සමවීම කවරක්දැයි' කී. භාර්ගවය, යම් හේතුවකින් ජාලිය නම් දාරුපත්තික අතවැසි තෙමේ මේ උපමාවෙන්ද, පාථික පුත්‍ර නිගණ්ඨයා ඒ ආසනයෙන් පහකරවන්ට නොහැකි වූයේමය. නැවතද ඔහුට මෙසේ කීය.

(හිවලෙක් තෙමේ) දියවලවල්වල මැඩියන්ද කලවිටිවල මීයන්ද අමු සොහොන්වල දමනලද කුණපයන්ද කා මහ වනයෙහි හා හිස් වනයෙහිද විශෙෂයෙන් වැඩුණේ මම මෘග රාජයෙක් (සිංහරාජයෙක්) වෙමියි, සිතූයේය. එසේ සිතා ඒ සිවල්තෙමේ සිංහනාද කරමියි සිවල් නාදයක්ම කෙළේය. නින්දිත සිවල්තෙමේ කවරෙක්ද? සිංහනාදය කවරක්දැයි' කී.

ඇවැත් පාථික පුත්‍රය, එපරිද්දෙන්ම තෝ වනාහි සුගත්වූ බුදුරදුන්ට දෙන සිව්පසයෙන් ඉතිරි බොජුන් කමින් ජීවත්වන්නේ තථාගත අර්හත් සම්‍යක් සම්බුදුන් හා සමවිය යුත්තෙකු කොට සිතන්නෙහිද? නින්දිත පාථික පුත්‍ර තෙමේ කවරෙක්ද? තථාගත අර්හත් සම්‍යක් සම්බුදුන් හා සමවීම කවරක්දැයි, කී.

භාර්ගවය, යම් හේතුවකින් ජාලිය නම් දාරුපතිත්ක අතවැසි තෙමේ මේ උපමාවෙන්ද පාථික පුත්‍ර නිගණ්ඨයා ඒ ආසනයෙන් පහකරන්නට නොහැකි වූයේමය. එසේ ඇති කල ඔහු ඒ පිරිසට අවුත් මෙසේ කීයේය.

'පින්වත්නි, පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ පැරදුනු ස්වභාව ඇත්තේය. 'ඇවත යමි, ඇවත යමියි' කියා එහිම ලැගෙන්නේය. හුනස්නෙන් නැගිටින්ටද නොහැකි වන්නේයයි' කී.

භාර්ගවය, මෙසේ කී කල්හි මම ඒ පිරිසට මෙසේ කීමි. පාථික පුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහනොකොට ඒ දෘෂ්ටිය

අත්නොහැර මාගේ ඉදිරියට එන්ට නුසුදුස්සෙක් වන්නේය. ඉදින් ඔහුට 'මම ඒ වචනය පහනොකොට ඒ සිත පහනොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ඉදිරියට යන්නෙමි'යි සිතී නම් ඔහුගේ හිසද සත්කඩකට පැලෙන්නේය. ඉදින් ආයුෂ්මත් ලිච්ඡවි රජුන්ට මෙබඳු සිතක් වන්නේ නම්' අපි පාථිකපුත්‍ර නිගණ්ඨයා වරපටවලින් බැඳ ගොන් බාන්වලින් ඇද එන්නෙමුයයි (අද්ද වන්නාහුද) ඒ වරපටවල් හෝ සිඳී යන්නාහුය. පාථිකපුත්‍රයා හෝ සිඳී යන්නේය. පාථිකපුත්‍ර නිගණ්ඨ තෙමේ ඒ වචනය පහනොකොට ඒ සිත දුරු නොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර මාගේ ඉදිරියට එන්ට නුසුදුසු වන්නේය. ඉදින් ඔහුට මම ඒ වචනය පහනොකොට ඒ සිත පහනොකොට ඒ දෘෂ්ටිය අත්නොහැර ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ඉදිරියට යන්නෙමි යයි සිතී නම් ඔහුගේ හිසද සත්කඩකට පැලෙන්නේයයි' කීමි.

"භාර්ගවය, එකල්හි මම ඒ පිරිසට දැහැමි කථාවෙන් කරුණු දැක්වීමි, දැඩි සේ ගැන්වීමි, සිත් තියුණු කරවීමි, සිත් පැහැදවීමි. ඒ පිරිස දැහැමි කථාවෙන් කරුණු දක්වා සිත් පහදවා මහත්වූ සසර කෙලෙස් බැඳුමෙන් මිදුනවුන් කොට අසූසාර දහසක් ප්‍රාණීන් මහත්වූ සංසාර දුර්ගමාර්ගයෙන් උදුරා නිවන්පුර අද්දර පිහිටුවා තෙජො ධාතු සමාපත්තියට සමවැදී තල්ගස් සතක් පමණවූ අහසට පැන නැග, අනිකුදු තල්ගස් හතක් පමණවූ තැන ගිනිසිළු මවා දල්වා, දුම් පිටකොට, ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා මහාවනයෙහිවූ කූටාගාර ශාලාවට පැමිණ සිටියෙමි.

"භාර්ගවය, එකල වනාහි සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රතෙමේ මම යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, මට වැඳ එකපැත්තක හුන්නේය. භාර්ගවය, එකපැත්තක හුන්නාවූ සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයාට මම මෙසේ කීමි. 'සුනක්ඛත්තය, තෝ කුමක් සිතන්නෙහිද? මම තට පාථික පුත්‍ර නිගණ්ඨයා ගැන යම් පරිද්දෙකින් කීයෙම්ද ඒ විපාකය එසේම වීද? අන් පරිද්දෙකින් වීදැයි' ඇසීමි. 'ස්වාමීන්වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පාථික පුත්‍ර නිගණ්ඨයා ගැන යම් පරිද්දෙකින් ප්‍රකාශ කෙළේද ඒ විපාකය එසේම වූයේය. අන් පරිද්දෙකින්

නොවූයේයයි'කී. 'සුනක්ඛත්තය, තෝ කුමක් සිතන්නෙහිද? ඉදින් මෙසේ ඇති කල්හි මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම කරණ ලද්දේද, නොකරණ ලද්දේද?

"ස්වාමීන්වහන්ස, මෙසේ ඇති කල්හි ඒකාන්තයෙන්ම මනුෂ්‍යධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම කරණ ලද්දේ වේ. නොකරණ ලද්දේ නොවේයැ'යි කී. 'හිස් පුරුෂය, මෙසේද ඇතිකල්හි මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම කරන්නාවූ මට තෝ මෙසේ කියන්නෙහිය. 'ස්වාමීන්වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි දැක්වීම නොකරන්නේමයයි' කියයි. හිස් පුරුෂය, බලව, කෙතරම් මහත් අපරාධයෙක් තා විසින් කරණ ලද්දේදැයි' කීයෙමි.

භාර්ගවය, මෙසේද මා විසින් කියනු ලබන්නාවූ සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ මේ ධර්ම විනය නම්වූ ශාසනයෙන් අපායෙහි ඉපදීමට සුදුසු නිරිසතෙක් එහි යන්නේ යම්සේද එසේම පහවී ගියේයයි' කීවාහුය.

"භාර්ගවය, මම ලොකොත්පත්තිය පිළිබඳ වංශයත් දනිමි. එයින් මතු සර්වඥතාඥානය දක්වා සියල්ලත් දනිමි. එහෙත් මම මෙනම් දේ දනිමියි තෘෂ්ණා දෘෂ්ටි මානයන්ගේ වශයෙන් නොගනිමි. තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් නොගන්නාවූ මා විසින් තමාම, තමා තුළ කෙලෙසුන්ගේ නිවීම දැනගන්නා ලද්දේය. යම් බඳු කෙලෙසුන්ගේ නිවීමක් දන්නාවූ තථාගතවූ බුදුරජ තෙමේ නිවන් නොදත් තීර්ථකයන් මෙන් විනාශයට දුකට නොපැමිණෙන්නේය.

"භාර්ගවය, ඇතැම් මහණ බමුණෝ ඊශ්වරයා විසින් ලොව මවන ලද්දේය. බ්‍රහ්මයා විසින් ලොවමවන ලද්දේයයි ඔවුන්ගේ ආචාර්‍ය්‍ය පරපුරෙන් එන ලොකොත්පත්ති වංශකථාව ප්‍රකාශකරද්දී, මම ඔවුන් කරා පැමිණ මෙසේ කියමි. ආයුෂ්මත්නි, තොපි ඊශ්වරයා විසින් මවන ලද්දේය, බ්‍රහ්මයා විසින් මවන ලද්දේය යන ආචාර්‍ය්‍ය පරපුරෙන් එන ලොකොත්පත්ති වංශකථාව ප්‍රකාශ කරන්නාහුදැ'යි අසමි. මා විසින් මෙසේ

අසනලද ඔව්හු එසේයයි පිළිගන්නාහුය. මම ඔවුන්ට මෙසේ කියමි. "ආයුෂ්මත්නි, තොපි කවරකු විසින් කෙසේ මවන ලද්දේද? ඊශ්වරයා විසින් මවන ලද්දේය, බ්‍රහ්මයා විසින් මවන ලද්දේය ලොකොත්පත්ති වංශකථාව ප්‍රකාශ කරන්නාහුද? මා විසින් අසන ලද්දාවූ ඔව්හු උත්තර දෙන්ට නොහැකි වෙත්. උත්තර දෙන්ට නොහැක්කාහු මාගෙන්ම අසත්. අසන ලද්දාවූ මම ඔවුන්ට මෙසේ ප්‍රකාශ කරමි.

"ඇවැත්නි, මෙබඳු කාලයක් වන්නේමය. බොහෝ දීර්ඝ කාලයක් ඇවෑමෙන් පසු යම්කිසි කලෙක මේ ලොකය විනාශ වන්නේය. ලොකය විනාසවන කල්හි බොහෝ සෙයින් සත්වයෝ ආභස්සර නම් බ්‍රහ්ම ලොකයෙහි උපදින්නාහුය ඔව්හු සිතින් උපන්නාවූ ප්‍රීතිය අනුභව කරමින් ස්වකීය ශරීරාලොක ඇතිව අහසෙහි හැසිරෙන්නෝව මනා කොට සිටින්නාහු ඉතා දීර්ඝකාලයක් වාසය කරත්. ඇවැත්නි, මෙබඳු කාලයෙක් වන්නේමය. දීර්ඝ කාලයක් ඇවෑමෙන් මේ ලෝකය හැදෙන්නේය. ලොකය හැදෙන කල්හි සූන්‍යවූ බ්‍රහ්මවිමානයක් පහළ වන්නේය. එකල වනාහි එක්තරා සත්වයෙක් ආයුෂ ක්ෂයවීමෙන් හෝ පින ක්ෂයවීමෙන් හෝ ආභස්සර බඹ ලොවින් චුතව සූන්‍යවූ බඹ විමනෙහි ඕපපාතිකව උපදින්නේය. හෙතෙමේ එහි සිතින් උපන් ප්‍රීතිය අනුභව කරමින් ශරීරාලොකයෙන් යුක්තව අහස හැසිරෙමින් සුවසේ සිටින්නේ බොහෝ දිගු කලක් (එසේ) සිටින්නේය. එහි හුදකලාව බොහෝ කලක් වසන ඔහුට නොඇල්මක් තැතිගැන්මක් උපදින්නේය. "ඒකාන්තයෙන් තවත් සත්වයෝද මෙහි එන්නාහු නම් ඉතා යෙහෙකැයි" මෙබඳු සිතෙක් වන්නේය. එසේ ඇති කල්හි තවත් සත්වයෝද ආයුෂ ක්ෂයවීමෙන් හෝ පින ක්ෂයවීමෙන් හෝ ආභස්සර බඹලොවින් චුතව සූන්‍යවූ ඒ බ්‍රහ්ම විමානයෙහි ඒ සත්වයා හා සහභාවයට පැමිණ උපදින්නාහුය. ඔව්හුද එහි සිතින් උපන් ප්‍රීතිය අනුභව කරන්නාහු ශරීරාලොකයෙන් යුක්තව, අහස හැසිරෙන ස්වභාව ඇතිව යහපත් සේ සිටින්නෝ බොහෝ කලක් වාසය කරත්.

"ඇවැත්නි, එහි යම් ඒ සත්වයෙක් පළමුව උපන්නේද ඔහුට මෙබඳු සිතෙක් වේ. මම බ්‍රහ්මයා වෙමි. සියල්ල මැඩ පවත්වන්නාවූ මහාබ්‍රහ්මයා වෙමි. කිසිවෙකු විසින් නොමැඩිය හැකිවූ ඒකාන්තයෙන් තමන් වසයෙහි පවත්නාවූ ඊශ්වරවූ ලොක කර්තෘවූ ලොව මවන්නාවූ ශ්‍රෙෂ්ඨවූ සත්වයන්ගේ පියා වෙමි. මා විසින් මේ සත්වයෝ මවන ලදහ. ඊට හේතු කවරේද? මට වනාහි පෙර දවස්හි මෙබඳු සිතෙක් වී. 'ඒකාන්තයෙන් අනිකුදු සත්වයෝ මෙහි එන්නාහු නම් ඉතා යෙහෙකැ'යි (මෙබඳු සිතෙක් වී.) මෙසේ මාගේ සිත්වූ පරිදි මේ සත්වයෝද මේ ආත්මභාවයට ආවාහුයයි (දෘෂ්ටියෙක් ගන්නේය) යම් ඒ සත්වයෝ වනාහි පසුව උපන්නාහුද ඔවුන්ට මෙබඳු සිතෙක් වන්නේය. 'මේ පින්වත් බ්‍රහ්ම තෙමේ මහා බ්‍රහ්මයා වන්නේය. සියල්ල මැඩපවත්වන්නේය. කිසිවෙකු විසින් මැඩිය නොහැක්කේය. ඒකාන්තයෙන් තම වසඟයෙහි පවත්නාවූ ඊශ්වරයාවූ ලෝක කර්තෘ වන්නේය. නිර්මාතෘවූද ශ්‍රෙෂ්ඨවූද තමන් විසින් ජයගත් වසඟකිරීමට පත්වූ සියලු සත්වයින්ගේ පියා වන්නේය. මේ පින්වත් බ්‍රහ්මයා විසින් අපි මවන ලද්දෙමු. ඊට හේතු කවරේද? මෙහි පළමුවෙන් උපන්නාවූ මේ බ්‍රහ්මයා අපි දුටුවෙමු. අපි පසුව උපන්නෝ වෙමුයි.' (කියායි)

"ඇවැත්නි, එහි යම් ඒ සත්වයෙක් පළමුව උපන්නේද ඒ සත්ව තෙමේ ඉතා දික් ආයුෂ ඇත්තෙක්ද වන්නේය. ඉතා වර්ණවත් වූවෙක්ද වන්නේය. ඉතා ආනුභාව ඇත්තේද වන්නේය. යම් ඒ සත්ව කෙනෙක් පසුව උපන්නාහුද ඒ සත්වයෝ ඉතා ස්වල්ප ආයුෂ ඇත්තෝ වන්නාහ. ඉතා දුර්වර්ණයෝද වන්නාහ. ඉතා අල්පානුභාව ඇත්තෝද වන්නාහ. ඇවැත්නි, මේ මතු කියන සේ සිදුවීමට කරුණු ඇත්තේය. කෙසේද යත්? යම් එක්තරා සත්වයෙක් ඒ ආත්මභාවයෙන් චුතව මේ මිනිස්ලොවට එන්නේ වේද, මේ මිනිස් ලොවට පැමිණියේ ගිහි ගෙයින් නික්ම පැවිදි වේද, ගිහි ගෙයින් නික්ම පැවිදි වූයේ කෙලෙස් තවන වීර්‍ය්‍යී වැඩීමෙන් මහත් වීර්‍ය්‍යී වැඩීමෙන් භාවනාවෙහි යෙදීමෙන් අප්‍රමාදයෙන් යහපත් කොට මෙනෙහි කිරීමෙන් යම් බඳු සමාධියක් ලැබූ කල්හි ඒ පෙර විසූ බ්‍රහ්මාත්මය

සිහි කරන්නේද ඉන් මතු සිහි නොකරන්නේද එබඳු චිත්තසමාධියක් ලබන්නේය. හෙතෙමේ මෙසේ කියන්නේය. 'යම් ඒ පින්වත් බ්‍රහ්මයෙක් සියල්ල මැඩ පවත්නාවූ මහා බ්‍රහ්මයෙක් වේද සියල්ලන් විසින් නොමැඩිය හැක්කේද ඒකාන්තයෙන් සියල්ල දන්නේද ඊශ්වර වූයේ සියල්ල තම වසඟයෙහි පවත්නේද ලොක කර්තෘවූ මැවුම්කාරයා වූයේද ශ්‍රෙෂ්ඨවූ සියල්ල දිනීමෙන් වසඟ කළාවූ සියලු සත්වයින්ගේ පියා වූයේද යම් පින්වත් මහා බ්‍රහ්මයෙකු විසින් අපි මවන ලද්දෙමුද ඒ මහා බ්‍රහ්ම තෙමේ නැති නොවන්නේය. (නිත්‍ය වූවෙක් වන්නේය.) ඒකාන්ත සදාකාලික වූවෙක් වන්නේය. නොපෙරළෙන ස්වභාව ඇත්තේ සදාකාලිකයෙක් වූයේම එපරිද්දෙන්ම සිටින්නේය. යම් ඒ අපි වනාහි ඒ පින්වත් බ්‍රහ්මයා විසින් මවන ලද්දෝ වෙමු. ඒ අපි නිත්‍ය නොවන්නෙමු. සදාකාලික නොවන්නෙමු. මඳ ආයු ඇත්තෝ වෙමු. චුතවන ස්වභාව ඇතිව මේ ආත්මභාවයට ආවෝ වෙමුයයි වරදවා ගන්නාහුය.

"ආයුෂ්මත්නි, "ඊශ්වරයා විසින් මවන ලද්දේය. බ්‍රහ්මයා විසින් මවන ලද්දේයයි ලොකොත්පත්ති ආචාර්‍ය්‍ය වාදය පණවන ලද්දේ මෙසේයයි ප්‍රකාශ කරමි. එකල්හි ඔවුහු මෙසේ කියන්නාහුය. 'ඇවැත් ගෞතමයන් වහන්ස, යම් පරිද්දෙකින් ආයුෂ්මත් ගෞතමයන් වහන්සේ කීයේද එපරිද්දෙන්ම අප විසින්ද අසන ලද්දේයයි කියති.

භාර්ගවය, මම ලොකොත්පත්ති වංශ කථාවද දනිමි. ඊට වැඩියෙන් සර්වඥතාඥානය දක්වා සියල්ලක්ද දනිමි. එසේ දන්නාවූ මම දනිමැයි තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් නොගනිමි. තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් නොගන්නාවූ මා විසින් තමන්ම කෙලෙසුන්ගේ නිවීම දැනගන්නාලදී. එසේ දැනගත් තථාගතයන් වහන්සේ වරදවාගත් දෘෂ්ටි ඇති තීර්ථකයන් මෙන් විනාශයට නොපැමිණෙන්නේය.

භාර්ගවය, ඇතැම් මහණ බමුණෝ ඛිඩ්ඩාපදූසික නම් ලොකොත්පත්ති ආචාර්‍ය්‍ය වාදයක් පණවන්නාහුය, මම ඔවුන්

කරා පැමිණ මෙසේ කියමි. 'ඇවැත්නි, ඛිඩ්ඩාපදූසික නම් ලොකොත්පත්ති ආචාර්‍ය්‍ය වාදයක් පණවන්නාහුය යනු සැබෑදැ'යි (අසමි.) මා විසින් අසනලද ඔව්හු එසේයයි පිළිගනිත්. ඔවුන්ට මම මෙසේ ප්‍රකාශ කරමි.

ආයුෂ්මත්වූ තෙපි කෙසේ ඛිඩ්ඩාපදූසික නම් ලොකොත්පත්ති ආචාර්‍ය්‍යවාද පනවන්නාහුදැයි අසමි. මා විසින් අසන ලද්දාවූ ඔව්හු නොදනිත්. නොදත් ඔව්හු මාගෙන්ම අසත්, අසන ලද්දාවූ මම ඔවුන්ට මෙසේ ප්‍රකාශ කරමි.

'ඇවැත්නි, ඛිඩ්ඩාපදූසික නම් දෙව් කොටසක් ඇත්තේය. ඔවුහු බොහෝ වේලාවක් සන්තොෂජනක ක්‍රීඩාවන්හි ඇලී වාසය කරද්ද, වැඩි කාලයක් සතුටු ක්‍රීඩා රතියෙහි යෙදී වාසය කරන්නාවූ ඔවුන්ගේ සිහි මුළාවන්නේය. සිහි මුළාවීමෙන් ඒ දෙවියෝ ඒ දෙව්ලොවින් චුත වන්නාහුය. ඇවැත්නි, යම් හෙයකින් එක්තරා සත්වයෙක් තෙමේ ඒ දෙව් ලොවින් චුතව මේ ආත්මබවට එන්නේද, මේ ආත්ම බවට ආවාවූ හෙතෙමේ ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවේද, ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවූයේ වීර්‍යය වඩා විශෙෂ වීර්‍යය වඩා භාවනාවෙහි යෙදීමෙන් අප්‍රමාදය වඩා යහපත් මෙනෙහි කිරීම හේතුකොටගෙන චිත්ත සමාධියක් (ධ්‍යානයක්) ලබන්නේය. ඒ සමාධි සිතින් ඒ පෙර විසූ ඛිඩ්ඩාපදූසික නම් දිව්‍ය භවය සිහිකරන්නේය. ඉන් මතු සිහි නොකරන්නේය. හෙතෙම මෙසේ කියන්නේය. පින්වත්නි, යම් ඒ ඛිඩ්ඩාපදූසික දෙව් කෙනෙක් වෙද්ද වැඩි වේලාවක් සතුටු ක්‍රීඩා රති ස්වභාවයට නොපැමිණ වාසය කරද්ද වැඩි වේලාවක් සතුටු ක්‍රීඩා රතියෙහි නොයෙදී වාසය කරන්නාවූ ඔවුන්ගේ සිහි මුළාවීමෙක් නොවෙයි. සිහි මුළානොවීම හෙතුකොටගෙන ඒ දෙවියෝ ඒ දෙව්ලොවින් චුත නොවෙත්. නිත්‍යවූ ඒකාන්තවූ සදාකාලිකවූ නොපෙරළෙන ස්වභාව ඇත්තාවූ සදාකාලික වූවන් මෙන් එසේම සිටින්නාහුය.

යම්බඳු වූ අපි ඛිඩ්ඩාපදූසික වූයෙමුද ඒ අපි වැඩි වේලාවක් සතුටු ක්‍රීඩාරතිස්වභාවයෙහි ඇලී වාසය කෙළෙමුද, වැඩි

කාලයක් හාස්‍ය ක්‍රීඩා රතියෙහි යෙදී වාසය කළාවූ, ඒ අපගේ සිහි මුළා විය. සිහි මුළා වීම හේතුකොට මෙසේ අපි ඒ දෙව් ලොවින් චුතව අනිත්‍ය වූවාහු සදාකාලික නුවූවාහු චුතවන ස්වභාවය ඇත්තාහු මේ ආත්මභාවයට පැමිණියෙමු යයි (කියත්.)

ඇවැත්නි, තොපි මෙසේ ඇති කරනලද ඛිඩ්ඩාපදූසික නම් ආචාර්‍ය්‍ය පරම්පරාවෙන් ආ ලොකොත්පත්ති වංශකථාව පනවන්නහුයයි කීයෙමි.

එකල ඔවුහු මෙසේ කීහ. "ඇවැත් ගෞතමයන් වහන්ස, යම්සේ ආයුෂ්මත් ගෞතමයන් වහන්සේ ප්‍රකාශ කෙළේද අප විසින්ද එසේම අසන ලද්දේය"යි කියයි.

භාර්ගවය, මම ලොකොත්පත්ති වංශකථාවත් දනිමි. එයින් මතු සර්වඥතාඥානය දක්වා සියල්ලද දනිමි. මම එසේ දනිමැයි තෘෂ්ණා මාන දෘෂ්ටි වශයෙන් නොගනිමි. එසේ නොගන්නාවූ මා විසින් තමා විසින්ම කෙලෙසුන් නිවීම දැනගන්නා ලදී. එසේ දන්නාවූ තථාගතයන් වහන්සේ විනාශයට නොපැමිණෙන්නේය.

"භාර්ගවය, ඇතැම් මහණ බමුණෝ මනොපදූසික නම් ලොකොත්පත්ති වංශකථාවක් පණවන්නාහුය. මම ඔවුන් කරා පැමිණ, 'ඇවැත්නි, තොපි මනොපදූසික නම් ලොකොත්පත්ති වංසකථාවක් ප්‍රකාශ කරන්නාහුය' යනු හැබෑදැයි අසමි. මා විසින් අසනලද ඔවුහු එසේයයි පිළිගන්නාහ. මම ඔවුන්ට මෙසේ කියමි. ඇවැත්නි, තොපි කුමක් හේතු කොටගෙණ මනොපදූසික නම් ලොකොත්පත්ති වංසකථාවක් ප්‍රකාශ කරන්නාහුදැ'යි අසමි. එසේ ඇසූ කල ඔවුහු උත්තර දෙන්ට නොහැකි වන්නාහුය. උත්තර දෙන්ට නොහැකි වූවාහු මාගෙන්ම අසන්නාහුය. අසනලද්දාවූ මම ඔවුන්ට මෙසේ ප්‍රකාශ කරන්නෙමි.

'ඇවැත්නි, මනොපදූසික නම් දෙවිකෙනෙක් ඇත්තාහ. ඒ දෙවියෝ වැඩි කාලයක් ඔවුනොවුන්ගේ යස ඉසුරු දැක ඉවසිය නොහී කොපාග්නියෙන් ඔවුනොවුන් දෙස බලා හිඳින්නාහ. ඔවුහු වැඩි කාලයක් කොපාග්නියෙන් ඔවුනොවුන් දෙස බලා

හිඳීමෙන් ඔවුනොවුන් කෙරෙහි සිත් දූෂ්‍ය කර ගන්නාහ. ඔවුහු ඔවුනොවුන් කෙරෙහි දූෂ්‍ය සිත් ඇතිව දුර්වලවූ ශරීර හා දුර්වලවූ සිත් ඇත්තෝ වෙත්. ඒ හෙතුකොට ගෙන ඒ දෙවියෝ ඒ දෙව් ලොවින් චුත වන්නාහ. ඇවැත්නි, මේ මතු කියන සේ වීමට හෙතු ඇත්තේය. එක්තරා සත්වයෙක් තෙමේ ඒ දෙව් ලොවින් චුතව මේ ආත්මයට (මිනිසත් බවට) ඒ ද, මිනිසත් බවට ආවාවූ හෙතෙමේ ගිහිගෙන් නික්ම පැවිදි වේද, පැවිදිවූ හෙතෙමේ වීර්යය වඩා විශෙෂ වීර්යය වඩා භාවනාවෙහි යෙදීමෙන් අප්‍රමාදය වඩා යහපත් මෙනෙහි කිරීම හේතු කොටගෙන චිත්ත සමාධියක් (ධ්‍යානයක්) ලබන්නේය. ඒ සමාධිසිතින් පෙර විසූ දෙව් ලොව දකින්නේය. ඉන් මතු නොදක්නේය. හෙතෙමේ මෙසේ කියන්නේය. යම්බඳු ඒ මනොපදූසික දෙව් කෙනෙක් වැඩි කාලයක් ඔවුනොවුන් දෙස කෝපයෙන් නොබලන්නාහුද ඔවුනොවුන් කෙරෙහි සිත් දූෂ්‍ය නොකරන්නාහුද, ඔවුහු දුර්වල නොවූ ශරීර හා සිත් ඇතිව ඒ දෙව්ලොවින් චුත නොවන්නාහ. නිත්‍ය නොපෙරළෙන ස්වභාව ඇති සදාකාලික වූවන් මෙන් එසේම සිටින්නාහ. යම් බඳුවූ අපි මනොපදූසික වූවෙමුද වැඩි වේලාවක් ඔවුනොවුන් දෙස කෝපයෙන් බැලුයෙමුද වැඩි වේලාවක් ඔවුනොවුන් දෙස කෝපයෙන් බැලීමෙන් ඔවුනොවුන් කෙරෙහි දූෂ්‍ය සිත් ඇත්තාහු දුර්වල ශරීර හා සිත් ඇත්තාවූ අපි ඒ දෙව්ලොවින් චුතවූවාහු අනිත්‍ය අස්ථිර ආශාස්වත මද ආයුෂ ඇති චුතවන ස්වභාව ඇත්තාහු මේ මිනිසත් බවට පැමිණියෙමු ය'යි කියති. ආයුෂ්මත්නි, තොපි මෙසේ මනොපදූසික ලොක උත්පත්ති වංශකථාව පණවන්නාහුයයි කියන්නෙමි. ඇවැත් ගෞතමයන් වහන්ස, ආයුෂ්මත් ගෞතමයන් වහන්සේ යම්සේ ප්‍රකාශ කළේද අප විසින්ද එසේම අසන ලද්දේය'යි කියත්.

"භාර්ගවය, මම ලොකොත්පත්ති වංශ කථාවද දනිමි. ඉන් වැඩියක්ද සර්වඥතාඥානය දක්වා දනිමි. එහෙත් මම දනිමැයි තෘෂ්ණාමාන දෘෂ්ටිවශයෙන් නොගනිමි, එසේ නොගන්නා මා විසින් තමාම කෙලෙසුන්ගේ නිවීම දැන ගන්නා ලදී. එසේ දන්නාවූ තථාගත තෙමේ විනාශයට නොපැමිණෙන්නේය.

භාර්ගවය, ඇතැම් මහණ බමුණෝ ලොකය හේතු රහිතව ඉබේම ඇති වූයේයයි 'අධිච්ච සමුප්පන්න' වාදය ස්වකීය ආචාර්ය්‍ය වංශ කථාව කොට ප්‍රකාශ කරති. මම ඔවුන් කරා පැමිණ මෙසේ කියමි. 'ආයුෂ්මත්නි, තොපි ලොකය හේතු රහිතව ඉබේම ඇති වූයේයයි 'අධිච්ච සමුප්පන්න' ලොක උත්පත්ති වංශ කථාවක් ප්‍රකාශ කරන්නහුය යනු සැබෑ දැයි' අසමි. මා විසින් මෙසේ අසනලද්දාවූ ඔවුහු 'එසේය'යි පිළිගන්නාහුය. මම ඔවුන්ට මෙසේ කියමි. 'ඇවැත්නි, තොපි 'අධිච්ච සමුප්පන්න, ලොක උත්පත්ති වංශ කථාව කවර හේතුවකින් පණවන ලද්දාහුදැ'යි අසමි. මා විසින් අසන ලද්දාවූ ඔවුහු උත්තර දෙන්ට නොහැකි වන්නාහුය. උත්තර දෙන්ට නොහැකි වන්නාහු මා අතින්ම අසන්නාහුය. අසන ලද්දාවූ මම ඔවුන්ට මෙසේ ප්‍රකාශ කරන්නෙමි. 'ඇවැත්නි, අසංඥා සත්ව නම් දෙවිකෙනෙක් ඇත්තාහ. සංඥාව හටගැණීමෙන් වනාහි ඒ දෙවියෝ ඒ දෙව්ලොවින් චුත වන්නාහ. ඇවැත්නි, මේ මතු කියන සේ වීමට හේතු, ඇත්තේය. යම් හේතුවකින් එක්තරා සත්වයෙක් ඒ දෙව් ලොවින් චුතව මේ මිනිසත් බවට එන්නේවේද මේ මිනිසත් බවට ආවාවූ හෙතෙමේ ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේද ගිහි ගෙන් නික්ම පැවිදිවූයේ කෙලෙස් තවන වීර්යය වඩා මහත් වීර්යය වඩා භාවනාවෙහි යෙදී අප්‍රමාදය වඩා යහපත් මෙනෙහි කිරීම හේතුකොටගෙන චිත්තසමාධියක් ලබන්නේය. ඒ සමාධියෙන් ඒ සංඥාවගේ පහළවීම දක්නේය. ඉන් මතු නොදක්නේය. හෙතෙමේ මෙසේ කියන්නේය. 'ආත්මයත් ලොකයත් හෙතුප්‍රත්‍ය නැතුව ඉබේම හටගත්තේය'යි කියායි. ඊට හේතු කවරේද? 'මම මීට ප්‍රථම නුවූයේමය. ඒ මම පෙර නොවී මෙකල්හි සත්ව බවට පෙරලී ආයෙමි'යි ප්‍රකාශකරයි. 'ආයුෂ්මත්නි, තොපි වනාහි අධිච්ච සමුප්පන්න වශයෙන් (හෙතු රහිතව ඉබේ හටගැණීමක් කොට) ආචාර්‍ය්‍ය වංශ ලොකොත්පත්තිය ප්‍රකාශ කරන්නාහු මෙබඳු වූවක් ප්‍රකාශ කරන්නාහුයයි කීයෙමි. (එවිට) ඔව්හු මෙසේ කියන්නාහුය. 'ඇවැත් ගෞතමයන් වහන්ස, ආයුෂ්මත් ගෞතමයන් වහන්සේ යම්සේ ප්‍රකාශ කෙළේද අප විසින්ද එසේ අසන ලද්දේය'යි කියායි.

භාර්ගවය, මම ලොකොත්පත්ති වංශයද දනිමි. ඉන් වැඩියක් සර්වඥතාඥානය දක්වා සියල්ලද දනිමි. එහෙත් මම දනිමැයි තෘෂ්ණාමාන දෘෂ්ටීන්ගේ වශයෙන් නොගනිමි. එසේ නොගන්නාවූ මා විසින් තමාම කෙලෙසුන්ගේ නිවීම දැන ගන්නා ලද්දේය. එසේ දන්නාවූ තථාගත තෙමේ විනාශයට නොපැමිණෙන්නේය.

භාර්ගවය, මෙසේ කියන්නාවූ මාහට ඇතැම් මහණ බමුණෝ ශ්‍රමණභවත් ගෞතම තෙමේද භික්ෂූහුද සැබෑනුවූ හිස්වූ බොරු අභූත බස් ප්‍රකාශ කරන්නාහුයයි කියන්නාහ. ‘ශ්‍රමණ භවත් ගෞතම තෙමේද භික්ෂූහුද විපරීත සංඥා ඇත්තෝය. ශ්‍රමණ භවත් ගෞතම තෙමේ මෙසේ කීයේය. යම් කලෙක්හි ශුභ විමොක්ෂයට පැමිණ වාසය කෙරේද ඒ කාලයෙහි සියල්ල අශුභ වශයෙන් දන්නේයයි කිය’යි යනුවෙනි.

“භාර්ගවය, මම එබන්දක් නොකියමි. යම් කලෙක්හි ශුභ විමොක්ෂයට එනම් වර්ණ කසිණධ්‍යානයට එළඹ වාසය කෙරේද ඒ කාලයෙහි සියලු ශුභාශුභයන් අශුභවශයෙන්ම දන්නේ යයි නොකියමි. භාර්ගවය, මම වනාහි මෙසේ කියමි. යම් කාලයෙක්හි ශුභ විමොක්ෂයට හෙවත් වර්ණ කසිණ ධ්‍යානයට පැමිණ වාසය කරයිද, ඒ කාලයෙහි ශුභාරම්මණයම දන්නේයයි කියමි. යම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේට හා භික්ෂූන්ට විපරීතසංඥා ඇත්තෝයයි කියත්ද, ඔව්හුම විපරීතසංඥා ඇත්තෝය. (මෙසේ කීකල භාර්ගව පිරිවැජි තෙමේ කියනුයේ) “ස්වාමීනි, භාග්‍යවතුන්වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම්සේ මම ශුභ විමොක්ෂයට පැමිණ වාසය කරන්නෙම්ද එසේ දහම් දෙසන්ට සමර්ථ වූයේයයි මෙසේ මම භාග්‍යවතුන් වහන්සේට ප්‍රශන්න වූයෙමියි” කීවේය.

“භාර්ගවය, අන්‍ය දෘෂ්ටිකයෙක්වූද, අන් වැටහීමක් ඇත්තා වූද, අන්‍ය රුචිකයෙක් වූද, අන් මතයක් ඇත්තාවූද, අන් ගුරුවරුන් ඇත්තාවූද, තට ශුභවිමොක්ෂයට (වර්ණ කසිණධ්‍යානයට) පැමිණ වාසය කිරීම දුෂ්කර වන්නේමය. එබැවින් භාර්ගවය, තොපගේ මා කෙරෙහි යම් ප්‍රශාදයෙක් වේද ඒ ප්‍රශාදයම තෝ හොඳින් රක්ෂාකරව”යි කීහ.

"ස්වාමීන් වහන්ස, ඉදින් අන්‍ය දෘෂ්ටිකවූද, අන් වැටහීමක් ඇත්තා වූද, අන්‍යරුචික වූද, අන් යෙදීමක් ඇත්තාවූද, අන් ගුරුවරුන් ඇත්තාවූද ඒ මා විසින් ශුභවිමොක්ෂයට පැමිණ වාසය කරන්ට දුෂ්කර වන්නේ නම් ස්වාමීනි, භාග්‍යවතුන්වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි යම්බඳු මාගේ ප්‍රශාදයෙක් වේද, ඒ ප්‍රශාදයම මම හොඳින් ආරක්ෂා කරන්නෙමි"යි කීය.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය දේශනා කළේය. සතුටු සිත් ඇත්තාවූ භාර්ගව ගොත්‍ර පරිබ්‍රාජක තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට විශෙෂයෙන් සතුටු වූයේය.

**පාථික සූත්‍රය නිමි**

---

## 25. උදුම්බරික සීහනාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයෙක භාග්‍යවතුන්වහන්සේ රජගහ නුවර සමීපයෙහිවූ ගිජ්ඣකුළු පව්වෙහි (ගිජ්ජකූට පර්වතයෙහි) වැඩ වාසය කළෝය. එකල්හි නිග්‍රොධ පරිබ්‍රාජක තෙමේ (ශාසනයෙන් පිට මහණවූ අයෙක්) තුන් සියයක් පමණ මහත් පිරිවැජි පිරිසක් සමග උදුම්බරිකා දෙවියගේ පිරිවැජි ආරාමයෙහි වාසය කළේය.

2. එකල්හි සන්ධාන නම් ගෘහපති තෙමේ මධ්‍යාහ්නයෙහි (දවල් කාලයෙහි) භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස රජගහ නුවරින් පිටත් වීය. 'භාග්‍යවතුන් වහන්සේ දැන් චිත්ත විවෙකයෙන් යුක්තව වාසය කරන්නාහ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දැකීමට මේ සුදුසු කාලය නොවෙයි. භාවනානුයොගී භික්ෂූන් වහන්සේලා දැකීමටත් මේ සුදුසු කාලය නොවෙයි. භාවනානුයොගී භික්ෂුහුද චිත්තවිවෙකයෙන් යුක්ත වූවාහුය. එහෙයින් උදුම්බරිකාවගේ පිරිවැජි ආරාමය යම් තැනකද, නිග්‍රොධ පරිබ්‍රාජක තෙමේ යම් තැනකද, මම එහි යන්නෙම් නම් ඉතා යහපතැ' යි සන්ධාන ගෘහපතියාට අදහසෙක් විය.

3. එකල්හි සන්ධාන ගෘහපති තෙමේ උදුම්බරිකාවගේ පිරිවැජි ආරාමය යම් තැනකද, නිග්‍රොධ පරිබ්‍රාජක තෙමේ යම් තැනකද එහි පැමිණියේය. එකල්හි නිග්‍රොධ පරිබ්‍රාජක තෙමේ මහත් පිරිවැජි පිරිස සමග මහහඬින් නොයෙක් විදියේ පහත් කථා කියමින් හුන්නේය. ඒ කෙසේදයත්, රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය, මහාමාත්‍යයන් පිළිබඳ කථාය, සේනාවන් පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද්ධ පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පාන වර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, සයන පිළිබඳ කථාය, මාලාවන් පිළිබඳ කථාය, සුවඳ පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නගර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, සූරයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, නාන තොටවල් පිළිබඳ කථාය, මළගියවුන් පිළිබඳ කථාය, නොයෙක් ආත්ම පිළිබඳ කථාය, ලොකායත ශාස්ත්‍රය පිළිබඳ කථාය, සමුද්‍රයාගේ හටගැනීම පිළිබඳ කථාය, මෙසේ දියුණුව හා පිරිහීම වේය යනාදිය පිළිබඳ කථාය යන (තිර්ශ්චීන) පහත් කථාවෝය.

4. නිග්‍රොධ පරිබ්‍රාජක තෙමේ එන්නාවූ සන්ධාන ගෘහපතියා ඈතදීම දුටුවේය. දැක සිය පිරිස හසුරුවාලීය. ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකවූ සන්ධාන ගෘහපති තෙමේ එයි. "සුදුවත් හඳනාවූ රජගහ නුවර වාසය කරන්නාවූ යම් පමණ ගිහි ශ්‍රාවකයෝ වෙත්ද මේ සන්ධාන ගෘහපති තෙමේ ඔවුන් අතුරෙන් එකෙකි. ආයුෂ්මත්නි, මොව්හු වනාහි නිශ්ශබ්දතාවය කැමැත්තෝය. නිශ්ශබ්ද තාවයෙහි හික්මුණෝය. නිශ්ශබ්දතාවයෙහි ගුණ කියන්නෝය. නිශ්ශබ්ද පිරිසක් බව දැන මෙහි පැමිණිය යුතු කොට සිතන්නේ නම් ඉතා යහපතැ"යි කීය. මෙසේ කී කල්හි පිරිවැජියෝ නිශ්ශබ්ද වූවාහුය.

5. එකල්හි සන්ධාන ගෘහපති තෙමේ නිග්‍රොධ පරිබ්‍රාජකයා යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ නිග්‍රොධ පරිබ්‍රාජකයා සමග සතුටු විය. සතුටු වියයුතු, සිහි කටයුතු කථා කොට නිමවා එක් පැත්තක හුන්නේය. එක් පැත්තකහුන් සන්ධාන ගෘහපති තෙමේ නිග්‍රොධ පරිබ්‍රාජකයාට මෙසේ කීයේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"පින්වත්නි, මේ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ එක් රැස්ව මහ හඬින් යුක්තව උස්ශබ්ද මහත්ශබ්ද ඇත්තාහු නොයෙක් විදියේ (තිරිසන්) පහත් කථාවෙහි යෙදුනාහු වාසය කරත්. ඒ කෙසේදයත්, රජවරුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය, මහාමාත්‍යයන් පිළිබඳ කථාය, සේනාවන් පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද්ධ පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, මාලාවන් පිළිබඳ කථාය, සුවඳ පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නගර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, සූරයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, නාන තොටවල් පිළිබඳ කථාය, මළගියවුන් පිළිබඳ කථාය, නොයෙක් ආත්ම පිළිබඳ කථාය, ලොකායත ශාස්ත්‍රය පිළිබඳ කථාය, සමුද්‍රයේ හටගැනීම පිළිබඳ කථාය, මෙසේ දියුණුව හා පිරිහීම වේය යනාදිය පිළිබඳ කථාය යන (තිරිසන්) පහත් කථාවෝයි. ඒ භාගවත්‍යතුන් වහන්සේ වනාහි අන් පරිද්දකින්ම ස්වල්ප ශබ්ද ඇත්තාවූද, ස්වල්ප ඝොෂා ඇත්තාවූද, ජනවාතයෙන් වෙන්වූ, මිනිසුන්ගේ රහස් කටයුතුවලට යොග්‍යවූ, එකී භාවයට සුදුසුවූ ගම් සීමා ඉක්මවූ දුර වාසස්ථානද, මනුෂ්‍ය වාසසීමා ඉක්මවූ ඉතා දුර වාසස්සාථනද සේවනය කරත්." මෙසේ කී කල්හි නිග්‍රොධ පරිබ්‍රාජක තෙමේ සන්ධාන ගෘපහතියාට මෙසේ කීයේය. "ගෘහපතිය, එසේ නම් ශ්‍රමණ ගෞතම තෙමේ කවරෙකු සමග කථා කරන්නේ දැයි දන්නෙහිද, කවරෙකු සමග සාකච්ඡාවට පැමිණෙන්නේද, කවරෙකු සමග උත්තරයට උත්තර දීමේ ක්‍රමයෙන් නුවණැති බවට පැමිණේද, ශ්‍රමණ ගෞතමයන්ගේ නුවණ වනාන්තරයන්හිදී විනාශ විය. ශ්‍රමණ ගෞතම තෙමේ විශාරද නුවූ බැවින් පිරිස් මැදට පැමිණෙන්ට අසමර්ථය, කථාවෙහි අසමර්ථය, හෙතෙමේ 'කිසිවෙක් මා අතින් ප්‍රශ්න විචාරති'යි ප්‍රශ්නයට බය වූයේ (ගම් කෙළවර) වනයේ දුර සෙනසුන්ම සේවනය කරයි. කිසිවක් ඇඟ වැදේදෝයි බයෙන් අයින් වෙවී යන එකැස් කණ ගවදෙනක් මෙනි. මෙපරිද්දෙන්ම ශ්‍රමණ ගෞතමයන්ගේ නුවණ වනාන්තරයන්හිදී විනාශ විය. ශ්‍රමණ ගෞතම තෙමේ පිරිස් අතර

නොහැසිරෙන්නෙකි. කථාවෙහි අසමර්ථය, හෙතෙමේ දුර වාසස්ථාන සේවනය කරයි.

**6.** එසේ නම් ගෘහපතිය, ශ්‍රමණ ගෞතමයන් මේ පිරිසට පැමිණියොත් එක ප්‍රශ්නයෙන්ම ඔවුන් වෙහෙසට පමුණුවම්හ. ඔහු හිස් කළයක් මෙන් පෙරලා හැම පැත්තෙන්ම නමා බැඳ තබම්හ" කීය. නිග්‍රොධ පරිබ්‍රාජකයා සමග පවත්වන ලද සන්ධාන ගෘහපතියාගේ මේ කථාසංලාපය භාග්‍යවතුන් වහන්සේ අතිශයින් පිරිසිදුවූ, මිනිස් කණ ඉක්මවූ දිවකණින් ඇසූහ. එවිට භාග්‍යවතුන් වහන්සේ ගිජ්ජකූට පර්වතයෙන් බැස, 'සුමාගධා' නම් පොකුණු ඉවුරෙහි මොරනිවාපය (මොනරුන්ගේ අභය ස්ථානය) යම් තැනකද එතනට පැමිණියෝය. පැමිණ, 'සුමාගධා' පොකුණු ඉවුරෙහිවූ මොරනිවාපයෙහි එලිමහනේ සක්මන් කළෝය. නිග්‍රොධ පරිබ්‍රාජක තෙමේ සුමාගධා පොකුණු ඉවුරෙහිවූ මොරනිවාපයෙහි එලිමහනේ සක්මන් කරන භාග්‍යවතුන්වහන්සේ දුටුයේය. දැක පින්වත්නි, නිශ්ශබ්ද වව්, පින්වත්නි, ශබ්ද නොකරව්, මේ ශ්‍රමණ ගෞතම තෙමේ සුමාගධා පොකුණු ඉවුරෙහිවූ මොරනිවාපයෙහි එළිමහනේ සක්මන් කරයි. ඒ ආයුෂ්මත් තෙමේ නිශ්ශබ්දතාවය කැමැත්තේය. නිශ්ශබ්දතාවයේ ගුණ කියන්නෙක. නිශ්ශබ්ද පිරිසක් බව දැන මෙහි පැමිණිය යුතු කොට සිතන්නේය. ඉඳින් ශ්‍රමණ ගෞතම තෙමේ මේ පිරිසට පැමිණියොත් ඉතා යහපතියි තම පිරිස හසුරුවාලීය.

ඉඳින් ශ්‍රමණභවත් ගෞතම තෙමේ මේ පිරිසට එන්නේ නම් 'ස්වාමීනි, යම් ධර්මයකින් භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් හික්මවාද භාග්‍යවතුන් වහන්සේ විසින් හික්මවනලද ශ්‍රාවකයෝ සතුටට පැමිණ තමහට පිහිටවූ මුල් ප්‍රතිපත්තියවූ ආර්‍ය්‍ය මාර්ගයයි යම් ධර්මයක් ප්‍රකාශ කරත්ද භාග්‍යවතුන් වහන්සේගේ ඒ ධර්මය කවරේද යන මේ ප්‍රශ්නය අසන්නෙමුයි කීය. මෙසේ කී කල්හි ඒ පරිබ්‍රාජකයෝ නිශ්ශබ්ද වූවාහුය.

**7** එවිට භාග්‍යවතුන් වහන්සේ නිග්‍රොධ පරිබ්‍රාජක තෙමේ යම් තැනකද එතනට පැමිණියහ. එවිට නිග්‍රොධ පරිබ්‍රාජක

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මෙහි වඩිනු මැනව. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ මේ පැමිණීම යහපත් පැමිණීමකි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ බොහෝ කලකින් මෙහි පැමිණියහ. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්ස, වැඩහිඳිනු මැනව. මේ ආසනය පනවනලදැ'යි කීයේය. පනවනලද ආසනයෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩහුන්නෝය. නිග්‍රොධ පරිබ්‍රාජක තෙමේද එක්තරා මිටි ආසනයක් ගෙන එක පැත්තක හුන්නේය. එකපැත්තක හුන් නිග්‍රොධ පරිබ්‍රාජකයාට භාග්‍යවතුන් වහන්සේ මෙසේ කීහ. නිග්‍රොධය, දැන් තෙපි කවර කථාවකින් යුක්තව හුන්නාහුද, තොප විසින් කවර කථාවක් අතර නවත්වන ලද්දීද? මෙසේ කී කල්හි නිග්‍රොධ පරිබ්‍රාජක තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීයේය.

"ස්වාමීනි, මෙහි අපි 'සුමාගධා' නම් පොකුණු ඉවුරෙහි මොරනිවාපයෙහි එළිමහනේ සක්මන් කරන භාග්‍යවතුන් වහන්සේ දුටුවෙමු. දැක මෙසේ කීවෙමු. "ඉදින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මේ පිරිසට වැඩියොත් උන්වහන්සේ අතින් මේ ප්‍රශ්නය අසන්නෙමු. යම් ධර්මයකින් භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් හික්මවාද භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ධර්මයකින් හික්මවනලද ශ්‍රාවකයෝ සතුටට පැමිණියාහු තමහට නිශ්‍රයවූ-(පිහිටවූ) මුල් ප්‍රතිපත්තියවූ ආයර්‍යමාර්ගයයි යම්ධර්මයක් ප්‍රකාශ කරද්ද, භාග්‍යවතුන් වහන්සේගේ ඒ ධර්මය කවරේද?' යනුයි. ස්වාමීනි, අප විසින් මේ කථාව අතරතුර නවත්වනලදී. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පැමිණියෝය.

"නිග්‍රොධය, අන්‍ය දෘෂ්ටිකවූ, අන්‍ය ලබ්ධිකවූ, වෙනත් බලාපොරොත්තු ඇති අන්‍ය ප්‍රතිපත්තියක පිහිටියාවූ අන්‍ය තීර්ථායතනයක ගුරුවූ තොප විසින්, යම් ධර්මයකින් මම ශ්‍රාවකයන් හික්මවම්ද, යම් ධර්මයකින් මා විසින් හික්මවන ලද ශ්‍රාවකයෝ සතුටට පැමිණියාහු තමහට ආශ්‍රයට සුදුසුවූ මුල් බ්‍රහ්මචාර්‍යාවයයි යම් ධර්මයක් ප්‍රකාශ කරද්ද ඒ ධර්මය නොදත හැක. එසේ හෙයින් නිග්‍රොධය, තෝ ස්වකීය ආචාර්‍යවාදයවූ වීර්යයෙන් පව් පිළිකුල්කිරීම සම්බන්ධව ප්‍රශ්න අසව, "ස්වාමීනි

කෙසේවූ, වීර්යයෙන් පව් පිළිකුල් කිරීමක් සම්පූර්ණවේද කෙසේ අසම්පූර්ණ වේදැයි" අසවයි කීහ.

8 මෙසේ කී කල්හි "පින්වත්නි, යමෙක් ස්වකීය ධර්මක්‍රමය තබා අනුන්ගේ ධර්ම ක්‍රමය ගැන ප්‍රශ්න විචාරවයි පවරන්නේද ඒ ශ්‍රමණගෞතමයන්ගේ මහත්සෘද්ධි ඇති බව, මහත් ආනුභාව ඇති බව ආශ්චර්‍ය්‍යය, අද්භූතය"යි. ඒ පරිබ්‍රාජකයෝ මහත්සේ හඬ නැගූහ. එකල්හි නිග්‍රොධ පරිබ්‍රාජක තෙමේ ඒ පරිබ්‍රාජකයන් නිශ්ශබ්ද කොට භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. ස්වාමීනි, අපි වීර්යයෙන් පව් පිළිකුල් කිරීම කියන්නෝ වමු. වීර්යයෙන් පව් පිළිකුල්කිරීම සාර වශයෙන් ගත්තෝ වමු. වීර්යයෙන් පව් පිළිකුල් කිරීමෙහි ඇලුනාහු වාසය කරමු. ස්වාමීනි, කෙසේවූ වීර්යයෙන් පව් පිළිකුල් කිරීම සම්පූර්ණවේද? කෙසේ නම් අසම්පූර්ණවේදැයි?" ඇසීය. "නිග්‍රොධය, මේ ලෝකයෙහි යහපත් පැවතුම්වලින් මිදුණාවූ කෑම කා අත ලොවින්නාවූ, 'එව වහන්සයයි' කී කල්හි නොපිළිගන්නාවූ, 'සිටුව වහන්සැයි' කී කල්හි නොපිළිගන්නාවූ, එලවන ලද දෙය පිළිනොගන්නාවූ, උදෙසා කරන ලද්ද නොපිළිගන්නාවූ ආරාධනාකොට දුන් දේ නොපිළිගන්නාවූ, නිර්වස්ත්‍ර තාපසයෙක් වෙයි. හෙතෙමේ සැලියෙන් ගත් කෙණෙහි නොපිළිගණියි. සැලිමුවවිටින් නොපිළිගණියි. එළිපත අතර කොට දුන් දෙය නොපිළිගණියි. දණ්ඩක් අතර කොට දුන් දෙය නොපිළිගණියි. මොහොලක් අතර කොට දුන්දෙය නොපිළිගණියි. කෑමකන දෙදෙනකු අතුරෙන් එකෙක් දුන් දෙය පිළිනොගණියි. ගැබිනිය විසින් දුන් දෙය නොපිළිගණියි. කිරිපොවන්නිය විසින් දුන්දෙය නොපිළිගණියි. පුරුෂයකු අතරට ගිය තැනැත්තිය විසින් දුන්දෙය නොපිළිගණියි. සම්මාදම් කළ දෙයින් කිසිවක් නොපිළිගණියි. යම්තැනක බල්ලෙකු පැමිණ සිටියේද ඔහුට නොදී එහිදී දුන්දෙය නොපිළිගණියි. යම්තැනක මැස්සෝ කැටි කැටිව හැසිරෙත්ද එහිදී දුන්දෙය නොපිළිගණියි. දියමස් නොපිළිගණියි. ගොඩ මස් නොපිළිගණියි. සුරාව නොබොයි. මල් ඉස්මෙන් සෑදූ මත්පැන් නොබොයි. කාඩිදිය නොබොයි. ඒ තාපස තෙමේ එකම ගෙයක පිඩු සිඟන්නේ හෝ වෙයි. එකම ආහාර පිඩකින්

යැපෙන්නේ හෝ වෙයි. ගෙවල් දෙකක පිඩු සිඟන්නේ හෝ වෙයි. ආහාර දෙපිඩකින් යැපන්නේ හෝ වෙයි. ගෙවල් සතක පිඩු සිඟන්නේ හෝ වෙයි. ආහාර පිඩු සතකින් යැපෙන්නේ හෝ වෙයි. එක් කුඩා බත්තැටියකින් හෝ යැපෙයි. කුඩා බත් තැටි දෙකකින් හෝ යැපෙයි. කුඩා බත්තැටි සතකින් හෝ යැපෙයි. දවසකට වරක් හෝ ආහාර ගණියි, දෙදවසකට වරක් හෝ ආහාර ගණියි. සත් දවසකට වරක් හෝ ආහාර ගණියි. මෙසේ මෙබඳුවූ අඩමසකට වරක්ද වාරභොජනයෙහි යෙදුනේ වාසය කරයි. හෙතෙමේ අමු පලා කයි. බඩහමු තණ කයි. වී ධාන්‍ය කයි. සම් කැබලි කයි. මැලියම් දිය සෙවෙල් කයි. ධාන්‍ය කුඩු කන්නේ හෝ වෙයි. දඹුබත් (දන්කුඩ) කන්නේ හෝ වෙයි. තල ආදි මුරුවට කන්නේ හෝ වෙයි. තණ කන්නේ හෝ වෙයි. ගොම කන්නේ හෝ වෙයි. වන මුල් ගෙඩි කෑම කොට ඇත්තේ හෝ යැපෙයි. ඉබේ වැටුන ගෙඩි කන්නේ හෝ වෙයි. හෙතෙම හනවැහැරී හෝ හඳී. හනවැහැරී මිශ්‍ර රෙදි හෝ හඳී. මිනියෙන් ඉවත්කළ වස්ත්‍ර හෝ දරයි. පංශුකූල වස්ත්‍ර හෝ දරයි. රුක් පතුරු හෝ දරයි. මැදින් පැලූ අඳුන් දිවිසම් හෝ දරයි. තියඳ වැහැරි හෝ දරයි. පුවරු වැහැරි හෝ දරයි. හිසකේවලින් කළ කම්බිලිද දරයි. කොටිසමින් කළ කම්බිලිද දරයි. බකමුහුණු පිහාටුවලින් කළ වැහැරිද දරයි. කෙස් රැවුල් උගුලන්නේද වෙයි. කෙස්රැවුල් ඉගිලීමෙහි යෙදුනේ ආසන ඉවත් කළේ උඩුකුරුව සිටියේද වෙයි. උක්කුටික වීර්යයෙන් යුක්තවූයේ උක්කුටිකයෙන් සිටින්නේද වෙයි. කටුමත්තේ ගමන් කරන්නේ කටු ඇතිරිමතුයෙහි නිදාගැනීමද කරයි. පුවරු මත්තේ නිදාගැනීමද කරයි. කුඩා තාප්ප උස් බිම් කන්ඩි උඩ නිදාගැනීම කරන්නේද වෙයි.

දූලි දැලි දරන්නේ එක පැත්තට නිදන්නේද වෙයි. එලිමහනේම වෙසෙයි. පළමුව එලූ පරිදිමවූ ආසනයේ හිඳී. අසූචි කෑමෙහි යෙදුනේ අසූචිකෑම කරයි. ඇල්දිය පානය නොකරන්නේ ඇල්දිය පානය නොකරයි. උදේ දවල් සවස යන තුන් වේලෙහි පව්සේදීම පිණිස දියට බැසීමෙහි යෙදී වාසය කරයි. නිග්‍රොධය, නුඹ ඒ කුමකැයි සිතන්නෙහිද? මෙසේ

ඇති කල්හි වීර්යයෙන් පව් දුරුකිරීම සම්පූර්ණ වේද නැතහොත් සම්පූර්ණ නොවේද?"

"ස්වාමීනි, ඒකාන්තයෙන් මෙසේ ඇති කල්හි වීර්යයෙන් පව් දුරුකිරීම සම්පූර්ණ වෙයි අසම්පූර්ණ නොවෙයි."

"නිග්‍රොධය, මෙසේ පරිපූර්ණවූ වීර්යයෙන් පව් දුරු කිරීමෙහි ඇති නොයෙක් උපක්ලේශයන් (කිලුටුවන දේ) මම කියමි."

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ මෙසේ පරිපූර්ණවූ වීර්යයෙන් පව් දුරුකිරීමෙහි නොයෙක් උපක්ලේශයන් (කිලුටු) කෙසේ නම් කියන්නේද?"

**9** "නිග්‍රොධය, මේ ලෝකයෙහි තාපසතෙමේ නිර්වස්ත්‍රව හිඳීම් තපස්කම් සමාදන්වෙයි. හෙතෙමේ ඒ තපස්කමින්ම සතුටු සිත් ඇත්තේ, සම්පූර්ණවූ අදහස් ඇත්තේ වෙයි. නිග්‍රොධය, තාපස තෙමේ යම්කිසි තපසක් සමාදන් වේද, හෙතෙමේ ඒ තපසින් සතුටුසිත් ඇත්තේ සම්පූර්ණවූ අදහස් ඇත්තේ වේද නිග්‍රොධය, මේද තාපසයාගේ උපක්ලේශයෙකි. නිග්‍රොධය, නැවතද අනිකක් කියමි. තාපස තෙමේ තපස්කම් සමාදන් වෙයි හෙතෙමේ ඒ තපසින් තමා උසස් කොටද අන්‍යයන් පහත් කොටද දකී. නිග්‍රොධය, තාපස තෙමේ යම් තපසක් සමාදන් වෙයිද හෙතෙමේ ඒ තපසින් තමා උසස් කොටද අන්‍යයන් පහත්කොටද දකී නම් නිග්‍රොධය, මේද තාපසයාගේ උපක්ලේශයෙකි. නිග්‍රොධය නැවතද අනිකක් කියමි, තාපස තෙමේ තපස්කම් සමාදන් වෙයි. හෙතෙමේ ඒ තපසින් මානයෙන් මත්වෙයි. මුසපත් වෙයි. ප්‍රමාදයට පැමිණෙයි. නිග්‍රොධය, තාපසතෙමේ යම් තපසක් සමාදන් වෙයිද, හෙතෙමේ ඒ තපසින් මානයෙන් මත්වේද, මුසපත් වේද, ප්‍රමාදයට පැමිණේද නිග්‍රොධය, මේද තාපසයාගේ උපක්ලේශයෙකි. නිග්‍රොධය, නැවතද අනිකක් කියමි. තාපස තෙමේ තපස්කම් සමාදන් වෙයි. හෙතෙම ඒ තපසින් ලාභ සත්කාර කීර්තියෙන් සතුටුවූයේ සම්පූර්ණවූ අදහස් ඇත්තේ වෙයි. නිග්‍රොධය, තාපස තෙමේ යම් තපසක් සමාදන්වෙයිද හෙතෙමේ ඒ තපසින් ලාභ

සත්කාර කීර්ති උපදවයිද හෙතෙමේ ඒ ලාභ සත්කාර කීර්ති ඉපදවීමෙන් සතුටුවූයේ සම්පූර්ණවූ අදහස් ඇත්තේ වේද නිග්‍රොධය, මේද තාපසයාගේ උපක්ලේශයෙකි. නිග්‍රොධය, නැවතද අනිකක් කියමි. තාපස තෙමේ තපස්කම් සමාදන් වෙයි. හෙතෙමේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයි. හෙතෙමේ ඒ ලාභ සත්කාර කීර්ති ඉපදවීමෙන් තමා උසස් කොටද අන්‍යයා පහත් කොටද සලකයි. නිග්‍රොධය, තාපස තෙමේ යම් තපසක් සමාදන් වෙයිද හෙතෙමේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයිද, හෙතෙමේ ඒ ලාභ සත්කාර කීර්ති ඉපදවීමෙන් තමා උසස් කොටද අනුන් පහත්කොටද සලකයිද, නිග්‍රොධය, මේද තාපසයාගේ උපක්ලේශයෙකි. (කිලුටෙකි) නිග්‍රොධය, නැවතද අනිකක් කියමි. තාපස තෙමේ තපස්කම් සමාදන් වෙයි. හෙතෙමේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයි. හෙතෙමේ ඒ ලාභ සත්කාර කීර්ති ඉපදවීමෙන් මානයෙන් මත් වෙයි. මුසපත් වෙයි. ප්‍රමාදයට පැමිණෙයි. නිග්‍රොධය, තාපස තෙමේ යම් තපසක් සමාදන් වෙයිද හෙතෙමේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයිද හෙතෙමේ ඒ ලාභ සත්කාර කීර්ති ඉපදවීමෙන් මානයෙන් මත් වෙයිද මුසපත් වෙයිද ප්‍රමාදයට පැමිණෙයිද නිග්‍රොධය, මේද තාපසයාගේ උපක්ලේශයෙකි. නිග්‍රොධය, නැවතද අනිකක් කියමි. නිග්‍රොධය, තාපස තෙමේ තපස්කම් සමාදන් වෙයි. මේ මට ප්‍රියයි මේ මට ප්‍රිය නොවෙයි කියා භොජනය දෙකොටසකට බෙදයි. හෙතෙමේ යමක් තමාට ප්‍රිය නොවෙයිද එය අපේක්ෂා රහිතව දුරු කරයි. යමක් තමාට ප්‍රියද එය තද ආසාවෙන් ගැලී මුසපත්වූයේ අතිශයින් ඇලුනේ දොස් නොදක්නේ, නුවණින් මෙනෙහි කිරීමක් නැතිව ඒ ආහාර අනුභව කරයි.

**10.** නිග්‍රොධය, තාපස තෙමේ යම් තපසක් සමාදන් වෙයිද හෙතෙම ඒ තපසින් ප්‍රිය ආහාර, අප්‍රිය ආහාරයයි ආහාර දෙකොටසකට බෙදයිද හෙතෙම යම් ආහාරයක් අකැමති නම් ඒ ආහාරය අපෙක්ෂා රහිතව දුරු කරයිද යම් ආහාරයක් කැමති නම් එහි ගැලී මුසපත්ව ආදීනව නොදැක පරිභොග කෙරේද නිග්‍රොධය, මෙයද තාපසයාගේ උපක්ලේශයෙකි. (කිලුටෙකි)

11. නිග්‍රොධය, නැවතද අනිකක් කියමි. තාපසතෙමේ ලාභ සත්කාර කීර්ති කැමැත්තේ මට රජවරුද, රාජ මහාමාත්‍යයෝද, ක්ෂත්‍රියයෝද, බ්‍රාහ්මණයෝද, ගෘහපතියෝද, තීර්ථකයෝද, සත්කාර කරන්නාහුයයි තපස්කම් සමාදන් වෙයි. නිග්‍රොධය, මෙයද තාපසයාගේ උපක්ලේශයෙකි (කිලුටෙකි.)

12. නිග්‍රොධය, නැවතද අනිකක් කියමි. මූලබීජය (පැල වෙන මුල්) ඛන්ධබීජය (පැලවෙන කඳන්) ඵළුබීජය (පැල වෙන පුරුක්) අග්ගබීජය (පැලවෙන කරටි) පස්වැනිවූ බීජබීජය (පැලවෙන ඇට) යන මේ කවරක් වුවත් කා දමන සෙනපහරක් වැනි කුළුදත් ඇති මොවුන්ගේ මහණකම කුමක්දැයි වෙනත් ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දොස් නඟන්නේ වෙයි.

13. නිග්‍රොධය, මෙයද තාපසයාගේ උපක්ලේශයෙකි. නිග්‍රොධය, නැවතද අනිකක් කියමි. තාපස තෙමේ කුලයන්හි සත්කාර කරනු ලබන්නාවූ, ගරු කරනු ලබන්නාවූ, බුහුමන් කරනු ලබන්නාවූ, පුදනු ලබන්නාවූ එක්තරා ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු හෝ දකියි. දැක ඔහුට මෙබඳු සිතෙක් වෙයි. බොහෝවූ සිවුපසයෙන් දිවි පවත්වන්නාවූ මොහුට කුලයන්හි සත්කාර කරත්, ගරුකරත්, බුහුමන් කරත්, පූජා කරත්, රළු පැවතුම් ඇති තවුස්වූ මට කුලයන්හි සත්කාර නොකරත්, ගරු නොකරත්, බුහුමන් නොකරත්, නොපුදත්. මෙසේ හෙතෙමේ කුලයන්හි ඊෂ්‍ර්‍යාව හා මසුරුකම උපදවන්නේ වෙයි. නිග්‍රොධය, මෙයද තාපසයාගේ උපක්ලේශයකි.

14. නිග්‍රොධය, නැවතද අනිකක් කියමි. තවුස් තෙමේ මිනිසුන්ට පේන තැන්වල හිඳ තපස්කම් කරයි. නිග්‍රොධය, තාපස තෙමේ මිනිසුන්ට පේන තැන්වල හිඳ තපස්කම් කරයිද මෙයද තාපසයාගේ උපක්ලේශයෙකි.

15. නිග්‍රොධය, නැවත අනිකක් කියමි. තාපස තෙමේ මේ මාගේ තපසයයි මේ මාගේ තාපසයයි තමාගේ ගුණ පෙන්වමින්කුලයන්හි හැසිරෙයි. නිග්‍රොධය, මෙයද තාපසයාගේ උපක්ලේශයෙකි.

16. නිග්‍රොධය, නැවතද අනිකක් කියමි. ඔබට මෙය රුචි දැයි අසන ලද්දේ නොකැමති දෙයට කැමතියයි කියයි. කැමති දෙයට නොකමැතියයි කියමින් අනුන් දැන නොගන්නා සේ කිසියම් වරදක් කරයි. මෙසේ හෙතෙමේ දැන දැන බොරු කියන්නේ වෙයි. නිග්‍රොධය, මෙයද තාපසයාගේ උපක්ලේශයෙකි.

17. නිග්‍රොධය, නැවතද අනිකක් කියමි. තාපස තෙමේ ධර්මය දෙසන්නාවූ තථාගතයන්ගේ හෝ තථාගත ශ්‍රාවකයකුගේ හෝ සතුටු වියයුතු ශාන්තධර්ම ක්‍රමයට සතුටු නොවෙයි. නිග්‍රොධය, මෙයද තාපසයාගේ උපක්ලේශයකි.

18. නිග්‍රොධය නැවත ද අනිකක් කියමි. තාපස තෙමේ ක්‍රොධ කරන්නේ, බද්ධ වෛර ඇත්තේ වෙයි. නිග්‍රොධය තාපස තෙමේ යම් හෙයකින් ක්‍රොධ කරන්නේ බද්ධ වෛර ඇත්තේ වේද මෙයද තාපසයාගේ උපක්ලේශයෙකි.

19. නිග්‍රොධය, නැවතද අනිකක් කියමි. තාපස තෙමේ ගුණමකුවූයේ ගුණවතුන් හා තමා සම කොට සිතන්නේ වෙයි. ඊර්ෂ්‍යා කරන්නේ මසුරුවූයේ වෙයි. කෛරාටිකවූයේ අනුන් රවටන්නේ වෙයි. තද බව ඇත්තේ අධිකමානයෙන් යුක්තවූයේ වෙයි. ලාමක අදහස් ඇත්තේ ලාමක අදහස්වලට වසඟවූයේ වෙයි. වැරදි ඇදහීම් ඇති වූයේ උච්ඡේද දෘෂ්ටියෙන් (සංසාරයක් නැතැයි විස්වාසයෙන්) යුක්තවූයේ වෙයි. ස්වකීය දෘෂ්ටිය ආශ්‍රය කරන්නේ එය දැඩිව අල්ලා ගත්තේ එය දුරලිය නොහැක්කේ වෙයි. නිග්‍රොධය, යම් හෙයකින් තාපස තෙමේ ස්වකීය දෘෂ්ටිය ආශ්‍රය කරන්නේ එය දැඩිව අල්ලාගත්තේ දුරලිය නොහැක්කේවේද නිග්‍රොධය, මෙයද තාපසයාගේ උපක්ලේශයෙකි.

නිග්‍රොධය, ඒ කුමකැයි සිතන්නෙහිද? යම් මේ තපොජිගුච්ඡා (වීර්යයෙන් පව් බැහැර කිරීම්) කෙනෙක් වෙත්ද ඔව්හු උපක්ලේශයෝද නැතහොත් අනුපක්ලේශයෝද? "ස්වාමීනි, එකාන්තයෙන් මේ තපොජිගුච්ඡාවෝ උපක්ලේශයෝය අනුපක්ලේශයෝ නොවෙත්මය."

"ස්වාමීනි මෙසේ වීමට ඉඩ ඇත්තේය. යම් හේතුවකින් ඇතැම් තාපසයෙක් මේ සියලු උපක්ලේශයන්ගෙන් යුක්ත වන්නේය. එක එකකින් යුක්තවීම කියනුම කවරේද?"

"නිග්‍රොධය, මේ ලෝකයෙහි තාපසතෙමේ තපස්කම් සමාදන් වෙයි. හෙතෙමේ ඒ තපසින් සතුටු නොවන්නේ සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. නිග්‍රොධය, තාපස තෙමේ යම් තපසක් සමාදන් වෙයිද හෙතෙමේ ඒ තපසින් සතුටුනොවූයේ සම්පූර්ණ අදහස් ඇත්තේ නොවේද මෙසේ හෙතෙමේ ඒ කාරණයෙහි පිරිසිදු වූවෙක් වෙයි.

**20.** "නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. තාපස තෙමේ තපස්කම් සමාදන් වෙයි. හෙතෙමේ ඒ තපසින් තමා උසස්කොට නොසලකයි. අන්‍යයා හෙලා නොදකියි. නිග්‍රොධය, තාපස තෙමේ යම් තපසක් සමාදන් වෙයිද හෙතෙමේ ඒ තපසින් තමා උසස් කොට නොසලකයිද අන්‍යයා හෙලා නොදකියිද මෙසේ හෙතෙමේ ඒ කාරණයෙහි පිරිසිදු වෙයි.

**21.** "නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. තාපස තෙමේ තපස්කම් සමාදන් වෙයි. හෙතෙමේ ඒ තපසින් මත් නොවෙයි. ක්ලාන්ත නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. නිග්‍රොධය, තාපසතෙමේ යම් තපසක් සමාදන්වේද හෙතෙමේ ඒ තපසින් මත් නොවෙයිද මුසපත් නොවෙයිද ප්‍රමාදයට නොපැමිණෙයිද මෙසේ හෙතෙමේ ඒ කාරණයෙහිදී පිරිසිදු වෙයි.

**22.** නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. තාපස තෙමේ තපස්කම් සමාදන් වෙයි. හෙතෙමේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයි. හෙතෙමේ ඒ ලාභ සත්කාර කීර්ති ඉපදවීමෙන් සතුටුවන්නේ නොවෙයි. සම්පූර්ණකළ අදහස් ඇත්තේ නොවෙයි. නිග්‍රොධය, තාපස තෙමේ යම් තපසක් සමාදන් වෙයිද, හෙතෙමේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයිද, හෙතෙමේ ඒ ලාභ සත්කාර කීර්ති ඉපදවීමෙන් සතුටු නොවන්නේද සම්පූර්ණ කළ අදහස් ඇත්තේ නොවෙයිද මෙසේ හෙතෙමේ ඒ කරුණෙහිදී පිරිසිදු වෙයි.

23 නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. තාපස තෙමේ තපස්කම් සමාදන් වෙයි. හෙතෙමේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයි. හෙතෙමේ ඒ ලාභ සත්කාර කීර්ති ඉපදවීමෙන් තමන් උසස් කොට නොසලකයි. අනුන් හෙලා නොදකියි. නිග්‍රොධය, තාපස තෙමේ යම් තපසක් සමාදන් වෙයිද හෙතෙමේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයිද හෙතෙමේ ඒ ලාභසත්කාර කීර්ති ඉපදවීමෙන් තමා උසස් කොට නොසලකයිද, අනුන් හෙලා නොදකියිද මෙසේ හෙතෙමේ මේ කාරණයේදී පිරිසිදු වේ.

24 නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. තාපස තෙමේ තපස්කම් සමාදන් වෙයි. හෙතෙමේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයි. හෙතෙමේ ඒ ලාභ සත්කාර කීර්ති ඉපදවීමෙන් මානයෙන් මත් නොවෙයි. මුසපත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. නිග්‍රොධය, තාපස තෙමේ යම් තපසක් සමාදන් වෙයිද, හෙතෙමේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයිද, හෙතෙමේ ඒ ලාභ සත්කාර කීර්ති ඉපදවීමෙන් මාන වශයෙන් මත් නොවෙයිද මුසපත් නොවෙයිද, ප්‍රමාදයට නොපැමිණෙයිද මෙසේ හෙතෙමේ ඒ කාරණයෙහිදී පිරිසිදු වෙයි.

25 "නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. තාපස තෙමේ තපස්කම් සමාදන්වෙයි. හෙතෙමේ මේ මට ප්‍රියයි මේ මට ප්‍රිය නොවෙයි කියා කෑම දෙකොටසකට නොබෙදයි. හෙතෙමේ තමාට යමක් ප්‍රිය නොවෙයිද එය බලාපොරොත්තු රහිතව දුරු කරයි. යමක් තමාට ප්‍රියද එය මත් නොවූයේ, මුසපත් නොවූයේ, අතිශයින් නොඇලුනේ, දොස් දක්නාසුලු වූයේ, නුවණින් මෙනෙහි කිරීමෙන් අනුභව කරයිද හෙතෙමේ ඒ කාරණයෙහිදී පිරිසිදු වෙයි.

**26.** නිග්‍රොධය නැවතද අනෙකක් කියමි. තාපසතෙමේ 'මට රජවරුද, රාජ මහාමාත්‍යයෝද, ක්ෂත්‍රියයෝද, බ්‍රාහ්මණයෝද, ගෘහපතියෝද යන මොව්හු සත්කාර කරන්නාහුය'යි තපස්කම් සමාදන් නොවෙයිද, හෙතෙමේ ඒ කාරණයෙහිදී පිරිසිදු වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

27. "නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. "මූලබීජය, ඛන්ධබීජය, ඵලු බීජය, අග්ග බීජය, පස්වැනිවූ බීජ බීජය යන මේ සියල්ල කා දමන හෙන පහරක් වැනි කුළුදත් ඇති මොවුන්ගේ මහණකම කුමක්දැ"යි අනික් ශ්‍රමණයකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දොස් නඟන්නේ නොවෙයිද හෙතෙමේ මෙසේ ඒ කාරණයේදී පිරිසිදු වෙයි.

28. "නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. තාපසතෙමේ කුලයන්හි සත්කාර කරනු ලබන්නාවූ ගරු කරනු ලබන්නාවූ බුහුමන් කරනු ලබන්නාවූ පූජා කරනු ලබන්නාවූ එක්තරා ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු දකී. දැක, ඔහුට මෙසේ නොසිතෙයි. "බොහෝවූ සිවුපසයෙන් දිවි පත්වන්නාවූ මොහුට කුලයන්හි සත්කාර කරත්, ගරු කරත්, බුහුමන් කරත්, පූජා කරත්, රළු පැවතුම් ඇති තාපසයෙක්වූ මට කුලයන්හි සත්කාර නොකරත්, ගරු නොකරත්, බුහුමන් නොකරත්, පූජා නොකරත්ය"යි හෙතෙමේ මෙසේ කුලයන්හි ඊර්ෂ්‍යාව හා මසුරු බව නූපදවයිද, මෙසේ හෙතෙමේ ඒ කාරණයෙහිදී පිරිසිදු වෙයි.

29. "නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. තාපස තෙමේ මිනිසුන්ට පේන තැන්වල තපස්කම් නොකරයිද මෙසේ හෙතෙමේ ඒ කාරණයෙහිදී පිරිසිදු වේ.

30. "නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. තාපස තෙමේ මේ මාගේ තපසයයි, මේ මාගේ තපසයයි, තමාගේ ගුණ පෙන්වමින් කුලයන්හි නොහැසිරේද මෙසේ හෙතෙමේ ඒ කාරණයෙහිදී පිරිසිදු වෙයි.

31. "නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. ඔබට මෙය රුචිදැයි විචාරන ලද්දේ නොකැමති දෙයට හෝ කැමතියයි නොකියයිද, කැමති දෙයට නොකැමතියයි හෝ නොකියයිද සැඟවී කිසිවක් නොකරයිද, මෙසේ හෙතෙමේ දැන දැන බොරු නොකියන්නේ වෙයිද, මෙපරිද්දෙන් හෙතෙමේ ඒ කාරණයෙහිදී පිරිසිදු වෙයි.

32. "නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. තාපස තෙමේ ධර්මය දෙශනා කරන්නාවූ තථාගතයන් වහන්සේගේ හෝ

තථාගත ශ්‍රාවකයකුගේ හෝ සතුටුවිය යුතු ශාන්ත ධර්ම ක්‍රමයට සතුටු වෙයි. මෙසේ හෙතෙමේ ඒ කාරණයෙහිදී පිරිසිදු වෙයි.

33. "නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. තාපසතෙමේ ක්‍රොධ නොකරන්නේ, බද්ධ වෛර නැත්තේ වෙයි. නිග්‍රොධය තාපසතෙමේ යම් හෙයකින් ක්‍රොධ නොකරන්නේ, බද්ධවෛර නැත්තේ වේද හෙතෙමේ ඒ කාරණයෙහිදී පිරිසිදු වෙයි.

34. "නිග්‍රොධය, නැවතද අනෙකක් කියමි. තාපස තෙමේ ගුණමකු නොවූයේ ගුණවතුන් හා තමා සම කොට නොසිතන්නේ වෙයි. ඊර්ෂ්‍යා නැත්තේ මසුරු නොවූයේ වෙයි. කෛරාටික නොවූයේ අනුන් නොරවටන්නේ වෙයි. තදනොවූයේ අධික මාන නැත්තේ වෙයි. ලාමක අදහස් නැත්තේ ලාමක අදහස්වලට වසඟ නොවූයේ වෙයි. වැරදි ඇදහීම් ඇති නොවූයේ උච්ඡේද දෘෂ්ටියෙන් (සංසාරයක් නැතැයි විස්වාස කිරීමෙන්) යුක්ත නොවූයේ වෙයි. දෘෂ්ටිය උසුලා සිටීම නොකරන්නේ එය දැඩිව අල්ලා නොගන්නේ එය ලෙහෙසියෙන් දුරලිය හැක්කේ වෙයි. නිග්‍රොධය, තාපස තෙමේ යම් හෙයකින් ස්වකීය දෘෂ්ටිය උසුලා සිටීම නොකරන්නේ එය දැඩිව අල්ලා නොගන්නේ එය ලෙහෙසියෙන් දුරලිය හැක්කේ වේද හෙතෙමේ ඒ කාරණයෙහිදී පිරිසිදු වෙයි.

"නිග්‍රොධය, නුඹ ඒ කුමකැයි සිතන්නෙහිද, ඉදින් මෙසේ ඇති කල්හි වීර්යයෙන් පව් දුරු කිරීම (තපො ජිගුච්ඡාව) පිරිසිදු වේද? නැතහොත් අපිරිසිදු වේද?"

35. "ස්වාමීනි, එකාන්තයෙන්ම මෙසේ ඇති කල්හි තපොජිගුච්ඡාව පිරිසිදු වන්නේය. අපිරිසිදු නොවන්නේය. උතුම් බවට පැමිණියේද සාර බවට පැමිණියේද වෙයි. "නිග්‍රොධය, මෙපමණකින් තපොජිගුච්ඡාව (වීර්යයෙන් පව් දුරුකිරීම) උතුම් බවට පැමිණියේද සාර බවට පැමිණියේද නොවෙයි. එතකුදු උවත් ගසක සුඹුලක් බවට පැමිණියේය"යි කීහ.

"ස්වාමීනි, කෙසේ නම් තපොජිගුච්ඡාව (වීර්යයෙන් පව් දුරු කිරීම) උතුම් බවටද සාර බවට පැමිණියේ වේද ස්වාමීනි,

භාග්‍යවතුන් වහන්ස, මට තපොජිගුච්ඡාව උතුම් බවටද සාර බවටද පමුණුවා ධර්මය දෙශනා කරනසේක් නම් යහපතියි කීය.”

**36.** “නිග්‍රොධය, මේ ලොකයෙහි තාපස තෙමේ ‘චාතුයාම’ නම් සංවරයෙන් සංවර වූයේ වෙයි. නිග්‍රොධය තාපස තෙමේ කෙසේනම් ‘චාතුයාම’ සංවරයෙන් යුක්තවූයේවේද? නිග්‍රොධය, මේ ලොකයෙහි තාපසතෙමේ ප්‍රාණඝාත නොකරයිද ප්‍රාණඝාත නොකරවයිද ප්‍රාණඝාත කරන්නාහට අනුබල නොදෙයිද, නොදුන් දෙය නොගනියිද නොදුන් දෙය අනුන් ලවා නොගන්වයිද නොදුන් දෙය ගන්නාහට අනුබල නොදෙන්නේද, බොරු නොකියයිද අනුන් ලවා බොරු නොකියවයිද බොරු කියන්නාහට අනුබල නොදෙයිද, පංචකාම සැප සේවනය නොකරයිද අනුන් ලවා පංචකාම සැප සේවනය නොකරවයිද පංචකාම සැප සේවනය කරන්නාහට අනුබල නොදෙන්නේ වෙයිද, නිග්‍රොධය, මෙසේ තාපස තෙමේ චාතුයාම නම් සංවරයෙන් සංවර වූයේ වෙයි. ඔහුගේ තපස් බැව්හි වැඩෙන ස්වභාවය ඇත්තේ වෙයි. සීලය මතුමත්තේ වඩයි. ගිහි බවට නොපැමිණෙයි. හෙතෙමේ වනය, වෘක්ෂ මූලය, පර්වතය, කඳුරැලිය, පර්වත ගුහාය, අෑත වනය, එළිමහන්ය, පිදුරු ගොඩය යන මේ විවේක තැනක් සේවනය කරයි. හෙතෙමේ පිණ්ඩපාතයෙන් හැරී ආයේ දවල් භොජනයෙන් පසු, පසුබත් කාලයෙහි (සවස්කාලයේ) එරමිනිය ගොතා කය කෙලින් තබා සිහි එළවා හිඳගනියි, හෙතෙමේ ආත්ම නම්වූ ලොකයෙහි ආසාව දුරු කොට පහවූ ආසාව ඇති සිතින් වාසයකරයි. ආසාවෙන් සිත පිරිසිදුකරයි. ක්‍රොධයෙන් හටගත් හිතේ අපිරිසිදු භාවය දුරුකොට ක්‍රොධ රහිත සිත් ඇත්තේ වාසය කරයි. සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේ ක්‍රොධයෙන් හටගත් හිතේ අපිරිසිදු භාවයෙන් සිත පිරිසිදු කරයි. අලස භාවය දුරුකොට පහවූ අලස භාවය ඇත්තේ වාසය කරයි. ආලොක සංඥා ඇත්තේ සිහි ඇත්තේ උතුම් ප්‍රඥා ඇත්තේ අලස භාවයෙන් සිත පිරිසිදු කරයි. සිතේ චංචලකම හා පසුතැවීම දුරුකොට නොවිසිර යන සිත් ඇතිව වාසය කරයි. ඇතුළත

සංසිඳුනු සිත් ඇත්තේ සිතේ විසිරයාමෙන් හා පසුතැවීමෙන් සිත පිරිසිදු කරයි. විචිකිච්ඡාව (සැකය) දුරුකොට එතර කළ විචිකිච්ඡා ඇත්තේ වාසය කරයි. කුසල ධර්මයන්හි කෙසේ කෙසේදැයි පැවැති සැකයෙන් සිත පිරිසිදු කරයි. හෙතෙමේ සිත කිලුටු කරන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ පංචනීවරණයන් දුරු කොට මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවෙනි දිසාවද එසේම තුන්වන දිසාවද, සතරවන දිසාවද, උඩ යට සරස යන සෑම තැන සියලු ලොක සත්වයා කෙරෙහි විසාලවූ මහත්ගතවූ අප්‍රමාණවූ අවෛරීවූ, ක්‍රොධ රහිතවූ මෛත්‍රී සහගත සිතින් වාසය කරයි. කරුණා සහගත සිතින්, මුදිතා සහගත සිතින්, උපෙක්ෂා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවෙනි තුන්වෙනි සතරවැනි දිසාද මෙසේ උඩ යට සරස යන සෑම තැන සියලු ලෝක සත්වයා කෙරෙහි විශාලවූ, මහද්ගතවූ අප්‍රමාණවූ ක්‍රොධ නැතිවූ උපෙක්ෂා සහගත සිත පතුරුවා වාසය කරයි. නිග්‍රොධය, ඒ කුමකැයි හඟින්නෙහිද? ඉදින් මෙසේ ඇති කල්හි තපොජිගුච්ඡාව (වීර්යයෙන් පව් දුරුකිරීම) පිරිසිදුද, නැතහොත් අපිරිසිදුද?

"ස්වාමීනි, ඒකාන්තයෙන්ම මෙසේ ඇති කල්හි තපොජිගුච්ඡාව (වීර්යයෙන් පව් දුරුකිරීම) පිරිසිදු වෙයි. අපිරිසිදු නොවෙයි. උතුම් වූයේද, සාර වූයේද වෙයි. "නිග්‍රොධය, මෙපමණකින් තපොජිගුච්ඡාව (වීර්යයෙන් පව් දුරු කිරීම) උතුම් වූයේද සාර වූයේද නොවෙයි. ගසේ පොත්ත වැනි බවට පැමිණියේ වෙයි."

"ස්වාමීනි, කොපමණකින් තපොජිගුච්ඡාව (වීර්යයෙන් පව් දුරු කිරීම) උතුම් බවට පැමිණියේ සාර බවට පැමිණියේ වෙයිද? ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, තපොජිගුච්ඡාව (වීර්යයෙන් පව් දුරුකිරීම) උතුම් බවටද සාර බවටද පමුණුවා ධර්මදෙශනා කරත් නම් යහපති."

37. "නිග්‍රොධය, මේ ලොකයෙහි තාපස තෙමේ චාතුයාම නම් සංවරයෙන් සංවර වූයේ වෙයි. නිග්‍රොධය, කෙසේ නම් තාපස තෙමේ චාතුයාම සංවරයෙන් සංවර වූයේ නම් වේද?

"නිග්‍රොධය, මේ ලොකයෙහි තාපස තෙමේ ප්‍රාණඝාත නොකරයිද, ප්‍රාණඝාත නොකරවයිද, ප්‍රාණඝාත කරන්නාහට අනුබල නොදෙයිද, නොදුන් දෙය නොගනියිද, නොදුන් දෙය අනුන් ලවා නොගන්නවයිද, නොදුන් දෙය ගන්නාහට අනුබල නොදෙන්නේ වෙයිද, බොරු නොකියයිද, අනුන් ලවා බොරු නොකියවයිද, බොරු කියන්නාහට අනුබල නොදෙයිද, පංචකාම සැප සේවනය නොකරයිද, අනුන් ලවා පංචකාම සැප සේවනය නොකරවයිද, පංචකාම සැප සේවනය කරන්නා හට අනුබල නොදෙන්නේ වෙයිද, නිග්‍රොධය, යම් හේතුවකින් තාපස තෙමේ මෙසේ චාතුයාම සංවරයෙන් සංවර වූයේ වෙයි නම් මේද ඔහුගේ තපස් බවෙකි. හෙතෙමේ සීලය මතු මත්තේ වඩයි, ගිහි භාවයට නොපැමිණෙයි,

හෙතෙමේ, වනය, වෘක්ෂමූලය, පර්වතය, කඳුරැලිය, පර්වත ගුහාය, සොහොනය, වනයේ ඈතය, එලිමහන්ය, පිදුරු ගොඩය යන විවේක ස්ථානයක් සේවනය කරයි, හෙතෙමේ පිණ්ඩපාතයෙන් හැරී ආයේ භොජනයෙන් පසු සවස්වරුවේ එරමිනිය ගොතා කය කෙලින් තබා සිහි එළවා හිඳගනියි. හෙතෙමේ ආත්ම නම්වූ ලොකයෙහි ආසාව දුරුකොට පහවූ ආසාව ඇති සිතින් වාසයකරයි. ආසාවෙන් සිත පිරිසිදු කරයි. ක්‍රොධයෙන් හටගත් හිතේ අපිරිසිදු භාවය දුරුකොට ක්‍රොධයෙන් වෙන්වූ සිත් ඇතිව වාසය කරයි. සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේ ක්‍රොධයෙන් හටගත් සිතේ අපිරිසිදු භාවයෙන් සිත පිරිසිදු කරයි. අලසභාවය දුරුකොට පහවූ අලස භාවය ඇතිව වාසය කරයි. ආලොක සංඥා ඇත්තේ සිහි ඇත්තේ උතුම් ප්‍රඥා ඇත්තේ අලස භාවයෙන් සිත පිරිසිදු කරයි. සිතේ විසිරයාම හා පසුතැවීම දුරුකොට සිතේ විසිරයාම හා පසුතැවීම්ද නැත්තේ වාසය කරයි. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ සිතේ විසිරයාම හා පසුතැවීමෙන් සිත පිරිසිදු කරයි. විචිකිච්ඡාව (සැකය) දුරුකොට එතරකළ විචිකිච්ඡා ඇත්තේ වාසය කරයි. කුසල ධර්මයන්හි කෙසේ කෙසේදැයි පැවැති සැකයෙන් සිත පිරිසිදු කරයි.

හෙතෙමේ සිත කිලුටු කරන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ පංච නීවරණයන් දුරුකොට මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවෙනි දිසාවද එසේම තුන්වන දිසාවද, එසේම සතරවන දිසාවද උඩ යට සරස යන සෑම තැන සියලු ලොක සත්වයා කෙරෙහි විසාලවූ, මහත්වූ, අප්‍රමාණවූ, අවෛරීවූ ක්‍රොධ රහිතවූ මෛත්‍රි සහගත සිතින් වාසය කරයි. කරුණාසහගත සිතින් මුදිතා සහගත සිතින් උපෙක්ෂාසහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවෙනි තුන්වෙනි සතරවෙනි දිසාද මෙසේ උඩ යට සරස යන සෑම තැන සියලු ලෝක සත්වයා කෙරෙහි විශාලවූ මහද්ගතවූ අප්‍රමාණවූ ක්‍රොධ නැතිවූ උපෙක්ෂා සහගත සිත පතුරුවා වාසය කරයි.

හෙතෙමේ නානා ප්‍රකාරවූ පූර්වෙනිවාස (පෙර විසූ ජාති පිළිවෙළ) සිහි කරයි. ඒ කෙසේද? ජාති එකක්ද ජාති දෙකක්ද, ජාති තුණක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දශයක්ද, ජාති විස්සක්ද ජාති තිසක්ද ජාති සතළිසක්ද ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් ජාති සිය ගණන්ද, නොයෙක් ජාති දහස් ගණන්ද, නොයෙක් ජාති ලක්ෂ ගණන්ද, නොයෙක් සංවෘත (විනාශ වන) කල්පද, නොයෙක් විවෘත (වැඩෙන) කල්පද, නොයෙක් සංවෘත විවෘත (විනාශවන වැඩෙන) කල්පද, අසුවල් තැන උපන්නෙමි, එතැන්හි මෙනම් ඇත්තේ වීමි. මෙනම් ගොත්‍ර ඇත්තේ වීමි, මෙබඳු වර්ණ ඇත්තේ වීමි, මෙබඳු ආහාර ඇත්තේ වීමි, මෙබඳු දුක් සැප විඳින්නේ වීමි, මෙපමණ ආයු කෙළවර කොට ඇත්තේ වීමි. එයින් චුතවූයේ අසුවල් තැන උපන්නේ වීමි. එහිදු මෙනම් ඇත්තේ මෙබඳු ගොත්‍ර ඇත්තේ මෙබඳු වර්ණ ඇත්තේ, මෙබඳු ආහාර ඇත්තේ, මෙවැනි දුක් සැප විඳින්නේ මෙබඳු ආයු කෙළවර කොට ඇත්තේ වීමි. එයින් චුතවූයේ මෙහි උපන්නෙමියි මෙසේ ආකාර සහිතව, තේරුම් සහිතව නොයෙක් ආකාර පෙර විසූ ජාති පිළිවෙළ සිහි කරයි. නිග්‍රොධය, නුඹ එය කුමකැයි සිතන්නෙහිද? ඉඳින් මෙසේ ඇති කල්හි තපොජිගුච්ඡාව (වීර්යයෙන් පව් දුරුකිරීම) පිරිසිදු වේද? අපිරිසිදුවේද”

38. "ස්වාමීනි, ඒකාන්තයෙන්ම මෙසේ ඇති කල්හි තපොජිගුච්ඡාව (වීර්යයෙන් පව් දුරුකිරීම) පිරිසිදු වෙයි, අපිරිසිදු නොවෙයි. උතුම්ද වෙයි. සාරද වෙයි."

"නිග්‍රොධය, මෙපමණකින්ම තපොජිගුච්ඡාව (වීර්යයෙන් පව් දුරුකිරීම) උතුම්ද සාරද නොවෙයි. එතකුදු වුවත් ගසේ එලය වැනි බවට පැමිණියේ වෙයි."

"ස්වාමීනි, කොපමණකින් වනාහි තපොජිගුච්ඡාව (වීර්යයෙන් පව් දුරුකිරීම) උතුම් බවට පැමිණියේ වේද, සාර බවට පැමිණියේ වේද, ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මට තපොජිගුච්ඡාව (වීර්යයෙන් පව් දුරුකිරීම) උතුම් බවටද සාර බවටද පමුණුවා ධර්මදෙශනා කරණසේක් නම් යහපති."

39. "නිග්‍රොධය, මේ ලොකයෙහි තාපස තෙමේ චාතුයාම සංවරයෙන් සංවර වූයේ වෙයි. නිග්‍රොධය තාපස තෙමේ කෙසේනම් චාතුයාම සංවරයෙන් යුක්තවූයේ වේද? නිග්‍රොධය, මේ ලොකයෙහි තාපස තෙමේ ප්‍රාණඝාත නොකරයිද ප්‍රාණ ඝාත නොකරවයිද ප්‍රාණඝාත කරන්නාහට අනුබල නොදෙයිද, නොදුන් දෙය නොගනියිද නොදුන් දෙය අනුන් ලවා නොගන්වයිද නොදුන් දෙය ගන්නාහට අනුබල නොදෙන්නේද, බොරු නොකියයිද, අනුන් ලවා බොරු නොකියවයිද, බොරු කියන්නාහට අනුබල නොදෙයිද, පංචකාම සැප සේවනය නොකරයිද, අනුන් ලවා පංචකාම සැප සේවනය නොකරයිද, පංච කාමසැප සේවනය කරන්නාහට අනුබල නොදෙන්නේ වෙයිද, නිග්‍රොධය, මෙසේ තාපස තෙමේ චාතුයාම සංවරයෙන් සංවර වූයේ වෙයි. ඔහුගේ තපස් බැව්හි වැඩෙන ස්වභාවය ඇත්තේ වෙයි. සීලය මතුමත්තේ වඩයි. ගිහිභාවයට නොපැමිණෙයි.

40. හෙතෙමේ වනය, වෘක්ෂමූලය, පර්වතය, කඳුරැලිය, පර්වත ගුහාය, සොහොනය, වනයේ ඈතය, එළිමහන්ය, පිදුරුගොඩය යන විවේක ස්ථානයක් සේවනය කරයි. හෙතෙමේ පිණ්ඩපාතයෙන් හැරී ආයේ සවස්වරුවෙහි එරමිනියා ගොතා කය කෙළින් තබා සිහිඑළවා හිඳගනියි. හෙතෙමේ ආත්ම නම්වූ

ලොකයෙහි ආසාව දුරුකොට පහවූ ආසාව ඇතිව සිතින් වාසය කරයි. ආසාවෙන් සිත පිරිසිදු කරයි. ක්‍රොධයෙන් හටගත් හිතේ අපිරිසිදු භාවය දුරුකොට ක්‍රොධයෙන් වෙන්වූ සිත් ඇත්තේ වාසය කරයි. සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේ ක්‍රොධයෙන් හටගත් සිතේ අපිරිසිදු භාවයෙන් සිත පිරිසිදු කරයි. අලසභාවය දුරුකොට පහවූ අලසභාවය ඇත්තේ වාසය කරයි. ආලොක සංඥා ඇත්තේ සිහි ඇත්තේ උතුම් ප්‍රඥා ඇත්තේ අලසභාවයෙන් සිත පිරිසිදු කරයි. නොසන්සුන්කම හා පසුතැවීම දුරුකොට නොසන්සුන්කම නැත්තේ වාසය කරයි. ඇතුලත සංසිඳුනු සිත් ඇත්තේ නොසන්සුන්කම හා පසුතැවීමෙන් සිත පිරිසිදු කරයි. විචිකිච්ඡාව (සැකය) දුරුකොට එතර කළ විචිකිච්ඡා ඇත්තේ වාසයකරයි. කුසල ධර්මයන්හි කෙසේ කෙසේදැයි පැවති සැකයෙන් සිත පිරිසිදු කරයි. හෙතෙමේ හිත කිලුටුකරන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ පංචනීවරණයන් දුරුකොට මෛත්‍රී සහගත සිතින් එක්දිසාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවෙනි දිසාවද එසේම තුන්වන දිසාවද එසේම සතරවන දිසාවද උඩ යට සරස යන සැමතැන සියලු ලොක සත්වයා කෙරෙහි විශාලවූ අප්‍රමාණවූ අවෛරීවූ ක්‍රොධ රහිතවූ මෛත්‍රි සහගත සිතින් වාසය කරයි. කරුණා සහගත සිතින්, මුදිතා සහගත සිතින්, උපෙක්ෂා සහගත සිතින්, එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවෙනි තුන්වැනි සතරවැනි දිසාද මෙසේ උඩ යට සරස යන සෑම තැන සියලු ලෝක සත්වයා කෙරෙහි විශාලවූ, මහත්ගතවූ, අප්‍රමාණවූ ක්‍රොධ නැතිවූ හිංසා රහිතවූ උපෙක්ෂා සහගත සිත පතුරුවා වාසය කරයි. හෙතෙමේ නානාප්‍රකාරවූ පූර්වෙනිවාසය සිහිකරයි. ඒ කෙසේද? ජාති එකක්ද, ජාති දෙකක්ද, ජාති තුණක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දශයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් ජාති සිය ගණන්ද, නොයෙක් ජාති දහස් ගණන්ද, නොයෙක් ජාති ලක්ෂ ගණන්ද, නොයෙක් සංවෘත (විනාශ වන) කල්පද, නොයෙක් විවෘත (වැඩෙන) කල්පද, නොයෙක් සංවෘත විවෘත (විනාශවන

පටුන



වැඩෙන) කල්පද, අසුවල් තැන උපන්මි, එතැන්හි මෙනම් ඇත්තේ වීමි. මෙනම් ගොත්‍ර ඇත්තේ වීමි, මෙබඳු වර්ණ ඇත්තේ වීමි, මෙබඳු ආහාර ඇත්තේ වීමි, මෙබඳු දුක් සැප විඳින්නේ වීමි, මෙපමණ ආයු කෙළවර කොට ඇත්තේ වීමි. එයින් චුත වූයේ අසුවල් තැන උපන්නේ වීමි. එහිදු මෙනම් ඇත්තේ මෙබඳු ගොත්‍ර ඇත්තේ මෙබඳු වර්ණ ඇත්තේ, මෙබඳු ආහාර ඇත්තේ, මෙවැනි දුක් සැප විඳින්නේ මෙබඳු ආයු කෙළවර කොට ඇත්තේ වීමි. එයින්ද චුතවූයේ මෙහි උපන්නෙමියි මෙසේ ආකාර සහිතව, තේරුම් සහිතව අනෙක ප්‍රකාර පූර්වෙනිවාසානුස්මෘතිය (පෙර විසූ ජාති පිළිවෙළ) සිහි කරයි.

හෙතෙමේ පිරිසිදුවූ මිනිස්ඇස ඉක්මෙව්වාවූ දිව්‍යඥානයෙන් චුත වන්නාවූද, උපදින්නාවූද, හීනවූද, උසස්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණවූද, යහපත් ගති ඇත්තාවූද, නපුරු ගති ඇත්තාවූද, කම්වූ පරිදි මිය පරලොව යන්නාවූද, සත්වයන් දැනගනී. "පින්වත්නි, මේ සත්වයෝ ඒකාන්තයෙන් කයින් කරන දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වචනයෙන් කරන දුශ්චරිතයෙන් යුක්තවූවාහු, සිතින් කරන දුශ්චරිතයෙන් යුක්තවූවාහු, ආර්යයන්ට දොස් කියන්නාහු, වැරදි ඇදහීම් ඇතිවූවාහු, මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවාහු ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු දුර්ගති නම්වූ විනාසයට පැමිණෙන්නාවූ නිරයෙහි උපන්නාහ. පින්වත්නි මේ සත්වයෝ වනාහි කයින් කරන සුචරිතයෙන් යුක්තවූවාහු, වචනයෙන් කරන සුචරිතයෙන් යුක්තවූවාහු, සිතින් කරන සුචරිතයෙන් යුක්තවූවාහු, ආර්යයන්ට දොස් නොකියන්නාහු සත්‍යවූ දැකීම් ඇත්තාහු, සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදන් වූවාහු ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපන්නාහුය"යි දකී.

41 "නිග්‍රොධය, ඒකුමකැයි සිතන්නෙහිද? ඉදින් මෙසේ ඇති කල්හි තපොජිගුච්ඡාව (වීර්යයෙන් පව් දුරුකිරීම) පිරිසිදු වේද? අපිරිසිදු වේද?" "ස්වාමීනි, ඒකාන්තයෙන්ම මෙසේ ඇති කල්හි තපොජිගුච්ඡාව පිරිසිදු වෙයි. අපිරිසිදු නොවෙයි. උතුම් වූයේද සාර වූයේද වෙයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"නිග්‍රොධය, මෙපමණකින්ම තපොජිගුච්ඡාව උතුම් වූයේද සාර වූයේද වෙ"යි

"නිග්‍රොධය, යම් ධර්මයකින් භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් හික්මවයිද භාග්‍යවතුන් වහන්සේ විසින් හික්මවනලද ඒ ශ්‍රාවකයෝ අස්වැසීමට පැමිණ යම් ධර්මයක් ආර්‍ය්‍ය මාර්ගයට මුල්වේයයි ප්‍රකාශ කරද්ද ඒ ධර්මය කුමක්දැයි යන මෙය තා විසින් මා අතින් විචාරණ ලද්දේය. මම යම් ධර්ම ක්‍රමයකින් ශ්‍රාවකයන් හික්මවම්ද, මා විසින් යම් ධර්ම ක්‍රමයකින් හික්මවන ලද ශ්‍රාවකයෝ අස්වැසීමට පැමිණ යම් ධර්මයක් ආර්‍ය්‍යමාර්ගයට මුල්වේයයි ප්‍රකාශ කරද්ද, ඒ ධර්මක්‍රම මෙසේ ඉතා උතුම්ද ඉතා ප්‍රණීතද වෙයි." මෙසේ කී කල්හි "මේ කාරණයෙහිලා ආචාර්‍ය්‍යයන් වහන්සේ සහිත අප නැසෙමු. ආචාර්‍ය්‍යයන් වහන්සේ සහිත අපි විනාශවෙමු. අපි මීට වඩා අතිශයින් උතුම් ධර්මයක් නොදනිමුයි" කියා ඒ පරිබ්‍රාජකයෝ මහත්සේ ශබ්ද නැගූහ.

**42.** "සන්ධාන ගෘහපති තෙමේ, දැන් එකාන්තයෙන් මේ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ භාග්‍යවතුන් වහන්සේගේ වචනය මනා කොට අසත්. එයට කන් නමත්. අවබොධ කිරීමේ සිත එළවත්යයි යම් අවස්ථාවක දැනගත්තේද, එකල්හි හෙතෙමේ නිග්‍රොධ පරිබ්‍රාජකයාට මෙසේ කීයේය. "වහන්ස නිග්‍රොධය, ඔබ මට මෙසේ කීයේ නොවේද, "එසේ නම් ගෘහපතිය දැන ගන්න. ශ්‍රමණ ගෞතම තෙමේ කරවකු හා කථාබස් කෙරේද? කවරකු හා කථාකෙරේද? කවරකු හා කථාකර උත්තරයට උත්තර දීමෙන් සමත් බවට පැමිණේද? ශ්‍රමණ ගෞතමයන් බෝමුලදී ලත් නුවණ වනාන්තරයෙහි තනිව විසීමෙන් විනාශ වීය. ශ්‍රමණ ගෞතම තෙමේ විශාරද බවක් නැති බැවින් පිරිසට පැමිණීමට අසමර්ථය. කිසිවකු තමන් අතින් ප්‍රශ්න අසතිය යන බියෙන් ගම් කෙළවර වාසස්ථාන සේවනය කරයි. කිසිවක් ඇඟ වැද්දෝයි බියෙන් අයින් වෙවී යන එකැස් කණ ගවදෙනක් මෙනි. එපරිද්දෙන් ශ්‍රමණ භවත් ගෞතම යන්ගේ ප්‍රඥාව වනාන්තරයෙහිදී නැසුණීය.

ශ්‍රමණ ගෞතම තෙමේ පිරිස්හි නොහැසිරෙන්නෙකි. කථා බස් කිරීමට සුදුසු නොවෙයි. හෙතෙමේ ගම්හි වාස ස්ථාන සේවනය නොකරයි. ගෘහපතිය, එසේ නම් ශ්‍රමණ ගෞතම තෙමේ මේ පිරිසට පැමිණියොත් එක ප්‍රශ්නයෙන්ම කට පියවන්නමු. ඔහු හිස් කලයක් මෙන් පෙරළන්නෙමු”යි කීයෙහිය.’

“ස්වාමීනි, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ මේ භාග්‍යවතුන් වහන්සේ මෙහි පැමිණියෝය. උන්වහන්සේ පිරිස්හි නොහැසිරෙන්නෙක් කරව්. අයින් වෙවී යන එකැස් ගවදෙනක් මෙන් කරව්. එකම ප්‍රශ්නයෙන් උන්වහන්සේගේ කට පියවාලව්. හිස් කලයක් මෙන් යටිකුරු කොට පෙරලව්”යයි කීය. මෙසේ කී කල්හි නිග්‍රෝධ පරිබ්‍රාජක තෙමේ තුෂ්ණිම්භූත වූයේ (නිශ්ශබ්ද වූයේ) තේජස් රහිත භාවයට පැමිණියේ බෙල්ල නවාගත්තේ බිම බලා ගත්තේ කල්පනා කරන්නේ කිසිවක් නොවැටහෙන්නෙක්ව හුන්නේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණිම්භූතවූ තේජස් රහිතවූ, කරබාගත්තාවූ බිම බලාගත්තාවූ, කල්පනා කරන්නාවූ, කිසිවක් නොවැටහෙන්නාවූ නිග්‍රෝධ පරිබ්‍රාජකයා දැක ඔහුට මෙසේ කීහ. “නිග්‍රෝධය තා විසින් මෙසේ කියන ලද්දේය යනු සැබෑද?”

“ස්වාමීනි, බාලයකු විසින් යම්සේද, මුළාවූවකු විසින් යම්සේද, අදක්ෂයකු විසින් යම්සේද එසේ මා විසින් කියන ලද බව සැබෑය”යි කීය.

43. “නිග්‍රෝධය, තෝ වෘද්ධවූ, මහළුවූ ගුරුවරයින්ගේ ගුරුවරවූ පරිබ්‍රාජකයන්ගෙන්, අතීත කාලයෙහි විසූ අර්හත් සම්‍යක් සම්බුද්ධවරයෝ එක්ව මෙවැනි නොයෙක් තිර්ශ්චීන කථාවල යෙදී විසුවාහුයයි අසා ඇත්තේද? ඒ කථා කවරහුද? රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය, මහාමාත්‍යයන් පිළිබඳ කථාය, සේනාවන් පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද්ධය පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පාන වර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, ඇඳන් පිළිබඳ කථාය, මාලාවන් පිළිබඳ කථාය, සුවඳ පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය,

නගර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, දියුණුව නොදියුණුව පිළිබඳ කථා ආදි තිරශ්චීන (පහත්) කථා මහ හඬින් පවත්වමින් වාසය කළාහුය කියාද, නැතහොත් දැන් මා මෙන් ඒ අතීත කාලයෙහි විසූ බුදුවරු, ස්වල්ප ශබ්ද ඇත්තාවූ මහජන ඝොෂාවෙන් වෙන්වූ ජනයාගේ වාතයෙන් වෙන්වූ, මිනිසුන්ගේ රහස් කටයුතුවලට යොග්‍යවූ, වනයෙහි දුර වාසයකරන ස්ථාන සේවනය කළාහුය"යි කියා අසා ඇත්තේද?

44. "ස්වාමීනි, පරිබ්‍රාජකවූ, වෘද්ධවූ, මහළුවූ මාගේ ගුරුවරයින්ගේ ගුරුවරයන්ගෙන් "අතීත කාලයෙහි විසූ අර්හත් සම්‍යක් සම්බුද්ධවරයෝ අප මෙන් රාජකථාය, චොරකථාය, පුරුෂයන් පිළිබඳ කථාය, සූරයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, නාන තොට පිළිබඳ කථාය, පූර්ව ප්‍රෙතයන් පිළිබඳ කථාය, නොයෙක් ආත්ම පිළිබඳ කථාය, ලොකායත ශාස්ත්‍රය පිළිබඳ කථාය, සත්වයන්ගේ හටගැනීම පිළිබඳ කථාය, දියුණුව නොදියුණුව පිළිබඳ කථා ආදි තිරශ්චීන (පහත්) කථා මහ හඬින් පවත්වමින් වාසය නොකළාහුය. ඒ අතීත කාලයෙහිවූ බුදුවරු දැන් ඔබවහන්සේ මෙන් ස්වල්ප ශබ්ද ඇත්තාවූ, මහජන ඝොෂාවෙන් වෙන්වූ, ජනයාගේ වාතයෙන් වෙන්වූ, මිනිසුන්ගේ රහස් කටයුතුවලට යොග්‍යවූ තනිව වාසයට යොග්‍යවූ වනයෙහි දුර වාසස්ථාන සේවනය කළාහුය"යි කියනුවා අසා ඇත්තෙමි.

"නිග්‍රොධය නුවණැත්තාවූ, සිහි ඇත්තාවූ, මහළුවූ යුෂ්මතුන්ට මෙබඳු අදහසක් නොවූයේද, "චතුස්සත්‍යය අවබොධ කළ ඒ භාග්‍යවතුන් වහන්සේ අනුන්ට එය අවබොධ කරවීම පිණිස ධර්මය දෙශනාකරති. දැමුණු ඉන්ද්‍රිය ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ අනුන්ගේ ඉන්ද්‍රිය දමනය පිණිස ධර්මදෙශනා කරති. ශාන්තවූ ඒ භාග්‍යවතුන් වහන්සේ අනුන්ගේ ශාන්තවීම පිණිස ධර්මදෙශනා කරති. සසරින් එතරවූ ඒ භාග්‍යවතුන් වහන්සේ අන්‍යයා සසරින් එතරවීම පිණිස ධර්මදෙශනා කරති. කෙළෙස් ගිනි නිවාගත් ඒ භාග්‍යවතුන් වහන්සේ අනුන්ගේ කෙළෙස් ගිනි නිවනු පිණිස ධර්මදෙශනා කරති" කියා අදහස් නොවූයේද?

මෙසේ කී කල නිග්‍රොධ පරිබ්‍රාජක තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "ස්වාමීනි, බාලයකු, මෝඩයකු

අදක්ෂයකු කරා වරද යම්සේ පැමිණේද, එසේ වරද මා කරා පැමිණියේය. ඒ මම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවෙමි. ස්වාමීනි, මතු සංවරය (හික්මීම) පිණිස ඒ මාගේ වරද, වරද වශයෙන් පිළිගන්නා සේක්වා.”

“එසේ නම් නිග්‍රොධය, බාලයකු, මෝඩයකු, අදක්ෂයකු කරා වරද යම්සේ පැමිණේද එසේ යම්බඳුවූ ඔබ මෙසේ වරද කීයෙහිද, එසේ කීමෙන් වරද වැරදිකරුවූ ඔබ වෙත පැමිණියේය. නිග්‍රොධය, යම් තැනක පටන් ඔබ වරද වරද වශයෙන් දැක ධර්මයවූ පරිදි පිළියම් කරන්නෙහිද, ඔබගේ ඒ වරද අපි පිළිගණිමු. නිග්‍රොධය, යමෙක් වරද වරද වශයෙන් දැක ධර්මයවූ පරිදි පිළියම් කෙරේද ඉන්මතු සංවරයට (හික්මීමට) පැමිණේද එය ආර්‍ය්‍ය විනයෙහි වැඩීමක්මය.

**46.** “නිග්‍රොධය, මම වනාහි මෙසේ කියමි. “කෛරාටික නොවූ’ මායා නැත්තාවූ, ඍජු ස්වභාව ඇත්තාවූ නුවණැති පුරුෂ තෙමේ මා වෙත පැමිණේවා, මම අනුශාසනා කරමි. මම ධර්මදෙශනා කරමි. අනුශාසනා පරිදි පිළිපදින්නේ ‘කුල පුත්‍රයෝ යමක් සඳහා ගිහි ගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද ඉතා උතුම්වූ බ්‍රහ්මචර්‍ය්‍යය කෙළවර කොට ඇති ඒ අර්හත් ඵලය මේ ආත්මයෙහිදීම තමා ඉතා උසස් ඥානයෙන් දැන සත්වසක් තුළදී ඊට පැමිණ වාසය කරන්නේය. නිග්‍රොධය, සත් වස තිබේවා. කෛරාටික නොවූ, මායා නැත්තාවූ, ඍජු ස්වභාව ඇත්තාවූ නුවණැති පුරුෂ තෙමේ මා වෙත පැමිණේවා! මම අනුශාසනා කරමි. මම ධර්මදෙශනා කරමි. අනුශාසනා පරිදි පිළිපදින්නේ, කුලපුත්‍රයෝ යමක් සඳහා ගිහි ගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද නිරුත්තරවූ බ්‍රහ්මචර්‍ය්‍යය කෙළවර කොට ඇති ඒ අර්හත් ඵලය මේ ආත්මයෙහිදීම තමා ඉතා උසස් ඥානයෙන් දැන සය වසක් තුළදී ඊට පැමිණ වාසය කරන්නේය. පස්වසක්, සිවුවසක්, තුන්වසක්, දෙවසක්, එක්වසක් තුළදී ඊට පැමිණ නාසය කරන්නේය. නිග්‍රොධය එක් වසක් තිබේවා. කෛරාටික නොවූ, මායා නැත්තාවූ, ඍජු ස්වභාව ඇති නුවණැත්තාවූ පුරුෂ තෙමේ මා වෙත පැමිණේවා, මම

අනුශාසනා කරමි. මම ධර්මදෙශනා කරමි. අනුශාසනා පරිදි පිළිපදින පුද්ගල තෙමේ, කුල පුත්‍රයෝ යමක් සඳහා ගිහි ගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද ඉතා උතුම්වූ බ්‍රහ්මචර්‍ය්‍යය කෙළවර කොට ඇති ඒ අර්හත් ඵලය මේ ආත්මයෙහිදීම තමා විශිෂ්ට ඥානයෙන් දැන සත්මසක් තුළදී ඊට පැමිණ වාසය කරන්නේය. නිග්‍රොධය, සත්මසක් තිබේවා. සය මසක්, පස් මසක්, සිවු මසක්, තුන් මසක්, දෙමසක්, එක් මසක්, අඩ මසක් තුළදී ඊට පැමිණ වාසය කරයි. නිග්‍රොධය අඩමස තිබේවා. කෛරාටික නොවූ, මායා නැත්තාවූ, ඍජු ස්වභාව ඇති නුවණැත්තාවූ පුරුෂ තෙමේ මා වෙත පැමිණේවා, මම අනුශාසනා කරමි. මම ධර්මදෙශනා කරමි. අනුශාසනා පරිදි පිළිපදින පුද්ගල තෙමේ, කුල පුත්‍රයෝ යමක් සඳහා ගිහි ගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද ඉතා උතුම්වූ බ්‍රහ්මචර්‍ය්‍යය කෙළවර කොට ඇති ඒ අර්හත් ඵලය මේ ආත්මයෙහිදීම තමා ඉතා උසස් ඥානයෙන් දැන සත් දවසක් තුළදී ඊට පැමිණ වාසය කරන්නේය.

47. නිග්‍රොධය, නුඹට මෙබඳු අදහසෙක් වන්නේය. 'අප අතවැස්සන් කරනු කැමැත්තෙන් ශ්‍රමණ ගෞතම තෙමේ මෙසේ කියන්නේය' යන අදහසයි. නිග්‍රොධය, මේ කාරණය එසේ නොදත යුතු. යමෙක් ඔබගේ ගුරු වේද, ඔහුම ඔබගේ ගුරු වේවා. නිග්‍රොධය, නුඹට මෙබඳු අදහසක් වන්නේය. 'ශ්‍රමණ ගෞතම තෙමේ අප ඉගෙනීමෙන් ඉවත් කරනු කැමැත්තේ මෙසේ කියන්නේය' කියායි. නිග්‍රොධය, මෙය එසේ නොදතයුතුයි. ඔබගේ ඉගෙණීම යමක් වේද, එයම ඔබගේ ඉගෙනීම වේවා, නිග්‍රොධය, ඔබට මෙබඳු අදහසක් වන්නේය. 'ශ්‍රමණ ගෞතම තෙමේ අප ජීවිකා මාර්ගයෙන් ඉවත් කරවනු කැමැත්තේ මෙසේ කියන්නේය' කියායි.

නිග්‍රොධය, මෙය එසේ නොදතයුතුයි. ඔබගේ යම් ජීවිකාවක්වේද එයම ඔබගේ ජීවිකාමාර්ගය වේවා. නිග්‍රොධය, ඔබට මෙබඳු අදහසක් වන්නේය. 'ආචාර්‍ය්‍යයන් සහිතවූ අපගේ අකුශලයයි කියනලද යම් අකුශල ධර්මයක් වේද ඒ අකුශල

ධර්මයන්හි පිහිටුවනු කැමැත්තේ ශ්‍රමණ ගෞතම තෙමේ මෙසේ කියන්නේය’ කියායි. නිග්‍රොධය, ඒ එසේ නොදත යුතු. ආචාර්‍ය්‍යයන් සහිත තොපගේ ඒ අකුශලයයි කියනලද ධර්මයෝම අකුසල් වෙත්වා. නිග්‍රොධය, නුඹට මෙබඳු අදහසෙක් වන්නේය. ‘ආචාර්‍ය්‍යවරයන් සහිත අපගේ කුශලයයි කියනලද යම් කුශල ධර්මයක් වේද, ඒ කුශල ධර්මයන්ගෙන් අප වෙන් කරනු කැමැත්තේ ශ්‍රමණ ගෞතම තෙමේ මෙසේ කියන්නේය’ කියායි. නිග්‍රොධය, මෙය එසේ නොදතයුතුයි. ආචාර්‍ය්‍යවරයන් සහිත තොපගේ කුශලයයි කියන ලද ධර්මයෝම කුශල් වෙත්වා.

“නිග්‍රොධය, මම තොපගේ අතවැසි බව කැමැත්තෙන් මෙසේ නොකියමි. තොප ඉගෙනීමෙන් ඉවත් කරනු කැමැත්තෙන් මෙසේ නොකියමි. තොප ජීවිකා මාර්ගයෙන් ඉවත් කරනු කැමැත්තෙන් මෙසේ නොකියමි. ආචාර්‍ය්‍යයන් සහිතවූ තොපගේ අකුශල යයි කියන ලද යම් අකුශල ධර්ම කෙනෙක් වෙත්ද ඒ අකුශල ධර්මයන්හි පිහිටුවනු කැමැත්තෙන් මෙසේ නොකියමි. ආචාර්‍ය්‍යයන් සහිතවූ තොපගේ කුශලයයි කියන ලද යම් කුශල ධර්ම කෙනෙක් වෙත්ද ඒ කුශල ධර්මයන්ගෙන් වෙන් කරනු කැමැත්තෙන් මෙසේ නොකියමි.

“හිත කෙළෙසන්නාවූ, නැවත ඉපදීම ඇතිකරන්නාවූ, දැවීම් සහිතවූ, දුක් විපාක ඇත්තාවූ මත්තෙහි ජාති ජරා මරණ උපදවන්නාවූ යම් අකුශල ධර්ම කෙනෙක් වෙත්ද, ඔවුන්ගේ දුරුකිරීම පිණිස ධර්මය දෙශනා කරමි. යම් පරිද්දකින් පිළිපන්නාවූ යුෂ්මතුන්ගේ හිත කෙළෙසන්නාවූ ධර්මයෝ දුරුවන්නාහුද, හිත පිරිසිදු කරන්නාවූ ධර්මයෝ දියුණු වන්නාහුද, ප්‍රඥාව සම්පූර්ණ බවටද උසස් බවටද පමුණුවන්නාවූ ඒ අර්හත් ඵලය මේ ආත්මයෙහිම තෙමේ උසස් ඥානයෙන් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරව්.”

48. මෙසේ දෙශනා කළ කල්හි ඒ පරිබ්‍රාජකයෝ තුෂ්ණීම්භූත වූවාහු, තේජස් රහිත වූවාහු, කරබාගත්තාහු බිම බලාගත්තාහු, කල්පනා කරන්නාහු, කිසිවක් නොවැටහෙන්නාහු, මාරයා විසින් මඩනාලද සිත් ඇත්තවුන් මෙන් සිටියාහුය.

එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිතක් වීය. 'මේ සියලු හිස් පුරුෂයෝ මාරයා විසින් ස්පර්ශ කරන ලද්දාහුය, යම් හේතුවකින් එකකුටද මෙබඳු අදහසක් නොවන්නේය. 'ඒකාන්තයෙන් අපි දැනගැනීම පිණිස ශ්‍රමණ ගෞතමයන් ලඟ උතුම් පැවතීමෙන් හැසිරෙමු, සත්දවස කුමක්ද? සතිය කෙතරම් සුළුද? අපි ඒ ධර්මය දැනගැනීමට උත්සාහ කරමු, යන අදහසක් ඔවුන්ට නැත්තේය කියායි, එවිට භාග්‍යවතුන් වහන්සේ උදුම්බරිකාවගේ පරිබ්‍රාජිකාරාමයෙහි සිංහනාද කොට අහසට පැනනැඟී ගිජුකුළු පව්වට ගියාහුය. සන්ධාන ගෘහපති තෙමේද එකෙණෙහිම රජගහ නුවරට පැමිණියේය.

**විසිපස් වැනිවූ උදුම්බරික සීහනාද සූත්‍රයයි.**

---

## 26. චක්කවත්ති සීහනාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ මගධරට මාතුලා නම් ගමෙහි වැඩවාසය කළාහුය. එකල භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා භික්ෂූන්ට කථාකළෝය. භික්ෂූන් වහන්සේලාද 'ස්වාමීන් වහන්ස' යයි භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නෝය. භාග්‍යවතුන් වහන්සේ මේ මතු දැක්වෙන ධර්ම කොට්ඨාසය දේශනා කළහ.

"මහණෙනි, තමන්ම ආරක්ෂාස්ථාන කොට තමන්ම පිහිට කොට වාසය කරව්, එයින් අනෙක් පිහිටක් නැත්තෝව වසවු. ධර්මය ආරක්ෂාස්ථාන කොට, ධර්මය පිහිට කොට වසව්, එයින් අනෙක් සරණක් නැත්තෝව වසව්.

2. මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් තමන්ම ආරක්ෂාස්ථාන කොට, තමන්ම පිහිට කොට අනෙක් සරණක් නැතිව, ධර්මයම ආරක්ෂාස්ථාන කොට ධර්මය පිහිට කොට අනෙක් සරණක් නැතිව වාසය කෙරේද? යත්:

මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ කයෙහි කය අනුව බලන්නෙක්ව, කෙළෙස් තවන වීර්යය ඇතිව, යහපත්

නුවණින් යුක්තව, සිහි ඇතිව, ස්කන්ධ ලෝකයෙහි ඇලීමත් මානසික දුකක් දුරලා වාසය කෙරේ.

වෙදනාවන්හි වෙදනා අනුව බලන්නෙක්ව, සිතෙහි සිත අනුව බලන්නෙක්ව, ධර්මයන්හි ධර්ම අනුව බලන්නෙක්ව කෙළෙස් තවන වීර්යය ඇතිව යහපත් නුවණින් යුක්තව, සිහි ඇතිව ස්කන්ධ ලෝකයෙහි ඇල්මත් මානසික දුකත් දුරලා වාසය කෙරේ.

මහණෙනි, මහණ තෙමේ තමන්ම ආරක්ෂාස්ථාන කොට, තමන්ම පිහිටකොට, අන්‍ය පිහිටක් නැතිව ධර්මය ආරක්ෂාස්ථාන කොට, ධර්මය පිහිටකොට අන්පිහිටක් නැතිව මෙසේ වාසය කරන්නේය.

මහණෙනි, පියාගෙන් තමන්ට උරුමව පැමිණි හැසිරිය යුතු ප්‍රදෙශයෙහි හැසිරෙව්. සිය පියාගෙන් පැමිණි හැසිරිය යුතු ප්‍රදෙශයෙහි හැසිරෙන්නවුන්ගේ සිදුරක් මාර තෙමේ නොලබන්නේය. මාර තෙමේ අරමුණක් නොලබන්නේය. මහණෙනි, මෙසේ කුශල ධර්මයන්ගේ සමාදානය හේතුකොට ගෙන පින් වැඩෙන්නේයයි වදාළේය.

3. මහණෙනි, පෙර ධාර්මිකවූ, ධර්මරාජන්වූ, මහාද්වීප සතරට අධිපතිවූ, දිනන ගති ඇති ජනපදයෙහි ස්ථිරභාවයට පැමිණියාවූ රත්න හතකින් යුක්තවූ "දළ්හනෙමී" නම් චක්‍රවර්ත්ති රජෙක් වීය. ඔහුට මේ රත්න හත වූහ. කවරහුද? යත්: චක්‍රරත්නය, හස්තිරත්නය, අශ්වරත්නය, මාණික්‍ය රත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපතිරත්නය, සත්වැනිවූ පරිණායක රත්නයද යන මොව්හුයි. ඒ රජුට ශූරවූ, දිව්‍ය පුත්‍රයන්ට සමාන ශරීර ඇත්තාවූ, සතුරු සේනාවන් මර්දනය කරන්නාවූ දහසකටත් වැඩි පුත්‍රයෝ වූහ. හෙතෙමේ සාගරය අවසානකොට ඇති මේ පොළොව දඬුවම් කිරීමක් නැතිව, ධර්මයෙන් සමගියෙන් දිනා වාසය කළේය. මහණෙනි, එවිට "දළ්හනෙමී" රජතෙමේ බොහෝ අවුරුදු ගණනක් බොහෝ අවුරුදු සියගණනක් බොහෝ අවුරුදු දහසක් ඉක්මීමෙන් පසු එක්තරා පුරුෂයෙකුට කථා කළේය. කථාකොට 'පින්වත් පුරුෂය, නුඹ දිව්‍ය චක්‍රරත්නය තුබුණු තැනින් මඳක්

හෝ මුළුමනින් හෝ යම් දිනක ඉවත් වූවොත් මට දන්වව'යි කීයේය. ඒ පුරුෂයාද දෙවයන් වහන්ස, එසේයයි පිළිතුරු දුන්නේය. මහණෙනි, ඒ පුරුෂ තෙමේ බොහෝ අවුරුදු ගණනක්, බොහෝ අවුරුදු සිය ගණනක්, බොහෝ අවුරුදු දහස් ගණනක් ඉක්මීමෙන් පසු දිව්‍ය චක්‍රරත්නය තුබුණු තැනින් ස්වල්පයක් ඉවත්වූ බව දුටුවේය. දැක, දළ්හනේමි රජු කරා ගොස් "පින්වත් දෙවයන් වහන්ස, ඔබ වහන්සේගේ දිව්‍ය චක්‍ර රත්නය තුබූ තැනින් ඉවත්වූ බව දන්නවාදැයි ඇසීය. එවිට දළ්හනෙමි රජ තමාගේ වැඩිමහළු පුත්‍රයාට කථා කොට මෙසේ කීවේය.

"පුත්‍ර කුමාරය, මාගේ දිව්‍යචක්‍රරත්නය තුබූ තැනින් ඉවත් වූයේය. යම් සක්විති රජකුගේ දිව්‍ය චක්‍රරත්නය තුබූ තැනින් ඉවත් වූවොත් ඒ රජු වැඩිකල් ජීවත් නොවන බව මා අසා තිබේ. මම මනුෂ්‍යයන්ට අයිති කම් සැප අනුභව කෙළෙමි. දැන් දිව්‍යමය කම්සැප සෙවීමට කාලයයි. පුත්‍රය, මෙහි එව. මේ සමුද්‍රය අවසාන කොට ඇති පොළොව පාලනය කරව. මම කෙස් රැවුල් කප්පවා, කසා වස්ත්‍ර හැඳ, ගිහි ගෙයින් නික්ම තාපස භාවයෙන් මහණ වන්නෙමි."

මහණෙනි, ඉක්බිති දළ්හනෙමී රජ තෙමේ වැඩිමහල් පුත්‍රයා මනා කොට රාජ්‍යයෙහි පිහිටුවා, කෙස් රැවුල් කප්පවා කසා වස්ත්‍රය හැඳ, ගිහි ගෙයින් නික්ම තාපස භාවයෙන් මහණ විය. මහණෙනි, රාජ ඍෂිවරයා මහණවී සත් දිනකින් දිව්‍ය චක්‍රරත්නය නොපෙනී ගියේය.

මහණෙනි, එවිට එක්තරා පුරුෂයෙක් ක්ෂත්‍රියවූ අභිෂේක ලත් රජු කරා ගියේය. ගොස් ඒ රජුට මෙසේ කීවේය. "පින්වත් දේවයන් වහන්ස, දිව්‍ය චක්‍රරත්නය නොපෙනී ගිය බව දන්නවාද?"

මහණෙනි, එකල්හි ඔටුණු පැළැඳීම කරන ලද ඒ ක්ෂත්‍රිය රජ තෙමේ ඒ අසා ශොකයට පැමිණියේය. ශොකී බවද ඇඟෙව්වේය. ඒ රජ තෙමේ එසේ කොට රාජර්ෂි (තාපසයා) වෙත ගොස් මෙසේ දැන්වීය. 'පින්වත් දෙවයෙනි, දිව්‍ය චක්‍රරත්නය නොපෙනී ගිය බව දන්නෙහිද?' මහණෙනි, මෙසේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කී කල්හි ඒ රාජ ඍෂි තෙමේ පුත්‍රවූ ක්ෂත්‍රිය රජුට මේ කාරණය කීයේය.

4. 'පුත්‍රය, නුඹ දිව්‍ය චක්‍රරත්නය නොපෙනී යාම ගැන ශෝක නොකරව, ශෝකී බව නොහඟව. පුත්‍රය, මේ දිව්‍ය චක්‍රරත්නය පියාගෙන් ලත් දායාදයෙක් නොවේ. පුත්‍රය නුඹ දොස් නැති සක්විතිවත් සම්පූර්ණ කරව. මේ කිය යුත්තක් ඇත. සක්විති වත් පුරන නුඹට පුර පසළොස්වක් පොහෝදා හිස් සෝදා දිය නා පෙහෙවස් සමාදන්ව ප්‍රාසාදයාගේ උඩුමහල් තලයෙහි හිඳිනකල දැති සහිත, පට්ටම සහිත බොස් ගෙඩිය සහිත සියලු විදියෙන් සම්පූර්ණවූ දිව්‍ය චක්‍රරත්නය පහළ වන්නේය. 'දෙවයන් වහන්ස, ඒ නිවැරදි සක්විතිවත් කවරේද' (මෙසේයි)

1. "පුත්‍රය, නුඹ ධර්මයෙහි පිහිටා ධර්මයට සත්කාර කරමින් ධර්මය ගරු කරමින්, ධර්මය ප්‍රිය කරමින්, ධර්මය පුදමින්, ධර්මය වඳිමින්, ධර්මධ්වජයක්ව ධර්මකෙතුවක්ව ධර්මය ප්‍රධාන කොට ගෙන, සිය අඹුදරුවන් සීලය අනුව හැසිරීමෙහි පිහිටුවා, ඔවුනට කළයුතු ධාර්මික ආරක්ෂා පිළියෙළ කරව.

2. බල සෙනඟද සීලයෙහි පිහිටුවා ඔවුනට කළයුතු ධාර්මික ආරක්ෂා පිළියෙළ කරව.

3. ක්ෂත්‍රියයන්ද සීලයෙහි පිහිටුවා ඔවුනට කළයුතු ධාර්මික ආරක්ෂා පිළියෙළ කරව.

4. බ්‍රාහ්මණ ගෘහපතීන්ද සීලයෙහි පිහිටුවා ඔවුනට කළයුතු ආරක්ෂාව පිළියෙළ කරව.

5. නිගම ජනපද වාසීන්ද රැක ගැනීම කරව.

6. මහණ බමුණන්ද රැක ගැනීම කරව.

7. සිවුපාවුන් හා කුරුල්ලන්ද, ජීවිත දානයෙන් ආරක්ෂා කරව.

8. සිය රටෙහි අධර්මක්‍රියා නොපවත්නා ලෙස කටයුතු කරව.

9. සිය රටෙහි ජීවත්වන දුප්පතුන්ට ධනය දෙව.

10. පුත්‍රය, සිය රටෙහි ආසා ආදි මදයෙන් හා පඤ්චකාම ගුණයෙන් වෙන්වූ ඉවසීමෙහි හා කරුණාවන්ත භාවයෙහි පිහිටියාවූ රාගාදිය දමනය කළ, සමනයකළ විනාශ කළ යම් මහණ බමුණු කෙනෙක් වෙත්ද, ඔවුන් කරා කලින්කල පැමිණ 'ස්වාමීනි, කුශලය නම් කුමක්ද? අකුශලය නම් කුමක්ද? වරද නම් කුමක්ද? නිවරද නම් කුමක්ද? කුමක් සේවනය කළ යුතුද? කුමක් සේවනය නොකළ යුතුද? කුමක් කරනු ලබන්නාවූ මට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස වන්නේද? කුමක් හෝ කරනු ලබන්නාවූ මට හිත පිණිස, සැප පිණිස වන්නේදැ"යි ප්‍රශ්න කළ යුතුයි. මෙසේ උන්වහන්සේලාගෙන් අසා යමක් අකුසල්ද එය අත්හැරිය යුතුයි. යමක් කුසල්ද එය පිළිගෙන පැවතිය යුතුයි. පුත්‍රය, නිවැරදි සක්විතිවත් මේවායි' කීය.

5. මහණෙනි, ඔටුණුපැළඳි ඒ ක්ෂත්‍රිය රජතෙමේ 'එසේය, දේවයන්වහන්සැ'යි පිය රජ සෘෂීන් කී පරිදි පිළිගෙන නිවැරදි සක්විතිවත් පිරූයේය. නිවැරදි සක්විතිවත් පුරන්නාවූ පුර පසළොස්වක් පොහෝදින හිස් සෝදා නහා උපොසථ සීලයෙහි පිහිටා ප්‍රාසාදයේ මතුමහල් තලයෙහි හුන්නාවූ ඒ රජුට දහසක් දැති ඇති, නිම්වලලු සහිත, නාභි සහිත සියලු ආකාරයෙන් සම්පූර්ණවූ දිව්‍ය චක්‍රරත්නය පහළ විය. ඒ දැක ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජුට මෙබඳු අදහසෙක් වීය. පුර පසළොස්වක් පොහෝ දින හිස් සෝදා නහා උපොසථ සීලයෙහි පිහිටා ප්‍රාසාදයාගේ මතුමහල් තලයට පැමිණියාවූ ඔටුණු පැළඳි යම්කිසි ක්ෂත්‍රිය රජකුට, දහසක් දැති ඇති නිම්වලලු සහිත, නාභි සහිත, සම්පූර්ණවූ දිව්‍ය චක්‍රරත්නය සියලු ආකාරයෙන් පහළවන්නේ නම් හෙතෙමේ සක්විති රජ වන්නේයයි මා විසින් අසන ලද්දේය. මම එකාන්තයෙන්ම සක්විති රජ වූයෙමි.'

මහණෙනි, අනතුරුව ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජතෙමේ ආසනයෙන් නැගිට උතුරු සළුව එක් අංසයෙක්හි කොට පොරවා 'පින්වත් චක්‍රරත්නය පැවැත්ම වේවා, පින්වත් චක්‍රරත්නය දිසාවන් දිනාවා'යි වම් අතින් කෙණ්ඩිය ගෙන දකුණු අතින් චක්‍රරත්නයට දිය ඉස්සේය.

මහණෙනි, අනතුරුව සිවුරඟ සෙනඟ සහිත සක්විති රජ සමඟ ඒ චක්‍රරත්නය පූර්වදිශාවට ගමන් කෙළේය. මහණෙනි, යම් ප්‍රදෙශයක චක්‍රරත්නය පිහිටියේද සක්විති රජ තෙමේ සිවුරඟ සෙනඟ සමග එහි වාසය කෙළේය.

මහණෙනි, පූර්වදිශාවෙහි ඒ විරුද්ධ රජදරුවෝ වෙත්ද? ඔවුහු සක්විති රජු කරා පැමිණ මෙසේ කීවාහුය. 'මහරජ එනු මැනව. මහරජ, ඔබගේ පැමිණීම යහපත් පැමිණීමකි. මහරජ, මේ දිවයින ඔබ අයත්ය. මහරජ, අනුශාසනා කරනු මැනවැ'යි කීය. සක්විති රජ තෙමේ මෙසේ අවවාද කළේය.

'ප්‍රාණවධ නොකට යුතුයි. හොරකම් නොකට යුතුයි. කාමමිථ්‍යාචාරයෙහි නොහැසිරිය යුතුයි. බොරු නොකිය යුතුයි. මත්පැන් නොබිය යුතුයි. පෙර රාජ්‍යය අනුභව කළ පරිදිම අනුභව කරව්, යනුවෙනි.

මහණෙනි, නැගෙනහිර දිශාවෙහි යම් ඒ රජදරුවෝ වෙත්ද, ඒ සියල්ලෝම සක්විති රජ අනුව යන්නෝ වූහ.

**6.** මහණෙනි, අනතුරුව ඒ චක්‍රරත්නය නැගෙනහිර සාගරයට වැද එතරව සිවුරඟ සෙනඟ සහිත සක්විති රජ සමග දකුණු දිසාවට ගමන් කෙළේය. මහණෙනි, යම් ප්‍රදෙශයෙක්හි දිව්‍ය චක්‍රරත්නය පිහිටියේද, සිවුරඟ සෙනඟ සහිත සක්විති රජතෙමේ ඒ ප්‍රදෙශයෙහි වාසය කෙළේය. මහණෙනි, දකුණු දිශාවෙහි යම් ඒ විරුද්ධ රජදරුවෝ වූවාහුද, ඔව්හු සියල්ලෝ සක්විති රජු කරා පැමිණ, මෙසේ කීවාහුය. 'මහරජ එනු මැනව්, මහරජ ඔබගේ පැමිණීම යහපත් පැමිණීමකි. මහරජ, මේ දිවයින ඔබ අයත්ය. මහරජ, අනුශාසනා කරනු මැනව්.' සක්විති රජ තෙමේ මෙසේ අවවාද කළේය.

"ප්‍රාණවධ නොකටයුතුයි. හොරකම් නොකටයුතුයි. කාමමිථ්‍යාචාරයෙහි නොහැසිරිය යුතුයි. බොරු නොකිය යුතුයි. මත්පැන් නොබිය යුතුයි. තමන් සතු රාජ්‍ය පෙර සේම භුක්ති විඳිව්."

"මහණෙනි, දකුණු දිශාවෙහි යම් ඒ විරුද්ධ රජදරුවෝ වූවාහුද, ඒ සියල්ලෝම සක්විති රජ අනුව යන්නෝ වූහ.

7. මහණෙනි, අනතුරුව ඒ චක්‍රරත්නය දකුණු සාගරයට වැද එතරව බස්නාහිර දිශාවට සිවුරඟ සෙනඟ සහිත සක්විති රජ සමඟ ගමන් කෙළේය. මහණෙනි, යම් ප්‍රදෙශයෙක්හි වනාහි දිව්‍ය චක්‍රරත්නය පිහිටි යේද ඒ ප්‍රදෙශයෙහි වනාහි සිවුරඟ සෙනඟ සහිත සක්විති රජ තෙමේ වාසයට එළඹියේය. මහණෙනි, බස්නාහිර දිසාවෙහි යම් ඒ විරුද්ධ රජදරුවෝ වෙත්ද, ඔවුහු සක්විති රජු කරා පැමිණ මෙසේ කීවාහුය. 'මහරජ එනු මැනවි. මහරජ ඔබගේ පැමිණීම යහපත් පැමිණීමකි. මහරජ මේ ඔබ අයත්ය. මහරජ අනුශාසනා කරනු මැනවැයි කීහ.' සක්විති රජ තෙමේ මෙසේ අවවාද කළේය.

"ප්‍රාණ වධ නොකටයුතුයි. හොරකම් නොකට යුතුයි. කාමමිථ්‍යාචාරයෙහි නො හැසිරිය යුතුයි. බොරු නොකිය යුතුයි. මත්පැන් නොබිය යුතුයි. තමන් සතු රාජ්‍ය පෙර සේම භුක්තිවිඳිව්" කියායි.

මහණෙනි, බස්නාහිර දිශාවෙහි යම් ඒ විරුද්ධ රජ දරුවෝ වූවාහුද? ඔව්හු සක්විති රජ අනුව යන්නෝ වූහ.

8. මහණෙනි, ඉක්බිති ඒ චක්‍රරත්නය බස්නාහිර සාගරයට වැද එතරව උතුරු දිශාවට සිවුරඟ සෙනඟ සහිත සක්විති රජ සමග ගමන් කෙළේය. මහණෙනි, යම් ප්‍රදෙශයෙක්හි දිව්‍ය චක්‍රරත්නය පිහිටියේද, සිවුරඟ සෙනඟ සහිත සක්විති රජතෙමේ ඒ ප්‍රදෙශයෙහි වාසය කෙළේය. මහණෙනි, උතුරු දිශාවෙහි යම් ඒ විරුද්ධ රජදරුවෝ වූවාහුද, ඔව්හු සියල්ලෝ සක්විති රජු කරා පැමිණ මෙසේ කීවාහුය. 'මහරජ එනු මැනවි. මහරජ, ඔබගේ පැමිණීම යහපත් පැමිණීමකි. මහරජ, මේ ඔබ අයත්ය. මහරජ, අනුශාසනා කරනු මැනවි.' සක්විති රජතෙමේ මෙසේ අවවාද කළේය.

"ප්‍රාණවධ නොකටයුතුයි. හොරකම් නොකටයුතුයි. කාමමිථ්‍යාචාරයෙහි නොහැසිරිය යුතුයි. බොරු නොකිය යුතුයි. මත්පැන් නොබිය යුතුයි. තමන් සතු රාජ්‍ය පෙර සේම භුක්ති විඳිව්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, උතුරු දිශාවෙහි යම් ඒ විරුද්ධ රජදරුවෝ වූවාහුද, ඔව්හු සක්විති රජ අනුව පවත්නෝ වූහ.

**9.** මහණෙනි, එවිට ඒ චක්‍රරත්නය සමුද්‍රය කෙළවර කොට ඇති මුළුපොළොව දිනා ඒ රාජධානියටම පෙරළා අවුත් සක්විතිරජුන්ගේ ඇතුල් වාසල් දොරටුවෙහි, මුරකරනතැන ඉදිරියෙහි සක්විතිරජුගේ ඇතුල් වාසල අලංකාර කරමින් අකුරෙහි ගැසූවාක් මෙන් සිටියේය. මහණෙනි, දෙවෙනි සක්විති රජ තෙමේද, මහණෙනි, තුන්වැනි සක්විති රජතෙමේද, මහණෙනි, සතරවැනි සක්විති රජ තෙමේද, මහණෙනි, පස්වැනි සක්විති රජ තෙමේද, මහණෙනි, සයවැනි සක්විති රජ තෙමේද මහණෙනි, සත්වැනි සක්විති රජ තෙමේද, බොහෝ වර්ෂ ගණනක්හුගේ බොහෝ වර්ෂ සියයක්හුගේ බොහෝ වර්ෂදහසක්හුගේ ඇවෑමෙන්, එක්තරා පුරුෂයකුට කථාකොට මෙසේ කීයේය. "පින්වත් පුරුෂය, නුඹ යම් දිනක දිව්‍යචක්‍රරත්නය තුබුණු තැනින් මඳක් හෝ මුළුමනින් හෝ ඉවත් වුවොත් මට දන්වව'යි කීයේය. මහණෙනි, ඒ පුරුෂයාද 'දේවයන් වහන්ස එසේයයි' පිළිතුරු දුන්නේය. මහණෙනි, ඒ පුරුෂ තෙමේ බොහෝ වර්ෂ ගණනක්හුගේ බොහෝ වර්ෂ සියයක්හුගේ බොහෝ වර්ෂ දහසක්හුගේ ඉක්මීමෙන් චක්‍රරත්නය තුබුණු තැනින් ස්වල්පයක් ඉවත්වූ බව දුටුවේය. දැක සක්විති රජ යම් තැනකද එහි පැමිණියේය. පැමිණ සක්විති රජුට මෙසේ කීයේය. 'පින්වත් දෙවයන් වහන්ස, ඔබ වහන්සේගේ දිව්‍ය චක්‍ර රත්නය තුබූ තැනින් ඉවත්වූ බව දන්නවාදැයි' ඇසීය. මහණෙනි, එවිට සක්විති රජ තෙමේ වැඩිමහළු පුත්‍රයාට කථා කොට මෙසේ කීයේය. 'පුත්‍රකුමාරය, මාගේ දිව්‍ය චක්‍රරත්නය තුබූ තැනින් ඉවත් වූයේය. යම් සක්විති රජකුගේ දිව්‍ය චක්‍ර රත්නය තුබූ තැනින් ඉවත් වුවොත් ඒ රජු වැඩිකල් ජීවත් නොවන බව මා අසා තිබේ. මම මනුෂ්‍යයන්ට අයිති කම්සැප අනුභව කෙළෙමි. දැන් දිව්‍යමය කම්සැප සෙවීමට කාලයයි. පුත්‍ර කුමාරය, එව මේ සමුද්‍රය අවසාන කොට ඇති පොළොව පාලනය කරව. මම කෙස් රැවුල් කප්පවා, කාසායවස්ත්‍රය හැඳ ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නෙමි.'

10. මහණෙනි, එවිට සක්විති රජ තෙමේ වැඩිමහල් කුමාරයා මනාකොට රාජ්‍යයෙහි පිහිටුවා, කෙස් රැවුල් කප්පවා කසාවස්ත්‍ර හැඳ, ගිහි ගෙයින් නික්ම තාපස භාවයෙන් මහණ වීය. මහණෙනි, රාජ ඍෂිවරයා පැවිදිවී සත් දිනකින් දිව්‍ය චක්‍රරත්නය නොපෙනී ගියේය. මහණෙනි, එවිට එක්තරා පුරුෂයෙක් අලුත ඔටුණු පළඳවනලද රජු කරා ගොස් දිව්‍ය චක්‍රරත්නය නොපෙනීගිය බව දන්නවාදැයි’, ඇසී. මහණෙනි, එකල්හි ඔටුණු පැළන්දාවූ ඒ ක්ෂත්‍රිය රජ තෙමේ දිව්‍ය චක්‍රරත්නය නැතිවී ගිය බව අසා ශෝකයට පැමිණියේය. ශෝකී බවද ඇඟෙව්වේය. රාජඍෂිවරයා වෙත පැමිණ දොස් නැති සක්විතිවත් නොවිචාළේය. හෙතෙමේ තමන්ගේ මතය පරිදි රට අනුශාසනා කරයි. නිදොස් සක්විති වත්හි පිහිටි පෙර රජුන්ගේ කාලයෙහි යම්සේද, එසේ තමන්ගේ මතය පරිදි රට අනුශාසනා කරන්නාවූ ඔහුගේ කාලයෙහි රට වැස්සෝ දියුණුවට නොපැමිණෙත්. මහණෙනි, එවිට අමාත්‍යයෝද, රජපිරිසද, ගණිතඥයෝද, මහාඅමාත්‍යයෝද, හස්ත්‍යාචාර්‍ය්‍යාදීහුද, දොරටුපාලයෝද, පණ්ඩිතමහාමාත්‍යයෝද, රැස්ව ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජුකරා පැමිණ මෙසේ කීවාහුය. නිදොස් සක්විතිවත්හි පිහිටි පෙර රජුන්ගේ කාලයෙහි යම් සේද එසේ තමන්ගේ මතය පරිදි රටපාලනය කරන්නාවූ ඔබගේ කාලයෙහි රට වැස්සෝ දියුණුවට නොපැමිණෙත්. දෙවයන් වහන්ස, ඔබගේ රාජ්‍යයෙහි අමාත්‍යවූද, රජපිරිසට අයත්වූද, ගණිතඥවූද, මහාමාත්‍යවූද, හස්ත්‍යාචාර්‍ය්‍යවූද, දොරටුපාලවූද, පණ්ඩිත මහාමාත්‍යවූද, අප සහ අන්‍යයෝද යන අපි නිදොස් සක්විතිවත් දන්නෙමු. දෙවයන්වහන්ස, ඔබවහන්සේ අප අතින් නිදොස් සක්විතිවත් අසන්නේ නම් යහපති. එසේ අසනලද්දාවූ අපි ඔබට නිදොස් සක්විතිවත් ප්‍රකාශ කරන්නෙමු.’ යි කීහ.

11. මහණෙනි, ඉක්බිති ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජ තෙමේ අමාත්‍යයන්ද, රජපිරිසෙහි වූවන්ද, ගණිතඥයන්ද, මහාමාත්‍යයන්ද, හස්ත්‍යාචාර්‍ය්‍යාදීන්ද, දොරටු පාලයන්ද, පණ්ඩිතමහාමාත්‍යයන්ද රැස් කරවා නිදොස් සක්විතිවත් ඇසුවේය. එසේ අසනලද්දාවූ ඔව්හු රජුට නිදොස් සක්විතිවත්

ප්‍රකාශ කළාහුය. ඒ සක්විතිවත් අසා දැහැමි ආරක්ෂා, ආවරණ, රැකවල් තැබීය. එසේද වුවත් දුප්පතුන්ට ධනය නුදුන්නේය. දුප්පතුන්ට ධනය නොදීමෙන් දිළිඳුකම මහත්විය. දිළිඳුකම මහත්වූ කල්හි එක්තරා පුරුෂයෙක් අනුන් අයත්, වස්තුහිමියන් විසින් නුදුන් වස්තුව හොරහිතින් ගත්තේය. මිනිස්සු ඒ පුරුෂයා අල්ලා ගත්තාහුය. අල්ලා ගෙන ඔටුණුපැළඳි, ක්ෂත්‍රිය රජුට දැක්වූවාහුය. දෙවයන් වහන්ස, මේ පුරුෂ තෙමේ අනුන් අයත්, වස්තු හිමියන් විසින් නුදුන් වස්තුව සොර සිතින් ගත්තේය.

මහණෙනි, එකල්හි ඔටුණු පළන් ක්ෂත්‍රිය රජ තෙමේ ඒ පුරුෂයාට මෙසේ කීයේය. 'පින්වත් පුරුෂය, නුඹ අනුන් අයත් වස්තු හිමියන් නුදුන් වස්තුව සොරසිතින් ගත්තේය යන කීම ඇත්තද? 'දෙවයන් වහන්ස ඇත්තය.' කවර කරුණක් නිසාද? 'දෙවයන් වහන්ස, ජීවත්වීමට ක්‍රමයක් නැති නිසායි.' මහණෙනි, එවිට ඔටුණු පළඳින ලද, ක්ෂත්‍රිය රජ තෙමේ ඒ පුරුෂයාට ධනය දුන්නේය. පින්වත් පුරුෂය, නුඹ මේ ධනයෙන් තමාද ජීවත් වෙව. මව්පියන් ද පොෂ්‍ය කරව, අඹුදරුවන්ද පොෂ්‍ය කරව, කර්මාන්තද කරව, මතුමත්තෙහි යහපත් විපාක ඇත්තාවූ, ස්වර්ගයට හිතවූ, සැප විපාක උපදවන්නාවූ, ස්වර්ගය පිණිස පවත්නාවූ දක්ෂිණාව ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි පිහිටුවව. මහණෙනි, ඒ පුරුෂ තෙමේ 'දෙවයන් වහන්ස, එසේය'යි ඔටුණු පැළඳි ක්ෂිත්‍රිය රජුට උත්තර දුන්නේය. මහණෙනි, අනෙක් පුරුෂයෙක්ද අනුන් අයත්, වස්තුහිමියන් විසින් නුදුන් වස්තුව හොර හිතින් ගත්තේය. මිනිස්සු ඒ පුරුෂයා අල්ලාගත්තාහුය. අල්ලාගෙන ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජුට දැක්වූවාහුය. දෙවයන් වහන්ස, මේ පුරුෂයා අනුන් අයත්, වස්තු හිමියන් විසින් නුදුන් වස්තුව, සොරසිතින් ගත්තෙහියයි කීවාහුය. මහණෙනි එකල්හි ඔටුනු පැළඳි, ක්ෂත්‍රිය රජ තෙමේ ඒ පුරුෂයාට මෙසේ කීයේය. පින්වත් පුරුෂය, නුඹ අනුන් අයත්, වස්තු හිමියන් නුදුන්වස්තු සොරසිතින් ගත්තේය යන කීම ඇත්තද?' දෙවයන් වහන්ස, ඇත්තය. කවර කරුණක් නිසාද, දෙවයන් වහන්ස, ජීවත් වීමට ක්‍රමයක් නැති නිසයි' මහණෙනි, ඉක්බිති ඔටුණු පළඳින ලද, ක්ෂත්‍රිය රජ තෙමේ ඒ පුරුෂයාටද ධනය දුන්නේය. 'පින්වත්

පුරුෂය, නුඹ මේ ධනයෙන් නුඹද ජීවත් වෙව. මව්පියන්ද පොෂ්‍යකරව, අඹුදරුවන්ද පොෂ්‍ය කරව. කර්මාන්තද කරව, මතුමත්තෙහි යහපත් විපාක ඇත්තාවූ, ස්වර්ගයට හිතවූ, දක්ෂිණාව ශ්‍රමණබ්‍රාහ්මණයන් කෙරෙහි පිහිටුවව. මහණෙනි, ඒ පුරුෂයා 'දෙවයන් වහන්ස, එසේයයි' ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජුට උත්තර දුන්නේය. යම් කෙනෙක් අනුන් අයත්, වස්තුහිමියන් විසින් නුදුන් වස්තුව, සොර සිතින් ගණිත්ද, ඔවුන්ට රජ තෙමේ ධනය දෙන්නේයයි' මිනිසුන් විසින් අසනලදී. ඒ අසා ඔවුන්ට මෙබඳු අදහසෙක් වීය. අපිද අනුන් අයත් නුදුන් වස්තුව, සොරහිතින් ගන්නමු නම් ඉතා යහපතැයි' කියායි.

12. මහණෙනි, එවිට එක්තරා පුරුෂයෙක් අනුන් අයත් නුදුන් වස්තුව, සොරසිතින් ගත්තේය. මිනිස්සු ඒ පුරුෂයා අල්ලා ගත්තාහුය. අල්ලාගෙන, ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජුට දැක්වූවාහුය. දෙවයන් වහන්ස, මේ පුරුෂයා අනුන් අයත් නුදුන් වස්තුව, සොරහිතින් ගත්තේය' කියායි. මහණෙනි, එකල්හි ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජ තෙමේ ඒ පුරුෂයාට මෙසේ කීයේය. 'පින්වත් පුරුෂය, නුඹ අනුන් අයත් නුදුන් වස්තුව, සොර සිතින් ගත්තේය යන කීම ඇත්තද?' 'දෙවයන් වහන්ස, ඇත්තයි. කවර කරුණක් නිසාද? දෙවයන් වහන්ස, ජීවත් වීමට ක්‍රමයක් නැති නිසායි.'

මහණෙනි, එවිට ඔටුණු පැළඳි ක්ෂත්‍රියරජුට මෙබඳු අදහසෙක් වීය. 'ඉදින් යම් කෙනෙක් අනුන් අයත්, නුදුන් වස්තුව, සොරසිතින් ගන්නේද, ඒ ඒ අයට මම ධනය දෙන්නෙමි. මේ කාරණයෙන් සොරකම වැඩෙන්නේය. මම මේ පුරුෂයා නැවත සොරකම් නොකරණ සේ වළකන්නෙම් නම් ඉතා යෙහෙකි. මුල් සිඳින්නෙම් නම් ඉතා යෙහෙකි, මේ පුරුෂයගේ හිස සිඳින්නෙම් නම් ඉතා යෙහෙකි. මහණෙනි, එවිට ඔටුණු පැළඳි, ක්ෂත්‍රිය රජ තෙමේ රාජ පුරුෂයන්ට අණ කෙළේය. රාජපුරුෂයිනි, එසේවීනම් මේ පුරුෂයා අත් පස්සට තබා රැහැනින් දැඩි කොට බැඳ, හිස මුඩු කොට, වදබෙර හඬින් වීථියක් පාසා මංසන්ධියක් පාසා පමුණුවා නුවර දකුණු දොරින් පිටතට ගෙන ගොස්, නුවරට දකුණු පැත්තේදී නැවත සොරකම්

නොකරන සේ වලකව්, මුල්සිඳිව්, මොහුගේ හිස සිඳිව්ය'යි නියම කෙළේ.

13. "මහණෙනි, 'දෙවයන් වහන්ස එසේයයි' ඒ පුරුෂයෝ ඔටුණු පැළඳි, ක්ෂත්‍රිය රජුට උත්තරදී ඒ පුරුෂයා අත් පස්සට තබා රැහැනින් දැඩිකොට බැඳ හිස මුඩුකොට, වදබෙර හඬින්, වීථියක් පාසා මංසන්ධියක් පාසා පමුණුවා නුවර දකුණු දොරින් පිටතට ගෙණ ගොස් නුවරට දකුණු පැත්තේදී නැවත සොරකම් නොකරන සේ වැළැක්වූවාහුය. මුල් සින්දාහුය. හිස සින්දාහුය. මහණෙනි, යම් ඒ කෙනෙක් අනුන් අයත්, නුදුන් වස්තුව, සොරසිතින් ගණිත්ද? රජතෙමේ, ඔවුන් නැවත සොරකම් නොකරනසේ වළකයි මුල්සිඳියි. ඔවුන්ගේ හිස් සිඳී, යයි මිනිස්සු ඇසුවාහුය. අසා, "අපිත් තියුණු ආයුධ සාදවන්නෙමු නම් සාදවා යම් ඒ කෙනෙකුන්ගේ නුදුන් වස්තුව සොර සිතින් ගන්නමුද ඔවුන් වළකන්නමු නම් ඔවුන්ගේ මුල් සිඳින්නමු නම් ඔවුන්ගේ හිස් සිඳින්නමු නම් ඉතා යෙහෙකැ"යි ඔවුනට මෙබඳු අදහසෙක් වීය. ඔව්හු තියුණු ආයුධ කරවුවාහුය. තියුණු ආයුධ කරවා ගම් පැහැරීමට පටන් ගත්තාහුය. නියම්ගම් පැහැරීමට පටන්ගත්තාහුය. නගර පැහැරීමට පටන්ගත්තාහුය. මංකොල්ලකෑමට පටන්ගත්තාහුය. ඔව්හු යම් කෙනෙකුන්ගේ නුදුන් වස්තුව සොර සිතින් ගණිත්ද? ඔවුන්ගේ වැළකීම කෙරෙත්. මුල් සිඳිත්. හිස් සිඳිත්.

14. මහණෙනි, මෙසේ දුප්පතුන්ට ධනය නොදෙනු ලබන කල්හි දිළිඳු බව අතිශයින් පැතිරී ගියේය. දිළිඳු බව අතිශයින් පැතිරී ගිය කල්හි සොරකම මහත් වීය. සොරකම මහත්වූ කල්හි අවි ආයුධ වැඩී ගියේය. අවි ආයුධ වැඩුණු කල්හි ප්‍රාණඝාතය වැඩී ගියේය. ප්‍රාණඝාතය වැඩී ගිය කල්හි ඒ සත්වයන්ගේ ආයුෂද පිරිහිණි. වර්ණයද පිරිහිණි. ආයුෂයෙන් පිරිහෙනු ලබන්නාවූද, වර්ණයෙන් පිරිහෙනු ලබන්නාවූද අසූ දහසක් අවුරුදු ආයු ඇති ඒ සත්වයන්ගේ පුත්‍රයෝ, සතළිස් දහසක් අවුරුදු ආයු ඇත්තෝ වූහ. මහණෙනි, මනුෂ්‍යයන් අතර සතළිස්දහසක් අවුරුදු ආයු ඇති කල්හි එක්තරා පුරුෂයෙක්,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

අනුන් අයත් නුදුන් වස්තුව සොර සිතින් ගත්තේය. ඒ පුරුෂයා අල්ලා ගත්තාහුය. අල්ලාගෙන රජුට දැක්වූවාහුය. 'දෙවයන් වහන්ස, මේ පුරුෂයා අනුන් අයත්, නුදුන් වස්තුව සොරසිතින් ගත්තේය. මහණෙනි, එසේ කී කල්හි ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජතෙමේ ඒ පුරුෂයාට මෙසේ කීයේය. 'පින්වත් පුරුෂය, අනුන් අයත් නුදුන් වස්තුව, සොරසිතින් ගත්තේය යන මේ කීම ඇත්තක්ද? 'දෙවයන් වහන්ස, නැතැයි දැන දැන බොරු කීයේය.'

මහණෙනි, මෙසේ වනාහි දුප්පතුන්ට ධනය නොදෙනු ලබන කල්හි දිළිඳු බව අතිශයින් පැතිරී ගියේය. දිළිඳු බව අතිශයින් පැතිරී ගිය කල්හි සොරකම මහත්වීය. සොරකම මහත්වූ කල්හි අවි ආයුධ වැඩී ගියේය. අවි ආයුධ වැඩුණු කල්හි ප්‍රාණඝාතය වැඩී ගියේය. ප්‍රාණඝාතය වැඩුණ කල්හි බොරුකීම වැඩී ගියේය. බොරුකීම වැඩීගිය කල්හි ඒ සත්වයන්ගේ ආයුෂද පිරිහිණි. වර්ණයද පිරිහිණි. ආයුෂයෙන් පිරිහෙනු ලබන්නාවූද, වර්ණයෙන් පිරිහෙනු ලබන්නාවූද, සතළිස්දහසක් අවුරුදු ආයු ඇති ඒ සත්වයන්ගේ පුත්‍රයෝ, විසිදහසක් අවුරුදු ආයු ඇත්තෝ වූහ.

**15.** 'මහණෙනි, මිනිසුන් අතර විසිදහසක් අවුරුදු ආයු ඇතිකල්හි එක්තරා පුරුෂයෙක් අනුන් අයත් නුදුන් වස්තුව, සොරසිතින් ගත්තේ' යයි ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජුට කේලම් කීයේය.

"මහණෙනි, මෙසේ වනාහි දුප්පතුන්ට ධනය නොදෙනු ලබන කල්හි දිළිඳු බව අතිශයින් පැතිරී ගියේය. දිළිඳු බව අතිශයින් පැතිරී ගිය කල්හි සොරකම මහත්වීය. සොරකම මහත්වූ කල්හි අවි ආයුධ වැඩී ගියේය. අවි ආයුධ වැඩී ගිය කල්හි ප්‍රාණඝාතය වැඩී ගියේය. ප්‍රාණඝාතය වැඩී ගිය කල්හි බොරුකීම වැඩී ගියේය. බොරුකීම වැඩී ගිය කල්හි කේලාම් කීම වැඩී ගියේය. කේලාම් කීම වැඩී ගිය කල්හි ඒ සත්වයන්ගේ ආයුෂද පිරිහිණි. වර්ණයද පිරිහිණි. ආයුෂයෙන් පිරිහෙනු ලබන්නාවූද, වර්ණයෙන් පිරිහෙනු ලබන්නාවූද විසි දහසක් අවුරුදු ආයු ඇති ඒ මනුෂ්‍යයන්ගේ පුත්‍රයෝ දස දහසක් අවුරුදු ආයු ඇත්තෝ වූහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**16.** 'මහණෙනි, මිනිසුන් අතර දසදහසක් අවුරුදු ආයු ඇති කල්හි ඇතැම් සත්ව කෙණෙක් යහපත් වර්ණ ඇත්තාහු වෙත්. ඇතැම් සත්ව කෙනෙක් අයහපත් වර්ණ ඇත්තාහු වෙත්. ඔවුන් අතර යම් ඒ සත්ව කෙනෙක් දුර්වර්ණ වූවාහුද? ඔව්හු ශොභමාන අය කෙරෙහි ඇල්ම උපදවා පරදාර සේවනයෙහි යෙදුනාහ. මහණෙනි, මෙසේ වනාහි දුප්පතුන්ට ධනය නොදෙනු ලබන කල්හි දිළිඳු බව අතිශයින් පැතිරී ගියේය. දිළිඳු බව අතිශයින් පැතිරී ගිය කල්හි සොරකම මහත් වීය. පරදාර සේවනය මහත්වූ කල අවි ආයුධ වැඩී ගියේය. අවි ආයුධ වැඩී ගිය කල්හි ප්‍රාණඝාතය වැඩී ගියේය. ප්‍රාණඝාතය වැඩී ගිය කල්හි බොරුකීම වැඩී ගියේය. බොරුකීම වැඩී ගිය කල්හි කේලාම් කීම වැඩී ගියේය. කේලාම් කීම වැඩී ගිය කල්හි කාමයන්හි වරදවා හැසිරීම වැඩී ගියේය. කාමයන්හි වරදවා හැසිරීම වැඩී ගිය කල්හි ඒ සත්වයන්ගේ ආයුෂද පිරිහිණි. වර්ණයද පිරිහිණි. ආයුෂයෙන් පිරිහෙනු ලබන්නාවූද, වර්ණයෙන් පිරිහෙනු ලබන්නාවූද, දසදහසක් අවුරුදු ආයුෂ ඇති ඒ මනුෂ්‍යයන්ගේ පුත්‍රයෝ පන්දහසක් අවුරුදු ආයුෂ ඇත්තෝ වූහ.

**17.** මහණෙනි, පන්දහසක් අවුරුදු ආයු ඇති මිනිසුන් අතර මේ ධර්මයෝ දෙදෙනෙක් මහත් භාවයට ගියහ. පරුෂ වචනය, සම්ඵප්‍රලාපය (හිස් වචනකීම) යන දෙකයි. මේ ධර්ම දෙක අතිශයින් පැතිරී ගිය කල්හි ඒ සත්වයන්ගේ ආයුෂද පිරිහිණි. වර්ණයද පිරිහිණි. ආයුෂයෙන් පිරිහෙනු ලබන්නාවූද, වර්ණයෙන් පිරිහෙනු ලබන්නාවූද පන්දහසක් අවුරුදු ආයුෂ ඇති මිනිසුන්ගේ පුත්‍රයෝ, ඇතැම් කෙනෙක් දෙදහස් පන්සියයක් අවුරුදු ආයුෂ ඇත්තෝ වූහ. ඇතැම් කෙනෙක් දෙදහසක් අවුරුදු ආයුෂ ඇත්තෝ වූහ. මහණෙනි, දෙදහස් පන්සියයක් අවුරුදු ආයුෂ ඇති මිනිසුන් අතර තද ආශාව. ක්‍රොධය යන දෙක අතිශයින් පැතුරුනේය. තද ආශාව ක්‍රොධය යන දෙක අතිශයින් පැතිරී ගිය කල්හි ඒ සත්වයන්ගේ ආයුෂද පිරිහිණි. වර්ණයද පිරිහිණි. ආයුෂයෙන් පිරිහෙනු ලබන්නාවූද, වර්ණයෙන් පිරිහෙනු

ලබන්නාවූද, දෙදහස් පන්සියයක් අවුරුදු ආයුෂ ඇති ඒ මිනිසුන්ගේ පුත්‍රයෝ දහසක් අවුරුදු ආයුෂ ඇත්තෝ වූහ.

18. මහණෙනි, දහසක් අවුරුදු ආයුෂ ඇති මිනිසුන් අතර මිථ්‍යාදෘෂ්ටිය අතිශයින් පැතිරී ගියේය. මිථ්‍යාදෘෂ්ටිය අතිශයින් පැතිරී ගිය කල්හි ඒ සත්වයන්ගේ ආයුෂද පිරිහිණි. වර්ණයද පිරිහිණි. ආයුෂයෙන් පිරිහෙනු ලබන්නාවූද, වර්ණයෙන් පිරිහෙනු ලබන්නාවූද, දහසක් අවුරුදු ආයු ඇති ඒ සත්වයන්ගේ පුත්‍රයෝ පන්සියයක් අවුරුදු ආයුෂ ඇත්තෝ වූහ. මහණෙනි, මිනිසුන් අතර පන්සියයක් අවුරුදු ආයු ඇතිවූ කල්හි අධර්ම රාගය, (මවු පිය නැදි මයිල් ආදීවූ අයුතු තන්හි උපදින රාගය) විසම ලොභය, (බලවත් තණ්හාව) මිථ්‍යාධර්මය (පුරුෂයන් පුරුෂයන් කෙරෙහිත් ස්ත්‍රීන් ස්ත්‍රීන් කෙරෙහිත් උපදවන රාගය) යන තුන අතිශයින් පැතිරී ගියේය. මේ අධර්ම තුන අතිශයින්පැතිරී ගිය කල්හි ඒ සත්වයන්ගේ ආයුෂද පිරිහිණි. වර්ණයදපිරිහිණි. ආයුෂයෙන් පිරිහෙනු ලබන්නාවූද, වර්ණයෙන්පිරිහෙනු ලබන්නාවූද පන්සියයක් අවුරුදු ආයුෂ ඇති ඒ සත්වයන්ගේ පුත්‍රයෝ, ඇතැම් කෙනෙක් දෙසිය පණහක් අවුරුදු ආයුෂ ඇත්තෝද, ඇතැම් කෙනෙක් දෙසියයක්අවුරුදු ආයුෂ ඇත්තෝදවූහ. මහණෙනි, මිනිසුන් අතර දෙසියපණසක් ආයුෂ ඇති කල්හි මව කෙරෙහි වරදවා පිළිපැදීම, පියාකෙරෙහි වරදවා පිළිපැදීම, ශ්‍රමණයන් කෙරෙහි වැරදිලෙස හැසිරීම, බ්‍රාහ්මණයන් කෙරෙහි වැරදි ලෙස හැසිරීම, සියපවුලෙහි වැඩිහිටියන්ට යටහත් නොවන බව, යන මේ වරදපසස පැතිර ගියේය.

19. මහණෙනි, මෙසේ වනාහි දුප්පතුන්ට ධනය නොදීමෙන් දිළිඳු බව අතිශයින් පැතිර ගියේය. දිළිඳු බව අතිශයින් පැතිර ගිය කල්හි සොරකම මහත් වීය. සොරකම මහත්වූ කල්හි අවි ආයුධ වැඩී ගියේය. අවි ආයුධ වැඩී ගිය කල්හි ප්‍රාණඝාතය වැඩී ගියේය. ප්‍රාණඝාතය වැඩීගිය කල්හි බොරු කීම වැඩී ගියේය. බොරුකීම වැඩී ගිය කල්හි කේලාම් කීම වැඩී ගියේය. කේලාම් කීම වැඩී ගිය කල්හි කාමයන්හි වරදවා හැසිරීම වැඩී ගියේය. කාමයන්හි වරදවා හැසිරීම වැඩී ගිය කල්හි පරුෂවචන, සම්ඵප්‍රලාප (හිස්වචන) දෙකවැඩී ගියේය. මේ දෙක වැඩී ගිය

කල්හි තද ආසාව ක්‍රොධය යන දෙක වැඩී ගියේය. ඒ දෙක වැඩී ගිය කල්හ මිථ්‍යාදෘෂ්ටිය වැඩී ගියේය. මිථ්‍යාදෘෂ්ටිය වැඩී ගිය කල්හි අධර්ම රාගය, විසමලොභය, මිථ්‍යාධර්මය යන වරද තුණ වැඩී ගියේය. මේ තුණ වැඩී ගිය කල්හි මව කෙරෙහි වරදවා පිළිපැදීම, පියා කෙරෙහි වරදවා පිළිපැදීම, ශ්‍රමණයන් කෙරෙහි වැරදිලෙස පිළිපැදීම, බ්‍රාහ්මණයන් කෙරෙහි වැරදි ලෙස හැසිරීම, සිය පවුලෙහි වැඩි හිටියන්ට ගරු නොකිරීම, යන මේ වරද පස වැඩී ගියේය. මේ පස වැඩී ගිය කල්හි ඒ සත්වයන්ගේ ආයුෂද පිරිහිණි. වර්ණයද පිරිහිණි. ආයුෂයෙන් පිරිහෙනු ලබන්නාවූද, වර්ණයෙන් පිරිහෙනු ලබන්නාවූද, දෙසියපණසක් අවුරුදු ආයුෂ ඇති සත්වයන්ගේ පුත්‍රයෝ අවුරුදු සියයක් ආයු ඇත්තාහු වූහ. යම් හේතුවකින් මේ මිනිසුන්ගේ පුත්‍රයෝ අවුරුදු දහයක් ආයුෂ ඇත්තෝ වන්නාහුද? එබඳු කාලයක් වන්නේය. මහණෙනි, මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂ කොට ඇති කල්හි පස් අවුරුදු කුමරිය ස්වාමියකුට දීමට සුදුසු කොට සලකන්නාහ. මහණෙනි, මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂ කොට ඇති කල්හි ගිතෙල්, වෙඬරු, තල තෙල්, මී, සකුරු, ලුණු යන මේ රස නැතිවී යන්නේය. මහණෙනි, යම් සේ මේ කාලයෙහි ආහාර අතුරෙන් හැල්බත්, මස් අග්‍රභොජනය වන්නේද? එසේ මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂ කොට ඇති කල්හි කුරහන් අග්‍රභෝජනය වන්නේය. මහණෙනි, මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂ කොට ඇති කල්හි දශකුශල කර්පපථයෝ මුළුමනින් නැති වන්නාහ. දශඅකුශල කර්මපථයෝ අතිශයින් පැතිරෙන්නාහ. මහණෙනි, මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂ කොට ඇති කල්හි කුශලය යන නමවත් ඇති නොවන්නේය. එසේ කල කුසල් කරන්නෙක් කොයින්ද?

**20.** මහණෙනි, මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂ කොට ඇති කල්හි මව කෙරෙහි වරදවා පිළිපදින්නාවූ, පියා කෙරෙහි වරදවා පිළිපදින්නාවූ, ශ්‍රමණයන් කෙරෙහි වැරදි ලෙස හැසිරෙන්නාවූ, බ්‍රාහ්මණයන් කෙරෙහි වැරදිලෙස හැසිරෙන්නාවූ සිය පවුලෙහි වැඩිහිටියන්ට ගරු නොකරන්නාවූ

යම් ඒ කෙනෙක් වන්නාහුද, ඔව්හු පිදිය යුත්තෝද ප්‍රශංසා කළ යුත්තෝද වන්නාහ. මහණෙනි මේ කාලයෙහි මව කෙරෙහි මනාව පිළිපදින්නාවූ, පියා කෙරෙහි මනාව පිළිපදින්නාවූ, ශ්‍රමණයන් කෙරෙහි නිවැරදි ලෙස හැසිරෙන්නාවූ, බ්‍රාහ්මණයන් කෙරෙහි නිවැරදි ලෙස හැසිරෙන්නාවූ, සිය පවුලෙහි වැඩිහිටියන්ට ගරු කරන්නාවූ අය යම්සේ පිදිය යුත්තාහු, ප්‍රශංසා කළ යුත්තාහු වෙත්ද, මහණෙනි, එපරිද්දෙන් මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂ කොට ඇති කල්හි මව කෙරෙහි වරදවා පිළිපදින්නාවූ, පියා කෙරෙහි වරදවා පිළිපදින්නාවූ, ශ්‍රමණයන් කෙරෙහි වැරදිලෙස හැසිරෙන්නාවූ, බ්‍රාහ්මණයන් කෙරෙහි වැරදිලෙස හැසිරෙන්නාවූ, සිය පවුලෙහි වැඩිහිටියන්ට ගරු නොකරන්නාවූ අය පිදියයුත්තෝද, ප්‍රශංසා කළ යුත්තෝද වන්නාහුය.

මහණෙනි, මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂ කොට ඇති කල්හි මවය කියා හෝ සුලු මවය කියා හෝ නැන්දාය කියා හෝ ගුරුභාර්‍ය්‍යාය කියා හෝ සුලු පියාගේ භාර්‍ය්‍යාවය කියා හෝ නොවන්නේය. එළුවන්, බැටළුවන්, ඌරන්, කුකුළන්, බල්ලන්, සිවලුන් යම්සේද එසේ ලෝවැසි තෙමේ වෙනසකට නොපැමිණෙන්නේය. මහණෙනි මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂ කොට ඇති කල්හි ඒ සත්වයන් තුළ ඔවුනොවුන් කෙරෙහි දැඩි කෝපය, දැඩි ව්‍යාපාදය දැඩි ද්වේෂය, දැඩි වධක චිත්තය (මැරීමේ ආශාව) ඇති වන්නේය. මහණෙනි, මුවන් මරන්නකුට මුවකු දැක දැඩි කෝපය, දැඩි ව්‍යාපාදය, දැඩි ද්වේෂය, දැඩි වධක චිත්තය ඇති වන්නේ යම්සේද එසේ පුත්‍රයා කෙරෙහි මවටද, මව කෙරෙහි පුත්‍රයාටද, පුත්‍රයා කෙරෙහි පියාටද, පියා කෙරෙහි පුත්‍රයාටද, සහෝදරිය කෙරෙහි සහෝදරයාටද, සහෝදරයා කෙරෙහි සහෝදරියටද ඔවුනොවුන් කෙරෙහි දැඩි කෝපය, දැඩි ව්‍යාපාදය, දැඩි ද්වේෂය, දැඩි වධකචිත්තය ඇතිවන්නේය.

මහණෙනි, මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂකොට ඇති කල්හි සත්දවසක් මුළුල්ලෙහි ශස්ත්‍ර අන්තර් කල්පය

(ආයුධවලින් ඇන කොටා ගෙන විනාශ වන කාලය) වන්නේය. ජනයා අතර ඔවුනොවුන් කෙරෙහි මෘගසංඥාව (මුවෙකැයි යන හැඟීම) ඇති වන්නේය. ඔවුන් අතට අසුවූ අසුවූ දැය ආවුධ වන්නේය. ඔව්හු තියුණු ආවුධවලින් මේ මුවෙක මේ මුවෙකැයි ඔවුනොවුන් කපා, කොටා ජීවිත විනාශකර ගන්නාහ.

21. මහණෙනි, ඒ මිනිසුන්ට මෙබඳු අදහසක් වන්නේය. " අපි කිසිවෙකු නොමරමු. කිසිවෙක් අප නොමරත්වා. අපි තණ ලැහැප්වලට හෝ පඳුරුවලින් ගැවසීගත් ස්ථානවලට හා ගස්වලින් ගැවසීගත් ස්ථානවලට හෝ ගංගා මැද දූපත් වලට හෝ කඳු මුදුන්වලට හෝ පැමිණ, වනයෙහිවූ අලමුල් පල වැල කා ජීවත්වන්නෙමු නම් යහපතැ'යි සිතා, ඔව්හු ඒ තණවලින් ගැවසීගත් ස්ථාන ආදියට පැමිණ සතියක් ජීවත්වෙත්. නැවත ඒ තණලැහැප් ආදීන් නික්ම අවුත් ඔවුනොවුන් වැළඳ ගෙන 'අපි යම්සේ ජීවත් වෙමුද එසේ ජීවත්වන සත්වයෝ දක්නා ලද්දාහුයයි' සතුටුසාමීචි කථාකොට මිත්‍රයන් කෙරෙත්. මහණෙනි, එකල්හි ඒ මිනිසුන්ට මෙබඳු අදහසක් වන්නේය. අපි අකුශලධර්මයන්හි යෙදුනබැවින් මහත්වූ මෙබඳුවූ නැදෑයින් විනාසයට පැමිණියෝ වමු. අපි කුසල්කරන්නෙමු නම් යහපති. කවර කුසලක් කරන්නමුද? අපි ප්‍රාණඝාතයෙන් වළකින්නමු නම් මැනවි. මේ කුසල ධර්මය සමාදන්ව පවත්නෝවමු' කියායි. ඔව්හු ප්‍රාණඝාතයෙන් වළකින්නාහුය. මේ කුසල ධර්මය සමාදන්ව පවත්නාහුය. ඔව්හු කුශල ධර්මයන් සමාදන්වීම හේතුකොට ගෙන ආයුෂයෙන්ද වැඩෙන්නාහ. වර්ණයෙන්ද වැඩෙන්නාහ. ආයුෂයෙන්ද වර්ණයෙන්ද වැඩෙනු ලබන්නාවූ ඒ මිනිසුන්ට විසිවස් ඇති පුත්‍රයෝ වන්නාහ.

22. මහණෙනි, ඒ මිනිසුන්ට මෙබඳු අදහසෙක් වන්නේය. 'අපි වනාහි කුශලධර්ම සමාදන්ව ආරක්ෂා කිරීම නිසා ආයුෂයෙන්ද වර්ණයෙන්ද වැඩෙමු. අපි අතිශයින් කුසල් කරන්නමු නම් ඉතා යහපත්ය කියායි. කවර කුසලක් කරන්නමුද? අපි හොරකමින් වළකින්නමු නම් ඉතා යහපති. කාමමිථ්‍යාචාරයෙන්, මුසාවාදයෙන්, කේලාම් කීමෙන්, එරුස වචනයෙන්, සම්ඵප්‍රලාපයෙන් වළකින්නමු නම්, තද ආසාව

දුරුකරන්නමු නම්, ක්‍රොධය දුරුකරන්නමු නම්, මිථ්‍යාදෘෂ්ටිය දුරුකරන්නමු නම්, අධර්මරාගය (මව් පිය නැදි මයිල් ආදි අයුතු තැන උපදවන රාගය), විසම ලොභය (පරිභොග කළ යුතු වස්තුවෙහිද ඉතා බලවත් ආශාව), මිථ්‍යාධර්මය (පුරුෂයන් පුරුෂයන් කෙරෙහිද, ස්ත්‍රීන් ස්ත්‍රීන් කෙරෙහිද උපදවන රාගය) යන තුන දුරුකරන්නමු නම් යහපති. අපි මව කෙරෙහි, පියා කෙරෙහි, ශ්‍රමණයන් කෙරෙහි, බ්‍රාහ්මණයන් කෙරෙහි, මනාකොට පවත්නෝ වමු. කුලදෙටුවන් පුදන්නෝ වමු නම් යහපතැයි සිතා, මහණෙනි, ඔව්හු මව කෙරෙහි, පියා කෙරෙහි, ශ්‍රමණයන් කෙරෙහි, බ්‍රාහ්මණයන් කෙරෙහි මනාකොට පවත්නෝ වන්නාහුය. කුලදෙටුවන් පුදන්නෝ වන්නාහුය. මෙසේ කුශලධර්ම සමාදන්ව පවතිත්. ඔව්හු කුසල ධර්ම සමාදන්ව පැවතීමෙන් ආයුෂයෙන්ද වර්ණයෙන්ද වැඩෙන්නාහ. ආයුෂයෙන්ද, වර්ණයෙන්ද වැඩෙනු ලබන්නාවූ විසි අවුරුද්දක් පරමායුෂ කොට ඇති ඒ මිනිසුන්ට අවුරුදු සතලිසක් පරමායුෂ ඇති පුත්‍රයෝ වන්නාහ. අවුරුදු සතලිසක් පරමායුෂ ඇති මිනිසුන්ට අවුරුදු අසූවක් පරමායුෂ ඇති පුත්‍රයෝ වන්නාහ. අවුරුදු අසූවක් පරමායුෂ ඇති මිනිසුන්ට අවුරුදු එකසිය හැටක් පරමායුෂ ඇති පුත්‍රයෝ වන්නාහ. අවුරුදු එකසිය හැටක් පරමායුෂ ඇති මිනිසුන්ට අවුරුදු තුන්සිය හැටක් පරමායුෂ ඇති පුත්‍රයෝ වන්නාහ. අවුරුදු තුන්සිය හැටක් පරමායුෂ ඇති මිනිසුන්ට අවුරුදු හයසිය සතලිසක් පරමායුෂ ඇති පුත්‍රයෝ වන්නාහ. අවුරුදු හයසිය සතලිසක් පරමායුෂ ඇති මිනිසුන්ට අවුරුදු දෙදහසක් පරමායුෂ ඇති පුත්‍රයෝ වන්නාහ. අවුරුදු දෙදහසක් ආයු ඇති මිනිසුන්ට අවුරුදු සාරදහසක් පරමායුෂ ඇති පුත්‍රයෝ වන්නාහ. අවුරුදු සාර දහසක් පරමායුෂ ඇති මිනිසුන්ට අවුරුදු අට දහසක් පරමායුෂ ඇති පුත්‍රයෝ වන්නාහ. අවුරුදු අටදහසක් පරමායුෂ ඇති මිනිසුන්ට අවුරුදු විසිදහසක් පරමායුෂ ඇති පුත්‍රයෝ වන්නාහ. අවුරුදු විසිදහසක් පරමායුෂ ඇති මිනිසුන්ට අවුරුදු සතලිස් දහසක් පරමායුෂ ඇති පුත්‍රයෝ වන්නාහ. අවුරුදු සතලිස් දහසක් පරමායුෂ ඇති මිනිසුන්ට අවුරුදු අසූදහසක් පරමායුෂ ඇති පුත්‍රයෝ වන්නාහ.

23. මහණෙනි, මිනිසුන් අතර අවුරුදු අසූදහසක් පරමායුෂ ඇති කල්හි අවුරුදු පන්සියයක් වයස්වූ කුමාරිකාවෝ ස්වාමි කුලයට යායුතු වන්නාහ. මිනිසුන් අතර අවුරුදු අසූ දහසක් පරමායුෂ ඇති කල්හි ආහාර ආශාවය, බත්මතය, මහළුවීමය යන ආබාධ තුන පමණක් ඇත්තේ වෙයි.

24. මහණෙනි, මිනිසුන් අතර අවුරුදු අසූදහසක් පරමායුෂ ඇති කල්හි මේ දඹදිව අතිශයින් සමෘද්ධ වූයේද, සම්පත්තියෙන් පිරුණේද වන්නේය. ගම්, නියම්ගම්, ජනපද, රාජධානි එකිනෙක සම්බන්ධව පවත්නේය.

මහණෙනි, මිනිසුන් අතර අවුරුදු අසූදහසක් පරමායුෂ ඇති කල්හි මේ දඹදිව උන වනයක් බට වනයක් මෙන් මිනිසුන් ගෙන් අතුරු සිදුරු නැති වන්නේය.

මහණෙනි, මිනිසුන් අතර අසූදහසක් අවුරුදු පරමායුෂ ඇති කල්හි මේ බරණැස් නුවර, දියුණුව බොහෝ ජනයන්ගෙන් ගැවසී ගත්තාවූ බොහෝ ආහාර ඇතිවූ කෙතුමතී නම් රාජධානියක් වන්නේය. මහණෙනි, මිනිසුන් අතර අසූ දහසක් අවුරුදු පරමායුෂ කොට ඇති කල්හි මේ දඹදිව කෙතුමති රාජධානිය ප්‍රමුඛ කොට ඇති අසූසාර දහසක් නගරයෝ වහළෙන් වහළයට කුකුළෙකුට යා හැකි සේ වන්නාහ.

මහණෙනි, මිනිසුන් අතර අසූදහසක් අවුරුදු පරමායුෂ කොට ඇති කල්හි ඒ කෙතුමතී නම් නුවර ධාර්මිකවූ සාගර හතර කෙළවර කොට ඇති මුළු පොළොව ජය ගත්තාවූ ජනපදයන්හි ස්ථිර බවට පැමිණියාවූ, චක්‍රරත්නය, හස්ති රත්නය, අශ්වරත්නය, මාණික්‍යරත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, පරිනායකරත්නය යන රත්න හතෙන් යුක්තවූ සඞ්ඛ නම් චක්‍රවර්ති රජෙක් වන්නේය. ඒ රජුට සූරවූ, වීරවූ, පරසෙනා මර්දනය කරන්නාවූ දහසකට අධික පුත්‍රයෝ වන්නාහ. ඒ රජ තෙමේ දඬුවම් නොකොට, ආයුධ නොගෙන මේ මුළු පොළොව ධර්මයෙන් දිනා වාසය කරන්නේය.

මහණෙනි, මිනිසුන් අතර අසූදහසක් අවුරුදු පරමායුෂ කොට ඇති කල්හි, මම දැන් යම් සේ ලෝකයෙහි උපන්නාවූ,

අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, විද්‍යාචරණ සම්පන්නවූ, සුගතවූ, ලෝකවිදූවූ, නිරුත්තරවූ, පුරිසදම්මසාරථීවූ දෙවිමිනිසුන්ට ශාස්තෘවූ බුද්ධවූ භාග්‍යවත් වූයේ යම්සේද එසේ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ, විද්‍යාචරණ සම්පන්නවූ, සුගතවූ, ලොකවිදූ වූ, නිරුත්තරවූ, පුරිසදම්මසාරථීවූ දෙවි මිනිසුන්ට ශාස්තෘවූ, බුද්ධවූ, මෛත්‍රෙය නම් භාග්‍යවතුන් වහන්සේ ලෝකයෙහි උපදින්නේය. ඒ බුදුරජාණන් වහන්සේ දෙවියන් සහිත, මාරයන් සහිත, බ්‍රහ්මයන් සහිත මේ ලෝකයද, මහණ බමුණන් සහිත දෙවි මිනිසුන් සහිත ජනයාද තමන් වහන්සේගේ උසස් ඥානයෙන් දැන ප්‍රකාශ කරන්නේය. මම දැන් දෙවියන් සහිත, මාරයන් සහිත බ්‍රහ්මයන් සහිත මේ ලෝකයද, මහණ බමුණන් සහිත දෙවි මිනිසුන් සහිත ජනයාද යම්සේ දැන ප්‍රකාශ කෙරෙම්ද එසේය. මම යම්සේ දැන් මුල යහපත්වූ, මැද යහපත්වූ, අවසානය යහපත්වූ, අර්ථ සහිතවූ, ව්‍යඤ්ජන සහිතවූ, සර්වසම්පූර්ණවූ, පිරිසිදුවූ, බ්‍රහ්මචර්‍ය්‍ය ප්‍රකාශ කෙරෙම්ද එසේ ඒ බුදුරජාණන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, අවසානය යහපත්වූ, අර්ථ සහිතවූ, ව්‍යඤ්ජන සහිතවූ, සර්ව සම්පූර්ණවූ, බ්‍රහ්මචර්‍ය්‍ය ප්‍රකාශ කරන්නේය. යම්සේ මම දැන් නොයෙක් සියගණන් භික්ෂු සංඝයා පරිහරණය කෙරෙම්ද එසේ ඒ බුදුරජාණන් වහන්සේ නොයෙක් සිය දහස් ගණන් භික්ෂු සංඝයා පරිහරණය කරන්නේය.

**25.** මහණෙනි, එකල්හි සඞ්ඛ නම් රජතෙමේ මහාපනාද නම් රජහු විසින් කරවනලද ගංගා නදියෙහි ගිලී පවත්නා ප්‍රාසාදය මතුකොට ගොඩට නංවා එහි කලක් වැස එය අන්‍යයනට හැරදමා මහණ, බමුණු, දුගී, මගී, යාචක, ආදීන්ට දන්දී මෛත්‍රෙය නම් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ සමීපයෙහි කෙස් රැවුල් කපා සිවුරු හැඳ ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වන්නේය. මෙසේ පැවිදිවූ හෙතෙමේ තනිව අප්‍රමාදව කෙළෙස් තවන වීර්යයෙන් යුක්තව නිවන් පිණිස යොමු කරන ලද සිත් ඇතිව වාසය කරන්නේ නොබෝ කලකින්ම යමක් පිණිස කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද ඉතා උසස්වූ බ්‍රහ්මචර්‍ය්‍යය

අවසාන කොට ඇති ඒ අර්හත් ඵලය තමාම ඉතා උසස් ඥානයෙන් අවබොධ කොට එයට පැමිණ වාසය කරන්නේය.

**26.** මහණෙනි, තමාම ආරක්ෂාස්ථාන කොට තමාම පිහිට කොට අනෙක් සරණක් නැත්තෝව වසව්. ධර්මයම ආරක්ෂාස්ථාන කොට ධර්මයම පිහිටකොට අනෙක් සරණක් නැත්තෝව වසව්. මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් තමාම ආරක්ෂාස්ථාන කොට තමාම පිහිටකොට, අනෙක් සරණක් නැතිව ධර්මයම ආරක්ෂාස්ථාන කොට ධර්මයම පිහිටකොට අනෙක් සරණක් නැතිව වෙසේද යත්:

මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ කෙළෙස් තවන වීර්යය ඇතිව, යහපත් නුවණින් යුක්තව, සිහි ඇතිව ස්කන්ධ ලෝකයෙහි ඇල්මත් මානසික දුකත් දුරලා කායානුපස්සනා, වෙදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා යන මෙහි යෙදී වාසය කරයි. මහණෙනි, මහණ තෙමේ තමාම ආරක්ෂාස්ථාන කොට, තමාම පිහිට කොට, අනෙක් සරණක් නැතිව, ධර්මයම ආරක්ෂාස්ථාන කොට ධර්මයම පිහිටකොට අනෙක් සරණක් නැතිව වසනුයේ මෙසේය.

මහණෙනි, (බුදුරජාණන් වහන්සේ) නමැති පියාගෙන් උරුමව තමන්ට පැමිණි ගෝචරයෙහි හැසිරෙව්, සිය පියාගෙන් පැමිණි හැසිරිය යුතු ප්‍රදේශයෙහි හැසිරෙන්නාහු ආයුෂයෙන්ද, වර්ණයෙන්ද, සුවයෙන්ද සම්පත්තියෙන්ද, බලයෙන්ද වැඩෙන්නාහුය.

**27.** මහණෙනි, භික්ෂුවගේ ආයුෂයට කාරණය කුමක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ ඡන්ද සමාධිය ප්‍රධාන කොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩයි, වීර්යය සමාධිය ප්‍රධාන කොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩයි. චිත්ත සමාධිය ප්‍රධානකොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩයි. වීමංසා සමාධිය ප්‍රධාන කොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩයි. හෙතෙමේ මේ සතර ඍද්ධි පාදයන් වැඩූ බැවින් ඉදින්

කැමැත්තේ නම් නියම ආයුෂ කාලය හෝ එයට වැඩියක් හෝ සිටින්නේය. මහණෙනි, මේ භික්ෂුවගේ ආයුෂයට කාරණයයි.

28. මහණෙනි, භික්ෂුවගේ වර්ණයට කාරණය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ සිල්වත් වූයේ වෙයි. ප්‍රාතිමොක්ෂ සංවර සීලයෙන් යුක්ත වූයේ ආචාර ගොචර සම්පන්න වූයේ ස්වල්ප මාත්‍ර වරදෙහිද භය දක්නා සුලු වූයේ වාසය කරයි, ශික්ෂා පද සමාදන්ව හික්මෙයි. මහණෙනි, මේ භික්ෂුවගේ වර්ණයට කාරණයයි.

29. මහණෙනි, භික්ෂුවගේ සැපයට කාරණය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ කාමයන්ගෙන් වෙන්ව, අකුශල ධර්මයන් ගෙන් වෙන්ව, විතර්ක සහිත, විචාර සහිත විවෙකයෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. විතර්ක විචාරයන් සන්සිඳවීමෙන් ද්විතීයධ්‍යාන, තෘතීයධ්‍යාන, චතුර්ථධ්‍යාන යන ධ්‍යානවලට පැමිණ වාසය කරයි. මහණෙනි, මේ භික්ෂුවගේ සැපයට කාරණයයි.

30. මහණෙනි, භික්ෂුවගේ සම්පතට කාරණය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දිසා දෙකක්, දිසා තුනක්, දිසා සතරක් එසේ උඩයට සරස සියලු තැන, සියලු ලෝකය මහත්වූ, අප්‍රමාණවූ අවෛරීවූ ක්‍රොධ රහිතවූ මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරයි. එසේම කරුණා සහගත සිතින්ද, මුදිතා සහගත සිතින්ද, උපෙක්ඛා සහගත සිතින්ද එක් දිසාවක්, දිසා දෙකක්, දිසා තුනක්, දිසා සතරක්, උඩ යට සියලු තැන, සියලු ලෝකය පතුරුවා වාසය කරයි. මහණෙනි, මේ භික්ෂුවගේ සම්පතට කාරණයයි.

3. මහණෙනි, භික්ෂුවගේ බලයට කාරණය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ කෙලෙස් නැති කිරීමෙන් කෙලෙස් රහිත අර්හත් ඵලය මේ ආත්මයෙහි ඉතා උසස් ඥානයෙන් අවබොධ කොට එයට පැමිණ වාසය කරයි. මහණෙනි, මේ භික්ෂුවගේ බලයට කාරණයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මහණෙනි, මාර බලය තරම් මැඩපැවැත්වීමට අමාරු අන් බලයක් මම නොදනිමි. එයද මේ අර්හත් බලයෙන් මැඩපැවතේ. මහණෙනි, කුශල ධර්ම සමාදන්ව පැවතීම් හේතුවෙන් මෙසේ පින් වැඩේ. බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කළෝය. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටු වූහ.

**විසිහය වැනිවූ චක්‍රවර්ති සීහනාද සූත්‍රය නිමියේයි.**

---

## 27. අග්ගඤ්ඤ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ මිගාර මාතෘ ප්‍රාසාද නම් පූර්වාරාමයෙහි වැඩවසන්නාහ. එකල වාසෙට්ඨ, භාරද්වාජ නම් සාමණේර දෙනම භික්ෂු භාවය බලාපොරොත්තුවෙමින් භික්ෂූන් සමීපයෙහි වෙසෙත්.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි විවේකයෙන් නැගී සිට ප්‍රාසාදයෙන් බැස (ඊට නැගෙනහිර දික්හි) පහයෙහි සෙවනැල්ල පවත්නා පසුභාගයෙහි අවකාශස්ථානයෙක සක්මන් කළහ. වාසෙට්ඨ නම් සාමණේර තෙමේ සවස් වේලෙහි විවේකයෙන් නැගී සිටියාවූ, පහයෙන් බැස ප්‍රාසාද සෙවනැල්ල පවත්නා අවකාශස්ථානයෙක්හි සක්මන් කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. දැක භාරද්වාජ නම් සාමණේර නමට කථා කළේය. කථා කොට

"ආයුෂ්මත් භාරද්වාජයෙනි, මේ භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි විවෙකයෙන් නැගීසිට පහයෙන් බැස ප්‍රාසාද සෙවනැල්ල පවත්නා අවකාශස්ථානයෙහි සක්මන් කරන්නාහුය. ආයුෂ්මත් භාරද්වාජය, (අපි) යමු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතන්හි පැමිණෙන්නෙමු. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් ධර්ම කථාවක් අසන්නට ලබන්නෙමු නම් ඉතා යහපතැ"යි කීය.

"ඇවැත්නි, එසේය"යි භාරද්වාජ තෙමේ වාසෙට්ඨ හට උත්තර දුන්නේය. එවිට වාසෙට්ඨ භාරද්වාජ දෙදෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හොඳින් වැඳ සක්මන් කරන්නාවූ භාග්‍යවතුන් වහන්සේ අනුව සක්මන් කළාහුය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ වාසෙට්ඨහට කථාකොට මෙසේ කීවාහුය. "වාසෙට්ඨය, තෙපි වනාහි බ්‍රාහ්මණ ජාති ඇත්තෝ වූවහුය. බ්‍රාහ්මණයන් අතුරෙහි කුලසම්පන්න වූවහුය. බ්‍රාහ්මණ කුලයෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි මහණ වූවහුය. වාසෙට්ඨය, කිම? (අන්‍ය) බ්‍රාහ්මණයෝ තොපට අපහාස නොකෙරෙද්ද? හෙළාදැකීම නොකෙරෙද්ද?"

2. "ස්වාමීන් වහන්ස, ඒකාන්තයෙන්ම බමුණෝ අපට අපහාස කෙරෙති. තම තමන්ට සුදුසුවූ සම්පූර්ණවූ අසම්පූර්ණ නොවූ කථාවෙන් හෙළා දැකීම කෙරෙති"යි කීය.

"වාසෙට්ඨය, බ්‍රාහ්මණයෝ තොපට ඒ කෙසේ නම් තම තමන්ට සුදුසුවූ සම්පූර්ණවූ අසම්පූර්ණ නුවූ කථාවෙන් අපහාස කෙරෙද්ද? හෙළා දැකීම කෙරෙද්ද?"

"ස්වාමීනි, බ්‍රාහ්මණයෝ මෙසේ කියති: 'බ්‍රාහ්මණ තෙමේම උතුම් වංශ ඇත්තේය. අන්‍යයෝ හීන වංශ ඇත්තෝය. බ්‍රාහ්මණ තෙමේම පිරිසිදු වංශ ඇත්තේය. බ්‍රාහ්මණයෝම ශුද්ධ වෙති. බ්‍රාහ්මණ නුවූවෝ ශුද්ධ නොවෙති. බමුණෝම මහා බ්‍රහ්මයාගේ පුත්‍රයෝය. (ඔහුගේ) කටින් පහළ වූවාහුය (ඔහු විසින්) හෘදයෙහි තබා වඩන ලද්දාහුය. නොහොත් හෘදයෙහි වැස කටින් නික්මුණාහුය. බ්‍රහ්මයා කෙරෙන් උපන්නාහුය. බ්‍රහ්මයා විසින් මවන ලද්දාහුය. බ්‍රහ්මයාගේම නෑයෝ වෙති. ඒ තෙපි ශ්‍රෙෂ්ඨ වංශය හැරපියා හීනවූ මාර පක්ෂයෙහිවූ බඹහුගේ පාදයෙන් උපන්නාවූ අපිරිසිදුවූ මුඩු මහණහු කෙරෙහි පැවිදිවීම් නම්වූ යම් ඒ හීන වංශයකට පැමිණීමක් ඇද්ද මහබඹහුගේ පාදයෙන් උපන්නාවූ මුඩු මහණහු කෙරෙහි පැවිදිවීම් නම්වූ ඒ හීන වංශයට පැමිණීම තොපට නුසුදුසුයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ස්වාමීනි, බමුණෝ මෙසේ අපට තම තමන්ට සුදුසුවූ සම්පූර්ණවූ අසම්පූර්ණ නුවූ කථාවෙන් අපහාස කෙරෙති. හෙළා දැකීම කෙරෙති.

3. වාසෙට්ඨය, ඒකාන්තයෙන් තොපගේ බ්‍රාහ්මණයෝ මුල සිහි නොකරමින් මෙසේ කියති. එනම්: 'බ්‍රාහ්මණ තෙමේම උතුම් වංශ ඇත්තේ වෙයි. අන්‍යයෝ පහත් වංස ඇත්තෝය. බ්‍රාහ්මණ තෙමේම පිරිසිදු වංස ඇත්තේ වෙයි. අන්‍යයෝ අපිරිසිදු වංශ ඇත්තෝයි. බ්‍රාහ්මණයෝම මහාබ්‍රහ්මයාගේ පුත්‍රයෝය. (ඔහුගේ) කටින් පහළ වූවාහුය. (ඔහු විසින්) හෘදයෙහි තබා වඩන ලද්දාහුය. නොහොත් හෘදයෙහි වැස කටින් නික්මුනාහුය. බ්‍රහ්මයා කෙරෙන් උපන්නාහුය. බ්‍රහ්මයා විසින් මවන ලද්දාහුය. බ්‍රහ්මයාගේම නෑදෑයෝ වෙත්ය' කියායි.

වාසෙට්ඨය, බ්‍රාහ්මණයන්ගේ ඔසප්වූද, දරුගැබ් ඇත්තාවූද, දරුවන් වදන්නාවූද, දරුවන්ට කිරි පොවන්නාවූද, බැමිණියෝ දක්නා ලැබෙති. ඒ බ්‍රාහ්මණයෝ යොනි මාර්ගයෙන්ම උපන්නෝව මෙසේ කියති. 'බ්‍රාහ්මණ තෙමේම උතුම් වංශ ඇත්තේය. අන්‍යයෝ පහත් වංශ ඇත්තෝය. බ්‍රාහ්මණ තෙමේම පිරිසිදු වංශ ඇත්තේය. අන්‍යයෝ අපිරිසිදු වංශ ඇත්තෝය. බ්‍රාහ්මණයෝම සුද්ධ වෙති. බමුණුනුවූවෝ සුද්ධ නොවෙති. බ්‍රාහ්මණයෝම මහාබ්‍රහ්මයාගේ පුත්‍රයෝය. (ඔහුගේ) කටින් පහළවූවාහ. ඔහු විසින් හෘදයෙහි තබා වඩනා ලද්දාහුය නොහොත් හෘදයෙහි වැස කටින් නික්මුනාහුය. බ්‍රහ්මයා විසින් මවන ලද්දාහුය. බ්‍රහ්මයාගේම නෑදෑයෝ වෙත්ය කියායි. ඔහු තුමූ බ්‍රහ්මයාටද බොරුවෙන් හෙළාදකිත්. බොරුද කියත්. බොහෝ පව්ද රැස්කර ගනිත්.

4. "වාසෙට්ඨය, මේ වංශ සතරක් වෙත්. එනම්, ක්ෂත්‍රියයෝය, බ්‍රාහ්මණයෝය, වෛශ්‍යයෝය (වෙළඳුන්ය), ශුද්‍රයෝය (කම්කරුවෝය) කියායි. වාසෙට්ඨය, මේ ලොකයෙහි සමහර ක්ෂත්‍රියයෙක්ද ප්‍රාණඝාත කරන්නෙක් වෙයි. නුදුන් දෙය ගන්නෙක් වෙයි. කාමයෙහි වරදවා හැසිරෙන්නෙක් වෙයි. බොරු කියන්නෙක් වෙයි. කේලාම් කියන්නෙක් වෙයි.

පරුෂවචන කියන්නෙක් වෙයි. හිස් වචන කියන්නෙක් වෙයි. දැඩි ලොභය බහුල කොට ඇත්තෙක් වෙයි. (ක්‍රොධයෙන්) වෙනස්වූ සිත් ඇත්තෙක් වෙයි. මිථ්‍යාදෘෂ්ටි (වැරදි දැකීම්) ඇත්තෙක් වෙයි.

"වාසෙට්ඨය, මෙසේ යම් ධර්මකෙනෙක් අකුසල් වෙද්ද, අකුසල්යයි කියන ලද්දාහුද, වරද සහිත වෙද්ද, වරද සහිතයයි කියන ලද්දාහුද, සෙවනය නොකට යුත්තාහුද, සෙවනය නොකටයුතුයයි කියන ලද්දාහුද, ආර්‍ය්‍යභාවයට නුසුදුසු වෙද්ද, ආර්‍ය්‍යභාවයට නුසුදුසුයයි කියන ලද්දාහුද, අපිරිසිදු වෙත්ද, අපිරිසිදු විපාක ඇත්තාහු වෙත්ද නුවණැත්තන් විසින් ගර්හා කරණ ලද්දාහු වෙත්ද ඒ ධර්මයෝ සමහර ක්ෂත්‍රියයෙකු කෙරෙහිද දක්නා ලැබෙත්.

**5.** "වාසෙට්ඨය, සමහර බ්‍රාහ්මණයෙක්ද ප්‍රාණඝාත කරන්නෙක් වෙයි. නුදුන් දෙය ගන්නෙක් වෙයි. කාමයෙහි වරදවා හැසිරෙන්නෙක් වෙයි. බොරු කියන්නෙක් වෙයි. කේලාම් කියන්නෙක් වෙයි. පරුසවචන කියන්නෙක් වෙයි, හිස් වචන කියන්නෙක් වෙයි. දැඩි ලොභය බහුල කොට ඇත්තෙක් වෙයි. (ක්‍රොධයෙන්) වෙනස්වූ සිත් ඇත්තෙක් වෙයි. මිථ්‍යාදෘෂ්ටි (වැරදි දැකීම්) ඇත්තෙක් වෙයි.

"වාසෙට්ඨය, මෙසේ යම් ධර්මකෙනෙක් අකුසල් වෙද්ද, අකුසල්යයි කියන ලද්දාහුද, වරද සහිත වෙද්ද, වරද සහිතයයි කියන ලද්දාහුද, සෙවනය නොකට යුත්තාහුද, සෙවනය නොකට යුතුයයි කියන ලද්දාහුද, ආර්‍ය්‍යභාවයට නුසුදුසුද, ආර්‍ය්‍යභාවයට නුසුදුසුයයි කියන ලද්දාහුද, අපිරිසිදු වෙත්ද, අපිරිසිදු විපාක ඇත්තාහු වෙත්ද, නුවණැත්තන් විසින් ගර්හා කරණ ලද්දාහු වෙත්ද, ඒ ධර්මයෝ සමහර බ්‍රාහ්මණයෙකු කෙරෙහිද දක්නා ලැබෙති.

**6.** "වාසෙට්ඨය, සමහර වෛශ්‍යයෙක්ද ප්‍රාණඝාත කරන්නෙක් වෙයි. නුදුන් දෙය ගන්නෙක් වෙයි. කාමයෙහි වරදවා හැසිරෙන්නෙක් වෙයි. බොරු කියන්නෙක් වෙයි. කේලාම් කියන්නෙක් වෙයි. පරුස වචන කියන්නෙක් වෙයි.

හිස් වචන කියන්නෙක් වෙයි. දැඩි ලොභය බහුලකොට ඇත්තෙක් වෙයි. (ක්‍රොධයෙන්) වෙනස්වූ සිත් ඇත්තෙක් වෙයි. මිථ්‍යාදෘෂ්ටි (වැරදි දැකීම්) ඇත්තෙක් වෙයි.

"වාසෙට්ඨය, මෙසේ යම් ධර්මකෙනෙක් අකුසල් වෙද්ද අකුසල්යයි කියන ලද්දාහුද, වරද සහිත වෙද්ද, වරද සහිතයයි කියන ලද්දාහුද, සෙවනය නොකට යුත්තාහුද, සෙවනය නොකට යුතුයයි කියන ලද්දාහුද, ආයර්‍ය්‍යභාවයට නුසුදුසුද, ආයර්‍ය්‍යභාවයට නුසුදුසුයයි කියන ලද්දාහුද, අපිරිසිදු වෙත්ද, අපිරිසිදු විපාක ඇත්තාහු වෙත්ද, නුවණැත්තන් විසින් ගර්හා කරණ ලද්දාහු වෙත්ද, ඒ ධර්මයෝ සමහර වෛශ්‍යයෙකු කෙරෙහිද දක්නා ලැබෙති.

7. "වාසෙට්ඨය, සමහර ශුද්‍රයෙක්ද ප්‍රාණඝාත කරන්නෙක් වෙයි. නුදුන් දෙය ගන්නෙක් වෙයි. කාමයෙහි වරදවා හැසිරෙන්නෙක් වෙයි. බොරු කියන්නෙක් වෙයි. කේලාම් කියන්නෙක් වෙයි. පරුෂ වචන කියන්නෙක් වෙයි. හිස් වචන කියන්නෙක් වෙයි. දැඩි ලොභය බහුලකොට ඇත්තෙක් වෙයි. (ක්‍රොධයෙන්) වෙනස්වූ සිත් ඇත්තෙක් වෙයි. මිථ්‍යාදෘෂ්ටි (වැරදි දැකීම්) ඇත්තෙක් වෙයි.

වාසෙට්ඨය, මෙසේ යම් ධර්මකෙනෙක් අකුසල් වෙද්ද, අකුසල්යයි කියන ලද්දාහුද, වරද සහිත වෙද්ද, වරද සහිත යයි කියන ලද්දාහුද, සෙවනය නොකට යුත්තාහුද, සෙවනය නොකට යුතුයයි කියන ලද්දාහුද, ආයර්‍ය්‍යභාවය සිදුකිරීමෙහි අසමර්ථ වෙද්ද, ආයර්‍ය්‍යභාවය සිදුකිරීමෙහි අසමර්ථයයි කියන ලද්දාහුද, අපිරිසිදු වෙත්ද, අපිරිසිදු විපාක ඇත්තාහු වෙත්ද, නුවණැත්තන් විසින් ගර්හාකරණ ලද්දාහු වෙත්ද ඒ ධර්මයෝ සමහර ශුද්‍රයෙකු කෙරෙහිද දක්නා ලැබෙති.

8. "වාසෙට්ඨය, මම ලොකයෙහි සමහර ක්ෂත්‍රියයෙක්ද ප්‍රාණඝාතයෙන් වැළකුනේ වෙයි. නුදුන් දෙය ගැන්මෙන් වැළකුනේ වෙයි. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුනේ වෙයි. බොරුකීමෙන් වැළකුනේ වෙයි. කේලාම් කීමෙන් වැළකුනේ වෙයි. පරුෂ වචන කීමෙන් වැළකුනේ වෙයි. හිස්

වචන කීමෙන් වැළකුනේ වෙයි. දැඩිලොභය බහුල කොට ඇත්තේ නොවෙයි. (ක්‍රොධ වසයෙන්) වෙනස්වූ සිත් ඇත්තේ නොවෙයි. සම්‍යග්දෘෂ්ටි (හරිදැකීම) ඇත්තේවෙයි. වාසෙට්ඨය, එසේ යම් ධර්මකෙනෙක් කුසල්වෙද්ද, කුසල්යයි කියන ලද්දාහුද වරද රහිත වෙද්ද, වරද රහිතයයි කියන ලද්දාහුද, සෙවනය කටයුත්තාහුද සෙවනය කටයුතුයයි කියන ලද්දාහුද, ආයර්‍ය්‍යභාවය සිදුකිරීමෙහි සමර්ථ වෙද්ද ආයර්‍ය්‍යභාවය සිදුකිරීමෙහි සමර්ථයයි කියන ලද්දාහුද, පිරිසිදුවෙද්ද, සැප විපාක ඇත්තාහු වෙද්ද, නුවණැත්තන් විසින් ප්‍රශංසා කරණ ලද්දාහු වෙද්ද, ඒ ධර්මයෝ සමහර ක්ෂත්‍රියයෙකු කෙරෙහිද දක්නා ලැබෙති.

**9.** වාසෙට්ඨය, සමහර බ්‍රාහ්මණයෙක්ද ප්‍රාණඝාතයෙන් වැළකුනේ වෙයි. නුදුන්දෙය ගැන්මෙන් වැළකුණේ වෙයි. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුනේ වෙයි. බොරු කීමෙන් වැළකුනේ වෙයි. කේළාම් කීමෙන් වැළකුනේ වෙයි. පරුස වචන කීමෙන් වැළකුනේ වෙයි. හිස් වචන කීමෙන් වැළකුනේ වෙයි. දැඩි ලොභය බහුලකොට ඇත්තේ නොවෙයි. (ක්‍රොධ වසයෙන්) වෙනස්වූ සිත් ඇත්තේ නොවෙයි. සම්‍යග්දෘෂ්ටි (හරිදැකීම) ඇත්තේ වෙයි. වාසෙට්ඨය, එසේ යම් ධර්ම කෙනෙක් කුසල් වෙත්ද, කුසල්යයි කියන ලද්දාහුද, වරද රහිත වෙද්ද, වරද රහිතයයි කියන ලද්දාහුද, සෙවනය කටයුත්තාහුද, සේවනය කටයුතුයයි කියන ලද්දාහුද, ආයර්‍ය්‍යභාවය සිදු කිරීමෙහි සමර්ථ වෙද්ද, ආයර්‍ය්‍යභාවය සිදු කිරීමෙහි සමර්ථයයි කියන ලද්දාහුද, පිරිසිදු වෙද්ද, සැප විපාක ඇත්තාහු වෙද්ද, නුවණැත්තන් විසින් ප්‍රශංසා කරණ ලද්දාහු වෙද්ද, ඒ ධර්මයෝ සමහර බ්‍රාහ්මණයෙකු කෙරෙහිද දක්නා ලැබෙති.

**10.** "වාසෙට්ඨය, සමහර වෛශ්‍යයෙක්ද ප්‍රාණඝාතයෙන් වැළකුනේ වෙයි. නුදුන් දෙය ගැන්මෙන් වැළකුනේ වෙයි. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුනේ වෙයි. බොරු කීමෙන් වැළකුනේ වෙයි. කේළාම් කීමෙන් වැළකුනේ වෙයි. පරුස වචන කීමෙන් වැළකුනේ වෙයි. හිස් වචන කීමෙන් වැළකුනේ වෙයි. දැඩි ලොභය බහුලකොට ඇත්තේ නොවෙයි. (ක්‍රොධ වසයෙන්) වෙනස්වූ සිත් ඇත්තේ නොවෙයි. සම්‍යග් දෘෂ්ටි

(හරි දැකීම්) ඇත්තේ වෙයි. වාසෙට්ඨය, එසේ යම් ධර්මකෙනෙක් කුසල් වෙත්ද, කුසල්යයි කියන ලද්දාහුද, වරද රහිත වෙද්ද, වරද රහිතයයි කියන ලද්දාහුද, සේවනය කටයුත්තාහුද, සේවනය කටයුතුයයි කියන ලද්දාහුද, ආයඝ්‍යභාවය සිදුකිරීමෙහි සමර්ථ වෙද්ද, ආයඝ්‍යභාවය කිරීමෙහි සමර්ථයයි කියන ලද්දාහුද, පිරිසිදු වෙද්ද, සැප විපාක ඇත්තාහු වෙද්ද, නුවණැත්තන් විසින් ප්‍රශංසා කරණ ලද්දාහුවෙද්ද, ඒ ධර්මයෝ සමහර වෛශ්‍යයෙකු කෙරෙහිද දක්නා ලැබෙති.

11. "වාසෙට්ඨය, සමහර ශුද්‍රයෙක්ද ප්‍රාණඝාතයෙන් වැළකුනේ වෙයි. නුදුන්දෙය ගැන්මෙන් වැළකුනේ වෙයි. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුනේ වෙයි. බොරු කීමෙන් වැළකුනේ වෙයි. කේලාම් කීමෙන් වැළකුනේ වෙයි. පරුෂ වචන කීමෙන් වැළකුනේ වෙයි. හිස් වචන කීමෙන් වැළකුනේ වෙයි. දැඩි ලොභය බහුලකොට ඇත්තේ නොවෙයි. (ක්‍රොධ වසයෙන්) වෙනස්වූ සිත් ඇත්තේ නොවෙයි. සම්‍යග් දෘෂ්ටි (හරි දැකීම්) ඇත්තේ වෙයි. වාසෙට්ඨය, එසේ යම් ධර්ම කෙනෙක් කුසල් වෙත්ද, කුසල්යයි කියනලද්දාහුද, වරද රහිත වෙද්ද, වරද සහිතයයි කියන ලද්දාහුද, සේවනය කටයුත්තාහුද, සේවනය කටයුතුයයි කියන ලද්දාහුද, ආයඝ්‍යභාවය සිදු කිරීමෙහි සමර්ථ වෙද්ද, ආයඝ්‍යභාවය සිදුකිරීමෙහි සමර්ථයයි කියන ලද්දාහුද, පිරිසිදු වෙද්ද, සැප විපාක ඇත්තාහු වෙද්ද, නුවණැත්තන් විසින් ප්‍රශංසා කරණ ලද්දාහු වෙද්ද, ඒ ධර්මයෝ සමහර ශුද්‍රයෙකු කෙරෙහිද දක්නා ලැබෙති.

12. වාසෙට්ඨය, මේ සතර වංශයන් කෙරෙහි නුවණැත්තන් විසින් ගර්හා කරණ ලද්දාවූද, නුවණැත්තන් විසින් ප්‍රශංසා කරණ ලද්දාවූද, පිරිසිදුවූද, අපිරිසිදුවූද, ධර්මයන් මිශ්‍රව පවත්නාකල්හි බ්‍රාහ්මණයෝ "බ්‍රාහ්මණ තෙමේම උතුම් වංශ ඇත්තේය අන්‍යයෝ හීන වංශ ඇත්තෝය. බ්‍රාහ්මණ තෙමේම පිරිසිදු වංශ ඇත්තේය. අන්‍යයෝ අපිරිසිදු වංශ ඇත්තෝය. බ්‍රාහ්මණයෝම ශුද්ධ වෙති. බ්‍රාහ්මණ නුවූවෝ ශුද්ධ නොවෙති. බමුණෝම මහා බ්‍රහ්මයාගේ පුත්‍රයෝය. (ඔහුගේ) මුඛයෙන් පහළවූවාහුය. (ඔහු විසින්) හෘදයෙහි හොවා වඩනලද්දාහුය.

නොහොත් ලෙහි වැස මුඛයෙන් නික්මුනාහුය. බ්‍රහ්මයා කෙරෙන් උපන්නාහුය. බ්‍රහ්මයා විසින් මවන ලද්දාහුය. බ්‍රහ්මයාගේම නෑදෑයෝ වෙත්ය'යි මෙසේ කියද්ද, ඔවුන්ගේ ඒ කථාව නුවැණැත්තෝ නොපිළි ගනිත්. ඊට හෙතු කවරේද? වාසෙට්ඨය, මේ (ක්ෂත්‍රියාදි) සතර වංසයන් අතුරෙන් (එකකට ඇතුළත්වූ) යම් භික්ෂුවක් රහත් වූයේද, නැති කරනලද ආශ්‍රව ඇත්තේ වේද, වාසය කොට නිම කරන ලද බ්‍රහ්මචර්‍ය්‍යා වාස (උතුම් හැසිරීම්) ඇත්තේද, කරනලද සිව් මග කටයුතු ඇත්තේද, බහා තබන ලද ස්කන්ධ බර ඇත්තේද, පිළිවෙලින් පැමිණි ස්වකීය කටයුතු ඇත්තේද, විනාශ කරන ලද භව බන්ධන ඇත්තේද, හොඳින් කරුණු සහිතව දැන කෙලෙසුන් කෙරෙන් මිදුනේ වේද, ඒ පුද්ගල තෙමේ ඔවුන් අතුරෙන් ශ්‍රෙෂ්ඨයයි කියනු ලැබේ. (එයද) ධර්මයෙන්මය, අධර්මයෙන් නොවේ. වාසෙට්ඨය, මේ සත්වයන් පිළිබඳවූ මෙලෙව්හිද පරලෙව්හිද යන දෙක්හිම ධර්මයම ශ්‍රෙෂ්ඨ වෙයි.

"වාසෙට්ඨය, සත්වයන් පිළිබඳවූ මෙලෙව්හිද, පරලෙව්හිද, යම්සේ ධර්මයම ශ්‍රෙෂ්ඨ වේද, එය මේ ආකාරයෙන්ද දත යුතුයි.

13. "වාසෙට්ඨය, පසේනදි කොසොල් රජ තෙම "තමන්ට වඩා උසස් අනෙකෙකු නැනිහෙයින් අනුත්තර නම්වූ ශ්‍රමණභවත් ගෞතම තෙමේ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදි වූයේය"යි දනියි. වාසෙට්ඨය, ශාක්‍යයෝ පසේනදි කොසොල් රජහුට සමාන වංශ ඇත්තාහුය. කොසොල් රජහට යටත්ව පවත්නාහුය. වාසෙට්ඨය, ශාක්‍යයෝ පසේනදි කොසොල් රජහු කෙරෙහි ගරු සැලකිලි පැවැත්වීමද වැඳීමද දැක හුනස්නෙන් නැගීසිටීමද ඇඳිලි බැඳීමද (ඇඟිලි එකට තබා වැඳීම) වත්පිළිවෙත් කිරීම් ආදී ඒ ඒ සුදුසු ක්‍රියාද කෙරෙති. මෙසේ ශාක්‍යයෝ පසේනදි කොසොල් රජහු කෙරෙහි ගරු සැලකිලි පැවැත්වීමය වැඳීමය, දැක හුනස්නෙන් නැගී සිටීමය, ඇඳිලි බැඳීමය, වත් පිළිවෙත් ආදී ඒ සුදුසු ක්‍රියාය යන යමක් කෙරෙද්ද, පසේනදි කොසොල් රජ තෙමේ ඒ ගරු සැලකිලි පැවැත්වීමද, වැඳීමද, දැක හුනස්නෙන් නැගී සිටීමද, ඇඳිලි බැඳීමද, වත් පිළිවෙත් කිරීම් ආදී ඒ ඒ සුදුසු ක්‍රියාද තථාගතයන්වහන්සේට කෙරෙයි.

"ශ්‍රමණගෞතමයන් වහන්සේ පිරිසිදුව උපන්නේ නොවේද, මම පිරිසිදුව නූපන්නේ වෙමි. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බලසම්පන්න නොවේද? මම දුර්වල වෙමි. ශ්‍රමණ ගෞතමයන්වහන්සේ හිත් ප්‍රිය කරන රූපයෙන් යුක්ත නොවේද? මම දුර්වර්ණයෙක් (අවලක්ෂණ රූප ඇත්තෙක්) වෙමි. ශ්‍රමණගෞතමයන් වහන්සේ මහානුභාවසම්පන්න නොවේද, මම ස්වල්ප ආනුභාවඇත්තෙක් වෙමි"යි කියායි. එසේද ඇති කල්හි ධර්මයටම සත්කාර කරන්නේ ධර්මයටම ගරු කරන්නේ ධර්මයටම බුහුමන් කරන්නේ ධර්මයටම පුදන්නේ මෙසේ පසේනදි කොසොල් රජ තෙමේ තථාගතයන්වහන්සේ කෙරෙහි සැලකීමද වැඳීමද දැක හුනස්නෙන් නැගී සිටීමද ඇඳිලි බැඳීමද වත්පිළිවෙත් ආදී ඒ ඒ සුදුසුක්‍රියාද කෙරෙයි.

"වාසෙට්ඨය, සත්වයන් පිළිබඳ මෙලොව්හිද පරලොව්හිද යම්සේ ධර්මය ශ්‍රේෂ්ඨ වේද එය මෙකී කාරණයෙන්ද දතයුතුයි.

14. "වාසෙට්ඨය, තෙපි නොයෙක් ජාති ඇත්තාහුය, නොයෙක් නම් ඇත්තාහුය. නොයෙක් ගොත්‍ර ඇත්තාහුය, නොයෙක් කුලයෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහුය. තෙපි කවරහුදැ'යි විචාරණ ලද්දාහුම 'ශාක්‍ය පුත්‍රවූ ශ්‍රමණයම්හ'යි ප්‍රකාශ කරන්නාහුය. වාසෙට්ඨය, යම් පුද්ගලයෙකුගේ ශ්‍රද්ධාව තථාගතයන් වහන්සේ කෙරෙහි චංචල නොවී පිහිටියාද හටගත් මුල් ඇත්තීද ඒහෙයින්ම දැඩි කොට පිහිටියාද ස්ථිර වූවාද ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලොකයෙහි අන් කිසිවෙකු විසින් හෝ සොලවන්නට නොහැකි වූවාද, ඒ ආයර්‍ය ශ්‍රාවකයා විසින් මේ වචනය කියන්නට සුදුසුය. එනම්, මම භාග්‍යවතුන් වහන්සේගේ පුත්‍ර වෙමි, ඖරස පුත්‍ර වෙමි. මුඛයෙන් පහළවූයේ වෙමි. ධර්මයෙන් පහළවූයේ නම් වෙමි. ධර්ම නිර්මිත නම් වෙමි. (නව ලොකොත්තර ධර්ම නමැති දායාදයට යොග්‍ය හෙයින්) ධර්මදායාද නම් වෙමි"යි කියායි. ඊට හේතු කවරේද, වාසෙට්ඨය, 'ධම්මකාය, යනුද 'බ්‍රහ්මකාය' යනුද 'ධම්මභූත' යනුද, 'බ්‍රහ්මභූත' යනුද තථාගතයන් වහන්සේගේම නම් වන හෙයිනි.

**15.** "වාසෙට්ඨය, යම් හේතුවකින් කිසි කලෙක්හි දීර්ඝ කාලයක්හුගේ ඇවෑමෙන් මේ ලෝකය වැනසේද, එබඳු කාලයක මේ ලොකය වැනසෙන කල්හි බොහෝසෙයින් සත්වයෝ ආභස්සර බ්‍රහ්ම ලොකයෙහි උපදනාහු වෙත්, ඔහු තුමූ එහි (ඕපපාතිකව) මනසින් උපන්නාහු ප්‍රීතියම ආහාරකොට ඇත්තාහු ස්වකීය ශරීරාලොකයෙන්ම බබලන්නාහු අහස්හි හැසිරෙන්නාහු මනොඥ ස්වභාව ඇත්තාහු ඉතා දීර්ඝ කාලයක් සිටිත්. වාසෙට්ඨය, යම් හෙයකින් කිසි කලෙක්හි දීර්ඝ කාලයක්හුගේ ඇවෑමෙන් මේ ලොකය හටගනීද, එබඳු කාලයක් වේ. ලොකය හටගන්නා කල්හි බොහෝසෙයින් සත්වයෝ ආභස්සර බ්‍රහ්මලෝකයෙන් චුතව මේ මනුෂ්‍ය ලොකයට පැමිණෙති, ඔහු තුමූ සිතින්ම (ඕපපාතිකව) උපන්නාහු ප්‍රීතියම ආහාර කොට ඇත්තාහු ස්වකීය ශරීරාලොකයෙන්ම බබලන්නාහු අහස්හි හැසිරෙන්නාහු මනොඥ ස්වභාව ඇත්තාහු ඉතා දීර්ඝ කාලයක් සිටිත්.

"වාසෙට්ඨය, එකල (සියළු සක්වළම) එකම ජලයක්ව අඳුරුව පවත්නේය. තද කළුවර වෙයි. සඳ හිරු දෙදෙන නොපෙණෙති. ග්‍රහතාරකාවෝ නොපෙණෙති. රෑදාවල් නොපෙණෙති, මාස අර්ධ මාසයෝ නොපෙණෙති. ඍතුභෙද හා අවුරුදු භෙද සහ ස්ත්‍රිය පුරුෂය යන භෙදයක් නොපෙණෙයි". සත්වයෝය, සත්වයෝය යන කොටසටම ඇතුළත් වෙති.

**16.** "වාසෙට්ඨය, ඉක්බිත්තෙන් කිසි කලෙක්හි දීර්ඝ කාලයක්හුගේ ඇවෑමෙන් ඒ සත්වයන්ට ජලයෙහි රස පොළොව පිහිටන්නීය."

'යම්සේ උණුකරනලද කිරි නිවෙන කල්හි මතුයෙහි යොදයක් වේද එපරිද්දෙන්ම (රස පොළොව) පහළ විය. ඒ රස පොළොව වර්ණ සම්පන්න විය. සුවඳින් යුක්ත විය. රසයෙන් යුක්ත විය. යහපත් ගිතෙල් හෝ යහපත් වෙඬරු හෝ යම්සේද එසේ වර්ණ සම්පන්න විය. පිළව් නැති දඬුවැල් බෑ මීයක් යම් සේද එබඳු රස ඇත්තීද විය."

වාසෙට්ඨය, එවිට ආශාව අධික එක්තරා සත්වයෙක් "පින්වත්නි, මේ කුමක් නම් වන්නේදැයි රස පොළොව ඇඟිල්ලෙන් ගෙණ රස බැලුයේය. රස පොළොව ඇඟිල්ලෙන් ගෙන රස බැලූ ඔහුගේ ආශාව වැඩි විය. ඔහුට එහි තද ආශාවද පහළ විය. වාසෙට්ඨය, අන්‍ය සත්වයෝද ඔහුගේ ක්‍රියාවට අනුව යාමෙන් රස පොළොව ඇඟිල්ලෙන් ගෙණ රස බැලුවාහුය. රස පොළොව ඇඟිල්ලෙන් ගෙන රස බලන්නාවූ ඔවුන්ගේ රස නහර පිණාගියේය. ඔවුන්ට එහි තද ආශාවද පහළ විය. වාසෙට්ඨය, එවිට ඒ සත්වයෝ රස පොළොව අතින් ගුළිකොට පිඩු පිඩු වශයෙන් කඩා අනුභවකරන්ට පටන්ගත්හ. වාසෙට්ඨය, යම් කලෙක්හි සත්වයෝ රස පොළොව ගුළි කොට පිඩු පිඩු වසයෙන් කඩා අනුභවකරන්ට පටන් ගත්තාහුද, එකල්හි ඒ සත්වයන්ගේ ශරීරාලොකය නැතිවී ගියේය. ශරීරාලොකය නැතිවීගිය කල්හි සඳ හිරු දෙදෙන පහළ වූහ. සඳ හිරු පහළවූ කල්හි ග්‍රහ තාරකාද සෙසු තාරකාරූපයෝද පහළ වූහ. ග්‍රහ තාරකා හා සෙසු තාරකා පහළවූ කල රෑදාවල් පෙනුනාහුය. රෑ දාවල් ප්‍රකටවූ කල්හි මාස අර්ධ මාසයෝ ප්‍රකට වූහ. මාස අර්ධමාසයන් පෙනෙන කල්හි ඍතු අවුරුදු ප්‍රකට වූහ. වාසෙට්ඨය, මෙපමණෙකින් මේ ලොකය නැවත හට ගත්තේ වෙයි.

17. "වාසෙට්ඨය, ඉක්බිත්තෙන් ඒ සත්වයෝ රස පොළොව අනුභව කරමින් එයම කමින් එයම ආහාර කොට ඇතිව බොහෝ දීර්ඝ කාලයක් සිටියාහුය. වාසෙට්ඨය, යම් යම් පරිද්දෙකින් ඒ සත්වයෝ රස පොළොව අනුභව කරමින් එයම කමින් එයම ආහාර කොට ඇතිව බොහෝ දීර්ඝ කාලයක් සිටියාහුද ඒ ඒ පරිද්දෙන් ඒ සත්වයන්ගේ ශරීරයෙහි රළු ගතියද ඇති විය. වර්ණයාගේ වෙනස්වීමද පෙනුනේය. සමහර සත්ව කෙනෙක් වර්ණවත් (ලක්ෂණ) වෙති. සමහර සත්ව කෙනෙක් දුර්වර්ණ (අවලක්ෂණ) වෙති. ඔවුන් අතුරෙහි යම් ඒ සත්ව කෙනෙක් වර්ණවත් වෙද්ද ඔහු තුමූ 'අපි ඔවුන්ට වඩා අතිශයින් වර්ණවත් වෙමු. අපට වඩා මොහු අතිශයින් දුර්වර්ණයහ"යි දුර්වර්ණ සත්වයන්ට අවමන් කෙරෙත්. වර්ණය නිසා උපන් අධික මාන

හෙතුවෙන් ඔවුන්ගේ රස පොළොව නැතිවී ගියේය. රස පොළොව නැතිව ගිය කල ඔහු එක්රැස් වූහ. එක්රැස්වී "අහෝ රසය, අහෝ රසය"යි ඔවුනොවුන් කථාකළහ. (ඒ එසේමැයි) මෙකලද මිනිස්සු කිසියම් මිහිරි රසයක් ලැබ 'අහෝ රසය, අහෝ රසය'යි කියති. එම පුරාණ ලොකොත්පත්ති වංශ කථාව මෙසේ ඇති විය. එහෙත් ඒ පිළිබඳ අර්ථය නොදනිත්මය.

"වාසෙට්ඨය, ඉක්බිති ඒ සත්වයන්ගේ රසපොළොව නැතිවී ගිය කල (බිම්හතු) ඔජා සහිත මොලොක්පස පහළවූයේය. යම්සේ නයිහතු පහළවන්නේද එමෙනි. එය වර්ණ සම්පන්න විය. සුවඳින් යුක්ත විය. රසයෙන් යුක්ත විය. යහපත්වූ ගිතෙල් හෝ යහපත්වූ වෙඬරු හෝ යම්සේ වේද, එබඳු පැහැඇත්තේ විය. පිළවු නැති දඬුවල් බෑ මීයක් යම්සේ වේද, එබඳු රස ඇත්තේ විය. වාසෙට්ඨය, එවිට ඒ සත්වයෝ බිම්හතු (බිම් පතුරු) අනුභව කරන්නට පටන්ගත්තාහුය. ඔව්හු ඒ බිම්හතු (බිම්පතුරු) අනුභවකරමින් එයම ආහාරකොට ඇතිව බොහෝ දීර්ඝ කාලයක් සිටියාහුය.

18. "වාසෙට්ඨය, යම් යම් පරිද්දෙකින් ඒ සත්වයෝ බිම්හතු (බිම්පතුරු) අනුභවකරමින් එයම ආහාරකොට ඇතිව බොහෝ දීර්ඝ කාලයක් සිටියාහුද, ඒ ඒ පරිද්දෙන් ඒ සත්වයන්ගේ ශරීරයන්හි රළු බවද වැඩිවිය. වර්ණය අඩු බවද පෙණුනේය. සමහර සත්ව කෙනෙක් වර්ණවත් වෙති. සමහර සත්ව කෙනෙක් දුර්වර්ණ වෙති. ඔවුන් අතුරෙහි යම් ඒ සත්ව කෙනෙක් වර්ණවත් වෙත්ද ඔහු තුමූ 'අපි මොවුන්ට වඩා අතිශයින් වර්ණවත් වෙමු. අපටවඩා මොහු අතිශයින් දුර්වර්ණයහ'යි දුර්වර්ණ සත්වයන් හෙලා දකිත්. වර්ණය නිසා උපන් මහත් මාන හෙතුවෙන් නැවත නැවත උපදනා මහත් මාන ස්වභාවය ඇති ඔවුන්ගේ බිම්හතු (බිම්පතුරු) නැතිවී ගියේය. බිම්හතු (බිම්පතුරු) නැතිවී ගිය කල බදාලතා නම්වූ වැල්ජාතියක් පහළවිය. නාලිකා (විලපලා) යම්සේ නම් එපරිද්දෙන් පහළ විය. ඒ බදාලතා නම් වැල්වර්ගය වර්ණවත් විය, සුවඳින් යුක්ත විය. රසවත් විය, යහපත්වූ ගිතෙල් හෝ යහපත්වූ වෙඬරු හෝ යම්සේ වේද, එබඳු පැහැඇත්තේ

විය. පිළව් නැති දඬුවැල් බෑ මීයක් යම්සේ වේද එබඳු රස ඇත්තේ විය.

"වාසෙට්ඨය, එවිට ඒ සත්වයෝ බදාලතා නම් වැල් ජාතිය අනුභව කරන්නට පටන් ගත්හ. ඔහු ඒ බදාලතා නම් වැල් වර්ගය අනුභව කරමින් එයම ආහාර කොට ඇතිව බොහෝ දීර්ඝ කාලයක් සිටියාහුය.

"වාසෙට්ඨය, යම් යම් පරිද්දෙකින් ඒ සත්වයෝ බදාලතා නම් වැල් ජාතිය අනුභව කරමින් එයම අහාර කොට ඇතිව බොහෝ දීර්ඝ කාලයක් සිටියාහුද ඒ ඒ පරිද්දෙන් ඒ සත්වයන්ගේ ශරීරයෙහි රළු බවද බොහෝ සෙයින් වැඩිවිය. වර්ණය අඩු බවද පෙනුනේය. සමහර සත්ව කෙනෙක් වර්ණවත් වෙති. සමහර සත්ව කෙනෙක් වර්ණය නැත්තෝ වෙති. ඔවුන් අතුරෙහි යම් ඒ සත්ව කෙනෙක් වර්ණවත් වෙත්ද ඔහු "අපි මොවුන්ට වඩා බොහෝ වර්ණවත් වෙමු. අපට වඩා මොහු බොහෝ වර්ණයෙන් අඩුය"යි දුර්වර්ණ සත්වයන් හෙලා දකිත්. වර්ණය නිසා උපන් මහත් මාන්න හේතුවෙන් නැවත නැවත උපදනා මහත් මාන්න ස්වභාවය ඇති ඔවුන්ගේ බදාලතා නැතිවී ගියේය. බදාලතා නම් වැල් ජාතිය නැතිවී ගිය කල ඔහු එක්ව රැස්වූහ. එක් රැස්ව 'අපට බදාලතා නම් වැල් ජාතියක් විය. දැන් අපගේ ඒ බදාලතා නම් වැල් ජාතිය ඒකාන්තයෙන් නැතිවී ගියේය"යි ඔවු නොවුන් කථා කළාහුය. මෙකලද මිනිස්සු කිසියම් දුකකින් පීඩාලද්දාහු "අපට ඒකාන්තයෙන් යමක් වී නම් එය පිරිහුනේයයි කියති. මෙසේ එම පුරාණ ලොකොත්පත්ති වංශ කථාවට අනුව යෙති. ඒ පිළිබඳ අර්ථය නොදනිත්මය.

19. "වාසෙට්ඨය, එවිට ඒ සත්වයන්ගේ බදාලතා නම් වැල් ජාතිය නැතිවී ගියකල නොසානලද භූමියෙහි උපන්නාවූ කුඩු රහිතවූ දහයිය, (පොතු) රහිතවූ සුවඳ ඇත්තාවූ සහල්ම ඵලකොට ඇත්තාවූ හැල් පහළ වූයේය. යම් ඒ සුවඳ හැල් කොටසක් සවස් වේළෙහි සවස බත පිණිස හැර ගණිද්ද උදය ඒ කොටස පැසී සිටියේ වේ, නැවත වැඩුනේ වේ. උදෑසන උදය බතට යම් ඒ සුවඳ හැල් කොටසක් හැර ගනිද්ද, සවස ඒ කොටස

පැසී සිටියේ වේ. නැවත වැඩුනේ, ගත් තැන නොපෙනී සිටින්නේ වේ. ධාන්‍යයන්ගේ එසේ නොඅඩු බවම පැණෙයි.

"වාසෙට්ඨය, එවිට නොසාන ලද භූමියෙහි හටගත්තාවූ හැල් අනුභව කරමින් එයම ආහාර කොට ඇතිව බොහෝ දීර්ඝ කාලයක් සිටියාහුය.

**20.** "වාසෙට්ඨය, යම් යම් පරිද්දෙකින් ඒ සත්වයෝ නොසානලද භූමියෙහි හටගත්තාවූ සුවඳහැල් අනුභවකරමින් එයම ආහාර කොට ඇතිව බොහෝ දීර්ඝ කාලයක් සිටියාහුද, ඒ ඒ පරිද්දෙන් ඒ සත්වයන්ගේ ශරීරයෙහි බොහෝ සෙයින් රළු බව වැඩි විය. වර්ණය අඩු බවද පෙනුණේය. පෙර යමෙක් ස්ත්‍රී වූවාද ඇයට ස්ත්‍රී ලකුණු පහළ විය. (පෙර) යමෙක් පුරුෂ වූයේද ඔහුට පුරුෂ ලකුණු පහළවිය. ස්ත්‍රී තොමෝද බොහෝ වේලාවක් පුරුෂයා දෙස බලයි. පුරුෂ තෙමේද ස්ත්‍රිය දෙස බලයි. මෙසේ බොහෝ වේලාවක් ඔවුනොවුන් දෙස බලන්නාවූ ඒ සත්වයන්ට කාම රාගය ඇති විය. ශරීරයෙහි රාග පරිදාහය උපන්නේය. ඒ සත්වයෝ රාග පරිදාහය හෙතුකොට මෙවුන්දම් සෙවනය කළහ. වාසෙට්ඨය, ඒ කාලයෙහි යම් ඒ සත්වයෝ මෙවුන්දම් සෙවනය කරන්නාවූ සත්වයන් දකිත්ද, (එකල්හි) සමහර කෙනෙක් පස් දමා ගසත්. සමහර කෙනෙක් අළු දමා ගසත්. සමහර කෙනෙක් ගොම වැනි දේ දමා ගසත්. අපිරිසිදු තැනැත්තිය නැසෙව. අපිරිසිදු තැනැත්තිය නැසෙව, කෙසේ නම් (එක්) සත්වයෙක් (අනෙක්) සත්වයෙකුට මෙබන්දක් කරන්නේදැයි කියායි. මෙකලද සමහර ජනපදයන්හි ස්ත්‍රියක ගෙනයනු ලබන කල්හි සමහර කෙනෙක් පස් දමා ගසත්. සමහර කෙනෙක් අළු දමා ගසත්. සමහර කෙනෙක් ගොම දමා ගසත්. මෙසේ එම පුරාණ ලොකොත්පත්ති වංශ කථාවට අනුව යෙති. ඒ පිළිබඳ අර්ථය නොදනිත්මය.

**21.** "වාසෙට්ඨය, ඒ කාලයෙහි යමක් අධර්මයයි සම්මත වීද, එය දැන් ධර්මයයි සම්මත වෙයි. වාසෙට්ඨය, ඒ කාලයෙහි යම් සත්වයෝ මෙවුන්දම් සෙවනය කෙරෙද්ද, ඔහු තුමූ මසකුදු දෙමසකුදු ගමකට හෝ නියම්ගමකට වදින්නට (අවසර)

නොලබති. වාසෙට්ඨය, යම් හේතුවකින් ඒ සත්වයෝ ඒ කාලයෙහි බොහෝ වේලාවක් මෛථුන්දම් සෙවනය කටයුතු බවට පැමිණියාහුද එකල්හි ඒ මෛථුන්දම් නම්වූ අසද්ධර්මය සඟවනු පිණිස ගෙවල් කරන්නට පටන්ගත්හ.

22. වාසෙට්ඨය, එකල්හි එක්තරා අලස ස්වභාව ඇති සත්වයෙකුට මෙබඳු අදහසක් විය. "පින්වත්නි, සවස බත පිණිස සවසද, උදය බත පිණිස උදෑසනද (සුවඳ) හැල් ගෙනෙමින් මම කුමට වෙහෙසෙම්ද, සවස හා උදෑසන බත් පිණිස එකවරම හැල් ගෙණ එන්නෙම් නම් යෙහෙකි" කියායි "වාසෙට්ඨය, එවිට ඒ සත්වතෙමේ සවස හා උදය බත් පිණිස එකවරම හාල් ගෙණ ආයේය. වාසෙට්ඨය, ඉක්බිත්තෙන් එක්තරා සත්වයෙක් ඒ සත්වයා යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, ඒ සත්වයාට මේ කාරණය කීයේය. පින්වත් සත්වය, එව, හැල් ගෙණ ඒම පිණිස යන්නෙමු"යි කීය. පින්වත් සත්වය, කම් නැත. (මට ඕනෑ නැත) මවිසින් සවස හා උදය බත පිණිස එක්වරම හැල් ගෙණඑන ලදැ'යි කීයේය. වාසෙට්ඨය, එවිට ඒ සත්ව තෙම ඒ එක (එකවර හැල් ගෙණ ආ) දෘෂ්ටානුගතියට (දුටු දේ අනුව යාමට) පැමිණෙන්නේ "පින්වත්නි, මෙසේ යහපතැ"යි කියා එක්වරම දෙදවසක් පිණිස (දෙදවසකට සෑහෙන තරම්) හැල් ගෙණ ආයේය. වාසෙට්ඨය, ඉක්බිත්තෙන් එක්තරා සත්වයෙක් ඒ සත්වයා යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, ඒ සත්වයාට මෙකරුණ කීයේය. "පින්වත් සත්වය, එව. හැල් ගෙණ එනු පිණිස යන්නෙමු"යි කීය. "පින්වත් සත්වය, කම් නැත. මා විසින් දෙදවසක ප්‍රයොජනය පිණිස හැල් එකරවම ගෙණඑනලදැ"යි කීයේය. වාසෙට්ඨය, එවිට ඒ සත්වතෙම ඒ (හැල් ගෙණ ආ) සත්වයාගේ දෘෂ්ටානුගතියට (දුටු දේ අනුව යාමට) පැමිණෙන්නේ "පින්වත්නි, මෙසේත් යහපතැ"යි කියා සතර දවසක් පිණිස හැල් එකවරම ගෙණ ආයේය. වාසෙට්ඨය, එවිට එක්තරා සත්වයෙක් ඒ (හැල් ගෙණ ආ) සත්වයා යම් තැනෙක්හිද එතන්හි පැමිණියේය. පැමිණ ඒ සත්වයාට මෙ කරුණ කීයේය. පින්වත් සත්වය, එව හැල් ගෙණ එනු පිණිස යන්නෙමු"යි කීය.

"පින්වත් සත්වය, කම් නැත. මා විසින් සතර දවසක ප්‍රයෝජනය පිණිස එකවරම හැල් ගෙණ එන ලදැ"යි කීයේය. වාසෙට්ඨය, ඉක්බිත්තෙන් ඒ සත්වතෙම ඒ (හැල් ගෙණආ) සත්වයාගේ දෘෂ්ටානුගතියට (දුටු දේ අනුව යාමට) පැමිණෙන්නේ "පින්වත්නි, මෙසේත් යහපතැ"යි කියා අටදවසක් පිණිස ඇල්වී එක වරම ගෙණ ආයේය. වාසෙට්ඨය, යම් කලෙක්හි ඒ සත්වයෝ හැල් (ගෙණවුත්) කල් තබා ගෙණ පාවිච්චි කරන්නට පටන්ගත්තාහුද එකල්හි කුඩුද සහල් වසා සිටියේය, දහයියා (පොතු) ද සහල් වසා සිටියේය. කපනලද ධාන්‍යයද නැවත නොවැඩුනේය. කපනලද තැන් එසේ අඩුවම පෙනුනේය. ඇල්වී පඳුරු පඳුරුව සිටියාහුය.

23. "වාසෙට්ඨය, එවිට ඒ සත්වයෝ එක්රැස්වූහ. එක්රැස්ව ඔවුනොවුන් (මෙසේ) කථා කළාහුය. "පින්වත්නි, ඒකාන්තයෙන් පාප ධර්මයෝ සත්වයන් කෙරෙහි පහළවූහ. අපි පෙර (ඖපපාතිකව) මනසින්ම පහළවූම්හ. ප්‍රීතියම ආහාර කොට ඇත්තමෝ ස්වකීය ශරීරාලොකයෙන් බබලන්නමෝ අහස්හි හැසිරෙන්නමෝ අතිශයින්ම ප්‍රීතිස්වභාව ඇත්තමෝ බොහෝ දීර්ඝ කාලයක් සිටියෙමු. කිසි කලෙක්හි දීර්ඝ කාලයක්හුගේ ඇවෑමෙන් ඒ අපට රස පෘථිවිය ජලයෙහි පිහිටියාය. ඒ රස පෘථිවිතොමෝ වර්ණවත් විය. සුවඳින් යුක්ත වීය. රසවත් වීය. ඒ අපි රස පොළොව අතින් ගුලි කොට පිඩු වසයෙන් කඩ කඩා කන්නට පටන්ගතුම්හ. රස පොළොව අතින් ගුලි කොට පිඩුවශයෙන් කඩ කඩා කන්නට පටන්ගත් ඒ අපගේ ස්වකීය ශරීරාලොකයෙන් බබලන බව නැතිවී ගියේය. ස්වකීය ශරීරාලොකයෙන් බබලන බව නැතිවීගිය කල සඳ හිරු දෙදෙන පහළවූහ. සඳ හිරු දෙදෙන පහළවූ කල්හි ග්‍රහ තාරකාද අනෙක් තාරකාරූපයෝද පහළවූහ. ග්‍රහතාරකා හා අනෙක් තාරකාරූපයන් පහළවූ කල්හි (රෑ දාවල්) ප්‍රකටවූහ. රෑ දාවල් පෙනෙන කල්හි මාස අර්ධමාසයෝ ප්‍රකටවූහ. මාස අර්ධ මාසයන් පෙනෙන කල්හි ඍතු අවුරුදු ප්‍රකටවූහ. ඒ අපි රස පොළොව අනුභව කරමින් එයම ආහාරකොට ඇත්තමෝ බොහෝ දීර්ඝ කාලයක් සිටියෙමු. ලාමකවූ අකුශල ධර්මයන්ගේ

පහළවීමෙන් ඒ අපගේ රස පොළොව නැතිවී ගියේය. රස පොළොව නැතිවී ගිය කල බිම් හතු පහළවිය. ඒ බිම්හතු (බිම්පතුරු) වර්ණවත් වූයේය. සුවඳින් යුක්ත වූයේය, රසවත් වූයේය, ඒ අපි බිම්හතු (බිම් පතුරු) අනුභවකරන්නට පටන්ගතුම්හ. ඒ අපි බිම්හතු (බිම්පතුරු) අනුභව කරමින් එයම ආහාර කොට ඇත්තමෝ බොහෝ දීර්ඝ කාලයක් සිටියෙමු. ලාමකවූ අකුශල ධර්මයන්ගේ පහළවීමෙන් ඒ අපගේ බිම්හතු (බිම් පතුරු) නැතිවී ගියේය. බිම්හතු (බිම් පතුරු) නැතිවී ගිය කල බදාලතා නම් මිහිරි රස ඇති වැල් ජාතිය පහළ විය. ඒ බදාලතා තොමෝ වර්ණවත් වූවාය. සුවඳින් යුක්ත වූවාය. රසවත් වූවාය. ඒ අපි බදාලතා නම් මිහිරි රස ඇති වැල් ජාතිය කන්නට පටන්ගතුම්හ. ඒ අපි ඒ බදාලතාවැල් අනුභව කරමින් එයම ආහාර කොට ඇත්තමෝ බොහෝ දීර්ඝ කාලයක් සිටියෙමු. ලාමකවූ අකුශල ධර්මයන්ගේ පහළවීමෙන් ඒ අපගේ බදාලතා නම් වැල් ජාතිය නැතිවී ගියේය. බදාලතා වැල් නැතිවී ගිය කල නොසානලද භූමිභාගයෙහි උපන්නාවූ කුඩු රහිතවූ දහයියා (පොතු) රහිතවූ පිරිසිදුවූ සුවඳ හමන්නාවූ පිරිසිදු සහල්ම ඵල කොට ඇත්තාවූ හැල් පහළ වූයේය. සවස් වේලෙහි සවස බත පිණිස යම් ඒ සුවඳ හැල් කොටසක් හැර ගණිමුද උදෑසන ඒ කොටස පැසී සිටියේ වේ. නැවත වැඩුනේ වේ. ස්වභාවයෙන්ම ගත් තැන නොපෙනී සිටියේ වේ. උදෑසන උදය බත පිණිස යම් ඒ සුවඳ හැල් කොටසක් හැර ගණිමුද සවස ඒ කොටස පැසී සිටියේ වෙයි. නැවත වැඩුනේ වෙයි. ස්වභාවයෙන්ම ගත්තැන නොපෙනී සිටියේ වෙයි. ඒ අපි නොසානලද බිම්හි හටගත්තාවූ හැල් අනුභව කරමින් එයම ආහාර කොට ඇත්තමෝ බොහෝ දීර්ඝකාලයක් සිටියෙමු. ලාමකවූ අකුශල ධර්මයන්ගේ පහළවීමෙන් කුඩුද ඒ අපගේ සහල් වසා සිටියේය. දහයියා (පොතු) ද සහල් වසා සිටියේය. කපනලද ධාන්‍යද නැවත නොවැඩුනේය. කපන ලද කපන ලද තැන් එසේ අඩුවම පෙනුනේය. ඇල්වී පඳුරු පඳුරුව සිටියාහුය. (එහෙයින්) අපි ඇල්වී බෙදා ගන්නෙමු නම් මායිම් තබා ගන්නෙමු නම් ඉතා යෙහෙකැ"යි කියායි. වාසෙට්ඨය, ඉක්බිත්තෙන් ඒ සත්වයෝ ඇල්වී බෙදා ගත්හ, මායිම් තබාගත්හ.

**24.** "වාසෙට්ඨය, එවිට ලොල ස්වභාව ඇති එක්තරා සත්වයෙක් ස්වකීය කොටස ආරක්ෂා කරන්නේ තමහට නුදුන්නාවූ එක්තරා කොටසක් රැගෙණ (සොරකම් කොට ගෙණ) පාවිච්චි කෙළේය. ඒ මේ සත්වයා අල්වා ගත්තාහුය. අල්වා ගෙණ මෙසේ කීවාහුය. "පින්වත් සත්වය, ඒකාන්තයෙන් පාපකර්මයක් කෙරෙහිය. යම් හෙයකින් තමාගේ කොටස ආරක්ෂා කරමින් තමහට නුදුන්නාවූ එක්තරා කොටසක් රැගෙණ පාවිච්චි කිරීමෙනි. පින්වත් සත්වය, නැවත එසේ නොකරව"යි කීවාහුය. "පින්වත්නි එසේය'යි ඒ සත්ව තෙම උත්තර දුන්නේය. වාසෙට්ඨය, දෙවන වාරයෙහිද ඒ සත්වතෙම ස්වකීය කොටස ආරක්ෂා කරන්නේ තමහට නුදුන්නාවූ එක්තරා කොටසක් රැගෙණ (සොරකම් කොටගෙණ) පාවිච්චි කළේය. ඒ සත්වයා අල්වා ගත්තාහුය. අල්වා ගෙණ මෙසේ කීවාහුය. "පින්වත් සත්වය, ඒකාන්තයෙන් පාපකර්මයක් කෙරෙහිය. යම් හෙතුවකින් තමාගේ කොටස ආරක්ෂා කරන්නේ තමහට නුදුන්නාවූ එක්තරා කොටසක් රැගෙණ පාවිච්චි කිරීමෙනි. පින්වත් සත්වය, නැවත එසේ නොකරව"යි කීවාහුය. "පින්වත්නි, එසේය"යි ඒ සත්වතෙම උත්තර දුන්නේය. වාසෙට්ඨය, තුන්වන වාරයෙහිද ඒ සත්ව තෙම තමාගේ කොටස ආරක්ෂා කරන්නේ තමහට නුදුන්නාවූ එක්තරා කොටසක් රැගෙණ පාවිච්චි කෙළේය. ඒ මේ (සොරකම් කළ) සත්වයා අල්වා ගත්තාහුය. අල්වා ගෙණ මෙසේ කීවාහුය, "පින්වත් සත්වය, ඒකාන්තයෙන් පාපකර්මයක් කෙරෙහිය. යම් හෙතුවකින් තමාගේ කොටස ආරක්ෂා කරන්නේ තමාට නුදුන්නාවූ එක්තරා කෙටසක් රැගෙණ පාවිච්චි කිරීමෙනි. "පින්වත් සත්වය, නැවත මෙසේ නොකරව"යි සමහර කෙනෙක් අතින් තැලූහ, සමහර කෙනෙක් ගල්කැටවලින් ගැසූහ, සමහර කෙනෙක් දණ්ඩෙන් ගැසූහ. වාසෙට්ඨය, එතැන් පටන් (ලොකයෙහි) අන්සතු නුදුන් දෙය ගැණීම පහළ විය. (අන්‍යයන්ට) අපහාස කිරීම පහළවිය. බොරු කීම පහළ විය. (සත්ව හිංසා පිණිස) දඬු ගැණීම පහළ විය.

වාසෙට්ඨය, එවිට ඒ සත්වයෝ රැස්වූහ. රැස්ව ඔවුනොවුන් (මෙසේ) කථා කළාහුය. "පින්වත්නි, යම් හේතුවකින් හොරකම්

කිරීම පෙනේද, ගර්හා කිරීම පෙනේද, බොරු කීම පෙනේද, අනුන්ට හිංසා පිණිස දඬු ගැණීම පෙනේද, එසේ ඒකාන්තයෙන් සත්වයන් කෙරෙහි පාප කර්මයෝ පහළවූහ. අපි එක් සත්වයෙකු සම්මත කරගන්නෙමු නම් යෙහෙක හෙතෙම අපට මනාකොට ප්‍රකාශ කටයුත්තක් ප්‍රකාශ කරන්නේය. ගැරහිය යුත්තහුට හොඳින් ගරහන්නේය. නෙරපිය යුත්තෙකු හොඳින් නෙරපන්නේය. අපි ඔහුට ඇල්වී කොටසක් (ඒ පිණිස) දෙමු" කියායි.

25. "වාසෙට්ඨය, එවිට ඒ සත්වයෝ ඔවුන් අතුරෙන් යමෙක් ඉතා උතුම් රූප ඇත්තේ වීද, බොහෝ ලක්ෂණ වීද බොහෝ පැහැදීම ගෙණ දෙන්නේ වීද, ඉතා මහත් ආනුභාව ඇත්තේ වීද, ඒ සත්වයා කරා පැමිණ මෙසේ කීවාහුය, "පින්වත් සත්වය, (මෙහි) එව හොඳින් ප්‍රකාශකටයුත්ත ප්‍රකාශකරව, ගර්හා කටයුත්තහුට හොඳින් ගර්හාකරව, නෙරපිය යුත්තහු හොඳින් නෙරපව, අපි තට ඇල්වීවලින් කොටසක් දෙන්නෙමුයි" කීවාහුය. වාසෙට්ඨය, පින්වත්නි, එසේයයි (හොඳයකියා) ඒ සත්ව තෙම ඒ සත්වයන්ට උත්තරදී ප්‍රකාශ කටයුත්ත හොඳින් ප්‍රකාශ කෙළේය. ගැරහිය යුත්තහුට හොඳින් ගැරහුයේය. නෙරපිය යුත්තහු හොඳින් නෙරපුයේය. ඔහුතුමූ ඒ සත්වයාට ඇල්වීවලින් කොටසක් දුන්නාහුය. "වාසෙට්ඨය, එසේ මහජනයා විසින් සම්මත කරණ ලද්දේය යන අර්ථයෙන් මහාසම්මතය, මහාසම්මතයයි කියා පළමුවන නාම (ව්‍යවහාර)ය ඇතිවිය වාසෙට්ඨය, ක්ෂෙත්‍රයන්ට (ඉඩම්වලට) අධිපතිය යන අර්ථයෙන් ක්ෂත්‍රියය ක්ෂත්‍රිය යයි කියා දෙවන නාම (ව්‍යවහාර)ය විය. වාසෙට්ඨය, ධර්මයෙන් අන්‍ය සත්වයන් පිණවයි යන අර්ථයෙන් රජය, රජය යන තුන්වන නාමය ඇතිවිය. වාසෙට්ඨය, මෙසේ අග්‍රයයි දන්නා ලද්දාවූ ලොකොත්පත්ති වංශ කථාවෙන් මේ ක්ෂත්‍රිය සමූහයාගේ පහළවීම වූයේය, ඒ සත්වයන් සම්බන්ධවම වේ. අන්‍ය සත්වයන් සම්බන්ධව නොවේ. සමානවූ සත්වයන් සම්බන්ධවම වේ. අසමාන සත්වයන් සම්බන්ධව නොවේ. ධර්මයෙන්මැයි. අධර්මයෙන් නොවේ. වාසෙට්ඨය, මේ සත්වයන් සම්බන්ධ මේ ලොකයෙහිද පරලෙව්හිද ධර්මයම ශ්‍රෙෂ්ඨය.

වාසෙට්ඨය, සමහර ඒ සත්වයන්ටම මෙබඳු අදහසක් විය. "පින්වත්නි, ඒකාන්තයෙන් පාපධර්මයෝ සත්වයන් කෙරෙහි පහළවූහ, යම් හෙයකින් හොරකම් කිරීම පෙනේද, අනුන්ට ගැරහීම පෙනේද බොරුකීම පෙනේද, සත්ව හිංසා පිණිස දඬු ගැණීම පෙනේද, නෙරපාලීම පෙනේද, එහෙයින් අපි ලාමකවූ අකුශල ධර්මයන් නසන්නෙමු නම් ඉතා යෙහෙකැ'යි කියායි, ඔව්හු ලාමක අකුශල ධර්මයන් දුරුකළහ. වාසෙට්ඨය, ලාමක අකුශල ධර්මයන් දුරුකෙරෙති, යන අර්ථයෙන් බ්‍රාහ්මණ බ්‍රාහ්මණයයි පළමුවන නාම (ව්‍යවහාර)ය වූයේය. ඔහු තුමූ වන ප්‍රදෙශයෙහි පන්සල් (කොළ සෙවිලි කළ පැල්) කොට ගෙණ එකී පන්සල්වල ධ්‍යාන කෙරෙති. ගිනි අඟුරු නැත්තාහු දුම් නැත්තාහු මොහොල් නැත්තාහු සවස් බත පිණිස සවස් වේලෙහිද උදය බත පිණිස උදෑසනද පිඬු සිඟීම් වශයෙන් කැඳ බත් සොයමින් ගම් නියම් ගම් රාජධානිවලට ඇතුල්වෙති. ඔහු ආහාර ලබා ගෙණ නැවතද වන ප්‍රදෙශයෙහි පන්සල්වලට වැද ධ්‍යාන කෙරෙති. මිනිස්සු ඒ මේ බ්‍රාහ්මණ සමූහයා දැක, පින්වත්නි, "මේ සත්වයෝ වන ප්‍රදෙශයෙහි පන්සල් කොට ගෙණ ඒ පන්සල්වල ධ්‍යාන කෙරෙති. ගිනි අඟුරු නැත්තාහු දුම් නැත්තාහු මොහොල් නැත්තාහු සවස බත පිණිස සවස් වේලෙහිද උදය බත පිණිස උදෑසනද පිඬු සිඟීම් වසයෙන් කැඳ බත් සොයමින් ගම් නියම් ගම් රාජධානිවලට ඇතුල්වෙති. ඔහු තුමූ ආහාර ලබාගෙණ නැවතත් පන්සල් වලටම වැද ධ්‍යාන කෙරෙත්යයි කීවාහුය. "වාසෙට්ඨය, 'ධ්‍යාන කෙරෙති යන අර්ථයෙන් ඣායකය ඣායකය යන දෙවන නාම (ව්‍යවහාර)ය විය.

වාසෙට්ඨය, එම සත්වයන් අතුරෙන් ඇතැම් කෙනෙක් වන ප්‍රදෙශයෙහි පන්සල්වල ඒ ධ්‍යානය (කළ නොහැකි වන්නාහු) ගම් වෙතටද නියම් ගම් වෙතටද පැමිණ ත්‍රිවෙදය සකස් කෙරෙමින්ද උගන්වමින්ද වෙසෙති. මිනිස්සු ඒ මේ සමූහයා දැක මෙසේ කීය.

"පින්වත්නි, මේ සත්වයෝ වන ප්‍රදෙශයෙහි පන්සල්වල ඒ ධ්‍යාන කළ නොහැකි වන්නාහු ගම් වෙතටද නියම් ගම් වෙතටද

පැමිණ ත්‍රිවෙදය සකස් කෙරෙමින්ද උගන්වමින්ද වෙසෙති. මොහු දැන් ධ්‍යාන නොකෙරෙති.” “දැන් මොහු ධ්‍යාන නොකෙරෙති” යන අර්ථයෙන් අජ්ඣායකයා අජ්ඣායකය යන තුන්වන නාම (ව්‍යවහාර)ය විය.

වාසෙට්ඨය, (වෙද මන්ත්‍ර දැරීමය වෙද මන්ත්‍ර හැදෑරීමය යන මෙය) එකල්හි පහත්යයි සම්මත විය. (ඒ මන්ත්‍ර දැරීම හා කියවීම දැන් ශ්‍රෙෂ්ඨයයි සම්මත වෙයි.

වාසෙට්ඨය, මෙසේ මේ පුරාණවූ ලෝක උත්පත්ති වංශ කථාවෙන් බ්‍රාහ්මණ සමූහයාගේ පහළවීම වූයේය. ඒ සත්වයන් සම්බන්ධවම වෙයි. අන්‍ය සත්වයන් සම්බන්ධව නොවේ. සමානවූ සත්වයන් සම්බන්ධව වේ. අසමාන සත්වයන් සම්බන්ධව නොවේ. ධර්මයෙන් මැයි. අධර්මයෙන් නොවේ.

වාසෙට්ඨය, මේ සත්වයන් පිළිබඳව මේ ලොකයෙහිද පරලෙව්හිද ධර්මයම ශ්‍රෙෂ්ඨයි.

වාසෙට්ඨය, එම සත්වයන් අතුරෙන් ඇතැම් සත්ව කෙනෙක් මෛථුන ධර්ම සෙවනය නිසා හරක් රැකීම් වෙළඳාම් ආදි ප්‍රසිද්ධ කර්මාන්තයන්හි යෙදුණාහ.

වාසෙට්ඨය, “මෛථුන ධර්මය සඳහා ප්‍රසිද්ධ කර්මාන්තයන්හි යෙදෙත්” යන අර්ථයෙන් වෛශ්‍යය. වෛශ්‍යයයි නාම (ව්‍යවහාර)ය විය.

වාසෙට්ඨය, මෙසේ වනාහි මේ පුරාණ වෛශ්‍ය සමූහයාගේ ලොකොත්පත්ති වංශ කථාව පහළ වූයේය. ඒ සත්වයන් සම්බන්ධවම වෙයි. අන්‍ය සත්වයන් සම්බන්ධව නොවෙයි සමානවූ සත්වයන් සම්බන්ධවම වෙයි. අසමානවූ සත්වයන් සම්බන්ධව නොවේ ධර්මයෙන් මැයි. අධර්මයෙන් නොවේ.

වාසෙට්ඨය, මෙසේ සත්වයන් සම්බන්ධව මේ ලොකයෙහිද පරලෙව්හිද ධර්මයම ශ්‍රෙෂ්ඨයි.

වාසෙට්ඨය, එම සත්වයන් අතුරෙන් යම් ඒ සත්ව කෙනෙක් වූවාහුද ඔහු නපුරු පැවතුම් ඇත්තෝ වූහ.

වාසෙට්ඨය, නපුරු ක්‍රියා ඇත්තෝය, නින්දිත ක්‍රියා ඇත්තෝය. යන අර්ථයෙන් ශූද්‍රය ශූද්‍රයයි යන නාම (ව්‍යවහාර)ය විය.

මෙසේ මේ පුරාණවූ ශූද්‍ර සමූහයාගේ පහළ වීම පිළිබඳ ලොක උත්පත්ති වංශ කථාව වූයේය. ඒ සත්වයන් සම්බන්ධවම වෙයි. අන්‍ය සත්වයන් සම්බන්ධව නොවෙයි. සමානවූ සත්වයන් සම්බන්ධවම වෙයි. අසමානවූ සත්වයන් සම්බන්ධව නොවේ. ධර්මයෙන් මැයි. අධර්මයෙන් නොවෙයි.

වාසෙට්ඨය, සත්වයන් සම්බන්ධව මේ ලොකයෙහිද පරලෙව්හිද ධර්මයම ශ්‍රෙෂ්ඨයි.

**26.** වාසෙට්ඨය, යම් හේතුවකින් ක්ෂත්‍රිය තෙමේද තමාගේ ක්ෂත්‍රිය ධර්මයට නින්දා කෙරෙමින් ශ්‍රමණ වන්නෙමියි ගිහිගෙන් නික්ම මහණ වේද, බ්‍රාහ්මණ තෙමේද ස්වකීය (බ්‍රාහ්මණ) ධර්මයට නින්දා කෙරෙමින් ශ්‍රමණ වන්නෙමියි ගිහිගෙන් නික්ම මහණ වේද, වෛශ්‍ය තෙමේද ස්වකීය (වෛශ්‍ය) ධර්මයට නින්දා කෙරෙමින් ශ්‍රමණ වන්නෙමියි, ගිහිගෙන් නික්ම මහණ වේද, ශූද්‍ර තෙමේද ශූද්‍ර ධර්මයට නින්දා කෙරෙමින් ශ්‍රමණ වන්නෙමියි, ගිහිගෙන් නික්ම මහණ වේද එබඳු කාලයක් වේමය.

වාසෙට්ඨය, මෙසේ ඒ වංශ සතරට අයත් සමූහ සතරෙන් ශ්‍රමණ සමූහයාගේ පහළවීම වූයේය. ඒ සත්වයන් සම්බන්ධවම වෙයි. අන්‍ය සත්වයන් සම්බන්ධව නොවේ. සමානවූ සත්වයන් සම්බන්ධවම වෙයි. අසමානවූ සත්වයන් සම්බන්ධව නොවේ. ධර්මයෙන් මැයි. අධර්මයෙන් නොවේ. වාසෙට්ඨය, සත්වයන් පිළිබඳව මේ ලොකයෙහිද පරලෙව්හිද ධර්මයම ශ්‍රෙෂ්ඨයි.

**27.** වාසෙට්ඨය, ක්ෂත්‍රිය තෙමේද කයින් දුශ්චරිතයෙහි හැසිර, වචනයෙන් දුශ්චරිතයෙහි හැසිර, සිතින් දුශ්චරිතයෙහි හැසිර මිථ්‍යාදෘෂ්ටිව මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන්ව මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන හෙතුවෙන් කය බිඳීමෙන් මරණින් මත්තෙහි අපාය නම්වූ දුගති නම්වූ විනිපාත නම්වූ නිරයෙහි උපදියි.

වාසෙට්ඨය, බ්‍රාහ්මණ තෙමේද කයින් දුශ්චරිතයෙහි හැසිර, වචනයෙන් දුශ්චරිතයෙහි හැසිර, සිතින් දුශ්චරිතයෙහි හැසිර,

මිථ්‍යාදෘෂ්ටිව මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන්ව මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදාන හේතුවෙන් කාය භෙදයෙන් මරණින් මත්තෙහි අපාය නම්වූ දුර්ගති නම්වූ විනිපාත නම්වූ නිරයෙහි උපදනේය.

වාසෙට්ඨය, වෛශ්‍ය තෙමේද කයින් දුශ්චරිතයෙහි හැසිර, වචනයෙන් දුශ්චරිතයෙහි හැසිර, සිතින් දුශ්චරිතයෙහි හැසිර, මිථ්‍යාදෘෂ්ටිව මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන්ව මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදාන හේතුවෙන් කාය භෙදයෙන් මරණින් මත්තෙහි අපාය නම්වූ දුර්ගති නම්වූ විනිපාත නම්වූ නිරයෙහි උපදනේය.

වාසෙට්ඨය, ශුද්‍ර තෙමේද කයින් දුශ්චරිතයෙහි හැසිර වචනයෙන් දුශ්චරිතයෙහි හැසිර, සිතින් දුශ්චරිතයෙහි හැසිර මිථ්‍යාදෘෂ්ටිව මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන්ව මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදාන හේතුවෙන් කායභෙදයෙන් මරණින් මත්තෙහි අපාය නම්වූ දුර්ගති නම්වූ විනිපාත නම්වූ නිරයෙහි උපදනේය.

වාසෙට්ඨය, ශ්‍රමණ තෙමේද කයින් දුශ්චරිතයෙහි හැසිර වචනයෙන් දුශ්චරිතයෙහි හැසිර සිතින් දුශ්චරිතයෙහි හැසිර මිථ්‍යාදෘෂ්ටිව මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන්ව මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදාන හෙතුවෙන් කායභෙදයෙන් මරණින් මත්තෙහි අපාය නම්වූ දුර්ගති නම්වූ විනිපාත නම්වූ නිරයෙහි උපදනේය.

28. වාසෙට්ඨය, ක්ෂත්‍රිය තෙමේද කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර, සම්‍යග්දෘෂ්ටිව සම්‍යග්දෘෂ්ටි කර්ම සමාදන්ව සම්‍යක් දෘෂ්ටි කර්මසමාදාන හෙතුවෙන් කායභෙදයෙන් මරණින් මත්තෙහි සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපදනේය.

වාසෙට්ඨය, බ්‍රාහ්මණ තෙමේද කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර, සම්‍යග්දෘෂ්ටිව සම්‍යග්දෘෂ්ටි කර්ම සමාදන්ව සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදාන හේතුවෙන් කාය භෙදයෙන් මරණින් මත්තෙහි සුගති නම්වූ දිව්‍ය ලොකයෙහි උපදෙන්ය.

වාසෙට්ඨය, වෛශ්‍ය තෙමේද කයින් සුචරිතයෙහි හැසිර වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර

සම්‍යග්දෘෂ්ටිව සම්‍යක්දෘෂ්ටිකර්ම සමාදන්ව සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදාන හේතුවෙන් කායභෙදයෙන් මරණින් මත්තෙහි සුගති නම්වූ දිව්‍ය ලොකයෙහි උපදනේය.

වාසෙට්ඨය, ශුද්‍ර තෙමේද කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර, සම්‍යග්දෘෂ්ටිව සම්‍යග්දෘෂ්ටි කර්ම සමාදන්ව සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදාන හේතුවෙන් කාය භෙදයෙන් මරණින් මත්තෙහි සුගති නම්වූ දිව්‍ය ලොකයෙහි උපදනේය.

වාසෙට්ඨය, ශ්‍රමණ තෙමේද කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර, සම්‍යග්දෘෂ්ටිව සම්‍යග්දෘෂ්ටිකර්ම සාමදන්ව සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදාන හෙතුවෙන් කායභෙදයෙන් මරණින් මත්තෙහි සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපදනේය.

**29.** වාසෙට්ඨය, ක්ෂත්‍රිය තෙමේද කයින් කුශලාකුශල දෙකම කරන්නේ වෙයි වචනයෙන් කුශල් අකුශල් දෙකම කරන්නේ වෙයි. සිතින් කුශලාකුශල දෙකම කරන්නේ වෙයි. මිශ්‍රවූ දෘෂ්ටි ඇතිව මිශ්‍රවූ දෘෂ්ටි සමාදන්ව මිශ්‍රවූ දෘෂ්ටි කර්ම සමාදාන හේතුවෙන් කාය භෙදයෙන් මරණින් මත්තෙහි සුවදුක් දෙකම විඳින්නේ වෙයි.

වාසෙට්ඨය, බ්‍රාහ්මණ තෙමේද කයින් කුශලාකුශල දෙකම කරන්නේ වෙයි. වචනයෙන් කුශලාකුශල දෙකම කරන්නේ වෙයි. සිතින් කුශලාකුශල දෙකම කරන්නේ වෙයි. මිශ්‍රවූ දෘෂ්ටි ඇතිව මිශ්‍රවූ දෘෂ්ටි සමාදන්ව මිශ්‍රවූ දෘෂ්ටි කර්ම සමාදානයෙන් කාය භෙදයෙන් මරණින් මත්තෙහි සුවදුක් දෙකම විඳින්නේ වෙයි.

වාසෙට්ඨය, වෛශ්‍ය තෙමේද කයින් කුශලාකුශල දෙකම කරන්නේ වෙයි. වචනයෙන් කුශලාකුශල දෙකම කරන්නේ වෙයි. සිතින් කුශලාකුශල දෙකම කරන්නේ වෙයි. මිශ්‍රවූ දෘෂ්ටි ඇතිව මිශ්‍රවූ දෘෂ්ටිකර්ම සමාදන්ව මිශ්‍රවූ දෘෂ්ටි සමාදාන හේතුවෙන් කාය භෙදයෙන් මරණින් මත්තෙහි සුවදුක් දෙකම විඳින්නේ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වාසෙට්ඨය, ශුද්‍ර තෙමේද කයින් කුශලාකුශල දෙකම කරන්නේ වෙයි. වචනයෙන් කුශලාකුශල දෙකම කරන්නේ වෙයි. සිතින් කුශලාකුශල දෙකම කරන්නේ වෙයි. මිශ්‍රවූ දෘෂ්ටි ඇතිව මිශ්‍රවූ දෘෂ්ටිකර්ම සමාදන්ව මිශ්‍රවූ දෘෂ්ටිකර්ම සමාදාන හේතුවෙන් කායභෙදයෙන් මරණින් මත්තෙහි සුවදුක් දෙකම විඳින්නේ වෙයි.

වාසෙට්ඨය, ශ්‍රමණ තෙමේද කයින් කුසල් අකුසල් දෙකම කරන්නේ වෙයි. වචනයෙන් කුසල් අකුසල් දෙකම කරන්නේ වෙයි. හිතින් කුසල් අකුසල් දෙකම කරන්නේ වෙයි. මිශ්‍රවූ දෘෂ්ටි ඇතිව මිශ්‍රවූ දෘෂ්ටිකර්ම සමාදන්ව මිශ්‍රවූ දෘෂ්ටිකර්ම සමාදාන හේතුවෙන් කායභෙදයෙන් මරණින් මත්තෙහි සුවදුක් දෙකම විඳින්නේ වෙයි.

**30.** වාසෙට්ඨය, ක්ෂත්‍රිය තෙමේද කයින් සංවරව, වචනයෙන් සංවරව, සිතින් සංවරව, කොට්ඨාස වසයෙන් සත් වැදෑරුම්වූ බොධි පාක්ෂික ධර්මයන් (මාර්ගඥාන ලබා ගැනීමට වුවමනා ධර්ම) වඩා මේ ආත්මභාවයෙහිම කෙලෙස් ගිනි නිවා ලන්නේය.

වාසෙට්ඨය, බ්‍රාහ්මණ තෙමේද කයින් සංවරව, වචනයෙන් සංවරව, සිතින් සංවරව කොට්ඨාස වසයෙන් සත් වැදෑරුම්වූ බොධිපාක්ෂික ධර්මයන් (මාර්ගඥාන ලබා ගැනීමට වුවමනා ධර්ම) වඩා මේ ආත්මභාවයෙහිම කෙලෙස් ගිනි නිවා ලන්නේය.

වාසෙට්ඨය, වෛශ්‍ය තෙමේද කයින් සංවරව, වචනයෙන් සංවරව, සිතින් සංවරව, කොට්ඨාස වසයෙන් සත් වැදෑරුම්වූ බොධිපාක්ෂික ධර්මයන් (මාර්ගඥාන ලබා ගැනීමට වුවමනා ධර්ම) වඩා මේ ආත්මභාවයෙහිම කෙලෙස් ගිනි නිවා ලන්නේය.

වාසෙට්ඨය, ශුද්‍ර තෙමේද කයින් සංවරව, වචනයෙන් සංවරව, සිතින් සංවරව, කොට්ඨාස වසයෙන් සත් වැදෑරුම්වූ බොධිපාක්ෂික ධර්මයන් (මාර්ගඥාන ලබා ගැනීමට වුවමනා ධර්ම) වඩා මේ ආත්මභාවයෙහිම කෙලෙස් ගිනි නිවා ලන්නේය.

වාසෙට්ඨය, ශ්‍රමණ තෙමේද කයින් සංවරව, වචනයෙන් සංවරව, සිතින් සංවරව, කොට්ඨාස වසයෙන් සත් වැදෑරුම්වූ

බොධිපාක්ෂික ධර්මයන් (මාර්ගඥාන ලබා ගැනීමට වුවමනා ධර්ම) වඩා මේ ආත්මභාවයෙහිම කෙලෙස් ගිනි නිවා ලන්නේය.

31. "වාසෙට්ඨය, මේ (ක්ෂත්‍රියාදි) සතර වංශයන් අතරෙන්යම් භික්ෂුවක් අර්හත් වූයේද, නැති කරනලද කෙලෙස් ඇත්තේද, වැස නිම කරනලද බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තේද, කරනලද සිවු මග කටයුතු ඇත්තේද, බහා තබනලද (කෙලෙස් බර ආදී) බර ඇත්තේද, පැමිණියාවූ තමාගේ අර්ථය ඇත්තේද, නැති කරන ලද සසර බැඳුම් ඇත්තේද, මනාකොට දැන කෙලෙසුන් කෙරෙන් මිදුනේද, හෙතෙමේ ඔවුනතුරෙන් අග්‍රයයි කියනු ලැබේ. ඒ ධර්මයෙන්මය, අධර්මයෙන් නොවෙයි. වාසෙට්ඨය, සත්වයන් පිළිබඳවූ මේ ලොකයෙහිද පරලෙව්හිද ධර්මයම ශ්‍රෙෂ්ඨයි.

වාසෙට්ඨය, සනඞ්කුමාර නම් බ්‍රහ්මයා විසින්ද මේ ගාථා තොමෝ කියන ලද්දීය.

"යම් ජනයෝ 'මම ගෞතම වෙමි.' 'මම කාශ්‍යප වෙමි'යි ගොත්‍රය සිහි කරන්නෝ වෙත්ද ඒ ජන සමූහයා අතුරෙහි ක්ෂත්‍රිය තෙමේ ශ්‍රෙෂ්ඨයි. අෂ්ට විද්‍යාවෙන් හා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තවූ යම් තථාගතයන් වහන්සේ කෙනෙක් වෙත්ද, ඒ තථාගතයන් වහන්සේ දෙවිමිනිසුන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ වන්නාහ."

වාසෙට්ඨය, ඒ මේ ගාථා තොමෝ සනඞ්කුමාර බ්‍රහ්මයා විසින් යහපත්කොට ගයන ලද්දීය. අයහපත් කොට ගයන ලද්දී නොවෙයි. මනාකොට කියන ලද්දීය. අයහපත්කොට කියන ලද්දී නොවෙයි. අර්ථයෙන් යුක්ත වූවාය. අනර්ථයෙන් යුක්තවූවා නොවෙයි. මවිසින්ද එකඟවන ලද්දීය.

වාසෙට්ඨය, මමද මෙසේ කියමි. යම් ජනයෝ, 'මම ගෞතම වෙමි, මම කාශ්‍යප වෙමැ'යි ගොත්‍ර සිහි කරන්නෝ වෙත්ද ඒ ජන සමූහයා අතුරෙහි ක්ෂත්‍රිය තෙමේ ශ්‍රෙෂ්ඨයි. අෂ්ට විද්‍යාවෙන් හා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තවූ යම් තථාගතයන් වහන්සේ කෙනෙක් වෙත්ද, ඒ තථාගතයන් වහන්සේ දෙවි මිනිසුන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ වන්නාහ.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක. වාසෙට්ඨ භාරද්වාජ යන සාමණේරයන් වහන්සේලා දෙනම සතුටු සිත් ඇත්තාහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටු වූවාහුය.

**විසිහත් වැනිවූ අග්ගඤ්ඤ සූත්‍රය නිමි.**

---

## 28. සම්පසාදනීය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ නාලාන්දාවෙහි, පාවාරික අඹ උයනෙහි වැඩ වාසය කළාහුය. එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක පැත්තක හුන්නේය. එක පැත්තක හුන්නාවූ ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "ස්වාමීනි මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙසේ පැහැදුනෙමි. සම්බොධියෙන් භාග්‍යවතුන් වහන්සේට වඩා ශ්‍රෙෂ්ඨවූ අන්‍ය ශ්‍රමණයෙක් හෝ අන්‍ය බ්‍රාහ්මණයෙක් හෝ පෙර නොවීය. අනාගතයෙහිත් නොවන්නේය. දැන් ද නොවෙයි" යනුවෙනි.

2. "ශාරීපුත්‍රය, තා විසින් මහත්වූ නිර්භීත වචනයක් කියන ලදී. ඒකාන්ත වචනයක් කියන ලදී. සිංහනාදයක් කරණ ලදී. සම්බොධියෙන් භාග්‍යවතුන් වහන්සේට වඩා ශ්‍රෙෂ්ඨවූ අන්‍ය ශ්‍රමණයෙක් හෝ අන්‍ය බ්‍රාහ්මණයෙක් හෝ පෙර නොවීය. අනාගතයෙහිත් නොවන්නේය. දැනුදු නැතැයි. මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුනෙමි යනුවෙනි. කිම ශාරිපුත්‍රය, අතීත කාලයෙහි වැඩ සිටි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ යම් ඒ බුදුවරයෝ වූවාහුද, ඒ සියලු බුදුවරයන්ගේ සිත් නුඹගේ සිතින් දැන මෙසේ ප්‍රකාශ කෙළෙහිද? 'මේ කාරණයෙන්ද ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු සිල් ඇත්තෝය. මේ කාරණයෙන්ද ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු ධර්ම ඇත්තෝය. මේ කාරණයෙන්ද ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු ප්‍රඥා අත්තෝය. මේ කාරණයෙන්ද ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු

හැසිරීම් ඇත්තෝය. මේ කාරණයෙන්ද ඒ භාග්‍යවතුන් වහන්සේලා කෙලෙසුන් කෙරෙන් මිදුනාහුය'යි ඒ සියලු බුදුවරයන්ගේ සිත් නුඹගේ සිතින් දැන මෙසේ ප්‍රකාශ කරන ලද්දේද?' "නැත ස්වාමීනි,"

"කිම ශාරීපුත්‍රය, අනාගතයෙහි පහළවන්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ යම් ඒ බුදුවරු වෙත්ද, මේ කාරණයෙන්ද ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු සිල් ඇත්තෝය. මේ කාරණයෙන්ද ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු ධර්ම ඇත්තෝය, මේ කාරණයෙන්ද ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු ප්‍රඥා ඇත්තෝය. මේ කාරණයෙන්ද ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු හැසිරීම් ඇත්තෝය. මේ කාරණයෙන්ද ඒ භාග්‍යවතුන් වහන්සේලා කෙලෙසුන් කෙරෙන් මිදුනාහු යයි, ඒ සියලු බුදුවරයන්ගේ සිත් නුඹගේ සිතින් දැන මෙසේ කියන ලද්දේද?" "නැත ස්වාමීනි."

"කිම ශාරිපුත්‍රය, මම මෙකල්හි අර්හත් සම්‍යක් සම්බුද්ධ වෙමි. මේ කාරණයෙන්ද භාග්‍යවතුන් වහන්සේ මෙබඳු සිල් ඇත්තෙක. මේ කාරණයෙන්ද මෙබඳු ධර්ම ඇත්තෙක. මෙබඳු ප්‍රඥා ඇත්තෙක. මෙබඳු හැසිරීම් ඇත්තෙක මේ කාරණයෙන්ද භාග්‍යවතුන් වහන්සේ මෙසේ කෙලෙසුන් කෙරෙන් මිදුනේ යයි' තමන්ගේ සිතින් මගේ සිත දැන ප්‍රකාශ කරණ ලද්දේද?" "නැත ස්වාමීනි,"

"ශාරිපුත්‍රය, එසේ නම් පසුගිය කාලයේත් මතු එන කාලයේත්, මේ කාලයේත් යන තුන් කල්හි අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා කෙරෙහි චෙතොපරියඤාණය (සිතින් සිත දැන ගැණීමේ නුවණ) නුඹට නැත. 'සම්බොධියෙන් භාග්‍යවතුන් වහන්සේට වඩා ශ්‍රෙෂ්ඨවූ අන්‍ය ශ්‍රමණයෙක් හෝ අන්‍යබ්‍රාහ්මණයෙක් හෝ පෙර නොවීය. අනාගතයෙහිත් නොවන්නේය. දැනුදු නොවෙයි. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙසේ පැහැදුනෙමි' කියා ශාරිපුත්‍රය, නුඹ කෙසේ නම් මහත්වූ භය නැති වචනය කියන ලද්දේද? ඒකාන්ත කොට කියන ලද්දේද? සිංහනාද කරණ ලද්දේද?"

3. "ස්වාමීනි, තුන්කාලය පිළිබඳ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා කෙරෙහි ඒ චෙතොපරියඥාණය (සිතින් සිත දැන ගැණීමේ නුවණ) මට නැත. ස්වාමීනි, එතකුදුවුවත් මවිසින් ධර්මයට අනුව දැනගන්නා ලදී. ස්වාමීනි, රජුගේ ස්ථිරප්‍රාකාර පාද ඇති, ශක්තිමත් ප්‍රාකාර තොරන් ඇති, එක් දොරක් ඇති, ප්‍රත්‍යන්තයෙහිවූ නුවරක් වේද? එහි පණ්ඩිතවූ, ව්‍යක්තවූ, නුවණැත්තාවූ, නොහඳුනන්නන් වළක්වන්නාවූ, හඳුනන්නවුන්, ඇතුල් කරන්නාවූ දොරටුපාල (මුරකාර) යෙක් වන්නේය. හෙතෙමේ ඒ නගරයාගේ හාත්පස ප්‍රාකාර මාර්ග පරීක්ෂා කරමින් හැසිරෙන්නේ ප්‍රාකාර සන්ධිය හෝ, ප්‍රාකාර සිදුරක් හෝ යටත් පිරිසෙයින් බළලකු නික්මෙන පමණ සිදුරකුදු නොදක්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය. යම්කිසි ලොකු සත්වකෙනෙක් මේ නුවරට ඇතුල්වීම හෝ පිටවීම කෙරෙත්ද? ඒ සියල්ලෝම මේ දොරින්ම ඇතුල් හෝ වන්නෝය පිට හෝ වන්නෝය' කියායි. ස්වාමීනි, එපරිද්දෙන්ම මවිසින් ධර්මයට අනුව මේ කාරණය දැනගන්නා ලද්දේය.

ස්වාමීනි, අතීතකාලයෙහි අර්හත්වූ, යම් ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා වූවාහුද, ඒ සියලු භාග්‍යවතුන් වහන්සේලා සිත කිළිටි කරන්නාවූ, ප්‍රඥාව දුර්වල කරන්නාවූ පඤ්චනීවරණයන් (කුසල් වැලැක්වීම් පහ) දුරුකොට, සතර සතිපට්ඨානයන්හි (සිහිය පිහිටුවීම් සතර) හොඳින් පිහිටුවන ලද සිත් ඇත්තාහු, සප්ත බොධ්‍යාඞ්ග ධර්මයන් (මාර්ග ඥානයට හෙතුවන අඞ්ග සත) තත්වූ පරිදි වඩා ඉතා උතුම් සම්‍යක් සම්බොධිය අවබෝධ කළාහුය. අනාගත කාලයෙහි අර්හත්වූ යම් ඒ සම්‍යක්සම්බුද්ධයන් වහන්සේලා පහළවන්නාහුද ඒ සියලු භාග්‍යවතුන් වහන්සේලාද සිත කිළිටිකරන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ, පඤ්චනීවරණයන් (කුසල් වැලැක්වීම් පහ) දුරුකොට සතර සතිපට්ඨානයන්හි (සිහිය පිහිටුවීම් හතරෙහි) හොඳින් පිහිටුවන ලද සිත් ඇත්තාහු සප්තබොධ්‍යාඞ්ග ධර්මයන් (මාර්ගඥානයට හෙතුවන කරුණු සත) තත්වූ පරිද්දෙන් වඩා ඉතා උතුම්වූ සම්‍යක්සම්බොධිය අවබොධ කරන්නාහුය. ස්වාමීනි, දැන් අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේද සිත

කිළිටි කරන්නාවූ, ප්‍රඥාව දුර්වල කරන්නාවූ පඤ්චනීවරණයන් (කුසල් වැලැක්වීම් පහ) දුරුකොට සතර සතිපට්ඨානයන්හි හොඳින් පිහිටුවන ලද සිත් ඇත්තාහු, සප්තබොධ්‍යාඞ්ග ධර්මයන් තත්වූ පරිද්දෙන් වඩා උතුම්වූ සම්‍යක් සම්බොධිය හොඳින් අවබොධ කළාහුය.

4. "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද ධර්මශ්‍රවණය පිණිස එතැනට පැමිණියෙමි. ස්වාමීනි, ඒ මට භාග්‍යවතුන් වහන්සේ වඩ වඩා උතුම්වූ, වඩ වඩා යහපත්වූ විපාක සහිත කුශලාකුශල ධර්මයන් දේශනා කළාහුය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වඩ වඩා උතුම්වූ, වඩ වඩා යහපත්වූ විපාක සහිත කුශලාකුශල ධර්මයන් යම් යම් ආකාරයකින් දේශනා කළාහුද, ඒ ඒ ආකාරයෙන් දේශනා කරන ලද ඒ ධර්මයන් අතුරෙන් ශ්‍රාවක පාරමීඥානයාගේ කෙළවරට පැමිණියෙමි. භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බුද්ධවනසේක. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය හොඳින් දේශනා කරන ලද්දේය. ශ්‍රාවක සඞ්ඝ තෙමේ හොඳින් පිළිපදින්නේය. ශාස්තෘන් වහන්සේ කෙරෙහි මෙසේ ප්‍රසන්න වූයෙමි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කුශල ධර්මයන් පිළිබඳ දේශනා කිරීමද ඊට වඩා උතුම් දෙයක් නැති කාරණයකි. එහි මේ කුශලධර්මයෝයි: ඒ කවරහුද? සතරසතිපට්ඨානයෝය (සිහිය වැඩිය යුතු භාවනා සතර), සතර සම්‍යක් ප්‍රධානයෝය (මහාවීර්යය සතර), සතර ඍද්ධිපාදයෝය (සත්‍යාවබොධය පිණිස පවත්නා හෙතු සතර), පඤ්චෙන්ද්‍රියය (ඉන්ද්‍රිය ධර්ම පස), පඤ්චබලයෝය (බලධර්ම පස), සප්තබොධ්‍යාඞ්ගයෝය, (සත්‍යාවබොධයේ අඞ්ග සත), ආර්‍ය්‍යාෂ්ටාංගික මාර්ගයය, යන කුශල ධර්මයෝයි. ස්වාමීනි, මේ ශාසනයෙහි මහණ තෙමේ කෙලෙස් විනාශ කිරීමෙන්, කෙලෙස් රහිතවූ, චෙතනා විමුත්ති, පඤ්ඤා විමුත්ති, අර්හත් ඵලය යන මේ, මේ ආත්මභාවයෙහි තමන්ගේ උසස් ඥානයෙන් දැන ඊට පැමිණ වාසය කරයි.

"ඒ කුශලධර්මයන් භාග්‍යවතුන් වහන්සේ සම්පූර්ණයෙන් දන්නාහ. මේ කුශල ධර්මයන් ඉතිරි නොකොට දන්නාවූ භාග්‍යවතුන් වහන්සේ විසින් මත්තෙහි දතයුත්තෙක් නැත.

"යම් මේ කුශල ධර්මයන් පිළිබඳ භාග්‍යවතුන් වහන්සේට වැඩියෙන් දන්නාවූ අන්‍ය ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් ඇත්තේද නැත. කුශල ධර්මයන් පිළිබඳ මෙයද අතිශයින් උතුම් බවකි.

5. "ස්වාමීනි, ආයතන පැනවීම් පිළිබඳ ධර්මය භාග්‍යවතුන් වහන්සේ යම් පරිද්දකින් දෙශනා කරත්ද මේද අන්‍යවූ ශ්‍රෙෂ්ඨ බවෙකි. ස්වාමීනි, අධ්‍යාත්මිකවූද බාහිරවූද (ඇතුළත් කොට ගන්නාවූද පිටත්හි කොට ගන්නාවූද) ආයතනයෝ සදෙනෙකි. ඇසද, රූපයෝද, කණද, ශබ්දයෝද, නාසයද, ගන්ධයෝද, දිවද, රසයෝද, කයද, ස්පර්ශයෝද, සිතද, ධර්මයෝද යන මොහුය. ස්වාමීනි, මේද ආයතන පැනවීම් පිළිබඳ ශ්‍රෙෂ්ඨ කරුණකි. එය භාග්‍යවතුන් වහන්සේ සම්පූර්ණයෙන් දන්නාහ. යම් මේ ආයතන පැනවීම් පිළිබඳ භාග්‍යවතුන් වහන්සේට වඩා වැඩි නුවණ ඇත්තාවූ අන්‍ය ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වන්නේද නැත. සම්පූර්ණයෙන් දන්නාවූ භාග්‍යවතුන් වහන්සේට, මත්තෙහි දැනගත යුත්තෙක්ද නැත.

6. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම්පරිද්දකින් ගැබ් පිළිසිඳගැනීම් පිළිබඳ ධර්මය දෙශනා කරද්ද මෙයද තවත් අතිශයින් උතුම් බවෙකි. ස්වාමීනි, මේ කුසෙහි පිළිසිඳ ගැණීම් සතරෙක. ස්වාමීනි, මේ ලෝකයෙහි ඇතැමෙක් නොදන්නේ මුළාවූයේ ප්‍රතිසන්ධි වශයෙන් මව්කුසට පිවිසෙයි නොදන්නේ මුළාවූයේ මව්කුස වසයි. නොදන්නේ මුළාවූයේ මව්කුසින් නික්මෙයි. මේ පළමුවන කුසෙහි පිළිසිඳ ගැන්මයි. ස්වාමීනි නැවතද අනෙකක් කියමි. මේ ලෝකයෙහි ඇතැමෙක් දන්නේ මුළා නොවූයේ ප්‍රතිසන්ධි වශයෙන් මව්කුසට පිවිසෙයි. නොදන්නේ මුළාවූයේ මව්කුස වසයි. නොදන්නේ මුළාවූයේ මව්කුසින් නික්මෙයි. මේ දෙවන මවුකුස පිළිසිඳ ගැනීමයි. ස්වාමීනි නැවතද අනෙකක් කියමි. මේ ලෝකයෙහි ඇතැමෙක් දන්නේ මුළානොවූයේ ප්‍රතිසන්ධි වශයෙන් මව්කුසට පිවිසෙයි. දන්නේ මුළානොවූයේ මව්කුස වසයි නොදන්නේ මුළාවූයේ මව්කුසින් නික්මෙයි. මේ තුන්වන මව්කුස පිළිසිඳ ගැනීමයි.

ස්වාමීනි නැවතද අනෙකක්කියමි. මේ ලෝකයෙහි ඇතැමෙක් දන්නේ. මුළානොවූයේ ප්‍රතිසන්ධි වශයෙන් මව්කුසට පිවිසෙයි. දන්නේ, මුළානොවූයේ මව්කුස වසයි. දන්නේ මුළානොවූයේ මව්කුසින් නික්මෙයි. මේ සතරවන මව්කුස පිළිසිඳ ගැනීමයි. මෙයද සත්වයන්ගේ පිළිසිඳ ගැනීම් පිළිබඳ ඉතා උතුම් බවෙකි.

7. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ යම් පරිද්දකින් ආදෙශන (අදහස් ප්‍රකාශ කිරීම්) කොට්ඨාසයන් පිළිබඳ ධර්මය දෙශනා කරද්ද මෙද තවත් ඉතා උතුම් බවෙකි. ස්වාමීනි මේ ආදෙශන කොට්ඨාස සතරෙකි. ස්වාමීනි, මේ ලොකයේ ඇතමෙක් යාම්, ඊම් ආදි නිමිති වලින් සිත දැන කියයි. 'තාගේ සිත මෙසේද වෙයි. තාගේසිත මේ අයුරෙන්ද පවතී. තාගේ සිත මේ කාරණයෙන්ද මෙසේ වෙයි.' හෙතෙමේ බොහෝ කොටද කියයි. එය එසේම වෙයි. අන් පරිද්දකින් නොවෙයි. මේ පළමුවන ආදෙශන කොටසයි.

ස්වාමීනි, නැවතද අනෙකක් කියමි. මේ ලෝකයෙහි ඇතැමෙක් නිමිත්තෙන් නොකියයි. එහෙත් මනුෂ්‍යයන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ ශබ්දය අසා කියයි. 'තාගේ සිත මෙසේද වෙයි. තාගේ සිත මේ අයුරින්ද පවතී. තාගේ සිත මේ කාරණයෙන්ද මෙසේ වෙයි.' හෙතෙමේ බොහෝ කොටද කියයි. එය එසේම වෙයි. අන් පරිද්දකින් නොවෙයි. මේ දෙවන ආදෙශන කොටසයි.

ස්වාමීනි, නැවතද අනෙකක් කියමි. මේ ලෝකයෙහි ඇතැමෙක් නිමිත්තෙන්ද නොමකියයි. මනුෂ්‍යයන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ ශබ්ද අසා නොමකියයි. එහෙත් කරුණු සහිතව විසඳා බැලීම් වශයෙන් තීරණ කරගැනීම් වශයෙන්, නිදීම්, පමාවීම්, දෙඩවීම් ආදී ශබ්ද අසා 'තාගේ සිත මෙසේයයි කියයි. තාගේ සිත මේ අයුරින්ද පවතියි. තාගේ සිත මේ ආකාරය'යිද කියයි. හෙතෙමේ බොහෝ කොටද කියයි. එය එසේම වෙයි. අන් පරිද්දකින් නොවෙයි. මේ තුන්වන ආදෙශන කොටසයි.

ස්වාමීනි, නැවතද අනෙකක් කියමි. මේ ලෝකයෙහි ඇතැමෙක් නිමිත්තෙන්ද නොම කියයි. මනුෂ්‍යයන්ගේ හෝ

අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ ශබ්දය අසාද නොම කියයි. කරුණු සහිතව විසඳා බැලීම් වශයෙන් තීරණ කරගැනීම් වශයෙන්, දෙඩවීම් ආදී ශබ්ද අසාද නොම කියයි. එතකුදු වුවත් විතර්ක විචාර සහිත සමාධියට පැමිණියහුගේ යම් සේ මේ භවත්හුගේ චිත්ත සංස්කාරයෝ හොඳින් පිහිටියාහුය. මේ සිතට අනතුරුව මෙනම් කල්පනා කරන්නේයයි තමාගේ සිතින් ඔහුගේ සිත නිශ්චයකර දැන ගනී. හෙතෙමේ බොහෝකොටද කියයි. එය එසේම වෙයි. අන් පරිද්දකින් නොවෙයි. මේ සතරවන ආදෙශන කොටසයි. ස්වාමීනි, අදහස් ප්‍රකාශ කිරීම් පිළිබඳ මේ ඉතා උතුම් බවෙකි.

8. "නැවතද, අනෙකක් කියමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ දර්ශන සමාපත්ති (නුවණින් දැකීමට පැමිණීම්) පිළිබඳ ධර්මය යම් පරිද්දකින් දෙශනාකරයිද මෙද ඉතා උතුම් බවෙකි. ස්වාමීනි, මේ දර්ශන සමාපත්ති සතරෙකි. ස්වාමීනි, මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කෙළෙස් තවන වීර්යයට පැමිණ, ඒ වීර්යයෙහි නැවත නැවත යෙදීමට පැමිණ, අප්‍රමාදයට පැමිණ, මනාව මෙනෙහි කිරීමට පැමිණ, යම් පරිද්දකින් සිත එකඟවූ කල්හි පාද තලයෙන් උඩ, හිසකේ මස්තකයෙන් යට, සම කෙළවර කොට ඇති, නොයෙක් අසුචියෙන් පිරුණාවූ මේ ශරීරය නැවත නැවත සිහිකෙරෙයි. එබඳු ප්‍රථමධ්‍යාන සමාධිය ස්පර්ශකෙරෙයි. මේ ශරීරයෙහි කෙස් ය, ලොම් ය, නිය ය, දත් ය, සම ය, මස් ය, නහර ය, ඇට ය, ඇටමිදුළු ය, වකුගඩු ය, හෘදයමාංශ ය, අක්මාව ය, දළබුව ය, බඩදිව ය, පපුමස ය, අතුනු ය, අතුනු බහන ය, නොදිරූ ආහාර ය, මළ ය, පිත ය, සෙම ය, සැරව ය, ලෙහෙ ය, ඩහදිය ය, මේද තෙල ය, කඳුලු ය, වුරුණු තෙල් ය, කෙළ ය, සොටු ය සඳමිදුළු ය, මුත්‍ර ය යන මේ දෙතිස් කුණප ඇත" කියා දකියි. මේ ප්‍රථම දර්ශන සමාපත්තියයි.

නැවතද, අනෙකක් කියමි. ස්වාමීනි, මේ ලෝකයෙහි ඇතම් ශ්‍රමණයෙක් හෝ ඇතැම් බ්‍රාහ්මණයෙක් හෝ කෙළෙස් තවන වීර්යයට පැමිණ, ඒ වීර්යයෙහි නැවත නැවත යෙදීමට පැමිණ,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

අප්‍රමාදයට පැමිණ, මනාව මෙනෙහි කිරීමට පැමිණ, යම් පරිද්දකින් සිත එකඟවූ කල්හි පාද තලයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට සම කළෙවරකොට ඇති නොයෙක් අසුචියෙන් පිරුණාවූ මේ ශරීරය නැවත නැවත සිහි කරයි. එබඳු ප්‍රථමධ්‍යාන සමාධිය ලබයි. යම්සේ සිත එකඟවූ කල්හි පාදතලයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට සම කෙළවර කොට ඇති නොයෙක් අසුචියෙන් පිරුණාවූ මේ ශරීරය නැවත නැවත සිහි කරයි. මේ ශරීරයෙහි කෙස් ය, ලොම් ය, නිය ය, දත් ය, සම ය, මස් ය, නහර ය, ඇට ය, ඇටමිදුළු ය, වකුගඩු ය, හෘදයමාංශ ය, අක්මාව ය, දළබුව ය, බඩදිව ය, පපුමස ය, අතුනු ය, අතුණු බහන ය, නොදිරූ ආහාර ය, මළ ය, පිත ය, සෙම ය, සැරව ය, ලෙහෙ ය, ඩහදිය ය, මේද තෙල ය, කඳුලු ය, වුරුණු තෙල් ය, කෙළ ය, සොටු ය, සඳමිදුළු ය, මුත්‍ර ය යන මේ දෙතිස් කුණප ඇත. පුරුෂයාගේ සිවි, මස්, ලේ ඉක්මවාද ඇට නැවත නැවත සිහි කරයි. මේ දෙවන දර්ශන සමාපත්තියයි.

ස්වාමීනි, නැවතද අනෙකක් කියමි. මේ ලෝකයෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ කෙලෙස් තවන වීර්යයට පැමිණ, ඒ වීර්යයෙහි නැවත නැවත යෙදීමට පැමිණ, අප්‍රමාදයට පැමිණ, මනාව මෙනෙහිකිරීමට පැමිණ, යම් පරිද්දකින් සිත එකඟවූ කල්හි පාදතලයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට සම කෙළවර කොට ඇති නොයෙක් අසූචියෙන් පිරුණාවූ මේ ශරීරය නැවත නැවත සිහි කරයි. එබඳුවූ ප්‍රථමධ්‍යාන සමාධිය ලබයි. යම්සේ සිත එකඟවූ කල්හි පාදතලයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට සම කෙළවර කොට ඇති නොයෙක් අසුචියෙන් පිරුණු මේ ශරීරය නැවත නැවත සිහි කරයි. මේ ශරීරයෙහි කෙස් ය, ලොම් ය, නිය ය, දත් ය, සම ය, මස් ය, නහර ය, ඇට ය, ඇටමිදුළු ය, වකුගඩු ය, හෘදයමාංශ ය, අක්මාව ය, දළබුව ය, බඩදිව ය, පපුමස ය, අතුනු ය, අතුණු බහන ය, නොදිරූ ආහාර ය, මළ ය, පිත ය, සෙම ය, සැරව ය, ලෙහෙ ය, ඩහදිය ය, මේද තෙල ය, කඳුලු ය, වුරුණුතෙල් ය, කෙළ ය, සොටු ය, සඳමිදුළු ය, මුත්‍ර ය යන මේ දෙතිස් කුණප කොටස් ඇත. පුරුෂයාගේ සිවි, මස්, ලේ ඉක්මවාද ඇට නැවත නැවත සිහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කරයි. දෙකොටසින්ම නොසිඳුණු මේ ලෝකයෙහි පිහිටියාවූද පරලොකයෙහි පිහිටියාවූද පුරුෂයාගේ විඥානය දැනගනී. මේ තුන්වන දර්ශන සමාපත්තියයි.

"ස්වාමීනි, නැවතද අනෙකක් කියමි. මේ ලෝකයෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ කෙළෙස් තවන වීර්යයට පැමිණ, ඒ වීර්යයෙහි නැවත නැවත යෙදීමට පැමිණ, අප්‍රමාදයට පැමිණ, මනාව මෙනෙහි කිරීමට පැමිණ, යම් පරිද්දකින් සිත එකඟවූ කල්හි පාදතලයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට සම කෙළවර කොට ඇති නොයෙක් අසූචියෙන් පිරුණාවූ මේ ශරීරය නැවත නැවත සිහි කරයි. එබඳුවූ ප්‍රථමධ්‍යාන සමාධිය ස්පර්ශ කෙරෙයි. මේ ශරීරයෙහි කෙස් ය, ලොම් ය, නිය ය, දත් ය, සම ය, මස් ය, නහර ය, ඇට ය, ඇටමිදුළු ය, වකුගඩු ය, හෘදය මාංශ ය, අක්මාව ය, දළබුව ය, බඩදිව ය, පපුමස ය, අතුනු ය, අතුණුබහන ය, නොදිරූ ආහාර ය, මළ ය, පිත ය, සෙම ය, සැරව ය, ලෙහෙ ය, ඩහදිය ය, මේදතෙල ය, කඳුලු ය, වුරුණුතෙල් ය, කෙළ ය, සොටු ය, සඳමිදුළු ය, මුත්‍ර යයි පුරුෂයාගේ සිවි, මස්, ලේ ඉක්මවාද ඇට නැවත නැවත සිහි කරයි. දෙකොටසින් නොසිඳුණු මේ ලෝකයෙහි නොපිහිටියාවූද පරලොකයෙහි නොපිහිටියාවූද පුරුෂයාගේ විඥානය දැනගනී. මේ තුන්වන දර්ශන සමාපත්තියයි.

"ස්වාමීනි, දර්ශන සාමපත්ති පිළිබඳ මෙද ඉතා උතුම් බවෙකි.

**9.** යම්සේ භාග්‍යවතුන් වහන්සේ සත්වයාය, පුද්ගලයාය, යනාදි වශයෙන් ලොක ව්‍යවහාරයෙහි පවත්නාවූ පුද්ගල ප්‍රඥප්ති (පුද්ගලයායි නියම කිරීම්) පිළිබඳ ධර්මය දේශනා කරයිද, ස්වාමීනි, මේද අනිකක්වූ ඉතා උතුම් බවෙකි.

ස්වාමීනි, මේ පුද්ගලයෝ සත් දෙනෙක් වෙත් උභතොභාග විමුක්තිය (ශීලසමාධි දෙපසින් මිදුනාවූ) පඤ්ඤාවිමුක්තිය (ප්‍රඥාවෙන් මිදුනාවූ) කායසක්ඛිය (කයින් ප්‍රතක්ෂ්‍ය කළාවූ,) දිට්ඨප්පත්තය (දැකීමේ අන්තයට පැමිණියාවූ) සද්ධා විමුක්තය (ශ්‍රද්ධාවෙන් මිදුනාවූ) ධම්මානුශාරීය, සද්ධානුසාරීය යන

සත්දෙනයි. ස්වාමීනි, පුද්ගල ප්‍රඥප්ති (පුද්ගලයන් පිළිබඳ හැඳින්වීම්) පිළිබඳ මෙද ඉතා උතුම් බවෙකි.

10. "ස්වාමීනි, යම්සේ භාග්‍යවතුන් වහන්සේ වීර්යය වැඩීම් පිළිබඳව ධර්මය දෙශනා කරයිද? ස්වාමීනි, මෙද අන්‍යවූ ඉතා උතුම් බවෙකි.

"ස්වාමීනි, බොධ්‍යඞ්ග ධර්මයෝ සත්දෙනෙක් වෙත්. සතිසම්බොජ්ඣඞ්ය (මාර්ගඥානයට හෙතුවූ සිහිය,) ධම්ම විචයසම්බොජ්ඣඞ්ගය, (මාර්ගඥානයට හෙතුවූ ප්‍රඥාව,) විරිය සම්බොජ්ඣඞ්ගය, (මාර්ගඥානයට හෙතුවූ වීර්යය,) පීතිසම්බොජ්ඣඞ්ගය (මාර්ගඥානයට හෙතුවූ ප්‍රීතිය,) පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය (මාර්ගඥානයට හෙතුවූ හිතේ සංසිඳීම,) සමාධි සම්බොජ්ඣඞ්ගය (මාර්ගඥානයට හෙතුවූ සමාධිය,) උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය (මාර්ගඥානයට හෙතුවූ උපෙක්ෂාව,) යන සතයි.

ස්වාමීනි, වීර්යය වැඩීම පිළිබඳ ධර්මදෙශනා අතුරෙන් මෙයද ඉතා උතුම් බවෙකි.

11. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම්සේ පිළිපැදීම් පිළිබඳ ධර්මය දෙශනා කරයිද මෙයද අන්‍යවූ ඉතා උතුම් බවෙකි.

"ස්වාමීනි, මේ පිළිපැදීම් සතරෙකි. දුක්ඛාපටිපදාදන්ධාභිඤ්ඤා (දුක්වූ පිළිපැදීම් සහිත සෙමින් අවබොධ කිරීම,) දුක්ඛාපටිපදාඛිප්පාභිඤ්ඤා (දුක්වූ පිළිපැදීම් සහිත වහා අවබොධකිරීම,) සුඛාපටිපදාදන්ධාභිඤ්ඤා (පහසුවූ පිළිපැදීම් ඇති සෙමින් අවබොධකිරීම,) සුඛාපටිපදාඛිප්පාභිඤ්ඤා (පහසුවූ පිළිපැදීම් ඇති වහා අවබොධ කිරීම,) යන මේ සතර වෙති.

ස්වාමීනි, එහි යම් මේ පිළිවෙත් පිරීමක් දුක් වන්නිද, අවබොධය සෙමින් වන්නේද, ස්වාමීනි, මේ ප්‍රතිපදාව දුක් බැවින්ද ප්‍රමාද බැවින්ද යන දෙකරුණෙන්ම හීනයයි කියනු ලබන්නීය. ස්වාමීනි, එහි යම් මේ ප්‍රතිපදාවක් දුක් වන්නීද අවබොධය වහා වන්නේද ස්වාමීනි, මේ ප්‍රතිපදාව දුක් බැවින් හීනයයි කියනු ලබන්නීය. ස්වාමීනි, එහි යම් මේ ප්‍රතිපදාවක්

සැප වන්නීද, අවබොධය ප්‍රමාද වන්නේද ස්වාමීනි, මේ ප්‍රතිපදාව ප්‍රමාද බැවින් හීනයයි කියනු ලබන්නීය.

"ස්වාමීනි, එහි යම් මේ ප්‍රතිපදාවක් සැප වන්නීද, අවබොධය සීඝ්‍ර වන්නේද ස්වාමීනි, මේ ප්‍රතිපදා තොමෝ සැප හෙයින්ද වහා පැමිණෙන හෙයින්දැයි යන දෙකරුණෙන් ප්‍රණීතයයි කියනු ලබන්නීය. ස්වාමීනි, මේ ප්‍රතිපදා පිළිබඳ දෙශනාවද එක්තරා ඉතා උතුම් බවෙකි.

12. "ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ යම් සේ යහපත් කොට කථාකිරීම පිළිබඳ ධර්මය දෙශනා කරයිද, ස්වාමීනි, මෙයද ඉතා උතුම් බවෙකි. ස්වාමීනි, මේ ලොකයෙහි ඇතැමෙක් බොරු වන්නාවූ වචන කථානොකරයි. භෙදකරවූ වචන කථා නොකරයි. කේලාම් වචන කථා නොකරයි. එකට එක කථා නොකරයි. ජය ගැනීමට කථා නොකරයි. නුවණින් පරීක්ෂා කොට සුදුසු කාලයෙහි සිත්හි තබා ගතයුතු වචන කියයි. ස්වාමීනි, යහපත් කොට කථාකිරීම පිළිබඳව මෙයද ඉතා උතුම් බවෙකි.

13. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම් පරිද්දකින් පුරුෂයන්ගේ යහපත් හැසිරීම පිළිබඳ ධර්මය දෙශනා කරයිද මෙයද ඉතා උතුම් බවෙකි.

"ස්වාමීනි, මේ ලෝකයෙහි ඇතැමෙක් සත්‍ය වචන කියන්නේ ශ්‍රද්ධා ඇත්තෙක් වන්නේය. කුහක නොවන්නේය. චාටු බස් කියන්නෙක් නොවන්නේය. ලාභ ලැබීම සඳහා අඟවන වචන කියන්නෙක් නොවන්නේය. සහමුලින් ගුණ මකා කීම නොකරන්නේය. ලාභයෙන් ලාභය නොසොයන්නෙක්ද ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇත්තෙක්ද වන්නේය. භොජනයෙහි පමණ දන්නෙක් වන්නේය. කාය වංකාදිය හැර සමව හැසිරෙන්නෙක් වන්නේය. නින්ද දුරු කිරීමෙහි යෙදුනෙක් වන්නේය. අලස නොවූයේ පටන් ගන්නාලද වීර්යය ඇත්තෙක් වන්නේය. ධ්‍යාන වඩන්නෙක් වන්නේය. සිහි ඇත්තෙක් වන්නේය. යහපත් වැටහීම් ඇත්තෙක් වන්නේය. ඥාන ගමනෙහි සමර්ථ නුවණින් යුක්තයෙක් වන්නේය. ධාරණයෙහි සමර්ථ නුවණින් යුක්තයෙක් වන්නේය. නුවණින් යුක්තයෙක් වන්නේය.

කාමයන්හි ගිජු වූවෙක් නොවන්නේය. සිහි ඇත්තෙක්ද, තැනට සුදුසු ප්‍රඥා ඇත්තෙක්ද වන්නේය. ස්වාමීනි, මේද පුරිසසීල සමාචාරය (පුරුෂයාගේ යහපත් හැසිරීම) පිළිබඳ ඉතා උතුම් බවෙකි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අනුශාසන කොට්ඨාසයන් පිළිබඳ ධර්මය යම්සේ දෙශනා කරයිද මෙයද අන්‍යවූ ඉතා උතුම් බවෙකි.

"ස්වාමීනි, මේ අනුශාසන කොටස් සතරෙකි. මේ පුද්ගල තෙමේ, අනුශාසනාව යම් සේද එසේ පිළිපැදීමෙන් ත්‍රිවිධ සංයොජනයන්ගේ (සත්කායදෘෂ්ටි විචිකිත්සා ශීලව්‍රත පරාමාස යන රැහැන් තුණ) නැති කිරීමෙන්, සෝවාන් වූයේ නිරයෙහි නොවැටෙන්නේ අභිසම්බොධියට (නිවන් අවබොධයට) නියම වූයේ වන්නේයයි තමන්වහන්සේගේ උපාය මනසිකාරයෙන් දැනගනී. මේ පුද්ගල තෙමේ අනුශාසනාව යම්සේද එසේ පිළිපැදීමෙන් ත්‍රිවිධ සංයොජනයන්ගේ නැති කිරීමෙන් රාග, ද්වෙෂ, මොහයන්ගේ තුනීකිරීමෙන් සකෘදාගාමී වන්නේය, එක වරක් මේ ලෝකයට පැමිණ දුක් කෙළවර කරන්නේයයි තමන්වහන්සේගේ උපාය මනසිකාරයෙන් අන්‍ය පුද්ගලයකු භාග්‍යවතුන්වහන්සේ දැනගනී. මේ පුද්ගල තෙමේ අනුශාසනාව යම්සේ ද එසේ පිළිපැදීමෙන් පස් වැදෑරුම් ඔරම්භාගිය සංයොජනයන්ගේ ක්ෂය කිරීමෙන් ඔපපාතික වන්නේය, ඒ බඹලොව පිරිනිවන්පාන්නේ ඒ බ්‍රහ්ම ලෝකයෙන් පෙරළා නොඑන්නේයයි තමන්වහන්සේගේ උපාය මනසිකාරයෙන් මෙනෙහි කිරීමෙන් අන්‍ය පුද්ගලයකු භාග්‍යවතුන් වහන්සේ දැනගනී. මේ පුද්ගල තෙමේ අනුශාසනාව යම්සේද එසේ පිළිපැදීමෙන් කෙලෙස් නැති කොට කෙලෙස් රහිතවූ අර්හත්ඵලයට පැමිණ මේ ආත්මයෙහිම තෙමේ උසස් නුවණින් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරන්නේයයි තමන් වහන්සේගේ උපාය මනසිකාරයෙන් අන්‍ය පුද්ගලයකු භාග්‍යවතුන් වහන්සේ දැනගනී. ස්වාමීනි, මේද අනුශාසනා කොටස් පිළිබඳ ඉතා උතුම් බවෙකි.

භාග්‍යවතුන් වහන්සේ අන් පුද්ගලයන්ගේ කෙළෙසුන් කෙරෙන් මිදීමේ ඥාන පිළිබඳව ධර්මය දෙශනා කරයිද මෙයද අනාවූ ඉතා උතුම් බවෙකි. මේ පුද්ගල තෙමේ ත්‍රිවිධ සංයෝජනයන්ගේ නැතිකිරීමෙන් සෝවාන්වූයේය. අපායෙහි නොවැටෙන්නේ රහත් බවට නියත වූයේ වන්නේයයි භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ උපාය මනසිකාරයෙන් දැනගනී. මේ පුද්ගලතෙමේ ත්‍රිවිධ සංයොජනයන් නැති කිරීමෙන් රාග, ද්වෙෂ, මොහයන් තුනී කිරීමෙන් සකෘදාගාමී වන්නේය. එක වරක්ම මේ ලෝකයට පැමිණ දුක් කෙළවර කරන්නේයයි භාග්‍යවතුන්වහන්සේ තමන්ගේ උපාය මනසිකාරයෙන් අන්‍ය පුද්ගලයකු දැනගනී. මේ පුද්ගල තෙමේ පස් වැදෑරුම් ඔරම්භාගිය සංයොජනයන් (ඕරයයි කියනලද කාම ලෝකය භජනය කරන්නාවූ සත්කායදෘෂ්ටි විචිකිත්සා ශිලව්‍රත පරාමාශ කාමරාග ව්‍යාපාද යන පස් වැදෑරුම් රැහැන්) නැති කිරීමෙන් ඖපපාතික වන්නේය. එහි පිරිනිවෙන්නේය. ඒ ලෝකයෙන් පෙරළා නොඑන්නේයයි භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ උපාය මනසිකාරයෙන් අන්‍ය පුද්ගලයකු දැනගනී. මේ පුද්ගල තෙමේ කෙලෙස් නැති කිරීමෙන් කෙලෙස් රහිතවූ අර්හත්ඵලයට පැමිණ මේ ආත්මයෙහි තෙමේ උසස් නුවණින් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරන්නේයයි භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ උපාය මනසිකාරයෙන් අන්‍ය පුද්ගලයකු දැනගනී. ස්වාමීනි, අන්‍ය පුද්ගලයන්ගේ කෙලෙසුන් කෙරෙන් මිදීමේ ඥාන පිළිබඳ ධර්මය දේශනා කිරීමෙහි මේද ඉතා උතුම් බවෙකි.

**16.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ශාස්වත වාදයන් (සදාකාලිකයයි ගන්නා වාදයන්) පිළිබඳ ධර්මය යම්සේ දෙශනා කරයිද මෙයද උතුම් බවෙකි. ස්වාමීනි, මේ ශාස්වත වාදයෝ (සදාකාලිකයයි ගන්නා වාදයෝ) තිදෙනෙකි. ස්වාමීනි, මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කෙළෙස් තවන වීර්යයට පැමිණ ඒ වීර්යයෙහි නැවත නැවත යෙදීමට පැමිණ, අප්‍රමාදයට පැමිණ, මනාව මෙනෙහි කිරීමට පැමිණ, යම්සේ සිතඑකඟවූ කල්හි නානා ප්‍රකාරවූ පෙර වාසය

කළ ආත්ම පිළිවෙළ සිහිකරයිද? එබඳු චිත්තසමාධියක් ලබයි. ඒ කෙසේද, එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුණක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් ජාති ලක්ෂ ගණන්ද අසවල් තැන වූයෙම් මෙබඳු නම් ඇත්තේ. මෙබඳු ගොත්‍ර ඇත්තේ, මෙබඳු වර්ණ ඇත්තේ, මෙබඳු ආහාරඇත්තේ මෙබඳු සැප දුක් විඳින්නේ, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තේ වීමියයි කියායි ඒ මම එයින් චුතවූයෙම් අසුවල් තැන උපනිමි. එහිද මෙබඳු නම් ඇත්තේ වීමි. මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු සැප දුක් වින්දේ වීමි. මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තේ වීමි. ඒ මම එයින් චුතවූයෙම් මෙහි උපන්නෙමි. මෙසේ ආකාර සහිතව දැක්වීම් සහිතව නානාප්‍රකාරවූ පෙර විසූ ආත්ම සිහි කරයි.

ලෝකය විනාශවූයේය කියා හෝ වැඩුනේය කියා හෝ මම අතීත කාලය දනිමි. ලෝකය විනාශ වන්නේය කියා හෝ වැඩෙන්නේය කියා හෝ මම අනාගත කාලයද දනිමි. ආත්මයද ලෝකයද ශාස්වතය, (සදාකාලිකය) වඳය, පර්වත කූටයක් මෙන් සිටියේය. මහකණුවක් මෙන් සිටියේය. ඒ සත්වයෝද ගමන්කරත්, සැරිසරත්, චුතවෙත්, උපදිත්. සදාකාලික වස්තු මෙන් නොවෙනස්ව ආත්මය ඇත්තේය. මේ පළමුවැනි ශාස්වත වාදයයි.

17. ස්වාමීනි, නැවත අනෙකක් කියමි. මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් කෙළෙස් තවන වීර්යයට පැමිණ, ඒ වීර්යයෙහි නැවත නැවත යෙදීමට පැමිණ, අප්‍රමාදයට පැමිණ, මනාව මෙනෙහි කිරීමට පැමිණ, යම් පරිද්දකින් සිත එකඟවූ කල්හි අනේකවිධ පූර්වෙනිවාසය සිහිකෙරේද, එසේවූ චිත්තසමාධියක් හෙවත් පෙරවිසූ ආත්ම පිළිවෙල දැනගැණීමේ නුවණ ලබයි. ඒ කෙසේද? නැසෙන වැඩෙන හෙයින් සංවර්ත විවර්ත නම්වූ එක් කල්පයක්ද, සංවර්ත විවර්ත දෙකක්ද, සංවර්ත විවර්ත තුනක්ද, සංවර්ත විවර්ත සතරක්ද, සංවර්ත විවර්ත පසක්ද, සංවර්ත විවර්ත දශයක්ද,

අසුවල් තැන උපන්මි. මෙනම් වීමි. මෙම ගොත්‍ර වීමි මෙබඳු වර්ණ ඇත්තේ වීමි. මෙවැනි ආහාර ඇත්තේ වීමි. මෙබඳු සුවදුක් වින්දෙමි. මෙපමණ ආයුෂ කෙළවර කොට ඇතිවීමි. ඒ මම එයින් චුතව අසුවල් තැන උපන්මි. එහිදු මෙනම් වීමි. මෙබඳු ගොත්‍ර ඇති වීමි. ඒ මම එයින් චුතව මෙහි උපන්මියි මෙසේ ආකාර සහිතව දැක්වීම් සහිතව, නොයෙක් පූර්වෙනිවාස සිහි කරයි. හෙතෙමේ මෙසේ කියයි. ලෝකය නැසීම් සහිතය කියා හෝ වැඩීම් සහිතය කියා හෝ අතීත කාලයද මම දනිමි. ලෝකය නැසීම් සහිත වන්නේය කියා හෝ ලෝකය වැඩීම් සහිත වන්නේය කියා හෝ මම අනාගත කාලයද දනිමි. ආත්මයද ලෝකයද ශාස්වතය, වඳය, පර්වතකූටයන් මෙන් සිටියේ ඉන්ද්‍රඛීලයක් මෙන් (මහකණුවක්) මෙන් සිටියේය. ඒ සත්වයෝ ගමන් කරත්. සැරිසරත්, චුතවෙත්, උපදිත්, සදාකාලික වස්තූන් මෙන් නොනැසී සිටිත්. ස්වාමීනි මේ දෙවන ශාස්වත වාදයයි

18. "ස්වාමීනි, නැවත අනෙකක් කියමි. මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කෙළෙස් තවන වීර්යයට පැමිණ ඒ වීර්යයෙහි නැවත නැවත යෙදීමට පැමිණ අප්‍රමාදයට පැමිණ, මනාව මෙනෙහි කිරීමට පැමිණ, යම්සේ සිත එකඟවූ කල්හි අනෙකප්‍රකාර පූර්වෙනිවාස සිහි කරයිද එබඳුවූ චිත්තසමාධිය ලබයි. ඒ කෙසේද, විනාශවන වැඩෙන කල්ප එකක්ද, විනාශවන වැඩෙන කල්ප දෙකක්ද, විනාශවන, වැඩෙන කල්ප තුනක්ද, විනාශවන වැඩෙන කල්ප සතරක්ද, විනාශවන වැඩෙන කල්ප පසක්ද, දශ සංවර්ත විවර්තයක්ද, (වැඩෙන්නාවූ පිරිහෙන්නාවූ කල්පයන්ද) විසි සංවර්ත විවර්තයක්ද, තිස් සංවර්ත විවර්තයක්ද සතළිස් සංවර්ත විවර්තයක්ද, සිහිකරයි. අසුවල් තැන උපන්මි. මෙනම් ඇත්තේ වීමි. මෙනම් ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේ වීමි. මෙබඳු සුවදුක් විඳින්නේ වීමි. මෙබඳු ආයුෂ කෙළවරක් ඇතිවීමි. ඒ මම එයින් චුතව අසුවල් තැන උපනිමි. එහිදු මෙනම්, වීමි මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු සැපදුක් වින්දේ වීමි. මෙබඳු ආයුෂ කෙළවරක් ඇතිවීමි. ඒ මම එයින් චුතව උපනිමියි මෙසේ ආකාර

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සහිතව, දැක්වීම් සහිතව නොයෙක් ආකාර පෙර විසූ පිළිවෙල සිහිකරයි. හෙතෙමේ මෙසේ කියයි. 'ලෝකය සංවර්තවිවර්ත සහිතයයි මම අතීතයද දනිමි. ලෝකය සංවර්ත සහිත වන්නේය. විවර්ත සහිත වන්නේයයිද මම අනාගතයද දනිමි. ආත්මයද ලෝකයද ශාස්වතය (සදාකාලිකය) පර්වත කූටයක් මෙන් සිටියේය. ඉන්ද්‍රඛීලයක් මෙන් සිටියේය. ඒ සත්වයෝද, සසර ගමන් කරත්. සැරිසරත්, මැරෙත්, උපදිත්. සදාකාලික වස්තූන් මෙන් පවතිත්. ස්වාමීනි, මේ තුන්වන ශාස්වත වාදයයි. ස්වාමීනි, ශාස්වත වාදයන් පිළිබඳ මෙයද උතුම් බවෙකි.

19. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පූර්වෙනිවාසානුස්මෘති ඥානය පිළිබඳ ධර්මය යම්සේ දෙශනා කරයිද මෙයද අන්‍යවූ (නිරුත්තර) උතුම් බවෙකි. "ස්වාමීනි, මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කෙළෙස් තවන වීර්යයට පැමිණ, ඒ වීර්යයෙහි නැවත නැවත යෙදීමට පැමිණ, අප්‍රමාදයට පැමිණ, මනාව මෙනෙහි කිරීමට පැමිණ, යම් පරිද්දකින් සිත එකඟවූ කල්හි නොයෙක් ආකාරවූ පෙර විසූ පිළිවෙල යම්සේ සිහි කරයිද එබඳුවූ චිත්තසමාධිය ලබයි. ඒ කෙසේද? එක්ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුණක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත කල්පයන්ද, නොයෙක් විවර්ත කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද, මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව, අනෙකවිධ පූර්වෙනිවාසය සිහිකරයි. යම් කෙනෙකුගේ ගණන් වශයෙන් හෝ සඞ්ඛ්‍යා වශයෙන් හෝ ආයුෂ ප්‍රමාණකර කියන්නට හැකි දෙවිකෙනෙක් නැත. එසේ වුවත් රූප ලෝකයන්හි හෝ අරූපලෝකයන්හි හෝ (සංඥාව පමණක් ඇති බඹලොව) සංඥ තලයන්හි හෝ අසංඥ තලයන්හි හෝ නෙවසඤ්ඤා නාසඤ්ඤ තලයන්හි හෝ යම් යම් ආත්මභාවයක වාසය කළේද මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව අනෙකවිධ පූර්වෙනිවාසය සිහි කරයි. ස්වාමීනි, මෙයද පූර්වෙනිවාසානුස්මෘති ඥානය පිළිබඳ ඉතා උතුම් බවෙකි.

**20.** "ස්වාමීනි, යම්සේ භාග්‍යවතුන් වහන්සේ සත්වයන්ගේ චුතූපපාත ඥානය පිළිබඳව (මරණය හා ඉපදීම දැනගන්නා නුවණ) ධර්මය දෙශනාකරයිද මෙයද අනාවූ නිරුත්තර බවෙකි. ස්වාමීනි මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කෙලෙස් තවන වීර්යයට පැමිණ ඒ වීර්යයෙහි නැවත නැවත යෙදීමට පැමිණ, අප්‍රමාදයට පැමිණ, මනාව මෙනෙහි කිරීමට පැමිණ, යම් පරිද්දකින් සිත එකඟවූ කල්හි මිනිස් ඇස ඉක්මවූ, පිරිසිදු දිවැසින්, චුතවන්නාවූද උපදින්නාවූද, හීනවූද, උසස්වූද, යහපත් වර්ණ අත්තාවූද දුර්වර්ණවූද, යහපත්ගති ඇත්තාවූද, අයහපත්ගති ඇත්තාවූද කම්වූ පරිදි මිය පරලොව යන්නාවූ සත්වයන් දැන ගනීද එබඳුවූ චිත්ත සමාධිය ලබයි. මේ පින්වත් සත්වයෝ එකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනො දුශ්චරිතයෙන් යුක්තවූවාහු, ආර්‍ය්‍යයන්ට දොස් කියන්නාහුද, මිසදිටුවූවාහු, මිථ්‍යාදෘෂ්ටි කර්මයන් සමාදන්වූවාහු ඔව්හු මරණින්මතු සැපයෙන් පහවූ හෙයින් අපායනම්වූ දුකට පැමිණීම හෙයින් දුග්ගති නම්වූ, විවසව (හිස යටිකුරුව වැටෙන්නාවූ) නරකයෙහි උපන්නාහුය. මේ පින්වත් සත්වයෝ කයින් කරන සුචරිතයෙන් යුක්තවූවාහු වචනයෙන් කරන සුචරිතයෙන් යුක්තවූවාහු, හිතින් කරන සුචරිතයෙන් යුක්තවූවාහු ආර්‍ය්‍යයන්ට දොස් නොකියන්නාහු සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන් වූවාහු ඔව්හු ශරීරභෙදයෙන්, මරණින්මතු සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපන්නාහුයයි මෙසේ මිනිස් ඇස ඉක්මවූ, පිරිසිදු දිවැසින්, චුතවන්නාවූද, උපදින්නාවූද හීනවූද, ප්‍රණීතවූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද කම්වූපරිදි පරලොව යන සත්වයන් දැනගනී. ස්වාමීනි, සත්වයන්ගේ චුතූපපාත ඥානයෙහි මෙයද ඉතා උතුම් බවෙකි.

**21.** "ස්වාමීනි, යම්සේ භාග්‍යවතුන් වහන්සේ ඍද්ධි විෂයෙහි ධර්මය දෙශනා කරයිද මෙයද අනාවූ නිරුත්තර (උතුම්) බවෙකි ස්වාමීනි, මේ ඍද්ධිවිෂයයෝ දෙදෙනෙකි. ස්වාමීනි, ආශ්‍රව සහිතවූ උපධි (කෙලෙස්) සහිතවූ, ආර්‍ය්‍යනොවූ ඍද්ධියක්

ඇත්තේය. ස්වාමීනි ආශ්‍රව රහිතවූ, කෙළෙස් රහිතවූ ආයඞීවූ ඍද්ධියක් ඇත්තේය. ස්වාමීනි, ආශ්‍රව සහිතවූ. උපධි (කෙලෙස්) සහිතවූ ආයඞී නොවූ ඍද්ධිය කවරේද? ස්වාමීනි මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කෙලෙස් තවන වීර්යයට පැමිණ ඒ වීර්යයෙහි නැවත නැවත යෙදීමට පැමිණ, අප්‍රමාදයට පැමිණ, මනාව මෙනෙහි කිරීමට පැමිණ, යම් පරිද්දකින් සිත එකඟවූ කල්හි අනෙකවිධ ඍද්ධිවිධිය ලබාද, එබඳුවූ චිත්ත සමාධිය ලබයි. කෙසේද එකෙක්ව බොහෝ දෙනෙක් වෙයි. බොහෝ දෙනෙක්ව එකෙක් වෙයි. ප්‍රකට බවටද, අප්‍රකට බවටද පැමිණෙයි. භිත්ති සරස, ප්‍රාකාර සරසද, පර්වත සරසද, අහසේ යම්සේද එසේ නොගැටෙමින් ගමන් කරයි. දියෙහි මෙන් පෘථිවියෙහිද ගැලීම්, ඉල්පීම් කරයි. පෘථිවියෙහි මෙන් ජලයෙහිද නොකිඳෙමින් යයි. පක්ෂියෙක් යම්සේද එසේ අහසෙහි හිඳගෙනම (හිඳීමෙන්) යයි. මහත් ඍද්ධි ඇති මේ සඳහිරු දෙදෙනද අතින් අල්ලයි, අතගායි. බඹ ලොව දක්වා කයින් සිය වසඟයෙහි පවත්වයි. ස්වාමීනි, මේ ආශ්‍රව සහිත, කෙලෙස් සහිත ආයඞී නොවූ ඍද්ධියයි. ස්වාමීනි, යම් බඳු ඍද්ධියක් ආශ්‍රව රහිතද කෙලෙස් රහිතද ආයඞීයයි කියනු ලැබේද ඒ ඍද්ධිය කවරේද? ස්වාමීනි, මේ ලෝකයෙහි යම් භික්ෂුවක් පිළිකුලෙහි පිළිකුල් නොවූ සංඥා ඇත්තේ වාසය කරන්නෙමියි ඉඳින් කැමති වන්නේද, එහි නොපිළිකුල් සංඥා ඇත්තේ වාසය කරයි. ඉඳින් නොපිළිකුළෙහි පිළිකුල් සංඥා ඇත්තේ වාසය කරන්නෙමියි කැමතිවේද එහි පිළිකුල් සංඥා ඇත්තේ වාසය කරයි. පිළිකුළෙහිද නොපිළිකුළෙහිද නොපිළිකුල් සංඥා ඇත්තේ වාසය කරන්නෙමියි ඉඳින් කැමති වෙයි. එහි පිළිකුල් සංඥා ඇත්තේ වාසය කරයි. පිළිකුලද, නොපිළිකුළද යන ඒ දෙක දුරු කොට සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥා ඇත්තේ මධ්‍යස්ථවූයේ වාසය කරන්නෙමි'යි ඉඳින් කැමති වේ නම් සිහි ඇත්තේ සම්‍යක්ප්‍රඥා ඇත්තේ එහි උපෙක්ෂාවූයේ වාසය කරයි. ස්වාමීනි මේ ඍද්ධිය වනාහි ආශ්‍රව (තද ඇල්ම) රහිත, කෙලෙස් රහිත ආයඞීඍද්ධියයි කියනු ලැබේ. ස්වාමීනි මෙද ඍද්ධි විෂයෙහි උතුම් බවෙකි. භාග්‍යවතුන් වහන්සේ එය

සම්පූර්ණයෙන් දනිත්, එය සම්පූර්ණයෙන් දන්නාවූ භාග්‍යවතුන් වහන්සේට මත්තෙහි දතයුත්තක් නැත. ඍද්ධි කොටස් පිළිබඳ භාග්‍යවතුන් වහන්සේට වඩා දන්නාවූ අන්‍ය ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නොවන්නේය.

**22.** ස්වාමීනි, පටන්ගන්නා ලද වීර්යය ඇති ස්ථිර වීර්යයෙන් යුක්ත පුරුෂ වීර්යයෙන් යුක්ත පුරුෂ පරාක්‍රමයෙන් යුක්ත මහා පුරුෂ වීර්යයෙන් යුක්ත, ශ්‍රද්ධාවත් කුල පුත්‍රයකු විසින් පැමිණිය යුතු යමක් ඇද්ද භාග්‍යවතුන් වහන්සේ එයට පැමිණියේය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ හීනවූ, ග්‍රාම්‍යවූ පෘථග්ජනයන්ට අයිතිවූ, ආර්‍ය්‍ය නොවූ අනර්ථ සහිතවූ කාම සුඛල්ලිකානු යොගයෙහි (කාම සැපයේ ඇලීමෙහි) නොයෙදුනේ වෙයි. දුක්වූ, අනාර්‍ය්‍යවූ අනර්ථ සහිත වූ අත්තකිලමථානු යොගයෙහි (තම ශරීරය වෙහෙසට පමුණුවා යෙදීම) නොයෙදුනේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ කාමාවචර සිත් (කාමභවයෙහි හසුරු වන්නාවූ සිත්) ඉක්ම සිටියාවූ, මේ ආත්මභාවයෙහි සැප විහරණ ඇත්තාවූ සතර ධ්‍යානයන් කැමති පරිදි ලබන්නේය. පහසුවෙන් ලබන්නේය. ස්වාමීනි, මා අතින් මෙසේ විචාරන්නේද? කිම ශාරීපුත්‍රය? අභිසම්බොධියෙන් (බුදුබවලැබීමෙන්) භාග්‍යවතුන්වහන්සේට වඩා වැඩි නුවණැත්තාවූ අන්‍ය ශ්‍රමණ කෙණෙක් හෝ බ්‍රාහ්මණ කෙණෙක් හෝ අතීත කාලයෙහි වූවාහු දැයි මෙසේ විචාරණ ලද්දේ, 'ස්වාමීනි, මම නැතැයි කියන්නෙමි.' කිම ශාරීපුත්‍රය, සම්බොධියෙන් භාග්‍යවතුන් වහන්සේට වඩා වැඩි නුවණැත්තාවූ අන්‍ය ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙණෙක් හෝ අනාගත කාලයෙහි පහළවන්නේදැ'යි මෙසේ විචාරණ ලද්දේ ස්වාමීනි, 'මම නැතැයි කියන්නෙමි.' කිම ඇවැත්නි, ශාරීපුත්‍රය, සම්බොධියෙන් භාග්‍යවතුන් වහන්සේට වඩා වැඩි නුවණ ඇත්තාවූ අන්‍ය ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙණෙක් මෙකල්හි වෙත්දැ'යි මෙසේ විචාරණ ලද්දේ 'ස්වාමීනි, මම නැතැයි කියමි.' ස්වාමීනි, ඉදින් මා අතින් මෙසේ විචාරන්නේද, කිම ඇවැත්නි, ශාරීපුත්‍රය, සම්බොධියෙන් භාග්‍යවතුන් වහන්සේ හා සමාන අන්‍ය ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් අතීත කාලයෙහි වූවාහු දැ'යි මෙසේ

විචාරණ ලද්දේ 'ස්වාමීනි, මම එසේය'යි කියන්නෙමි. කිම ඇවැත්නි, ශාරීපුත්‍රය, සම්බොධියෙන් භාග්‍යවතුන් වහන්සේ හා සමාන අන්‍ය ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ අනාගත කාලයෙහි වන්නාහුදැ'යි මෙසේ විචාරණ ලද්දේ 'ස්වාමීනි, මම එසේය'යි කියන්නෙමි. කිම ඇවැත්නි ශාරීපුත්‍රය, මෙකල්හි සම්බොධියෙන් භාග්‍යවතුන් වහන්සේ හා සමාන අන්‍ය ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණකෙනෙක් වෙත්දැ'යි මෙසේ විචාරණලද්දේ 'ස්වාමීනි, මම නැතැයි කියන්නෙමි.' ස්වාමීනි, ඉදින් මා අතින් මෙසේ විචාරන්නේද, කිම ඇවැත්නි ශාරීපුත්‍රය, එක්තරා ශාස්තෘකෙනෙකුගේම උතුම් බව පිළිගන්නෙහිද? එක්තරා ශාස්තෘකෙනෙකුගේ උතුම් බව නොපිළිගන්නෙහිදැයි මෙසේ විචාරණ ලද්දේ ස්වාමීනි, මම මෙසේ ප්‍රකාශ කරන්නෙමි. ඇවැත්නි, මෙය භාග්‍යවතුන් වහන්සේගෙන්ම අසන ලදී. භාග්‍යවතුන් වහන්සේ වෙතින්ම පිළිගන්නාලදී. අතීතකාලයෙහි සම්බොධියෙන් මා හා සමානවූ අර්හත් සම්‍යක් සම්බුදුවරයෝ පහළවූහයි අසන ලදී. අනාගතයෙහි සම්බොධියෙන් සමානවූ අර්හත් සම්‍යක් සම්බුදුවරයෝ පහළවන්නාහයි භාග්‍යවතුන් වහන්සේගෙන්ම අසනලදී. භාග්‍යවතුන් වහන්සේ වෙතින්ම පිළිගන්නා ලදී. එක් ලෝකයක අර්හත්වූ බුදුවරු දෙනමක් ඉදිරි පසු නොවී උපදින්නාහුය යන මේ කාරණය අස්ථානයි, (සිද්ධනොවේ) අනවකාසයි. ඊට හෙතු නැතැයි අසනලදී. ස්වාමීනි, ඇතැමෙක් මගෙන් මෙසේ විචාළවිට මම මෙසේ ප්‍රකාශ කළොත් භාග්‍යවතුන්වහන්සේගේ වචනයට අනුකූලද? භාග්‍යවතුන් වහන්සේට (බොරුවෙන්) චොදනා කරන්නෙක් නොවන්නෙම්ද? ධර්මයට අනුකූල වූවක් ප්‍රකාශ කෙරෙම්ද? කරුණු සහිත කිසියම් වාදානුපාතයෙක් නොවේද? ගැරහිය යුතු ස්ථානයට නොපැමිණේද? එසේ නම් ශාරීපුත්‍රය, නුඹ මෙසේ විචාරණ ලද්දේ මෙසේ ප්‍රකාශ කරනු ලබන්නේ අනුකූලව කියන්නෙක් වෙයි. මට බොරුවෙන් චොදනා නොකරන්නෙහිය. ධර්මයට අනුකූලව ප්‍රකාශ කරන්නෙහිය. සහධාර්මිකවූ (කරුණු සහිතවූ) කිසිවෙක් වාදයෙහි ගැරහිය යුතු තැනට නොපැමිණෙයි. මෙසේ

වදාළ කල්හි ආයුෂ්මත් උදායිස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය දැන්නුවේය.

23. "ස්වාමීනි, යම් තථාගතවරයෙක් තෙමේ මෙබඳු මහත් ඍද්ධි ඇත්තේ, මෙබඳු මහානුභාව ඇත්තේ වේද? එබඳු තථාගතයන්ගේ මදකින් සතුටුවන බව, ලද දෙයින් සතුටුවන බව, සැහැල්ලු පැවතුම් ඇති බව, ආශ්චර්‍ය්‍යය, අද්භූතය එසේද වුවත් තමාගේ ගුණ ප්‍රකට නොකරන්නේය. ස්වාමීනි, මෙයින් එක ධර්මයක්වත් අන්‍යතීර්ථක පරිබ්‍රාජිකයෝ තමන් කෙරෙහි දක්නාහු නම් ඔව්හු එපමණකින්ම කොඩි ඔසවන්නාහුය. ස්වාමීනි, මෙබඳු මහත් ඍද්ධි ඇති මහානුභාව ඇති යම් තථාගතවරයෙක් වේද? ඒ තථාගතයන්ගේ මද දෙයින් සතුටුවන බව, ලද දෙයින් සතුටු වන බව, සැහැල්ලු පැවතුම් ඇති බව, ආශ්චර්‍ය්‍යය, පුදුමය, එසේද වුවත් තමාගේ ගුණ ප්‍රකට නොකරන්නේ යයි කීය. උදායී, නුඹ මෙබඳු මහත් ඍද්ධි ඇති, මෙබඳු මහානුභාව ඇති යම් තථාගතවරයෙක් වේද? ඒ තථාගතවරයන්ගේ මද දෙයින් සතුටුවන බව, ලද දෙයින් සතුටු වන බව, සැහැල්ලු පැවතුම් ඇති බව, තමන්ගේ ගුණ ප්‍රකට නොකරන බව යන මේ ආදිය බලව. උදායී, මෙයින් එක ධර්මයක් හෝ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ තමන් කෙරෙහි දක්නාහු නම් ඔව්හු එපමණකින්ම කොඩි ඔසවන්නාහුය. උදායි, නුඹ මෙබඳු මහත් ඍද්ධි ඇති මෙබඳු මහානුභාව ඇති එතකුදු වුවත් තමන්ගේ ගුණ ප්‍රකට නොකරන්නාවූ යම් තථාගතවරයෙක් වේද ඒ තථාගතවරයන්ගේ මද දෙයින් සතුටුවන බව, ලදදෙයින් සතුටුවන බව, සැහැල්ලු පැවතුම් ඇති බව බලවය"යි වදාළේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ කැඳවූවෝය. "එසේ නම් ශාරීපුත්‍රය, මේ ධර්මක්‍රමය භික්ෂූන්ටද, භික්ෂුණීන්ටද, උපාසකයන්ටද, උපාසිකාවන්ටද නැවත නැවත කියව. ශාරීපුත්‍රය, යම්බඳු හිස් පුරුෂයන්ගේ තථාගතයන් වහන්සේ කෙරෙහි සැකයක් හෝ විමතියක් හෝ වන්නේද ඔවුන්ගේ ඒ සැකය ඒ විමතිය මේ ධර්ම ක්‍රමය අසා නැති වන්නේය."

ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි සතුට පළ කළේය. එහෙයින් මේ මේ ප්‍රකාශනයට 'සම්පසාදනීය' යනුම නමෙකි.

**විසිඅටවැනිවූ සම්පසාදනීය සූත්‍රය නිමි.**

---

## 29. පාසාදික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. (නොහොත් මාගේ ඇසීම මෙසේයි). එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි දුනු ශිල්ප උගත් විදීම් ශාස්ත්‍රය දත් ශාක්‍යයෝ වූවාහුද ඔවුන්ගේ අඹ උයන තුළවූ ප්‍රාසාදයෙහි වැඩ වාසය කරති. එකල නිගණ්ඨනාත පුත්‍ර තෙමේ පාවා නම් නුවරෙහිදී නොබෝදිනකට පෙර මැරුණේය. ඔහුගේ මරණයෙන් පසු බිඳීගිය නිගණ්ඨයෝ කොටස් දෙකක් වූවාහු හටගත් ඩබර ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විරුද්ධ වාදයට පැමිණියාහු ඔවුනොවුන් අතර මුඛ නමැති ආයුධයන්ගෙන් විදිමින් වාසය කරන්නාහුය. 'තෝ මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි. කිම, තෝ මේ ධර්ම විනය දන්නෙහිද? තෝ වරදවා පිළිපදින්නෙහිය. මම මනාකොට පිළිපදින්නෙමි. මාගේ වචන අර්ථ සහිත වන්නේය. තාගේ වචන අර්ථ රහිත වන්නේය. පළමුව කියයුත්ත පසුව කීයේය. පසුව කියයුත්ත පළමුව කීයේය. තා විසින් පුරුදු කරන ලද්ද මාගේ වාදයට පැමිණ නැවතුනේය. තා විසින් වාදය නංවන ලද්දේය. තාගේ මත්තෙහි මා විසින් දොෂය නංවන ලද්දේය. බත් මුලක් රැගෙන ඒ ඒ අය කරා එළඹ වාදයෙන් මිදීම පිණිස උත්තර සොයමින් හැසිරෙව. ඉදින් හැකි වන්නෙහි නම් මා විසින් නගනලද දොෂයෙන් තමන් මුදා ගන්නෙහිය. නිගණ්ඨනාත පුත්‍රයන් කෙරෙහි එක් මරණයෙක් වන්නේයයි හඟිමියි,' කියන්නාහුය. ගිහි වස්ත්‍ර හඳනා ලද අනුව පවත්නාවූ නිගණ්ඨනාථ පුත්‍රයාගේ යම්බඳු ගිහි ශ්‍රාවකයෝ වෙද්ද ඔව්හුද ඒ නිගණ්ඨනාථ පුත්‍ර ශ්‍රාවකයන් කෙරෙහි කලකිරුණු ස්වභාව ඇතිව නොඇලුණු ස්වභාව ඇතිව

සත්කාර කිරීමාදියෙන්ද වැළකුණාහුය. නොමනාව ප්‍රකාශ කරන ලද්දාවූ නොමනා දැනීම් ඇත්තාවූ නිවනට නොපමුණුවන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස නොපවත්නාවූ සම්‍යක් සම්බුදු රජුන් විසින් දෙශනා නොකරන ලද්දාවූ ධර්ම විනයෙහි පිහිට බිඳීගියාවූ පිළිසරණක් නැත්තාහු යම්සේද එසේ වූහ.

2. එකල්හි චුන්ද ස්ථවිර තෙමේ පාවා නුවර වස්වසා නිමවන ලද වස් ඇත්තේ සාම නම් ගම යම් තැනෙක්හිද ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේට වැඳ එක පැත්තක හුන්නේය. එකපැත්තක හුන්නාවූ චුන්දස්ථවිර තෙමේ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේට මේ කාරණය දැන්නුවේය. "ස්වාමීන් වහන්ස, නොබෝදා නිගණ්ඨනාත පුත්‍රතෙමේ පාවා නුවරෙහිදී මැරුණේය. ඔහුගේ මරණයෙන් පසු බිඳී ගිය නිගණ්ඨයෝ කොටස් දෙකක් වූවාහු හටගත් ඩබර ඇත්තාහු, හටගත් කලහ ඇත්තාහු, විරුද්ධ වාදයට පැමිණියාහු, ඔවුනොවුන් අතර මුඛ නමැති ආයුධයන්ගෙන් විදිමින් වාසය කරන්නාහුය. 'තෝ මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි. කිම තෝ මේ ධර්ම විනය දන්නෙහිද? තෝ වරදවා පිළිපදින්නෙහිය. මම මනා කොට පිළිපදින්නෙමි. මාගේ වචන අර්ථ සහිත වන්නේය. තාගේ වචන අර්ථ රහිත වන්නේය. පෙරටුව කියයුත්ත පසුව කීයේය. පසුව කියයුත්ත පෙරටුව කීයේය. තා විසින් පුරුදු කරන ලද්ද මාගේ වාදයට පැමිණ නැවතුනේය. තා විසින් වාදය නංවන ලද්දේය. තාගේ මත්තෙහි මා විසින් දොෂය නංවන ලද්දේය. බත්මුලක් රැගෙන ඒ ඒ අය කරා එළඹ වාදයෙන් මිදීම පිණිස උත්තර සොයමින් හැසිරෙව. ඉදින් හැකි වන්නෙහි නම් මා විසින් නගනලද දොෂයෙන් තමන් මුදාගන්නෙහිය. නිගණ්ඨනාත පුත්‍රයන් කෙරෙහි එක් මරණයෙක් වන්නේයයි හඟිමියි කියන්නාහුය.

ගිහි වස්ත්‍ර හඳනාලද අනුව පවත්නාවූ නිගණ්ඨනාත පුත්‍රයාගේ යම් බඳු ගිහි ශ්‍රාවකයෝ වෙද්ද ඔව්හු ඒ නිණ්ඨනාත පුත්‍ර ශ්‍රාවකයන් කෙරෙහි කලකිරුණු ස්වභාව ඇතිව නොඇලුණු

ස්වභාව ඇතිව සත්කාර කිරීමාදියෙන්ද වැළකුනාහුය. අයහපත්කොට ප්‍රකාශකරන ලද්දාවූ නොමනා දැනීම් ඇත්තාවූ නිවනට නොපමුණු වන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස නොපවත්නාවූ සම්‍යක්සම්බුදුරජුන් විසින් දෙශනා නොකරන ලද්දාවූ ධර්මවිනයෙහි පිහිට බිඳී ගිය පිළිසරණක් නැති කල යම්සේද එසේ වූහයි කීය.”

3. මෙසේ කී කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ චුන්දස්ථවිරයන්ට මෙය කීයේය. “ඇවැත් චුන්දය, භාග්‍යවතුන් වහන්සේ දැකීමට මේ කථා පඬුර ඇත්තේය. ඇවැත් චුන්දය, යමු. භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණෙන්නෙමු. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මේ කරුණු දන්වන්නෙමුය”යි කීහ.

“එසේය, ස්වාමීන් වහන්සැ”යි කියා චුන්ද ස්ථවිර තෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්නේය. එකල ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේද, චුන්දස්ථවිර තෙමේද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමුණුනාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක පැත්තක හුන්නාහුය. එක පැත්තක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්නුවේය.” ස්වාමීන්වහන්ස, මේ චුන්දස්ථවිර තෙමේ මෙසේ කීයේය. ‘ස්වාමීන් වහන්ස, නිගණ්ඨනාත පුත්‍ර තෙමේ පාවා නම් නුවර මේ නොබෝදා මැරුණේය. ඔහුගේ මරණයෙන් පසු නිගණ්ඨයෝ දෙකොටසක්ව බිඳී ගොස් හටගත් ඩබර ඇතිව හටගත් කලහ ඇතිව විරුද්ධ වාදයට පැමිණියාහු ඔවුනොවුන් අතර මුඛ නමැති ආයුධයන්ගෙන් විදිමින් වාසය කරන්නාහුය. ‘තෝ මේ ධර්මවිනය නොදන්නෙහිය. මම මේ ධර්මවිනය දනිමි. කිම තෝ මේ ධර්මවිනය දන්නෙහිද? තෝ වරදවා පිළිපදින්නෙහිය. මම යහපත්ව පිළිපදින්නෙමි. මාගේ වචන අර්ථ සහිත වන්නේය. තාගේ වචන අර්ථ රහිත වන්නේය. පළමුව කියයුත්ත පසුව කීයේය. පසුව කියයුත්ත පළමුව කීයේය. තා විසින් පුරුදු කරන ලද්ද මාගේ වාදයට පැමිණ නැවතුනේය. තා විසින් වාදය නංවන ලද්දේය, තාගේ මත්තෙහි මා විසින්

දොෂය නංවන ලද්දේය. බත් මුලක් රැගෙන ඒ ඒ අය කරා පැමිණ වාදයෙන් මිදීම පිණිස උත්තර සොයමින් හැසිරෙව. ඉදින් හැකි වන්නෙහි නම් මා විසින් නගනලද දොෂයෙන් තමා මුදා ගන්නෙහිය. නිගණ්ඨනාත පුත්‍රයන් කෙරෙහි එක් මරණයෙක් වන්නේය' යි හඟිමියි කියන්නාහු ගිහිවස්ත්‍ර හඳනාලද අනුව පවත්නාවූ නිගණ්ඨනාත පුත්‍රයාගේ යම්බඳු ගිහි ශ්‍රාවකයෝ වෙත්ද ඔව්හුද ඒ නිගණ්ඨනාත පුත්‍ර ශ්‍රාවකයන් කෙරෙහි කලකිරුණු ස්වභාව ඇතිව නො ඇලුණු ස්වභාව ඇතිව සත්කාර කිරීමාදියෙන්ද වැළකුණාහුය. අයහපත්ව ප්‍රකාශකරන ලද්දාවූ අයහපත් දැනීම ඇත්තාවූ නිවනට නොපමුණු වන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස නොපවත්නාවූ සම්‍යක් සම්බුදු රජුන් විසින් දෙශනා නොකරන ලද්දාවූ ධර්මවිනයෙහි පිහිට බිඳී ගියාහු පිළිසරණක් නැත්තෝ වූවාහුයයි දැන්නුවේය. එවිට භාග්‍යවතුන් වහන්සේ චුන්දය, මේ කාරණය මෙසේම වන්නේය. අයහපත්ව ප්‍රකාශකළාවූ අයහපත් දැනුම් ඇත්තාවූ නිවනට නොපමුණුවන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස නොපවත්නාවූ සම්‍යක් සම්බුදුරජුන් විසින් ප්‍රකාශ නොකළාවූ ධර්මවිනයෙහි මෙසේ වන්නේයයි වදාළේය.

4. "චුන්දය, මේ ලොකයෙහි ශාස්තෘ තෙමේ සම්‍යක් සම්බුද්ධ නුවූයේ වේද, ධර්මය අයහපත් කොට ප්‍රකාශ කරන ලද්දේ වේද, අයහපත් කොට දන්නා ලද්දේ වේද, නිවනට නොපමුණුවයිද, කෙලෙස් සංසිඳවීම පිණිස නොපවත්නේද, සම්‍යක් සම්බුදුරජ විසින් දෙශනා නොකරණ ලද්දේ වේද, ශ්‍රාවක තෙමේද ඒ ධර්මයෙහි ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි නොපිළිපදින්නේද සාමීචි ප්‍රතිපත්තියෙහි (සුදුසු පිළිවෙතෙහි) නොපිළිපදින්නේද ධර්මය අනුව නොහැසිරෙන්නේද, ඒ ධර්මයෙන් ඉවත්ව පවතීද, හෙතෙමේ මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, ඒ තාහට ලාභයක් වන්නේය. ඒ තාගේ මිනිසත් බවද යහපත් ලැබීමෙක් වූයේය. තාගේ ශාස්තෘ තෙමේද සම්‍යක්සම්බුද්ධ නුවූයේය. ධර්මය තෙමේද යහපත්ව නොකියන ලද්දේය. යහපත්ව දන්නා ලද්දේ නොවෙයි. නිවනට නොපමුණුවන්නේය. කෙලෙස් සංසිඳීම පිණිස නොපවත්නේය.

සම්‍යක් සම්බුදුවරයෙකු විසින් ප්‍රකාශ නොකරන ලද්දේය. තෝද ඒ ධර්මයෙහි ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි නොපිළිපදිමින් වාසය කරන්නෙහිය. සාමීචිවත (සුදුසු පිළිවෙත) සඳහා නොපිළිපදින්නෙහිය. ඒ ධර්මයට අනුව පිළිපදින්නෙක් නුවූයෙහිය. ඒ ධර්මයෙන් ඉවත්ව පවත්නෙහියයි (කියයුතු වන්නේය.)

"චුන්දය, මෙසේ එහි ශාස්තෘ තෙමේත් නින්දා කටයුත්තෙක් වන්නේය. එහි ධර්මය තෙමේත් නින්දා කටයුතු වන්නේය. එහි ශ්‍රාවක තෙමේ මෙසේ ප්‍රශංසා කටයුතු වන්නේය. චුන්දය, යමෙක් මෙබඳුවූ ශ්‍රාවකයෙකුට මෙසේ කියන්නේ වේද, 'ආයුෂ්මත් තෙමේ එව, යම්සේ තාගේ ශාස්තෘවරයා විසින් ධර්මය දෙශනා කරන ලද්දේද පණවන ලද්දේද, එසේ පිළිපදීවායි යමෙක් එය සමාදන් කරවාද (ගන්නවාද) යමෙක් සමාදන්ව ගණීද, යමෙක් සමාදන්වන ලද්දේ ඒ පිණිස පිළිපදීද, ඒ සියල්ලෝම බොහෝ අකුසල් රැස් කරන්නාහුය. ඊට හේතු කවරේද? චුන්දය, අයහපත් සේ ප්‍රකාශකරන ලද්දාවූ අයහපත් සේ දන්නා ලද්දාවූ නිවනට නොපමුණුවන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස නොපවත්නාවූ සම්‍යක් සම්බුදු රජ විසින් ප්‍රකාශ නොකළාවූ ධර්මවිනයෙහි මෙසේම වන්නේය. චුන්දය, මෙහි ශාස්තෘ තෙමේත් සම්‍යක්සම්බුදු නොවන්නේය. ධර්මය තෙමේත් අයහපත් සේ ප්‍රකාශ කරණ ලද්දේය. අයහපත් සේ දන්නා ලද්දේය. නිවනට නොපමුණුවන්නේය. කෙලෙස් සංසිඳවීම පිණිස නොපවත්නේය. සම්‍යක් සම්බුද්ධයන් විසින් ප්‍රකාශ නොකරණ ලද්දේය. ඒ ධර්මයෙහි ශ්‍රාවක තෙමේත් ධර්මානුධර්ම ප්‍රතිපත්තිය පිළිපදින්නෙක්ව වාසය කෙරේද? සාමීචි වත (සුදුසු පිළිවෙත) පිළිපදින්නේ ධර්මයට අනුව පිළිපදින්නෙක් වේද ඒ ධර්මය හොඳින් රැගෙණ පවතීද, ඔහුට මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, ඒ තට අලාභයක් විය. ඒ තාගේ මිනිසත්බව මොනවට නොලබන ලද්දේය. තාගේ ශාස්තෘ තෙමේත් සම්‍යක්සම්බුද්ධ නුවූයේය. ධර්මය තෙමේත් නොමනාව කියන ලද්දේය. හොඳින් නොදන්නා ලද්දේය. නිවනට නොපමුණු වන්නේය. කෙලෙස් සංසිඳවීම පිණිස නොපවත්නේය. සම්‍යක්සම්බුද්ධයන් විසින්

ප්‍රකාශ නොකරණ ලද්දේය. තෝද ඒ ධර්මයෙහි ධර්මානු ධර්මප්‍රතිපත්තියෙන් යුක්තව වාසය කරන්නෙහිය. සාමීචි වතින් (සුදුසු පිළිවෙතින්) පිළිපදින්නේ ධර්මයට අනුව පිළිපදින්නෙක් වූයෙහිය. ඒ ධර්මය හොඳින් රැගෙන පවත්නෙහිය'යි, කියයුතුය. චුන්දය, මෙසේ වනාහි එහි ශාස්තෘ තෙමේත් නින්දා කටයුත්තෙක් වන්නේය. එහි ධර්මය තෙමේත් නින්දා කටයුතු වන්නේය. එහි ශ්‍රාවකතෙමේත් මෙසේ නින්දා කටයුතු වන්නේය. චුන්දය, යමෙක් මෙබඳුවූ ශ්‍රාවකයෙකුට මෙසේ කියන්නේ වේද ඒකාන්තයෙන් ආයුෂ්මත් තෙමේ හරිමඟ පිළිපදින්නේය. හරිමඟ නිපදවන්නේයයි යමෙක් තෙමේ ප්‍රශංසා කෙරේද යමෙකු ප්‍රශංසා කටයුතුවේද යමෙක් තෙමේ ප්‍රශංසා කරණ ලද්දේ බොහෝසෙයින් වීර්යය පටන්ගනීද ඒ සියල්ලෝම බොහෝ අකුසල් රැස්කරන්නාහුය. ඊට හේතු කවරේද? චුන්දය, අයහපත් ලෙස ප්‍රකාශ කරණ ලද්දාවූ අයහපත් ලෙස දන්නා ලද්දාවූ නිවනට නොපමුණුවන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස නොපවත්නාවූ සම්‍යක් සම්බුදු රජුන් විසින් දෙශනා නොකළාවූ ධර්ම විනයෙහි මෙසේම වන්නේය."

5. "චුන්දය, මේ ශාසනයෙහි ශාස්තෘ තෙමේත් සම්‍යක් සම්බුද්ධ වන්නේය. ධර්මය තෙමේත් හොඳින් දේශනා කරන ලද්දේය. හොඳින් දන්නා ලද්දේය. නිවනට පමුණුවන්නේය. (මාර්ගය පිණිසද ඵලය පිණිසද පමුණුවන්නේය) කෙලෙස් සංසිඳවීම පිණිස පවත්නේය. සම්‍යක්සම්බුදු රජුන් විසින් වදාරණ ලද්දේය. ශ්‍රාවක තෙමේ ඒ ධර්මයෙහි ධාර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් තොරව වාසය කෙරේද සාමීචි වතින් (සුදුසු පිළිවෙතින්) තොරව වාසය කෙරේද ධර්මයට අනුව පිළිපදින්නෙක් නොවේද ඒ ධර්මයෙන් ඉවත්ව පවතීද හෙතෙමේ මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, ඒ තාහට අලාභයක් වන්නේය. ඒ තාගේ මිනිසත් බව යහපත් ලෙස නොලබන ලද්දේය. තාගේ ශාස්තෘ තෙමේද සම්‍යක් සම්බුද්ධ වූයේය. ධර්මය තෙමේත් හොඳින් දේශනා කරන ලද්දේය. හොඳින් දන්නා ලද්දේය. නිවනට පමුණුවන්නේය. කෙලෙස් සංසිඳවීම පිණිස පවත්නේය. සම්‍යක්සම්බුදු රජුන් විසින් වදාරණ ලද්දේය. තෝ

ඒ ධර්මයෙහි ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් තොරව වාසය කරන්නෙහිය. සාමීචි වතින් (සුදුසු පිළිවෙතින්) තොරව වාසය කරන්නෙහිය. ධර්මයට අනුව පිළිපදින්නෙක් නොවන්නෙහිය. ඒ ධර්මයෙන් ඉවත්ව වාසය කරන්නෙහිය'යි කියාය, චුන්දය, මෙසේ එහි ශාස්තෘ තෙමේද ප්‍රශංසාවට සුදුසු වන්නේය. එහි ධර්මය තෙමේත් ප්‍රශංසා කටයුතු වන්නේය. එහි ශ්‍රාවක තෙමේ මෙසේ නින්දා කටයුත්තෙක් වන්නේය."

**6.** "චුන්දය, යමෙක් මෙබඳු ශ්‍රාවකයෙකුට මෙසේ කියන්නේවේද, 'ආයුෂ්මත් තෙමේ ඒවා, යම්සේ තාහට ශාස්තෘන් වහන්සේ විසින් ධර්මය දෙශනා කරණ ලද්දේද පණවන ලද්දේද එසේ පිළිපදීවායි යමෙක් යොදවන්නේ වේද යමෙක් යෙදෙන්නේ වේද යමෙක් යොදවන ලද්දේ, ඒ පිණිස පිළිපදින්නේ වේද ඒ සියල්ලෝම බොහෝ පින් රැස්කරන්නාහුය. ඊට හේතු කවරේද? චුන්දය, හොඳින් දෙශනා කරන ලද්දාවූ හොඳින් දන්නා ලද්දාවූ නිවනට පමුණුවන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස පවත්නාවූ සම්‍යක්සම්බුදු රජුන් විසින් ප්‍රකාශකර වදාළාහු ධර්ම විනයෙහි මෙබන්දක්ම වන්නේය. චුන්දය, මේ සස්නෙහි ශාස්තෘ තෙමේත් සම්‍යක් සම්බුද්ධ වේද ධර්මය තෙමේත් හොඳින් දෙශනාකරණ ලද්දේ හොඳින් දන්නා ලද්දේ නිවනට පමුණුවන්නේ කෙලෙස් සංසිඳවීම පිණිස පවත්නේ සම්‍යක් සම්බුද්ධයන් විසින් දෙශනා කරන ලද්දේ වේද, ශ්‍රාවක තෙමේත් ඒ ධර්මයෙහි ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිළිපදින්නේ වේද සාමීචි (සුදුසු) ප්‍රතිපදාවෙන් යුක්ත වූයේ ධර්මයට අනුව පිළිපදින්නෙක්ව වාසය කෙරේද ඒ ධර්මය හොඳින් රැගෙණ පවතීද හෙතෙමේ මෙසේ කියයුතු වන්නේය, 'ඇවැත්නි, ඒ තාහට ලාභයෙක් වන්නේය. ඒ තාගේ මිනිසත්බව හොඳකාර ලබන ලද්දේය. තාගේ ශාස්තෘ තෙමේ සම්‍යක්සම්බුද්ධ වූයේය. ධර්මය තෙමේත් හොඳින් දෙශනා කරන ලද්දේ හොඳින් දන්නා ලද්දේ නිවනට පමුණුවන්නේ කෙලෙස් සංසිඳවීම පිණිස පවත්නේ සම්‍යක් සම්බුද්ධයන් විසින් වදාරණ ලද්දේය. තොපිද ඒ ධර්මයෙහි ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යුක්තව වාසය කරන්නාහුය. සාමීචි (සුදුසු) ප්‍රතිපත්තියෙන් යුක්ත වූයේ ධර්මයට

අනුව පිළිපදින්නෙක් වූවහුය. ඒ ධර්මය හොඳින් රැගෙන පවත්නහුය’යි කියායි. චුන්දය, මෙසේ එහි ශාස්තෘ තෙමේද ප්‍රශංසාවට සුදුස්සෙක් වන්නේය. එහි ධර්මයත් ප්‍රශංසාවට සුදුසු වන්නේය. එහි ශ්‍රාවක තෙමේත් ප්‍රශංසාවට සුදුසු වන්නේය. චුන්දය, යමෙක් මෙබඳුවූ ශ්‍රාවකයෙකුට මෙසේ කියන්නේ වේද, ‘ඒකාන්තයෙන් ආයුෂ්මත් තෙමේ මාර්ගය සඳහා පිළිපදින්නේය. න්‍යාය ධර්මය පිළිපදින්නෙක් වන්නේයයි’ කියා යමෙක් ප්‍රශංසා කෙරේද යමෙක් ප්‍රශංසාවට සුදුසු වේද යමෙක් ප්‍රශංසා කරන ලද්දේ බොහෝසෙයින් වීර්යය වඩාද ඒ සියල්ලෝම බොහෝසේ පින් රැස්කරන්නාහුය. ඊට හේතු කවරේද? චුන්දය, හොඳින් දෙශනා කළාවූ හොඳින් දන්නා ලද්දාවූ නිවනට පමුණුවන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස පවත්නාවූ සම්‍යක් සම්බුදු රදුන් විසින් දේශනා කළාවූ ධර්ම විනයෙහි මෙසේ වන්නේය.’

7. “චුන්දය, මේ කාලයෙහි අර්හත්සම්‍යක්සම්බුද්ධවූ ශාස්තෲන් වහන්සේත් ලොකයෙහි පහළවූහ. හොඳින් දෙශනා කළාවූ හොඳින් දන්නා ලද්දාවූ නිවනට පමුණුවන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස පවත්නාවූ සම්‍යක්සම්බුදු රදුන් විසින් දේශනා කරන ලද්දාවූ ධර්මයද පහළ වූයේය. උන්වහන්සේගේ ශ්‍රාවකයෝ ධර්මයෙහි අර්ථය අවබොධ නොකරණ ලද්දාහු වෙද්ද ඒ ශ්‍රාවකයින්ට සම්පූර්ණවූ බ්‍රහ්මචය්‍ර්‍යාව ප්‍රකාශ නොකරණ ලද්දේ වේද ප්‍රකට නොකරණ ලද්දේ වේද සියල්ල ඇතුලත්වූ පදයන්ගෙන් යුක්ත නොකරණ ලද්දේද දෙව් මිනිසුන් දක්වා යහපත්කොට හොඳින් දේශනා නොකරන ලද්දේ වේද එසේ ඇති කල්හි අපගේ ශාස්තෲන් වහන්සේගේ අතුරුදහන්වීම (පිරිනිවීම) වේද චුන්දය, මෙබඳුවූ ශාස්තෘ තෙමේ පිරිනිවන් පාන ලද්දේ ශ්‍රාවකයින්ට තැවීම් ඇති කරන්නේ වේ. ඊට හේතු කවරේද? අර්හත් සම්‍යක් සම්බුද්ධවූ අපගේ ශාස්තෲන් වහන්සේත් ලෝකයෙහි පහළවූ සේක. හොඳින් දේශනා කළාවූ, හොඳින් දන්නා ලද්දාවූ නිවනට පමුණුවන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස පවත්නාවූ සම්‍යක් සම්බුදු රජුන් විසින් දේශනා කළාවූ ධර්මය පහළ වූයේය. ඒ ධර්මයෙහි අර්ථය අවබොධ නොකරන ලද්දෝ වූම්හ. අපහට ඒකාන්තයෙන් සම්පූර්ණවූ

බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ නොකරන ලද්දේ වේ. ප්‍රකට කරන ලද්දේ නොවේ. සියල්ල ඇතුළත් කළ පදයන්ගෙන් යුක්තකරන ලද්දේ නොවේ. දෙව් මිනිසුන් දක්වා නිවන් පැමිණවීම් සහිතව යහපත් සේ ප්‍රකාශ කරණ ලද්දේ නොවේ. එසේ ඇති කල්හි අපගේ ශාස්තෘන් වහන්සේගේ නැතිවී යෑම වූයේය' (කියායි.) චුන්දය, මෙබඳුවූ ශාස්තෘන් වහන්සේ මැරෙණ ලද්දේ ශ්‍රාවකයින්ට තැවීම් ඇති කරන්නේ වේ."

8. "චුන්දය, මේ කාලයෙහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ශාස්තෘන් වහන්සේත් ලොකයෙහි පහළවූයේ වේද? හොඳින් දේශනාකළාවූ හොඳින් දන්නාලද්දාවූ නිවනට පමුණුවන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස පවත්නාවූ සම්‍යක් සම්බුදු රජුන් විසින් දේශනා කළාවූ ධර්මය පහළ වූයේ වේද? උන්වහන්සේගේ ශ්‍රාවකයෝත් ධර්මයෙහි අර්ථය අවබොධ කරන ලද්දෝ වෙද්ද ඒකාන්තයෙන් ඒ ශ්‍රාවකයින්ට සම්පූර්ණ වශයෙන් බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරන ලද්දේ වේද ප්‍රකට කරන ලද්දේ වේද සියල්ල සංග්‍රහ කරන ලද්දේ වේද දෙව් මිනිසුන්ගේ පටන් නිවන් පැමිණවීම් වශයෙන් හොඳින් ප්‍රකාශ කොට වදාරණ ලද්දේ වේද, එසේ ඇතිකල්හි ශාස්තෘවරයාගේ නැතිවීයාම වේද? චුන්දය, මෙබඳුවූ ශාස්තෘ තෙමේ මැරෙණ ලද්දේ ශ්‍රාවකයින්ට තැවීම නොකරන්නේ වේ. ඊට හේතු කවරේද? අපගේ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ශාස්තෘන් වහන්සේද ලොකයෙහි පහළවූසේක. හොඳින් දේශනා කරන ලද්දාවූ හොඳින් දන්නාලද්දාවූ නිවනට පමුණුවන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස පවත්නාවූ සම්‍යක් සම්බුදුරදුන් විසින් දේශනා කරන ලද්දාවූ ධර්මය පහළවූයේ වේද ඒ ධර්මයෙහි අර්ථය අවබොධ කරන ලද්දෝ වෙමුද, ඒකාන්තයෙන් අපට සම්පූර්ණ වශයෙන් බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරන ලද්දේ වේද ප්‍රකට කරන ලද්දේ වේද සියල්ල ඇතුලු කළ පදවශයෙන් කරන ලද්දේ වේද? දෙව්මිනිසුන්ගේ පටන් නිවනට පැමිණවීමෙන් හොඳින් ප්‍රකාශ කොට දේශනාකරන ලද්දේ වේද එසේ ඇති කල්හි අප ශාස්තෘන් වහන්සේගේ නැතිවීයාම වන්නේය'යි කියායි. චුන්දය,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මෙබඳුවූ ශාස්තෘ තෙමේ මැරෙණ ලද්දේ ශ්‍රාවකයින්ට තැවීම් නොකරන්නේ වේ.

9. "චුන්දය, මේ අඞ්ග දෙකින් යුක්තවූ ධර්මයක් වේද ශාස්තෘ තෙමේත් වැඩිමහලු නුවූයේද බොහෝ කල් දන්නෙක් නොවේද පැවිද්දෙන් කලක් ගතනුවූයේ වේද බොහෝ කලක් ඉක්මගියේ නොවේද අන්තිම වයසට නොපැමිණියේ වේද මෙසේ ඇති කල්හි ඒ අඞ්ගයෙන් ඒ ධර්මය සම්පූර්ණ වූයේ නොවේ. චුන්දය, මේ අඞ්ගයෙන් යුක්තවූ බ්‍රහ්මචර්‍ය්‍යාව සම්පූර්ණ නොවන්නේය. ශාස්තෘ තෙමේත් වැඩි වයස්ගතවූයේ බොහෝ කල් දැන පුරුදු ඇතියේ පැවිද්දෙන් කලක් ඉක්ම ගියේ බොහෝ කල් ගතවූයේ අන්තිම වයසට පැමිණියේ වේද උන්වහන්සේගේ ශ්‍රාවකවූ ස්ථවිර භික්ෂූහු සමතුන් නොවෙත්ද භික්ෂුණීහු නොවෙද්ද පණ්ඩිතයෝ නොවෙද්ද පැමිණි රහත් ඵල ඇත්තෝ නොවෙද්ද සද්ධර්මය තමා ප්‍රකාශ කරන්ට සුදුසු නොවෙද්ද උපන් පරවාද කරුණු සහිතව ගැනීමෙන් ඉවත් කොට නිවන් පැමිණවීම් සහිත ධර්මය දෙශනා කරන්ට සුදුසු නොවත්ද මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ නුවූයේ වේ.

10. "චුන්දය, යම් හේතුවකින් මේ අඞ්ගදෙකකින් යුක්තවූ බ්‍රහ්මචර්‍ය්‍යාවක් (උතුම් හැසිරීමක්) වේද ශාස්තෘතෙමේත් රාත්‍රඥ වූයේ (බොහෝ කල් දන්නේ) පැවිද්දෙන් කල් ගත වූයේ බොහෝකල් ඉක්මගියේ අන්තිම වයසට පැමිණියේ වේද ඔහුගේ ස්ථවිර ශ්‍රාවක භික්ෂූහුද සමර්ථයෝ වෙද්ද භික්ෂුණීහු වෙද්ද විශාරදයෝ (බොහෝ දත් අය) වෙද්ද, පැමිණි රහත් ඵල ඇත්තෝ වෙද්ද සද්ධර්මය ප්‍රකාශ කිරීමට සුදුසු වෙද්ද උපන් පරවාද හේතු සහිත කරුණු දැක්වීමෙන් ඉවත් කොට නිවන් පැමිණවීම් සහිත ධර්මය දෙශනා කරන්ට සමර්ථ වෙත්ද මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) මේ අඞ්ගයෙන් සම්පූර්ණ වූයේ වේ.

"චුන්දය, මේ අඞ්ග දෙකින් යුක්තවූ බ්‍රහ්මචර්‍ය්‍යාව සම්පූර්ණ වූයේ වෙයි. ශාස්තෘතෙමේත් ස්ථවිරවූයේ රාත්‍රඥවූයේ (බොහෝ

කල් දන්නේ) පැවිද්දෙන් කල්ගත වූයේ බොහෝ කල් ඉක්ම ගොස් අන්තිම වයසට පැමිණියේ වේද ඒ ශාස්තෘවරයාගේ ස්ථවිර ශ්‍රාවක භික්ෂුහුද සමත්තු වෙද්ද භික්මුණාහු වෙද්ද, විශාරදයෝ (බොහෝ දේ දත් අය) වෙද්ද පැමිණි රහත් ඵල ඇත්තෝ වෙද්ද සද්ධර්මය ප්‍රකාශ කිරීමට සුදුසු වෙත්ද උපන් පරවාද හේතු සහිත කරුණු දැක්වීමෙන් ඉවත් කොට නිවන් පැමිණවීම් සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වෙද්ද, මෙසේ ඒ උතුම් හැසිරීම් මේ අංගයෙන් සම්පූර්ණ වූයේ වේ.

ඒ ශාස්තෘවරයාගේ මධ්‍යම ශ්‍රාවක භික්ෂූහු සමත්තු නොවෙද්ද, භික්මුනාහු නොවෙද්ද, බොහෝ දේ දත් අය නොවෙද්ද, පැමිණි රහත් ඵල ඇත්තෝ නොවෙද්ද, උපන් පරවාද ධර්මයට අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට අසමර්ථ වෙද්ද? මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ නොවේ.

ඒ ශාස්තෘවරයාගේ මධ්‍යම ශ්‍රාවක භික්ෂූහු සමත්තු වෙද්ද, භික්මුනාහු වෙද්ද, බොහෝදේ දත් අය වෙද්ද පැමිණි රහත්ඵල ඇත්තෝ වෙද්ද, උපන් පරවාද ධර්මයට අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිත ධර්මදෙශනා කිරීමට සමර්ථ වෙද්ද, මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ වේ.

ඒ ශාස්තෘවරයාගේ නවක (අලුත්) ශ්‍රාවකභික්ෂූහු සමතුන් නොවෙද්ද, භික්මුනාහු නොවෙද්ද, බොහෝදේ දත් අය නොවෙද්ද, පැමිණි රහත් ඵල ඇත්තෝ නොවෙද්ද උපන් පරවාද ධර්මයට අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්මදෙශනා කිරීමට අසමර්ථ වෙද්ද, මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ නොවේ.

ඒ ශාස්තෘවරයාගේ නවක (අලුත්) ශ්‍රාවක භික්ෂූහු සමතුන් වෙද්ද, භික්මුනාහු වෙද්ද, බොහෝ දේ දත් අය වෙද්ද පැමිණි රහත් ඵල ඇත්තෝ වෙද්ද, උපන් පරවාද ධර්මයට අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිත ධර්මදෙශනා කිරීමට සමර්ථ වෙද්ද,

මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ වේ.

ඒ ශාස්තෘවරයාගේ ශ්‍රාවිකාවූ ස්ථවිර භික්ෂුණීහු සමත් වූවෝ නොවෙද්ද, හික්මුනාහු නොවෙද්ද, බොහෝ දේ දත් අය නොවෙද්ද, පැමිණි රහත් ඵල ඇත්තෝ නොවෙද්ද, උපන් පරවාද ධර්මයට අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට අසමර්ථ වෙද්ද, මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ නොවේ.

ඒ ශාස්තෘවරයාගේ ශ්‍රාවිකාවූ ස්ථවිර භික්ෂුණීහු සමත් වූවෝ වෙත්ද, හික්මුනාහු වෙත්ද, බොහෝ දේ දත් අය වෙත්ද, පැමිණි රහත්ඵල ඇත්තෝ වෙත්ද, උපන් පරවාද ධර්මයට අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වෙත්ද. මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ වේ.

උන්වහන්සේගේ ශ්‍රාවිකාවූ මධ්‍යම භික්ෂූණීහු සමත්වූවෝ නොවෙත්ද, හික්මුනාහු නොවෙත්ද, බොහෝ දේ දත් අය නොවෙත්ද පැමිණි රහත්ඵල ඇත්තෝ නොවෙත්ද, උපන් පරවාද ධර්මයට අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිත ධර්මදෙශනා කිරීමට අසමර්ථ වෙත්ද. මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ නොවේ.

උන්වහන්සේගේ ශ්‍රාවිකාවූ මද්ධ්‍යම භික්ෂුණීහු සමත්වූවෝ වෙද්ද, හික්මුනාහු වෙද්ද, බොහෝදේ දත් අය වෙද්ද පැමිණි රහත් ඵල ඇත්තෝ වෙද්ද, උපන් පරවාද ධර්මයට අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිත ධර්මදෙශනා කිරීමට සමර්ථ වෙද්ද, මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ වේ.

උන්වහන්සේගේ ශ්‍රාවිකාවූ අලුත් භික්ෂුණීහු සමත්වූවෝ නොවෙද්ද, හික්මුනාහු නොවෙද්ද, බොහෝ දේ දත් අය නොවෙද්ද, පැමිණි රහත් ඵල ඇත්තෝ නොවෙද්ද උපන් අන්‍ය මතයන් ධර්මයට අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම

දෙශනා කිරීමට අසමර්ථ වෙද්ද, මෙසේ ඒ බ්‍රහ්මචයර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ නොවේ.

උන්වහන්සේගේ ශ්‍රාවිකාවූ අලුත් භික්ෂුණීහු සමත් වූවෝ වෙද්ද, හික්මුනාහු වෙද්ද, බොහෝ දේ දත් අය වෙද්ද පැමිණි රහත් ඵල ඇත්තෝ වෙද්ද, උපන් අන්‍ය මතයන් ධර්මයට අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිත ධර්මදෙශනා කිරීමට සමර්ථ වෙද්ද, මෙසේ ඒ බ්‍රහ්මචයර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ වේ.

උන්වහන්සේගේ ශ්‍රාවකවූ සුදු ඇඳුම් හඳිනාලද බ්‍රහ්මචාරීවූ ගෘහස්ථ උපාසකයෝ සමතුන් නොවෙද්ද බොහෝ දේ දත් අය නොවෙද්ද, පැමිණි මාර්ග ඵල ඇත්තෝ නොවෙද්ද උපන් අන්‍ය මතයන් ධර්මයට අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට අසමර්ථ වෙද්ද මෙසේ ඒ බ්‍රහ්මචයර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ නොවේ.

උන්වහන්සේගේ ශ්‍රාවකවූ සුදු ඇඳුම් හඳිනාලද බ්‍රහ්මචාරීවූ ගෘහස්ථ උපාසකයෝ සමතුන් වෙද්ද, හික්මුනාහු වෙද්ද, බොහෝ දේ දත් අය වෙද්ද පැමිණි මාර්ග ඵල ඇත්තෝ වෙද්ද, උපන් අන්‍ය මතයන් ධර්මයට අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිත ධර්මදෙශනා කිරීමට සමර්ථ වෙද්ද. මෙසේ ඒ බ්‍රහ්මචයර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ වේ.

උන්වහන්සේ ශ්‍රාවකවූ සුදු ඇඳුම් හඳිනාලද කාමභොගීවූ ගෘහස්ථ උපාසකයෝ සමර්ථ නොවෙද්ද, හික්මුනාහු නොවෙද්ද, බොහෝ දේ දත් අය නොවෙද්ද, පැමිණි මාර්ග ඵල ඇත්තෝ නොවෙද්ද උපන් අන්‍ය මතයන් ධර්මයට අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට අසමර්ථ වෙද්ද, මෙසේ ඒ බ්‍රහ්මචයර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ නොවේ.

උන්වහන්සේගේ ශ්‍රාවකවූ සුදු ඇඳුම් හඳිනාලද කාමභෝගීවූ ගෘහස්ථ උපාසකයෝ සමර්ථ වෙද්ද, හික්මුනාහු වෙද්ද, බොහෝ

දේ දත් අය වෙද්ද පැමිණි මාර්ග ඵල ඇත්තෝ වෙද්ද, උපන් අන්‍ය මතයන් ධර්මයට අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිත ධර්මදෙශනාකිරීමට සමර්ථවෙද්ද. මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ වේ.

උන්වහන්සේගේ ශ්‍රාවිකාවූ සුදු ඇඳුම් හඳිනා ලද ගෘහස්ථ බ්‍රහ්මාචාරී උපසිකාවෝ සමර්ථ නොවෙද්ද, හික්මුනාහු නොවෙද්ද, බොහෝදේ දත් අය නොවෙද්ද, පැමිණි මාර්ගඵල ඇත්තෝ නොවෙද්ද උපන් අන්‍ය මතයන් ධර්මයට අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට අසමර්ථ වෙද්ද, මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ නොවේ.

උන්වහන්සේගේ ශ්‍රාවිකාවූ සුදු ඇඳුම් හඳිනාලද ගෘහස්ථ බ්‍රහ්මචාරී උපාසිකාවෝ සමර්ථ වෙත්ද, හික්මුණාහු වෙත්ද බොහෝ දේ දත් අය වෙත්ද පැමිණි මාර්ගඵල ඇත්තෝ වෙත්ද, අන්‍ය මතයන් ධර්මයට අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වෙද්ද, මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ වේ.

උන්වහන්සේගේ ශ්‍රාවිකාවූ සුදු ඇඳුම් හඳිනා ලද කාම භෝගී ගෘහස්ථ උපාසිකාවෝ සමර්ථ නොවෙද්ද, හික්මුනාහු නොවෙද්ද, බොහෝ දේ දත් අය නොවෙද්ද, පැමිණි මාර්ග ඵල ඇත්තෝ නොවෙද්ද උපන් අන්‍ය මතයන් ධර්මයට අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට අසමර්ථ වෙද්ද මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව (උතුම් හැසිරීම) ඒ අංගයෙන් සම්පූර්ණ වූයේ නොවේ.

උන්වහන්සේගේ ශ්‍රාවිකාවූ සුදු ඇඳුම් හඳිනා ලද කාමභෝගී ගෘහස්ථ උපාසිකාවෝ සමර්ථ වෙද්ද, හික්මුනාහු වෙද්ද, බොහෝ දේ දත් අය වෙද්ද පැමිණි මාර්ගඵල ඇත්තෝ වෙද්ද, උපන් අන්‍ය මතයන් ධර්මයට අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වෙද්ද මෙසේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව ඒ අඞ්ගයෙන් සම්පූර්ණ වූයේ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

එයින්ද, උන්වහන්සේගේ බ්‍රහ්මචරියාව සමෘද්ධවූයේත් නොවන්නේය, මහත් වූයේත් නොවන්නේය, පැතුරුනේත් නොවන්නේය, බොහෝදෙනා විසින් දන්නා ලද්දේද නොවන්නේය. පැතිරීමක්ද නොවන්නේය. යම්තාක් දෙව් මිනිසුන් විසින් හොඳින් ප්‍රකාශ කරණ ලද්දක්ද නොවන්නේය. ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව ඒ අඞ්ගයෙන් සම්පූර්ණ වූයේ නොවේ.

උන්වහන්සේගේ බ්‍රහ්මචරියාව වනාහි මෙසේ සමෘද්ධ වූයේත් නොවන්නේය, මහත් වූයේත් නොවන්නේය, පැතුරුනේත් නොවන්නේය, බොහෝදෙනා විසින් දන්නා ලදුව පැතිරීමත් නොවන්නේය, යම්තාක් දෙව් මිනිසුන් දක්වා හොඳින් ප්‍රකාශ කරණ ලද්දක් නොවන්නේය, ලාභයෙන් හා යසසින් අග පැමිණියක් නොවන්නේද මෙසේ ඒ බ්‍රහ්මචරියාව ඒ අඞ්ගයෙන් සම්පූර්ණ වූයේ නොවේ.

11. චුන්දය, මේ අංගදෙකෙන් යුක්තවූම යම් බ්‍රහ්මචර්‍ය්‍යාවක් (උතුම්හැසිරීමක්) වේද ශාස්තෘ තෙමේද ස්ථිරවූ ගුණ ඇත්තේද බොහෝ දේ දැන පුරුද්ද ඇත්තේ වේද, පැවිදිවී කලක් ගතවූයේ වේද, ජීවිතයෙහි අන්තිම වයසට පැමිණියේ වේද, උන්වහන්සේගේ ශ්‍රාවකවූ ස්ථවිර භික්ෂුහුද, සමර්ථ වෙද්ද, හික්මුනාහු වෙත්ද, බොහෝ දේ දත් අය වෙත්ද, පැමිණි රහත්ඵල ඇත්තෝ වෙත්ද උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වෙත්ද,

උන්වහන්සේගේ ශ්‍රාවකවූ මධ්‍යම භික්ෂුහුද සමර්ථ වෙත්ද, හික්මුනාහු වෙත්ද, බොහෝ දේ දත් අය වෙත්ද, පැමිණි රහත්ඵල ඇත්තෝ වෙත්ද, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිත ධර්මදෙශනා කිරීමට සර්මථ වෙද්ද, උන්වහන්සේගේ ශ්‍රාවකවූ අලුත් භික්ෂුහු සමර්ථ වෙත්ද, හික්මුනාහු වෙත්ද, බොහෝ දේ දත් අය වෙත්ද, පැමිණි මාර්ගඵල ඇත්තෝ වෙත්ද, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වෙත්ද,

උන්වහන්සේගේ ශ්‍රාවිකාවූ ස්ථවිරභික්ෂුණීහු සමර්ථවෙත්ද, හික්මුනාහු වෙත්ද, බොහෝ දේ දත් අය වෙත්ද, පැමිණි රහත්ඵල

ඇත්තෝ වෙත්ද, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වෙත්ද, උන්වහන්සේගේ ශ්‍රාවිකාවූ මධ්‍යම භික්ෂුණීහු සමර්ථවෙත්ද, හික්මුණාහු වෙත්ද, පැමිණි මාර්ගඵල ඇත්තෝ වෙත්ද, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිතව ධර්ම දෙශනා කිරීමට සමර්ථ වෙත්ද, උන්වහන්සේගේ ශ්‍රාවිකාවූ අලුත් භික්ෂුණීහු සමර්ථ වෙත්ද, හික්මුනාහු වෙත්ද, බොහෝ දේ දත් අය වෙත්ද, පැමිණි මාර්ගඵල ඇත්තෝ වෙත්ද, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත් කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වෙත්ද,

උන්වහන්සේගේ ශ්‍රාවකවූ සුදු ඇඳුම් හඳිනලද බ්‍රහ්මචාරී ගෘහස්ථ උපාසකයෝ සමර්ථ වෙත්ද, හික්මුණාහු වෙත්ද, බොහෝදේ දත් අය වෙත්ද, පැමිණි රහත්ඵල ඇත්තෝ වෙත්ද, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම්සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වෙත්ද,

උන්වහන්සේගේ ශ්‍රාවකවූ සුදු ඇඳුම් හඳිනාලද කාමභොගී ගිහි උපාසකයෝ සමර්ථ වෙත්ද, හික්මුණාහු වෙත්ද, බොහෝදේ දත් අය වෙද්ද පැමිණි මාර්ගඵල ඇත්තෝ වෙත්ද, උපන් අන්‍යමතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වෙත්ද,

උන්වහන්සේගේ ශ්‍රාවිකාවූ සුදු ඇඳුම් හඳිනාලද බ්‍රහ්මචාරී ගිහි උපාසිකාවෝ සමර්ථ වෙද්ද, හික්මුණාහු වෙද්ද, බොහෝ දේ දත් අය වෙත්ද, පැමිණි මාර්ගඵල ඇත්තෝ වෙත්ද, උපන් අන්‍යමතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වෙත්ද,

උන්වහන්සේගේ ශ්‍රාවිකාවූ සුදු ඇඳුම් හඳිනාලද කාම භොගී ගිහි උපාසිකාවෝ සමර්ථ වෙත්ද, හික්මුනාහු වෙත්ද, බොහෝ දේ දත් අය වෙත්ද, පැමිණි මාර්ගඵල ඇත්තෝ වෙත්ද, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වෙත්ද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

උන්වහන්සේගේ බ්‍රහ්මචර්‍ය්‍යාව සමෘද්ධවූවක්ද වන්නේය. මහත්වූවක්ද වන්නේය. පැතිරීමක්ද වන්නේය. බොහෝදෙනා විසින් දන්නාලද මහත්වූවක්ද වන්නේය. යම්තාක් දෙව්මිනිසුන් හා හොඳින් ප්‍රකාශකරණ ලද්දක්ද වන්නේය. ලාභයෙන් හා යසසින් අග තැන් පැමිණියේ මෙසේ ඒ බ්‍රහ්මචරියාව ඒ අඞ්ගයෙන් සම්පූර්ණ වූයේ වේ.

12. චුන්දය, මේ කාලයෙහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ශාස්තෘවූ මම ලොකයෙහි උපන්නෙමි. මනාකොට අවබොධ කරන ලද්දාවූ නිවනට පමුණුවන්නාවූ, කෙලෙස් සංසිඳවීම පිණිස පවත්නාවූ සම්‍යක් සම්බුදු රදුන් විසින් දැනගන්නා ලද්දාවූ ධර්මය යහපත්කොට ප්‍රකාශ කරණ ලද්දේය. ධර්මයෙහි අර්ථය අවබොධ කරණ ලද මාගේ ශ්‍රාවකයෝ වෙත්ද එකාන්තයෙන් ඔවුන්ට බ්‍රහ්මචර්‍ය්‍යාව සම්පූර්ණ වශයෙන් ප්‍රකාශකරණ ලද්දේ මතුකරණ ලද්දේ සර්ව සංග්‍රහ පද වශයෙන් කරණ ලද්දේ වේද, දෙව් ලොවින්ද මිනිස් ලොව දක්වා නිවනට පැමිණවීම් වශයෙන් හොඳින් ප්‍රකාශ කරණ ලද්දේය.

චුන්දය, මම දැන් ශාස්තෘ වූයේ ස්ථිර ගුණයෙන් යුක්ත වූයේ බොහෝ කල් දන්නේ, පැවිදිවී බොහෝ කල් ගතවූයේ අන්තිම වයසට පැමිණියේ වෙමි. චුන්දය, මාගේ වනාහි දැන් ශ්‍රාවකවූ ස්ථවිර භික්ෂූහු සමත්වූවාහු, හික්මුණාවූ පණ්ඩිත වූවාහු පැමිණි රහත්ඵල ඇත්තාහු, ධර්මය යහපත්කොට ප්‍රකාශ කිරීමට සමර්ථ වූවාහු, උපන්නාවූ අන්‍ය මත කරුණු සහිතව ඉවත්කොට නිවන් පැමිණවීමෙන් ධර්මය දෙශනා කිරීමට සමර්ථ වූවාහුය. චුන්දය, දැන් මාගේ ශ්‍රාවකවූ මද්ධ්‍යම භික්ෂූහුද, සමත් වූවාහු, බොහෝ දේ දත් අය වූවාහු පැමිණි රහත්ඵල ඇත්තාහු, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වූවාහුය. චුන්දය, දැන් වනාහි මාගේ ශ්‍රාවකවූ අලුත් භික්ෂූහුද සමත් වූවාහු, හික්මුනාහු, බොහෝ දේ දත් අය වූවාහු, පැමිණි රහත්ඵල ඇත්තාහු, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්ම දෙශනා කිරීමට සමර්ථ වූවාහුය. චුන්දය, දැන් මාගේ ශ්‍රාවිකාවූ

ස්ථවිර භික්ෂුණීහුද සමත් වූවාහු, හික්මුනාහු, බොහෝ දේ දත් අය වූවාහු, පැමිණි රහත්ඵල ඇත්තාහු, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්මය දෙශනා කිරීමට සමර්ථ වූවාහුය. චුන්දය, දැන් මාගේ ශ්‍රාවිකාවූ මධ්‍යම භික්ෂුණීහුද සමත් වූවාහු, බොහෝ දේ දත් අය වූවාහු, පැමිණි රහත්ඵල ඇත්තාහු උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්මය දෙශනා කිරීමට සමර්ථ වූවාහුය. චුන්දය, දැන් මාගේ ශ්‍රාවිකාවූ අලුත් භික්ෂුණීහුද, සමත් වූවාහු, හික්මුනාහු, බොහෝ දේ දත් අය වූවාහු, පැමිණි රහත්ඵල ඇත්තාහු, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්මය දෙශනා කිරීමට සමර්ථ වූවාහුය. චුන්දය, දැන් මාගේ ශ්‍රාවකවූ සුදු ඇඳුම් හඳිනාලද බ්‍රහ්මචාරී ගිහි උපාසකයෝද, සමත් වූවාහු, හික්මුනාහු, බොහෝ දේ දත් අය වූවාහු, පැමිණි මාර්ග ඵල ඇත්තාහු, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්මය දෙශනා කිරීමට සමර්ථ වූවාහුය. චුන්දය, දැන් මාගේ ශ්‍රාවකවූ සුදු ඇඳුම් හඳිනාලද කාමභොගී උපාසකයෝද සමත් වූවාහු, හික්මුනාහු බොහෝ දේ දත් අය වූවාහු, පැමිණි මාර්ගඵල ඇත්තාහු, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්මය දෙශනා කිරීමට සමර්ථ වූවාහුය. චුන්දය, දැන් මාගේ ශ්‍රාවිකාවූ සුදු ඇඳුම් හඳිනාලද බ්‍රහ්මචාරීවූ ගිහි උපාසිකාවෝද, සමත් වූවාහු, හික්මුනාහු, බොහෝ දේ දත් අය වූවාහු, පැමිණි මාර්ග ඵල ඇත්තාවූ, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්මය දෙශනාකිරීමට සමර්ථ වූවාහුය. චුන්දය, දැන් මාගේ ශ්‍රාවිකාවූ සුදු ඇඳුම් හඳිනා ලද කාමභොගී ගිහි උපාසිකාවෝද, සමත් වූවාහු, හික්මුනාහු බොහෝ දේ දත් අය වූවාහු, පැමිණි මාර්ග ඵල ඇත්තාහු, උපන් අන්‍ය මතයන් ධර්මය අනුව ඉවත්කොට නිවන් දැක්වීම් සහිත ධර්මය දෙශනා කිරීමට සමර්ථ වූවාහුය. චුන්දය, දැන් මාගේ බ්‍රහ්මචර්‍ය්‍යාව සමෘද්ධවූයේද සම්පූර්ණ වූයේද පැතුරුනේද බොහෝදෙනා විසින් දන්නා ලද්දේද, දෙව් මිනිසුන් දක්වා හොඳින් ප්‍රකාශ කරණ ලද්දේද වේ.

13. චුන්දය, මෙකල යම් පමණ ශාස්තෘහු ලෝකයෙහි උපන්නාහුද? චුන්දය, මම යම්සේද එසේ ලාභයෙන් හා යසසින් අග පැමිණි අන් එකම ශාස්තෘවරයෙකු මම නොදක්නෙමි.

චුන්දය, මෙකල යම් පමණ සංඝකෙනෙක් හෝ සමූහකෙනෙක් හෝ ලෝකයෙහි උපන්නාහුද චුන්දය, මේ භික්ෂු සංඝ තෙමේ යම්සේද එසේ ලාභයෙන් හා යසසින් අගපැමිණි අනික් එක සඟකොටසකුත් නොදක්නෙමි.

චුන්දය, යම් ඒ බ්‍රහ්මචර්‍ය්‍යාවකට වනාහි සෑම ලෙසින් සම්පූර්ණවූ හැම ආකාරයෙන් පිරුණාවූ අඩු නුවූද වැඩි නුවූද හොඳින් දේශනා කරන ලද්දාවූද හාත්පස සම්පූර්ණවූ ශ්‍රෙෂ්ඨ චරියා නම්වූ බ්‍රහ්මචර්‍ය්‍යාවෙක් ප්‍රකාශකරන ලද්දේයයි හොඳින් කියනු ලබන්නේ නම් සෑම ලෙසින් සම්පූර්ණවූ හැම ආකාරයෙන් පිරුණාවූ අඩු නුවූද වැඩි නුවූද හොඳින් දේශනා කරන ලද්දාවූද හාත්පස සම්පූර්ණවූ ශ්‍රෙෂ්ඨචරියා නම්වූ බ්‍රහ්මචර්‍ය්‍යාවයයි මීටම කියයුත්තේය.

14. චුන්දය, උද්දකරාම පුත්‍ර තෙමේද, 'කිසිවක් දක්නේ නොදක්නේය' යන මෙබඳු වචනයක් කීවේය. කුමක් දක්නේද නොදක්නේදැයි ඇසූ කල මනාව මුවහත් තබනලද ආයුධයේ තලය දක්නේය. (මුවහත්) ධාරාව නොපෙනේයයි (කිය). චුන්දය, 'කිසිවක් දක්නේ නොදක්නේය' යන මෙය උද්දකරාම පුත්‍රය විසින් යම් මේ ආයුධයක් සඳහාම කියන ලද්දේ වේද මෙය හීනවූ ග්‍රාම්‍යවූ පෘථග්ජනිකවූ උතුම් නුවූ අනර්ථ සහිත වූවක් වන්නේය. චුන්දය, යම් බඳුවූ මේකිසිත් දක්නේ නොදක්නේයයි හොඳින් කියනු ලබන්නේ මෙසේ සෑම ලෙසින් සම්පූර්ණවූ හැම ආකාරයෙන් සම්පූර්ණකොට ඇති අඩුවක් නැත්තාවූද වැඩියක් නැත්තාවූද හොඳින් දෙශනා කළාවූ හාත්පස සම්පූර්ණවූ බ්‍රහ්මචර්‍ය්‍යාව හොඳින් ප්‍රකාශ කරන ලද්දේය. මෙසේ මෙය නොදක්නේයයි මෙහි ඉවතට ඇදීම කරන්නේය. මෙසේ එය ඉතා පිරිසිදු වන්නේයයි මෙසේ මෙය නොදක්නේයයි මෙහි ළඟට ඇදීම කරන්නේය. මෙසේ එය ඉතා පිරිසිදු වන්නේයයි මෙසේම මෙය නොදක්නේය. මෙය කිසිත් දක්නේ

නොදක්නේයයි කියනු ලැබේ. චුන්දය, යමකට වනාහි හොඳින් කියනු ලබන්නේ සෑම ලෙසින් හැම ආකාරයෙන් සම්පූර්ණකොට ඇති අඩුවක් නැත්තාවූද වැඩියක් නැත්තාවූද හොඳින් දෙශනා කළාවූ හාත්පස සම්පූර්ණවූ බ්‍රහ්මචය්‍ර්‍යාව හොඳින් ප්‍රකාශ කරන ලද්දේයයි කියන්නේ නම් හැම ලෙසින් සම්පූර්ණවූ හැම ආකාරයෙන් සම්පූර්ණ කොට ඇති අඩුනුවූ වැඩිනුවූ හොඳින් වදාළාවූ හාත්පස සම්පූර්ණවූ බ්‍රහ්මචය්‍ර්‍යාව හොඳින් ප්‍රකාශ කරන ලද්දේයයි කියන්නේය. එහෙයින් චුන්දය, මා තොපට යම් ධර්ම කොටසක් ඉතා උසස් ප්‍රඥාවෙන් දැන දෙශනා කරන ලද්දේද ඒ ධර්මයෙහි සියල්ලන් විසින්ම එක්රැස්ව අර්ථයෙන් අර්ථය වචනයෙන් වචනය හොඳින් කිය යුත්තේය. විවාද නොකළ යුත්තේය. යම්සේ මේ බ්‍රහ්මචය්‍ර්‍ය සංඛ්‍යාත ශාසනය බොහෝ කල් පවත්නේ වේද එසේ සජ්ජායනා කළයුතු වන්නේය. එය බොහෝ දෙනාට හිත පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය. චුන්දය, මා විසින් තොපට කවර නම් ධර්මයක් ඉතා උසස් ප්‍රඥාවෙන් දැන දෙශනා කරන ලද්දේද ඒ ධර්මයෙහි සියල්ලන් විසින්ම එකතුව රැස්ව අර්ථයෙන් අර්ථය වචනයෙන් වචනය හොඳින් කියයුත්තේය. විවාද නොකළ යුත්තේය. යම්සේ මේ බ්‍රහ්මචය්‍ර්‍ය සංඛ්‍යාත ශාසනය බොහෝ කල් පවත්නේ වේද බොහෝදෙනාට හිත පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේද එසේ සජ්ජායනා කළ යුත්තේය. හේ කවරේද? සතර සතිපට්ඨානයෝය (සිහිය වැඩිය යුතු භාවනා සතර,) සතර සම්‍යක් ප්‍රධානයෝය (මහා වීය්‍ර්‍ය සතර,) සතර ඍද්ධිපාදයෝය (සත්‍යය අවබොධය පිණිස පවත්නා හේතු හතර,) පඤ්චෙන්ද්‍රියෝය (ඉන්ද්‍රිය ධර්ම පස,) පඤ්ච බලයෝය (බල ධර්ම පස,) සප්ත බොද්ධ්‍යාංගයෝය (සත්‍යය අවබොධකිරීමේ අංග හත) ආය්‍ර්‍ය අෂ්ටාංගිකමාර්ගය යන මොහුය. චුන්දය, ඒ මේ ධර්මයෝ මා විසින් ඉතා උසස් ප්‍රඥාවෙන් දැක දෙශනා කරන ලද්දාහුය. යම් ධර්මයෙක්හි

සියල්ලන් විසින්ම අවුත් එක්රැස්ව අර්ථයෙන් අර්ථය වචනයෙන් වචනය කියයුත්තේය. විවාද නොකට යුත්තේය. යම්සේ මේ බ්‍රහ්මචර්‍ය්‍යාවයයි කියන ලද ශාසනය බොහෝ කල් පවත්නේද දිගු කල් පවතින්නේ වේද එසේ සජ්ඣායනා කළ යුතුය. එය බොහෝදෙනාට හිත පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය.

15. චුන්දය, සමගිවූද සතුටු වන්නාවූද විවාද නොකරන්නාවූද තොප විසින් හික්මිය යුත්තාහුය. සමඟ මහණදම් පුරණ එක් භික්ෂුවක් සංඝයා කෙරෙහි ධර්මය කියන්නේ වේද ඉදින් එහිලා තොපට මෙබඳු සිතක් වන්නේය. 'මේ ආයුෂ්මත් තෙමේ අර්ථයද වරදවා ගන්නේය. වචනද වරදවා කියන්නේයයි සිතන්නේය. ඔහුට නොම සතුටු විය යුත්තේය. ප්‍රතික්ෂෙපද නොකට යුත්තේය. නොසතුටුව ප්‍රතික්ෂෙපද නොකොට මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, මේ අර්ථයාගේ මේ වචන හෝ ඒ වචන හෝ වන්නාහුද කවර නම් වචන වඩා සුදුසුද? ඒ වචනයන්ගේ මේ අර්ථය වන්නේද? ඒ අර්ථය වන්නේද? කවර අර්ථයෙක් ඉතා සුදුසුදැයි ඇසිය යුත්තේය.' ඉදින් හෙතෙම මෙසේ කියන්නේ වේද, 'ඇවැත්නි, මේ අර්ථයට මේ වචනම ඉතා සුදුසුවන්නාහුය. යම් වචනයක් මා විසින් කියන ලද්දේද මේ වචනයන්ගේ මේ අර්ථය තෙමේම අතිශයින් සුදුසු වන්නේය මා විසින් කියන ලද්දේ ඒ අර්ථයමැයි කියයිද ඒ භික්ෂුතෙමේ ඇතුළත්ද නොකළ යුත්තේය. ඉවත්ද නොකළ යුත්තේය. ඇතුළත්ද නොකොට ඉවත්ද නොකොට ඒ අර්ථයේද ඒ වචනයන්ගේද දැරීම පිණිස හොඳින් ඇඟවිය යුත්තේය.' චුන්දය, ඉදින් අනික් භික්ෂුවක් සංඝයා විෂයෙහි ධර්මය කියන්නේ වේද, ඉදින් එහිලා තොපට මෙබඳු සිතෙක් වන්නේය 'මේ ආයුෂ්මත් තෙමේ අර්ථයම වරදවා ගන්නේය. වචන නිවැරදිව කියන්නේය' කියායි. ඔහුට නොමසතුටුවිය යුත්තේය. ප්‍රතික්ෂෙපද නොකට යුත්තේය. නොසතුටුව ප්‍රතික්ෂෙපද නොකොට හෙතෙමේ මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි,

මේ වචනයන්ගේ මේ අර්ථය වන්නේද, ඒ අර්ථය වන්නේද? කිනම් අර්ථයෙක් ඉතා සුදුසු වන්නේදැයි ඇසිය යුතුය. ඉදින් හෙතෙමේ මෙසේ කියන්නේ වේද, 'ඇවැත්නි, මේ වචනයන්ගේ මේ අර්ථය ඉතා සුදුසු වන්නේය. යමක් මා විසින් කියන ලද්දේද ඒ මෙය වන්නේයයි කියයිද හෙතෙමේ ඇතුළත්ද නොකළ යුත්තේය. ඉවත්ද නොකට යුත්තේය. ඇතුළත්ද නොකොට ඉවත්ද නොකොට එම අර්ථය දැරීම පිණිස ඔහුටම ඇඟවිය යුත්තේමය.

**16.** චුන්දය, අනික් භික්ෂුවක්ද සංඝයාට ධර්මය කියන්නේ වේද ඉදින් එහි ලා තොපට මෙබඳු සිතක් වන්නේය. 'මේ ආයුෂ්මත් තෙමේ අර්ථයම හොඳින් ගන්නේය. වචන වරදවා පිහිටුවීම කරන්නේය'යි සිතන්නේය. ඔහුට සතුටුද නොවිය යුත්තේය. ප්‍රතික්ෂෙපද නොකට යුත්තේය. සතුටු වීමත් නොකොට ප්‍රතික්ෂෙපත් නොකොට හෙතෙමේ මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, මේ අර්ථයාගේ මේ වචනම වන්නාහුද? ඒ වචන හෝ වන්නාහුද කවර නම් වචනයක් සුදුසුදැ'යි ඇසිය යුතුය. ඉදින් හෙතෙමේ මෙසේ කියන්නේද ඇවැත්නි, මේ අර්ථයට මේ වචන සුදුසු වන්නේය. යමක් මා විසින් කියන ලද්දේ නම් ඒ මෙය වන්නේයයි කියයිද හෙතෙමේ නොම ඇතුළත් කළ යුත්තේය. ඉවත්ද නොකළ යුත්තේය. ඇතුළත්ද නොකොට ඉවත්ද නොකොට ඒ වචන අර්ථයන්ගේම දැරීම පිණිස එයම හොඳින් හැඟවිය යුත්තේය. චුන්දය, ඉදින් අනික් භික්ෂුවක් තෙමේ සංඝයාට ධර්මය කියන්නේ වේද ඉදින් එහි ලා තොපට මෙබඳු සිතක් වන්නේද, 'මේ ආයුෂ්මත් තෙමේ වනාහි අර්ථයද හොඳින් ගන්නේය. වචනද හොඳින් ප්‍රකාශ කරන්නේය'යි කියායි. ඔහුගේ කීම යහපත් වන්නේයයි සතුටුවිය යුත්තේය. අනුමොදන් විය යුත්තේය. ඔහුගේ කීම යහපත්යයි සතුටුව, අනුමෝදන්ව මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, යම්බඳුවූ අපි මෙසේ අර්ථයෙන් යුක්තවූ වචනයෙන් යුක්තවූ (ධර්මය ප්‍රකාශ කරන්නාවූ) ඔබ වැනි බ්‍රහ්මචාරී ආයුෂ්මතෙකු දකින්නෙමුද? ඇවැත්නි, එය අපගේ ලැබීමෙක් වන්නේය. අපගේ මිනිසත් බව මනා ලැබීමක් වන්නේයයි කිය යුතුය.

17. චුන්දය, මම තොපට මෙලොව ඇත්තාවූම කාමාදි ක්ලෙශයන්ගේ සංවරය පිණිසම ධර්මය දෙශනා නොකරමි. චුන්දය, මම පරලොව පවත්නාවූ ක්ලෙශයන්ගේ නැසීම පිණිසම ධර්මය දෙශනා නොකරමි. චුන්දය, මම මෙලොව පිළිබඳ ක්ලෙශයන්ගේ වැළැක්ම පිණිසද ධර්මය දෙශනා කරමි. පරලොව පිළිබඳ ක්ලෙශයන්ගේ නැසීම පිණිසද ධර්මය දෙශනා කරමි.

18. චුන්දය, එහෙයින් මා විසින් තොපට යම් සිව්රක් නියමකරන ලද්දේද එය යම්තාක් තොපගේ සීතල නැසීම පිණිසද උණුසුම නැසීම පිණිසද මැසි, මදුරු, අව්, සුලං සර්පයන්ගේ ස්පර්ශයෙන් වන උවදුරු නැසීම පිණිසද ලජ්ජා උපදින තැන් වැසීම පිණිසද ප්‍රමාණ වන්නේය. මා විසින් තොපට යම් පිණ්ඩපාතයක් නියමකරන ලද්දේද ඒ පිණ්ඩපාතය යම්තාක් මේ ශරීරය පැවැත්ම පිණිසද යැපීම පිණිසද සාදුක් පීඩා වැළැක්ම පිණිසද බ්‍රහ්මචරියාවට උපකාර පිණිසද ප්‍රමාණ වන්නේය. පිණ්ඩපාත භොජනය වැළඳීමෙන් පුරාණ වේදනාද නසමි. අලුත් වේදනාද නූපදවමි. මාගේ ජීවිතයේ පැවැත්මද වන්නේය. නිවරද බවද පහසුවෙන් විසීමද වන්නේයයි පරිභොග කරන්නේය. මා විසින් තොපට යම් සේනාසනයක් නියම කරන ලද්දේද එය තොපට යම්තාක් සීතල නැසීම පිණිසද උණුසුම නැසීම පිණිසද මැසි, මදුරු, අව්, සුළං, සර්ප ස්පර්ශයන්ගේ නැසීම පිණිසද සුදුසු වන්නේය. යම්තාක් ඍතු උවදුරු නැති කිරීමද තනිව ඉදීමෙහි ඇලීම පිණිසද සුදුසු වන්නේය. මා විසින් තොපට යම් බෙහෙත් පිරිකරක් නියම කරන ලද්දේද එය තොපගේ යම්තාක් උපන් රෝග වේදනාවන්ගේ නැසීම පිණිසද නිදුක් බව කෙළවරකොට ඇති බව පිණිසද සුදුසු වන්නේය.

19. "චුන්දය, යම් හේතුවකින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ (ශාසනයෙන් පිට පැවිදිවූ අය) ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ සැපයෙහි ඇලීමෙන් යුක්තව වාසය කරන්නාහුයයි කියන්නාහුද එසේ කීමට හේතු ඇත්තේය.

"චුන්දය, මෙසේ කියන්නාවූ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ වෙත්ද ඔවුන්ට මෙසේ කියයුතු වන්නාහුය. ඇවැත්නි, ඒ සැපයෙහි ඇලී වාසය කිරීම නම් කවරක් වන්නේද? සැපයෙහි ඇලී වාසය කිරීම් බොහෝ වන්නාහුය. නොයෙක් ආකාර වන්නාහුය. නොයෙක් විධි වන්නාහුය.

චුන්දය, මේ සැපයෙහි ඇලී වාසය කිරීම් සතරක් හීන වූවාහුය. ගම්මුන්ගේ ගති වූවාහුය. පෘථග්ජනයන්ගේ ගති වූවාහුය. උතුම් ගති නුවූවාහුය. අනර්ථ පිණිස පවත්නාහුය. අවබොධය පිණිස නොපවත්නාහුය. නොඇලීම පිණිස නොපවත්නාහුය. ක්ලෙශයන්ගේ නිරොධය පිණිස ද නොපවත්නාහුය. කෙලෙස් සංසිඳීම පිණිසද නොපවත්නාහුය. විශෙෂයෙන් දැනීම පිණිසද නොපවත්නාහුය. සම්බොධිය පිණිසද නිර්වාණය පිණිසද නොපවත්නාහුය.

කවරනම් සතරෙක්ද? "චුන්දය, මේ ලොකයෙහි ඇතැම් අඥානයෙක් තෙමේ ප්‍රාණීන් මර මරා තමා සැපයට පමුණුවන්නේය. පිණවන්නේය. මේ පළමුවැනි සුඛල්ලිකානුයෝගය වන්නේය. නැවතද චුන්දය මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් හොරකම් කර කර තමා සැපයට පමුණුවන්නේය. පිණවන්නේය. මේ දෙවෙනි සුඛල්ලිකානුයොගය වන්නේය. චුන්දය නැවතද මේ ලොකයෙහි ඇතැමෙක් බොරු කිය කියා තමා සැපයට පමුණුවන්නේය, පිණවන්නේය. මේ තුන්වැනි සුඛල්ලිකානුයොගය වන්නේය. නැවතද චුන්දය, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් පස්වැදෑරුම් කාම ගුණයෙන් පැවරීම වූයේ යුක්තවූයේ සේවනය කෙරේද මේ සතරවෙනි සුඛල්ලිකානුයොගය වන්නේය. චුන්දය, මේ සුඛල්ලිකානුයොගයෝ සතර වනාහී හීනවූවාහු ගම්මුන්ගේ ගති වූවාහු පෘථග්ජනයන්ගේ ගතිවූවාහු උතුම් නුවූවාහු අනර්ථය පිණිස පවත්නාහුය. අවබොධය පිණිසද නොවන්නාහුය. රාගය නැතිවීම පිණිසද නොවන්නාහුය. ක්ලේශනිරොධය පිණිසද නොවන්නාහුය. කෙලෙස් සංසිඳීම පිණිසද විශෙෂයෙන් දැනීම පිණිසද සම්බොධිය පිණිසද නිර්වාණය පිණිසද නොවන්නාහුය.

චුන්දය, යම් හේතුවකින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ (සාසනයෙන් පිට මහණවූවෝ) "මේ සිව්වැදෑරුම් සුඛල්ලිකානුයොගයෙහි යෙදී ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ වාසය කරන්නාහුයයි" කියත්ද ඊට හේතු ඇත්තේය. මෙසේ කියන්නාහු වෙත්ද ඔවුන්ට තොපි එසේ නොකියව්යයි කිය යුත්තාහුය, ඔවුන්ට තොපි සැබෑනුවූ බොරුබසින් නුගුණ නොකියයුත්තාහුයයි කියයුත්තාහුය.

**20.** "චුන්දය, මේ සුඛල්ලිකානුයෝගයෝ සතරක් ඒකාන්ත අවබොධය පිණිසද රාගය නැතිකිරීම පිණිසද කෙලෙස් නැතිකිරීම පිණිසද කෙලෙස් සංසිඳීම පිණිසද විශෙෂයෙන් දැනීම පිණිසද සම්බොධිය පිණිසද නිර්වාණය පිණිසද පවත්නාහුය. කිනම් සතරෙක්ද? චුන්දය, මේ ශාසනයෙහි මහණතෙමේ කාමයන්ගෙන් වෙන්වූයේ අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමද්ධ්‍යානයට පැමිණ වාසය කෙරේද මේ පළමුවෙනි සුඛල්ලිකානුයොගය වන්නේය.

චුන්දය, නැවතද මහණතෙමේ විතර්ක විචාරයන්ගේ සංසිඳවීමෙන් ඇතුළත පැහැදීම ඇති කරන්නාවූ හිතේ එකඟ බවයයි කියනලද විතර්ක විචාර යන ධ්‍යානාංග නැත්තාවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කෙරේද මේ දෙවැනි සුඛල්ලිකානුයොගය වන්නේය.

"චුන්දය, නැවතද මහණතෙමේ ප්‍රීතියගේද නැතිකිරීමෙන් තෘතීයධ්‍යානයට එළඹ වාසය කෙරේද මේ තුන්වෙනි සුඛල්ලිකානුයොගය වන්නේය.

චුන්දය, නැවතද මහණතෙමේ සැපයද නැතිකිරීමෙන් දුකද නැති කිරීමෙන් චතුර්ථ ධ්‍යානයට පැමිණ වාසය කෙරේද මේ සතරවෙනි සුඛල්ලිකානුයොගය වන්නේය.

**21.** චුන්දය, මේ සතර සුඛල්ලිකානුයෝගයෝ ඒකාන්තයෙන් කලකිරීම පිණිසද නොඇලීම පිණිසද ක්ලේශයන්ගේ නිරුද්ධකිරීම පිණිසද සංසිඳීම පිණිසද විශෙෂයෙන් දැනීම පිණිසද අවබොධය පිණිසද නිර්වාණය

පිණිසද පවත්නාහුය. චුන්දය, මේ කාරණය ඇත්තේය. යම් හේතුවකින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ (සාසනයෙන් පිට මහණවූ අය) 'මේ සතර සුඛල්ලිකානුයෝගයෙහි යෙදී ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ වාසය කරන්නාහුය'යි කියන්නාහ. මෙසේ කියන්නාවූ ඔවුන්ට තෙපි 'එසේය'යි කියයුත්තාහුය. තෙපි යහපත්කොට කියන්නාහුය. තොපි අසත්‍යයෙන් චොදනා නොකරන්නාහු යයි කිය යුත්තාහුය. චුන්දය, මේ කාරණයක් ඇත්තේ වේ. යම් හේතුවකින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ (සාසනයෙන් පිට මහණවූඅය) මෙසේ කියන්නාහු වෙත්ද (කෙසේද) 'ඇවැත්නි, මේ සතර සුඛල්ලිකානුයොගයෙහි යෙදී වාසය කරන්නවුන්ට කෙතෙක් ඵල වන්නාහුද කොතෙක් ආනිසංස කැමති විය යුත්තාහුදැයි කියන්නාහ. මෙසේ කියන්නාවූ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ කියයුතු වන්නාහුය.

'ඇවැත්නි, මේ සතර සුඛල්ලිකානුයොගයෙහි යෙදී වාසය කරන්නවුන් විසින් ඵල ආනිසංස සතරක් කැමති විය යුත්තාහ. කවර නම් සතරක්ද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙමේ ත්‍රිවිධ සංයෝජනයන්ගේ නැති කිරීමෙන් අපායෙහි නොවැටෙන්නාවූ සම්බොධිය නියත කොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වන්නේය. මේ ප්‍රථම ඵලය වන්නේය. පළමුවෙනි ආනිසංසය වන්නේය.

නැවතද ඇවැත්නි, මහණ තෙමේ "ත්‍රිවිධ සංයෝජනයන්ගේ නැතිකිරීමෙන් රාග, ද්වෙෂ, මොහයන්ගේ තුනී කිරීමෙන් සකෘදාගාමියෙක් වේද, එක්වරක්ම මේ ලෝකයට අවුත් දුක් කෙළවර කරන්නෙක් වන්නේය. මේ දෙවෙනි ඵලය, දෙවෙනි ආනිසංසය වන්නේය.

නැවතද ඇවැත්නි, මහණ තෙමේ පස්වැදෑරුම් ඔරම්භාගිය (සත්කායදෘෂ්ටි, විචිකිත්ෂා, ශීලව්‍රත පරාමර්ශ, කාමරාග, ව්‍යාපාද යන රැහැන් පස) සංයෝජනයන්ගේ නැතිකිරීමෙන් ඕපපාතිකයෙක් වන්නේය. ඒ බඹලොවින් මෙලොවට නොඑන ස්වභාව ඇත්තේ එහි පිරිනිවන්පාන ස්වභාව ඇත්තෙක් වන්නේය. මේ තුන්වෙනි ඵලය, තුන්වෙනි ආනිසංසය වන්නේය.

නැවතද ඇවැත්නි, මහණ තෙමේ කාමාදි කෙලෙස් නැති කිරීමෙන් අර්හත් ඵලයට පැමිණ මේ ආත්මයෙහිම තමාම උසස් ඥානයෙන් දැන අවබොධකොට එයට පැමිණ වාසය කරන්නේය. මේ සතරවෙනි ඵලය, සතරවෙනි ආනිසංසය වන්නේය.

ඇවැත්නි, මේ සතර සුඛල්ලිකානුයෝගයෙහි යෙදී වාසය කරන්නවුන් විසින් මේ සතරඵල සතර ආනිසංස කැමති වියයුත්තාහු යි.

22. "චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. යම් හේතුවකින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහුය. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ ස්ථිර ස්වභාවයක් නැතිව වාසය කරන්නාහුය කියායි.

චුන්දය, මෙසේ කියන්නාවූ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ කියයුතු වන්නාහුය. ඇවැත්නි, සර්වඥතා ඥානයෙන් සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයින්ට දිවි කෙළවර දක්වා නොඉක්මවියයුතු ධර්මයක් දෙශනා කරන ලදී. පනවන ලදී.

23. ඇවැත්නි, යම්සේ ඉන්ද්‍රඛීලයක් (නගර දොරටුවෙහි සිටවන ශක්තිමත් කණුව) හෝ යකඩ කණුවක් හෝ ගැඹුරු භූමියෙහි හොඳින් සිටුවා තබන ලද්දේ නොසැළෙන්නේ වේද කම්පා නොවන්නේ වේද ඇවැත්නි, එපරිද්දෙන්ම සියල්ල දන්නාවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන්වහන්සේ විසින් ශ්‍රාවකයින්ට ජීවිතයේ අවසානය දක්වා නොඉක්මවියයුතුවූ ධර්මයක් දෙශනා කරනලදී. පනවනලදී. ඇවැත්නි, යම් ඒ භික්ෂුවක් තෙමේ නැති කරණලද කෙලෙස් ඇත්තේ රහත් වූයේ වේද, වැස නිමවනලද බ්‍රහ්මචය්‍ර්‍යාව ඇත්තේ කරණලද කටයුතු ඇත්තේ ඉවත් කරනලද කෙලෙස් බර ඇත්තේ පැමිණෙනලද තමාගේ යහපතවූ රහත්ඵල ඇත්තේ වේද, ක්ෂයකරණලද සසර රඳවන රැහැන් ඇත්තේ හොඳකාර දැන අර්හත්ඵල නිදහසින් මිදුනේවේද, ඒ රහත් තෙමේ කරුණු නවයක හැසිරීමට

නුසුදුස්සෙක් වන්නේය. ඇවැත්නි, රහත්වූ භික්ෂු තෙමේ දැන දැන ප්‍රාණයක් නැති කිරීමට සුදුසු නොවන්නේය. රහත්වූ භික්ෂු තෙමේ සොර සිතින් අන්සතු දෙයක් ගැනීමට සුදුසු නොවන්නේය. රහත්වූ භික්ෂුතෙමේ මෛථුන්දම් සේවනය කිරීමට සුදුසු නොවන්නේය. රහත්වූ භික්ෂු තෙමේ දැන දැන බොරු කීමට සුදුසු නොවන්නේය. රහත්වූ භික්ෂු තෙමේ පෙර ගිහි කාලයෙහි මෙන් වස්තු කාමයෙන්ද ක්ලෙශ කාමයෙන්ද තැන්පත් කොටගෙණ යමක් පාවිච්චි කිරීමට සුදුසු නොවන්නේය. රහත්වූ භික්ෂු තෙමේ ආසාව නිසා අගතියට යාමට නුසුදුස්සෙක් වන්නේය. රහත්වූ භික්ෂු තෙමේ ද්වෙෂයෙන් (ක්‍රොධයෙන්) අගතියට යාමට නුසුදුස්සෙක් වන්නේය. රහත්වූ භික්ෂු තෙමේ මොහයෙන් (මොඩකමින්) අගතියට යාමට නුසුදුස්සෙක් වන්නේය. රහත්වූ භික්ෂු තෙමේ බියෙන් අගතියට යාමට සුදුසු නොවන්නේය. ඇවැත්නි, යම් ඒ භික්ෂුවක් තෙමේ නැති කරන ලද කෙලෙස් ඇත්තේ රහත්වූයේ වේද වැස නිමවන ලද බ්‍රහ්මචය්‍ර්‍යය (උතුම් හැසිරීම) ඇත්තේ වේද කටයුතු නිමකරන ලද්දේ වේද අහක්කරනලද කෙලෙස් බර ඇත්තේද පැමිණෙන ලද රහත්ඵල නම්වූ තමන්ගේ යහපත ඇත්තේද නැතිකරනලද භවසංයෝජන (සසර බැඳෙන රැහැන්) ඇත්තේ අර්හත් ඵල නිදහසින් හොඳින් මිදුනේ වේද ඒ රහත් භික්ෂු තෙමේ මේ කරුණු නවයෙහි හැසිරීමට සුදුසු නොවන්නේය. චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. යම් හේතුවකින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහු වෙද්ද? (කෙසේද යත්) ‘ශ්‍රමණ භවත් ගෞතම තෙමේ අතීත කාලය ගැන වැඩි වශයෙන් ඥාන දර්ශනය පණ වන්නේය, ප්‍රකාශ කරන්නේය. අනාගත කාලය ගැන ඒ මේ කරුණ කෙසේ වන්නාහුදැයි ඒ මේ කරුණ කුමක් වන්නාහුදැයි වැඩි වශයෙන් ඥාන දර්ශනය නොපනවන්නේය, ප්‍රකාශ නොකරන්නේය’යි (කියත්ද) ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ අනිකක් ගැන පවත්නාවූ ඥාණ දර්ශණයෙන් අනිකක්ගැන පවත්නාවූ ඥාණ දර්ශනයක් පැණවිය යුත්තක් කොට, ප්‍රකාශ කටයුත්තක් කොට හඟින්නාහුය. අඥානවූ අසමත් අය යම්සේද? එසේ වන්නාහුය.

**24.** චුන්දය, අතීත කාලය ගැන තථාගතයන් වහන්සේගේ පෙර විසූ ජීවිත සිහිකිරීමේ ඥානය ඇත්තේය. උන්වහන්සේ යම්තාක් කැමති වන්නේද ඒ තාක් සිහි කරන්නේය. අනාගත කාලය ගැනද තථාගතයන් වහන්සේගේ බෝගස මුලදී හටගත් සතර මාර්ග ඥානය (හතර ආකාර මාර්ග ඥානය) උපදනේය. මේ අන්තිම ජාතිය වන්නේය. නැවත උත්පත්තියක් නැත්තේයයි දැනගන්නේය.

"චුන්දය, අතීතවූ නමුත් යමක් අසත්‍ය නම් නැත්නම් අනර්ථයෙන් යුක්ත නම් තථාගතයන් වහන්සේ ප්‍රකාශ නොකරන්නේය. චුන්දය, අතීතවූ නමුත් යමක් සත්‍ය වුවද ඇත්ත වුවද අනර්ථය පිණිස පවත්නේනම් එයද තථාගතයන් වහන්සේ ප්‍රකාශ නොකරන්නේය.

චුන්දය, තථාගතයන්වහන්සේ ඒ ප්‍රශ්නය විසඳීමට සුදුසු කල් දන්නේ වේ. චුන්දය, අනාගත කාලය පිළිබඳ යමක් නැත්තාවූද සත්‍ය නුවූද අනර්ථයෙන් යුක්තවූවක් වේ නම් තථාගතයන් වහන්සේ එය ප්‍රකාශ නොකරන්නේය. අනාගත කාලය පිළිබඳවූද යමක් සත්‍ය වේද ඇත්ත වේද අනර්ථය පිණිස පවතීද තථාගතයන් වහන්සේ එය ප්‍රකාශ නොකරන්නේය. තථාගතයන්වහන්සේ ඒ ප්‍රශ්නය විසඳීමට කල් දන්නේය.

චුන්දය, වර්තමාන කාලය පිළිබඳ නැත්තාවූ සත්‍ය නුවූ අනර්ථයෙන් යුක්ත වූවක් වේද එය තථාගතයන් වහන්සේ ප්‍රකාශ නොකරන්නේය. චුන්දය, වර්තමාන කාලය පිළිබඳ ඇත්තාවූ සත්‍යවූ අනර්ථයෙන් යුක්තවූවක් වේද එයද තථාගතයන් වහන්සේ ප්‍රකාශ නොකරන්නේය. චුන්දය, වර්තමාන කාලය පිළිබඳ ඇත්තාවූද සත්‍යවූද අර්ථයෙන් යුක්තවූවක් වේද එහිද ඒ ප්‍රශ්නය විසඳීමට තථාගතයන්වහන්සේ කාලය දන්නේය. චුන්දය, වර්තමාන කාලය පිළිබඳ ඇත්තාවූද සත්‍යවූද අර්ථයෙන් යුක්තවූවක් වේද එහි ඒ ප්‍රශ්නය සුදුසු කාලයෙහි ප්‍රකාශ කිරීමට තථාගතයන් වහන්සේ දන්නේවේ. මෙසේ චුන්දය, තථාගතයන් වහන්සේ අතීත අනාගත වර්තමාන කාලයන් සම්බන්ධ ධර්මයන්හි සුදුසු කල් බලා ප්‍රකාශ කරන්නෙක් වේද සත්‍යයක්ම

ප්‍රකාශකරන්නෙක් වේද අර්ථය ප්‍රකාශකරන්නෙක් වේද ධර්මය ප්‍රකාශකරන්නෙක් වේද විනය ප්‍රකාශකරන්නෙක් වේද එහෙයින් තථාගතයයි කියනු ලැබේ. චුන්දය, යම් හේතුවකින් දෙවියන් සහිතවූද මාරයන් සහිතවූද බ්‍රහ්මයන් සහිතවූද ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයා සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ ලොකයා විසින් ඇසින් දක්නා ලද්දාවූද කණින් අසන ලද්දාවූද නාසය, දිව, කය යන ඉන්ද්‍රියන්ගෙන් දැනගන්නා ලද්දාවූද සිතින් දැනගන්නා ලද්දාවූද පැමිණෙන ලද්දාවූද සොයන ලද්දාවූද විමසන ලද්දාවූද යමක් වේද ඒ සියල්ල තථාගතයන් වහන්සේ විසින් අවබොධ කරන ලද්දේය. එහෙයින් තථාගත යයි කියනු ලැබේ. චුන්දය, යම්බඳු රාත්‍රියෙක්හි තථාගත තෙමේ උතුම් සම්‍යක් සම්බොධිය අවබොධ කෙරේද යම්බඳු රාත්‍රියෙක්හි ස්කන්ධයන් ඉතිරි නොවූ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පාද මේ අතර කාලයෙහි යම් ධර්මයක් කියන්නේද ප්‍රකාශ කරන්නේද දක්වන්නේද ඒ සියල්ල එපරිද්දෙන්ම වන්නේය. අන් පරිද්දකින් නොවන්නේය. එහෙයින් තථාගතයයි කියනු ලැබේ. චුන්දය, තථාගත තෙමේ යම් සේ කියන්නේද එසේ කරන්නේය. යම්සේ කරන්නේද එසේ කියන්නේය. මෙසේ කියන සේ කරන්නේද කරනසේ කියන්නේද වෙයි. එහෙයින් තථාගතයයි කියනු ලැබේ.

**25.** චුන්දය, දෙවියන් සහිතවූද මාරයන් සහිතවූද බ්‍රහ්මයන් සහිතවූද ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයා හා දෙව් මිනිසුන් සහිතවූ ලොකයෙහි තථාගත තෙමේ සියල්ල මැඩපවත්වන්නේය. කිසිවෙකු විසින් නොමැඩිය හැකි වන්නේය. ඒකාන්තයෙන් සියල්ල දක්නේය. සියල්ල තමා වසයෙහි පවත්වන්නේය. එහෙයින් තථාගතයයි කියනු ලැබේ. චුන්දය, මේ කාරණයෙක් ඇත්තේ වේ. යම් හේතුවකින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ (සාසනයෙන් පිට මහණවූ අය) මෙසේ කියන්නාහු වෙත්ද? 'ඇවැත්නි, සත්ව තෙමේ මරණින් මත්තෙහි කුමක් වන්නේද? මෙයම සත්‍ය වන්නේද? අන්‍යයන්ගේ කීම් හිස්වන්නේද කියායි.

චුන්දය, අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ (සාසනයෙන් පිට මහණවූ අය) මෙසේ කියන්නාහුද (ඔවුන්ට) මෙසේ කියයුතු

වන්නාහුය. 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් 'සත්ව තෙමේ මරණින් මත්තෙහි වන්නේය' යන මේ දෘෂ්ටියම සත්‍ය වන්නේය. අන්‍යයන්ගේ කීම් හිස් වන්නේය'යි ප්‍රකාශ නොකරන ලද්දේමය. "චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. චුන්දය, යම් හේතුවකින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහු වෙද්ද, කිමෙක්ද, ඇවැත්නි, සත්ත්ව තෙමේ මරණින් මත්තෙහි නොවන්නේය. මේ දෘෂ්ටියම සත්‍ය වන්නේය. අන්‍යයන්ගේ කීම් හිස් වන්නේය' කියායි.

**26.** "චුන්දය, අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහුද, (ඔවුන්ට) මෙසේ කියයුතු වන්නාහුය. 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් සත්ව තෙමේ මරණින් මත්තෙහි නොවන්නේය. මේ දෘෂ්ටියම සත්‍ය වන්නේය අන්‍යයන්ගේ කීම් හිස් වන්නේයයිද, මෙසේද ප්‍රකාශ නොකරන ලද්දේය. "චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. යම් හේතුවකින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ (සාසනයෙන් පිට මහණවූ අය) මෙසේ කියන්නාහු වෙත්ද, 'ඇවැත්නි, කිමෙක්ද? සත්ව තෙමේ මරණින් මත්තෙහි ඇති වන්නේද? නොවන්නේද? මේ දෘෂ්ටියම සත්‍ය වන්නේද, අන්‍යයන්ගේ කීම් හිස් වන්නේද' කියායි "චුන්දය, අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහුද, (ඔවුන්ට) මෙසේ කියයුතු වන්නාහුය. 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් සත්ත්වතෙමේ මරණින් මත්තෙහි වන්නේද නොවන්නේ දැයි මේ දෘෂ්ටිය සත්‍යවන්නේය. සෙස්සන්ගේ කීම් හිස්වන්නේ ය'යි මෙසේ වනාහි ප්‍රකාශ නොකරණ ලද්දේයයි කියයුතුය.

"චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. යම් හේතුවකින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ (සාසනයෙන් පිට මහණවූ අය) මෙසේ කියන්නාහු වෙත්ද, ඇවැත්නි, කිමෙක්ද, සත්ත්ව තෙමේ මරණින් මත්තෙහි වන්නේත් වේද නොවන්නේත් වේද? මේ දෘෂ්ටියම සත්‍ය වන්නේද, අන්‍යයන්ගේ කීම් හිස් වන්නේද, චුන්දය, අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ (සාසනයෙන් පිට මහණවූ අය) මෙසේ කියන්නාහුද (ඔවුන්ට) මෙසේ කියයුතු වන්නාහුය. 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මරණින් මත්තෙහි සත්වතෙම වන්නේය කියා හෝ නොවන්නේය කියා හෝ මේ

දෘෂ්ටියම සත්‍ය වන්නේය. අන්‍යයන්ගේ කීම් හිස් වන්නේය'යි මෙසේද ප්‍රකාශ නොකරන ලද්දේය. "චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. 'ඇවැත්නි, කුමක් හෙයින් ශ්‍රමණභවත් ගෞතමයන් විසින් මේ කාරණය ප්‍රකාශ නොකරණ ලද්දේදැ'යි මෙසේ කියන්නාහුද? "චුන්දය, එසේ කියන්නාවූ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ (සාසනයෙන් පිට මහණවූ අය) වන්නාහුද (ඔවුන්ට) මෙසේ කියයුතු වන්නාහුය. 'ඇවැත්නි, මෙය අර්ථයෙන් යුක්ත වූවක් නොවන්නේය. ධර්මයෙන් යුක්ත වූවක් නොවන්නේය. බ්‍රහ්මචර්‍ය්‍යාවට මුල නොවන්නේය. කලකිරීම පිණිස නොපවත්නේය. නොඇලීම පිණිසද නොපවත්නේය. කෙලෙසුන් නැසීම පිණිසද නොපවත්නේය. කෙලෙස් සංසිඳවීම පිණිසද නොපවත්නේය. විශෙෂයෙන් දැකීම පිණිසද නොපවත්නේය. නිර්වාණය පිණිසද නොපවත්නේය. එහෙයින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරණ ලද්දේය'යි, (කියයුතු වන්නාහුය.) "චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. යම් හේතුවකින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ (සාසනයෙන් පිට මහණවූ අය) 'ඇවැත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් විසින් කුමක් ප්‍රකාශ කරණ ලද්දේදැයි මෙසේ කියන්නාහුද (ඔවුන්ට) මෙසේ කියයුතු වන්නාහුය. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දුකවන්නේයයි දුක්ඛ සත්‍යය ප්‍රකාශ කරණ ලද්දේය. ඇවැත්නි, මෙය දුක හටගැනීමට හේතුවයයි දුක්ඛ සමුදය සත්‍යය භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දේය. ඇවැත්නි මෙය දුක නැති කිරීම යයි දුක්ඛ නිරොධ සත්‍යය භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දේය. ඇවැත්නි, මෙය දුක්නැති කිරීමට පමුණුවන්නාවූ ප්‍රතිපදාවයයි දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දේය'යි (කියයුතු වන්නාහුය) "චුන්දය, මේ කාරණයෙන් ඇත්තේය. යම් හේතුවකින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ (සාසනයෙන් පිට මහණවූ අය) 'ඇවැත්නි, කුමක් හෙයින් මෙය ශ්‍රමණ භවත් ගෞතමයන් විසින් ප්‍රකාශ කරණ ලද්දේ දැ'යි, මෙසේ කියන්නාහුද "චුන්දය, මෙසේ කියන්නාවූ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ (සාසනයෙන් පිට මහණවූ අය) වන්නාහුද

(ඔවුන්ට) මෙසේ කියයුතු වන්නාහුය. ඇවැත්නි, මෙය අර්ථයෙන් යුක්තවූයේය. මෙය ධර්මයෙන් යුක්ත වූයේය. මෙය බ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වන්නේය. ඒකාන්ත අවබොධය පිණිසද නොඇලීම පිණිසද කෙලෙස් නැතිකිරීම පිණිසද කෙලෙස් සංසිඳවීම පිණිසද විශෙෂ ඥානය පිණිසද යහපත් අවබොධය පිණිසද නිර්වාණය පිණිසද පවත්නේය. එහෙයින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද්දේය'යි (කියයුතු වන්නාහුය.) 'චුන්දය, පූර්ව කෙළවර ඇසුරු කළාවූ යම් දෘෂ්ටි කෙනෙක් ඇත්තාහුද ප්‍රකාශ කළ යුතුවූ ඒ දෘෂ්ටි මා විසින් තොපට ප්‍රකාශ කරන ලද්දාහුය. ප්‍රකාශ නොකළ යුත්තාවූ ඒ දෘෂ්ටි තොපට කුමක් සඳහා ප්‍රකාශ කරන්නෙම්ද? අග කෙළවර ඇසුරු කළාවූ යම් දෘෂ්ටි කෙනෙක් ඇත්තාහුද? ඒ දෘෂ්ටි යම් ආකාරයකින් ප්‍රකාශ කළ යුත්තාහුද මා විසින් තොපට ඒ ආකාරයෙන් ප්‍රකාශ කරන ලද්දාහුය. යම් ආකාරයකින් ප්‍රකාශ නොකළ යුත්තාහුද ඒ ආකාරයෙන් කුමක් සඳහා ප්‍රකාශ කරන්නෙම්ද? "චුන්දය, ඇතැම් මහණ බමුණෝ මෙසේ කියන්නෝද මෙබඳු දෘෂ්ටි ඇත්තාහුද වෙත්. 'ආත්මයද ලෝකයද සදාකාලික වන්නේය. මේ දෘෂ්ටිය සත්‍ය වන්නේය. සෙස්සන්ගේ කීම් අසත්‍ය වන්නේය' (කියායි.) චුන්දය, ඇතැම් මහණ බමුණෝ මෙසේ කියන්නාහුද මෙබඳු දෘෂ්ටි ඇත්තාහුද වෙත්. ආත්මයද ලොකයද සදාකාලික නොවන්නේය. ආත්මයද ලොකයද සදාකාලික වන්නේද සදාකාලික නොවන්නේද වේ. ආත්මයද ලොකයද සදාකාලික නොවන්නේත් වේ. සදාකාලික නොවන්නේත් නොවන්නේ වේ. ආත්මයද ලොකයද තමා විසින් කරන ලද්දේය. ආත්මයද ලොකයද අන්‍යයන් විසින් කරන ලද්දේ ආත්මයද ලොකයද තමා විසින් උපදවන ලද්දේද, අනුන් විසින් උපදවන ලද්දේද වන්නේය. ආත්මයද ලොකයද තමා විසින්ද ඇති නොකරන ලද්දේද, අනුන් විසින්ද ඇති නොකරන ලද්දේද, හේතුවක් නැතිව හටගත්තේයයි' මේ දෘෂ්ටියම සත්‍ය වන්නේය. සෙස්සන්ගේ කීම් හිස් වන්නේයයි (කියාද) සැප දුක් දෙක සදාකාලික වන්නේය. සැප දුක් දෙක සදාකාලික නොවන්නේය. සැප දුක් දෙක සදාකාලිකද, සදාකාලික

නොවූයේද වන්නේය. සැපදුක් දෙක සදාකාලික නොවන්නේද සදාකාලික නොවන්නේ නොවෙන්නේද වන්නේය. සැප දුක් දෙක තමන් විසින් ඇති කරන ලද්දේය. අනුන් විසින් ඇති කරන ලද්දේය. සැප දුක් දෙක තමන් විසින්ද නොකරන ලද්දේය. අනුන් විසින්ද නොකරන ලද්දේය. සැප දුක් දෙක තමන්ද නොකොට අනුන්ද නොකොට හේතුවක් නැතිව හටගත්තේය. මේ දෘෂ්ටියම සත්‍ය වන්නේය. සෙස්සන්ගේ කීම් හිස්වන්නේයයි කියන්නාහුය. "චුන්දය, එහි ලා යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ආත්මයද ලොකයද සදාකාලික වන්නේය. 'මේ දෘෂ්ටියම සත්‍යවන්නේය. සෙස්සන්ගේ කීම් හිස් වන්නේය'යි මෙසේ කියන්නාහුද, මේ දෘෂ්ටි ඇත්තාහුද, මම ඔවුන් කරා එළඹ, 'ඇවැත්නි, ආත්මයද ලොකයද සදාකාලික වන්නේයයි කියනු ලබන්නේද මෙය ඇත්තේද නැත්තේදැයි අසමි. යම් හේතුවකින් ඔව්හුද මේ දෘෂ්ටියම සත්‍යවන්නේය. සෙස්සන්ගේ කීම් හිස්වන්නේය'යි කියන්නාහුද, ඔවුන්ගේ ඒ කීමට මම එකඟ නොවෙමි. ඊට හේතු කවරේද? චුන්දය, මේ ලොකයෙහි ඇතැම් සත්ත්වයෝ අන් පරිද්දකින් වන සංඥා (හැඟීම්) ඇත්තෝද වන්නාහුය. චුන්දය, මේ පැනවීමෙහිද මම තමන්හා සම සම වූවෙක් නොම දක්නේවෙමි. වැඩියෙක් කොයින්ද? එකල යම් මේ විශෙෂ පැනවීමෙහි මම වැඩිසිටි තැනැත්තේ වෙමියි (වදාළේය.) චුන්දය, එහි ලා යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් මෙසේ කියන්නාහුද, මෙබඳු දෘෂ්ටි ඇත්තාහුද, 'ආත්මයද ලොකයද සදාකාලික වන්නේය. ආත්මයද ලොකයද සදාකාලික නොවන්නේය. ආත්මයද ලොකයද සදාකාලිකද වන්නේය සදාකාලික නොවූයේද වන්නේය. ආත්මයද ලොකයද සදාකාලික නොවන්නේත් වන්නේය. සදාකාලික නොවන්නේත් නොවන්නේය. ආත්මයද ලොකයද තමා විසින් ඇති කරන ලද්දේ වන්නේය. ආත්මයද ලොකයද අනුන් විසින් ඇතිකරන ලද්දේ වන්නේය. ආත්මයද ලොකයද තමා විසින් ඇතිකරන ලද්දේද අනුන් විසින් ඇතිකරන ලද්දේද වන්නේය. ආත්මයද ලොකයද තමන් විසින් ඇතිකරන ලද්දේත් නොවන්නේය. අනුන් විසින් ඇතිකරන ලද්දේත් නොවන්නේය හේතුවක් නැතිව

හටගත්තේය. සැප දුක් දෙක සදාකාලික වන්නේය. සැපදුක් දෙක සදාකාලික නොවන්නේය, සැප දුක් දෙක සදාකාලිකද වන්නේය. සදාකාලිකද නොවන්නේය. සැප දුක් දෙක සදාකාලික නොවන්නේත් වන්නේය. සදාකාලික නොවන්නේත් නොවන්නේය. සැප දුක් දෙක තමා විසින් කරන ලද්දේ වේ. සැප දුක් දෙක අනුන් විසින් කරන ලද්දේ වේ. සැප දුක් දෙක තමා විසින් කරන ලද්දේද අනුන් විසින් කරන ලද්දේද වේ. සැප දුක් දෙක තමා විසින් නොකරන ලද්දේද සැප දුක් දෙක අනුන් විසින් කරන ලද්දේද හේතුවක් නැතිව හටගත්තේද වේ. මේ දෘෂ්ටියම සත්‍ය වන්නේය. සෙස්සන්ගේ කීම් හිස්වන්නේ ය'යි කියන්නාහුද මම ඔවුන් කරා පැමිණ මෙසේ කියමි. 'ඇවැත්නි, සැපදුක් දෙක තමා විසින් නොකරන ලදුවද අනුන් විසින් නොකරන ලදුවද හේතුවක් නැතිව හටගත්තේ යයි කියනු ලබන්නේ මෙය ඇත්තේද නැත්තේදැ' යි අසමි. යම් හේතුවකින් ඔව්හු මේ දෘෂ්ටියම සත්‍යවන්නේය, සෙස්සන්ගේ කීම් හිස්වන්නේ ය'යි මෙසේ කියන්නාහුද, මම ඔවුන්ගේ ඒ කීමට එකඟ නොවෙමි. ඊට හේතු කවරේද? චුන්දය, මේ ලොකයෙහි ඇතැම් සත්ත්වයෝ අන් පරිදිවූ සංඥා (හැඟීම්) ඇත්තාහුද වෙත්. චුන්දය, මේ පැනවීමෙහිලා මම වනාහි තමන්වහන්සේ හා සමවූවෙක් නොම දකිමි. වැඩිසිටියෙක් කොයින්ද? යම් මේ ඉතා උසස් පැනවීමක් වේද එහිලා මම වැඩිසිටියෙක් වන්නෙමියි, කීවාහුය.

"චුන්දය, මොහු වනාහි යම් ආකාරයකින් ප්‍රකාශ කළ යුත්තාහුද ඒ ආකාරයෙන් ප්‍රකාශකළාවූ පූර්ව කෙළවර ඇසුරු කළ දෘෂ්ටිහු වෙත්. යම් දෘෂ්ටි කෙනෙක් යම් ආකාරයකින් ප්‍රකාශ නොකළ යුත්තාහුද තොපට කුමක් සඳහා ඒ දෘෂ්ටි ප්‍රකාශ කරන්නෙම්ද?

"චුන්දය, තොපට යම් ආකාරයකින් ප්‍රකාශකළ යුත්තාහුද ඒ ආකාරයෙන් ප්‍රකාශ කළාවූද යම් ආකාරයකින් ප්‍රකාශ නොකළ යුත්තාහුද ඒ ආකාරයෙන් තොපට කුමක් සඳහා ප්‍රකාශ කරන්නෙම්ද යන අග කෙළවර ඇසුරු කළාවූ දෘෂ්ටිහු නම් කවරහුද යත්?

**27.** "චුන්දය, ඇතැම් මහණබමුණෝ මෙසේ කියන්නාහුද, මෙබඳු දෘෂ්ටි ඇත්තාහුද වෙත්. 'ආත්මය තෙම රූපය ඇත්තේ වෙයි. මරණින් මත්තෙහි ඒ ආත්මය නිරෝගි වන්නේ වේ. මේ දෘෂ්ටියම සත්‍ය වන්නේය. සෙස්සන්ගේ කීම් හිස්වන්නේය'යි කියන්නාහුය. චුන්දය, ඇතැම් මහණ බමුණෝ මෙසේ කියන්නාහු, මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්. 'ආත්මය රූපය නැත්තේ වේ. ආත්මය රූපය ඇත්තේද රූපය නැත්තේද වේ. ආත්මය රූපය නැත්තේද රූපය නැත්තේ නොවන්නේද වේ. ආත්මය සංඥාව (හැඟීම්) ඇත්තේවේ. ආත්මය සංඥාව (හැඟීම්) නැත්තේ වේ. ආත්මය සංඥාව (හැඟීම්) නැත්තේද සංඥාව නැත්තේ නොවන්නේද වේ. ආත්මය සිඳෙන්නේය. වැනසෙන්නේය. මරණින් මතු නොවන්නේය. මේ දෘෂ්ටියම සත්‍යය වන්නේය. සෙස්සන්ගේ කීම් හිස්වන්නේය'යි කියන්නාහුය. චුන්දය, එහිලා යම් ඒ මහණ බමුණු කෙනෙක් මෙසේ කියන්නාහුද මෙබඳු දෘෂ්ටි ඇත්තාහුද. 'ආත්මය රූපය ඇත්තේ වේ. මරණින් මතු නිරොගිවේ. මේ දෘෂ්ටියම සත්‍ය වන්නේය. සෙස්සන්ගේ කීම් හිස්වන්නේ ය'යි (කියත්ද) මම ඔවුන් කරා පැමිණ මෙසේ කියමි. 'ඇවැත්නි, ආත්මය තෙම රූපය ඇත්තේවේ. මරණින් මතු නිරෝගි වන්නේය'යි කියනු ලැබේද, මෙය ඇත්තේද නැත්තේදැයි අසමි. යම් හේතුවකින් ඔව්හු මේ දෘෂ්ටියම සත්‍ය වන්නේය. සෙස්සන්ගේ කීම් හිස්වන්නේය' යි මෙසේ කියන්නාහු වෙත්ද ඔවුන්ගේ ඒ කීමට මම එකඟ නොවෙමි. ඊට හේතු කවරේද? චුන්දය, මේ ලොකයෙහි ඇතැම් සත්ත්වයෝ අන් පරිද්දකින් වන සංඥා (හැඟීම්) ඇත්තෝද වෙත්. චුන්දය, මේ පැනවීමෙහි ලා මම තමන්වහන්සේ හා සම වූවෙක් නොමදක්නෙමි. වැඩිසිටියෙක් කොයින්ද? යම් මේ ඉතා උසස්වූ පැනවීමක් වේද, එහි ලා මමම වැඩිසිටියෙක් වන්නෙමි' යි කියන්නෙමි. 'චුන්දය, එහි යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙසේ කියන්නාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, 'ආත්මය රූපය නැත්තේ වේ, ආත්මය රූපය ඇත්තේද රූපය නැත්තේද වේ. ආත්මය රූපය නැත්තේද රූපය නැත්තේ නොවන්නේද වේ. ආත්මය සංඥාව (හැඟීම්) ඇත්තේ

වේ. ආත්මය සංඥාව (හැඟීම්) නැත්තේ වේ. ආත්මය සංඥාව (හැඟීම්) නැත්තේද සංඥාව නැත්තේ නොවන්නේද වේ. ආත්මය සිදෙන්නේය. වැනසෙන්නේය. මරණින් මත්තෙහි නොවන්නේය. මේ දෘෂ්ටියම සත්‍ය වන්නේය. සෙස්සන්ගේ කීම් හිස්වන්නේය'යි (කියද්ද) මම ඔවුන් කරා පැමිණ මෙසේ කියමි. 'ඇවැත්නි, ආත්මය සිදෙන්නේය. වැනසෙන්නේය. මරණින් මතු නොවන්නේයයි කියත්ද, මෙය ඇත්තේදැ' යි කියනු ලැබේද, 'චුන්දය, යම් හේතුවකින් ඔව්හු මෙසේ කියන්නාහුද 'මේ දෘෂ්ටියම සත්‍ය වන්නේය. සෙස්සන්ගේ කීම් හිස්වන්නේය' යි කියද්ද, ඔවුන්ගේ ඒ කීමට මම එකඟ නොවෙමි.' ඊට හේතු කවරේද? චුන්දය, මෙහි ඇතැම් සත්ත්වයෝ අන්පරිද්දකින් වන සංඥා (හැඟීම්) ඇත්තාහුද වෙත්. චුන්දය, මේ පැනවීමෙහි ලා මම තමන් වහන්සේ හා සම වූවෙක් නොම දක්නෙමි. වැඩියෙක් කොයින්ද? යම් මේ ඉතා උසස්වූ පැනවීමක් වේද මමම එහි වැඩිසිටියෙක් වන්නෙමි'යි කියන්නෙමි.

"චුන්දය, මොහු වනාහි තොපට යම් ආකාරයකින් ප්‍රකාශ කළයුත්තාහුද ඒ ආකාරයෙන් ප්‍රකාශ කළාවූද යම් ආකාරයකින් ප්‍රකාශ නොකළ යුත්තාහුද ඒ ආකාරයෙන් තොපට කුමක් සඳහා ප්‍රකාශ කරන්නෙම්ද යන අග කෙළවර ඇසුරු කළාවූ දෘෂ්ටිහුය.

28. "චුන්දය, මේ පූර්ව කෙළවර ඇසුරුකළාවූද අග කෙළවර ඇසුරු කළාවූද දෘෂ්ටීන්ගේ නැසීම පිණිස ඉක්මවීම පිණිස මා විසින් මෙසේ මේ සතර සතිපට්ඨානයෝ දෙශනා කරණ ලද්දාහු පණවන ලද්දාහුය. කවර නම් සතරෙක්ද? චුන්දය, මේ සස්නෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්යයෙන් යුක්ත වූයේ ප්‍රයෝජන අප්‍රයෝජන සලකන ලද නුවණින් යුක්තව සිහියෙන් යුක්තවූයේ පඤ්චස්කන්ධයයි කියනලද ලොකයෙහි තද ආසාව නම් විෂම ලොභයද සෝකයද යන දෙදෙන හික්මවා තම ශරීරයෙහි ශරීරය අනුව දක්නා ස්වභාව ඇතිව වාසය කෙරේද, වේදනාවන්හිද චිත්තයෙහිද කෙලෙස් තවන වීර්යයෙන් යුක්තවූයේ ප්‍රයෝජන අප්‍රයෝජන සලකන ලද නුවණින් යුක්තව සිහියෙන් යුක්තවූයේ පඤ්චස්කන්ධ නම් ලොකයෙහි විෂම ලෝභයයි කියනලද තද

ආසාව හා සෝකයද දුරුකොට වාසය කෙරේද ධර්මයන්හි ධර්මයන් අනුව දක්නා ස්වභාව ඇතිව වාසය කෙරේද, චුන්දය, මේ පූර්ව කෙළවර ඇසුරු කළාවූ දෘෂ්ටීන්ගේද අග කෙළවර ඇසුරු කළාවූ දෘෂ්ටීන්ගේද නැසීම පිණිස ඉක්මවීම පිණිස මෙසේ මා විසින් මේ සතර සතිපට්ඨානයෝ දෙශනාකරණ ලද්දාහුය. පණවන ලද්දාහුය.

**29.** ඒ කාලයෙහි වනාහි ආයුෂ්මත් උපවාණ ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ පිටිපසින් භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් සිටියේ වේ. එකල්හි ආයුෂ්මත් උපවාණ ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය. "ස්වාමීන් වහන්ස, මේ ධර්මදෙශනා ක්‍රමය ආශ්චර්‍ය්‍ය වන්නේය. ස්වාමීන්වහන්ස, ඉතා පුදුම වන්නේය. ස්වාමීන් වහන්ස, මේ ධර්ම කොට්ඨාශය පැහැදීම ඇති කරන්නේය. ස්වාමීන් වහන්ස, මේ ධර්ම කොට්ඨාශය හොඳින් පැහැදීම ඇති කරන්නේය. ස්වාමීන්වහන්ස, මේ ධර්ම කොට්ඨාශය කවරනමක් ඇත්තේදැ"යි ඇසුවේය. "උපවාණය, එසේනම් මේ ධර්ම කොට්ඨාශය 'පාසාදිකය'යි කියාම දරාගණුවයි වදාළේය.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය දේශනා කළාහුය. සතුටු සිත් ඇත්තාවූ ආයුෂ්මත් උපවාණ ස්ථවිර තෙමේද භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට විශෙෂයෙන් සතුටු වූයේයි.

**විසිනව වැනිවූ පාසාදික සූත්‍රය නිමි.**

---

## 30. ලක්ඛණ සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුහු විසින් කරවන ලද දෙව්රම් වෙහෙර වාසය කරන්නාහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන්ට කථා කළාහුය. 'පින්වතුන් වහන්සැ'යි ඒ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ කීවාහුය.

2 "මහණෙනි, මේ ලක්ෂණ දෙතිස මහාපුරුෂයාගේ මහාපුරුෂ ලක්ෂණයෝය. යම් ඒ ලක්ෂණවලින් යුක්තවූ මහාපුරුෂයාගේ මේ ගති දෙකක්ම වෙත්. අන් ගතියක් නොවන්නීය, ඉදින් (ඔහු) ගිහිගෙයි වාසය කෙරේද, සතර දිශාවට අධිපති වූයේ දිනූ රටවල් ඇත්තේ, ජනපදයන්හි ප්‍රධානයා වූයේ, රත්න සතකින් යුක්ත වූයේ, දැහැමි වූයේ, ධර්ම රාජයන්වූ සක්විති රජෙක් වෙයි.

ඔහුට මේ රත්න හත වෙති ඒ කවරේද? චක්‍ර රත්නය, ඇත් රත්නය, අස් රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පරසේනාවන් මැඩිය හැකිවූ දෙව් පුතුන් හා සමානවූ ශරීර ඇති, සූරවූ දහසකට අධිකවූ පුත්‍රයෝ වෙති. හෙතෙම සයුර සීමාකොට වූ මේ පොළොව දඬුවම්කිරීම් නැතිව ආයුධ රහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කෙරෙයි. ඉදින් (ඒ ලක්ෂණ ඇති) මහාපුරුෂයා ගිහිගෙන් නික්ම මහණ වේද, ලොකයෙහි කෙලෙස් නමැති වැස්ම සිඳිනලද, අර්හත්වූ සම්‍යක් සම්බුදු වෙයි. මහණෙනි, මහා පුරුෂයාගේ ඒ දෙතිස් මහා පුරුෂලක්ෂණයෝ කවරහුද? යම් ලක්ෂණයන් ගෙන් යුක්තවූ මහාපුරුෂයාගේ මේ ගති දෙකක් වෙත්. අන්‍ය ගතියක් නැත.

"ඉදින් (ඔහු) ගිහිගෙයි වාසය කෙරේද? සක්විති රජ වෙයි. ඔහුට මේ රත්න හත වෙති. ඒ කවරේද? චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට සතුරු සේනාවන් මැඩිය හැකිවූ, දිව්‍ය පුත්‍රයන් හා සමානවූ ශරීර ඇති සූරවූ දහසකට අධිකවූ පුත්‍රයෝ වෙති. හෙතෙම සාගරය කෙළවර කොටවූ මේ පොළොව දඬුවම් කිරීමක් නැතිව, ආයුධ රහිතව, ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කරයි.

3. "ඉදින් ගිහිගෙන් නික්ම පැවිදි වේද? ලොකයෙහි කෙලෙස් නමැති වහල සිඳිනලද අර්හත්වූ සම්‍යක් සම්බුදු වෙයි.

"මහණෙනි, මෙහි මහාපුරුෂ තෙමේ මනාකොට පිහිටි පාද ඇත්තේ වෙයි. මහණෙනි, යම් හෙයකින් මහාපුරුෂ තෙමේ

මනාකොට පිහිටි පා ඇත්තේ වේද? මහණෙනි, එයද මහා පුරුෂයාගේ මහාපුරුෂ ලක්ෂණයක් වෙයි. මහණෙනි, නැවතද මහාපුරුෂයාගේ යටි පතුල්වල දහසක් අර ඇති, නිම්වලලු සහිතවූ නැබ සහිතවූ, සියලු අයුරින් සම්පූර්ණවූ චක්‍රයෝ පහල වෙත්ද, මහණෙනි, මෙයද මහාපුරුෂයාගේ මහාපුරුෂ ලක්ෂණයක් වෙයි. මහණෙනි, නැවතද මහාපුරුෂ තෙමේ දික් විළුඹ ඇත්තේ වෙයි. දිගඇඟිලි ඇත්තේවෙයි, මෘදුවූ තරුණවූ අතුල් පතුල් ඇත්තේවෙයි. දැල්කවුලුවකට බඳු සමවූ ඇඟිලි ඇති අත් පා ඇත්තේ වෙයි. පිරුණු ගොප් මස ඇති පා ඇත්තේ වෙයි. ඕලු මුවන්ගේ බඳු කෙණ්ඩා ඇත්තේ වෙයි. සිටගෙනම නොනැමී දෙ අත්තලවලින් දනහිස් අතගායිද, පිරිමදීද, කොෂය තුළ සැඟවුනු පුරුෂ ලක්ෂණ ඇත්තේ වෙයි. රන්වන්වූ හම ඇත්තේ වෙයි. සියුම් හම ඇත්තේ වෙයි, සියුම්වූ හම ඇති බැවින් දූලි කුණු ශරීරයෙහි නොඇල්ලෙන්නේ වෙයි. එක එක ලොම් ඇත්තේ වෙයි, රෝම කූපයන්හි එක් එක් රෝම හට ගත්තාහුය. උඩුකුරු අක්ඇති රෝම ඇත්තේ වෙයි, උඩු කුරුවූ ලොම් නිල්වන්ය, අඳුන්වන්ය.

"කෙලින් පිහිටි ශරීරය ඇත්තේ වෙයි. (දෙ පිටිපතුල් දෙ උරහිස්, කර යන) සත් තැන උස් වූයේ වෙයි. සිංහයෙකුගේ ශරීරයේ ඉදිරිපස මෙන් සම්පූර්ණ ශරීරයක් ඇත්තේ වෙයි. පිට දෙපැත්ත මැද පිරුණේ වෙයි. නුග රුකක්සේ වටවූ බව ඇත්තේ වෙයි. උන්වහන්සේගේ ශරීරය යම් පමණ වේද බඹයත් එපමණය. බඹය යම් පමණද ශරීරයත් එපමණය. සම වට බෙල්ල ඇත්තේ වෙයි. සත්සියයක් රසනහර ඇත්තේ වෙයි. සිංහයෙකුගේ යට හක්ක මෙන් සම්පූර්ණ උඩු යටි හකු දෙක ඇත්තේ වෙයි. සම සතලිස් දත් ඇත්තේ වෙයි, සම දත් ඇත්තේ වෙයි, සිදුරු නැතිවූ දත් ඇත්තේ වෙයි, දිලිසෙන ඉතා සුදු දත් ඇත්තේ වෙයි, මෘදු දික් පළල් දිව ඇත්තේ වෙයි, බ්‍රහ්මයාගේ මෙන් කටහඬ ඇත්තේ වෙයි. කුරවීක හඬ බඳු කටහඬ ඇත්තේ වෙයි. පිරිසිදු නිල්වන් පාට ඇස් ඇත්තේ වෙයි, උපන් කෙණෙහි වස්සෙකුගේ බඳු පැහැදුනු ඇස් ගුලි ඇත්තේ වෙයි. දෙ බැම

අතර සුදුවූ මෘදුවූ පුලුන් පෙදක් වැනි දකුණට කරකැවී නළල මැද පිහිටි රෝමයක් වූයේ වෙයි.

4. "මහණෙනි, යම් හේතුවකින් මහපුරුෂයාගේ දෙබැම අතර සුදුවූ මෘදුවූ පුළුන් පෙදක් වැනි ඌර්ණරෝමයක් වූයේද මෙයද, මහණෙනි, මහාපුරුෂයාගේ මහාපුරුෂ ලක්ෂණයක් වෙයි. මහණෙනි, නැවතද මහාපුරුෂ තෙමේ පිරුණු නළල සහිත සම්පූර්ණ හිස ඇත්තේ වෙයි.

"මහණෙනි, මහපුරිස් තෙමේ යම් බඳුවූ සම්පූර්ණ හිස ඇත්තේ වේද, මෙයද මහණෙනි, මහාපුරුෂයාගේ මහා පුරුෂ ලක්ෂණයක් වෙයි. මහණෙනි, ඒ මේ ලක්ෂණ දෙතිස වනාහි මහාපුරුෂයාගේ මහාපුරුෂ ලක්ෂණයෝය. යම් ලක්ෂණයන්ගෙන් යුක්තවූ මහාපුරුෂයාගේ ගති දෙකක් වෙත්. අන් ගතියක් නොවන්නීය. ඉදින් ඔහු ගිහිගෙයි වසයිද සක්විති රජ වෙයි. ඉදින් ගිහිගෙන් නික්ම මහණ වේද ලොකයෙහි කෙලෙස් නමැති පියස්ස සුන් කළ අර්හත්වූ සම්‍යක් සම්බුදු වෙයි. මහණෙනි, මහාපුරුෂයාගේ මේ දෙතිස් මහාපුරුෂ ලක්ෂණයන් බාහිර ඍෂීහුද දනිත්, එහෙත් ඔවුහු මේ කර්මය කළ හෙයින් මේ ලක්ෂණ ලබත්යයි නොදනිත්.

5. 'මහණෙනි, යම් හේතුවකින් තථාගතයන්වහන්සේ පෙර ජාතියෙහි පෙර භවයෙහි පෙර වාසයෙහි පෙර මනුෂ්‍යයෙක් වූයේ දශ කුශල ධර්මයන්හි දැඩිව සමාදන් වූයේ නිශ්චලවූ සමාදානය ඇත්තේ විය. කයින් කරන සුචරිතයෙහිද, වචනයෙන් කරන සුචරිතයෙහිද, සිතින් කරන සුචරිතයෙහිද, දන් බෙදා හදා දීමෙහිද, සීලසමාදානයෙහිද, පෙහෙවස් විසීමෙහිද මවට උපස්ථාන කිරීමෙහිද, පියාට උපස්ථාන කිරීමෙහිද, මහණුන්ට සත්කාර කිරීමෙහිද, පව් දුරු කළ බමුණන්ට සත්කාර කිරීමෙහිද, වැඩිහිටියන් පිදීමෙහිද, එක් එක් උසස් කුශල ධර්මයන්හි දැඩි සමාදාන ඇත්තේ නිශ්චල සමාදාන ඇත්තේ විය. හෙතෙම ඒ කර්මය කළ බැවින්, රැස් කළ බැවින්, බලවත්වූ බැවින්, මහත්වූ බැවින්, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙව් වරුන්ට

වඩා කරුණු දහයකින් වැඩි වෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද දිව්‍යමයවූ පාටෙන්ද දිව්‍යමයවූ සැපයෙන්ද, දිව්‍යමයවූ පිරිවරින්ද, දිව්‍යමයවූ අධිපති බවෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද, දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද, දිව්‍යමයවූ රසයෙන්ද, දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩි වෙයි.

**6.** "හෙතෙම ඒ දෙව් ලොවින් චුතව මිනිසත් බවට පැමිණියේ මේ මහපුරිස් ලකුණු ලබයි. භූමියෙහි සමව පිහිටන පා ඇත්තේ වෙයි. සමවූ පාදය භූමියෙහි තබයි. සමව නගයි. සම මුළු පාදතලයන්ගෙන් බිම ස්පර්ශ කෙරෙයි. හෙතෙම ඒ ලකුණින් යුක්තවූයේ ඉදින් ගිහිගෙයි වාසය කෙරේද හතර දිසාවට අධිපතිව දිනූ රටවල් ඇත්තේ ජනපදයන්හි ප්‍රධානයා වූයේ රත්න හතින් යුක්තවූ දැහැමිවූ ධර්මරාජන්වූ සක්විති රජ වෙයි.

"ඔහුට මේ රත්න හත පහල වෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස් රත්නය, මැණික් රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පරිනායක රත්නය යන මොවුහුය. ඔහුට පරසේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්. හෙතෙම සයුර හිම්කොට ඇති මේ පොළොව පර සතුරු කටු නැති කොට සියලු සැපතින් පිරීගිය, නිර්භය, අනතුරු රහිතව දඬුවම් රහිතව, ආයුධ රහිතව, ධාර්මිකව, සාමයෙන් දිනා වාසය කරයි. රජ වූයේ කුමක් ලබාද? මනුෂ්‍යවූ කිසි සතුරෙකු විසින් හෝ විරුද්ධ වූවකු විසින් හෝ නොසෙල්විය හැක්කේය. රජ වූයේ මෙය ලබයි.

**7.** "ඉදින් වනාහි ගිහිගෙන් නික්ම මහණ වේනම් ලොව කෙලෙස් නමැති වහල කැඩූ අර්හත් සම්‍යක් සම්බුදු වෙයි. බුදු වූයේ කුමක් ලබාද? ඇතුළත්හිවූ හෝ පිටත්හිවූ හෝ සතුරන් විසින් හෝ විරුද්ධවූවන් විසින් හෝ රාගයෙන් හෝ ද්වෙෂයෙන් හෝ මොහයෙන් හෝ මහණෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බඹෙකු විසින් හෝ ලොකයෙහි කිසිවෙකු විසිනුත් නොසෙල්විය හැක්කේ වෙයි. බුදු වූයේ මෙය ලබයි. මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙය මෙසේ කියනු ලැබේ.

"සත්‍ය කීමෙහිද, දශ කුශල ධර්මයෙහිද, ඉන්ද්‍රිය දමනයෙහිද, (කාය සොචෙය්‍යතාදී) තුන් ආකාර ඉතා පිරිසිදු සීලයම වාසස්ථාන කොට ඇති උපොසථ (පෙහෙවස්) සීලයන්හිද, දීමෙහිද, අවිහිංසාවෙහි හා කෝප නොවීමෙහිද, ඇලුනේ ඒ ධර්ම දැඩිව සමාදන්ව ගෙන සියලු ආකාරයෙන් හැසුරුනේය."

"හෙතෙම එම කුශල කර්මයෙන් දෙව් ලොවට පැමිණියේය. දිව්‍යමය සැපද, ක්‍රීඩා සැපද අනුභව කෙළේය. එයින් චුතව නැවත මෙහි පැමිණියේ සමවූ පාදයන්ගෙන් පෘථිවිය ස්පර්ශ කෙළේය."

"රැස්වූ ලක්ෂණ ප්‍රකාශ කරන්නාවූ නිමිති ශාස්ත්‍ර දන්නෝ 'සමවූ දෙපාවලින් බිම ස්පර්ශ කරන්නහුගේ සෙලවීමක් නැතැ'යි ප්‍රකාශ කළාහුය. තවද ගිහියෙකුගේ හෝ මහණෙකුගේ හෝ එම ලක්ෂණය එකී අදහස ප්‍රකාශ කරන්නේ වේ.'

"ගිහිගෙයි වසන්නේ එම කර්මයේ විපාකයෙන් අනුන් මැඩ පවත්නේ, සතුරන් මර්දනය කරන්නේ, මේ ලොකයෙහි මනුෂ්‍යවූ කිසිවකු විසිනුත් මැඩලිය නොහැකි වේ."

"ඉදින් ගිහිගෙය අත්හැර යාමට කැමැතිවූ ඒ ලක්ෂණයෙන් යුත් නැණවත් පුද්ගල තෙමේ මහණ වේද, අග්‍රවූ මනුෂ්‍යයින්ගෙන් ඉතා උසස්වූ හෙතෙම කිසි කලෙකත් යටත් බවකට නොපැමිණේ. මෙය වනාහි මේ ලක්ෂණයාගේ ධර්මතාවයි."

8. "මහණෙනි, යම් හේතුවකින් තථාගත තෙමේ පෙර ජාතියෙහි පෙර භවයෙහි පෙර වාසයෙහි පෙර මිනිසකු වූයේ බොහෝ දෙනාට සුව එළවන්නෙක් විය. රජ සොර සතුරු ආදීන්ගෙන් ඇතිවන බියද තැති ගැනීම් නම්වූ භයද දුරු කෙළේ දැහැමිවූ ආරක්ෂාව යොදා පිරිවර සහිතව දානය දුන්නේය. හෙතෙම ඒ කර්මය කළ බැවින් රැස් කළ බැවින් බලවත්වූ

බැවින් මහත්වූ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදී. ඔහු එතැනින් චුතව මිනිස් බවට පැමිණියේ මේ මහපුරිස් ලකුණ ලබයි. යට පාද තලයන්හි, දහසක් අරඇති නිව් වලලු සහිතවූ නැබ සහිත සියලු අයුරින් සම්පූර්ණවූ හොඳින් බෙදූ චක්‍රයෝ පහල වෙත්. ඒ ලකුණින් යුක්ත වූයේ මෙතෙමේ ඉදින් ගිහිගෙයි වසාද සක්විති රජ වෙයි. රජවූයේ කුමක් ලබාද? මහා පිරිවර ඇත්තේ වෙයි. බමුණු ගෘහපතියෝය, නියම් ගම් වැසියෝය, නැණැත්තෝය, මහමැතියෝය. අඞගරක්ෂකයෝය, (ශරීරය රැකසිටින භේවායෝය) දොරටු පාලයෝය, ඇමැතියෝය, මහත් පිරිවරය, (සෙසු ඇණවීම් කරන්නෝය) රජවරුය, අනුභව කරවන්නෝය, (භොජක) රජකුමරුවෝය යන මොවුහු වෙති. රජ වූයේ මෙය ලබයි.

"ඉදින් ගිහිගෙන් නික්ම මහණ වේද ලොකයෙහි කෙලෙස් නමැති වහල කැඩූ අර්හත්වූ සම්‍යක්සම්බුදු වෙයි. බුදුවූයේ කුමක් ලබාද? මහා පිරිවර ඇත්තේ වෙයි. භික්ෂුහුය, භික්ෂුණීහුය, උපාසකයෝය, උපාසිකාවෝය, දෙවියෝය, මිනිස්හුය, අසුරයෝය, නාගයෝය, ගාන්ධර්වයෝය යන මොවුහුය. බුදු වූයේ මෙය ලබයි. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙය මෙසේ කියනු ලැබේ.

"පෙර විසූ අතීත ජාතීන්හි මිනිස් වූයේ බොහෝ දෙනාට සුව ගෙනදෙන්නේ භය නමැති තැතිගැනීමද ලොමු දැහැගන්නාවූ භයද යන මෙකී බිය දුරුකරන්නේ මහජනයාගේ ආරක්ෂාව සැලසීමෙහි උත්සාහවන්ත වූයේය."

"හෙතෙම එම කුශල කර්මයෙන් දෙව් ලොවට පැමිණියේය. දිව්‍යමය සැපද ක්‍රීඩා සැපද අනුභව කෙළේය. එයින් චුතව නැවත මෙහි පැමිණියේ පාදෙකෙහි නිම්වළලු හා දහසක් දැති ඇති චක්‍ර ලබයි."

"රැස්වූ ලක්ෂණ පාඨකයෝ සියයක් පින් ලකුණු ඇති කුමරුවා දැක වටට නිම්වළලු ඇති චක්‍ර යම්සේද, එසේම

සතුරන් මඩනා පිරිවර ඇත්තෙක් වන්නේයයි ප්‍රකාශ කළාහුය."

"ඉදින් එබඳු තැනැත්තේ පැවිදි නොවන්නේ නම් (සක්විති රජකුගේ) අණසක පතුරුවයි. මුළු ලොකයට අනුශාසනා කරයි. මේ ලොකයෙහි ක්ෂත්‍රියයෝ ඔහු අනුගමනය කරන්නෝ වෙත්. මහා යසස් ඇති ඔහු පිරිවරා යෙත්."

"ඉදින් ගිහිගෙය අතහැර යාමට කැමැතිව නැණවත් එබඳු පුරුෂ තෙමේ මහණ වේද, ඉතා උතුම්වූ දෙව් මිනිසුන් විසින් පුදනලද මහා යසස් ඇති ඔහු දෙවියෝද, මනුෂ්‍යයෝද, අසුර සත්වයෝද, රාක්ෂයෝද, ගාන්ධර්වයෝද, පක්ෂීහුද, සිවුපාවෝද පිරිවරත්."

**9.** "මහණෙනි, යම් හේතුවකින් තථාගත තෙමේ පූර්ව ජාතියෙහි පූර්ව භවයෙහි පූර්ව වාසයෙහි පූර්වයෙහි මනුෂ්‍යයෙක්ව ප්‍රාණඝාතය හැර ප්‍රාණ ඝාතයෙන් වෙන් වූයේ විය. දඬුවම් නොකරන්නේ ආයුධ නොගන්නේය. පාපයෙහි ලජ්ජා ඇත්තේය. දයාවෙන් යුක්තය. සියලු සතුන් කෙරෙහි හිතානුකම්පීව වාසය කළේද? ඔහු ඒ කර්මය කළ බැවින් රැස් කළ බැවින් බලවත් බැවින් මහත්වූ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙව් වරුන්ට වඩා කරුණු දහයකින් වැඩිවෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද දිව්‍යමයවූ පාටෙන්ද දිව්‍යමයවූ සැපයෙන්ද දිව්‍යමයවූ පිරිවරින්ද දිව්‍යමයවූ අධිපතිත්වයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද දිව්‍යමයවූ රසයෙන්ද දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩිවෙයි. හෙතෙම එයින් චුතව මිනිස් බවට පැමිණියේ මේ තුන් මහා පුරිස් ලකුණු ලබයි. දික් විළුම් ඇත්තේ වෙයි. දික් ඇඟිලි ඇත්තේ වෙයි. බ්‍රහ්මයාගේ මෙන් ඍජු ශරීර ඇත්තේ වෙයි. හෙතෙම ඒ ලකුණුවලින් යුක්තවූයේ, ඉදින් ගිහිගෙයි වාසය කෙරේද, සක්විති රජවෙයි. ඔහුට මේ රත්න හත පහළ වෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය,

අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්, මෙතෙම සයුර හිම් කොට ඇති පෘථිවිය සියලු සැපතින් පිරීගිය, නිර්භයවූ, උවදුරු අනතුරු රහිතවූ සතුරන්ගෙන් වන අනතුරු රහිතවූවක් කොට දඬුවම් රහිතව, ආයුධ රහිතව ධර්මයෙන් සමදානයෙන් දිනා වාසය කරයි. රජවූයේ කුමක් ලබාද? දීර්ඝ ආයුෂ ඇත්තෙක් වෙයි. බොහෝ කලක් ජීවත්වන්නෙක් වෙයි බොහෝ කලක් ආයුෂ පාලනයකරයි. මනුෂ්‍යවූ කිසි සතුරෙකු විසින් හෝ විරුද්ධ කාරයකු විසින් හෝ කිසිවෙකු විසිනුදු අතරකදී ජීවිතය තොර කරන්නට නොහැක්කේ වෙයි. රජවූයේ මෙය ලබයි. ඉදින් ගිහි ගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳදමා අර්හත් සම්මාසම්බුදු වන්නේය. බුදු වූයේ කුමක් ලබාද? දීර්ඝ ආයුෂ ඇත්තෙක් වෙයි. බොහෝ කලක් ජීවත් වන්නෙක් වෙයි. දීර්ඝායුෂ පාලනය කරයි. සතුරන් විසින් හෝ විරුද්ධකාරයන් විසින් හෝ, මහණෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බඹෙකු විසින් හෝ ලොව කිසිවෙකු විසිනුදු අතරකදී ජීවිතය තොරකරන්නට නොහැක්කේ වෙයි. බුදුවූයේ මෙය ලබයි. මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙය මෙසේ කියනු ලැබේ.

"තමාගේ මරණ වධයෙන් ඇතිවන බිය තමා විසින්ම අවබොධ කොට ගෙන අනුන්ගේ ජීවිත විනාශ කිරීමෙන් වෙන්වූයේ විය. එම සුචරිත කර්ම විපාකයෙන් ස්වර්ගයට ගියේ කළ යහපත් කර්මවල ඵල විපාක අනුභව කෙළේය."

"එයින් චුතව මේ මිනිස් ලොවට පැමිණියේ දෙදන දක්වා දික්වූ අත් ඇති බවද, දිග ඇඟිලි ඇති බවද හොඳින් කෙලින් යහපත්සේ හටගත් බ්‍රහ්මයාගේ ශරීරය වැනි ශරීරයක් ඇති බවද යන මේ තුන් ලකුණු මෙහිදී ලබයි."

"තරුණවූ උසස්ලෙස පිහිටියාවූ හොඳින් හටගත් යහපත් අත් ඇති උන්වහන්සේගේ මෘදුවූ තරුණවූ ඇඟිලි

දීර්ඝ වෙත්. මේ තුන් මහපුරිස් ලකුණු කරණ කොට ගෙන කුමරුවා බොහෝ කල් ජීවත් වීමට සුදුසු බව කියත්.”

“ඉදින් ගිහියෙක් වේ නම් බොහෝ කලක් ජීවත් වේ. නො එසේව එයින් නික්ම පැවිදි වේ නම් අතිශයින්ම දීර්ඝ කාලයක් ජීවත් වේ. වශීප්‍රාප්තවූ (වසඟ කරගත් හිත් ඇති) ඍද්ධි භාවනාවෙන් ජීවත් වන්නේද වෙයි. මෙසේ දීර්ඝ ආයුෂ ඇති බවට ඒ නිමිත්තකි.”

**10.** “මහණෙනි, යම් හේතුවකින් තථාගත තෙමේ පෙර ජාතියෙහි, පෙර භවයෙහි, පෙර වාසයෙහි, පෙර මනුෂ්‍යයෙක් වූයේ මිහිරිවූ රසයෙන් යුක්තවූ කෑ යුතුවූ අනුභව කළයුතුවූ ලෙවිය යුතුවූ රස විඳිය යුතුවූ ආහාර පාන වර්ගයන් දෙන්නේ විය. හෙතෙම ඒ කර්මය කළ බැවින් රැස් කළ බැවින් බලවත් වූ බැවින් මහත්වූ ශරීරයාගේ බිඳී මෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙවිවරුන්ට වඩා කරුණු දහයකින් වැඩිවෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද දිව්‍යමයවූ පාටෙන්ද දිව්‍යමයවූ සැපයෙන්ද දිව්‍යමයවූ පිරිවරින්ද දිව්‍යමයවූ අධිපතිත්වයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද, දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද, දිව්‍යමයවූ රසයෙන්ද, දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩිවෙයි. හෙතෙමේ එයින් චුතව මිනිස් බවට පැමිණියේ මේ මහපුරිස් ලකුණ ලබයි. (සත්තුස්සදතා) සත් තැනෙක්හි පිරුණු මස් ඇත්තේ වෙයි. දෙඅත් පිරුණාහු වෙති. දෙපතුල් පිරුණාහු වෙති. දෙඋරහිස් පිරුණාහු වෙත්. කර පිරුණේ වෙයි. හෙතෙම ඒ ලකුණින් හෙබියේ ඉදින් ගිහිගෙයි වසාද සක්විති රජ වෙයි. ඔහුට මේ රත්න හත පහල වෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනි වූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්, හෙතෙම සයුර හිම්කොට ඇති මේ පෘථිවිය උවදුරු නැතිව, සියලු සැපතින් පිරීගිය, නිර්භය, අනතුරු රහිත, සතුරන්ගෙන් වන අනතුරු

රහිත කොට දඬුවම් රහිතව, ආයුධ රහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කරයි. රජවූයේ කුමක් ලබාද? මිහිරිවූ රසවත්වූ කෑයුතුවූ බුදියයුතුවූ රසවිඳිය යුතුවූ ලෙවිය යුතුවූ ආහාරපාන වර්ගයන් ලබන්නේ වෙයි, රජවූයේ මෙය ලබයි. ඉදින් ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳ දමා අර්හත් සම්මාසම්බුදු වන්නේය. බුදුවූයේ කුමක් ලබාද? මිහිරිවූ රසවත්වූ කෑයුතුවූ බුදියයුතුවූ රස විඳියයුතුවූ ලෙවිය යුතුවූ ආහාරපාන වර්ගයන් ලබන්නේ වෙයි. බුදුවූයේ මෙය ලබයි. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙය මෙසේ කියනු ලැබේ.

"කෑයුතුවූද බුදිය යුතුවූද නැවත ලෙවිය යුතුවූ හා රස විඳිගත යුතුවූද උතුම් අග්‍රරස දෙන්නක් විය. හෙතෙම ඒ සුචරිත කර්මයෙන් නන්දන වනයෙහි බොහෝ කාලයක් සතුටු වෙයි."

"මේ ලෝකයේදී සත්තුස්සද ලක්ෂණය (පිරුණු දෙ අතුල් දෙ පතුල් දෙඋරහිස හා ගෙල ඇති බව) ලබයි. ඔහුට මිහිරි කෑම බීම ලැබෙන බවට මේ ලකුණකැයි දක්ෂ නිමිති කියන්නෝ කීහ."

"ගිහියෙකුගේ වුවද මෙ ලක්ෂණය මිහිරි ආහාර පානලැබීම ප්‍රකාශ කරන්නේ වේ. උතුම්වූ කෑම බීම ලබන්නාවූ හෙතෙම සියලු බැඳුම් සිඳ පැවිද්ද ලබායයිද කීහ."

"මහණෙනි, යම් හේතුවකින් තථාගත තෙමේ පෙර ජාතියෙහි පෙර භවයෙහි, පෙර වාසයෙහි, පෙර මනුෂ්‍යයෙක් වූයේ දානයෙන් ප්‍රිය වචනයෙන්, අර්ථචර්‍ය්‍යායෙන් සමානාත්මතායෙන් යන මේ සංග්‍රහ කළයුතු කරුණු හතරෙන් ජනයන් සංග්‍රහ කරන්නෙක් විය. හෙතෙම ඒ කර්මය කළ බැවින්ද රැස් කළ බැවින්ද බලවත් බැවින්ද මහත් බැවින්ද ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙවිවරුන්ට වඩා කරුණු දහයකින් වැඩිවෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද

දිව්‍යමයවූ පාටෙන්ද දිව්‍යමයවූ සැපයෙන්ද දිව්‍යමයවූ පිරිවරින්ද දිව්‍යමයවූ අධි පතිත්වයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද, දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද, දිව්‍යමයවූ රසයෙන්ද, දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩිවෙයි. හෙතෙම එයින් චුතව මිනිස් බවට පැමිණියේ මේ දෙආකාර මහාපුරුෂ ලක්ෂණ ලබයි. මෘදුවූ තරුණවූ අතුල් පතුල් ඇත්තේ වෙයි සමවූ ඇඟිලි ඇති අත් පා ඇත්තේ වෙයි. හෙතෙම ඒ ලක්ෂණයන් ගෙන් යුක්තවූයේ ඉදින් ගිහිගෙයි වසාද සක්විති රජ වෙයි. ඔහුට මේ රත්න හත පහලවෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලියහැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්, හෙතෙම සයුර හිම්කොට ඇති මේ පෘථිවිය උවදුරු නැති, සියලු සැපතින් පිරීගිය, නිර්භය, අනතුරු රහිත සතුරන් රහිත කොට, දඬුවම් රහිතව, ආයුධරහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කරයි. රජවූයේ කුමක් ලබාද? හොඳින් සංග්‍රහ කරන්නාවූ ඥාතිජනයා ඇත්තේ වෙයි. බමුණු ගෘහපතියන් නියම් ගම් දනව් වැස්සන්, නැකැත්තන් (නැකැත් දන්නවුන්) මහමැතියන්, අංග රක්ෂකයන් (ශරීරය රැක සිටින භේවායන්) දොරටුපාලයන්, ඇමැතියන් පිරිවර ජනයින් (සෙසු අණ කරන්නන් රජවරුන්, අනුභව කරවන්නන් (භොජක) රජකුමරුවන් යන මොවුන් පිරිවර කොට ඇත්තේ වෙයි. රජවූයේ මෙය ලබයි. බුදුවූයේ කුමක් ලබාද? හොඳින් සේවය කරන ඥාති ජනයා ඇත්තේ වෙයි. භික්ෂූහුය, භික්ෂුණීහුය, උපාසකයෝය, උපාසිකාවෝය, දෙවියෝය, මනුෂ්‍යයෝය, අසුරයෝය, නාගයෝය, ගාන්ධර්වයෝය යන මොවුහු උන්වහන්සේට සේවක පිරිවර වෙති. බුදුවූයේ මෙය ලබයි. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙය මෙසේ කියනු ලැබේ.

"දානයද අර්ථචර්‍ය්‍යාවද ප්‍රිය වචනයද
සමානාත්මතාවද යන මෙහි හැසිර බොහෝ දෙනාට

පටුන



හොඳින් සේවය කොට අපවාද රහිතවූ ගුණයෙන් යුතුව ස්වර්ගයට යයි"

"ඉන් චුතව මෙම මිනිස් ලොවට පැමිණියේ ඉතා අලංකාරවූ සිත් අලවන්නාවූ දැකුම් කටයුතුවූ මුදුතරුණ අත්පා ඇති බවද සමානවූ ඇඟිලි ඇති අත් පා ඇති බවද ඉතා දැකුම් කටයුතුවූ මනොඥ බවද ඉතා සියුමැලිවූ ළදරුතෙම ලබයි."

"කටයුතු නොකටයුතු කැමති සේ පිළිවෙළ කරන්නාවූ කීකරු පිරිවර ජනයා ලබයි. හොඳින් සේවය කරන ලදුයේ මේ ලෝකයේ වසයි. ප්‍රිය වචන කියන්නේ හිත සැප සොයන්නේ කැමතිවූ ගුණයන්හි හැසිරෙ"යි.

"තවද සියලු කාම සැප අතහැර දමයි. සර්වඥවූ උන්වහන්සේ ජනයාට ධර්මකථා දෙශනා කරති. එය අසා අතිශයින් පැහැදුනු උන්වහන්සේගේ වචනයට අනුව පිළිපදින්නෝ ධර්මයට අනුව හැසිරෙන්නෝ වෙත්."

11. "මහණෙනි, යම් හේතුවකින් තථාගත තෙමේ පෙර ජාතියෙහි, පෙර භවයෙහි, පෙර වාසයෙහි, පෙර මනුෂ්‍යයෙක් වූයේ බොහෝ දෙනාට දෙලෝ වැඩ ඇසුරු කළාවූද දශ කුශල ධර්මයන් ඇසුරු කළාවූද වචන කියයිද, බොහෝ දෙනාට උපදෙස් සහිත කථා කියයිද, ධර්මදාන නැමැති යාගයෙන් සත්වයන්ට හිත සැප සලසන්නේ වීද, හෙතෙම ඒ කර්මය කළ බැවින්, රැස් කළ බැවින්, බලවත්වූ බැවින්, මහත්වූ බැවින්, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙව්වරුන්ට වඩා කරුණු දහයකින් වැඩි වෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද, දිව්‍යමයවූ පාටෙන්ද, දිව්‍යමයවූ සැපයෙන්ද, දිව්‍යමයවූ පිරිවරින්ද, දිව්‍යමයවූ අධිපතිභාවයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද, දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද දිව්‍යමයවූ රසයෙන්ද, දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩිවෙයි. හෙතෙම එතැනින් චුතව මිනිස් බවට පැමිණියේ මේ දෙආකාර මහා පුරිස් ලකුණු ලබයි. පිරුණු ගොප් මස ඇති පාද ඇති බව

හා උඩුකුරු අක් ඇති රෝම බවද වෙයි. ඔහු ඒ දෙලකුණින් යුක්තවූයේ ඉඳින් ගිහි ගෙයි වාසය කෙරේද, සක්විති රජ වෙයි ඔහුට මේ රත්න හත පහළවෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනි පුත්‍ර රත්නය. යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලියහැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්, හෙතෙම සයුර හිම් කොට ඇති මේ පෘථිවිය උවදුරු නැති, සියලු සැපතින් පිරීගිය, නිර්භය, අනතුරු රහිත, උවදුරු රහිත කොට, දඬුවම් රහිතව, ආයුධ රහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කෙරෙයි. රජවූයේ කුමක් ලබාද? අග්‍ර වෙයි, ශ්‍රෙෂ්ඨ වෙයි, ප්‍රධාන වෙයි, උතුම් වෙයි, කාමසැප විඳින්නන්ට අතිශයින්ම උත්තම වෙයි. රජ වූයේ මෙය ලබයි. ඉඳින් ගිහි ගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳ දමා අර්හත් සම්මාසම්බුදු වන්නේය. බුදුවූයේ කුමක් ලබාද? අග්‍ර වෙයි, ශ්‍රෙෂ්ඨ වෙයි, ප්‍රමුඛ වෙයි, උතුම් වෙයි. සියලු සත්ත්වයන්ට අතිශයින්ම උතුම් වෙයි, බුදුවූයේ මෙය ලබයි. මෙකරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙය මෙසේ කියනු ලැබේ.

"පෙර අර්ථ ධර්ම යුක්තවූ වචන බෙහෙවින් බොහෝ දෙනාට හිත සුව පිණිස දැක්වීය. ප්‍රාණීන්ට හිත සුව එලවන්නේ විය. නොමසුරුවූයේ ධර්මදාන නම්වූ යාගය කෙළේය."

"හෙතෙම එම සුචරිත කර්මයෙන් සුගතියට යයි. එහි සතුටුවෙයි. මේ මිනිස් ලොවට පැමිණියේ උස්සංඛපාදතා (පිරුණු ගොප් මස ඇති පාද ඇති බව) උද්ධග්ගලොමතා (උඩුකුරු අග් ඇති රෝම ඇති බව) යන මේ ලක්ෂණ දෙක උත්තම බැවින් හා ප්‍රමුඛ බැවින් ලබයි."

"සම්පූර්ණයෙන් (අගින්) උඩට නැමී ගිය ලොම ඇත්තේ පතුල්වලින් උඩ අලඞ්කාර කරන්නාවූ මස් ලේවලින් පිරුණාවූ සිවියෙන් වැඩී ගියාවූ හොඳින් පිහිටි ගොප් ඇට වූහ."

"ඉදින් එබඳු තැනැත්තේ ගිහිගෙයි වසන්නේ නම් කාමභොගීන් අතුරෙන් අග්‍රස්ථානයට පැමිණෙන ඔහුට වඩා උතුම් කෙනෙක් ඇති නොවේ. දඹදිව මැඩපවත්වා වාසය කරයි."

"උත්තමවූ පැවිදි බවට පැමිණියේ සියලු සත්වයන් අතුරෙන් අග්‍රස්ථානයට පැමිණේ. ඔහුට වඩා උසස් කෙනෙක් ඇති නොවේ. සියලු ලොකය මැඩ වාසය කරයි."

12. "මහණෙනි, යම් හේතුවකින් තථාගත තෙමේ පෙර ජාතියෙහි, පෙර භවයෙහි, පෙර වාසයෙහි, පෙර මනුෂ්‍යයෙක්වූයේ ශිල්ප හෝ, විද්‍යා හෝ, පන්සිල් දසසිල් ආදී සීල හෝ, (කර්මය ස්වකීය කොට ඇති ප්‍රඥාව) හෝ මොව්හු කෙසේ නම් වහා දැන ගන්නාහුද? මොව්හු කෙසේ නම් වහා පිළිපදින්නාහුද? බොහෝ කලක් විඩාවට නොපැමිණෙන්නාහුදැයි හොඳින් ඉගැන්වූයේ වේද, ඔහු ඒ කර්මය කළ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි, හෙතෙම එහි අන්‍ය දෙව්වරුන්ට වඩා කරුණු දහයකින් වැඩිවෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද දිව්‍යමයවූ පාටෙන්ද දිව්‍යමයවූ සැපයෙන්ද දිව්‍යමයවූ පිරිවරින්ද දිව්‍යමයවූ අධිපතිභාවයෙන්ද දිව්‍යමයවූ රූපයෙන්ද දිව්‍යමයවූ ශබ්දයෙන්ද දිව්‍යමයවූ ගන්ධයෙන්ද දිව්‍යමයවූ රසයෙන්ද දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩිවෙයි. හෙතෙම එතැනින් චුතවූයේ මිනිස් බවට පැමිණ මේ මහා පුරිස් ලකුණ ලබයි. (ඕලු) එණි මුවන්ගේ පාබඳු කෙන්ඩා ඇත්තේ වෙයි. ඔහු ඒ ලකුණින් යුක්ත වූයේ, ඉදින් ගිහි ගෙයි වාසය කෙරේද, සක්විති රජ වෙයි ඔහුට මේ රත්න හත පහළවෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්, හෙතෙම සයුර හිම්කොට ඇති මේ පෘථිවිය සොරුන් නැතිවූ, සඵලවූ සියලු සැපතින් පිරීගිය, නිර්භය,

අනතුරු රහිතවූ උවදුරු රහිත වූවක් කොට, දඬුවම් රහිතව, ආයුධ රහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කෙරෙයි. රජ වූයේ කුමක් ලබාද? රජහට සුදුසුවූ, ඇත්, අස් ආදීහුද රාජසේවකයෝද, රජුගේ කෑම් බීම් හා පාවිච්චියට ගන්නා වස්තූහුද, රජෙකුට සුදුසුවූ යම් දෙයක් වේද ඒ සියල්ල වහා ලබයි. රජවූයේ මෙය ලබයි. බුදුවූයේ කුමක් ලබයිද? ශ්‍රමණයන්ට සුදුසුවූ සිවුරු ආදියද සිව්පිරිසද, ශ්‍රමණයන්ගේ පාවිච්චියට ගන්නා පිරිකර වෙත්ද, ශ්‍රමණයන්ට සුදුසුවූ යම් ඒදේ වෙත්ද, ඒ සියල්ල වහා ලබයි. බුදුවූයේ මෙය ලබයි. මෙකරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙය මෙසේ කියනු ලැබේ.

"ශිල්පයන්හිද, විද්‍යාවන්හිද, සීලයන්හිද කර්මයන්හිද, ඉක්මනින් කෙසේ දැන ගන්නාහු දැයි (ශිෂ්‍යයන් කෙරෙහි අනුකම්පාවෙන්) ඉගැන්වීමට කැමැතිවෙයි. යම් කිසිවෙකුට වෙහෙස නොවන පරිදි, බොහෝ කල් ගත නොකරනසේ ඉක්මණින් (ශිල්ප විද්‍යාදිය) කියවීද."

"සැප ගෙන දෙන එම කුශලකර්මය හෙතු කොට හොඳින් පිහිටි වටවූ මනා සේ හටගත් පිළිවෙලින් උඩට නැගුනු අග් ඇති උඩට නැමීගිය රෝම ඇති සියුම් සමින් වැසුනු මනොඥවූ ජංඝා (කෙණ්ඩා) ලබයි."

"එබඳු ලක්ෂණ ඇති පුද්ගලයාට (එණි මුවෙකුට බඳු කෙණ්ඩා ඇති බැවින්) එණෙය්‍ය ජංඝයයි කීහ. මේ ලෝකයෙහි ශීඝ්‍රව ලැබෙන සැපතින් යුක්ත වෙයි. ඉදින් ගිහිගෙයට සුදුසු සැප යම් කලෙක බලාපොරොත්තු වේද? මහණ නුවූ කල මෙලෙව්හිදීම වහා එය ලබයි."

"ඉදින් ගිහිගෙය අත්හැර යාමට කැමැත්තාවූ එබඳු නැණවත් තෙමේ, යම් කලෙක සුදුසුවූ මහණකමට පැමිණේද ඔහුට යොග්‍යවූ ඒ සැප වහා ලබයි."

13 "මහණෙනි, යම් හේතුවකින් තථාගත තෙමේ පෙර ජාතියෙහි, පෙර භාවයෙහි, පෙර වාසයෙහි, පෙර මනුෂ්‍යයෙක් වූයේ මහණෙකු හෝ බමුණෙකු හෝ වෙත පැමිණ, 'ස්වාමීනි,

කුසලය කුමක්ද? අකුසලය කුමක්ද? වරද කුමක්ද? නිවරද කුමක්ද? සේවනය කළයුත්ත කුමක්ද? සේවනය නොකළ යුත්ත කුමක්ද? මා විසින් කුමක් කරනු ලැබීමෙන් දීර්ඝකාලයක් අහිත පිණිස, දුක පිණිස වන්නේද? මා විසින් කුමක් කරනු ලැබීමෙන් දීර්ඝකාලයක් හිත පිණිස සැප පිණිස වන්නේදැයි අසන ලද්දේ වීද? හෙතෙම ඒ කර්මය කළ බැවින් රැස් කළ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙව්වරුන්ට වඩා කරුණු දහයකින් වැඩිවෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද, දිව්‍යමයවූ පාටෙන්ද, දිව්‍යමයවූ සැපයෙන්ද, දිව්‍යමයවූ පිරිවරින්ද, අධිපතිභාවයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද, දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද, දිව්‍යමයවූ රසයෙන්ද, දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩිවෙයි.

එතැනින් චුතව මිනිස් බවට පැමිණියේ මේ මහපුරිස් ලකුණ ලබයි. සියුම් සිවි ඇත්තේ වෙයි. සියුම්වූ සිවිය ඇති බැවින් දූවිලි ආදිය ශරීරයෙහි නොඅල්ලයි. හෙතෙම ඒ ලකුණින් යුක්තවූයේ ඉදින් ගිහිගෙයි වසාද සක්විති රජ වෙයි. ඔහුට මේ රත්න හත පහළවෙත්. චක්‍රරත්නය, ඇත් රත්නය, අශ්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්. හෙතෙම සයුර හිම්කොට ඇති මේ පෘථිවිය සොරුන් නැති, සඵලවූ සියලු සැපතින් පිරීගිය, නිර්භය, අනතුරු රහිත, උවදුරු රහිත කොට ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කෙරෙයි. රජ වූයේ කුමක් ලබාද? මහානුවණ ඇත්තේ වෙයි. ඔහුට නුවණින් සමවූවෙක් හෝ කාම සැප විඳින්නන් අතුරෙන් ශ්‍රෙෂ්ඨවූ කිසිවෙකුදු නොවේ. රජ වූයේ මෙය ලබයි. ඉදින් ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳදමා අර්හත් සම්මා සම්බුදු වන්නේය. බුදු වූයේ කුමක් ලබාද? මහාප්‍රඥාව ඇත්තේ වේ. නොයෙක් දෙයෙහි පැතිර පවත්නා පුළුල් නුවණ ඇත්තේද වේ. සතුට බහුලව මාර්ගඵල අවබොධ කළ නුවණ ඇත්තේද වේ. (ස්කන්ධාදියෙහි) යුහුව දුවන නුවණ

ඇත්තේද වේ තියුණු නුවණ ඇත්තේද වේ. විනිවිද යන නුවණ ඇත්තේද වේ. උන්වහන්සේට නුවණින් සමවූවෙක් හෝ ශ්‍රේෂ්ඨවූවෙක් හෝ සියලු සත්වයන් අතුරෙහි නැත්තේය. බුදුවූයේ මෙය ලබයි. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙසේ කියනු ලැබේ.

"පෙර විසූ අතීත ජාතීන්හි මහණුන් වෙත පැමිණ කන් යොමුකොට යහපත මේය අයහපත මේයයි දැනගනු කැමැත්තේ අසන්නෙක්ව සොයන්නෙක්ව අර්ථ සහිත කථාව පරීක්ෂා කොට බැලීය."

"නුවණ ලැබීමට සුදුසුවූ මෙම කර්මයෙන් මිනිස් බව ලදුයේ සියුම් සිවි ඇති බව නම් වූ සුඛුමච්ඡවිතාව ලැබීය. උත්පත්ති කාලය පිළිබඳ වූද ශරීර ලක්ෂණ පිළිබඳ වූද ඵලාපල කීමෙහි දක්ෂයෝ (මේ තෙමේ) සියුම් අදහස් අවබොධ කොට ගෙන දකින්නේ යයි පැවසූහ."

"ඉදින් එබඳු තැනැත්තේ මහණ නොවන්නේ නම් (සක්විති රජෙකුට අයිති) අණ පතුරුවයි. මුළු ලොකයට අනුශාසනා කරයි. අර්ථානර්ථ දැනගැනීමේ ඥානයෙහිද වඩා ශ්‍රෙෂ්ඨ කෙනෙක් හෝ ඔහු හා සමාන කෙනෙක් හෝ නොවෙයි."

"ඉදින් ගිහිගෙය අතහැර යනු කැමැත්තාවූ එබඳු නැණවත් තෙමේ යම් කලෙක මහණකමට පැමිණේද, ඉතා උතුම්වූ විශෙෂ ප්‍රඥාවද ලබයි. උතුම්වූ ශ්‍රෙෂ්ඨ ප්‍රඥා ඇති හෙතෙම සම්‍යක් සම්බොධියට පැමිණේ."

14. "මහණෙනි, යම් හේතුවකින් තථාගත තෙමේ පෙර ජාතියෙහි, පෙර භවයෙහි, පෙර වාසයෙහි, පෙර මනුෂ්‍යයෙක් වූයේ ක්‍රොධ නොකරන්නෙක් විය. ක්‍රෝධය බහුල කොට නැත්තෙක් විය. බොහෝ කොට බැන්නේද වක්වූ කටුවක් මෙන් ඇමිණී නොගියේය. නොකිපුණේය. ව්‍යාපාද නොකෙළේය. වෛර නොකෙළේය. කෝපයද, දොෂයද, දොම්නසද තුන් දොරින් ප්‍රකට නොකෙළේය. සියුම්වූ මොලොක්වූ ඇතිරිලිද, බිම එලන සියුම් කොමු රෙදිද, සියුම් කපු රෙදිද, සියුම්වූ

කොසෙය්‍යය ඇඳුම්ද සියුම්වූ කම්බලද දෙන ලද්දේය. හෙතෙම ඒ කර්මය කළ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙව්වරුන්ට වඩා කරුණු දහයකින් වැඩිවෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද, දිව්‍යමයවූ පාටෙන්ද, දිව්‍යමයවූ සැපයෙන්ද, දිව්‍යමයවූ පිරිවරින්ද, දිව්‍යමයවූ අධිපතිභාවයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද, දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද, දිව්‍යමයවූ රසයෙන්ද, දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩි වෙයි.

"හෙතෙම එතැනින් චුතව මිනිස්බවට පැමිණියේ මේ මහ පුරිස් ලකුණ ලබයි. රන්වන්වූ රන් හා සමානවූ සම ඇත්තේ වෙයි. ඒ ලකුණින් යුක්තවූ හෙතෙම ඉදින් ගිහිගෙයි වාසය කෙරේද? සක්විති රජ වෙයි.

"ඔහුට මේ රත්න හත පහළ වෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්. හෙතෙම සයුර හිම් කොට ඇති මේ පෘථිවිය සොරුන් නැති, සඵලවූ සියලු සැපතින් පිරීගිය, නිර්භය, අනතුරු රහිත, උවදුරු රහිත කොට දඬුවම් රහිතව, ආයුධ රහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කරයි.

"රජ වූයේ කුමක් ලබාද? සියුම්වූ මෘදුවූ ඇතිරිලිද, පොරෝනාද සියුම් කොමු රෙදිද සියුම් කපු රෙදිද සියුම්වූ කොසෙය්‍ය ඇඳුම්ද, සියුම්වූ කම්බලද ලබන්නේ වේ. රජ වූයේ මෙය ලබයි.

"ඉදින් ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳ දමා අර්හත් සම්මා සම්බුදු වන්නේය.

බුදුවූයේ කුමක් ලබාද? සියුම්වූ මෘදුවූ ඇතිරිලිද සියුම් කොමු රෙදිද සියුම්වූ කපු රෙදිද සියුම්වූ කොසෙය්‍ය වස්ත්‍රද, සියුම්වූ

කම්බලද ලබන්නේ වේ. බුදුවූයේ මෙය ලබයි. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙසේ කියනු ලැබේ.

"අක්‍රොධය (මෛත්‍රිය) අධිෂ්ඨාන කෙළේය. යහපත් ස්පර්ශය ඇති සියුම් වස්ත්‍රද දන් දුන්නේය. ඉතා පෙර භවයන්හි සිටියේ යහපත් ස්පර්ශය ඇති සියුම් වස්ත්‍රද දන් දුන්නේය. ඉතා පෙර භවයන්හි සිටියේ මහා පෘථිවියට වසින්නාවූ මහා වැස්සක් මෙන් එකී (දාන වස්තූන්) දන් දුන්නේය."

"ඒ යහපත් කර්මය කොට මෙලොවින් චුතව දෙව් ලොව ඉපද යහපත් ලෙස කර්මයන්ගේ ඵලවිපාක විඳ මේ ලොකයෙහි රන්වන් ශරීරයෙන් යුක්ත වූයේ දෙවියන් අතර අතිශයින් ශ්‍රෙෂ්ඨවූ ශක්‍රයා මෙන් (රූපකායෙන්) සියල්ලන් යටත් කෙරේ."

"මහණවනු නොකැමැති ඒ මනුෂ්‍ය තෙමේ ගිහිගෙයි වසයිද, මහාපොළොව හොඳින් අනුශාසනා කරයි හෙතෙම රත්න හතද නිර්මලවූ පිරිසිදු සිවියක්ද ලබයි."

"ඉදින් ගිහිගෙන් නික්ම මහණවන්නේ නම් හඳිනා ඇඳුම් හා උතුම් පොරෝනා (සිවුරු ආදිය) යන මේ දේ ලබන්නෙක් වේ. හෙතෙම පෙර කළ කර්මයාගේ විපාකය විඳීම කෙරේද, ඒ කළ කර්මයන්ගේ ඵලය විනාශ නොවේ."

15 "මහණෙනි, යම් හේතුවකින් තථාගත තෙමේ පෙර ජාතියෙහි පෙර භවයෙහි පෙර වාසයෙහි පෙර මනුෂ්‍යයෙක් වූයේ බොහෝ කාලයක් වෙන්ව සිටියාවූ අන් රටෙහි විසුවාවූ නෑ මිතුරු සුහද යහළු යන මොවුන් එකතැන් කරන්නෙක් වූයේය. මවද පුතා සමග සම්මුඛ කරන්නෙක් වූයේය. පුතාද මව සමග එකතැන් කරන්නෙක් වූයේය. පියාද පුතා සමග එකතැන් කරන්නෙක් වූයේය. පුතාද පියා සමග එකතැන් කරන්නෙක් වූයේය. සහෝදරයා සහෝදරයා සමග එකතැන් කරන්නෙක් වූයේය. සහෝදරයාද සහෝදරිය සමග එකතැන් කරන්නෙක් වූයේය. සහෝදරියද සහෝදරයා සමග එකතැන්

කරන්නෙක් වූයේය. සමගි කොටද විශෙෂයෙන් සතුටු වූයෙක්ද වූයේය. ඔහු ඒ කර්මය කළ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙවිවරුන්ට වඩා කරුණු දහයකින් වැඩිවෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද දිව්‍යමයවූ පාටෙන්ද දිව්‍යමයවූ සැපයෙන්ද දිව්‍යමයවූ පිරිවරින්ද දිව්‍යමයවූ අධිපතිභාවයෙන්ද දිව්‍යමයවූ රූපයෙන්ද දිව්‍යමයවූ ශබ්දයෙන්ද දිව්‍යමයවූ ගන්ධයෙන්ද දිව්‍යමයවූ රසයෙන්ද දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩිවෙයි.

ඔහු එතැනින් චුතව මිනිස් බවට පැමිණියේ මේ මහා පුරිස් ලකුණ ලබයි. කොසොහිත වත්ථගුය්හ (කොෂයෙන් වැසුන පුරුෂ නිමිත්ත) ඇත්තේ වෙයි. හෙතෙම ඒ ලකුණින් යුක්ත වූයේ, ඉදින් ගිහිගෙයි වාසය කෙරේද? සක්විති රජ වෙයි.

ඔහුට මේ රත්න හත පහළ වෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්, හෙතෙම සයුර හිම් කොට ඇති මේ පෘථිවිය සොරුන් නැති, සඵලවූ සියලු සැපතින් පිරීගිය, නිර්භය, අනතුරු රහිත, උවදුරු රහිතකොට, දඬුවම් රහිතව, ආයුධ රහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කෙරෙයි.

"රජවූයේ කුමක් ලබාද? බොහෝ පුත්‍රයන් ඇත්තේ වෙයි. ඔහුට සූරවූ, වීරවූ, පර සෙනඟ මර්දනය කරන්නාවූ දහසකට අධිකවූ පුත්‍රයෝ වෙත්. රජ වූයේ මෙය ලබයි."

"ඉදින් ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳදමා අර්හත් සම්මා සම්බුදු වන්නේය."

"බුදු වූයේ කුමක් ලබයිද, බොහෝ ශ්‍රාවක පුතුන් ඇත්තෙක් වෙයි. උන්වහන්සේට සූරවූ වීරවූ පරසෙනඟ මර්දනය කරන්නාවූ නොයෙක් දහස් ගණන් පුත්‍රයෝ වෙත්. බුදුවූයේ මෙය ලබයි.

මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙසේ කියනු ලැබේ

"පෙර විසූ අතීතජාතීන්හි බැහැර සිටීමෙහි බොහෝ කල්වූ අතිදීර්ඝ කාලයක් වෙන්ව සිටියාවූ නෑ සුහද මිතුරන් සමගි කෙළේය. සමගිකොට ඒ අනුව සතුටු වූයේය."

"හෙතෙම එම කුශල කර්මයෙන් දෙව්ලොවට පැමිණියේය. දිව්‍යමය සැපද ක්‍රීඩා සැපද වින්දේය. එයින් චුතව නැවත මෙහි පැමිණියේ වස්ත්‍රයෙන් ආවරණය කළ යුතු කොසොහිත වත්ථගුය්හතා ලක්ෂණය ලබයි."

"එබඳු වූයේ දියුණුවූ පුත්‍රයන් ඇත්තේ වේ. සූරවූ වීර ස්වභාව ඇති ප්‍රිය වචන කියන ප්‍රීතිය උපදවන දහසකටද වඩා පුත්‍රයෝ ගිහිව සිටින ඔහුට වෙති"

"මහණව හැසිරෙන්නහුට වචනයට (විනය ධර්මයට) අනුව හැසිරෙන බොහෝවූ ශ්‍රාවක පුත්‍රයෝ වෙත්. තවද ගිහියෙකුට හෝ පැවිද්දෙකුට එම ලකුණ වේ නම් එය අකී අර්ථය ප්‍රකාශ කරන්නේ වේ."

**පළමුවෙනි බණවර නිමි.**

**16.** "මහණෙනි, යම් හේතුවකින් තථාගතයන් වහන්සේ පෙර ජාතියෙහි, පෙර භවයෙහි, පෙර මනුෂ්‍යයෙක් වූයේ මහජන සංග්‍රහය සමකර බලන්නේ, සමකර දනියි, තෙමේම පුද්ගලයා දනියි, පුද්ගල විශෙෂය දනියි. මොහුට මෙය සුදුසුයි, මොහුට මෙය සුදුසුයයි, පෙර ඒ ඒ තන්හි පුරිස විශෙෂය සලකන්නෙක් වූයේය. ඔහු ඒ කර්මය කළ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙවිවරුන්ට වඩා කරුණු දහයකින් වැඩිවෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද, දිව්‍යමයවූ පාටෙන්ද, දිව්‍යමයවූ සැපයෙන්ද, දිව්‍යමයවූ පිරිවරින්ද, දිව්‍යමයවූ අධිපතිභාවයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද, දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද, දිව්‍යමයවූ රසයෙන්ද, දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩිවෙයි.

"හෙතෙම එතැනින් චුතව මිනිස් බවට පැමිණියේ, මේ දෙයාකාරවූ මහාපුරුෂ ලක්ෂණ ලබයි. නුගගසක් මෙන් උසට සරි මහතත් මහතට සරි උසත් ඇත්තේද වෙයි. කෙළින් සිටියේම නොනැමී දෙ අත්තලවලින් දන පිරිමසීද, පිරිමදීද, හේ ඒ දෙලකුණින් යුක්ත වූයේ ඉදින් ගිහිගෙයි වසාද සක්විති රජ වෙයි.

"ඔහුට මේ රත්න හත පහළ වෙත්. (ඒ කවරේද) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලියහැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්. හෙතෙම සයුර හිම් කොට ඇති මේ පෘථිවිය සොරුන් නැති, සඵලවූ සියලු සැපතින් පිරීගිය, නිර්භයවූ, අනතුරු රහිතවූ උවදුරු රහිත වූවක් කොට, දඬුවම් රහිතව, ආයුධ රහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කරයි.

"රජ වූයේ කුමක් ලබාද? ධනවත් වූයේ, මහධන ඇත්තේ මහත් භොග ඇත්තේ, බොහෝ රන් රිදී ඇත්තේ, බොහෝ ධනය පිළිබඳ දේ ඇත්තේ, බොහෝ ධන ධාන්‍ය ඇත්තේ, සම්පූර්ණවූ අටු කොටු ඇත්තේ වෙයි. රජ වූයේ මෙය ලබයි.

"ඉදින් ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳ දමා අර්හත් සම්මා සම්බුදු වන්නේය."

"බුදුවූයේ කුමක් ලබාද? ධනවත් වූයේ මහ ධන ඇත්තේ, මහත් භොග ඇත්තේ වෙයි. උන්වහන්සේට මේ ධනයෝ වෙත්. ඒ කවරහුද? ශ්‍රද්ධා ධනය, ශීලධනය, හිරිධනය (පවට ලජ්ජාව,) ඔත්තප්ප (පවට භය) ධනය, සුත (බොහෝ දේ දත් බව) ධනය, චාග (ත්‍යාග) ධනය, ප්‍රඥා ධනය (යන මොවුහුය) බුදුවූයේ මෙය ලබයි. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙසේ කියනු ලැබේ.

"සමකොට, පරීක්ෂාකොට හිතා ඒ ඒ තැනදී මොහුට
මේ දානය සුදුසුය. මේ සංග්‍රහය සුදුසුයයි මහජනයා

පරීක්ෂාකොට සංග්‍රහ කරන්නේ පෙර ඒ ඒ දානාදියට සුදුසු විශෙෂ පුරුෂයන් දැන සංග්‍රහ කරන්නෙක් විය."

"අතීතයෙහි ඉතුරුවූ සුචරිත කර්ම විපාකයෙන් පොළොවෙහි කෙලින් සිටියේ නොනැමී දෙ අතින් දනහිස් ස්පර්ශ කරයි. නුගරුකක් මෙන් පිරිමඬුලු (උසට සරිවූ මහත මහතට සරිවූ උස) ඇත්තේද විය."

"නොයෙක් නිමිති ලකුණු දත් සියුම් නුවණැති මනුෂ්‍යයෝ මේ ළදරු කුමාරතෙම නොයෙක් ආකාරවූ ගිහියන්ට සුදුසු වස්තුව ලබායයි ප්‍රකාශ කළාහුය."

"මේ ලෝකයෙහි පොළොවට අධිපතිවූ කාමභොගී ගිහියන්ට සුදුසුවූ වස්තූහු බොහෝ ඇති වෙත්. ඉදින් සියලු කාම සැප හැරදමන්නේ නම් ඉතා උතුම්වූ ශ්‍රේෂ්ඨ අග්‍ර ධනය ලබයි."

17. "මහණෙනි, යම් හේතුවකින් තථාගතයන්වහන්සේ පෙර ජාතියෙහි පෙර භවයෙහි, පෙර වාසයෙහි පෙර මනුෂ්‍යයෙක් වූයේ බොහෝ ජනයාගේ අර්ථය කැමැති විය. යහපත කැමැති විය, සැප කැමැති විය, සසරින් මිදීම කැමැති විය. මොව්හු කෙසේ නම් ශ්‍රද්ධාවෙන් දියුණු වන්නාහුද? ශීලයෙන් දියුණු වන්නාහුද, අසා දැනගැනීමෙන් දියුණු වන්නාහුද, ත්‍යාගයෙන් දියුණු වන්නාහුද, ධර්මයෙන් දියුණු වන්නාහුද, ප්‍රඥාවෙන් දියුණුවන්නාහුද, ධනධාන්‍යයෙන් දියුණුවන්නාහුද, කෙත් වතුවලින් දියුණු වන්නාහුද, දෙපා සිවුපා සතුන්ගෙන් දියුණු වන්නාහුද, අඹුදරුවන්ගෙන් දියුණු වන්නාහුද, දැසි දස් කම්කරුවන්ගෙන් දියුණු වන්නාහුද, නෑයන්ගෙන් දියුණු වන්නාහුද, මිත්‍රයන්ගෙන් දියුණු වන්නාහුද, කිට්ටු නෑයින්ගෙන් දියුණුවන්නාහුද යනුයි. හේ ඒ කර්මය කළ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙව්වරුන්ට වඩා කරුණු දහයකින් වැඩිවෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද, දිව්‍යමයවූ පාටෙන්ද, දිව්‍යමයවූ සැපයෙන්ද, දිව්‍යමයවූ පිරිවරින්ද, දිව්‍යමයවූ අධිපතිභාවයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද, දිව්‍යමයවූ ශබ්දයෙන්ද,

දිව්‍යමයවූ ගන්ධයෙන්ද, දිව්‍යමයවූ රසයෙන්ද, දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩි වෙයි.

හෙතෙමෙ එතැනින් චුතව මෙහි පැමිණියේ, මේ තුන් මහා පුරිස් ලකුණු ලබයි. සිංහයෙකුගේ ඉදිරි කොටස බඳු ශරීරය ඇත්තේ වෙයි. දෙපැත්ත මැද පිරීගිය පිට ඇත්තේ වෙයි. සමව වටවූ කර ඇත්තේ වෙයි. හෙතෙම ඒ ලකුණින් යුක්ත වූයේ ඉදින් ගිහිගෙයි වසාද සක්විති රජ වෙයි.

ඔහුට මේ රත්න හත පහළ වෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය, ඔහුට පර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්. හෙතෙම සයුර හිම් කොට ඇති මේ පෘථිවිය සොරුන් නැතිවූ සඵලවූ සියලු සැපතින් පිරීගිය, නිර්භයවූ, අනතුරු රහිතවූ, උවදුරු රහිත වූවක් කොට, දඬුවම් රහිතව, ආයුධ රහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කරයි.

රජ වූයේ කුමක් ලබාද? නොපිරිහෙන ස්වභාවය ඇත්තේ වෙයි. ධන ධාන්‍යයෙන් කෙත් වතුවලින් දෙපා සිවුපා සතුන්ගෙන් අඹුදරුවන්ගෙන්, දැසිදස් කම්කරුවන්ගෙන් ඥාතීන්ගෙන් මිතුරන්ගෙන් කිට්ටු ඥාතීන්ගෙන් නොපිරිහෙයි. සියලු සැපතින් නොපිරිහෙයි. රජවූයේ මෙය ලබයි.

ඉදින් ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳදමා අර්හත් සම්මා සම්බුදු වන්නේය.

බුදු වූයේ කුමක් ලබාද? නොපිරිහෙන ස්වභාව ඇත්තේ වේ. ශ්‍රද්ධාවෙන්, ශීලයෙන්, (ශ්‍රැත) බොහෝ දේ දැනගැනීමෙන්, ප්‍රඥාවෙන් නොපිරිහෙයි සියලු සැපතින් නොපිරිහෙයි. බුදු වූයේ මෙය ලබයි. මෙ කරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙසේ කියනු ලැබේ.

"ශ්‍රද්ධාවෙන්ද, ශීලයෙන්ද, බොහෝ දේ දැනගැනීමෙන්ද, ප්‍රඥාවෙන්ද, ත්‍යාගයෙන්ද, බොහෝවූ

සත් පුරුෂ ධර්මයන්ගෙන්ද, ධන ධාන්‍යයන්ගෙන්ද, කෙත්වත්වලින්ද, පුත්‍ර දාරාවන්ගෙන්ද, සිවුපාවුන්ගෙන්ද, නෑ මිතුරන්ගෙන්ද, කිට්ටු නෑයින්ගෙන්ද, බලයෙන්ද, වර්ණය, සැපය යන මේ දෙකෙන්ද, අනුන් කෙසේ නොපිරිහෙලම් දැයි කැමැතිවෙයි. මේ සම්පත්වලින් මිනිසුන්ගේ දියුණුව බලාපොරොත්තු වෙයි."

"පෙර කරනලද, හොඳින් රැස් කළ කර්ම බලයෙන් හෙතෙම සිංහයෙකුගේ ඉදිරි කොටස බඳුව හොඳින් පිහිටි (ශරීර) උඩ කොටස ඇත්තේ හොඳින් වටවූ කර ඇත්තේ දෙපැත්ත මැද පිරීගිය පිට ඇත්තේද විය. එය ඔහුගේ නොපිරිහෙන බවට පෙරනිමිත්තක් විය."

"ගිහි වූයේ ධාන්‍යයෙන්ද, ධනයෙන්ද, පුත්‍රදාරාවන්ගෙන්ද, සිවුපාවුන්ගෙන්ද වැඩේ. ධනධාන්‍යාදි කිසිවක් නොමැත්තේ පැවිදිවූයේ නම් ඉතා උතුම්වූ නොපිරිහෙන ස්වභාව ඇති සම්‍යක් සම්බොධියට පැමිණේ."

18. "මහණෙනි, යම් හේතුවකින් තථාගතයන්වහන්සේ පෙර ජාතියෙහි, පෙර භවයෙහි, පෙර වාසයෙහි, පෙර මනුෂ්‍යයෙක් වූයේ, අතින් හෝ, ගලින් හෝ, දඬුයෙන් හෝ, ආයුධයෙන් හෝ සත්වයන්ට වෙහෙස නොකරන ස්වභාව ඇත්තෙක් වූයේය. හෙතෙමේ ඒ කර්මය කළ බැවින්, රැස් කළ බැවින් දෙව් ලොව උපදනේය."

හෙතෙම එතැනින් චුතව මිනිස් බවට පැමිණියේ මේ මහාපුරුෂ ලක්ෂණය ලබයි. රසග්ගසග්ගී ලක්ෂණය ඇත්තේ වෙයි. උඩුකුරුව සමව රස ගෙනයන්නාවූ රස නහර උන්වහන්සේගේ ගෙලෙහි හටගත්තාවූ වෙත්. හෙතෙම ඒ ලකුණින් යුතුවූයේ ඉදින් ගිහිගෙයි වසාද, සක්විති රජ වෙයි.

"ඔහුට මේ රත්න හත පහළ වෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත් වැනිවූ පුත්‍ර රත්නය යන

මොවුහුය, ඔහුට පර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්. හෙතෙම සයුර හිම් කොට ඇති මේ පෘථිවිය සොරුන් නැතිවූ, සඵලවූ සියලු සැපතින් පිරීගිය, නිර්භයවූ, අනතුරු රහිතවූ, උවදුරු රහිත වූවක් කොට, දඬුවම් රහිතව, ආයුධ රහිතව, ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කරයි.

"රජ වූයේ කුමක් ලබාද? නිරොගි වූවෙක් වෙයි, පීඩා නැත්තෙක් වෙයි. ඉතා සීත නොවූ ඉතා උෂ්ණ නොවූ සමව පවතින කෑම දිරවන ගින්නෙන් යුක්ත වූයේ වෙයි. රජවූයේ මෙය ලබයි.

"ඉදින් ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳ දමා අර්හත් සම්මා සම්බුදු වන්නේය.

"බුදුවූයේ කුමක් ලබාද? නිරොගි වූවෙක් වෙයි. පීඩා නැත්තෙක් වෙයි, ඉතා සීත නොවූ, ඉතා උෂ්ණ නොවූ, සමව පවතින කෑම දිරවන ගින්නෙන් යුක්ත වූයේ වෙයි. බුදුවූයේ මෙය ලබයි. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙසේ කියනු ලැබේ.

> "දඬුවම් කිරීම් වශයෙන් හෝ තර්ජන කිරීම් වශයෙන් හෝ අතින් දඬුවලින් නැතහොත් කැට කැබිලිතිවලින් ආයුධවලින් හෝ මරණ වධ වශයෙන් ජනතාවට හිංසා නොකෙළේය. අහිංසකයෙක් විය."
>
> "එම කර්මයෙන්ම හෙතෙම පරලොව සුගතීන්හි සතුටු වෙයි. සැප විපාක ගෙනදෙන කර්මකොට සැප විඳී." මෙලෙව්හි උත්පත්ති වශයෙන් පැමිණියේ ඒ ඒ රස නහර තුමූම මැනවින් පිහිටියාහු රසග්ගසග්ගිතා ලක්ෂණය ලබයි."
>
> "එබැවින් අතිශයින් තීක්ෂණවූ දක්ෂවූ නිමිත්ත පාඨකයෝ මේ මිනිස් තෙමේ සැප බහුල කෙනෙක් වන්නේයයි කීහ. ගිහියෙකුගේ හෝ පැවිද්දකුගේ හෝ එම ලක්ෂණය එකී අර්ථය ප්‍රකාශ කරන්නේ වෙයි."

**19.** "මහණෙනි, යම් හේතුවකින් තථාගතයන්වහන්සේ පෙර ජාතියෙහි, පෙර භවයෙහි, පෙර වාසයෙහි මනුෂ්‍යයෙක් වූයේ, ක්‍රොධයෙන් රවා බලන්නෙක් නොවේ. කපටි ඇසින් බලන්නෙක් නොවේ. ඇස් හකුළුවා බලන්නෙක් නොවේ. අවංකව බලන්නෙක් වූයේය. ප්‍රිය ඇසින් මහජනයා බලන්නෙක් වූයේය. හෙතෙම ඒ කර්මය කළ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙව්වරුන්ට වඩා කරුණු දහයකින් වැඩි වෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද දිව්‍යමයවූ පාටෙන්ද, දිව්‍යමයවූ සැපයෙන්ද දිව්‍යමයවූ පිරිවරින්ද දිව්‍යමයවූ අධිපතිභාවයෙන්ද දිව්‍යමයවූ රූපයෙන්ද දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද දිව්‍යමයවූ රසයෙන්ද දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩි වෙයි.

හේ එතැනින් චුතව මිනිස් බවට පැමිණියේ මේ දෙයාකාරවූ මහපුරිස් ලකුණු ලබයි. අතිශයින් නිල් පාට ඇස් ඇත්තේ වෙයි. එදා උපන් වස්සෙකුගේ ඇස්පිහාටුවලට බඳු ඇස්පිහාටු ඇත්තේ වෙයි. හෙතෙම ඒ දෙලකුණින් යුක්ත වූයේ, ඉදින් ගිහිගෙයි වසාද සක්විති රජ වෙයි.

ඔහුට මේ රත්න හත පහළ වෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පෙර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්. හෙතෙම සයුර හිම් කොට ඇති මේ පෘථිවිය සොරුන් නැතිවූ, සඵලවූ, සියලු සැපතින් පිරීගිය, නිර්භයවූ, අනතුරු රහිතවූ, උවදුරු රහිත වූවක් කොට, දඬුවම් රහිතව, ආයුධ රහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කරයි.

රජ වූයේ කුමක් ලබාද? බොහෝ දෙනාට දැකීමට ප්‍රිය වූවෙක් වෙයි. බමුණු ගෘහපතීන්ට නියම්ගම් දනව් වාසීන්ට නැකත් කරුවන්ට මහ ඇමතියන්ට සෙනාපතියන්ට යුද්ධ සේනාවන්ට දොරටු පාලයන්ට ඇමතියන්ට පිරිස් වැස්සන්ට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

රජවරුන්ට සේවකයන්ට කුමාරවරුන්ට ප්‍රිය වූවෙක් මනාප වූවෙක් වෙයි. රජ වූයේ මෙය ලබයි.

ඉදින් ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳදමා අර්හත් සම්මාසම්බුදු වන්නේය.

බුදු වූයේ කුමක් ලබාද? බොහෝ දෙනාට ප්‍රියවූ දැකුම් ඇත්තේ වෙයි. භික්ෂූන්ට භික්ෂුණීන්ට උපාසකයින්ට උපාසිකාවන්ට දෙවියන්ට මිනිසුන්ට අසුරයන්ට නාගයන්ට ගාන්ධර්වයන්ට ප්‍රිය වූවෙක් මනාප වූවෙක් වෙයි. බුදු වූයේ මෙය ලබයි. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙය මෙසේ කියනු ලැබේ.

"රවා බලන්නෙක් නොවීය. වංක ලෙස ඇස් කෙළවරින් බලන්නේද නොවීය. ඔරවා නොබලන්නේ ඍජුවූ පැතුරුණු බැලුම් ඇත්තේ විය. ප්‍රිය ඇසින් බොහෝදෙනා දෙස බැලුවේය."

"හෙතෙම සුගතිවල ඵල විපාක අනුභව කරයි. එහිදී සතුටුවෙයි. මේ ලෝකයේදී හොඳින් දැකුම් කටයුතුවූ අතිශයින් නිල්වන් ඇස් ඇත්තේ එදා උපන් වස්සෙකුගේ ඇස්පිහාටුවලට බඳු ඇස්පිහාටු ඇත්තේ වෙයි."

"හසලවූ නිමිති ශාස්ත්‍රයෙහි දක්ෂවූ සියුම් ඇස් පරීක්ෂාකොට බැලීමෙහි දක්ෂවූ මිනිස්සු ඔහු ප්‍රියවූ දැකුම් ඇත්තෙකැයි පෙන්වත්."

"ගිහි වූයේ නමුදු ප්‍රියවූ දැකුම් ඇත්තේ ශාන්තවූයේ බොහෝ දෙනාට ප්‍රිය වූයේද වෙයි. ඉදින් ගිහි නොවේ නම් බොහෝ දෙනාගේ ශොක නැති කරන්නාවූ ප්‍රියවූ ශ්‍රමණයෙක් වේ."

**20.** "මහණෙනි, යම් හේතුවකින් තථාගත තෙමේ පෙර ජාතියෙහි පෙර භවයෙහි පෙර වාසයෙහි පෙර මනුෂ්‍යයෙක් වූයේ බොහෝ ජනයන් අතුරෙන් කයින් කරන සුචරිතයෙහි, වචනයෙන් කරන සුචරිතයෙහි, සිතින් කරන සුචරිතයෙහි, දන්දීමෙහි, සිල් සමාදන්වීමෙහි, පොහෝ දිනයන්හි සිල්

සමාදන්වීමෙහි, මවට උපස්ථාන කිරීමෙහි, පියාට උපස්ථාන කිරීමෙහි, මහණුන්ට උපස්ථාන කිරීමෙහි, බමුණන්ට උපස්ථාන කිරීමෙහි, කුලදෙටුවන් පිදීමෙහි (යන මේ) නොයෙක් නොයෙක් උතුම් කුශල ධර්මයන්හි ප්‍රධාන විය. හෙතෙම ඒ කර්මය කළ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙවිවරුන්ට වඩා කරුණු දහයකින් වැඩිවෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද, දිව්‍යමයවූ පාටෙන්ද, දිව්‍යමයවූ සැපයෙන්ද, දිව්‍යමයවූ පිරිවරින්ද, දිව්‍යමයවූ අධිපතිභාවයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද, දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද, දිව්‍යමයවූ රසයෙන්ද, දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩි වෙයි. හෙතෙම එතැනින් චුතව මිනිස් බවට පැමිණියේ මේ මහපුරිස් ලකුණ ලබයි. නළල් පටකින් යුක්තවූයේ වෙයි. හෙතෙම ඒ ලකුණින් යුක්තවූයේ ඉදින් ගිහිගෙයි වසාද සක්විති රජවෙයි. ඔහුට මේ රත්න හත පහළවෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්, හෙතෙම සයුර හිම් කොට ඇති මේ පෘථිවිය සොරුන් නැතිවූ, සඵලවූ, සියලු සැපතින් පිරීගිය, නිර්භයවූ, අනතුරු රහිතවූ, උවදුරු රහිත වූවක් කොට, දඬුවම් රහිතවූ, ආයුධ රහිතවූ, ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කරයි. රජවූයේ කුමක් ලබාද? බමුණු ගෘහපතියෝ, නියම්ගම් දනව් වැසියෝ, නැකැත් කියන්නෝ, මහ ඇමැතියෝ, යුද්ධ සෙනාධිපතියෝ, දොරටුපාලයෝ, ඇමැතියෝ පිරිවර ජනයෝ, රජවරු, සෙවකයෝ, කුමරුවෝ යන මහජනයා ඔහුට අනුව පවත්නේය. රජ වූයේ මෙය ලබයි. ඉදින් ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳ දමා අර්හත් සම්මා සම්බුදු වන්නේය. බුදුවූයේ කුමක් ලබාද? භික්ෂූහු, භික්ෂුණීහු, උපාසකයෝ, උපාසිකාවෝ, දෙවියෝ, මිනිස්සු, අසුරයෝ, නාගයෝ, ගාන්ධර්වයෝ යන මහජනයා උන්වහන්සේට අනුව පවත්නේ වෙයි. බුදුවූයේ මෙය

ලබයි. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙය මෙසේ කියනු ලැබේ.

"සුචරිත ධර්මයන්හි පෙරටුව යන්නෙක් වූයේ ධර්මයෙහි හැසිරීමෙහි ඇළුනේ විය. බොහෝදෙනා විසින් අනුගමනය කරනු ලබන්නෙක්ද වූයේ ස්වර්ගයන්හි පුණ්‍ය විපාක ලැබීය."

"හෙතෙම (ස්වර්ගයෙහි) සුචරිත විපාක විඳ මේ ලොකයෙහි උණ්හීසසීසතා (නළල්පටක් ඇති බව) ලක්ෂණය ලැබීය. නිමිති කියන්නෝ (ඔහු පරීක්ෂාකොට) මෙතෙම බොහෝදෙනාට පෙරටුව යන්නෙක් වන්නේයයි ප්‍රකාශ කළාහුය."

"මෙලොව මිනිසුන් අතුරෙහි ඔහුට වතාවත් කරන්නෝ බොහෝ වෙත් යයි ලදරුකල්හිම ප්‍රකාශ කරත්. ඉදින් පොළොවට අධිපතිවූ ක්ෂත්‍රියයෙක් වූයේ නම් වතාවත් කරන බොහෝ දෙනා ලබයි."

"ඉදින් මිනිසත් බව ලැබූ හෙතෙම මහණ වේද, ධර්මයන්හි මහත් ප්‍රගුණ භාවයක් ඇති වේ. ඔහුගේ අනුශාසනයෙහිද ගුණයෙහිද ඇලුනාවූ අනුව යන්නාවූ බොහෝ ජනයා ඇති වෙයි.'

**21.** "මහණෙනි, යම් හේතුවකින් තථාගතතෙමේ පෙර ජාතියෙහි පෙර භවයෙහි පෙර වාසයෙහි පෙර මනුෂ්‍යයෙක් වූයේ බොරුව දුරුකොට බොරුවෙන් වෙන්වූයේ, සත්‍යය කියන්නෙක්, ඇත්තෙන් ඇත්ත ගලපන්නෙක්, ස්ථිර වචන ඇත්තෙක්, ඇදහියයුතු වචන ඇත්තෙක්, ලොකයා නොරවටන්නෙක් වූයේය. හෙතෙම ඒ කර්මය කළබැවින් රැස්කළ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි, හෙතෙම එහි අන්‍ය දෙවිවරුන්ට වඩා කරුණු දහයකින් වැඩිවෙයි, දිව්‍යමයවූ ආයුෂයෙන්ද, දිව්‍යමයවූ පාටෙන්ද, දිව්‍යමයවූ සැපයෙන්ද, දිව්‍යමයවූ පිරිවරින්ද, දිව්‍යමයවූ අධිපතිභාවයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද, දිව්‍යමයවූ

ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද, දිව්‍යමයවූ රසයෙන්ද, දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩි වෙයි. හෙතෙම එතැනින් චුතව මිනිස් බවට පැමිණියේ, මේ මහා පුරිස් ලකුණු ලබයි. (රෝමකූපයන්හි) එක එක රෝම ඇත්තේ වෙයි. සුදු මෘදුවූ පුළුන් රොදක් මෙන් දෙබැම අතර පිහිටි ඌර්ණ රෝම ලක්ෂණය ඇත්තේ වෙයි.

"හෙතෙම ඒ දෙලකුණින් යුක්තවූයේ ඉදින් ගිහිගෙයි වසාද, සක්විති රජ වෙයි. ඔහුට මේ රත්න හත පහළ වෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්, හෙතෙම සයුර හිම්කොට ඇති මේ පෘථිවිය සොරුන් නැතිවූ, සඵලවූ, සියලු සැපතින් පිරිගිය, නිර්භයවූ, අනතුරු රහිතවූ, උවදුරු රහිත වූවක් කොට, දඬුවම් රහිතව, ආයුධ රහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කරයි. රජ වූයේ කුමක් ලබාද? බමුණු ගෘහපතියෝ, නියම් ගම් දනව් වැස්සෝ, ගණකයෝ, මහ මැතියෝ, යුද්ධ සේනාධිපතියෝ, දොරටු පාලයෝ, ඇමැතියෝ, පිරිවර ජනයෝ, රජවරු, සෙවකයෝ, කුමරුවෝ යන මහාජනයා ඔහු අනුව පවතියි. රජවූයේ මෙය ලබයි. ඉදින් ගිහි ගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳදමා අර්හත් සම්මාසම්බුදු වන්නේය. බුදුවූයේ කුමක් ලබාද? භික්ෂූහු, භික්ෂුණීහු, දෙවියෝ, මිනිස්සු, අසුරයෝ, නාගයෝ, ගාන්ධර්වයෝ යන මහජනයා උන්වහන්සේට අනුව පවතී. බුදුවූයේ මෙය ලබයි. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙය මෙසේ කියනු ලැබේ.

"පෙර ජාතීන්හි පොරොන්දු කඩ නොකරන්නේ දෙයාකර වචන නැත්තේ අසත්‍යය දුරුකළේය. හෙතෙම කිසිවෙකුට අසත්‍යය ප්‍රකාශ කරන්නේද නොවීය. සිදුවූ බොරු නොවූ සත්‍යවචනයන්ම කථා කෙළේය."

"සුදුවූ අතිශයින් සුදුවූ පුළුන් මෙන් මෘදුවූ බැම අතරෙහි මැනවින් පිහිටි ඌර්ණ රොම ලක්ෂණය විය. රෝම කූපයන්හි

රෝම දෙකක් හටනොගත්තාහුය. (රෝමකූපයන්හි) එක එක රෝමයෙන් යුත් අවයව ඇති බව විය."

"හටගත් නිමිති පරීක්ෂණයෙහි දක්ෂවූ බොහෝ ලක්ෂණ ශස්ත්‍රඥයෝ රැස්වූවහු උර්ණ රෝමයද අනිකුත් රෝමයෝද මනාකොට පිහිටියාහු නම් බොහෝ ජනතෙම එබඳු තැනැත්තාගේ අදහස් අනුව පවතී (යයි පැවසූහ.)"

"පෙර බොහෝ ජාතීන්හි කරන ලද සුචරිත කර්ම බලයෙන් ගිහි වුවද මහජනතෙමේ (ඔහුගේ) අදහස් අනුව පවතී. කාම සිත් සම්පූර්ණයෙන්ම නැති බැවින් අකිඤ්චනවූ මහණ බවට පත්වූ කල මහජන තෙමේ ඉතා උතුම්වූ බුද්ධත්වය ලද උන්වහන්සේ අනුගමනය කරයි."

**22.** "මහණෙනි, යම් හේතුවකින් තථාගතතෙමේ පෙර ජාතියෙහි පෙර භවයෙහි ඉපද පෙර වාසයෙහි මනුෂ්‍යයෙක් වූයේ පිසුණුබස් (කේලාම්) දුරුකොට පිසුණු බසින් වෙන්වූයේ විය. මොවුන්ගේ භෙදය පිණිස මෙයින් අසා අන්තැනෙක නොකියන්නෙක්, අසවලුන්ගේ භෙදය පිණිස අසවල් තැනින් අසා මොවුන්ට නොකියන්නෙක් මෙසේ භින්නවූවන් ගලපන්නෙක් හෝ සමගි වූවන්ට අනුබලදෙන්නෙක් හෝ සමගියෙහි ඇලුනේ සමගියෙහි යුක්ත වූයේ, සමගියෙහි සතුටු වූවෙක්, සමගි කරන වචන කියන්නෙක් වූයේය. හෙතෙම ඒ කර්මය කළ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි, හෙතෙම එහි අන්‍ය දෙව් වරුන්ට වඩා කරුණු දහයකින් වැඩිවෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද, දිව්‍යමයවූ පාටෙන්ද, දිව්‍යමයවූ සැපයෙන්ද, දිව්‍යමයවූ පිරිවරින්ද, දිව්‍යමයවූ අධිපතිභාවයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද, දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද, දිව්‍යමයවූ රසයෙන්ද, දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩිවෙයි.

"හෙතෙම එතැනින් චුතව මිනිස් බවට පැමිණියේ මේ දෙයාකාර මහපුරුෂ ලක්ෂණ ලබයි. සමසතළිස් දත් ඇත්තේද

වෙයි, අතර විවර නැති දත් ඇත්තේ වෙයි. හෙතෙම ඒ ලකුණින් යුක්තවූයේ ඉදින් ගිහිගෙයි වසාද සක්විති රජවෙයි.

"ඔහුට මේ රත්න හත පහළවෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්, හෙතෙම සයුර හිමි කොට ඇති මේ පෘථිවිය සොරුන් නැතිවූ, සඵලවූ සියලු සැපතින් පිරීගිය, නිර්භයවූ, අනතුරු රහිතවූ, උවදුරු රහිත වූවක් කොට, දඬුවම් රහිතව, ආයුධ රහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කරයි. රජවූයේ කුමක් ලබාද? නොබිඳුනු පිරිස ඇත්තෙක් වෙයි. ඔහුගේ පිරිස නොබිඳුනේ වෙයි. බමුණු ගෘහපතියෝ නියම්ගම් දනව් වැස්සෝ, ගණකයෝ, මහ ඇමතියෝ, යුද්ධ සේනාවෝ, දොරටුපාලයෝ, ඇමැතියෝ, පිරිවර ජනයෝ, රජවරු, සේවකයෝ, කුමරුවෝ (යන මොවුහුයි.) රජ වූයේ මෙය ලබයි. ඉදින් ගිහි ගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳදමා අර්හත් සම්මාසම්බුදු වන්නේය. බුදු වූයේ කුමක් ලබාද? නොබිඳුනු පිරිස ඇත්තේ වෙයි. උන්වහන්සේගේ පිරිස නොබිඳුනෝ වෙති. භික්ෂූහු, භික්ෂුණීහු, උපාසකයෝ, උපාසිකාවෝ, දෙවියෝ, මිනිස්සු, අසුරයෝ, නාගයෝ, ගන්ධර්වයෝ (යන මොවුහුයි.) බුදු වූයේ මෙය ලබයි. මෙකරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙය කියනු ලැබේ.

> "භෙදය දියුණු කරන්නාවූද, සමගිවූවන්ගේ සමගිය නැති කරන්නාවූද, වාද විවාද දියුණු කරන්නාවූද, කලකොලාහල වැඩෙන නුසුදුසු ක්‍රියා කරන්නාවූද, සමගි වූවන්ගේ භෙදය ඇතිකරන වචන නොකීවේය."

> "අවිවාදය වැඩෙන ස්වභාවය ඇත්තාවූ භෙදවූවන්ගේ සමගිය ඇතිවන ස්වභාවයෙන් යුක්තවූ යහපත් වචන පැවසීය. මහජනයාගේ කලහ දුරු කෙළේය. සමගි වූයේ සමගි වූවන් හා සමග සතුටු වෙයි. බෙහෙවින්ද සතුටු වෙයි."

"හෙතෙම දිව්‍යලොකයෙහි කුශල ඵල විපාක අනුභව කරයි. එහි සතුටුවෙයි. මේ ලොකයේදී අඩු නොවූ එක්වූ යහපත්ව පිහිටි මුව තුළ හටගත් දත් සතළිසක් වෙත්."

"ඉදින් පොළොවට අධිපතිවූ රජෙක් වෙයිනම් ඔහුට භෙද කළ නොහැකි පිරිස් වෙත්, පහවූ කෙලෙස් කිලුටු ඇති නිර්මලවූ ශ්‍රමණයෙක් වෙයි නම් ඔහුට (තමා) අනුගමනය කරන නිශ්චලවූ පිරිස වේ."

23. "මහණෙනි, යම්හෙයකින් තථාගතතෙමේ පෙර ජාතියෙහි පෙර භවයෙහි පෙර වාසයෙහි පෙර මනුෂ්‍යයෙක් වූයේ ඵරුෂ වචනය දුරුකොට ඵරුෂ වචනයෙන් වෙන් වූයේ විය. යම් ඒ වචනයක් තොමෝ කෙලතොළු නොවූයේ කණට සුව ගෙනදෙන්නී, පෙම් වඩන්නී, සිත් අලවන්නී නාගරිකවූවා, බොහෝ ජනයා විසින් කැමැති වන්නී, බොහෝ ජනයා විසින් මනවඩන්නී වූවාද එබඳුවූ වචන කියන්නෙක් විය. හේ ඒ කර්මය කළ බැවින් රැස්කළ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙව්වරුන්ට වඩා කරුණු දහයකින් වැඩි වෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද දිව්‍යමයවූ පාටෙන්ද දිව්‍යමයවූ සැපයෙන්ද දිව්‍යමයවූ පිරිවරින්ද දිව්‍යමයවූ අධිපතිභාවයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද දිව්‍යමයවූ රසයෙන්ද දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩිවෙයි. හෙතෙම එතැනින් චුතව මිනිස්බවට පැමිණියේ මේ දෙයාකාර මහා පුරිස් ලකුණු ලබයි. පුළුල් දිවක් ඇත්තේද වෙයි. බ්‍රහ්මයන්ගේ හඬට බඳුවූද කොවුලන්ගේ හඬ හා සමානවූද හඬ ඇත්තේ වෙයි. හෙතෙම ඒ ලක්ෂණවලින් යුතුවූයේ, ඉදින් ගිහිගෙයි වසා ද සක්විති රජ වෙයි.

"ඔහුට මේ රත්න හත පහළවෙත්. (ඒ කවරේද?) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය, යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව් පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්, හෙතෙම සයුර හිම්

කොට ඇති මේ පෘථිවිය සොරුන් නැතිවූ, සඵලවූ සියලු සැපතින් පිරීගිය, නිර්භය, අනතුරු රහිතවූ, උවදුරු රහිත වූවක් කොට, දඬුවම් රහිතව, ආයුධ රහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කරයි.

රජ වූයේ කුමක් ලබාද? ඇදහිය යුතු වචන ඇත්තෙක් වෙයි. ඔහුගේ වචනය බමුණු ගෘහපතියෝ, නියම්ගම් දනව් වැස්සෝ, ගණන් ශාස්ත්‍රය දන්නෝ, මහා ඇමැතියෝ, යුද්ධ සේනාවෝ, දොරටුපාලයෝ, ඇමතියෝ, රජවරු, සේවකයෝ, කුමරුවෝ (යන මොවුහු) පිළිගනිත්. රජවූයේ මෙය ලබයි. ඉදින් ගිහි ගෙන් නික්ම පැවිදිවන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳදමා අර්හත් සම්මාසම්බුදු වන්නේය. බුදුවූයේ කුමක් ලබාද? ඇදහිය යුතු වචන ඇත්තේ වෙයි. උන්වහන්සේගේ වචනය භික්ෂූහු, භික්ෂුණීහු, උපාසකයෝ, උපාසිකාවෝ, දෙවියෝ, මිනිස්සු, අසුරයෝ, නාගයෝ, ගාන්ධර්වයෝ (යන මොවුහු) පිළිගනිත්. බුදුවූයේ මෙය ලබයි. මේ කරුණු භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙය කියනු ලැබේ.

"හෙතෙම නින්දාබස් කොලාහල හා වෙහෙස ඇති කරන්නාවූ පීඩාකරනු බොහෝදෙනා මර්දනය කරන ඵරුෂ වචන කථා නොකෙළේය. මිතුරන් ඇතිකරන්නාවූ මෘදුවූ මනාසේ ප්‍රියවූ මිහිරිවූ රළුනොවූ වචන ප්‍රකාශ කළේය."

"හෙතෙම සිතට ප්‍රියවූ ආදරණීයවූ කණට සැපවූ වචන පවසයි. මැනවින් පුරුදු කළ යහපත් වචනයෙන් සැප විපාක විඳීම කළේය. ස්වර්ගයන්හි පුණ්‍ය විපාක වින්දේය."

"හෙතෙම සුචරිත විපාක විඳ මේ ලොකයෙහිදී බ්‍රහ්ම හඬ ඇති බව ලැබීය. ඔහුට පුළුල්වූ දිවද වෙයි. පිළිගත යුතු වචන ඇත්තේද වන්නේවෙයි."

"ගිහි වූවහුටද යම්සේ කියයිද ඒ වූපරිදි සියල්ල සමෘද්ධ වෙයි. ඉදින් ඒ මිනිස් තෙමේ මහණ වේ නම් බොහෝ දෙනාට බොහෝ යහපත් වචන කියන්නාවූ ඔහුගේ ඒ වචන ජනසමූහයා පිළිගණිත්."

24. "මහණෙනි යම් හේතුවකින් තථාගත තෙමේ පෙර ජාතියෙහි පෙර භවයෙහි පෙර වාසයෙහි පෙර මනුෂ්‍යයෙක් වූයේ සම්ඵප්‍රලාපය (හිස්වචන) දුරුකොට සම්ඵප්‍රලාප කීමෙන් දුරුවූයේ විය. සුදුසුකල් දැන කියන්නෙක්, ඇති දෙයක් කියන්නෙක්, ප්‍රයෝජනවූවක් කියන්නෙක්, ධාර්මික දෙයක් කියන්නෙක්, හික්මවිය යුතු වචන කියන්නෙක්, සිත තබාගත යුතු වූද කරුණු සහිතවූද උපදෙස් සහිතවූද අර්ථ සහිතවූද වචන සුදුසු කාලයෙහි කියන්නෙක් වූයේය. හෙතෙම ඒ කර්මය කළ බැවින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි. හෙතෙම එහි අන්‍ය දෙව්වරුන්ට වඩා කරුණු දහයකින් වැඩිවෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද දිව්‍යමයවූ පාටෙන්ද දිව්‍යමයවූ සැපයෙන්ද දිව්‍යමයවූ පිරිවරින්ද දිව්‍යමයවූ අධිපතිභාවයෙන්ද දිව්‍යමයවූ රූපයෙන්ද දිව්‍යමයවූ ශබ්දයෙන්ද දිව්‍යමයවූ ගන්ධයෙන්ද දිව්‍යමයවූ රසයෙන්ද දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් වැඩි වෙයි. හෙතෙම එතැනින් චුතව මිනිස් බවට පැමිණියේ මේ මහා පුරුෂ ලක්ෂණය ලබයි. සීහහනුතා (සිංහ හකු ඇති) ලක්ෂණය ඇත්තේ වෙයි. ඔහු ඒ ලකුණින් යුතුවූයේ, ඉඳින් ගිහිගෙයි වසාද සක්විති රජවෙයි.

"ඔහුට මේ රත්න හත පහළ වෙත්. (ඒ කවරේද) චක්‍ර රත්නය, ඇත් රත්නය, අස් රත්නය, මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නය යන මොවුහුය. ඔහුට පර සේනාවන් මැඩලිය හැකි සූරවූ දෙව්පුතුන් හා සමාන ශරීර ඇති දහසකට වැඩිවූ පුත්‍රයෝ වෙත්. හෙතෙම සයුර හිම් කොට ඇති මේ පෘථිවිය සොරුන් නැතිව, සඵලව සියලු සැපතින් පිරීගිය, නිර්භයවූ, අනතුරු රහිත, උවදුරු රහිත වූවක් කොට, ආයුධ රහිතව ධර්මයෙන් සමාදානයෙන් දිනා වාසය කරයි. රජ වූයේ කුමක් ලබාද? කිසි මිනිස් සතුරකු විසින් හෝ විරුද්ධ වූවකු විසින් හෝ නොමැඩිය හැක්කේ වෙයි. රජ වූයේ මෙය ලබයි ඉඳින් ගිහි ගෙන් නික්ම පැවිදිවන්නේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳදමා අර්හත් සම්මාසම්බුදු වන්නේය. බුදු වූයේ කුමක් ලබාද? ඇතුලතවූ රාගාදීන් විසින් හෝ පිටත්හිවූ සතුරන්

විසින් හෝ විරුද්ධකාරයන් විසින් හෝ නොමැඩිය හැක්කේ වෙයි. රාගයෙන් හෝ දොෂයෙන් හෝ මොහයන් හෝ මහණෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලොකයෙහි කිසිවෙකු විසිනුදු නොමැඩිය හැක්කේ බුදුවූයේ මෙය ලබයි. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙසේ කියනු ලැබේ.

"හිස්වචන නොකියයි. නොවිසිරීගිය වචන ඇත්තේ වෙයි. අහිත වචනද දුරු කළේය. හිතවූද බොහෝ දෙනාට සැපවූද වචන පැවසීය."

"එය කොට මෙලොවින් චුතව දෙව්ලොව උපන්නේ කුශල විපාක අනුභව කළේය. ඉන් චුතව නැවත මෙහි පැමිණියේ සීහ හනුතා (සිංහ හකු) ලක්ෂණය ලැබීය."

"(හෙතෙම මේ ලොකයෙහි උපදින්නේ නම්) කිසිවෙකු විසින් නොමැඩිය හැකි මහානුභාව ඇති මනුෂ්‍ය ශ්‍රෙෂ්ඨවූ රජෙක් වෙයි. දෙවියන්ට අතිශයින් ශ්‍රෙෂ්ඨවූ ඉන්ද්‍ර නම්වූ ශක්‍රයා හා සමවෙයි."

"මේ ලොකයෙහිදී එබඳුවූයේ දිසා අනුදිසාවන්හි ගාන්ධර්ව අසුර යක්ෂ රාක්ෂස දේව යන මොවුන් විසින් මැඩලිය නොහැක්කේ වේ."

**25.** "මහණෙනි, යම් හේතුවකින් තථාගතතෙමේ පෙර ජාතියෙහි පෙර භවයෙහි පෙර වාසයෙහි පෙර මනුෂ්‍යයෙක් වූයේ වැරදි ජීවිකාමාර්ගය දුරුකොට යහපත් ජීවිකා මාර්ගයෙන් ජීවිකාව කළේය. තරාදි ආදියෙන් වඤ්චා කිරීමය. රන් හා නොරන් මිශ්‍රකොට වඤ්චා කිරීමය. වී ආදිය මැනීමෙන් වඤ්චා කිරීමය. හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැනීමය. උපායෙන් අනුන් රැවටීමය. යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය. නොයෙක් ආකාරවූ කපටි ප්‍රයොගය. කැපීමය. මැරීමය. බන්ධනය. සැඟවී සිට වස්තු පැහැර ගැන්මය. ගම් නියම්ගම් ආදිය පැහැරීමය. බලාත්කාරකමින් වස්තු

පැහැරගැන්මය යන මෙයින් වැළැක්කේ විය. හෙතෙම ඒ කර්මය කළ බැවින් රැස්කළ බැවින්, මහත් බැවින්, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදී. හෙතෙම එහි අන්‍යවූ දෙවියන්ට වඩා කරුණු දහයකින් අධික වෙයි. දිව්‍යමයවූ ආයුෂයෙන්ද, දිව්‍යමයවූ වර්ණයෙන්ද, දිව්‍යමයවූ සැපයෙන්ද, දිව්‍යමයවූ යසසින්ද, දිව්‍යමයවූ අධිපතිභාවයයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද, දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ ගන්ධයෙන්ද, දිව්‍යමයවූ රසයෙන්ද, දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද, යන මේ කරුණුවලිනි. හෙතෙම එතැනින් චුතව මිනිස් බවට පැමිණියේ මේ දෙයාකාරවූ මහාපුරුෂ ලක්ෂණ ලබයි. සම දත් ඇත්තේද අතිශයින් සුදුවූ දත් ඇත්තේද වෙයි. හෙතෙම ඒ දෙලකුණින් යුක්තවූයේ ඉඳින් ගිහි ගෙයි වසාද, සතර දිගම අධිපති කොට ඇති දනව්හි ප්‍රධාන වූයේ රත්න හතෙන් යුක්තවූයේ දැහැමිවූ ධර්මරාජන්වූ සක්විති රජෙක් වෙයි. ඔහුට මේ රත්න හත පහල වෙති. ඒ කවරහුද? චක්‍ර රත්නය, හස්ති රත්නය, අශ්ව රත්නය, මැණික් රත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපති රත්නය, සත්වැනි පුත්‍ර රත්නය (යන මොවුහුයි.) ඔහුට සූරවූ වීරවූ පරසෙනග මැඩිය හැකිවූ දහසකට අධික පුත්‍රයෝ වෙත්. හෙතෙම සයුර හිම් කොට ඇති මේ පෘථිවිය සොරුන් නැතිවූ, දියුණුවූ, සියලු සැපතින් යුක්තවූ, නිර්භයවූ, අනතුරු රහිතවූ, උවදුරු රහිත වූවක් කොට, දඬුවම් රහිතව, ආයුධ රහිතව, ධර්මයෙන් සාමයෙන් දිනා වාසයකරයි. රජවූයේ කුමක් ලබාද, පිරිසිදු පිරිවර ඇත්තේ වෙයි. ඔහුට බමුණු ගෘහපතියෝ නියම්ගම් දනව් වැස්සෝ, නැකැත් දන්නෝ, මහමැතියෝ, යුද්ධසේනාවෝ, දොරටුපාලයෝ, ඇමැතියෝ, පරිවාර ජනයෝ, රජවරු, සේවකයෝ, කුමරුවෝ (යන මොවුහු) පිරිසිදු පිරිවර වෙත්. රජවූයේ මෙය ලබයි. ඉඳින් ගිහිගෙන් නික්ම මහණ වේද, ලොකයෙහි කෙලෙස් වහල විනාස කළාවූ අර්හත්වූ සම්‍යක් සම්බුදු වෙයි. බුදුවූයේ කුමක් ලබාද? පිරිසිදු පිරිවර ඇත්තේ වෙයි. උන්වහන්සේට භික්ෂූහු, භික්ෂුණීහු, උපාසකයෝ, උපාසිකාවෝ, දෙවියෝ, මිනිස්සු, අසුරයෝ, ගාන්ධර්වයෝ (යන මොවුහු) පිරිසිදු පිරිවර වෙති. බුදුවූයේ මෙය ලබයි. මෙකරුණ භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. එහි මෙසේ කියනු ලැබේ.

"හෙතෙම වැරදි ජීවිකාව දුරුකළේය. ධාර්මිකවූ, පිරිසිදුවූ සමපැවැත්ම ඇති කළේය. අහිත දෙයද අත්හැරියේය. බොහෝදෙනාට හිත පිණිසද සැප පිණිසද හැසුරුණේය."

"ඒ මනුෂ්‍යතෙම ශක්‍රයා හා සමානවූයේ (කුශල) කර්ම කොට හසල බුද්ධිමත් සත්පුරුෂයන් විසින් වර්ණනා කරන ලද සුචරිත විපාක ස්වර්ගයෙහි විඳී. දිව්‍යමය කාම ක්‍රීඩාවන්ගෙන් යුක්ත වූයේ සතුටු වෙයි."

"ඒ දෙව්ලොවින් චුතව කරණලද කුශල විපාකයාගේ ශෙෂයෙන් මිනිසත්බව ලබා සමවූද පිරිසිදුවූද අතිශයින් සුදුවූද දත් ලබයි."

"උගතුන්යයි පිළිගත් මිනිසුන්වූ බොහෝ ලක්ෂණ ශාස්ත්‍රය දන්නෝ රැස්වූවාහු ඔහුට දෙවරක් ඇතිවන බැවින් ද්විජ නම්වූ සමවූ අතිශයින් සුදුවූ පිරිසිදුවූ ශොභන දත් ඇත්තේ පිරිසිදු ජනසමූහයා පිරිවරකොට ඇත්තේ වේ (යයි පැවසූහ.)"

"ඉදින් රජවෙයි නම් මහා පිරිවර ඇත්තේ මහා පොලොවට අනුශාසකවූයේ බොහෝදෙනා ඇත්තේ වේ. බලාත්කාරයෙන් ජනපද පීඩනයක්ද නොකරයි. බොහෝ දෙනාට හිත සැප පිණිස හැසිරෙයි. බොහෝදෙන ඔවුනොවුන්ට සමාන සැප දුක් ඇත්තෝව හිත සැප පිණිස හැසිරෙත්."

"ඉදින් මහණ වෙයි නම් පව් නැති කළාවූ කෙලෙස් කිලුටු සංසිඳුවන ලද්දාවූ විවෘත කළ කෙලෙස් වහල ඇති පහකරන ලද ක්ලෙශ ක්ලාන්ත ඇති ශ්‍රමණයෙක් වූයේ මෙලොවද පරලොවද දකියි."

"ඔහුගේ අවවාදයට අනුව හික්මෙන්නාවූ බොහෝ ගිහි පැවිද්දෝ වෙත්. පිළිකුල් ලෙස නින්දා කරන ලද පාපය කම්පා කෙරෙත්. හෙතෙම පිරිසිදු වූවන් විසින්

පිරිවරන ලද්දයේ වේ. රාගාදි කිලුටුද, රාගාදි උල්ද, ද්වේෂ නමැති කිලුටුද (යන සියලු කෙලෙස්) දුරු කරයි."

**තිස් වැනිවූ ලක්ඛණ සූත්‍රය නිමියේය.**

---

## 31. සිගාලක සූත්‍රය.

1. මා විසින් (මේ සූත්‍රය) මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර (ලෙහෙනුන්ට වැටුප් දුන් හෙයින්) කලන්දකනිවාප නම්වූ, වෙළුවන වෙහෙරෙහි වාසය කළහ.

එකල සිගාලක නම් ගෘහපති පුත්‍ර තෙම කල් ඇතිවම නැගිට රජගහ නුවරින් පිටත්ව ගොස් තෙත්වූ ඇඳුම් ඇතුව තෙත්වූ හිසකෙස් ඇතුව ඇඳිලිබැඳගෙන නැගෙනහිර දිසාවය, දකුණු දිසාවය, බස්නාහිර දිසාවය, යට දිසාවය, උතුරු දිසාවය, උඩ දිසාවය යන බොහෝ දිසාවන් නමස්කාර කරන්නේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍රා සිවුරු ගෙන රජගහනුවරට පිඬු පිණිස ගියෝය.

කල් ඇතිවම නැගිට රජගහ නුවරින් නික්ම ගොස් තෙත් වූ ඇඳුම් ඇතිව, තෙත්වූ හිස කෙස් ඇතිව ඇඳිලි බැඳගෙන (ඇඟිලි එකට තබාගෙන) නැගෙනහිර දිසාවය, දකුණු දිසාවය, බස්නාහිර දිසාවය, උතුරු දිසාවය, යට දිසාවය, උඩ දිසාවය, යන බොහෝ දිසාවන් වඳින්නවූ සිගාලක නම් ගෘහපති පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේ දුටුවෝය. (එසේ) දැක සිගාලක නම් ගෘහපති පුත්‍රයාට මෙය කීවාහුය. "ගෘහපති පුත්‍රය, නුඹ කල් ඇතුවම නැගිට රජගහ නුවරින් නික්ම ගොස් තෙත්වූ ඇඳුම් ඇතිව තෙත්වූ හිස කෙස් ඇතිව ඇදිලි බැඳ ගෙන නැගෙනහිර දිසාවය, දකුණු දිසාවය, බස්නාහිර දිසාවය, උතුරු දිසාවය, යට දිසාවය, උඩ දිසාවය යන බොහෝ දිසාවන්ට කුමක් හෙයින් වඳින්නෙහිදැ"යි, ඇසූහ.

"ස්වාමීන් වහන්ස, (මගේ) පියා මැරෙණ කල මට මෙසේ කීයේය. 'දරුව, දිශාවන්ට නමස්කාර කරව" (කියායි.)

"ස්වාමීන් වහන්ස, ඒ මම පියාගේ වචනයට සත්කාර කරන්නේ, ගෞරව කරන්නේ, බුහුමන්කරන්නේ, පුදන්නේ කල් ඇතුවම නැගිට රජගහ නුවරින් නික්ම ගොස් තෙත්වූ ඇඳුම් ඇතිව තෙත්වූ හිස කෙස් ඇතිව, ඇඳිලි බැඳගෙන නැගෙනහිර දිශාවය, දකුණු දිශාවය, බස්නාහිර දිසාවය, උතුරු දිසාවය, යට දිසාවය, උඩ දිශාවය යන බොහෝ දිශාවන්ට නමස්කාර කරමි'යි කීයේය.

"ගෘහපති පුත්‍රය, ආය්‍ය්‍ර විනයෙහි (බුදු සස්නෙහි) මෙසේ සදිශාවෝ නොවැඳිය යුත්තාහුයි" කීවාහුය.

"ස්වාමීන් වහන්ස, ආය්‍ය්‍ර විනයෙහි කෙසේනම් සදිසාවෝ වැඳිය යුත්තාහුද, ස්වාමීන් වහන්ස, ආය්‍ය්‍ර විනයෙහි සදිශාවෝ යම් පරිද්දකින් වැඳිය යුත්තාහුද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ මට ධර්මය දේශනා කළ මැනවැයි" (කීයේය.)

"ගෘහපති පුත්‍රය, එසේවී නම් අසව, හොඳින් සිහියේ තබාගනුව කියන්නෙමියි" (කීවෝය)

"ස්වාමීන් වහන්ස, එසේයයි" කියා සිගාලක ගෘහපති පුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළෝය.

**2.** "ගෘහපති පුත්‍රය, යම් කලක පටන් උතුම් ශ්‍රාවකයා විසින් කර්ම ක්ලෙශ (අපිරිසිදු ක්‍රියා) සතරක් දුරු කරණ ලද්දාහු වෙද්ද, කරුණු සතරකින් පව්කම් නොකෙරේද, වස්තු විනාශයට හේතුවූ කරුණු සය සේවනය නොකෙරේද, හෙතෙම මෙසේ දාහතරක්වූ ලාමක ගතිවලින් වෙන් වූයේ සය දිශාවන් භය නූපදින සේ වසා තබන්නෙක්ව දෙලොවම ජය ගැනීම පිණිස පිළිපදින්නේ වෙයි. ඔහු විසින් මෙලොවද දිනන ලද්දේ වෙයි. පරලොවද දිනන ලද්දේ වෙයි. හෙතෙම ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති දිව්‍ය ලෝකයෙහි උපදින්නේය. ඔහු විසින් කවර නම් කර්ම ක්ලේශ (අපිරිසිදු ක්‍රියා) හතරක් පහකරන ලද්දාහු වෙද්ද? ගෘහපති පුත්‍රය, ප්‍රාණඝාතය (සතුන් මැරීම) අපිරිසිදු ක්‍රියාවකි. අදත්තාදානය (අන් සතු දෙය හොර හිතින්

ගැනීම) අපිරිසිදු ක්‍රියාවකි. කාම මිථ්‍යාචාරය (කාමයන්හි වරදවා හැසිරීම) අපිරිසිදු ක්‍රියාවකි. මුසාවාදය (බොරුකීම) අපිරිසිදු ක්‍රියාවකි. ඔහු විසින් මේ අපිරිසිදු ක්‍රියා හතර පහකරන ලද්දාහු වෙත්යයි" භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. ශාස්තෘවූ සුගතයන් වහන්සේ මෙය වදාරා නැවතද මෙසේ වදාළේය.

"සතුන් මැරීමද සොරකම් කිරීමද, බොරු කීමද, අන්සතු අඹුවන් වෙත යාමද යන මේ කරුණු සතර නුවණ ඇත්තෝ ප්‍රසංසා නොකරති."

"කවර නම් කරුණු සතරකින් පව්කම් කෙරේද? ඡන්දයෙන් (ඇල්මෙන්) අගතියට යාමෙන් පව්කම් කරයි. ද්වෙෂයෙන් (ක්‍රොධයෙන්) අගතියට යාමෙන් පව්කම් කරයි. භයින් අගතියට යාමෙන් පව්කම් කරයි. මොහයෙන් අගතියට යාමෙන් පව්කම් කරයි.

ගෘහපති පුත්‍රය, යම් හේතුවකින් ආය්‍ය්‍යශ්‍රාවකතෙම ඡන්දයෙන් අගතියට නොයන්නේම වේද, ද්වෙෂයෙන් අගතියට නොයන්නේම වේද, භයින් අගතියට නොයන්නේම වේද, මොහයෙන් අගතියට නොයන්නේම වේද, (ආය්‍ය්‍ය ශ්‍රාවක තෙමේ) මේ කරුණු සතරින් පව්කම් නොකෙරේයයි භාග්‍යවතුන් වහන්සේ වදාළේය. ශාස්තෘවූ සුගතයන් වහන්සේ නැවතද මෙසේ වදාළහ.

"යමෙක් ඡන්දයෙන්ද, ද්වෙෂයෙන්ද, භයින්ද මොහයෙන්ද ධර්මය ඉක්මවාද, ඒ තැනැත්තාගේ යසස කළුවර පක්ෂයෙහි චන්ද්‍රයා මෙන් පිරිහෙන්නේය."

"යමෙක් ඡන්දයෙන්ද, ද්වෙෂයෙන්ද භයින්ද මොහයෙන්ද, ධර්මය නොඉක්මවාද ඒ තැනැත්තාගේ යසස පුර පක්ෂයෙහි සඳ මෙන් පිරෙන්නේය."

3. වස්තුව විනාශයට හේතුවූ කවර නම් කරුණු සයක් සේවනය කෙර්ද?

"ගෘහපති පුත්‍රය, මත්වීමට හා ප්‍රමාදයට කරුණුවූ මත්පැන් බීමෙහි නැවත නැවත යෙදීම වස්තු විනාශ වීමට හේතුවකි.

නුසුදුසු කාලයෙහි වීථි සංචාරණයෙහි නැවත නැවත යෙදීම වස්තු විනාශයට හේතුවකි. නැටුම් පොලවල හැසිරීම වස්තු විනාශයට හෙතුවකි. ප්‍රමාදයට හේතුවූ දූකෙළියෙහි නැවත නැවත යෙදීම වස්තු විනාශයට හෙතුවකි. පාපමිත්‍රයන් හා නැවත නැවත එක්වීම වස්තු විනාශයට හෙතුවකි. අලස බැව්හි නැවත නැවත යෙදීම වස්තු විනාශයට හෙතුවකි.

**4.** "ගෘහපති පුත්‍රය, මත්වීමට හා ප්‍රමාදයට කරුණුවූ මත්පැන් බීමෙහි නැවත නැවත යෙදීමෙහි මේ දොෂ සයක් වෙත්. මේ ආත්මයෙහිම (හෙවත් තමා බලාසිටියදීම) ධනය පිරිහීම, කෝලාහල වැඩිවීම, රොග පීඩාවන්ට හෙතුවීම, අපකීර්තිය ඇතිවීම, ලජ්ජා නැතිව හැසිරීම, නුවණ දුර්වල කිරීම සවැනි කාරණය වේ.

"ගෘහපති පුත්‍රය, මත්වීමට හා ප්‍රමාදයට කරුණුවූ මත්පැන් පානයෙහි නැවත නැවත යෙදීමෙහි මේ දොෂ සය වෙත්.

**5.** "ගෘහපති පුත්‍රය, නොකල්හි වීථි සංචාරණයෙහි නැවත නැවත යෙදීමෙහි මේ දොෂ සයක් වෙත්. තමාද ප්‍රවේසම් නොකරන ලද්දේ නොරක්නා ලද්දේ වෙයි. තමාගේ අඹුදරුවෝද ප්‍රවේසම් නොකරන ලද්දාහු නොරක්නා ලද්දාහු වෙත්. තමාගේ වස්තුවද ප්‍රවේසම් නොකරන ලද්දේ නොරක්නා ලද්දේ වෙයි. පව්වුවූ කාරණයන්හි සැක කටයුත්තේද වේ. ඔහු කෙරෙහි සිදු නොවූ කතාද පැනනඟී. බොහෝවූ දුක් හිරිහැරවලටද පෙරටුවූවෙක් වෙයි. ගෘහපති පුත්‍රය, නොකල්හි වීථි සංචාරණයෙහි නැවත නැවත යෙදීමෙහි මේ දොෂ සය වෙත්.

**6.** "ගෘහපති පුත්‍රය, නැටුම් පලවල්වල හැසිරීමෙහි මේ දොෂ සයක් වෙත්. නැටුම් කොතැන්හිද, ගී කීම් කොතැන්හිද, වැයීම් කොතැන්හිද, කථා පැවැත්වීම් කොතැන්හිද, කයිතාලම් ආදිය ගැසීම් කොතැන්හිද, කල පිඹීම් කොතැන්හිදැයි (සොයා හැසිරීමය) ගෘහපති පුත්‍රය, මේ නෘත්‍යස්ථානයන්හි හැසිරීමෙහි දොෂ සය වෙත්.

**7.** "ගෘහපති පුත්‍රය, ප්‍රමාදයට කරුණුවූ දූකෙළියෙහි නැවත නැවත යෙදීමෙහි මේ දොෂ සයක් වෙත්. දිනූ තැනැත්තේ

වෛර රැස්කර ගනියි. පරදිනු ලැබූ තැනැත්තේ වස්තුව ගැන නැවත නැවත සෝක කරයි. තමන් බලාසිටියදීම වස්තු විනාශ වේ. සභාවකට පැමිණි ඔහුගේ වචනය නොපිළිගනියි. අසල් වැසියන් විසින් නින්දා කරනු ලබන්නෙක් වෙයි. දූකෙළියෙහි යෙදෙන මොහු අඹුවන් පොෂණයට නුසුදුසුයයි ආවාහ විවාහකයන් විසින් නොපතන ලද්දේ වෙයි. ගෘහපති පුත්‍රය, ප්‍රමාදයට කරුණුවූ දූකෙළියෙහි නැවත නැවත යෙදීමෙහි මේ දොෂ සය වෙත්.

8. "ගෘහපති පුත්‍රය, පව්ටු මිතුරන් ආශ්‍රය කිරීමෙහි නැවත නැවත යෙදීමෙහි මේ දොෂ සයක් වෙත්. යම් කෙනෙක් දූකෙළියෙහි යෙදෙත්ද, යම් කෙනෙක් (ගැහැණුන් කෙරෙහි) ලොල්වෙත්ද, යම් කෙනෙක් සුරා පිපාසයෙහි ගැලී වෙසෙත්ද, යම් කෙනෙක් කපටිකම් කෙරෙත්ද, යම් කෙනෙක් වංචා ප්‍රයොග කෙරෙත්ද, යම් කෙනෙක් (මං පැහැරීම් ආදී) සැහැසිකම් කෙරෙත්ද, ඔව්හු ඔහුගේ මිතුරෝ වෙත්. ඔහුගේ යහලුවෝද වෙත්. ගෘහපති පුත්‍රය, පාප මිත්‍රයන් ආශ්‍රය කිරීමෙහි නැවත නැවත යෙදීමෙහි මේ දොෂ සය වෙත්.

9. "ගෘහපති පුත්‍රය, අලස බැව්හි නැවත නැවත යෙදීමෙහි මේ දොෂ සයක් වෙත්. ඉතා සීතලයයි වැඩ නොකරයි. ඉතා උණුසුම්යයි වැඩ නොකරයි. ඉතා සවස්යයි වැඩ නොකරයි. ඉතා උදෑසනයයි වැඩ නොකරයි. ඉතා බඩගින්නෙන් පෙළෙමියි වැඩ නොකරයි. කෑම කෑමෙන් ඉතා බඩ බර ඇත්තෙමියි වැඩ නොකරයි. මෙසේ නොකොට ඉතිරිවූ කටයුතු බහුලව වාසයකරන්නාවූ ඔහුට නූපන්නාවූ වස්තුහුද නූපදිත්. උපන්නාවූ වස්තුහුද පිරිහෙත්. ගෘහපති පුත්‍රය, අලස බවෙහි නැවත නැවත යෙදීමෙහි මේ දොෂ සය වෙත්" යයි භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. ශාස්තෘවූ සුගතයන්වහන්සේ මෙය වදාරා නැවත මෙසේද වදාළෝය.

"(මත්පැන් බීමට මිතුරුවූ) පානසඛ නම් යහලුවෙක් වෙයි. ඉදිරිපිටදී පමණක් යහලුකම දක්වන සම්මිය සම්මිය නම් යහලුවෙක් වෙයි. යමෙක් තමහට වැඩක් ඇති කල්හි මිත්‍ර වන්නාවූ සඛ නම් යහලුවෙක්ද වේ.

"හිර උදාවන තෙක් නිදා ගැනීමය, අන් අඹුවන් සේවනය කිරීමය, තරහ බැඳ ගැනීමය, අවැඩ සිදුවන දේ කිරීමය, පවිටු මිතුරන් සේවනය කිරීමය, තද මසුරු බවය යන මේ කරුණු සය මිනිසා විනාශ කරත්.

"පාප මිත්‍රයන් ඇති පවිටු යහලුවන් ඇති ලාමක පැවතුම් හා නොහැසිරිය යුතු තන්හි හැසිරෙන්නාවූ තැනැත්තේ මෙලොවින්ද පරලොවින්ද යන දෙලොවින්ම පිරිහේ.

"සූදු කෙලීමෙහි හා අන් අඹුවන් සේවනය කිරීමෙහි යෙදීමද, සුරාපානය කිරීමද, නැටුම් ගී කීම්වලට කැමැත්තද, දහවල් නිදාගැනීමද, නොකල්හි නුසුදුසු තන්හි හැසිරීමද, පාප මිත්‍රයන් ඇති බවද, තද මසුරුකමද යන මේ කරුණු සය පුරුෂයා විනාශ කරත්.

"යම් කෙනෙක් පසටෙන් (දාදු කැටයෙන්) සූදු කෙළිද්ද, සුරාපානය කෙරෙද්ද, අනුන්ගේ ප්‍රාණය මෙන් රකින අඹුවන් සේවනය කරද්ද, දුසිරිතෙහි ගැලී වසන මිනිසුන් සේවනය කරද්ද, (යහපත අයහපත දත්) ඥානවන්තයින් සේවනය නොකරද්ද, (ඔවුන්ගේ) යසස කළුවර පක්ෂයෙහි චන්ද්‍රයා මෙන් පිරිහීමට පැමිණේ.

"වස්තුව ධනය නැතිව වසන යමෙක් මත්පැන් බීමෙහි ලොල් වූයේ සුරා සැලට ගොස් වතුර මෙන් සුරා පානය කරන්නේ ණයට බැස ගනියි. වහා තමාගේ කුලය (ගෙදර) පිරිහුණු කුලයක් (ගෙදරක්) කරන්නේය.

"දහවල් නිදන ගති ඇතිවූද, රෑ නොනැගිටින්නාවූම ගති ඇතිවූද, නිතොර (මත්පැනින්) මත්වූද, ගැහැනුන් කෙරෙහි ලොල්වූද පුද්ගලයා විසින් ගිහිගෙයි විසීම නොකළ හැකිය.

"දැන් ඉතා සීතලය, ඉතා උණුසුමය, ඉතා සවස් වීයයි මෙසේ වැඩ නොකරන මිනිසුන් වස්තුහු ඉවත් කරත්.

"මෙලොව යමෙකු සීතලද, උණුසුමද, තණ පතක් පමණවත් නොසිතාද, උත්සාහයෙන් වැඩ කරන්නාවූ ඒ මිනිසා සැපයෙන් නොපිරිහෙන්නේය."

10. "ගෘහපති පුත්‍රය, මිත්‍ර නොවූ මිතුරු වෙසින් හැසිරෙන මේ සතර දෙනෙක් දතයුතු වෙත්. 'අඤ්ඤදත්ථුහර' නම් (යමක් ගැනීමට පමණක් යහලුකම් දක්වන තැනැත්තා) මිත්‍ර නොවූ මිත්‍රයෙකු මෙන් හැසිරෙන්නෙකැයි දතයුතු. 'වචී පරම' නම් (වචනයෙන් පමණක් සැලකීම කරණ) තැනැත්තා මිත්‍ර නොවූ මිත්‍රයෙකු මෙන් හැසිරෙන්නෙකැයි දතයුතු. 'අනුප්පියභාණී' නම් (තමන් ඉදිරිපිටදී ස්තුති කරන රැවටිලි බස් කියන) නැතැත්තා මිත්‍ර නොවූ මිත්‍රයෙකු මෙන් හැසිරෙන්නෙකැයි දතයුතු "අපාය සහාය" නම් (පව් කම් සඳහා යහලුකම් කරන) තැනැත්තා මිත්‍රනොවූ මිත්‍රයෙකු මෙන් හැසිරෙන්නෙකැයි දතයුතුයි.

"ගෘහපති පුත්‍රය, අඤ්ඤදත්ථුහර නම් මිත්‍රනොවූ මිත්‍රයෙකු මෙන් හැසිරෙන තැනැත්තේ මේ කරුණු සතරින් දතයුතු.

"හිස් අතින් අවුත් මිත්‍රයාගෙන් කිසිවක් ගෙන යාමට බලාපොරොත්තු වෙයි. සුලු දෙයක් දීමෙන් ලොකු දෙයක් කැමති වෙයි. තමහට බියක් ඇතිකල්හි ඔහුගේ කටයුතු කරයි. තමාගේ ප්‍රයොජනය පිණිස කටයුතු කරයි."

"ගෘහපති පුත්‍රය, මේ කරුණු සතරින් අඤ්ඤදත්ථුහර නම් මිත්‍රනොවූ මිත්‍රයෙකු මෙන් හැසිරෙන නැතැත්තා දතයුතුයි."

"ගෘහපති පුත්‍රය, වචීපරම නම් මිත්‍රනොවූ මිත්‍රයෙකු මෙන් හැසිරෙන තැනැත්තා කරුණු සතරකින් දතයුතු. ඉකුත්වූ දෙයින් සංග්‍රහ කරයි. මතු ඇතිවන දෙයින් සංග්‍රහ කරයි. කටයුත්තක් පැමිණ සිටි කල්හි තමන්ට වූ විපත්තිය දක්වයි. ගෘහපති පුත්‍රය, මේ කරුණු සතරින් වචීපරම නම් මිත්‍ර නොවූ මිත්‍ර ප්‍රතිරූපකයා දත යුතුයි.

"ගෘහපති පුත්‍රය, අනුප්පියභාණී නම් මිත්‍ර නොවූ මිත්‍ර ප්‍රතිරූපකයා කරුණු සතරකින් දතයුතුයි. මිතුරාට පව් කිරීමද

අනුමත කරයි. කුසල් කිරීමද අනුමත කරයි. ඉදිරියෙහි ඔහුගේ ගුණ කියයි. නැති තැන ඔහුගේ අගුණ කියයි. ගෘහපති පුත්‍රය, මේ කරුණු සතරින් අනුප්පියභාණී නම් මිත්‍ර නොවූ මිත්‍ර ප්‍රතිරූපකයා දතයුතුයි.

"ගෘහපති පුත්‍රය, අපාය සහාය නම්, මිත්‍ර නොවූ මිත්‍ර ප්‍රතිරූපකයා කරුණු සතරකින් දත යුතුයි. මත්වීමට හා ප්‍රමාදයට කාරණාවූ මත්පැන් පානය පිණිස නැවත නැවත යෙදීමෙහි යහලු වෙයි. නොකල්හි වීථි සංචාරණය සඳහා නැවත නැවත යෙදීමෙහි යහලු වෙයි. නැටුම් ඇති තැන්වල හැසිරීමෙහි යහලු වෙයි. ප්‍රමාදයට කරුණුවූ සූදු කෙළියෙහි නැවත නැවත යෙදීමෙහි යහලු වෙයි. ගෘහපති පුත්‍රය, මේ කරුණු සතරින් අපාය සහාය නම් මිත්‍ර නොවූ මිත්‍ර ප්‍රතිරූපකයා දතයුතුය"යි භාග්‍යවතුන් වහන්සේ කීවාහුය. සුගත නම්වූ ශාස්තෲන්වහන්සේ මේ කාරණය වදාරා නැවතද මෙසේ කීවාහුය.

"අඤ්ඤදත්ථුහර, නම් (හිස් අතින් අවුත් මිතුරාගෙන් යමක් ගෙනයන) යම් මිතුරෙක් වේද? වචීපරම නම් වචනයෙන් පමණක් සලකන) යම් මිතුරෙක් වේද? අනුප්පියභාණී නම් (කරන හොඳ නරක දෙකට ඉදිරිපිටදී ගුණ කියන, නැති තැන අගුණ කියන) යම් මිතුරෙක් වේද, අපාය සහාය නම් (පව් කටයුතුවල යොදවන) යම් මිතුරෙක් වේද යන මේ අමිත්‍රයන්වූ මිත්‍ර ප්‍රතිරූපකයන් සතර දෙන, මෙසේ දැන නුවණ ඇති තැනැත්තේ බිය සහිත මාර්ගයක් මෙන් දුරින්ම දුරු කරන්නේය."

11. "ගෘහපති පුත්‍රය, හොඳ හිත ඇති මේ මිත්‍රයෝ සතර දෙනෙක් දතයුතු වෙත්. උපකාර නම් (හැම කටයුත්තකදීම පිටු නොපානා) හොඳ හිත ඇති මිත්‍රයෙක් දත යුතුයි. සමාන සුඛ දුක්ඛ, නම් (සැප දුක් දෙක්හි සමාන පැවතුම් ඇති) හොඳ සිතැති මිත්‍රයෙක් දතයුතුයි. අත්ථක්ඛායී නම් (අවැඩින් වළකා වැඩෙහි යොදවන) හොඳ සිතැති මිත්‍රයෙක් දත යුතුයි. අනුකම්පක, නම් (මිතුරුකම සලකා අනුකම්පා කරණ) හොඳ සිතැති මිත්‍රයෙක් දතයුතුයි.

"ගෘහපති පුත්‍රය, උපකාරක නම් හොඳ හිතැති මිත්‍රයා කරුණු සතරකින් දතයුතුයි. මත්වූ මිතුරා රකියි. මත්වූ මිතුරාගේ ධනය රකියි. භයක් පැමිණි මිතුරාට උපකාර වෙයි. කටයුත්තක් ඇති කල්හි දෙගුණයක් කොට වස්තුව දෙයි. ගෘහපති පුත්‍රය, උපකාර නම් හොඳ හිතැති මිතුරා මේ කරුණු සතරින්ද දතයුතුයි.

"ගෘහපති පුත්‍රය, සමාන සුව දුක් ඇති හොඳ හිතැති මිතුරා කරුණු සතරකින් දතයුතුයි. තමන්ගේ රහස් මිතුරාට කියයි. මිතුරාගේ රහස් හෙළිනොකරයි. මිතුරාට විපතක් පැමිණි කල්හි අත් නොහරියි. ඒ මිතුරාගේ යහපත සඳහා ජීවිතය පවා පුදනලද්දේ වෙයි. ගෘහපති පුත්‍රය, මේ කරුණු සතරින් සුව දුක් දෙක්හි සමාන පැවතුම් ඇති හොඳ හිතැති මිතුරා දතයුතුයි.

"ගෘහපති පුත්‍රය, කරුණු සතරකින් අත්ථක්ඛායී නම් හිත වැඩ කියන්නාවූ හොඳ හිතැති මිතුරා කරුණු සතරකින් දත යුතුයි. පව් කිරීමෙන් වළක්වයි. යහපත් කටයුත්තෙහි යොදවයි. නොඇසූ දෙය අස්වයි. දෙව්ලොව මග කියයි. ගෘහපති පුත්‍රය, මේ කරුණු සතරින් අත්ථක්ඛායී නම් හොඳ හිතැති මිතුරා දත යුතුයි.

"අනුකම්පා කරණ හොඳ හිතැති මිතුරා කරුණු සතරකින් දත යුතුයි. මිතුරාගේ පිරිහීමට සතුටු නොවෙයි. ඔහුගේ දියුණුවට සතුටු වෙයි. මිතුරාගේ නුගුණ කියන්නවුන් වළක්වයි. ගුණ කියන්නහුට ප්‍රශංසා කරයි. ගෘහපති පුත්‍රය, මේ කරුණු සතරින් අනුකම්පක නම් හොඳ හිතැති මිතුරා දත යුත්තේය"යි භාග්‍යවතුන්වහන්සේ මෙය කීවාහුය. ශාස්තෘවූ සුගතයන් වහන්සේ මෙය වදාරා නැවත මෙසේද වදාළෝය.

"උපකාර ඇත්තාවූ යම් මිත්‍රයෙක් වේද, සුවදුක් දෙක්හි සමව පවත්නාවූ යම් මිත්‍රයෙකුත් වේද, හිතවැඩ කියනසුලුවූ යම් මිත්‍රයෙකුත් වේද? අනුකම්පා ඇත්තාවූ යම් මිත්‍රයෙකුත් වේද

"යන මේ මිතුරන් සතරදෙනා නුවණ ඇත්තේ මෙසේ දැන හැඳින මව්කෙනෙක් ස්වකීය පුතෙකු සේවනය කරන්නාක් මෙන් යහපත් කොට සේවනය කරන්නේය.

"සීලයෙන් යුක්තවූ නුවණ ඇත්තේ දිලිසෙන ගිනි මෙන් බබලයි. මලෙන් රොන් ගන්නාවූ බමරෙකු මෙන් අනුන්ට පීඩාවක් නැතිව වස්තුව රැස්කරන්නහුගේ සම්පත් රැස්වීමට පැමිණෙත්. කුමක් මෙන්ද? ක්‍රමයෙන් වේයන් විසින් බඳිනු ලබන්නාවූ තුඹස වැඩෙන්නාක් මෙනි."

"මෙසේ දැහැමින් වස්තුව රැස්කොට ගිහිගෙයි විසීමට සමර්ථවූ පුද්ගල තෙමේ වස්තුව සතර කොටසකට බෙදන්නේය. හෙතෙම ඒකාන්තයෙන් මිතුරන් බැඳ ගනියි.

"එහි එක් කොටසකින් සම්පත් අනුභව කරන්නේය. දෙකොටසක් කර්මාන්ත පිණිස යොදන්නේය. සතරවන කොටස විපත් පැමිණි කල්හි ප්‍රයොජන වන්නේයයි නිදන් කොට තබන්නේය."

12. "ගෘහපති පුත්‍රය, කෙසේ නම් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ සදිසාවන් වසන්නේ (රකින්නේ) වේද, ගෘහපති පුත්‍රය, මේ දිසා සයක් වෙත්. මව්පියෝ නැගෙනහිර දිසාවයයි දත යුතුයි. ගුරුවරු දකුණු දිසාවයයි දතයුතුයි. අඹුදරුවෝ බස්නාහිර දිසාවයයි දතයුතුයි. යාලු මිත්‍රයෝ උතුරු දිසාවයයි දතයුතුයි. දැසි දස් කම්කරුවෝ යටදිසාවයයි දතයුතුයි. මහණ බමුණෝ උඩදිසාවයයි දතයුතුයි.

13. "ගෘහපති පුත්‍රය, නැගෙනහිර දිසාවවූ මව්පියෝ පුත්‍රයා විසින් කරුණු පසකින් උපස්ථාන කටයුතු වෙත්. මව්පියන් විසින් පොෂණය කරන ලද මම ඒ මව්පියන් පොෂ්‍ය කරන්නෙමි, ඒ මව්පියන්ගේ කටයුතු කරන්නෙමි. කුල පරම්පරාව පිහිටුවන්නෙමි. දායාදය පිළිපදිමි. (මව්පියන් සතු වස්තුව රැකගනිමි) තවද මිය පරලොව ගිය මව්පියන්ට දක්ෂිණාව දෙන්නෙමි. (පින් අනුමෝදන් කරවන්නෙමි) ගෘහපති පුත්‍රය, මේ කරුණු පසින් පුත්‍රයා විසින් උපස්ථාන කරනලද නැගෙනහිර දිසාවවූ මව්පියෝ දරුවන්ට කරුණු පසකින් අනුකම්පා කරත්. පවින් වළක්වත්. යහපතෙහි යොදවත්. සිල්ප ශාස්ත්‍රය උගන්වත්, සුදුසුවූ භාර්‍ය්‍යාවක් හා යොදවත්. සුදුසු කාලයෙහි දායාදය (මව්පියන් සතු වස්තුව) පාවා දෙත්. ගෘහපති පුත්‍රය, මේ කරුණු

පසින් පුත්‍රයා විසින් උපස්ථාන කරනලද නැගෙනහිර දිසාවවූ මව්පියෝ මේ කරුණු පසින් පුත්‍රයාට අනුකම්පා කරත්. මෙසේ ඒ පුත්‍රයා විසින් මේ නැගෙනහිර දිසාව වසන (රකින) ලද්දී නිර්භය වූවා වන්නීය.

14. "ගෘහපති පුත්‍රය, කරුණු පසකින් අතවැස්සා (ගෝලයා) විසින් දකුණු දිශාවවූ ගුරුවරයෝ උපස්ථාන කටයුතු වෙත්. දැක, උන් ආසනයෙන් නැගිටීමෙන්ද, උපස්ථාන කිරීමෙන්ද, ගුරුවරයාගේ වචන හොඳින් ඇසීමෙන්ද, කටයුතු වත් පිළිවෙත් කිරීමෙන්ද සකස්කොට ශිල්ප ඉගෙණීමෙන්ද (යන මෙයිනි) ගෘහපති පුත්‍රය, මේ කරුණු පසින් අතවැස්සා විසින් උපස්ථාන කරණ ලද්දාවූ දකුණු දිශාවවූ ගුරුවරු කරුණු පසකින් අතවැසියාට (ගෝලයාට) අනුකම්පා කරත්. යහපත් කොට හික්මවත්, හොඳින් උගන්වත්, (තමන් දත්) සියලු ශිල්පශාස්ත්‍ර හා ධර්මය මනාව කියා දෙන්නාහු වෙත්. මිත්‍රජනයා අතරෙහි කියා පෙන්වාදෙත්, දිශාවන්හි ආරක්ෂාව ඇතිකෙරෙත්, ගෘහපති පුත්‍රය, මේ කරුණු පසින් අතවැස්සා විසින් උපස්ථාන කරණ ලද්දාවූ දකුණු දිශාවවූ ගුරුවරු මේ කරුණු පසින් අතවැස්සාට අනුකම්පා කරත්. මෙසේ ඔහු විසින් මේ දකුණු දිසාව වසන (රකින) ලද්දී භය රහිත වූවා වේ.

15. "ගෘහපති පුත්‍රය, කරුණු පසකින් සැමියා විසින් බස්නාහිර දිසාවවූ භාර්‍ය්‍යා තොමෝ උපස්ථාන කටයුත්තීය. බුහුමන් කිරීමෙන්ද, අවමන් නොකිරීමෙන්ද, අන් අඹුවන් සේවනය නොකිරීමෙන්ද, සැප ඉසුරු පාවා දීමෙන්ද, අලංකාරයට සුදුසු ඇඳුම් පැළඳුම් දීමෙන්ද (යන මෙයිනි) ගෘහපති පුත්‍රය, මේ කරුණු පසින් සැමියා විසින් උපස්ථාන කරණලද බස්නාහිර දිසාවවූ භාර්‍ය්‍යාතොමෝ කරුණු පසකින් සැමියාට අනුකම්පා කරයි. හොඳින් කටයුතු පිළියෙල කරයි. පිරිවර ජනයාට හොඳින් සංග්‍රහකරයි පරපුරුෂයන් සේවනය නොකරයි. ස්වාමියා රැස්කළ වස්තුව ආරක්ෂාකරයි. සියලු කටයුතුවල දක්ෂවූවා අලස නොවෙයි. ගෘහපති පුත්‍රය, මේ කරුණු පසින් ස්වාමියා විසින් උපස්ථාන කරනලද බස්නාහිර දිසාවවූ භාර්‍ය්‍යා තොමෝ මේ කරුණු පසින් ස්වාමියාට අනුකම්පා කරයි. මෙසේ

මොහු විසින් මේ බස්නාහිර දිසාව වසන ලද්දී නිර්භයවූවා වේ.

16. "ගෘහපති පුත්‍රය, කරුණු පසකින් වනාහි කුල පුත්‍රයා විසින් උතුරු දිශාවවූ මිතුරු ජනයෝ උපස්ථාන කටයුත්තාහුය. දීමෙන්ද, ප්‍රිය වචනයෙන්ද, හිතවැඩ සැලසීමෙන්ද, සමානාත්මතාවයෙන්ද (තමන් හා සමාන කොට සැලකීමෙන්ද) නොරැවටීමෙන්ද (යන මෙයිනි.) ගෘහපති පුත්‍රය, මේ කරුණු පසින් වනාහි කුල පුත්‍රයා (යහපත් ගිහියා) විසින් උපස්ථාන කරනලද, උතුරු දිශාවවූ මිතුරු ජනයෝ මේ කරුණු පසකින් කුලපුත්‍රයාට අනුකම්පා කරත්. ප්‍රමාදවූවහු රකිත්. ප්‍රමාදවූ කුලපුත්‍රයාගේ (යහපත් ගිහියාගේ) වස්තුව රකිත්. භයවූවහුට පිහිට වෙත්. විපත් පැමිණිකල්හි අත් නොහරිත්. ඒ කුලපුත්‍රයාගේ අනික් පිරිසටද සැලකිලි කරත්. ගෘහපති පුත්‍රය, කුලපුත්‍රයා විසින් මේ කරුණු පසින් උපස්ථාන කරනලද උතුරු දිශාවවූ මිතුරු ජනයෝ මේ කරුණු පසින් කුලපුත්‍රයාට අනුකම්පා කරත්. මෙසේ ඔහු විසින් මේ උතුරු දිශාව වසන (රකින) ලද්දී, භය රහිත කරන ලද්දේ වේ.

17. "ගෘහපති පුත්‍රය, කරුණු පසකින් ස්වාමියා විසින් යටදිශාවවූ දාසි දාස කම්කරු ජනයෝ උපස්ථාන කටයුත්තාහුය. ශක්තිවූ පරිද්දෙන් කටයුතු නියමකිරීමෙන්ද, බත් වැටුප් දීමෙන්ද, ගිලන්වූකල උපස්ථාන කිරීමෙන්ද, අමුතු රසවත් ආහාර බෙදා දීමෙන්ද, සුදුසු කල දියයුතු දේ දීමෙන්ද (යන මෙයිනි) ගෘහපති පුත්‍රය, මේ කරුණු පසින් වනාහි ස්වාමියා විසින් උපස්ථාන කරන ලද්දාවූ යට දිශාවවූ දාසි දාස කම්කරුවෝ කරුණු පසකින් ස්වාමියාට අනුකම්පා කරත්. පළමු කොට නැගී සිටින්නාහුද වෙත්. පසුව නිදන්නාහුද වෙත්. දුන් දෙය පමණක් ගන්නාහුද වෙත්. හොඳින් කර්මාන්ත කරත්. ගුණ කීර්තිය පතළකර හරින්නාහුද වෙත්. ගෘහපති පුත්‍රය, මේ කරුණු පසින් වනාහි ස්වාමියා විසින් උපස්ථාන කරනලද යට දිසාවවූ දාසි දාස කම්කරුවෝ මේ කරුණු පසින් ස්වාමියාට අනුකම්පා කරත්. මෙසේ මොහු විසින් මේ යට දිසාව වසන (රකින) ලද්දී භය රහිත කරනලද්දී වේ.

18. "ගෘහපති පුත්‍රය, කරුණු පසකින් වනාහි කුලපුත්‍රයා විසින් උඩ දිශාවවූ මහණ බමුණෝ උපස්ථාන කටයුත්තාහු වෙත්. මෛත්‍රීසහගතවූ කයින් කරන කර්මයෙන්ද, මෛත්‍රී සහගතවූ වචනයෙන් කරන කර්මයෙන්ද, මෛත්‍රීසහගතවූ හිතින් කරන කර්මයෙන්ද, (හෙවත් මෙත් සිත් පෙරටු සිතිවිලිවලින්ද,) නොවසන ලද දොරටු ඇති බැවින්ද, ආහාර පානාදිය දීමෙන්ද, (යන මෙයිනි.) ගෘහපතිපුත්‍රය, මේ කරුණු පසින් වනාහි කුලපුත්‍රයා විසින් උපස්ථාන කරන ලද උඩ දිශාවවූ මහණ බමුණෝ කරුණු සයකින් කුලපුත්‍රයාට අනුකම්පා කරත්. පව්කම්වලින් වළක්වත්. සුචරිතයෙහි යොදවත්, යහපත් සිතින් අනුකම්පා කරත්. නොඇසූ ධර්මය අසවත්, ඇසූ ධර්මය පිරිසිදු කරත්. දෙව්ලොවට යන මග කියා දෙත්. ගෘහපති පුත්‍රය, මේ කරුණු පසින් කුලපුත්‍රයා විසින් උපස්ථාන කරන ලද උඩ දිශාවවූ මහණ බමුණෝ මේ කරුණු පසින් කුලපුත්‍රයාට අනුකම්පා කරත්. මෙසේ මොහු විසින් උඩ දිශාව වසන (රකින) ලද්දී නිර්භය කරන ලද්දී වේය"යි. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළාහුය. ශාස්තෘවූ සුගතයන් වහන්සේ මෙය දෙශනාකර වදාරා නැවත මෙසේ දෙශනා කළාහුය.

"මව්පියෝ නැගෙනහිර දිශාවය, ගුරුවරු දකුණු දිශාවය, අඹුදරුවෝ බස්නාහිර දිශාවය, මිතුරු ජනයෝ උතුරු දිසාවය.

"දැසි දස් කම්කරුවෝ යට දිශාවය, මහණ බමුණෝ උඩ දිශාවය, මේ දිසාවන්ට නමස්කාර කරන්නේ නම්, ඒ ගෘහස්ථයා කුලයෙහි (ගිහිගෙයි) විසීමට සමර්ථ වන්නේය.

"නුවණැත්තාවූ සීලයෙන් යුක්තවූ මොලොක් ගති ඇති, වැටහෙන නුවණින් යුත් යටහත් පැවතුම් ඇති තදගති නැත්තාවූ එබඳු තැනැත්තේ සැප ලබන්නේය.

"නොපසුබට වීර්යය ඇති අලස නොවූ තැනැත්තේ විපත්වලදී කම්පා නොවේද, සිදුරු නොවූ (කැලැල් රහිත) පැවතුම් ඇති නුවණ ඇත්තාවූ එබඳු තැනැත්තේ සැප ලබන්නේය.

"සංග්‍රහ කරන්නාවූ මිත්‍රයන් ඇතිකරන්නාවූ (මිත්‍රයන්ගේ) වචන දන්නාවූ මසුරුමල දුරුකළාවූ, (හිත වැඩට) පමුණුවන්නාවූ විශෙෂයෙන් හික්මවන්නාවූ නැවත නැවත හික්මවන්නාවූ එබඳු තැනැත්තේ යසස් ලබන්නේය."

"දීමද, ප්‍රිය වචන කීමද, අනුන්ට වැඩ පිණිස හැසිරීමද, තමන්සේ අනුන් සැළකීමද, යන මේ ලොකයෙහි ධර්මයන්හි සුදුසු පරිද්දෙන් ඒ ඒ තන්හි පිළිපැදීම යන යමක් වෙයිද

"ලොකයෙහි මේ සංග්‍රහයෝ ගමන්කරන්නාවූ රථයාගේ කඩඇනය මෙනි. මේ සතර සංග්‍රහ වස්තු නොවනාහු නම්, මව දරුවන් කරණ කොට බුහුමනක් හෝ පිදීමක් හෝ නොලබන්නේය. පියාද දරුවන් කරණ කොට (එය) නොලබන්නේය.

"යම් හේතුවකින් නුවණැත්තෝ මේ සතර සංග්‍රහ වස්තූන් හොඳාකාර සලකා බලත්ද, එහෙයින් ඔව්හු මහත් බවට පැමිණෙත්. පැසසිය යුත්තෝද වෙත්."

**19.** මෙසේ වදාළ කල්හි සිගාලක නම් ගෘහපති පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "ස්වාමීන් වහන්ස ඉතා යහපත, ස්වාමීන් වහන්ස (මේ ධර්මය) ඉතා යහපත, ස්වාමීන් වහන්ස, යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ යම්සේද, වසා තබන ලද්දක් වැසුම් හැර දක්වන්නේ හෝ යම්සේද, මං මුළාවූවෙකුට මග කියන්නේ හෝ යම්සේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි, කළුවරෙහි තෙල්පහනක් දරන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්ම දේශනා කරන ලද්දේය. ස්වාමීන් වහන්ස, ඒ මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, භික්ෂු සංඝයාද, සරණ යමි. භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් ජීවිතාන්තය දක්වා සරණ ගිය උපාසකයෙකැයි පිළිගන්නා සේක්වා"යි කීයේය.

**තිස් එක් වැනිවූ සිගාලක සූත්‍රය නිමි.**

---

# 32. ආටානාටිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහිවූ ගිජ්ජකූට පර්වතයෙහි වැඩ වාසය කරති. එකල්හි සතර වරම් මහ රජදරුවෝ මහත්වූ යක්ෂ සේනාවෙන්ද, මහත්වූ ගාන්ධර්ව සේනාවෙන්ද, මහත්වූ කුම්භණ්ඩ සේනාවෙන්ද, මහත්වූ නාගසේනාවෙන්ද, සතර දිසාවෙහි ආරක්ෂා පිහිටුවා, සතර දිසාවෙහි බල සෙනග පිහිටුවා, සතර දිසාවෙහි රැකවල් ලවා, රාත්‍රියේ ප්‍රථම භාගය ඉක්ම ගිය කල්හි, (තමන්ගේ) ශරීර ආලොකයෙන් හාත්පස ගිජ්ජකූට පර්වතය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතන්හි පැමිණියා හුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට හොඳාකාර වැඳ එක පැත්තකින් හුන්නාහුය. ඒ යක්ෂයෝද සමහර කෙනෙක් භාග්‍යවතුන් වහන්සේට වැඳ එක පැත්තක හුන්නාහුය. සමහර කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූවාහුය. සතුටු විය යුතු, සිහි කටයුතු කථාව කොට නිමවා එක පැත්තක හුන්නාහුය. සමහර කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ දෙසට දොහොත් මුදුන්දී වැඳ එක පැත්තකටවී හුන්නාහුය. සමහර කෙනෙක් නාම ගොත්‍රය කියා එක පැත්තක හුන්නාහුය. එකපැත්තක හුන්නාවූ වෛශ්‍රවණ නම්වූ මහරජ තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීයේය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට අසතුටුවූ උසස් (බලවත්) යක්ෂයෝද ඇත්තාහුය, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට සතුටුවූ උසස් (බලවත්) යක්ෂයෝද ඇත්තාහුමය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට අසතුටුවූ මද්ධ්‍යම ආනුභාව ඇති යක්ෂයෝත් ඇත්තාහුමය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට සතුටුවූ මද්ධ්‍යම ආනුභාව ඇත්තාවූ යක්ෂයෝත් ඇත්තාහුමය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට අසතුටුවූ පහත්වූ යක්ෂයෝත් ඇත්තාහුමය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට සතුටුවූ පහත් යක්ෂයෝත් ඇත්තාහුමය. ස්වාමීනි, බොහෝ සෙයින් යක්ෂයෝ භාග්‍යවතුන් වහන්සේට අසතුටු වූවාහුමය. එයට හෙතු කවරේද? ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වනාහි

සතුන් මැරීමෙන් වැළකීම පිණිස ධර්මය දෙශනා කරන්නාහ. සොරකම් කිරීමෙන් වැළකීම පිණිස ධර්මය දෙශනා කරන්නාහ. කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීම පිණිස ධර්මය දෙශනා කරන්නාහ. බොරු කීමෙන් වැළකීම පිණිස ධර්මය දෙශනා කරන්නාහ. මත් බවට හා ප්‍රමාදයට කාරණාවූ සුරාපානයෙන් වැළකීම පිණිස ධර්මය දෙශනා කරන්නාහ. ස්වාමීනි, බොහෝ සෙයින් යක්ෂයෝ සතුන් මැරීමෙන් නොවැළක්කාහුමය. සොරකම් කිරීමෙන් නොවැළක්කාහුමය. කාමයන්හි වරදවා හැසිරීමෙන් නොවැළක්කාහුමය. බොරු කීමෙන් නොවැලක්කාහුමය. මත්බවට ප්‍රමාදයට කාරණාවූ සුරාපානයෙන් නොවැළැක්කාහුමය. ඒ යක්ෂයන්ට ඒ ධර්මදෙශනාව අප්‍රිය වේ. හිත් සතුටු වන්නේ නොවේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ කැලෑවෙහි වූද ගම් සීමාව ඉක්මවූ වන සේනාසනවූද (කැලෑවෙහි) ඉතා දුරවූද නිශ්ශබ්ද වූද කලබල නැත්තාවූද මිනිසුන්ගෙන් තොරවූ සුලඟ ඇත්තාවූද මනුෂ්‍යයන්ගේ රහස් කටයුතුවලට යොග්‍යවූද, හිත එකඟකර ගැනීමට සුදුසුවූද, සේනාසනයන් (වසනතැන්) සේවනය කරති.

ඒ තන්හි නිතර වාසය කරන්නාවූ මහා බලසම්පන්නවූ යක්ෂයෝ ඇත්තාහුය. යම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවෙහි නොසතුටු වන්නාහුද ඔවුන්ගේ සතුට පිණිස ස්වාමීනි, භික්ෂුන්ගේද භික්ෂුණීන්ගේද උපාසකවරුන්ගේද උපාසිකාවන්ගේද පාලනය පිණිසද ආරක්ෂාව පිණිසද, වෙහෙස නොවන පිණිසද, පහසු හැසිරීම පිණිසද භාග්‍යවතුන් වහන්සේ (ආටානාට නම් නගරයෙහි බඳින ලද හෙයින්) මේ ආටානාටිය (නම්වූ) පිරිත පිළි ගත මැනව"යි දැන්වූයේය. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව පිළි ගත්හ. එවිට වෙසවුණු මහ රජ තෙම භාග්‍යවතුන් වහන්සේගේ පිළි ගැණීම දැන ඒ වේලාවෙහි මේ ආටානාටිය පිරිත කීයේය.

3. "පසැස් ඇත්තාවූ සොභාමත්වූ විපස්සී නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා. සියලු සත්වයන් කෙරෙහි පතළ කරුණාවෙන් යුක්තවූ සිඛී නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"කෙලෙස් විනාස කළාවූ කෙලෙසුන් තවන වීර්යය ඇති වෙස්සභූ නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා. මාරයන් යටත් කළාවූ කකුසඳ නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.

"සියලු පව් අහක් කළාවූ වැස නිමවනලද බ්‍රහ්මචර්‍ය්‍යය ඇති, කොනාගමන නම් සර්වඥයන් වහන්සේට නමස්කාරවේවා

"සියලු කෙලෙසුන්ගෙන් මිදුනාවූ කාශ්‍යප නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.

"යම් තථාගතකෙනෙක් සියලු සංසාරදුක් දුරුකරන්නාවූ මේ ධර්මය දෙශනා කළාහුද ශ්‍රීමත්වූද ශාක්‍ය පුත්‍රවූ ඒ ගෞතම සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.

"ලොකයෙහි යම් රහත් කෙනෙක් පිරිනිවියාහුද තත්වූ පරිද්දෙන් දැක වදාළාහුද ඒ රහත්වූ පිසුණු (අර්ථ නැති වචන) නොකියන්නාහ. මහත් බවට පැමිණියාහ. භය නැති කළහ. (උන්වහන්සේලාට නමස්කාර වේවා.

"අෂ්ටවිද්‍යා පසළොස් චරණයන්ගෙන් (නුවණ අට සහ චරණ පසලොසින්) යුක්තවූ මහත් බවට පැමිණියාවූ භය නැති කළාවූ දෙවි මිනිසුන්ට හිතවූ යම් ගෞතම සර්වඥයන් වහන්සේ කෙනෙකුට නමස්කාර කෙරේද්ද, උන්වහන්සේටද නමස්කාර වේවා.

4. "දිලිසෙන මහත් මණ්ඩල ඇති, සූර්‍ය්‍ය තෙම යම් තැනකින් උදාවේද, යමෙක් උදාවන කල්හි රාත්‍රියද අන්තර්ධාන වේද, යම් දිසාවකින් හිරු උදාවූ කල්හි දවස යයි කියනු ලැබේද, එහි ගැඹුරුවූ පැතුරුණාවූ ජලය ඇති සමුද්‍රයයි කියනලද දිය විලෙක්ද ඇත්තේය.

"ඒ ස්ථානයෙහි පැතුරුණාවූ ජලය ඇති ඒ දියවිල සමුද්‍රයයි, මෙසේ දනිත්. මේ නිසා ඒ දිසාවට නැගෙනහිර දිසාවයයි ජනයා කියන්නේය. යස පිරිවර ඇත්තාවූ ඒ මහරජ තෙම යම් දිසාවක් ආරක්ෂා කෙරේද,

"ගාන්ධර්වයන්ට අධිපතිවූ ඔහු ධෘතරාෂ්ට්‍රය නම් වන්නේය. ඒ මහරජ තෙම ගාන්ධර්වයන් විසින් පිරිවරණ ලද්දේ නැටුම් ගී කීම්වලින් සිත් අලවා වෙසෙයි.

"ඉන්ද්‍රය යන නම් ඇත්තාවූ මහත් බල ඇත්තාවූ අනූ එක් දෙනෙක් පමණවූ ඔහුගේ සමාන නම් ඇත්තාවූ බොහෝ පුත්‍රයෝද ඇත්තාහයි මා විසින් අසන ලදී.

"ඔවුහුද මහත් බවට පැමිණියාවූ විශාරදවූ බුද්ධ නම්වූ (සූර්‍ය්‍ය වංශයෙහි උපන් හෙයින්) ආදිච්චබන්ධු නම් වූ සර්වඥයන්වහන්ස, ශ්‍රේෂ්ඨ පුරුෂයන්වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවයි කියා දුරදීම නමස්කාර කරති.

"දක්ෂවූ සර්වඥතාඥානයෙන් මහජනයා බලන්නෙහි යයි කියා අමනුෂ්‍යයෝද නුඹවහන්සේට වඳිති. මේ වැඳීම අප විසින් නැවත නැවත අසනලදී. එහෙයින් මෙසේ කියම්හ.

"ගෞතම නම්වූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරවුදැයි' (අප විසින් විචාරණ ලද යක්ෂයෝ) ගෞතම සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හයි (කියති.) විද්‍යාචරණ (නුවණ හා සීල සමාධි) ගුණයෙන් යුක්තවූ ගෞතම බුදුන් වහන්සේට අපි නමස්කාර කරම්හයි (කීවාහුය.)

5. "යම් දිශාවකින් මළමිනි ගෙනයනු ලැබෙත්ද? පිසුණු (කේලාම්) කියන්නාවූ ඉදිරිපිට නැති තැන නින්දා කරන්නාවූ, ප්‍රාණඝාත කරන ගත ඇති රෞද්‍රවූ ඝොර සිත් ඇත්තාවූ වඤ්චාකාරීවූ ජනයෝ (යම් දිශා භාගයකින් ගෙනයනු ලැබෙතියි කියත්ද,

"යස පිරිවර ඇත්තාවූ ඒ මහ රජතෙම යම් දිශාවක් ආරක්ෂා කෙරේද, ජනතෙම ඒ දිශාවට දකුණු දිශාවයයි කියන්නේය. මෙයින් ඒ දිශාව දකුණු දිශා නම් වන්නීය.

"කුම්භාණ්ඩයන්ට අධිපතිවූ විරූඪය යන නම් ඇති ඒ රජතෙම කුම්භාණ්ඩයන් විසින් පිරිවරණ ලද්දේ නැටුම් ගී කීම් වලින් සිත් අලවා වාසය කරයි.

"ඒ රජහුගේ එක නම් ඇති බොහෝවූ පුත්‍රයෝද ඇත්තාහයි මා විසින් අසන ලදී. මහත් බල ඇති ඉන්ද්‍ර නම් ඇත්තාවූ ඔව්හුද අනූඑක් දෙනෙක් වන්නාහ. ඒ පුත්‍රයෝද ආදිච්චබන්ධුවූ මහත් බවට පැමිණියාවූ පහවූ භය ඇති සර්වඥයන් වහන්සේ දැක දුරදීම පුරුෂ ශ්‍රේෂ්ඨයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා, පුරුෂ උත්තමයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවායි නමස්කාර කරති.

"සර්වඥතාඥානයෙන් ලොකය බලනසේක (එහෙයින්) අමනුෂ්‍යයෝද ඔබ වහන්සේට වඳිති. මේ වචනය අප විසින් නිතර අසන ලදී. එහෙයින් මෙසේ කියම්හ.

"ගෞතම නම්වූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරව්දැයි, (අසම්හ, එසේ අප විසින් අසන ලද යක්ෂයෝ) ගෞතම නම් බුදුන්ට නමස්කාර කරම්හ. විද්‍යාචරණ (නුවණ සහ සීල සමාධි) ගුණයෙන් යුක්තවූ ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හයී,' (කියති.)

**6.** "යම් දිශාවෙක්හි, දිලිසෙන මහත් මණ්ඩල ඇති සූර්‍ය්‍යයා බැසයයිද, සූර්‍ය්‍යයා බැස ගිය කල්හි දවල් කාලය නැති වේද"

"යම් සූර්‍ය්‍යයෙකු බැස ගිය කල්හි රාත්‍රියයි කියනු ලැබේද, ඒ සූර්‍ය්‍යයා බැස ගිය තන්හි (ඇත්තාවූ) ඒ විල ගැඹුරුවූ පැතුරුණාවූ ජලය ඇති සමුද්‍රය නම් වන්නේය.

"ඒ සූර්‍ය්‍යයා බැස ගිය තන්හි (ඇත්තාවූ) ඒ විල පැතුරුණාවූ ජලය ඇත්තාවූ සමුද්‍රයයි දනිති. මෙයින් ඒ දිශාව බස්නාහිර දිශාවයයි ජනතෙම මෙසේ කියන්නේය.

"යස පිරිවර ඇත්තාවූ යම් මහරජෙක් ඒ දිශාව ආරක්ෂා කෙරේද, නාගයන්ට අධිපතිවූ විරූපාක්ෂ නම්වූ ඒ වරම් රජ තෙම නාගයන් විසින් පිරිවරණ ලද්දේ නැටුම් ගී කීම්වලින් සිත් අලවා වාසය කරයි.

'ඒ වරම්රජහුගේ එක නම ඇති බොහෝවූ පුත්‍රයෝද ඇත්තාහයි මා විසින් අසන ලදී. මහත් බල ඇත්තාවූ ඉන්ද්‍ර නම් ඔවුහු අනු එක් දෙනෙක් වන්නාහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"ඔව්හුද සූර්‍ය්‍යවංශයට නෑවූ මහත් බවට පැමිණියාවූ පහවූ භය ඇති සර්වඥයන් වහන්සේ දැක දුරදීම පුරුෂ ශ්‍රෙෂ්ඨයන්වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා, පුරුෂොත්තමයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවායි නමස්කාර කරත්.

"දක්ෂවූ සර්වඥතාඥානයෙන් ජනයා බලන්නෙහියයි කියා අමනුෂ්‍යයෝද ඔබ වහන්සේට නමස්කාර කරති. මේ කාරණය අප විසින් නිතර අසනලදී. එහෙයින් මෙසේ කියම්හ."

"(තොපි) ගෞතම නම්වූ සර්වඥයන්වහන්සේට නමස්කාර කරව්දැයි (අප විසින් අසනලද යක්ෂයෝ) 'ගෞතම නම්වූ සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හ. ඒ විද්‍යාචරණ ගුණයෙන් යුක්තවූ ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හයි' කියති.

7. "යම් දිසාවෙක්හි රම්‍යවූ උතුරුකුරු දිවයින පිහිටියේද, දැකුම් කටයුතුවූ මහාමෙරු පර්වතය වන්නේද, ඒ උතුරුකුරු දිවයිනෙහි වස්ත්‍රාභරණාදිය මගේය මගේ යයි ගැනීමක් නැත්තාහු භාර්‍ය්‍යා පරිග්‍රහයක් (භාර්‍ය්‍යාවන් අයත්කර ගැන්මක්) නැත්තාවූ මනුෂ්‍යයෝ උපදිත්.

"ඒ මිනිස්සු වී නොවපුරන්නාහ. සීසෑම පිණිස නගුල් කෙතට නොගෙනියත්. ඒ මනුෂ්‍යයෝ නොසානා ලද භූමියෙහි හටගෙණ පැසුනාවූ ඇල්සාල් බත් අනුභව කරත්.

"කුඩු නැත්තාවූද පොතු නැත්තාවූද පිරිසිදුවූ සුවඳ ඇති සහල් ඵල කොට ඇති හැල් රන්සැළියෙහි ලා (ජොති පාසාණ නම් ගල් උණුසුමෙන්) පිස ඒ සැලියෙන් ගත් කෑම කති.

"ඔව්හු ගවදෙනකු එක් කුර ඇති වාහනයක් කොට දිසානුදිසාවන්හි සංචාරය කරති. සිව්පා සතෙකු එක් කුර ඇති වාහනයක් කොට දිසානුදිසාවන්හි සංචාරය කරති.

"ස්ත්‍රියක් වාහනය කොට දිසානුදිසාවන්හි සංචාරය කරති. පුරුෂයෙකු හෝ වාහනයකොට දිසානුදිසා වන්හි හැසිරෙත්.

"තරුණියක් වාහනය කොට දිසානුදිසාවන්හි සංචාරය කරති. තරුණයෙක් වාහනය කොට දිසානුදිසාවන්හි සංචාරය කරති.

"ඒ රජහුගේ පිරිවරවූ ඔවුහු වාහනවල නැග සියලු දිසා වටකොට අවිදිති. යස පිරිවර ඇත්තාවූ වෙසවුණු මහ රජහට ඇත් යානද, අස්ව යානද, දිව්‍ය යානද, ප්‍රාසාදද, සිවිගෙවල්ද, උඩුමහල් ගෙවල්ද රන්සිවි ගෙවල්ද වන්නාහ.

"ඒ රජහට අහස්හි (උස් ස්ථානවල හෝ උසට) මවන ලද ආටානාට, කුසිනාට, පරකුසිනාට, නාටපුරිය, පරකුසිතනාට යන නගරයෝ වූවාහුය.

උතුරු දිශාවෙන් කපීවන්ත නම් නුවරෙක, ඊට බස්නාහිර දිසාවෙහි ජනොඝය, නවනවුතියය, අම්බර අම්බරවතියය, යන නගර හා ආළකමන්දා නම් රාජධානියද වන්නාහුය.

"නිදුකාණන් වහන්ස, කුවෙර නම් මහ රජහුගේ විසාණා නම් රාජධානියක්ද ඇත්තීය. ඒ කාරණයෙන් කුවෙර නම් මහ රජතෙම වෛශ්‍රවණයයි කියනු ලැබේ.

"වෙන වෙනම කරුණු පරීක්ෂාකර කියන්නාවූ තතොලාය, තත්තලාය, තතොතලාය, ඔජසිය, තෙජසිය, තතොජසිය, සූරය, රාජය, අරිෂ්ටය, නෙමිය යන යක්ෂයෝ දොළොස් දෙනෙක් වෙති.

"යමකින් ජලය ගෙණ වර්ෂාව වසීද, වර්ෂාව යමකින් පැතිරේද, ඒ රාජධානියෙහිවූ විලද ධරණී නම් වන්නීය. ඒ විල අද්දර යක්ෂයෝ නිතර රැස් වන භගලවතී නම් සභා ශාලාවද වන්නීය.

ඒ ශාලාව වටේට නිතර ගෙඩි ඇත්තාවූද නොයෙක් කුරුළු සමූහයාගෙන් ගැවසුණාවූද මොනරුන් කොස්වා ලිහිනින් හා කෝකිල ආදී පක්ෂීන් විසින්ද පවත්වන ලද සිත් පිනවන නාද ඇති වෘක්ෂයෝ ඇත්තාහ.

"තවද පොකුණෙහි නාද කරන ජීවඤ්ජීවක නම් කුරුල්ලෝද උට්ඨවචිත්තක නම් කුරුල්ලෝද වන කුකුලෝද

පියුම්වනයෙහි රන්වන් කකුළුවෝද, තල් රෙහෙරුද, හැසිරෙන්නාහ.

"මේ පොකුණෙහි ගිරා සැළලිහිණින්ගේ ශබ්ද ඇත්තේය. දණ්ඩ මාණවක නම් පක්ෂීහුද හැසිරෙන්නාහ. ඒ කුවෙර නම් මහ රජහුගේ පොකුණ හැම කල්හි එකම ආකාරයෙන් බබලන්නීය.

"යස පිරිවර ඇත්තාවූ ඒ මහ රජතෙම යම් දිසාවක් ආරක්ෂා කෙරේද ඒ දිසාව උතුරු දිසාවයයි මෙසේ ජනතෙම ඒ දිසාවට කියන්නේය.

"යක්ෂයන්ට අධිපතිවූ කුවෙර යන නමක් ඇත්තාවූ ඒ වරම් රජතෙම යක්ෂ සේනාවන් විසින් පිරිවරනලද්දේ නැටුම් ගී කීම්වලින් සිත් අලවා වාසය කරන්නේය.

"ඒ රජහුගේ බොහෝ පුත්‍රයෝද, සමාන නම් ඇත්තාහයි, මා විසින් අසන ලදී. මහත්වූ බල ඇති ඉන්ද්‍ර නම්වූ ඔව්හු අනූඑක් දෙනෙක් වෙති.

"ඔව්හුද ප්‍රබුද්ධවූ ආදිත්‍ය බන්ධුවූ මහත්බවට පැමිණියාවූ පහවූ භය ඇති සර්වඥයන්වහන්සේ දුරදීම දැක පුරුෂ ශ්‍රේෂ්ඨයන් වහන්ස, නුඹවහන්සේට නමස්කාර වේවා. පුරුෂොත්තමයන් වහන්ස, නුඹවහන්සේට නමස්කාර වේවායි නමස්කාර කරත්.

"දක්ෂවූ සර්වඥතා ඥානයෙන් ජනයා බලන්නෙහියයි අමනුෂ්‍යයෝද නුඹ වහන්සේට වඳිති. මේ කාරණය අප විසින් නිතර අසනලදී. එහෙයින් මෙසේ කියම්හ.

"ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරව්දැයි (අසන ලද්දාවූ ඔව්හු) ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරම්හ. විද්‍යාචරණ ගුණයෙන් යුක්තවූ ගෞතම සර්වඥයන් වහන්සේට නමස්කාර කරම්හයි කියති."

8. නිදුකාණන්වහන්ස, ඒ මේ ආටානාටිය පිරිත වනාහි භික්ෂූන්ටද, භික්ෂුණීන්ටද, උපාසකවරුන්ටද, උපාසිකාවරුන්ටද, ආරක්ෂාව පිණිසද සැපසේ විසීම පිණිසද නොවෙහෙසීම පිණිසද වන්නීය. නිදුකාණන්වහන්ස, යම් කිසි භික්ෂුවක් විසින් හෝ භික්ෂුණියක් විසින් හෝ උපාසකයෙකු විසින් හෝ උපාසිකාවක් විසින් හෝ මේ ආටානාටිය නම් ආරක්ෂාව යහපත්ව ඉගෙන දැනගන්නා ලද්දීද, අක්ෂර පද නොපිරිහෙලා සම්පූර්ණකොට ඉගෙන ගන්නා ලද්දීද, ඉදින් යම් අමනුෂ්‍යාවූ යක්ෂයෙක් හෝ යක්ෂණියක් හෝ යක්ෂපොතකයෙක් හෝ යක්ෂ පොතිකාවක් හෝ යක්ෂ මහා මාත්‍යයෙක් හෝ යක්ෂ පිරිසෙහි වූවෙක් හෝ යක්ෂ වැඩකරුවෙක් හෝ ගාන්ධර්වයෙක් හෝ ගාන්ධර්ව ස්ත්‍රියක් හෝ ගාන්ධර්ව පොතකයෙක් හෝ ගාන්ධර්ව පොතිකාවක් හෝ ගාන්ධර්ව මහාමාත්‍යයෙක් හෝ ගාන්ධර්ව පිරිසෙහි වූවෙක් හෝ ගාන්ධර්ව වැඩකරුවෙක් හෝ කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩියක් හෝ කුම්භාණ්ඩ පොතකයෙක් හෝ කුම්භාණ්ඩ පෝතිකාවක් හෝ කුම්භාණ්ඩ මහාමාත්‍යයෙක් හෝ කුම්භාණ්ඩ පිරිසෙහි වූවෙක් හෝ කුම්භාණ්ඩ වැඩකාරයෙක් හෝ නාගයෙක් හෝ නාගිනියක් හෝ නාග පොතකයෙක් හෝ නාග පොතිකාවක් හෝ නාග මහාමාත්‍යයෙක් හෝ නාග පිරිසෙහි වූවෙක් හෝ නාග මෙහෙකරුවෙක් හෝ නපුරු සිත් ඇතිව, භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ උපාසකයකු හෝ උපාසිකාවක් හෝ යන්නහු පසුපස්සේ යන්නේ හෝ වේද සිටියහු ළඟ සිටින්නේ හෝ වේද, හිඳින්නහු ළඟ හිඳින්නේ හෝ වේද, නිදාගන්නහු ළඟ නිදා ගන්නේ හෝ වේද, නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙම මාගේ ගම්වල හෝ නියම් ගම්වල හෝ සත්කාරයක් හෝ ගරු කිරීමක් හෝ නොලබන්නේය. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙම මාගේ ආළකමන්දා නම්වූ රාජධානියෙහි වාසය කිරීමට තැනක් හෝ ස්ථිර වාසයක් හෝ නොලබන්නේය. නිදුකාණන්වහන්ස, ඒ අමනුෂ්‍ය තෙම මාගේ යක්ෂයන්ගේ සමාගමට යන්ටද නොලබන්නේය. නිදුකාණන්වහන්ස, තවද ඔහු අමනුෂ්‍යයෝ ආවාහ විවාහයන්ට නුසුදුස්සකුද කරන්නාහුය.

නිදුකාණන්වහන්ස, තවද ඔහුට අමනුෂ්‍යයෝ ඔහුගේ ආත්මභාවය දක්වා සම්පූර්ණ පද ශබ්ද ඇති අපහාස වචනවලින් නින්දා කරන්නාහුය. නිදුකාණන්වහන්ස, තවද ඔහුගේ හිසෙහි අමනුෂ්‍යයෝ හිස්වූ ලොහ පාත්‍රයක්ද මුනින් තමන්නාහුය. නිදුකාණන්වහන්ස, තවද ඔහුගේ හිසද සත් කඩක් කොට පලන්නාහුය.

**9.** නිදුකාණන්වහන්ස. රෞද්‍රවූ නපුරු ගති ඇති එකට එක කරන්නාවූ අමනුෂ්‍යයෝ ඇත්තාහුය. ඒ අමනුෂ්‍යයෝ සතරවරම් රජදරුවන්ගේ (වචනය) නොඅදහත්. සතරවරම් මහරජදරුවන්ගේ අමාත්‍යයන්ගේ වචනය නොපිළිගනිති. යක් සෙනෙවියන් වෙනුවට සිටින්නන්ගේ වචනය නොපිළිගනිති. නිදුකාණන්වහන්ස, ඒ අමනුෂ්‍යයෝ සතරවරම් මහ රජදරුවන්ට අකීකරු වූයෝයයි කියනු ලැබෙත්. යම්සේ මගධරටට අධිපතිවූ රජහුගේ රටෙහි සොරු වෙත්ද, ඒ සොරු මගධ රටට අධිපතිවූ රජහුගේ වචනය නොපිළිගනිති. මගධ රජහුගේ අමාත්‍යයන්ගේ වචනය නොපිළිගනිති. මගධ රජහුගේ අමාත්‍යයන් වෙනුවට සිටින පුරුෂයන්ගේ වචනය නොපිළිගනිති. නිදුකාණන්වහන්ස, ඒ මහසොරහු වනාහි මගධ රජහට අකීකරු වූවෝ නම් වෙත්යයි කියනු ලැබෙත්.

නිදුකාණන්වහන්ස, එපරිද්දෙන්ම නපුරු ගති ඇති රෞද්‍රවූ එකට එක කරන්නාවූ අමනුෂ්‍යයෝ ඇත්තාහුය. ඒ අමනුෂ්‍යයෝ සතර වරම් මහ රජදරුවන්ගේ වචනය නොපිළිගනිත්. වරම් මහ රජදරුවන්ගේ සෙනෙවියන්ගේ වචනය නොපිළිගනිති. වරම් රජදරුවන්ගේ සෙනෙවියන් වෙනුවට සිටින පුරුෂයන්ගේ වචනය නොපිළිගනිත්. නිදුකාණන්වහන්ස, ඒ මේ අමනුෂ්‍යයෝ වරම් රජදරුවන්ට අකීකරු වූවෝයයි කියනුලැබෙත්. නිදුකාණන් වහන්ස, යම් කිසි අමනුෂ්‍ය යක්ෂයෙක් හෝ යක්ෂනියක් හෝ යක්ෂ පොතකයෙක් හෝ යක්ෂ පොතිකාවක් හෝ යක්ෂ මහාමාත්‍යයෙක් හෝ යක්ෂ පිරිසෙහි වූවෙක් හෝ යක්ෂ වැඩ කාරයෙක් හෝ ගන්ධර්වයෙක් හෝ ගන්ධර්ව ස්ත්‍රියක් හෝ ගන්ධර්වපොතකයෙක් හෝ ගන්ධර්ව පොතිකාවක් හෝ

ගන්ධර්ව මහාමාත්‍යයෙක් හෝ ගන්ධර්ව පිරිසෙහි වූවෙක් හෝ ගන්ධර්ව වැඩකරුවෙක් හෝ කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩියක් හෝ කුම්භාණ්ඩ පොතකයෙක් හෝ කුම්භාණ්ඩ පොතිකාවක් හෝ කුම්භාණ්ඩ මහාමාත්‍යයෙක් හෝ කුම්භාණ්ඩ පිරිසෙහි වූවෙක් හෝ කුම්භාණ්ඩ වැඩකරුවෙක් හෝ නාගයෙක් හෝ නාගිනියක් හෝ නාග පොතකයෙක් හෝ නාග පොතිකාවක් හෝ නාගමහමාත්‍යයෙක් හෝ නාග පිරිසෙහි වූවෙක් හෝ නාග මෙහෙකරුවෙක් හෝ නපුරු සිතින්, භික්ෂුවක් හෝ භික්ෂුනියක් හෝ උපාසකයෙකු හෝ උපාසිකාවක් හෝ යන්නහු සමග (පසු පස්සේ) යන්නේ හෝ වේද සිටියහු ළඟ සිටින්නේ හෝ වේද, හිඳින්නහු ළඟ හිඳින්නේ හෝ වේද, නිදාගන්නහු ළඟ නිදාගන්නේ හෝ වේද, මේ යක්ෂ තෙම අල්වන්නේය. මේ යක්ෂ තෙම ආවෙශ වන්නේය. මේ යක්ෂ තෙම පීඩා කරන්නේය. මේ යක්ෂ තෙම විශෙෂයෙන් පීඩා කරන්නේය, මේ යක්ෂ තෙම හිංසා කරන්නේය, මේ යක්ෂ තෙම විශෙෂයෙන් හිංසා කරන්නේය, කියා ප්‍රධාන යක්ෂවූ යක්ෂ සේනාවට අධිපතිවූ එහෙයින්ම මහා සේනාපතිවූ මේ යක්ෂයන්ට යක්ෂ තෙම නොහරනේ යයි සෝෂා කොට දැන්විය යුතුයි. ශබ්ද නගා කිය යුතුයි. මුරගා කිය යුතුයි. කවර යක්ෂ කෙනෙකුන්ට, කවර මහා යක්ෂ කෙනෙකුන්ට, කවර සෙනෙවිරත් කෙනෙකුන්ට, කවර මහ සෙනෙවිරත් කෙනෙකුන්ටද යත්?

"ඉන්ද්‍රය, සොමය, වරුණය, භාරද්වාජය, ප්‍රජාපතීය, චන්දනය, කාමසෙට්ඨය, කිණ්ණුඝණ්ඩුය, නිඝණ්ඩුය"

"පණාදය, ඔපමඤ්ඤය, දෙවසූතය, මාතලීය, චිත්‍රසෙනය, ගන්ධර්වය, නළය, රාජය, ජනෙසභය. සාතාගිරය, හෙමවතය, පුණ්ණකය, කර්තියය, ගුලය, සීවකය, මුචලින්දය, විශ්වාමිත්‍රය, යුගන්ධරය"

"ගොපාලය, සුප්පගෙධය, හිරිය, නෙත්තිය, මන්දිය, පඤ්චාලචණ්ඩය, ආලවකය, පජ්ජුන්නය, සුමනය, සුමුඛය, දධීමුඛය, මනිමානීචරය, දීඝය (යන යක්ෂ සෙනාධිපතීහුද)

තවද, මොවුන් හා එක්වූ සෙරිස්සක නම් යක්ෂයෙක්ද, ඇත්තේය."

මේ යක්ෂ තෙම අල්වාගන්නේය. මේ යක්ෂ තෙම ආවෙශ වන්නේය. මේ යක්ෂ තෙම පීඩා කරන්නේය. මේ යක්ෂ තෙම විශෙෂයෙන් පීඩා කරන්නේය. මේ යක්ෂ තෙම හිංසා කරන්නේය. මේ යක්ෂ තෙම අත්නොහරින්නේයයි කියා ප්‍රධාන යක්ෂවූ යක්ෂ සේනාපතිවූ මහා සේනාපතිවූ මේ යක්ෂයන්ට මෙපරිද්දෙන් දැන් විය යුත්තේය, ඝොෂා කොට කිය යුත්තේය, ශබ්ද නගා කියයුත්තේය. මුරගා කිය යුත්තේය.

නිදුකාණන් වහන්ස, ඒ මේ ආටානාටිය ආරක්ෂාව වනාහි භික්ෂූන්ගේද භික්ෂුනීන්ගේද උපාසකයන්ගේද උපාසිකාවන්ගේද ආරක්ෂාව පිණිසද, (යක්ෂොපද්‍රවවලින්) නොවෙහෙසීම පිණිසද, සුවසේ විසීම පිණිසද පවත්නේය.

නිදුකාණන් වහන්ස, අපි බොහෝ වැඩ කටයුතු ඇත්තම්හ එබැවින් දැන් අපි යම්හයි" භාග්‍යවතුන් වහන්සේට දැන්වූවාහුය.

"වරම් රජදරුවෙනි, තෙපි දැන් යම් ගමනක් සිතව්ද? එයට කාලය බව දනිව් යයි වදාළ සේක. ඉක්බිත්තෙන් සතර වරම් මහරජ දරුවෝ උන් ආසනවලින් නැගිට භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කොට ප්‍රදක්ෂිණා කොට එතන්හිම අන්තර්ධාන වූවාහුය. (නොපෙනී ගියහ.)

ඒ (අනිකුත්) යක්ෂයෝද, උන් ආසනවලින් නැගිට සමහර කෙනෙක් භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණු කොට එතන්හිම නොපෙනී ගියාහුය. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූවාහුය, සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථා පවත්වා එතන්හිම නොපෙනී ගියාහුය ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේට ඇඳිලි බැඳ නමස්කාර කොට එහිම අතුරුදහන් වූහ. ඇතැම් කෙනෙක් තමන්ගේ නාමගොත්‍ර කියා එතන්හිම අතුරුදහන් වූහ. සමහර කෙනෙක් තුෂ්ණීම්භූත වූවාහු (කිසිවක් නොකියාම) එතන්හිම නොපෙනී ගියාහුය.

**පළමුවන බණවර නිමි.**

10. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රියගේ ඇවෑමෙන් භික්ෂූන්ට කථාකළහ. "මහණෙනි, මේ ඉකුත් රාත්‍රියෙහි සතර වරම් මහ රජදරුවෝ මහත්වූ යක්ෂ සේනාවෙන්ද, මහත්වූ ගාන්ධර්ව සේනාවෙන්ද, මහත්වූ කුම්භාණ්ඩ සේනාවෙන්ද, මහත්වූ නාග සේනාවෙන්ද, සතර දිසාවෙහි ආරක්ෂා පිහිටුවා, සතර දිසාවෙහි බලසෙනග පිහිටුවා, සතර දිසාවෙහි රැකවල් ලවා, රාත්‍රියේ ප්‍රථම භාගය ඉක්ම ගිය කල්හි, (තමන්ගේ) ශරීර ආලොකයෙන් හාත්පස ගිජ්ජකූට පර්වතය බබුළුවා මම යම් තැනකද එතැනට පැමිණියාහුය. පැමිණ, මට හොඳාකාර වැඳ, එකපැත්තකින් හුන්නාහුය. ඒ යක්ෂයෝද සමහර කෙනෙක් මට වැඳ එකපැත්තක හුන්නාහුය. සමහර කෙනෙක් මා සමග සතුටු වූවාහුය, සතුටු විය යුතු, සිහි කටයුතු කථාව කොට නිමවා එකපැත්තක හුන්නාහුය. සමහර කෙනෙක් මා දෙසට දොහොත් මුදුන්දී වැඳ එක පැත්තකටවී හුන්නාහුය. සමහර කෙනෙක් නාම ගොත්‍රය කියා එකපැත්තක හුන්නාහුය. එකපැත්තක හුන්නාවූ වෛශ්‍රවණ නම්වූ මහරජ තෙම මට මේ කරුණ කීයේය.

11. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට අසතුටුවූ උසස් (බලවත්) යක්ෂයෝද ඇත්තාහුය, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට සතුටුවූ උසස් (බලවත්) යක්ෂයෝද ඇත්තාහුමය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට අසතුටුවූ මද්ධ්‍යම ආනුභාව ඇති යක්ෂයෝත් ඇත්තාහුමය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට සතුටුවූ මද්ධ්‍යම ආනුභාව ඇත්තාවූ යක්ෂයෝත් ඇත්තාහුමය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට අසතුටුවූ පහත්වූ යක්ෂයෝත් ඇත්තාහුමය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට සතුටුවූ පහත් යක්ෂයෝත් ඇත්තාහුමය. ස්වාමීනි, බොහෝ සෙයින් යක්ෂයෝ භාග්‍යවතුන් වහන්සේට අසතුටු වූවාහුමය. එයට හෙතු කවරේද? ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වනාහි සතුන් මැරීමෙන් වැළකීම පිණිස ධර්මය දෙශනා කරන්නාහ. සොරකම් කිරීමෙන් වැළකීම පිණිස ධර්මය දෙශනා කරන්නාහ. කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීම පිණිස ධර්මය දෙශනා

කරන්නාහ. බොරු කීමෙන් වැළකීම පිණිස ධර්මය දෙශනා කරන්නාහ. මත් බවට හා ප්‍රමාදයට කාරණාවූ සුරාපානයෙන් වැළකීම පිණිස ධර්මය දෙශනා කරන්නාහ. ස්වාමීනි, බොහෝ සෙයින් යක්ෂයෝ සතුන් මැරීමෙන් නොවැළක්කාහුමය. සොරකම් කිරීමෙන් නොවැළක්කාහුමය. කාමයන්හි වරදවා හැසිරීමෙන් නොවැළක්කාහුමය. බොරු කීමෙන් නොවැලක්කාහුමය. මත්බවට ප්‍රමාදයට කාරණාවූ සුරාපානයෙන් නොවැළක්කාහුමය. ඒ යක්ෂයන්ට ඒ ධර්මදෙශනාව අප්‍රිය වේ. හිත් සතුටු වන්නේ නොවේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ කැලෑවෙහි වූද, ගම් සීමාව ඉක්මවූ වන සේනාසනවූද (කැලෑවෙහි) ඉතා දුරවූද නිශ්ශබ්ද වූද කලබල නැත්තාවූද මිනිසුන්ගෙන් තොරවූ සුලඟ ඇත්තාවූද මනුෂ්‍යයන්ගේ රහස් කටයුතුවලට යොග්‍යවූද, හිත එකඟකර ගැනීමට සුදුසුවූද, සේනාසනයන් (වසනතැන්) සේවනය කරති.

ඒ තන්හි නිතර වාසය කරන්නාවූ මහා බලසම්පන්නවූ යක්ෂයෝ ඇත්තාහුය. යම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවෙහි නොසතුටු වන්නාහුද ඔවුන්ගේ සතුට පිණිස ස්වාමීනි, භික්ෂුන්ගේද භික්ෂුණීන්ගේද උපාසකවරුන්ගේද උපාසිකාවන්ගේද පාලනය පිණිසද ආරක්ෂාව පිණිසද, වෙහෙස නොවන පිණිසද, පහසු හැසිරීම පිණිසද භාග්‍යවතුන් වහන්සේ (ආටානාට නම් නගරයෙහි බඳින ලද හෙයින්) මේ ආටානාටිය (නම්වූ) පිරිත පිළි ගත මැනව"යි දැන්වූයේය. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව පිළිගත්හ. එවිට වෙසවුණු මහ රජ තෙම භාග්‍යවතුන් වහන්සේගේ පිළි ගැණීම දැන ඒ වේලාවෙහි මේ ආටානාටිය පිරිත කීයේය.

12. "පසැස් ඇත්තාවූ සොභාමත්වූ විපස්සී නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා. සියලු සත්වයන් කෙරෙහි පතළ කරුණාවෙන් යුක්තවූ සිඛී නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.

"කෙලෙස් විනාස කළාවූ කෙලෙසුන් තවන වීර්යය ඇති වෙස්සභූ නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා. මාරයන්

යටත් කළාවූ කකුසඳ නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.

"සියලු පව් අහක් කළාවූ වැස නිමවනලද බ්‍රහ්මචර්‍ය්‍යය ඇති, කොනාගමන නම් සර්වඥයන් වහන්සේට නමස්කාරවේවා

"සියලු කෙලෙසුන්ගෙන් මිදුනාවූ කාශ්‍යප නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.

"යම් තථාගතකෙනෙක් සියලු සංසාරදුක් දුරුකරන්නාවූ මේ ධර්මය දෙශනා කළාහුද ශ්‍රීමත්වූ ශාක්‍ය පුත්‍රවූ ඒ ගෞතම සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.

"ලොකයෙහි යම් රහත් කෙනෙක් පිරිනිවියාහුද තත්වූ පරිද්දෙන් දැක වදාළහුද ඒ රහත්හු පිසුණු (අර්ථ නැති වචන) නොකියන්නාහ. මහත් බවට පැමිණියහ. භය නැති කළහ. (උන්වහන්සේලාට) නමස්කාර වේවා

"අෂ්ටවිද්‍යා පසළොස් චරණයන්ගෙන් (නුවණ අට සහ චරණ පසලොසින්) යුක්තවූ මහත් බවට පැමිණියාවූ භය නැති කළාවූ දෙව් මිනිසුන්ට හිතවූ යම් ගෞතම සර්වඥයන් වහන්සේ කෙනෙකුට නමස්කාර කෙරෙද්ද, උන්වහන්සේටද නමස්කාර වේවා.

13. "දිලිසෙන මහත් මණ්ඩල ඇති, සූර්‍ය්‍යතෙම යම් තැනකින් උදාවේද, යමෙක් උදාවන කල්හි රාත්‍රියද අන්තර්ධාන වේද, යම් දිසාවකින් හිරු උදාවූ කල්හි දවස යයි කියනු ලැබේද, එහි ගැඹුරුවූ පැතුරුණාවූ ජලය ඇති සමුද්‍රයයි කියනලද දිය විලෙක්ද ඇත්තේය.

"ඒ ස්ථානයෙහි පැතුරුණාවූ ජලය ඇති ඒ දියවිල 'සමුද්‍රයයි, මෙසේ දනිත්. මේ නිසා ඒ දිසාවට නැගෙනහිර දිසාවයයි ජනයා කියන්නේය. යස පිරිවර ඇත්තාවූ ඒ මහරජ තෙම යම් දිසාවක් ආරක්ෂා කෙරේද,

"ගාන්ධර්වයන්ට අධිපතිවූ ඔහු ධෘතරාෂ්ට්‍රය නම් වන්නේය. ඒ මහරජ තෙම ගාන්ධර්වයන් විසින් පිරිවරණ ලද්දේ නැටුම් ගී කීම්වලින් සිත් අලවා වෙසෙයි.

"ඉන්ද්‍රය යන නම් ඇත්තාවූ මහත් බල ඇත්තාවූ අනූ එක් දෙනෙක් පමණවූ ඔහුගේ සමාන නම් ඇත්තාවූ බොහෝ පුත්‍රයෝද ඇත්තාහයි මා විසින් අසන ලදී.

"ඔවුහුද මහත් බවට පැමිණියාවූ විශාරදවූ බුද්ධ නම්වූ (සූර්‍ය්‍ය වංශයෙහි උපන් හෙයින්) ආදිච්චබන්ධු නම් වූ සර්වඥයන්වහන්ස, ශ්‍රේෂ්ඨ පුරුෂයන්වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවයි කියා දුරදීම නමස්කාර කරති.

"දක්ෂවූ සර්වඥතාඥානයෙන් මහජනයා බලන්නෙහි යයි කියා අමනුෂ්‍යයෝද නුඹවහන්සේට වඳිති. මේ වැඳීම අප විසින් නැවත නැවත අසනලදී. එහෙයින් මෙසේ කියම්හ.

"ගෞතම නම්වූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරවුදැයි' (අප විසින් විචාරණ ලද යක්ෂයෝ) ගෞතම සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හයි (කියති.) විද්‍යාචරණ (නුවණ සහ සීල සමාධි) ගුණයෙන් යුක්තවූ ගෞතම බුදුන් වහන්සේට අපි නමස්කාර කරම්හයි (කීවාහුය.)

14. "යම් දිසාවකින් මළමිනී ගෙනයනු ලැබෙත්ද? පිසුණු (කේලාම්) කියන්නාවූ ඉදිරිපිට නැති තැන නින්දා කරන්නාවූ, ප්‍රාණඝාත කරන ගති ඇති රෞද්‍රවූ සොර සිත් ඇත්තාවූ වඤ්චාකාරීවූ ජනයෝ (යම් දිශා භාගයකින්) ගෙනයනු ලැබෙතියි කියත්ද,

"යස පිරිවර ඇත්තාවූ ඒ මහ රජතෙම යම් දිසාවක් ආරක්ෂා කෙරේද, ජනතෙම ඒ දිසාවට දකුණු දිසාවයයි කියන්නේය. මෙයින් ඕ තොමෝ දකුණු දිසා නම් වන්නීය.

"කුම්භාණ්ඩයන්ට අධිපතිවූ විරූඪය යන නම් ඇති ඒ රජතෙම කුම්භාණ්ඩයන් විසින් පිරිවරණ ලද්දේ නැටුම් ගී කීම්වලින් සිත් අලවා වාසය කරයි.

"ඒ රජහුගේ එක නම් ඇති බොහෝවූ පුත්‍රයෝද ඇත්තාහයි මා විසින් අසන ලදී. මහත් බල ඇති ඉන්ද්‍ර නම් ඇත්තාවූ ඔව්හුද අනූඑක් දෙනෙක් වන්නාහ. ඒ පුත්‍රයෝද ආදිච්චබන්ධුවූ

මහත් බවට පැමිණියාවූ පහවූ භය ඇති සර්වඥයන් වහන්සේ දැක දුරදීම පුරුෂ ශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා, පුරුෂ උත්තමයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවායි නමස්කාර කරති.

"සර්වඥතාඥානයෙන් ලොකය බලනසේක (එහෙයින්) අමනුෂ්‍යයෝද ඔබ වහන්සේට වඳිති. මේ වචනය අප විසින් නිතර අසන ලදී. එහෙයින් මෙසේ කියම්හ.

"ගෞතම නම්වූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරව්දැයි, (අසම්හ, එසේ අප විසින් අසන ලද යක්ෂයෝ) ගෞතම නම් බුදුන්ට නමස්කාර කරම්හ. විද්‍යාචරණ (නුවණ සහ සීල සමාධි) ගුණයෙන් යුක්තවූ ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හයි (කියති.)

15. "යම් දිශාවෙක්හි, දිලිසෙන මහත් මණ්ඩල ඇති සූර්‍ය්‍යයා බැසයයිද, සූර්‍ය්‍යයා බැස ගිය කල්හි දවල් කාලය නැති වේද

"යම් සූර්‍ය්‍යයෙකු බැස ගිය කල්හි රාත්‍රියයි කියනු ලැබේද, ඒ සූර්‍ය්‍යයා බැස ගිය තන්හි (ඇත්තාවූ) ඒ විල ගැඹුරුවූ පැතුරුණාවූ ජලය ඇති සමුද්‍රය නම් වන්නේය.

"ඒ සූර්‍ය්‍යයා බැස ගිය තන්හි (ඇත්තාවූ) ඒ විල පැතුරුණාවූ ජලය ඇත්තාවූ සමුද්‍රයයි දනිති. මෙයින් ඒ දිශාව බස්නාහිර දිශාවයයි ජනතෙම මෙසේ කියන්නේය.

"යස පිරිවර ඇත්තාවූ යම් මහරජෙක් ඒ දිශාව ආරක්ෂා කෙරේද, නාගයන්ට අධිපතිවූ විරූපාක්ෂ නම්වූ ඒ වරම් රජ තෙම නාගයන් විසින් පිරිවරණ ලද්දේ නැටුම් ගී කීම්වලින් සිත් අලවා වාසය කරයි.

"ඒ වරම් රජහුගේ එක නම් ඇති බොහෝවූ පුත්‍රයෝද ඇත්තාහයි, මා විසින් අසන ලදී. මහත් බල ඇත්තාවූ ඉන්ද්‍ර නම් ඔවුහු අනූ එක් දෙනෙක් වන්නාහ.

"ඔව්හුද සූර්‍ය්‍ය වංශයට නෑවූ මහත් බවට පැමිණියාවූ පහවූ භය ඇති සර්වඥයන් වහන්සේ දැක දුරදීම පුරුෂ ශ්‍රෙෂ්ඨයන්

වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා, පුරුෂොත්තමයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවායි නමස්කාර කරත්.

"දක්ෂවූ සර්වඥතාඥානයෙන් ජනයා බලන්නෙහියයි කියා අමනුෂ්‍යයෝද ඔබවහන්සේට නමස්කාර කරති. මේ කාරණය අප විසින් නිතර අසනලදී. එහෙයින් මෙසේ කියම්හ.

"(තොපි) ගෞතම නම්වූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරව්දැයි (අප විසින් අසනලද යක්ෂයෝ) 'ගෞතම' නම්වූ සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හ. ඒ විද්‍යාචරණ ගුණයෙන් යුක්තවූ ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට අපි නමස්කාරකරම්හයි කියති.

**16.** "යම් දිසාවෙක්හි රම්‍යවූ උතුරුකුරු දිවයින පිහිටියේද, දැකුම් කටයුතුවූ මහාමෙරු පර්වතය වන්නේද, ඒ උතුරුකුරු දිවයිනෙහි වස්ත්‍රාභරණාදිය මගේය මගේ යයි ගැනීමක් නැත්තාවූ භාර්‍ය්‍යා පරිග්‍රහයක් (භාර්‍ය්‍යාවන් අයත්කර ගැන්මක්) නැත්තාවූ මනුෂ්‍යයෝ උපදිත්.

"ඒ මිනිස්සු වී නොවපුරන්නාහ. සීසෑම පිණිස නගුල් කෙතට නොගෙනියත්. ඒ මනුෂ්‍යයෝ නොසානාලද භූමියෙහි හටගෙන පැසුනාවූ ඇල්සාල් බත් අනුභවකරත්.

"කුඩු නැත්තාවූද පොතු නැත්තාවූද පිරිසිදුවූ සුවඳ ඇති සහල් ඵල කොට ඇති හැල් රන් සැළියෙහි ලා (ජොති පාසාණ නම් ගල් උණුසුමෙන්) පිස ඒ සැලියෙන් ගත් කෑම කති.

"ඔව්හු (වෛශ්‍රවණ වරම් රජහුගේ පිරිවර යක්ෂයෝ) ගවදෙනකු එක් කුර ඇති වාහනයක් කොට දිසානුදිසාවන්හි සංචාරය කරති. සිව්පා සතෙකු එක් කුර ඇති වාහනයක් කොට දිසානුදිසාවන්හි සංචාරය කරති.

"ස්ත්‍රියක් වාහනය කොට දිසානුදිසාවන්හි සංචාරය කරති. පුරුෂයෙකු හෝ වාහනය කොට දිසානුදිසාවන්හි හැසිරෙත්.

"තරුණියක් වාහනය කොට දිසානුදිසාවන්හි සංචාරය කරති. තරුණයෙක් වාහනය කොට දිසානුදිසාවන්හි සංචාරය කෙරෙති.

"ඒ රජහුගේ පිරිවරවූ ඔවුහු වාහනවල නැග සියලු දිසා වටකොට ඇවිදිති. යස පිරිවර ඇත්තාවූ වෙසවුණු මහ රජහට හස්ති යානද, අස්ව යානද, දිව්‍ය යානද, ප්‍රාසාදද, සිවි ගෙවල්ද, උඩුමහල් ගෙවල්ද රන්සිවි ගෙවල්ද වන්නාහ.

"ඒ රජහට අහස්හි (උස්ස්ථානවල හෝ උසට) මවන ලද ආටානාට, කුසිනාට, පරකුසිනාට, නාටපුරිය, පරකුසිතනාට යන නගරයෝ වූවහුය.

"උතුරු දිසාවෙන් කපීවන්ත නම් නුවරෙක, ඊට බස්නාහිර දිසාවෙහි ජනොඝය, නවනවුතියය, අම්බර අම්බරවතියය යන නගර හා ආලකමන්දා නම් රාජධානියද වන්නාහුය.

'නිදුකාණන් වහන්ස, කුවෙර නම් මහ රජහුගේ විසාණා නම් රාජධානියක්ද ඇත්තීය. ඒ කාරණයෙන් කුවෙර නම් මහරජ තෙම වෛශ්‍රවනයයි කියනු ලැබේ.

වෙන වෙනම කරුණු පරීක්ෂාකර කියන්නාවූ තතොලාය, තත්තලාය, තතොතලාය, ඔජසිය, තෙජසිය, තතොජසිය, සූරය, රාජය, අරිෂ්ටය, නෙමිය යන යක්ෂයෝ දොළොස් දෙනෙක් වෙති.

යමකින් ජලය ගෙන වර්ෂාව වසීද, වර්ෂාව යමකින් පැතිරේද, ඒ රාජධානියෙහිවූ විලද ධරණී නම් වන්නීය ඒ විල අද්දර යක්ෂයෝ නිතර රැස්වන භගලවතී නම් සභා ශාලාවද වන්නීය.

"ඒ ශාලාව වටේට නිතර ගෙඩි ඇත්තාවූද නොයෙක් කුරුළු සමූහයාගෙන් ගැවසුණාවූද මොනරුන් කොස්වා ලිහිනින් හා කෝකිල ආදී පක්ෂීන් විසින්ද පවත්වන ලද සිත් පිනවන නාද ඇති වෘක්ෂයෝ ඇත්තාහ.

"තවද පොකුණෙහි නාද කරන ජීවඤ්ජීවක නම් කුරුල්ලෝද උට්ඨවචිත්තක නම් කුරුල්ලෝද වන කුකුලෝද පියුම්වනයෙහි රන්වන් කකුළුවෝද, තල් රෙහෙරුද, හැසිරෙන්නාහ.

"මේ පොකුණෙහි ගිරා සැළලිහිණීන්ගේ ශබ්ද ඇත්තේය. දණ්ඩ මාණවක නම් පක්ෂීහුද හැසිරෙන්නාහ. ඒ කුවෙර නම් මහ රජහුගේ පොකුණ හැම කල්හි එකම ආකාරයෙන් බබලන්නීය.

"යස පිරිවර ඇත්තාවූ ඒ මහ රජතෙම යම් දිසාවක් ආරක්ෂා කෙරේද ඒ දිසාව උතුරු දිසාවයයි මෙසේ ජනතෙම ඒ දිසාවට කියන්නේය.

"යක්ෂයන්ට අධිපතිවූ කුවෙර යන නමක් ඇත්තාවූ ඒ වරම් රජතෙම යක්ෂ සේනාවන් විසින් පිරිවරනලද්දේ නැටුම් ගී කීම්වලින් සිත් අලවා වාසය කරන්නේය.

"ඒ රජහුගේ බොහෝ පුත්‍රයෝද, සමාන නම් ඇත්තාහයි, මා විසින් අසන ලදී. මහත්වූ බල ඇති ඉන්ද්‍ර නම්වූ ඔව්හු අනූඑක් දෙනෙක් වෙති.

"ඔව්හුද ප්‍රබුද්ධවූ ආදිත්‍ය බන්ධුවූ මහත්බවට පැමිණියාවූ පහවූ භය ඇති සර්වඥයන්වහන්සේ දුරදීම දැක පුරුෂශ්‍රෙෂ්ඨයන් වහන්ස, නුඹවහන්සේට නමස්කාර වේවා. පුරුෂොත්තමයන් වහන්ස, නුඹවහන්සේට නමස්කාර වේවායි නමස්කාර කරත්.

"දක්ෂවූ සර්ඥතා ඥානයෙන් ජනයා බලන්නෙහියයි අමනුෂ්‍යයෝද නුඹ වහන්සේට වඳිති. මේ කාරණය අප විසින් නිතර අසනලදී. එහෙයින් මෙසේ කියම්හ.

"ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරව්දැයි (අසන ලද්දාවූ ඔව්හු) ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරම්හ. විද්‍යාචරණ ගුණයෙන් යුක්තවූ ගෞතම සර්වඥයන් වහන්සේට නමස්කාර කරම්හයි කියති."

17. "නිදුකාණන් වහන්ස, ඒ මේ ආටානාටිය පිරිත වනාහි භික්ෂූන්ටද, භික්ෂුණීන්ටද, උපාසකවරුන්ටද උපාසිකාවරුන්ටද, ආරක්ෂාව පිණිසද සැපසේ විසීම පිණිසද නොවෙහෙසීම පිණිසද වන්නේය. නිදුකාණන්වහන්සේ, යම්කිසි භික්ෂුවක් විසින්

හෝ භික්ෂුණියක් විසින් හෝ උපාසකයෙකු විසින් හෝ උපාසිකාවක් විසින් හෝ මේ ආටානාටිය නම් ආරක්ෂාව යහපත්ව ඉගෙන දැනගන්නා ලද්දීද, අක්ෂර පද නොපිරිහෙලා සම්පූර්ණකොට ඉගෙන ගන්නා ලද්දීද, ඉදින් යම් අමනුෂ්‍යවූ යක්ෂයෙක් හෝ යක්ෂණියක් හෝ යක්ෂපොතකයෙක් හෝ යක්ෂපොතිකාවක් හෝ යක්ෂ මහා මාත්‍යයෙක් හෝ යක්ෂ පිරිසෙහි වූවෙක් හෝ යක්ෂ වැඩකරුවෙක් හෝ ගාන්ධර්වයෙක් හෝ ගාන්ධර්ව ස්ත්‍රියක් හෝ ගාන්ධර්ව පොතකයෙක් හෝ ගාන්ධර්ව පොතිකාවක් හෝ ගාන්ධර්ව මහාමාත්‍යයෙක් හෝ ගාන්ධර්ව පිරිසෙහි වූවෙක් හෝ ගාන්ධර්ව වැඩකරුවෙක් හෝ කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩියක් හෝ කුම්භාණ්ඩ පොතකයෙක් හෝ කුම්භාණ්ඩ පෝතිකාවක් හෝ කුම්භාණ්ඩ මහාමාත්‍යයෙක් හෝ කුම්භාණ්ඩ පිරිසෙහි වූවෙක් හෝ කුම්භාණ්ඩ වැඩකාරයෙක් හෝ නාගයෙක් හෝ නාගිනියක් හෝ නාග පොතකයෙක් හෝ නාග පොතිකාවක් හෝ නාග මහාමාත්‍යයෙක් හෝ නාග පිරිසෙහි වූවෙක් හෝ නාග මෙහෙකරුවෙක් හෝ නපුරු සිත් ඇතිව, භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ උපාසකයකු හෝ උපාසිකාවක් හෝ යන්නහු පසුපස්සේ යන්නේ හෝ වේද සිටියහු ළඟ සිටින්නේ හෝ වේද, හිඳින්නහු ළඟ හිඳින්නේ හෝ වේද, නිදාගන්නහු ළඟ නිදා ගන්නේ හෝ වේද, නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙම මාගේ ගම්වල හෝ නියම් ගම්වල හෝ සත්කාරයක් හෝ ගරු කිරීමක් හෝ නොලබන්නේය. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙම මාගේ ආළකමන්දා නම්වූ රාජධානියෙහි වාසය කිරීමට තැනක් හෝ ස්ථිර වාසයක් හෝ නොලබන්නේය. නිදුකාණන්වහන්ස, ඒ අමනුෂ්‍ය තෙම මාගේ යක්ෂයන්ගේ සමාගමට යන්ටද නොලබන්නේය. නිදුකාණන්වහන්ස, තවද ඔහු අමනුෂ්‍යයෝ ආවාහ විවාහයන්ට නුසුදුස්සකුද කරන්නාහුය. නිදුකාණන්වහන්ස, තවද ඔහුට අමනුෂ්‍යයෝ ඔහුගේ ආත්මභාවය දක්වා සම්පූර්ණ පද ශබ්ද ඇති අපහාස වචන වලින් නින්දා කරන්නාහුය. නිදුකාණන්වහන්ස, තවද ඔහුගේ හිසෙහි අමනුෂ්‍යයෝ හිස්වූ ලොහ පාත්‍රයක්ද මුනින්

නමන්නාහුය. නිදුකාණන්වහන්ස, තවද ඔහුගේ හිසද සත් කඩක් කොට පලන්නාහුය.

18. "නිදුකාණන්වහන්ස. රෞද්‍රවූ නපුරු ගති ඇති එකට එක කරන්නාවූ අමනුෂ්‍යයෝ ඇත්තාහුය. ඒ අමනුෂ්‍යයෝ සතරවරම් රජදරුවන්ගේ (වචනය) නොඅදහත්. සතරවරම් මහරජදරුවන්ගේ අමාත්‍යයන්ගේ වචනය නොපිළිගනිති. යක් සෙනෙවියන් වෙනුවට සිටින්නන්ගේ වචනය නොපිළිගනිති. නිදුකාණන්වහන්ස, ඒ අමනුෂ්‍යයෝ සතරවරම් මහ රජදරුවන්ට අකීකරු වූවෝයයි කියනු ලැබෙත්. යම්සේ මගධරටට අධිපතිවූ රජහුගේ රටෙහි සොරු වෙත්ද, ඒ සොරු මගධ රටට අධිපතිවූ රජහුගේ වචනය නොපිළිගනිද්ද, මගධ රජහුගේ අමාත්‍යයන්ගේ වචනය නොපිළිගනිද්ද, මගධ රජහුගේ අමාත්‍යයන් වෙනුවට සිටින පුරුෂයන්ගේ වචනය නොපිළිගනිද්ද. නිදුකාණන්වහන්ස, ඒ මහසොරහු වනාහි මගධ රජහට අකීකරු වූවෝ නම් වෙත්යයි කියනු ලැබෙත්.

'නිදුකාණන්වහන්ස, එපරිද්දෙන්ම නපුරු ගති ඇති රෞද්‍රවූ එකට එක කරන්නාවූ අමනුෂ්‍යයෝ ඇත්තාහුය. ඒ අමනුෂ්‍යයෝ සතර වරම් මහ රජදරුවන්ගේ වචනය නොපිළිගනිත්. වරම් මහ රජදරුවන්ගේ සෙනෙවියන්ගේ වචනය නොපිළිගනිති. වරම් රජදරුවන්ගේ සෙනෙවියන් වෙනුවට සිටින පුරුෂයන්ගේ වචනය නොපිළිගනිත්. නිදුකාණන්වහන්ස, ඒ මේ අමනුෂ්‍යයෝ වරම් රජදරුවන්ට අකීකරු වූවෝයයි කියනුලැබෙත්. නිදුකාණන් වහන්ස, යම් කිසි අමනුෂ්‍ය යක්ෂයෙක් හෝ යක්ෂනියක් හෝ යක්ෂ පොතකයෙක් හෝ යක්ෂ පොතිකාවක් හෝ යක්ෂ මහාමාත්‍යයෙක් හෝ යක්ෂ පිරිසෙහි වූවෙක් හෝ යක්ෂ වැඩ කාරයෙක් හෝ ගන්ධර්වයෙක් හෝ ගන්ධර්ව ස්ත්‍රියක් හෝ ගන්ධර්වපොතකයෙක් හෝ ගන්ධර්ව පොතිකාවක් හෝ ගන්ධර්ව මහාමාත්‍යයෙක් හෝ ගන්ධර්ව පිරිසෙහි වූවෙක් හෝ ගන්ධර්ව වැඩකරුවෙක් හෝ කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩියක් හෝ කුම්භාණ්ඩ පොතකයෙක් හෝ කුම්භාණ්ඩ පොතිකාවක් හෝ කුම්භාණ්ඩ මහාමාත්‍යයෙක් හෝ කුම්භාණ්ඩ

පිරිසෙහි වූවෙක් හෝ කුම්භාණ්ඩ වැඩකරුවෙක් හෝ නාගයෙක් හෝ නාගිනියක් හෝ නාග පොතකයෙක් හෝ නාග පොතිකාවක් හෝ නාගමහාමාත්‍යයෙක් හෝ නාග පිරිසෙහි වූවෙක් හෝ නාග මෙහෙකරුවෙක් හෝ නපුරු සිතින්, භික්ෂුවක් හෝ භික්ෂුනියක් හෝ උපාසකයෙකු හෝ උපාසිකාවක් හෝ යන්නහු සමග (පසු පස්සේ) යන්නේ හෝ වේද, සිටියහු ළඟ සිටින්නේ හෝ වේද, හිඳින්නහු ළඟ හිඳින්නේ හෝ වේද, නිදාගන්නහු ළඟ නිදාගන්නේ හෝ වේද, මේ යක්ෂ තෙම අල්වන්නේය. මේ යක්ෂ තෙම ආවෙශ වන්නේය. මේ යක්ෂ තෙම පීඩා කරන්නේය. මේ යක්ෂ තෙම විශෙෂයෙන් පීඩා කරන්නේය, මේ යක්ෂ තෙම හිංසා කරන්නේය, මේ යක්ෂ තෙම විශෙෂයෙන් හිංසා කරන්නේය, කියා ප්‍රධාන යක්ෂවූ යක්ෂ සේනාවට අධිපතිවූ එහෙයින්ම මහා සේනාපතිවූ මේ යක්ෂයන්ට යක්ෂ තෙම නොහරනේ යයි ඝෝෂා කොට දැන්විය යුතුයි. ශබ්ද නගා කිය යුතුයි. මුරගා කිය යුතුයි. කවර යක්ෂ කෙනෙකුන්ට, කවර මහා යක්ෂ කෙනෙකුන්ට, කවර සෙනෙවිරත් කෙනෙකුන්ට, කවර මහ සෙනෙවිරත් කෙනෙකුන්ටද යත්?

"ඉන්ද්‍රය, සොමය, වරුණය, භාරද්වාජය, ප්‍රජාපතීය, චන්දනය, කාමසෙට්ඨය, කිණ්ණුඝණ්ඩුය, නිඝණ්ඩුය.

"පණාදය, ඔපමඤ්ඤය, දෙවසූතය, මාතලීය, චිත්‍රසෙනය, ගන්ධර්වය, නළය, රාජය, ජනෙසභය. සාතා ගිරය, හෙමවතය, පුණ්ණකය, කර්තියය, ගුලය, සීවකය, මුචලින්දය, විශ්වාමිත්‍රය, යුගන්ධරය.

"ගොපාලය, සුප්පගෙධය, හිරිය, නෙත්තිය, මන්දිය, පඤ්චාලචණ්ඩය, ආලවකය, පජ්ජුන්නය, සුමනය, සුමුඛය, දධිමුඛය, මනිමානිචරය, දීඝය (යන යක්ෂ සෙනාධිපතීහුද) තවද, මොවුන් හා එක්වූ සෙරිස්සක නම් යක්ෂයෙක්ද, ඇත්තේය.

"මේ යක්ෂ තෙම අල්වාගන්නේය. මේ යක්ෂ තෙම ආවෙශ වන්නේය. මේ යක්ෂ තෙම පීඩා කරන්නේය. මේ යක්ෂ තෙම

විශෙෂයෙන් පීඩා කරන්නේය. මේ යක්ෂ තෙම හිංසා කරන්නේය. මේ යක්ෂ තෙම අත්නොහරින්නේයයි කියා ප්‍රධාන යක්ෂවූ යක්ෂ සේනාපතිවූ මහා සේනාපතිවූ මේ යක්ෂයන්ට මෙපරිද්දෙන් දැන්විය යුත්තේය, ඝොෂා කොට කිය යුත්තේය, ශබ්ද නගා කියයුත්තේය. මුරගා කිය යුත්තේය.

**19.** "නිදුකාණන් වහන්ස, ඒ මේ ආටානාටිය ආරක්ෂාව වනාහි භික්ෂූන්ගේද භික්ෂුනීන්ගේද උපාසකයන්ගේද උපාසිකාවන්ගේද ආරක්ෂාව පිණිසද, (යක්ෂොපද්‍රවවලින්) නොවෙහෙසීම පිණිසද, සුවසේ විසීම පිණිසද පවත්නේය.

"නිදුකාණන් වහන්ස, අපි බොහෝ වැඩ කටයුතු ඇත්තම්හ එබැවින් දැන් අපි යම්හයි" භාග්‍යවතුන් වහන්සේට දැන්වූවාහුය.

"වරම් රජදරුවෙනි, තෙපි දැන් යම් ගමනක් සිතව්ද? එයට කාලය බව දනිව්" යයි වදාළසේක. ඉක්බිත්තෙන් සතර වරම් මහරජදරුවෝ උන් ආසනවලින් නැගිට මට නමස්කාර කොට ප්‍රදක්ෂිණා කොට එතන්හිම අන්තර්ධාන වූවාහුය. (නොපෙනී ගියහ.)

ඒ (අනිකුත්) යක්ෂයෝද, උන් ආසනවලින් නැගිට සමහර කෙනෙක් මට වැඳ පැදකුණු කොට එතන්හිම නොපෙනී ගියාහුය. ඇතැම්කෙනෙක් මා සමග සතුටු වූවාහුය. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථා පවත්වා එතන්හිම නොපෙනී ගියාහුය ඇතැම් කෙනෙක් මට ඇඳිලි බැඳ නමස්කාර කොට එහිම අතුරුදහන් වූහ. ඇතැම් කෙනෙක් තමන්ගේ නාමගොත්‍ර කියා එතන්හිම අතුරුදහන් වූහ. සමහර කෙනෙක් තුෂ්ණීම්භූත වූවාහු (කිසිවක් නොකියාම) එතන්හිම නෙපෙනී ගියාහුය.

"මහණෙනි, ආටානාටිය නම් පිරිත උගනිව්. මහණෙනි, ආටානාටිය නම් පිරිත නිතර පුහුණු කරව්. මහණෙනි, ආටානාටිය නම් පිරිත සිත්හි ලා දරාගනිව්. මහණෙනි, ආටානාටිය පිරිත වැඩදායක වන්නේය. භික්ෂූන්ගේද භික්ෂුණීන්ගේද උපාසකයන්ගේද උපාසිකාවන්ගේද ආරක්ෂාව පිණිසද පීඩා නොවීම පිණිසද සැපසේ වාසයකිරීම පිණිසද

වන්නේය" යන මෙය භාග්‍යවතුන්වහන්සේ වදාළහ. සතුටු සිත් ඇත්තාවූ භික්ෂූහු ඒ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට විශෙෂයෙන් සතුටු වූවාහුය.

**තිස් දෙවැනිවූ ආටානාටිය සූත්‍රය නිමි.**

---

## 33. සංගීති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ මල්‍යජනපදවල ගමන් කරනුයේ පන්සියයක් පමණවූ මහත් භික්ෂු සංඝයා සමග මල්‍යයන්ගේ පාවා නම් නුවර යම් තැනකද එතැනට පැමිණියෝය. එහි භාග්‍යවතුන් වහන්සේ පාවා නුවර චුන්ද නම් කර්මාර පුත්‍රයාගේ අඹ උයනෙහි වාසය කරති. එකල පාවා නුවර වැසි මල්‍යයන්ගේ උබ්භතක නම් අළුත්වූ නොබෝ දින කරවන ලද්දාවූ මහණෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ කිසියම් මිනිසෙකු විසින් වාසය නොකරන ලද සන්ථාගාර ශාලාවක් වෙයි.

"භාග්‍යවතුන් වහන්සේ වනාහි මල්‍ය ජනපදවල ගමන් කරණුවෝ, පන්සියයක් පමණවූ මහත් භික්ෂු සංඝයා සමග පිළිවෙලින් පාවා නුවරට වැඩිසේක් පාවා නුවර චුන්ද නම් කර්මාරපුත්‍රයාගේ අඹඋයනෙහි වාසය කරති"යි පාවා නුවර වැසි මල්‍යයෝ ඇසුවාහුය.

2. එකල්හි පාවානුවර වැසි මල්‍යයෝ භාග්‍යවතුන් වහන්සේ වැඩසිට තැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට හොඳින් වැඳ එකපැත්තක උන්හ. එකපැත්තක උන්නාවූ පාවානුවර වැසි මල්‍යයෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාහුය. ස්වාමීනි, මෙහි පාවානුවර වැසි මල්‍යයන්ගේ උබ්භතක නම්වූ අළුත් සන්ථාගාරය (නුවර මැද කරවණ ලද ශාලාව) නොබෝ දින කරවන ලද්දේ වෙයි. මහණෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ කිසියම් මිනිසකු විසින්, වාසය නොකරන ලද්දේය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ එය පළමුකොට පරිභොග කරත්වා. (පාවිච්චි කරත්වා) භාග්‍යවතුන් වහන්සේ

විසින් පළමුකොට පරිභොග කරනලද සන්ථාගාරය පසුව පාවා නුවර වැසි මල්ලයයෝ පරිභොග කරන්නාහුය. එය පාවා නුවර වැසි මල්ලයයන්ට බොහෝ කලක් හිත සුව පිණිස වන්නේ ය"යි කීහ. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දවීමෙන් ඉවසූසේක. ඉක්බිති පාවා නුවර වැසි මල්ලයයෝ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ, ප්‍රදක්ෂිණා කර (වටේ යමින් වැඳ) සන්ථාගාරය යම් තැනකද එතැනට පැමිණියාහුය. පැමිණ, සන්ථාගාරය සියළු තන්හි ඇතිරිලි එලා ආසන පනවා දිය සැළි තබා පහන් දල්වා භාග්‍යවතුන්වහන්සේ යම්තැනකද එතැනට පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකපැත්තක සිටියාහුය. එකපැත්තක සිටියාවූ ඒ පාවානුවර වැසි මල්ලයයෝ, භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාහුය. "ස්වාමීනි, සන්ථාගාරය සියළු තන්හි ඇතිරිලි අතුරන ලදී. ආසන පනවන ලදී. දිය සැළි තබන ලදී. තෙල් පහන් දල්වන ලදී. ස්වාමීනි, දැන් එහි වැඩමවීමට සුදුසු කල් බව දැනගන්නා සේක්වා,"යි කීහ. එවිට භාග්‍යවතුන් වහන්සේ හැඳ පෙරවා, පාත්‍රය හා සිවුරු ගෙණ භික්ෂු සංඝයා සමග සන්ථාගාරය යම් තැනකද එතැනට පැමිණියහ. පැමිණ, පා සෝදා සන්ථාගාරයට පිවිස ශාලාව මධ්‍යයෙහිවූ කණුවට පිටදී නැගෙනහිර දෙසට මුහුණ ලා වැඩ සිටියහ. භික්ෂු සංඝයාද පා සෝදා සන්ථාගාරයට ඇතුල්ව බස්නාහිර බිත්තියට පිට දී පෙර දිසාවට මුහුන ලා භාග්‍යවතුන් වහන්සේම ඉදිරියෙහි කොට උන්හ.

පාවා නුවර වැසි මල්ලයයෝද පා සෝදා සන්ථාගාරයට ඇතුල්ව පෙරදිසාවෙහිවූ භිත්තිය නිසා (බස්නාහිර) දිගට මුහුනලා භාග්‍යවතුන්වහන්සේම ඉදිරියෙහි කොට උන්නාහුය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පාවා නුවර වැසි මල්ලයයන්ට, රාත්‍රී බොහෝ වේලාවක්ම ධර්ම දෙශනාකර කරුණු දක්වා, සමාදන් කරවා, උනන්දු කරවා, අතිශයින් සතුටු කරවා "වාසෙට්ඨයිනි, රාත්‍රිය බොහෝ ඉක්ම ගියාය. දැන් තොපට ගමනට සුදුසු කාලය හඟිව්" කියා පිටත්කර යැවූසේක. "එසේය ස්වාමීනි" කියා පාවා නුවර වැසි මල්ලයයෝ භාග්‍යවතුන් වහන්සේට උත්තර දී

හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ, ප්‍රදක්ෂිණාකර ගියාහුය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, පාවානුවර වැසි මල්‍ලයන් පිටත්ව ගිය නොබෝ වේලාවකින් ඉතා නිශ්ශබ්දවූ භික්ෂු සංඝයා දෙස බලා, ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන්ට මෙසේ ආමන්ත්‍රණය කළසේක. "ශාරීපුත්‍රය, භික්ෂු සංඝතෙම පහවූ ථීනමිද්ධය ඇත්තේය (නිදිමත නැතිව සිටියි.) ශාරීපුත්‍රය, භික්ෂූන්ට සුදුසු දැහැමි කථාවක් තොපට වැටහේවා. මාගේ පිට රුදා කෙරෙයි. එහෙයින් මම කය දිග හරින්නෙමි"යි කීහ. "එසේය ස්වාමීනි" කියා ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ දෙපට සිවුර හතරට නමා එලා, දකුණු පයෙහි වම්පය මදක් ඉක්මවා තබා, සිහි නුවණින් යුක්තව නැගිටිමි යන කල්පනාව සිත්හි තබාගෙන දකුණැලයෙන් සිංහසෙය්‍යාව කළසේක.

එකල්හි නිගණ්ඨනාත පුත්‍ර පාවා නුවර අසලදී කාලක්‍රියා කොට වැඩි කලක් නැත.

ඔහුගේ මරණයෙන් පසු බිඳී ගිය නිගණ්ඨයෝ කොටස් දෙකක් වූවාහු හටගත් ඩබර ඇත්තාහු, හටගත් කලහ ඇත්තාහු, විරුද්ධ වාදයට පැමිණියාහු, ඔවුනොවුන් අතර මුඛ නමැති ආයුධයන්ගෙන් විදිමින් වාසය කරන්නාහුය. 'තෝ මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි. කිම තෝ මේ ධර්ම විනය දන්නෙහිද? තෝ වරදවා පිළිපදින්නෙහිය. මම මනා කොට පිළිපදින්නෙමි. මාගේ වචන අර්ථ සහිත වන්නේය. තාගේ වචන අර්ථ රහිත වන්නේය. පළමුව කියයුත්ත පසුව කීයේය. පසුව කියයුත්ත පළමුව කීයේය. තා විසින් පුරුදු කරන ලද්ද මාගේ වාදයට පැමිණ නැවතුනේය. තා විසින් වාදය නංවන ලද්දේය. තාගේ මත්තෙහි මා විසින් දොෂය නංවන ලද්දේය. ඒ ඒ අය කරා එළඹ වාදයෙන් මිදීම පිණිස උත්තර සොයමින් හැසිරෙව. ඉදින් හැකි වන්නෙහි නම් මා විසින් නගන ලද දොෂයෙන් තමන් මුදාගනුව. නිගණ්ඨනාත පුත්‍රයන් කෙරෙහි එක් මරණයෙක් වන්නේයයි හඟිමියි කියන්නාහුය.

නිගණ්ඨනාත පුත්‍රයාගේ සුදුවස්ත්‍ර හඳිනා යම් ගිහි ශ්‍රාවක කෙනෙක් වූවාහුද ඔව්හුද ඒ නිගණ්ඨනාත පුත්‍ර ශ්‍රාවකයන් කෙරෙහි කලකිරුණු ස්වභාව ඇතිව නොඇලුණු ස්වභාව ඇතිව සත්කාර කිරීමාදියෙන්ද වැළකුනාහුය. අයහපත් කොට ප්‍රකාශකරන ලද්දාවූ මනාව නොදත් නිවනට නොපමුණුවන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස නොපවත්වන්නාවූ සම්‍යක්සම්බුදු කෙනෙකු විසින් දෙශනා නොකරන ලද්දාවූ ධර්ම විනයෙහි පිහිට බිඳී ගිය කල පිළිසරණක් නැති කල යම්සේද එසේ වූහයි කීය."

4. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ භික්ෂූන්ට කථාකොට මෙසේ කීහ. ඇවැත්නි, නිගණ්ඨනාත පුත්‍රතෙම පාවා නුවර අසලදී නොබෝ දින මැරීගියේය. ඔහුගේ මරණයෙන් පසු බිඳීගිය නිගණ්ඨයෝ කොටස් දෙකක් වූවාහු හටගත් ඩබර ඇත්තාහු, හටගත් කලහ ඇත්තාහු, විරුද්ධ වාදයට පැමිණියාහු, ඔවුනොවුන් අතර මුඛ නමැති ආයුධයන්ගෙන් විදිමින් වාසය කරන්නාහුය. 'තෝ මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි. කිම හෝ මේ ධර්ම විනය දන්නෙහිද? තෝ වරදවා පිළිපදින්නෙහිය. මම මනා කොට පිළිපදින්නෙමි. මාගේ වචන අර්ථ සහිත වන්නේය. තාගේ වචන අර්ථ රහිත වන්නේය. පළමුව කියයුත්ත පසුව කීයේය. පසුව කියයුත්ත පළමුව කීයේය. තා විසින් පුරුදු කරන ලද්ද මාගේ වාදයට පැමිණ නැවතුනේය. තා විසින් වාදය නංවන ලද්දේය. තාගේ මත්තෙහි මා විසින් දොෂය නංවන ලද්දේය. ඒ ඒ අය කරා එළඹ වාදයෙන් මිදීම පිණිස උත්තර සොයමින් හැසිරෙව. ඉදින් හැකි වන්නෙහි නම් මා විසින් නගන ලද දොෂයෙන් තමන් මුදාගනුව. නිගණ්ඨනාත පුත්‍රයන් කෙරෙහි එක් මරණයෙක් වන්නේයයි හඟිමියි කියන්නාහුය.

"නිගණ්ඨනාත පුත්‍රයාට අනුව යන්නාවූ ගිහි වස්ත්‍ර හඳනා ලද යම් බඳු ගිහි ශ්‍රාවකයෝ වෙද්ද ඔව්හුද ඒ නිගණ්ඨනාතපුත්‍ර ශ්‍රාවකයන් කෙරෙහි කලකිරුණු ස්වභාව ඇතිව නොඇලුණු ස්වභාව ඇතිව සත්කාර කිරීමාදියෙන්ද වැළකුනාහුය. අයහපත්

කොට ප්‍රකාශ කරන ලද්දාවූ මනාකොට නොදත් නිවනට නොපමුණුවන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස නොපවත්නාවූ සම්‍යක්සම්බුදු කෙනෙකු විසින් දෙශනා නොකරන ලද්දාවූ ධර්ම විනයෙහි පිහිට බිඳී ගිය පිළිසරණක් නැති කල යම්සේද එසේ වූහයි කීහ.”

**5.** “ඇවැත්නි, මනාව නොදත් නිවන් පිණිස නොපවත්නාවූ සංසිඳීම පිණිස නොපවත්නාවූ සම්‍යක් සම්බුද්ධ නොවූවකු විසින් දැන ගන්නා ලද්දාවූ නපුරු කොට කියන ලද්දාවූ ශාසනයෙහි, මෙය මෙසේ වෙයි. ඇවැත්නි, මේ අපගේ ධර්මය වනාහි අපගේ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාව ප්‍රකාශ කරණ ලද්දේය. මොනවට දැනගන්නා ලද්දේය. නිවන් පිණිස පවත්නේය. සංසිඳීම පිණිස පවත්නේය. සම්‍යක් සම්බුදුවරයෙකු විසින් දැනගන්නා ලද්දේ වෙයි. යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යය බොහෝ කල් පවත්නේද චිරස්ථායී වන්නේද එසේ ඒ ධර්මය සියල්ලන් විසින්ම එක්ව කිය යුතුයි. විවාද නොකට යුතුයි. එය බොහෝදෙනාට හිත පිණිස බොහෝදෙනාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දෙවි මිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිස වන්නේය.

“ඇවැත්නි, අපගේ භාග්‍යවතුන් වහන්සේ විසින් යහපත් කොට දැනගන්නාලද්දාවූ, නිවන් පිණිස පවතින්නාවූ, සංසිඳීම පිණිස පවතින්නාවූ, සම්මාසම්බුද්ධයන් වහන්සේ විසින් යහපත් කොට අවබොධ කරන ලද්දාවූ බොහෝදෙනාට හිත පිණිස, බොහෝදෙනාට සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවි මිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිස බ්‍රහ්මචර්‍ය්‍යය චිරස්ථායිව දිගුකලක් පවතිනසේ සියල්ලන් විසින් සංගායනය කටයුතුවූ විවාද නොකටයුතුවූ ඒ ධර්මය කවරේද?

**6.** ඇවැත්නි, සියල්ල දැන වදාළවූ දැක වදාළවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට ප්‍රකාශ කරණ ලද්දාවූ එක් ධර්මයක් ඇත්තේය. ඒ ධර්මයෙහි යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝ කල් පවත්නේ වේද එසේ සියල්ලන් විසින්ම එක්ව සජ්ජායනා (එක්ව කීම) කළ

යුත්තේය. විවාද නොකළ යුත්තේය. එය බොහෝදෙනාට හිත පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙව් මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය.

කවර නම් එක් ධර්මයක්ද? සියලු සත්වයෝ ආහාරය නිසා පවත්නාහුය. සියලු සත්වයෝ හෙතුව නිසා පවත්නාහුය. ඇවැත්නි මේ ධර්මය ඒ සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ විසින් මනා කොට ප්‍රකාශ කරණ ලද එකක්වූ ධර්මය වෙයි. යම්සේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝ කල් පවත්නේද චිරස්ථායි වේද මෙසේ සියල්ලන් විසින් එක්ව සජ්ජායනා කළ යුතුය. විවාද නොකළ යුතුය. එය බොහෝදෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස ලොකයාට අනුකම්පා පිණිස දෙව් මිනිසුන්ට සැප පිණිස පවත්නේය.

7. "ඇවැත්නි, ඒ දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට ප්‍රකාශ කරන ලද්දාවූ දෙකක්වූ ධර්ම ඇත්තාහ. යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝ කල් පවත්නේ වේද චිරස්ථායී වේද සියල්ලන් විසින් එක්ව එසේ සජ්ජායනා (එක්ව කීම) කළ යුත්තේය. එය බොහෝදෙනාට හිත පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙව් මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය.

"ඒ දෙකක්වූ ධර්ම කවරහුද? නාමය හා රූපය (නාම ස්කන්ධ සතර හා නිර්වාණය සහ රූප ස්කන්ධය) අවිද්‍යාව හා භවතෘෂ්ණාවය (චතුස්සත්‍ය නොදැනීම සහ භවයට ආසාව) භවදෘෂ්ටිය හා විභව දෘෂ්ටිය (නිත්‍ය ආත්මයක් ගැනීම හා ආත්මය සිඳේයයි ගැනීම) අහිරිකය (පාපයට ලජ්ජා නැතිකම) හා අනොත්තප්පය (පාපයට බිය නැතිකම) හිරිය (පාපයට ලජ්ජාව) හා ඔත්තප්පය (පාපයට භය,) දුර්වචභාවය (කියනදේ නාහන බව) හා පාපමිත්‍රයන් ඇති බවය, සුවච බව හා යහපත් මිතුරන් ඇති බව, ඇවැත් (භික්ෂූන්ගේ වරදට පැමිණීම) දැනීමෙහි

දක්ෂ බව හා ඇවැතින් නැගී සිටීමෙහි දක්ෂ බවද, සමාපත්තියෙහි දක්ෂ බව හා සමාපත්තියෙන් නැගීසිටීමෙහි දක්ෂ බවද, ධාතූන් දැනීමෙහි දක්ෂ බව හා ධාතූන් මෙනෙහි කිරීමෙහි දක්ෂ බවද, ආයතනයන් දැනීමෙහි දක්ෂ බව හා පටිච්චසමුප්පාදයන් දැනීමෙහි දක්ෂ බවද, හෙතු දැනීමෙහි දක්ෂ බව හා අහෙතු දැනීමෙහි දක්ෂ බවද, අවංක බව හා පාපයට ලජ්ජා ඇති බවද, ඉවසීම හා සුරත බව (කයින් වචනයෙන් පව් නොකිරීම) ද, සාබල්‍යය (මෘදු වචන ඇති බව) හා පටිසන්ථාරය (ධර්මයෙන් හා ආහාරපානාදියෙන් සංග්‍රහ කිරීම) ද අවිහිංසාව හා (කරුණාව,) පිරිසිදුබව, මුට්ඨසච්චය (සිහිමුලා) හා අසම්පජඤ්ඤයද සතිය හා ප්‍රඥාවද, ඉන්ද්‍රියයන් නොවසනලද බව හා භොජනයෙහි පමණ නොදැනීමද, ඉන්ද්‍රියයන්හි වසන ලද දොර ඇති බව හා භොජනයෙහි පමණ දැනීමද, පටිසංඛාන බලය (අඥාන භාවයෙන් කම්පා නොකළ හැකි ඥානය) හා භාවනා බලය (භාවනාවෙන් උපදින බලය,) සති බලය හා සමාධි බලයද, සමථය හා විදර්ශනාවද, සමථ නිමිත්ත (පසුව උපදින සමාධියට හෙතුවන පළමු සමාධිය) හා පග්ගහ නිමිත්තද (පසුව උපදින වීර්යයට හෙතුවූ පූර්ව වීර්යය,) වීර්යය හා සිත විසිරනොයාමද, සීලවිපත්තිය හා දිට්ඨිවිපත්තියද, සීලසම්පදාව හා දිට්ඨිසම්පදාවද, සීලවිසුද්ධිය හා දිට්ඨිවිසුද්ධියද, විදර්ශනා ඥානය හා ඒ හා එකට යෙදුණ වීර්යයද සංවේග වියයුතු කරුණුවල සංවේගවීම හා සංවේගයට පැමිණියාහුගේ නුවණින් වීර්යය වැඩීමද කුසලධර්මයන්හි බොහෝ කැමති බව හා වීර්යයෙහි නොනවතින බවද ත්‍රිවිද්‍යාව හා විමුක්තිය (නිර්වාණය) ද ආර්‍ය්‍ය මාර්ගයන්හි ඥානය හා ආර්‍ය්‍ය ඵලයන්හි ඥානයද වෙත්. ඇවැත්නි, ඒ දන්නාවූ දක්නාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ දෙක බැගින් ධර්මයෝ මොනවට ප්‍රකාශ කරන ලද්දාහ. යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝ කල් පවත්නේවේද චිරස්ථායි වන්නේද එසේ මේ ධර්මය සියල්ලන් විසින් එක්ව සජ්ඣායනය (එක්ව කීම) කළයුත්තේය. විවාද නොකළ යුත්තේය එය බොහෝ දෙනාට හිත පිණිසද බොහෝ දෙනාට සැප පිණිසද ලොවට

අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය.

8. "ඇවැත්නි, දන්නාවූ දක්නාවූ රහත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද්දාවූ තුන බැගින්වූ ධර්මයෝ වෙත්. එහි සියල්ලන් විසින්ම එක්ව සජ්ජායනා කළ යුතුයි. විවාද නොකළ යුතුයි. එය බොහෝ දෙනාට හිත පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට හිත පිණිසද වන්නේය.

"ඒ කවරහුද යත්? ලොභ අකුසල මූලය, ද්වෙෂ අකුසල මූලය, මොහ අකුසල මූලය යන අකුසල් මුල් තුනය. අලොභ කුසල මූලය, අදොස කුසල මූලය, අමොහ කුසල මූලය යන කුසල් මුල් තුනය. කයින් කරන දුශ්චරිතය, වචනයෙන් කරන දුශ්චරිතය, හිතින් කරන දුශ්චරිතයයි දුශ්චරිත තුනකි. කයින් කරන සුචරිතය, වචනයෙන් කරන සුචරිතය, හිතින් කරන සුචරිතය යන සුචරිත තුනකි කාම විතර්කය, (කාම වස්තු ගැන කල්පනාව,) ව්‍යාපාද විතර්කය (අනුන්ගේ විනාශය ගැන කල්පනාව,) විහිංසා විතර්කය (අනුන්ට හිංශාකිරීම ගැන කල්පනාව) යන අකුශල විතර්ක තුනකි.

නෛෂ්ක්‍රම්‍ය විතර්කය (කාමවස්තුන්ගෙන් වෙන්වීමේ කල්පනාව,) අව්‍යාපාද විතර්කය (මෛත්‍රී කල්පනාව,) අවිහිංසා විතර්කය (අවිහිංසාව ගැන කල්පනාව) යන කුසල විතර්ක තුනකි.

කාම සංකල්පය, ව්‍යාපාද සංකල්පය, විහිංසා සංකල්පය යන අකුසල සංකල්ප තුනකි.

නෛෂ්ක්‍රම්‍ය සංකල්පය, අව්‍යාපාද සංකල්පය, අවිහිංසා සංකල්පය යන කුසල සංකල්ප තුනකි.

කාම සංඥාය, ව්‍යාපාද සංඥාය, විහිංසා සංඥාය යන අකුසල සංඥා තුනකි.

නෛෂ්ක්‍රම්‍ය සංඥාය, අව්‍යපාද සංඥාය, අවිහිංසා සංඥාය යන කුසල සංඥා තුනකි.

කාම ධාතුය, ව්‍යාපාද ධාතුය, විහිංසා ධාතුය යන අකුසල ධාතු තුනකි.

නෛෂ්ක්‍රම්‍ය ධාතුය, අව්‍යාපාද ධාතුය, අවිහිංසා ධාතුය යන කුසල ධාතු තුනකි.

අනිකුදු ධාතු තුනක් වෙත්. කාම ධාතුය, රූප ධාතුය, අරූප ධාතුය යන තුනය. අනිකුදු ධාතු තුනක් වෙත්. රූප ධාතු, අරූප ධාතු, නිරොධ ධාතුය යන තුනය.

අනිකුදු ධාතු තුනක් වෙත්. හීන ධාතුය, මධ්‍යම ධාතුය, ප්‍රණීත (ශ්‍රෙෂ්ඨ) ධාතුය යන තුනයි.

තෘෂ්ණා තුනක් වෙත්. කාම තෘෂ්ණාය, භව තෘෂ්ණාය විභව තෘෂ්ණාය යන තුනයි. අනිකුදු තෘෂ්ණා, තුනක් වෙත්. කාම තෘෂ්ණාය, රූප තෘෂ්ණාය, අරූප තෘෂ්ණාය යන තුනයි.

අන්‍යවූ තෘෂ්ණා තුනක් වෙත්. රූප තෘෂ්ණාය, අරූප තෘෂ්ණාය, නිරොධ තෘෂ්ණාය යන තුනයි.

සත්කාය දෘෂ්ටිය (ආත්මය පිළිබඳ වැරදි දැකීම්,) විචිකිච්ඡාව (සැකය,) සීලබ්බත පරමාසය (ශාසනයෙන් බැහැර සිල් හා ව්‍රත දෘෂ්ටිවශයෙන් ගැනීම) යන සංයොජන (කෙලෙස් බැම්) තුනක් වෙත්.

කාමාශ්‍රවය, භවාශ්‍රවය, අවිද්‍යාශ්‍රවයයි ආශ්‍රව තුනක් වෙත්.

කාම භවය, රූප භවය, අරූප භවයයි භව තුනක් වෙත්.

කාමෙසනය (කාමවස්තු සොයන ආශාව,) භවෙසනය (භවය සොයන ආශාව,) බ්‍රහ්මචරියෙසනය (මිථ්‍යාදෘෂ්ටි වශයෙන් බ්‍රහ්මචය්‍ය්‍යාව සොයන ආශාව) යන එසන (සෙවීම්) තුනක් වෙත්.

මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමියි යන මානය, මම සමානයෙක් වෙමියි යන මානය, මම හීනයෙක් (පහත් කෙනෙක්) වෙමියි යන මානය'යි මාන තුනක් වෙත්.

අතීත කාලය, අනාගත කාලය, වර්තමාන කාලය යන කාල තුනකි.

සක්කාය අන්තය (උපාදාන ස්කන්ධ පස නමැති කොටස,) සක්කාය සමුදය අන්තය (උපාදාන ස්කන්ධ පසට හෙතුවවූ තණ්හාව නමැති කොටස) සක්කාය නිරොධ අන්තය (නිර්වාණය නමැති කොටස) යි අන්ත (කොටස්) තුනෙකි.

සැප වෙදනා, දුක් වෙදනා, උපෙක්ඛා (සැප දුක් දෙකට මැදහත්) වෙදනා යි වෙදනා තුනකි.

දුක්ඛතා තුනක් වෙත්. දුක්ඛ දුක්ඛතාව (දුක් වෙදනාව,) සංඛාර දුක්ඛතාව (උපෙක්ඛා වෙදනාව,) විපරිනාම දුක්ඛතාව (සුඛ වෙදනාව) යි දුක්ඛතා තුනකි.

මිච්ඡත්තනියත රාසිය (නියත මිථ්‍යාදෘෂ්ටිය සහ ආනන්තරිය කර්ම,) සම්මත්තනියත රාසිය (සතර ආය්‍යී මාර්ගය,) අනියත රාසිය (නියත මිථ්‍යාදෘෂ්ටි ආනන්තරිය කර්ම හැර ඉතිරි ධර්ම) යන රාසි තුනකි.

ඉකුත් කාලය අරබයා සැක කරයි. විචිකිච්ඡා උපදවයි. නිශ්චය හෝ නොකරයි. නොපහදයි. අනාගත කාලය ගැන හෝ සැක කරයි. සැක උපදවයි. තීරණයකට නොබසියි. නොපහදියි. දැන් පවත්නා කාලය ගැන හෝ සැක කරයි. සැක උපදවයි. නිශ්චය නොකරයි. නොපහදියි යන සැක තුනක් වෙත්.

"තථාගතයන් වහන්සේගේ නොරැක්කයුතු කරුණු තුනක් වෙත්. ඇවැත්නි, තථාගත තෙමේ පිරිසිදු කාය සමාචාර (කයෙහි පැවතුම්) ඇත්තේ වෙයි. මාගේ මෙය (මේ දුශ්චරිතය) අන්‍යයා නොදනීවායි රැක්ක යුතු කාය දුශ්චරිත තථාගතයන් වහන්සේට නැත. ඇවැත්නි, තථාගත තෙම පිරිසිදු වාක් සමාචාර (වචනයෙහි පැවතුම්) ඇත්තේය. මාගේ මෙය (මේ වාක් දුශ්චරිතය) අන්‍යයා නොදනීවායි රැක්ක යුතු වාක් දුශ්චරිතයක් තථාගතයන් වහන්සේට නැත. ඇවැත්නි, තථාගත තෙම පිරිසිදු මනො සමාචාර (මනො පැවැත්ම) ඇත්තේය. මාගේ මෙය (හිතේ දුශ්චරිතය) අන්‍යයා නොදනීවායි රැක්ක යුතු මනො දුශ්චරිතයක් තථාගතයන්වහන්සේට නැත යන මේ තුනය.

පලිබොධ තුනක් වෙත්. රාග පලිබොධය, දොස පලිබොධය, මොහ පලිබොධය යන තුනයි.

ගිනි තුනක් වෙත්. රාග ගින්න, ද්වෙෂ ගින්න, මොහ ගින්න යන තුනය.

අනිකුදු ගිනි තුනක් වෙත්. ආහුණෙය්‍ය ගින්නය (මවුපියන්,) ගෘහපති ගින්නය (ස්වාමිපුරුෂයා,) දක්ඛිණෙය්‍ය ගින්නය (භික්ෂුසංඝයා,) යන තුනයි.

තුන් ප්‍රකාරයකින් රූප සංග්‍රහය වේ. දැකීම් සහිත හැපීම් සහිත රූපය, දැකීම් රහිත හැපීම් සහිත රූපය, දැකීම් රහිත හැපීම් රහිත රූපය යන තුනයි.

"සංස්කාර තුනක් වෙත්. පුණ්‍යාභිසංස්කාරය, (අට වැදෑරුම් කාමාවචර කුසල චෙතනා සහ පස්වැදෑරුම් රූපාවචර කුසල චෙතනා,) අපුණ්‍යාභිසංස්කාරය (දොළොස් අකුසල චෙතනා,) අනෙඤ්ජාභිසංස්කරණය (සතර වැදෑරුම් අරූපාවචර කුසල චෙතනා) යන තුනයි.

"පුද්ගලයෝ තුන්දෙනෙක් වෙත්. සෙඛ (අර්හත්ඵලය හැර ඉතිරි මාර්ගඵලයන්ට පැමිණි ආයඹියෝ සත්දෙන) පුද්ගලයා, අසෙඛ (අර්හත්ඵල ලැබූ) පුද්ගලයා, නෙවසෙඛනාසෙඛ (සෙඛත් නොවන අසෙඛත් නොවන පෘථග්ජන) පුද්ගලයා යන තුන්දෙනය.

"ස්ථවිරයන් තිදෙනෙකි. ජාති ථෙර (මහලු ගිහියා,) ධම්ම ථෙර (සීලාදි ථෙරකරණිය ධර්මයන්ගෙන් යුත් භික්ෂුව,) සම්මුතිථෙර (නමින් ථෙර ථෙර යි කියනු ලබන භික්ෂුව) යන තුන් දෙනය.

"දානමය පුණ්‍යක්‍රියා වස්තුව, සීලමය පුණ්‍යක්‍රියා වස්තුව, භාවනාමය පුණ්‍යක්‍රියා වස්තුවයයි පුණ්‍යක්‍රියා වස්තු තුනකි.

"දැකීමෙන්, ඇසීමෙන්, සැක කිරීමෙන්යයි චොදනා වස්තු තුනකි.

"කාමූපපත්ති (කාම සම්පත් ලැබීම්) තුනක් වෙත්. ඇවැත්නි, ඉදිරියට පැමිණි අරමුණුවලින් කම් සැප විඳින සත්ව කෙනෙක්

ඇත්තාහ. ඔවුහු ඉදිරියට පැමිණි ඇතැම් කාම වස්තූන්හි වසය (අයිතිය) පවත්වත්. මිනිසුන්ද, දෙවියන්ද, ඇතැම් විනිපාතිකයන්ද (නිරිසතුන් හැර ඉතිරි ආපායික සත්වයන්) මෙනි. මේ පළමුවන කාමූපපත්තියයි.

"ඇවැත්නි, මවනලද කාමසම්පත් ඇති සත්ව කෙනෙක් ඇත්තාහ. ඔවුහු මව මවා කාමයන්හි වසය පවත්වති. නිම්මාණ රතී දෙව්ලොව වැසි දෙවියන් මෙනි. මේ දෙවන කාමූපපත්තියයි.

"ඇවැත්නි, අනුන් විසින් මවනලද කාමසම්පත් ඇති සත්ව කෙනෙක් වෙත්. ඔවුහු පර නිර්මිත (අනුන් විසින් මවනලද) කාමයන්හි වසය පවත්වති. පරනිර්මිත වසවර්ති දෙව්ලොව වැසි දෙවියන් මෙනි. මේ තෙවන කාමූපපත්තියයි.

"සුඛොත්පත්ති (සැප ලැබීම්) තුනක් වෙත්. ඇවැත්නි, ධ්‍යාන සැප උපදව උපදවා සැපවිඳින්නාවූ සත්වකෙනෙක් ඇත්තාහ. බ්‍රහ්මකායික දෙවියෝ යම්සේද එමෙනි. මේ පළමුවන සැප ලැබීමයි.

"ඇවැත්නි, ධ්‍යානසැපයෙන් තෙත්වූ හාත්පසින් තෙත්වූ සම්පූර්ණවූ පැතිරගියාවූ ඔවුහු ඇතැම්විට 'අනේ සැපය! අනේ සැපයයි' ප්‍රීතිවාක්‍ය පවත්වත්. ආභස්සර දෙවියෝ යම්සේද එමෙනි. මේ දෙවන සැප ලැබීමයි.

"ඇවැත්නි, සැපයෙන් තෙත්වූ, හාත්පසින් තෙත්වූ ගැවසුනාවූ පිරුණාවූ පැතිර ගියාවූ සත්වකෙනෙක් ඇත්තාහ. ඔව්හු සතුටුවූවාහු, ඇත්තාවූම චිත්තසුඛයක් විඳිත්. සුභකිණ්හ දෙවියෝ යම්සේද එමෙනි. මේ තෙවන සැප ලැබීමයි.

"ප්‍රඥා තුනක් වෙත්. ශෛක්ෂ (යට මාර්ගඵල ඇත්තන්ගේ) ප්‍රඥාව, අශෛක්ෂ (රහත් ඵලයේ සිටි පුද්ගලයාගේ) ප්‍රඥාව, නෙවසෙක්ඛ නාසෙක්ඛ (පෘථග්ජන) ප්‍රඥාව යන තුනය.

"අනිකුදු ප්‍රඥා තුනක් වෙත්. චින්තාමය (සිතීමෙන් ලබන) ප්‍රඥාව, සුතමය (ඇසීමෙන් ලබන) ප්‍රඥාව, භාවනාමය (භාවනා කිරීමෙන් ලබන) ප්‍රඥාව යන තුනයි.

"ආවුධ තුනක් වෙත්. සුතාවුධය (ධර්මය ඇසීමෙන් ලබන නුවණ නමැති ආයුධය,) පවිවෙකාවුධය (කාය විවෙක චිත්ත විවෙක උපධි විවෙක යන ත්‍රිවිධ විවෙකය නමැති ආයුධය,) පඤ්ඤාවුධය (ලෞකික ලොකොත්තර ප්‍රඥාව නමැති ආයුධය) යන තුනයි.

ඉන්ද්‍රිය තුනක් වෙත්. අනඤ්ඤාතං ඤස්සාමිතින්ද්‍රිය, (සොතාපත්ති මාර්ගඥානය,) අඤ්ඤින්ද්‍රිය (සොවාන් ඵලයෙහි පටන් අර්හත්මාර්ගය දක්වා ඇති ඥාන සය,) අඤ්ඤාතාවින්ද්‍රිය (අර්හත් ඵලය) යන තුනයි.

"ඇස් තුනක් වෙත්. මසැස, දිවැස, නුවණැස යන තුනයි.

"ශික්ෂා තුනක් වෙත්. අධිශීල ශික්ෂාව (භික්ෂු ශීලය,) අධිචිත්ත ශික්ෂාව (විදර්ශනාපාදක ධ්‍යාන,) අධිප්‍රඥා ශික්ෂාව (විදර්ශනා ප්‍රඥාව) යන තුනයි.

"භාවනා, තුනක් වෙත්. කාය භාවනා (රහතන් වහන්සේගේ පඤ්ච ද්වාර කය,) චිත්ත භාවනා (අෂ්ට සමාපත්ති,) පඤ්ඤා භාවනා (අර්හත්ඵල ප්‍රඥාව) යන තුනයි.

"අනුත්තරිය (සියල්ලට උසස්) ධර්ම තුනක් වෙත්. දස්සනානුත්තරිය (විදර්ශනා ඥානය,) පටිපදානුත්තරිය (මාර්ගඥාන,) විමුත්තානුත්තරිය (ඵලඥාන) යන තුනයි.

"සමාධි තුනක් වෙත්. සවිතක්ක සවිචාර සමාධිය (විතර්කය හා විචාරය සහිත සමාධිය,) අවිතක්ක විචාරමත්ත සමාධිය (විතර්කය නැති විචාරය පමණක් ඇති සමාධිය,) අවිතක්ක අවිචාර සමාධිය (විතර්ක විචාර දෙකම නැති සමාධිය) යන තුනයි.

"අනිකුදු සමාධි තුනක් වෙත්. සුඤ්ඤාත සමාධිය (අනාත්මය දක්නා විදර්ශනා සමාධිය,) අනිමිත්ත සමාධිය (අනිත්‍යය දක්නා විදර්ශනා සමාධිය,) අප්පණිහිත සමාධිය (දුක දක්නා විදර්ශනා සමාධිය) යන තුනයි.

"සොචෙය්‍ය (පිරිසිදු බැව් ඇති කරන්නාවූ) ධර්ම තුනක් වෙත්. කාය සොචෙය්‍ය (ත්‍රිවිධ කාය සුචරිත) වචී සොචෙය්‍ය

(වාක් සුචරිත සතර) මනො සොචෙය්‍ය (ත්‍රිවිධ මනො සුචරිත) යන තුනයි.

"මොනෙය්‍ය (මුනි භාවය කරන්නාවූ) ධර්ම තුනක් වෙත්. කාය මොනෙය්‍ය (කාය සුචරිතාදිය,) වචී මොනෙය්‍ය (වචී සුචරිතාදිය,) මනො මොනෙය්‍ය (මනො සුචරිතාදිය) යන තුනයි.

"කෞශල්‍ය (දක්ෂකම්) තුනක් වෙත්. ආය කෞශල්‍යය (කුශලයන්ගේ දියුණුව පිණිස පවත්නා ප්‍රඥාව,) අපාය කෞශල්‍ය (කුසලයන්ගේ විනාශය දක්නා ප්‍රඥාව) උපාය කෞශල්‍යය (තැනට සුදුසු නුවණ) යන මේ තුනය.

"මද තුනක් වෙත්. ආරොග්‍ය මදය, යොබ්බන (තරුණ) මදය, ජාති (උසස් ජාතියකය යන) මදය යන තුනයි.

"ආධිපත්‍යය (අධිපතිකම්) තුනක් වෙත්. අත්තාධිපතෙය්‍ය (තමා අධිපති කොට ඇති බව) ලොකාධිපතෙය්‍ය (ලොකයා අධිපති කොට ඇති බව) ධම්මාධිපතෙය්‍යය (ධර්මය අධිපති කොට ඇති බව) යන තුනයි.

"කථාවස්තු තුනක් වෙත්. අතීත කාලයෙහි මෙසේ වූයේ යයි ඉකුත් කාලය ගැන හෝ කථා කියන්නේය, අනාගත කාලයෙහි මෙසේ වන්නේයයි අනාගත කාලය ගැන හෝ කථා කියන්නේය. දැන් මේ කාලයෙහි මෙසේ වෙයි කියා දැන් පවත්නා කාලය ගැන හෝ කථා කියන්නේය යන තුනයි.

"විද්‍යා තුනක් වෙත්. පෙරවිසූ ජාති පිළිවෙළ දැනීමේ විද්‍යාව, සත්වයන්ගේ චුති උත්පත්ති දැනීමේ විද්‍යාව, කෙලෙස් නැති කරන ප්‍රඥාව වන විද්‍යාව යන තුනයි.

"විහරණ (පැවතුම්) තුනක් වෙත්. දිව්‍ය විහරණය (අෂ්ට සමාපත්ති) බ්‍රහ්ම විහරණය, (මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා) ආය්‍යී විහරණය (ඵල සමාපත්ති) යන තුනයි.

"ප්‍රාතිහාය්‍යී තුනක් වෙත්. ඍද්ධි ප්‍රාතිහාය්‍යීය, ආදෙශනා ප්‍රාතිහාය්‍යීය, අනුශාසනී ප්‍රාතිහාය්‍යීය යන තුනයි.

"ඇවැත්නි, ඒ දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ තුනක් තුනක්වූ ධර්මයෝ යහපත්සේ ප්‍රකාශ කරන ලද්දාහ.

"යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝ කල් පවත්නේ වේද චිරස්ථායී වේද එසේ සියල්ලන් විසින් එක්ව ඒ ධර්මය සජ්ඣායනා කළ යුත්තේය, විවාද නොකළ යුත්තේය, එය බොහෝදෙනාට හිත පිණිසද බොහෝ දෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙව් මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය.

**9.** "ඇවැත්නි, දන්නාවූ දක්නාවූ රහත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට ප්‍රකාශකරන ලද්දාවූ සතර ධර්මකෙනෙක් ඇත්තාහ.

"යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝ කල් පවත්නේ වේද චිරස්ථායී වේද එසේ සියල්ලන් විසින් එක්ව ඒ ධර්මය සජ්ඣායනා කළ යුත්තේය. විවාද නොකළ යුත්තේය, එය බොහෝ දෙනාට හිත පිණිසද බොහෝ දෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙව් මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය. ඒ කවර සතර ධර්ම කෙනෙක්ද?

"සතිපට්ඨාන සතරක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණ ඇත්තේ, සිහි ඇත්තේ, කාය ලොකයෙහි අභිධ්‍යා, දෞර්මනස්‍ය (ලොභය හා ද්වෙෂය) දුරුකොට ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරයි. වේදනාවන්හි, චිත්තයෙහි, ධර්මයන්හි, ධර්මය අනුව බලමින් වාසය කරයි. යන සතර ධර්මයෝයි.

"සම්‍යක් ප්‍රධානසතරක් වෙත්. ඇවැත්නි, මේ සාසනයෙහි මහණතෙම නූපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි, වීර්‍ය්‍යය පටන් ගනියි. සිත දැඩිකොට ගනියි. උපන්නාවූ ලාමක අකුසල ධර්මයන්ගේ නැතිකිරීම පිණිස කැමැත්ත උපදවයි, වෑයම් කරයි. වීර්‍ය්‍යය පටන්ගනියි. සිත දැඩිකොට ගනියි. නූපන් කුසල

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවයි, උත්සාහ කරයි. වීර්යය පටන්ගනියි. සිත දැඩිකොට ගනියි, උපන් කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස මුළානොවීම පිණිස, බොහෝවීම පිණිස, මහත්වීම පිණිස වැඩිවීම පිණිස, භාවනාවෙන් සම්පූර්ණ කිරීම පිණිස කැමැත්ත උපදවයි, වෑයම් කරයි, වීර්යය පටන්ගනියි, සිත දැඩිකොට ගනියි, යන මේ සතරයි.

"ඎද්ධිපාද සතරක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම ඡන්දසමාධිය ප්‍රධානකොට ඇති සංස්කාරයන් ගෙන් යුක්තවූ ඎද්ධිපාදය වඩයි, චිත්ත සමාධිය ප්‍රධානකොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ ඎද්ධිපාදය වඩයි. වීර්යය සමාධිය ප්‍රධානකොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ ඎද්ධි පාදය වඩයි. වීමංසා සමාධිය ප්‍රධානකොට ඇති සංස්කාරයන් ගෙන් යුක්තවූ ඎද්ධිපාදය වඩයි යන සතරයි.

"ධ්‍යානසතරක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම කාමයන්ගෙන් වෙන්වම අකුසලය ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවෙකයෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් ඇතුළත පැහැදීම ඇත්තාවූ, හිතේ එකඟ බව ඇති, විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත්, ප්‍රීතිය හා සැපය ඇති, ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතියගේ වැළැක්මෙන්ද, උපෙක්ෂා සහිතවූයේ සිහියෙන් යුක්තවූයේ නුවණින් යුක්තවූයේ ශරීරයෙන් සුවය විඳිමින් උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහරණ ඇත්තේයයි උත්තමයෝද කියද්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. සැපය දුරුකිරීමෙන්ද, දුක දුරුකිරීමෙන්ද, පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් නිදුක්වූ නොසැපවූ උපෙක්ෂා ස්මෘති පාරිසුද්ධිය ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි යන සතර ධ්‍යානයෝයි.

"සමාධි භාවනා සතරක් වෙත්. ඇවැත්නි, (යම් භාවනාවක්) වඩනා ලද්දී බහුල වශයෙන් කරන ලද්දී, මෙලොව මේ ආත්මයෙහි සැප විහරණය පිණිස පවතීද එබඳු සමාධි

භාවනාවක් ඇත. (යම් භාවනාවක්) වඩනා ලද්දී, බහුල වශයෙන් කරන ලද්දී ඥාන දර්ශන (දිව්‍ය චක්ෂුරභිඥානය) ප්‍රතිලාභය පිණිස පවතීද, (එබඳු) සමාධි භාවනාවක් ඇත. ඇවැත්නි, (යම් භාවනාවක්) වඩනා ලද්දී බහුල වශයෙන් කරන ලද්දී, ස්මෘති සම්ප්‍රජන්‍යය (සිහිය හා ඥානය) පිණිස පවතීද (එබඳු) සමාධි භාවනාවක් ඇත. ඇවැත්නි, (යම් සමාධි භාවනාවක්) වඩනා ලද්දී බහුල වශයෙන් කරන ලද්දී ආශ්‍රවයන් (කෙලෙස්) ක්ෂයකිරීම පිණිස පවතීද, එබඳු සමාධි භාවනාවක් ඇත.

"ඇවැත්නි, කවර නම් සමාධි භාවනාවක් වඩනා ලද්දී බහුල වශයෙන් කරන ලද්දී මේ ආත්මයෙහි සැප විහරණය (සැපසේ විසීම) පිණිස පවතීද,

"ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම කාමයන්ගෙන් වෙන්වූයේ, අකුසල ධර්මයන්ගෙන් වෙන්වූයේ විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයිද,

"විතර්ක විචාරයන්ගේ සංසිඳවීමෙන් ඇතුලත පැහැදීම ඇති කරන්නාවූ හිතේ එකග බවයයි කියනලද විතර්ක විචාර යන ධ්‍යානාංග නැත්තාවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයිද,

"ප්‍රීතියගේ නැතිකිරීමෙන්ද උපෙක්ෂා ඇත්තේද යහපත් ප්‍රඥාව ඇත්තේද වාසය කරයි. කයින් සැපයද විඳියි. යමක් උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේයයි ආර්‍ය්‍යයෝ (බුද්ධාදි උත්තමයෝ) කියද්ද ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයිද,

"සැපය දුරුකිරීමෙන්ද, දුක දුරුකිරීමෙන්ද පෙරසේම සොම්නස හා දොම්නස නැති කිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ මැදහත් සිහිය පිළිබඳ පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද,

"ඇවැත්නි, මේ සමාධි භාවනාව වඩනා ලද්දී, බහුල වශයෙන් කරන ලද්දී මෙලොව සැපසේ වාසය පිණිස පවතියි.

'ඇවැත්නි, කවර සමාධි භාවනාවක් වඩනා ලද්දී බහුල වශයෙන් කරනලද්දී ඥානදර්ශන (දිව්‍ය චක්ෂුරභිඥානය) ප්‍රතිලාභය පිණිස පවතීද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම, ආලොක සංඥාව මෙනෙහි කරයි. දවල්ය යන සංඥාව අධිෂ්ඨාන කරයි. දහවල් යම්සේද රාත්‍රියත් එසේය, රාත්‍රිය යම්සේද දහවලත් එසේයයි, මෙසේ විවෘතවූ හාත්පසින් ආවරණය නොවූ සිතින් ආලොක සහිත සිත වඩයි. ඇවැත්නි මේ සමාධි භාවනාව වඩනා ලද්දී බහුල වශයෙන් කරන ලද්දී, ඥාන දර්ශන ප්‍රතිලාභය පිණිස පවතියි.

"ඇවැත්නි, කවර නම් සමාධි භාවනාවක් වඩනා ලද්දී බහුල වශයෙන් කරන ලද්දී ස්මෘති සම්ප්‍රජන්‍යය පිණිස පවතීද, ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුවට ප්‍රකටවූ (පැහැදිලිව පෙනෙන) වෙදනාවෝ උපදිති. ප්‍රකට වූවාහු වැටහෙත්. ප්‍රකට වූවාහු විනාසයට යෙත්. ප්‍රකට සංඥාවෝ උපදිත්. ප්‍රකට වූවාහු වැටහෙත්. ප්‍රකට වූවාහු විනාසයට යෙත්. ප්‍රකටවූ විතර්කයෝ උපදිත්. ප්‍රකට වූවාහු ඉදිරිපත්ව සිටිත්. ප්‍රකට වූවාහු විනාසයට යෙත්.

"ඇවැත්නි, මේ සමාධි භාවනා තොමෝ වඩනා ලද්දී බහුල වශයෙන් කරන ලද්දී, ස්මෘති සම්ප්‍රජන්‍යය, පිණිස පවතියි.

"ඇවැත්නි, කවර නම් සමාධි භාවනාවක් වඩනා ලද්දී බහුල වශයෙන් කරන ලද්දී කෙලෙස් නැසීම පිණිස පවතීද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම උපාදානස්කන්ධ පසෙහි ඇතිවීම නැතිවීම අනුව බලමින් වාසය කරයි. මේ රූපයයි. මේ රූපය හටගැනීමේ හේතුවයි. මේ රූපයාගේ නිරුද්ධ වීමයි. මේ සංඥාවෝය, මේ සංස්කාරයෝය, මේ විඥානයය, මේ විඥානයාගේ හටගැනීමේ හේතුවයි. මේ විඥානයාගේ විනාසයයි. උපාදානස්කන්ධ පසෙහි ඇතිවීම හා නැතිවීම බලමින් වාසය කරයි.

"ඇවැත්නි, මේ සමාධි භාවනාව වඩනා ලද්දී බහුල වශයෙන් කරන ලද්දී කෙලෙස් නැසීම පිණිස පවතියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"අප්‍රමාන්‍යයෝ (ප්‍රමාණ කළ නොහැකි සත්වයන් කෙරෙහි පවත්නා ධර්ම) සතරක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවෙනි දිසාවය, තුන්වෙනි දිසාවය, සතරවෙනි දිසාවය. මෙසේ උඩ යට සරස යන සියලු තන්හි පැතුරුණාවූ, සියල්ලෙන් යුක්තවූ ලොකය, විපුලවූ මහද්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද රහිතවූ මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසයකරයි. කරුණා සහගත සිතින්, මුදිතා සහගත සිතින්, උපෙක්ෂා සහගත සිතින්, පතුරුවා වාසය කරයි. එසේම දෙවන දිසාවය, එසේම තුන්වන දිසාවය, එසේ සතරවන දිසාවය, මෙසේ උඩ යට සරස සියලු තැන පතළාවූ සියල්ලෙන් යුක්තවූ ලොකය, විපුලවූ මහද්ගතවූ, අප්‍රමාණවූ, අවෛරවූ ධ්‍යානය ව්‍යාපාද රහිතවූ උපෙක්ෂා සහගත සිතින් පැතිර වාසය කරයි. (යන සතරයි.)

"ආරූප්‍ය (අරූප ධ්‍යාන) සතරක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම සියලු අයුරින් රූප සංඥාව ඉක්මවීමෙන් ප්‍රතිඝ (ගැටීම්) සංඥාව නැති කිරීමෙන් නානත්ත (විවිධ) සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්ත යයි ආකාසානඤ්චායතනධ්‍යානයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඥානය අනන්තයයි විඥානඤ්චායතනධ්‍යානයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් විඥානඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනධ්‍යානයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානයට පැමිණ වාසය කරයි, (යන සතරයි.)

"අපස්සෙන (ආධාර) සතරක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම නුවණින් දැන සෙවනය කළයුත්ත සේවනය කරයි. නුවණින් දැන ඉවසිය යුත්තක්ම ඉවසයි. නුවණින් දැන දුරුකළ යුත්තක්ම දුරුකරයි. නුවණින් දැන පහකළ යුත්තක්ම පහකරයි, (යන සතරයි)

"ආයර්‍ය්‍යවංශ සතරක් වෙත්. ඇවැත්නි මේ ශාසනයෙහි මහණතෙම ඉතරීතර චීවරයෙන් (ලැබුණු කවර හෝ සිවුරකින්) සතුටුවෙයි. ඉතරීතර චීවර සන්තෝෂයෙහි ගුණ කියන්නේද වෙයි. චීවරය සඳහා නුසුදුසුවූ සෙවීමක් නොකැපවූ දෙයක් නොකරයි. සිව්රක් නොලැබුණේද නොකලකිරෙයි. සිව්රක් ලැබුණේද එහි නොඇලී මුසපත් නොවී තණ්හාවෙන් නොබැඳී ආදිනව (දොස්) දන්නා ගති ඇතුව සසරින් මිදීමේ ප්‍රඥාවෙන් යුක්තව පරිභොග කරයි. ඒ ඉතරීතර චීවර සන්තෝෂයෙන්ද තමා උසස් නොකෙරෙයි. අනුන් පහත් නොකෙරෙයි. යමෙක් එහි දක්ෂවූයේ අලස නොවූයේ සිහියෙන් සහ නුවණින් යුක්තවූයේ වේද, ඇවැත්නි, මේ මහණතෙම පැරණිවූ අග්‍රයයි දන්නාවූ ආයර්‍ය්‍යවංශයෙහි සිටියේයයි කියනු ලැබේ.

"ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මේ ශාසනයෙහි මහණතෙම ඉතරීතර පිණ්ඩපාතයෙන් (ලැබුනු පිණ්ඩපාතයකින්) සතුටුවූයේ වෙයි. ඉතරීතර පිණ්ඩපාතයෙන් සතුටු වීමෙහි ගුණ කියන්නේද වෙයි. පිණ්ඩපාතය නිසා නුසුදුසුවූ සෙවීමක් නොකැපවූ දෙයක් නොකරයි. පිණ්ඩපාතය නොලැබද නොකලකිරෙයි. පිණ්ඩපාතය ලැබද එහි ගිජුනොවී මුසපත්නොවී නොබැඳී දොෂ දකිමින් සසරින් මිදීමේ නුවණින් යුක්තව වළඳයි. ඒ ඉතරීතර පිණ්ඩපාතයෙන් සතුටු වීමෙන්ද තමා නොම උසස් කරයි. අනුන් පහත් නොකරයි. යමෙක් වනාහි එහි දක්ෂවූයේ අලස නොවූයේ සිහිනුවණින් යුක්තවූයේ වේද, ඇවැත්නි, මේ මහණතෙම පැරණිවූ අග්‍රයයි දන්නාවූ ආයර්‍ය්‍යවංශයෙහි සිටියේ යයි කියනු ලැබේ. ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මේ ශාසනයෙහි මහණ තෙම ඉතිරීතර සෙනාසනයෙන් (ලැබුනු සෙනසුනකින්) සතුටු වූයේ වේ. ලැබුනු සෙනසුනෙන් සතුටුවීමෙහි ගුණ කියන්නේද වෙයි. සෙනසුන් නිසා නුසුදුසුවූ සෙවීමක් නොකැපවූ දෙයක් නොකරයි. සෙනස්නක් නොලැබද නොකලකිරෙයි. සෙනස්නක් ලැබද ගිජුනොවී මුසපත් නොවී නොබැඳී දොස් දක්නා ගති ඇතිව සසරින් මිදීමේ නුවණින් යුක්තව පරිභොග කරයි.

"ඒ ලදපරිදි සෙනස්නෙන් සතුටුවීමෙන්ද තමා උසස් නොකරයි. අනුන් පහත් නොකරයි. යමෙක් එහි දක්ෂ වූයේ අලස නොවූයේ සිහියෙන් හා නුවණින් යුක්තවූයේ වේද ඇවැත්නි, මේ මහණතෙම පැරණි අග්‍රයයි දන්නාවූ ආර්‍ය්‍යවංශයෙහි සිටියේයයි කියනු ලැබේ.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණතෙම ප්‍රහාණයෙහි (කෙලෙස් දුරුකිරීමෙහි) කැමැත්තේ ප්‍රහාණයෙහි ඇලුනේ වෙයි. භාවනාවෙහි සතුටුවූයේ භාවනාවෙහි ඇළුනේ වෙයි. ඒ කෙලෙස් දුරුකිරීමෙහි කැමැත්තෙන්ද කෙලෙස් දුරුකිරීමෙහි ඇලීමෙන්ද, භාවනාවෙහි කැමැත්තෙන්ද, භාවනාවෙහි ඇලීමෙන්ද තමා නොම උසස් කරයි. අනුන් නොපිරිහෙළයි. යමෙක් වනාහි එහි දක්ෂවූයේ අලස නොවූයේ වේද, ඇවැත්නි, මේ මහණතෙම පැරණිවූ අග්‍රයයි දන්නාවූ ආර්‍ය්‍ය වංශයෙහි සිටියේයයි කියනු ලැබේ, (යන සතරයි.)

"ප්‍රධාන (උතුම්වීර්‍ය්‍යය) සතරක් වෙත්. සංවරප්‍රධානය (ඇස් ආදිය සංවර කරන්නහුට උපන් වීර්‍ය්‍යය) ප්‍රහාණප්‍රධානය, (කාමවිතර්කාදීන් දුරුකරන්නාහුට උපන් වීර්‍ය්‍යය) භාවනා ප්‍රධානය (බොධ්‍යාංග භාවනා කරන්නහුට උපන් වීර්‍ය්‍යය) අනුරක්ෂණ ප්‍රධානය (සමාධිනිමිත්ත රක්නහුට උපන් වීර්‍ය්‍යය) යන සතරයි. ඇවැත්නි, සංවර ප්‍රධානය කවරේද? ඇවැත්නි මේ ශාසනයෙහි මහණතෙම ඇසින් රූපයක් දැක නිමිති ගන්නේ නොවේද, අනුබ්‍යඤ්ජන (නැවත නැවත මතුකොට සිතීම්) වශයෙන් ගන්නේ නොවේද, යම් හේතුවකින් මේ දෙයෙහි සංවර රහිතව වාසයකරන්නහුට අභිධ්‍යා දෞර්මනස්‍යවූ (ලොභ ද්වෙෂ) ලාමකවූ අකුශල ධර්මයෝ පහළ වෙත්ද එහෙයින් ඇස සංවර කිරීම පිණිස පිළිපදියි ඇස රකියි. චක්ෂුරින්ද්‍රියෙහි (ඇසෙහි) සංවරයට පැමිණෙයි. කණින් ශබ්දයක් අසා, නැහැයෙන් සුවඳක් දැන, දිවෙන් රසක් විඳ, කයින් ස්පර්ශයකොට සිතින් ධර්මාරම්මණයක් දැන නිමිති වශයෙන් නොගන්නේ වේද, අනුබ්‍යඤ්ජන වශයෙන් නොගන්නේ වේද යම් හේතුවකින් මේ මනින්ද්‍රිය අසංවරව වාසයකරන්නාහුට

ලොභ ද්වෙෂ යන ලාමකවූ අකුශල ධර්මයෝ පහළවෙත්ද එහෙයින් මනස සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රිය (හිත) රකියි. මනින්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි. ඇවැත්නි, මේ සංවර ප්‍රධානයයි කියනු ලැබේ.

"ඇවැත්නි, ප්‍රහාණ ප්‍රධානය (හෙවත් කෙලෙස් දුරලීමෙහි වීර්යය) කවරේද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම උපන්නාවූ කාම විතර්කය (කාම කල්පනාව) නොඉවසයි, හැර දමයි, දුරුකරයි, කෙළවර කරයි, අභාවයට පමුණුවයි. උපන්නාවූ ව්‍යාපාද විතර්කය (නැසීමේ අදහස) උපන්නාවූ විහිංසා විතර්කය (හිංසා අදහස,) උපනුපන් ලාමකවූ අකුශල ධර්මයන් නොඉවසයි, හැරදමයි, දුරුකරයි, කෙළවර කරයි, අභාවයට පමුණුවයි, ඇවැත්නි, මේ ප්‍රහාණ ප්‍රධානයයි, කියනු ලැබේ.

ඇවැත්නි, භාවනාප්‍රධානය කවරේද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය (නිවණ) ඇසුරුකළාවූ, විරාගය (නිවණ) ඇසුරුකළාවූ, නිරොධය (නිවණ) ඇසුරු කළාවූ කෙළෙස් දුරු කිරීමෙහි නැමීම් ඇත්තාවූ, ස්මෘති සම්බොධ්‍යංගය (මාර්ගඵල අවබොධයෙහි අංගයක් වන සිහිය) වඩයි. ධර්මවිචය සම්බොධ්‍යංගය වඩයි. වීර්යය සම්බොධ්‍යංගය වඩයි. ප්‍රීති සම්බොධ්‍යංගය වඩයි. ප්‍රශ්‍රබ්ධි (හිත කය දෙක නිවීම) සම්බොධ්‍යංගය වඩයි. සමාධි සම්බොධ්‍යංගය වඩයි විවෙකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ වොස්සග්ගපරිනාමය (කෙලෙස් දුරුකිරීමෙහි නැමීම්) ඇති උපෙක්ෂා සම්බොධ්‍යංගය වඩයි. ඇවැත්නි, මේ භාවනාප්‍රධානයයි කියනු ලැබේ.

"ඇවැත්නි, අනුරක්ෂණා ප්‍රධානය කවරේද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම, උපන්නාවූ යහපත්වූ සමාධිනිමිත්ත රකියි. අස්තික සංඥාව (ඇටය යන හැඟීම) පුලවක (පණු) සංඥාව, විනීලක (නිල්වූ මළ සිරුර) සංඥාව, විච්ඡිද්‍රක (කොටස් කපා දැමූ මළසිරුර) සංඥාව, උද්ධුමාතක (ඉදිමුණ මළසිරුර) සංඥාව රකියි. ඇවැත්නි, මේ අනුරක්ෂණා ප්‍රධානයයි කියනු ලැබේ. (යන සතරයි.)

"ඤාණ සතරක් වෙත්. ධර්මයෙහි ඤාණය (චතුස්සත්‍ය දක්නාවූ මාර්ගඥාන හා ඵලඥාන) අන්වයෙහි ඤාණය, (චතුස් සත්‍ය දක්නා ඥාණය අනුවගිය ඥානය) පරිච්ඡේදයෙහි ඤාණය, (අනුන්ගේ සිත් පිරිසිඳ දැනගන්නා ඥානය) සම්මුතියෙහි ඤාණය (අවශෙෂ ඥාන) (යන සතරයි.)

"අන්‍යවූද ඤාණ සතරක් වෙත්. දුකෙහි ඤාණය, දුක් හට ගැන්මෙහි ඤාණය, දුක් නැතිකිරීමෙහි ඤාණය, දුක් නැති කිරීමට පිළිපදින මාර්ගයෙහි ඤාණය, (යන සතරයි)

"සෝවාන්වීමට අංග සතරක් වෙත්. සත්පුරුෂ සේවනය, සද්ධර්මශ්‍රවණය, යොනිසෝමනසිකාරය (නුවණින් කල්පනා කිරීම) ධර්මානුධර්මප්‍රතිපත්තිය (ලොකොත්තර ධර්ම අනුව පිළිපැදීම (යන සතරයි)

"සෝවාන් වූවහුගේ අංග සතරක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් (නොසෙල්වෙන පැහැදීමෙන්) යුක්තවූයේ වෙති. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙන් අර්හත්ය. සම්‍යක්සම්බුද්ධය, විජ්ජාචරණ සම්පන්නය, සුගතය, ලොකවිදූය, දමනය කළයුතු පුරුෂයන් දමනය කිරීමෙහි ශ්‍රෙෂ්ඨ රථාචාර්‍ය්‍යයෙකු බඳුය, දෙවිමිනිසුන්ට ශාස්තෲය, බුද්ධය, භාග්‍යවත්යයි, (නොසෙල්වෙන පැහැදීමෙන් යුක්තවෙයි)

"ධර්මයෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්තවූයේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මොනවට ප්‍රකාශ කරණ ලද්දේය. ඒ ඒ පුද්ගලයා විසින් දැක්කහැකි විපාක ඇත්තේය. කල් නොයවා ලැබියහැකි විපාක ඇත්තේය. අවුත් බලව යන විධියට සුදුසුය, උපනයනය (සිත එලවීම) කටයුතුය. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දතයුතුයයි (නොසෙල්වෙන පැහැදීමෙන් යුක්තවෙයි).

"සංඝයා කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය, න්‍යායවූ පරිද්දෙන්

පිළිපන්නේය, සුදුසු පිළිවෙතට පිළිපන්නේය. යම් මේ පුරුෂ යුගල සතරක් හෙවත් පුරුෂ පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද මේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම පිදීමට සුදුසුය. දුර සිට ගෙනෙනලද පූජාවට සුදුසුය. පූජාවට සුදුසුය. ඇඳිලි කිරීමට (අත් එකට තබා වැඳීමට) සුදුසුය. ලොකයාහට ඉතා උතුම්වූ පුණ්‍යක්ෂෙත්‍රයක් වෙයි. ආර්‍ය්‍යයන් විසින් කැමැතිවූ, නොකඩවූ, නොසිදුරුවූ සබල (තැනින් තැන කැඩීමෙන් කබර) නොවූ, කල්මාස (කැළැල්) නොවූ තණ්හාවට දාස බැවින් මිදුනාවූ, නුවණැත්තන් විසින් පසස්නා ලද්දාවූ, තණ්හා දිට්ඨි දෙකින් පරාමර්ශණය (අල්ලාගැණීම) නොකරණ ලද්දාවූ, සමාධිය පිණිස පවත්නාවූ, සීලයෙන් යුක්ත වූයේයයි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්තවෙයි. (යන සතරයි.)

"ශ්‍රාමාණ්‍ය ඵල (මහණ කමෙහි ඵල) සතරක් වෙත්. සෝවාන්ඵලය, සකෘදාගාමිඵලය, අනාගාමිඵලය, රහත්ඵලය, (යන සතරයි)

"ධාතු සතරක් වෙත්. පෘථිවී (තදගතිය) ධාතුව, ආපො (බැඳගන්නා ගතිය) ධාතුව, තෙජො (දවන ගතිය) ධාතුව වායො (පුම්බන ගතිය) ධාතුව, (යන සතරයි.)

"ආහාර සතරක් වෙත්. මහත්වූ හෝ සියුම්වූ හෝ කබලි කාරාහාරය, (පිඩුවසයෙන් ගන්නා ආහාරය) දෙවෙනි ඵස්සා හාර (ස්පර්ශය) තුන්වෙනි මනොසඤ්චෙතනාහාරය (චෙතනාව) සතර වෙනි විඤ්ඤාණාහාරයයි (සිත) (යන සතරයි.)

"විඤ්ඤාණට්ඨිති (විඤ්ඤාණ පැවතුම්) සතරක් වෙත්. ඇවැත්නි, රූපය උපාය (පිහිට) කොට හෝ පවත්නාවූ විඤ්ඤාණය පවතියි. රූපය අරමුණු කොට හෝ රූපය ප්‍රතිෂ්ඨා (පිහිට) කොට හෝ තෘෂ්ණාවෙන් ඉසින ලද (විඤ්ඤාණය) වැඩීමට හටගැනීමට මහත් භාවයට පැමිණේ.

"ඇවැත්නි, වෙදනාව උපාය කොට හෝ සංඥාව උපාය කොට හෝ, සංස්කාර උපාය කොට හෝ, පවත්නාවූ විඤ්ඤාණය පවතියි. සංස්කාරය අරමුණු කොට සංස්කාරය

ප්‍රතිෂ්ඨා කොට, තෘෂ්ණාවෙන් ඉසිනලද (විඤ්ඤාණය) වැඩීමට, නැගීමට මහත් භාවයට පැමිණේ. (යන සතරයි)

"අගති ගමන සතරක් වෙත්. ඡන්දයෙන් අගතියට යයි. ද්වෙෂයෙන් අගතියට යයි. භයින් අගතියට යයි, මොහයෙන් අගතියට යයි, (යන සතරයි.)

"තෘෂ්ණා ඉපදීම සතරක් වෙත්. ඇවැත්නි, චීවර හේතුවෙන් හෝ භික්ෂුහට උපදින තෘෂ්ණාව උපදියි, ඇවැත්නි, පිණ්ඩපාත හෙතුවෙන් හෝ භික්ෂුහට උපදින තෘෂ්ණාව උපදියි. ඇවැත්නි, සෙනාසන හෙතුවෙන් හෝ භික්ෂුහට උපදින තෘෂ්ණාව උපදියි. ඇවැත්නි, මෙසේ භවාභව හෙතුවෙන් (තෙල්, මීසකුරු ආදිය හෙතුකොටගෙන) හෝ භික්ෂුහට උපදින තෘෂ්ණාව උපදියි. (යන සතරයි.)

"ප්‍රතිපදා (පිළිපැදීම්) සතරක් වෙත්. වහා (මාර්ගඵල) අවබොධ නොකරන්නාවූ දුක්වූ ප්‍රතිපදාවය, වහා අවබොධ කරන්නාවූ දුක්වූ ප්‍රතිපදාවය, වහා අවබොධ නොකරන්නාවූ සැපවූ ප්‍රතිපදාවය, වහා අවබොධ කරන්නාවූ සැපවූ ප්‍රතිපදාවය, (යන සතරයි)

"අනිකුදු ප්‍රතිපදා සතරක් වෙත්. අක්ෂම (ශීත උෂ්ණාදිය නොඉවසන) ප්‍රතිපදාවය, ක්ෂම (ශීතාදිය ඉවසන) ප්‍රතිපදාවය, දම (ඉන්ද්‍රියන් දමනය කරන) ප්‍රතිපදාවය, සම (කෙලෙස් සංසිඳවන) ප්‍රතිපදාවය (යන සතරයි.)

"ධර්මපද (කොටස්) සතරක් වෙත්. අනභිධ්‍යා ධර්මපදය, (අලොභය මුල්කොට උපදවනලද ධර්ම කොටස) අව්‍යාපාද ධර්ම පදය, (අද්වෙෂය මුල්කොට උපදවන ලද ධර්මකොටස) සම්මාසතිය ධර්මපදය, (සිහිය මුල්කොට උපදවන ලද ධර්ම කොටස) සම්‍යක්සමාධිධර්මපදය, (සමාධිය මුල්කොට උපදවන ධර්ම කොටස) (යන සතරය.)

"ධර්ම සමාදාන සතරක් වෙත්. ඇවැත්නි, වර්තමානයෙහි දුක්වූද මත්තෙහි දුක් විපාක ඇත්තාවූද ධර්මසමාදානයක් ඇත්තේය. ඇවැත්නි, වර්තමානයෙහි දුක්වූද, මත්තෙහි සැප

විපාක ඇත්තාවූද ධර්මසමාදානයක් ඇත්තේය. ඇවැත්නි, වර්තමානයෙහි සැපවූද මත්තෙහි දුක් විපාක ඇත්තාවූද ධර්ම සමාදානයක් ඇත්තේය. ඇවැත්නි, වර්තමානයෙහි සැපවූද, මත්තෙහි සැප විපාක ඇත්තාවූද ධර්ම සමාදානයක් ඇත්තේය. (යන සතරයි)

"ධර්මස්කන්ධ (ධර්මසමූහ) සතරක් වෙත්. සීලස්කන්ධය, සමාධි ස්කන්ධය, ප්‍රඥාස්කන්ධය, විමුක්තිස්කන්ධය, (යන සතරයි.)

"බල සතරක් වෙත්. වීර්යය බලය, ස්මෘති බලය, සමාධි බලය, ප්‍රඥා බලය (යන සතරයි)

"අධිෂ්ඨාන සතරක් වෙත්. ප්‍රඥා අධිෂ්ඨානය, සත්‍යාධිෂ්ඨානය, ත්‍යාගාධිෂ්ඨානය, ව්‍යපසම (සංසිඳීම) අධිෂ්ඨානය, (යන සතරයි)

"ප්‍රශ්නය ව්‍යාකරණ (ප්‍රශ්න විසඳීම්) සතරක් වෙත්. ඒකාන්තයෙන් විසඳිය යුතුවූ ප්‍රශ්නය, අසා බලා විසඳිය යුතුවූ ප්‍රශ්නය, බෙදා විසඳිය යුතුවූ ප්‍රශ්නය, (නොවිසඳා) තැබිය යුතුවූ ප්‍රශ්නය, (යන සතරයි)

"කර්ම සතරක් වෙත්. ඇවැත්නි, කෘෂ්ණවූ (කළු හෝ නරක) කෘෂ්ණ විපාක (පව් පලදීම්) ඇත්තාවූ කර්මයක් ඇත. ඇවැත්නි, ශුක්ලවූ (සුදු හෝ හොඳ) ශුක්ල විපාක ඇත්තාවූ කර්මයක් ඇත්තේය. ඇවැත්නි, කෘෂ්ණ හා ශුක්ලවූද කෘෂ්ණ හා ශුක්ල විපාක ඇත්තාවූද කර්මයක් ඇත. ඇවැත්නි, කෘෂ්ණ නොවූ ශුක්ල නොවූද කෘෂ්ණ හා ශුක්ල නොවූ විපාක ඇත්තාවූද කර්මයක් ඇත. (එය) කර්මයන්ගේ ක්ෂයකිරීම (නැතිකිරීම) පිණිස පවතියි.

ප්‍රත්‍යක්ෂ කටයුතුවූ ධර්ම සතරක් වෙත්. පූර්වෙ නිවාසය (යට ජාතිවල සිටි තැන්) ස්මෘතියෙන් (සිහිකිරීමෙන්) ප්‍රත්‍යක්ෂ කටයුතුය. සත්වයන්ගේ චුතූපපාතය (මියයාම හා ඉපදීම) දිවසින් ප්‍රත්‍යක්ෂ කටයුතුය. අෂ්ට විමොක්ෂයෝ නාමකයින් (සමග එක්ව උපන් නාමකයින්) ප්‍රත්‍යක්ෂ කටයුතුය. ආශ්‍රවයන්ගේ ක්ෂයකිරීම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

(කෙළෙස් අවසන් කිරීම) ප්‍රඥායෙන් (අර්හත්ඵල ඥානයෙන්) ප්‍රත්‍යක්ෂ කටයුතුය. (යන සතරයි.)

"ඔඝ (සැඩ පහර) සතරක් වෙත්) කාමොඝය, භවොඝය, දිට්ඨොඝය, අවිජ්ජොඝය (යන සතරයි.)

"යොග (යෙදීම්) සතරක් වෙත්. කාමයොගය, භවයොගය, දිට්ඨි යොගය, අවිජ්ජායොගය, (යන සතරයි.)

"විසඤ්ඤොග (ක්ලෙශ සම්බන්ධය නැතිකිරීම්) සතරක් වෙත්. කාම යොගයන්ගේ විසංයොගය (හෙවත් අනාගාමී මාර්ගය) භව යොගයන්ගේ විසංයොගය (අර්හත් මාර්ගය) දිෂ්ටි යොගයන්ගේ විසංයොගය (සෝවාන් මාර්ගය) අවිද්‍යා යොගයන්ගේ විසංයොගය (අර්හත් මාර්ගය) (යන සතර)

"ග්‍රන්ථ (ගැට හෝ බැමි) සතරක් වෙත්. අභිධ්‍යා කාය ග්‍රන්ථය, ව්‍යාපාද කාය ග්‍රන්ථය, සීලබ්බතපරාමාස කාය ග්‍රන්ථය, ඉදංසච්චාභිනිවෙස (මෙයම සත්‍යය අනික හිස්යයි මෙසේ පැවති දෘෂ්ටිය) කාය ග්‍රන්ථය (යන සතරයි.)

උපාදාන (දැඩි ලෙස ගැනීම්) සතරක් වෙත්. කාම උපාදානය, දිට්ඨි උපාදානය, සීලබ්බත උපාදානය, අත්තවාද උපාදානය (යන සතරයි.)

යොනි (උත්පත්ති ක්‍රම) සතරක් වෙත්. අණ්ඩජ යොනිය (බීජයෙන් උපදින උත්පත්තිය) ජලාබුජ (මවු කුසක උපදින උත්පත්තිය,) සංසෙදජයොනිය (කුණු රොඩු ආදියෙහි උත්පත්තිය,) ඔපපාතික (එක්වර පහළවන උත්පත්තිය) යන උත්පත්ති සතරයි.

ගර්භාවක්‍රාන්ති (ගැබපිළිසිඳීම්) සතරක් වෙත්. ඇවැත්නි මේ ලොකයෙහි ඇතැමෙක් දැනුමක් නැතිවම මව්කුස පිළිසිඳ ගනිති. දැනුමක් නැතිවම මව්කුසෙහි සිටිති. දැනුමක් නැතිවම මව් කුසින් නික්මෙති. මේ පළමුවන ගර්භාවක්‍රාන්තියයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මේ ලොකයෙහි ඇතැමෙක් දැනගෙනම මව් කුස පිළිසිඳගනියි. නොදැන මව්

කුසෙහි සිටියි. නොදැන මව්කුසින් නික්මෙයි. මේ දෙවන ගර්භාවක්‍රාන්තියයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මේ ලොකයෙහි ඇතමෙක් දැනගෙනම මව් කුස පිළිසිඳගනියි. දැනගෙනම මව් කුසෙහි සිටියි. නොදැන මව්කුසින් නික්මෙයි. මේ තෙවන ගර්භාවක්‍රාන්තියයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මේ ලොකයෙහි ඇතැමෙක් දැනගෙනම පිළිසිඳ ගැනීම් වශයෙන් මව්කුසට බැස ගනියි. දැනගෙනම මව් කුසෙහි සිටියි. දැනගෙනම මව්කුසින් නික්මෙයි. මේ සතරවන ගර්භාවක්‍රාන්තියයි (යන සතරයි.)

"ආත්මභාව ප්‍රතිලාභ (උත්පත්ති ලැබීම්) සතරක් වෙත්. ඇවැත්නි, යම් උත්පත්තියෙක්හි ආත්ම සඤ්චෙතනාව (තමාගේ මෙහෙයීම) කරණකොටගෙනම චුතවෙයිද, අනුන්ගේ මෙහෙයවීම හේතුකොටගෙන චුතනොවෙයිද, එබඳු උත්පත්තියක් ඇත. ඇවැත්නි, යම් උත්පත්තියෙක්හි අනුන්ගේ මෙහෙයවීම නිසා චුතවන්නේද තමාගේ මෙහෙයීමෙන් චුතනොවන්නේද එබඳු උත්පත්තියක් ඇත්තේය. ඇවැත්නි, යම් උත්පත්තියෙක්හි තමාගේ මෙහෙයීමත් අනුන්ගේ මෙහෙයවීමත් නිසා චුතවන්නේද එබඳු උත්පත්තියක් ඇත්තේය. ඇවැත්නි, යම් උත්පත්තියෙක්හි තමාගේ මෙහෙයීමත් අනුන්ගේ මෙහෙයවීමත් නිසා චුතනොවන්නේද. එබඳු උත්පත්තියක් ඇත. (යන සතරයි)

"දක්ෂිණාවිසුද්ධි (දානය පිරිසිදුවන ක්‍රම) සතරක් වෙත්. ඇවැත්නි, දායකයා කෙරෙන් පිරිසිදුවන, ප්‍රතිග්‍රාහකයා (පිළිගන්නා) කෙරෙන් පිරිසිදු නොවන දානයක් ඇත්තේය ඇවැත්නි, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු වන දායකයා කෙරෙන් පිරිසිදු නොවන දානයක් ඇත්තේය. ඇවැත්නි, දායකයා කෙරෙන්ද පිරිසිදු නොවන ප්‍රතිග්‍රාහකයා කෙරෙන්ද පිරිසිදු නොවන දානයක් ඇත්තේය. ඇවැත්නි, දායකයා කෙරෙනුත් ප්‍රතිග්‍රාහකයා කෙරෙනුත් පිරිසිදුවන දානයක් ඇත්තේය (යන සතරයි.)

"සංග්‍රහ වස්තු සතරක් වෙත්. දානය, ප්‍රිය වචනය, අර්ථ චර්‍ය්‍යාවය, (හිත වැඩෙහි හැසිරීම) සමානාත්මතාවය, (යන සතරයි.)

"උතුම් නොවන ව්‍යවහාර සතරක් වෙත්. මුසාවාදය, පිසුණු (කේලාම්) වචන කීමය, ඵරුෂ වචන කීමය, හිස් වචන කීමය (යන සතරයි.)

"ආර්‍ය්‍යයන්ගේ ව්‍යවහාර සතරක් වෙත්. බොරු කීමෙන් වැළකීමය, කේලාම් කීමෙන් වැළකීමය, ඵරුෂ වචනයෙන් වැළකීමය, හිස්වූ කථාවෙන් වැළකීමය, (යන සතරයි.)

"අන්‍යවූද අනාර්‍ය්‍ය (උතුම් නොවූ) ව්‍යවහාර සතරක් වෙත්. නුදුටු දෙය දුටුවෙමියි කීමය, නොඇසූ දෙය ඇසුවෙමියි කීමය, නොහැගුණු දෙය හැඟීමියි කීමය. නොදන්නා ලද්ද දන්නෙමියි කීමය. (යන සතරයි.)

"අන්‍යවූද ආර්‍ය්‍ය (උතුම්) ව්‍යවහාර සතරක් වෙත්. නුදුටු දෙය නුදුටිමියි කීමය, නොඇසූ දෙය නොඇසීමියි කීමය, නොහැගි දෙය නොහැඟීමියි කීමය, නොදන්නා ලද්ද නොදනිමියි කීමය, (යන සතරයි.)

"අන්‍යවූද අනාර්‍ය්‍ය ව්‍යවහාර සතරක් වෙත්. දුටුදෙය නුදුටිමියි කීමය, ඇසූ දෙය නොඇසීමියි කීමය, හැගිදෙය නොහැඟීමියි කීමය, දන්නාලද්ද නොදනිමියි කීමය (යන සතරයි)

අන්‍යවූද ආර්‍ය්‍ය ව්‍යවහාර සතරක් වෙත්. දුටු දෙය දුටු වෙමියි කීමය, ඇසූ දෙය ඇසීමියි කීමය, හැගි දෙය හැඟීමියි කීමය, දන්නා ලද්ද දනිමියි කීමය, (යන සතරයි.)

"පුද්ගලයෝ සතර දෙනෙක් වෙත්. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමහට තැවීම් ඇතිකිරීමෙහි යෙදුනේ තමා තවන්නෙක් වෙයි. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් අන්‍යයන් තැවීමෙහි යෙදුනේ අනුන් තවන්නෙක් වෙයි.

"ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමා තැවීමෙහි යෙදුනේ තමා තවන්නෙක්ද අනුන් තැවීමෙහි යෙදුනේ අනුන් තවන්නෙක්ද වේ.

"ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමා තැවීමෙහි නොයෙදුනේ, තමන් නොතවන්නෙක්ද අන්‍යයන් තැවීමෙහි නොයෙදුනේ, අනුන් නොතවන්නෙක්ද වේ. (යන සතරදෙනයි.)

"තමා නොතවන්නාවූද අනුන් නොතවන්නාවූද හෙතෙම මේ ආත්මයෙහිම, නිදුක්ව නිවී සැනහී සැප විඳිමින් ශ්‍රෙෂ්ඨවූ ආත්මයෙන් යුක්තව වාසය කරයි.

"අන්‍යවූද පුද්ගලයෝ සතර දෙනෙක් වෙත්. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමහට හිත පිණිස පිළිපදින්නේ වේ. අනුන්ට හිත පිණිස නොපිළිපදින්නේ වේ.

"ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් අනුන්ට හිත පිණිස පිළිපදින්නේ වෙයි. තමහට හිත පිණිස නොපිළිපදියි.

"ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමහට හිත පිණිසද නොපිළිපදියි. අනුන්ට හිත පිණිසද නොපිළිපදියි.

"ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමහට හිත පිණිසද පිළිපදින්නේ වෙයි. අනුන්ට හිත පිණිසද පිළිපදින්නේ වෙයි. (යන සතරදෙනයි.)

"අන්‍යවූ පුද්ගලයෝ සතරදෙනෙක් වෙත්. අඳුරෙන් අඳුරට යන පුද්ගලයාය. අඳුරෙන් එළියට යන පුද්ගලයාය. එළියෙන් අඳුරට යන පුද්ගලයාය, එළියෙන් එළියට යන පුද්ගලයාය (යන සතරදෙනයි.)

"අන්‍යවූ පුද්ගලයෝ සතරදෙනෙක් වෙත්. සමණ මචලය (සෝවාන් පුද්ගලයාය,) සමණ පදුමය (සකෘදාගාමි පුද්ගලයාය,) සමණ පුණ්ඩරීකය (අනාගාමි පුද්ගලයාය,) සමණ සුඛුමාලය (අර්හත් පුද්ගලයාය) යන සතරදෙනයි.

"ඇවැත්නි, ඒ දන්නාවූ දක්නාවූ රහත්වූ සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සතර ධර්මයෝ මොනවට දෙශනා කරණ ලද්දාහ.

"යම්සේ මේ ශාසන බ්‍රහ්මචය‍ර්‍යාව බොහෝකල් පවත්නේ වේද චිරස්ථායී වේද එසේ සියල්ලන් විසින් එක්ව මේ ධර්මය

සජ්ජායනා (එක්ව කීම) කළ යුත්තේය. විවාද නොකළ යුත්තේය. එය බොහෝදෙනාට හිත පිණිසද බොහෝ දෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය.”

**පළමුවෙනි බණවර නිමි.**

**10.** ඇවැත්නි, දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් හොඳින් ප්‍රකාශ කරණ ලද්දාවූ ධර්මයෝ පස්දෙනෙක් වෙත්.

‘යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝ කල් පවත්නේ වේද චිරස්ථායී වේද එසේ සියල්ලන් විසින් එක්ව ඒ ධර්මය සජ්ජායනා (එක්ව කීම) කළ යුත්තේය, විවාද නොකළ යුත්තේය. එය බොහෝ දෙනාට හිත පිණිසද බොහෝ දෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට වැඩ පිණිසද සැප පිණිසද වන්නේය.

“ඒ කවර ධර්ම පසක්ද? රූපස්කන්ධය (රූප රාශිය) වෙදනා ස්කන්ධය (විඳීම් රාශිය) සංඥාස්කන්ධය, (හැඟීම් රාශිය) සංස්කාරස්කන්ධය (හැඟීම් විඳීම දෙක හැර ඉතිරි චෛතසික රාශිය) විඥානස්කන්ධය (සිත් රාශිය)යි මෙසේ ස්කන්ධ (රාශි) පසක් වෙත්.

“උපාදානස්කන්ධ (තණ්හා දිට්ඨි දෙකින් අල්වා ගනු ලබන ස්කන්ධ) පසකි. රූප උපාදානස්කන්ධය, වෙදනා උපාදානස්කන්ධය, සංඥාඋපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඥාන උපාදානස්කන්ධය, (යන පසයි)

“කාමගුණ පසකි. කැමැතිවූ, මනාපවූ, ප්‍රියවූ, කාමයන් ඇසුරුකළාවූ, ඇළුම් කටයුතුවූ, ඇසින් දැකගතයුතුවූ රූපයෝ වෙත්. කණින් දැනගතයුතුවූ ශබ්දයෝ, නාසයෙන් ආඝ්‍රාණය කටයුතුවූ ගන්ධයෝ, දිවෙන් දැනගතයුතුවූ රසයෝ, කයින් දැනගතයුතුවූ, මනාපවූ ප්‍රියවූ කැමතිවූ කාමයන් ඇසුරු කළාවූ, ඇළුම් කටයුතුවූ, ස්පර්ශයෝ වෙත්. (යන පසයි)

"ගති පසක් වෙත්. නිරය, තිරිසන් යෝනිය, ප්‍රෙත ආත්මය, මනුෂ්‍යයෝ්ය, දෙවියෝය. (යන පසයි)

"මාත්සය්‍යී (මසුරුකම්) පසක් වෙත්. ආවාස මාත්සර්‍යය, කුල මාත්සය්‍යීය, ලාභ මාත්සය්‍යීය, වර්ණ මාත්සය්‍යීය, ධර්ම මාත්සය්‍යීය, (යන පසයි)

"නීවරණ (වැලකීම්) පසක්වෙත්, කාමච්ඡන්දනීවරණය, ව්‍යාපාදනීවරණය, ථීනමිද්ධ නීවරණය, උද්ධච්චකුක්කුච්ච නීවරණය, විචිකිච්ඡා නීවරණය (යන පසයි)

"ඔරම්භාගිය සංයෝජන පසක් වෙත්. සත්කාය දෘෂ්ටිය (මමය, මාගේය යන හැඟීම) විචිකිච්ඡාව, (සැකය) සීලබ්බත පරාමාසය, කාමච්ඡන්දය, ව්‍යාපාදය, (යන පසයි)

"උද්ධම්භාගිය සංයෝජන පසක් වෙත්. රූපරාගය, අරූප රාගය, මානය, උද්ධච්චය, අවිජ්ජාය, (යන පසයි.)

"ශික්ෂාපද පසක් වෙත්. ප්‍රාණඝාතයෙන් වැළකීමය, සොර කමින් වැළකීමය, කාම මිථ්‍යාචාරයෙන් වැළකීමය, මුසාවාදයෙන් වැළකීමය, සුරාපානයෙන් වැළකීමය, (යන පසය.)

"අභව්‍ය (නුසුදුසු) කරුණු පසක් වෙත්. ඇවැත්නි, රහත්වූ මහණතෙම දැනගෙන සතෙකු නැසීමට අභව්‍ය වේ. (නුසුදුසු වේ.) රහත්වූ මහණ තෙම නුදුන් දෙයක් සොර සිතින් ගැනීමට නුසුදුසු වේ. රහත්වූ මහණ තෙම මෛථුන සේවනයට නුසුදුසු වේ. රහත්වූ මහණ තෙම දැන දැන බොරු කීමට නුසුදුසු වේ. රහත්වූ මහණ තෙම පෙර ගිහි කාලයෙහි මෙන් සන්නිධිකාර වශයෙන් (රැස්කර තබාගෙන) කාම වස්තූන් පරිභොග කරන්ට නුසුදුසු වේ. (යන පසයි)

"ව්‍යසන (විනාශ) පසක් වෙත්. ඥාති ව්‍යසනය, භොග ව්‍යසනය, රොග ව්‍යසනය, සීල ව්‍යසනය, දෘෂ්ටි ව්‍යසනය, (යන පසයි) ඇවැත්නි, සත්වයෝ ඥාති විනාශය හේතුකොට හෝ භොග විනාශය හේතුකොට හෝ රොග විනාශය හේතු කොට හෝ ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි සැප නැති හෙයින් අපාය නම්වූ, දුකටම තැන් වන හෙයින් දුර්ගති නම්වූ යටිකුරුවූ

වැටෙන හෙයින් විනිපාත නම්වූ, නරකයෙහි නූපදිත්. ඇවැත්නි, සත්වයෝ සීල විනාශය හෙතුකොට හෝ දෘෂ්ටි විනාශය හේතුකොට හෝ ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි අපාය නම්වූ, දුර්ගති නම්වූ, විනිපාත නම්වූ නරකයෙහි උපදිත්.

"සම්පත් පසක් වෙත්. ඥාති සම්පත්ය, භොග සම්පත්ය, ආරොග්‍ය සම්පත්ය, සීල සම්පත්ය, දෘෂ්ටි සම්පත්ය (යන පසයි.)

"ඇවැත්නි, සත්වයෝ ඤාති සම්පත්තිය හේතුකොට හෝ භොග සම්පත්තිය හේතු කොට හෝ, ආරොග්‍ය සම්පත්තිය හේතු කොට හෝ, ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි නූපදිත්. ඇවැත්නි, සත්වයෝ සීල සම්පත්තිය හේතු කොට හෝ දෘෂ්ටි සම්පත්තිය හේතු කොට හෝ ශරීරය බිඳීමෙන් මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපදිත්.

"දුස්සීලයාගේ සීල විපත්තියෙහි ආදීනව පසක් වෙත්. ඇවැත්නි මේ ශාසනයෙහි දුස්සීලතෙම සීල විපත්තියට පැමිණියේ ප්‍රමාදය හේතුකොට ගෙණ මහත් වස්තු විනාසයට පැමිණේ. දුස්සීලයාගේ සීල විපත්තියෙහි මේ පළමුවන ආදීනවයයි. නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, සීලවිපත්තියට පැමිණියාවූ දුස්සීලයාගේ අපකීර්තිය පැන නගියි. දුස්සීලයාගේ සීලවිපත්තියෙහි මේ දෙවන ආදීනවයයි. නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, සීලවිපත්තියට පැමිණියාවූ දුස්සීලයා ක්ෂත්‍රිය පිරිසකට හෝ බ්‍රාහ්මණ පිරිසකට හෝ ගෘහපති පිරිසකට හෝ ශ්‍රමණ පිරිසකට හෝ කිසියම් පිරිසකට පැමිණෙයි නම් භයින් හැකිලී පැමිණෙයි. දුස්සීලයාගේ සීල විපත්තියෙහි මේ තුන්වෙනි ආදීනවයයි. නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, සීල විපත්තියට පැමිණි දුස්සීලයා සිහි මුළාවී මැරෙයි. දුස්සීලයාගේ සීලවිපත්තියෙහි මේ සතරවන ආදීනවයයි. නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, සීලවිපත්තියට පැමිණි දුස්සීලයා ශරීරය බිඳීමෙන් මරණින් මතු අපාය නම්වූ, දුර්ගතිනම්වූ, විනිපාතනම්වූ, නරකයෙහි උපදියි. දුස්සීලයාගේ සීලවිපත්තියෙහි මේ පස්වන ආදීනවයයි.

"සිල්වත්හුගේ සීල සම්පත්තියෙහි ආනිසංස පසක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි සීලයෙන් සම්පූර්ණවූ සිල්වත් තෙමේ අප්‍රමාදය හේතු කොට මහත්වූ වස්තු රාශියට පැමිණේ. සිලවත්හුගේ සීල සම්පත්තියෙහි මේ පළමුවන ආනිසංසයයි. නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, සීලසම්පන්නවූ සිල්වත්හුගේ යහපත් කීර්තිය පැන නගියි. සිල්වත්හුගේ සීල සම්පත්තියෙහි මේ දෙවන ආනිසංසයයි. නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, සීලසම්පන්නවූ සිල්වත් තෙමේ ක්ෂත්‍රිය පිරිසකට හෝ බ්‍රාහ්මණ පිරිසකට හෝ ගෘහපති පිරිසකට හෝ ශ්‍රමණ පිරිසකට හෝ කිසියම් පිරිසකට පැමිණේ නම් භය නැතිව එඩිතරව පැමිණෙයි. සිල්වත්හුගේ සීල සම්පත්තියෙහි මේ තුන්වෙනි ආනිසංසයයි. නැවත අනිකක්ද කියමි, සීල සම්පන්නවූ සිල්වත් තෙමේ සිහි මුළානොවූයේ මැරෙයි. සිල්වත්හුගේ සීලසම්පත්තියෙහි මේ සතර වන ආනිසංසයයි. නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, සීලයෙන් යුක්තවූ සිල්වත් තෙම ශරීරය බිඳීමෙන් මරණින් මතු සුගති නම්වූ ස්වර්ගලොකයෙහි උපදියි. සිල්වත්හුගේ සීල සම්පත්තියෙහි මේ පස්වන ආනිසංසයයි.

"ඇවැත්නි, අනුන්ට චොදනා කරණු කැමැතිවූ චොදක භික්ෂුව විසින් ධර්ම පසක් තමා කෙරෙහි පිහිටුවා අන්‍යයාට චොදනා කටයුත්තේය. සුදුසු කාලයෙහි කියන්නෙමි, නුසුදුසු කාලයෙහි නොකියන්නෙමි. වූවක් කියන්නෙමි, නුවූවක් නොකියන්නෙමි, මිහිරි බසින් කියන්නෙමි, ඵරුෂ බසින් නොකියන්නෙමි, අර්ථයෙන් යුක්තවූවක් කියන්නෙමි, අනර්ථයෙන් යුක්තවූවක් නොකියන්නෙමි, මෛත්‍රියෙන් කියන්නෙමි, ක්‍රොධයෙන් නොකියන්නෙමි යන පසයි. ඇවැත්නි, අනුන්ට චොදනා කරණු කැමැතිවූ, චොදක භික්ෂුව විසින් මේ කරුණු පස තමා කෙරෙහි පිහිටුවා අනුන්ට චොදනා කටයුතුයි.

"ප්‍රධානියංග (වීර්යය කරණ මහණහුගේ අංග) පසක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම ශ්‍රද්ධාව ඇත්තේවෙයි, තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය අදහයි ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කරුණෙන් රහත්‍ය, සම්‍යක්සම්බුද්ධය, විද්‍යාචරණ

සම්පන්නය, සුගතය, ලොකවිදූය, අනුත්තරපුරිස දම්ම සාරථිය, දෙව් මිනිසුන්ට ශාස්තෘය, බුද්ධය, භගවත්යයි අදහයි.

"ස්වල්ප ආබාධ ඇත්තේ ඉතා ශීතද නොවූ ඉතා උෂ්ණද නොවූ මධ්‍යමවූ වීර්යයට සුදුසුවූ සමව ආහාර දිරවන ගින්නෙන් යුක්තවූයේ වෙයි. ශාස්තෘන්වහන්සේ කෙරෙහි හෝ නුවණැත්තාවූ සබ්‍රම්සරුන් (එකට වාසය කරන භික්ෂූන්) කෙරෙහි හෝ තමා පිළිබඳ කරුණු ඇතිසැටියෙන් ප්‍රකාශ කරන කපටිනොවූ රැවටිලි නැත්තෙක් වෙයි. අකුසල් දුරු කිරීම පිණිස කුසල් වැඩීම පිණිස, ශක්ති ඇතිව දැඩිවූ වීර්යය ඇතිව කුසල ධර්මයන්හි අත්නොහරිනලද වීර්යය ඇතිව පටන් ගන්නාලද වීර්යය ඇත්තේවෙයි. ආයඨිවූ, කලකිරීම ඇති කරන්නාවූ, හොඳින් දුක් නැතිකිරීමට පමුණුවන්නාවූ උදය ව්‍යයගාමිනී (ඇතිවීම හා නැතිවීම දක්වන) ප්‍රඥාවෙන් යුක්ත වූයේ ප්‍රඥාව ඇත්තේ වෙයි. (යන පසයි)

"සුද්ධාවාස පසක් වෙත්. අවිහය, අතප්පය, සුදස්සය, සුදස්සිය, අකනිට්ඨය, (යන පසයි) අනාගාමීහු පස්දෙනෙක් වෙත්, අන්තරා පරිනිබ්බායීය, උපහච්ච පරිනිබ්බායීය, අසඞ්ඛාර පරිනිබ්බායීය, සසඞ්ඛාර පරිනිබ්බායීය, උද්ධංසොත අකනිට්ඨාගාමීය, (යන පස්දෙනයි)

"චෙතොඛිල (චිත්තයාගේ තද බැව්) පසක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක කරයි, විචිකිච්ඡා උපදවයි. නිශ්චය නොකරයි, නොපහදියි, ඇවැත්නි, යම් මේ භික්ෂුවක් තෙම ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක කෙරේද, විචිකිච්ඡා උපදවාද නිශ්චය නොකෙරේද, නොපහදීද ඔහුගේ සිත වීර්යය පිණිස අනුයොගය පිණිස නිතර කිරීම පිණිස ප්‍රධානය පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත වීර්යය පිණිස අනුයොගය පිණිස නිතර කිරීම පිණිස ප්‍රධානය පිණිස නොනැමේද මේ පළමුවන චෙතොඛිලයයි (හිතේ ඇති තද බවයි.) නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම ධර්මයෙහි සැක කෙරෙයි, විචිකිච්ඡා උපදවයි, සංඝයා කෙරෙහි සැක කරයි, විචිකිච්ඡා උපදවයි, ශික්ෂාවෙහි සැක කරයි,

විචිකිච්ඡා උපදවයි, සබ්‍රම්සරුන් (එක්ව වසන සංඝයා) කෙරෙහි කිපියේ නොසතුටු සිත් ඇත්තේ, නැසුනු සිත් ඇත්තේ හටගත් හුල් ඇත්තේ වෙයි, ඇවැත්නි, යම් මේ මහණෙක් සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ නොසතුටු සිත් ඇත්තේ නැසුනු සිත් ඇත්තේ හටගත් හුල් ඇත්තේ වේද ඔහුගේ සිත වීර්යය පිණිස අනුයොගය පිණිස නිතර කිරීම පිණිස ප්‍රධානය පිණිස නොනැමේ. යමෙකුගේ සිත වීර්යය පිණිස අනුයෝගය පිණිස නිතර කිරීම පිණිස ප්‍රධානය පිණිස නොනැමේද මේ පස්වන චෙතොඛිලයයි.

"සිත පිළිබඳ විනිබන්ධ (බැමි) පසක් වෙත්, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම කාමයන්හි පහව නොගිය රාගය ඇත්තේ, පහව නොගිය ඡන්දය ඇත්තේ, පහව නොගිය ප්‍රේමය ඇත්තේ, පහව නොගිය පිපාස ඇත්තේ පහව නොගිය පරිළාහ (දැවිල්ල) ඇත්තේ, පහව නොගිය තෘෂ්ණා ඇත්තේ වෙයි.

"ඇවැත්නි, යම් මේ මහණෙක් තෙම කාමයන්හි පහව නොගිය රාග ඇත්තේ, පහව නොගිය ඡන්දය ඇත්තේ, පහව නොගිය ප්‍රේමය ඇත්තේ පහව නොගිය පිපාසා ඇත්තේ පහව නොගිය පරිළාහය ඇත්තේ, පහව නොගිය තෘෂ්ණාව ඇත්තේ වේද, ඔහුගේ සිත වීර්යය පිණිස අනුයෝගය පිණිස නිතර කිරීම පිණිස ප්‍රධානය පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත වීර්යය පිණිස අනුයෝගය පිණිස නිතර කිරීම පිණිස ප්‍රධානය පිණිස නොනැමේද මේ පළමුවන චිත්ත විනිබන්ධය (හිතේ ඇතිවන බැම්ම) යි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම (තමාගේ) කයෙහි පහව නොගිය රාගය ඇත්තේ පහව නොගිය ඡන්දය (කැමැත්ත) ඇත්තේ, පහව නොගිය ප්‍රේමය ඇත්තේ, පහව නොගිය පිපාස ඇත්තේ, පහව නොගිය දැවිල්ල ඇත්තේ, පහව නොගිය තෘෂ්ණාව ඇත්තේ වෙයි. ඇවැත්නි යම් මේ මහණෙක්තෙම පහවනොගිය රාග ඇත්තේ පහවනොගිය ඡන්දය ඇත්තේ, පහවනොගිය ප්‍රෙමය ඇත්තේ, පහවනොගිය පිපාස ඇත්තේ, පහවනොගිය දැවිල්ල ඇත්තේ, පහව නොගිය තෘෂ්ණා ඇත්තේ වේද, ඔහුගේ සිත වීර්යය

පිණිස, අනුයෝගය පිණිස, නිතර කිරීම පිණිස, ප්‍රධානය පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත වීර්යය පිණිස, අනුයොගය පිණිස, නිතර කිරීම පිණිස, ප්‍රධානය පිණිස නොනැමේද, මේ සිත පිළිබඳ දෙවන විනිබන්ධයයි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම තමාගෙන් අන්‍යවූ රූපයෙහි පහව නොගිය රාගය ඇත්තේ, පහවනොගිය ඡන්දය ඇත්තේ, පහවනොගිය ප්‍රෙමය ඇත්තේ, පහවනොගිය පිපාස ඇත්තේ, පහව නොගිය දැවිල්ල ඇත්තේ, පහව නොගිය තෘෂ්ණා ඇත්තේ වෙයි. ඇවැත්නි, යම් මේ මහණ තෙම පහව නොගිය රාගය ඇත්තේ, පහව නොගිය ඡන්දය ඇත්තේ, පහවනොගිය ප්‍රෙමය ඇත්තේ, පහව නොගිය පිපාස ඇත්තේ, පහව නොගිය දැවිල්ල ඇත්තේ, පහව නොගිය තෘෂ්ණා ඇත්තේ වේද, ඔහුගේ සිත වීර්යය පිණිස, අනුයොගය පිණිස, නිතර පැවැත්වීම පිණිස, ප්‍රධානය පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත වීර්යය පිණිස, අනුයොගය පිණිස, නිතර යෙදීම පිණිස, ප්‍රධානය පිණිස නොනැමේද, මේ සිත පිළිබඳ තුන්වන විනිබන්ධයයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණතෙම බඩ පිරෙන තෙක් වළඳා සයන සැපය, පස්ස (ඇලයෙන් ඇලයට හැරි හැරී නිදන) සැපය, නිද්‍රා සැපය යන මෙහි යෙදුනේ, වාසය කරයිද. ඔහුගේ සිත වීර්යය පිණිස, අනුයෝගය පිණිස, නිතර යෙදීම පිණිස, ප්‍රධානය පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත වීර්යය පිණිස, අනුයෝගය පිණිස, නිතර යෙදීම පිණිස ප්‍රධානය පිණිස, නොනැමේද මේ සිත පිළිබඳ සතරවන විනිබන්ධයයි. මේ සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍ය්‍යයෙන් හෝ දෙවියෙක් හෝ වන්නෙමි, දෙවියන්ගෙන් එක්තරා කෙනෙකු හෝ වන්නෙමියි, මහණ තෙම කිසියම් දෙව් කොටසක් පතා බ්‍රහ්මචරියාවෙහි හැසිරේද ඔහුගේ සිත වීර්යය පිණිස, අනුයොගය පිණිස, නිතර යෙදීම පිණිස, ප්‍රධානය පිණිස, නොනැමෙයි, යමෙකුගේ සිත වීර්යය පිණිස, අනුයොගය පිණිස, නිතර යෙදීම පිණිස, ප්‍රධානය පිණිස නොහැසිරේද, මේ පස්වන චිත්තවිනිබන්ධය වේ.

"ඉන්ද්‍රිය පසක් වෙත්. චක්ෂු ඉන්ද්‍රිය, ශ්‍රොත ඉන්ද්‍රිය, ඝ්‍රාණ ඉන්ද්‍රිය, ජිව්හා ඉන්ද්‍රිය, කාය ඉන්ද්‍රියය (යන පසයි.)

"අනිකුදු ඉන්ද්‍රිය පසක් වෙත්. සුඛ ඉන්ද්‍රිය, දුක්ඛ ඉන්ද්‍රිය සොමනස්ස ඉන්ද්‍රිය, දොමනස්ස ඉන්ද්‍රිය, උපෙක්ෂා ඉන්ද්‍රිය යන පසයි.

"අනිකුදු ඉන්ද්‍රිය පසක් වෙත්. ශ්‍රද්ධා ඉන්ද්‍රිය, වීර්යය ඉන්ද්‍රිය, ස්මෘති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, ප්‍රඥා ඉන්ද්‍රිය, යන පසයි.

"නිස්සරණීය (නික්මීම්) ධාතු පසක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි කාමයන් මෙනෙහි කරන්නාවූ භික්ෂුහුගේ සිත ඒ කාමයන්හි නොපැමිණෙයිද, නොපහදියිද, නොසිටියිද, බැසනොගනියිද, නෛෂ්ක්‍රම්‍යය (දශ අශුභයන්ගෙන් උපදවන ලද ප්‍රථම ධ්‍යානය) වනාහි සිහි කරන්නාවූ ඔහුගේ සිත නෛෂ්ක්‍රම්‍යයෙහි පැමිණෙයිද, පහදියිද, පිහිටයිද, බැසගනියිද, ඔහුගේ ඒ සිත යහපත් අරමුණට පැමිණෙන ලද්දේය. යහපත් කොට වඩන ලද්දේය. යහපත් කොට නැගී සිටින ලද්දේය. කාමයන්ගෙන් මිදුණේය, වෙන්වූයේය. කාමය නිසා දුක්වූ, දාහ සහිතවූ යම් ආශ්‍රව (කෙලෙස්) කෙනෙක් උපදිත්ද, හෙතෙම ඒ කෙලෙස්වලින් මිදුනේ වෙයි. හෙතෙම ඒ වෙදනාව නොවිඳියි. මේ කාමයන් කෙරෙන් නික්මීම යයි කියන ලදී.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, ව්‍යාපාදය (ක්‍රොධය) මෙනෙහි කරන්නාවූ භික්ෂුහුගේ සිත ව්‍යාපාදයෙහි නොපැමිණෙයිද නොපහදියිද නොසිටියිද බැස නොගනියිද මෛත්‍රිය ධ්‍යානය වනාහි මෙනෙහි කරන්නාවූ මොහුගේ සිත මෛත්‍රියෙන් උපදවනලද ධ්‍යානයට පැමිණෙයිද පහදියිද පිහිටයිද, බැසගනීද ඔහුගේ ඒ සිත යහපත් අරමුණට පැමිණෙනලදී. මනාකොට වඩනලදී. මනාකොට නැගීසිටින ලදී. මනාකොට බැසගන්නාලදී. ව්‍යාපාදයෙන් මිදුණේ වෙයි, වෙන්වූයේ වෙයි. ක්‍රොධය නිසා දුක්වූ දාහ සහිතවූ යම් ආශ්‍රව කෙනෙක් (කෙලෙස්) උපදිත්ද එයින් හෙතෙම මිදුනේ වෙයි. හෙතෙම ඒ වෙදනාව නොවිඳියි. මේ ව්‍යාපාදයෙන් නික්මීමයයි කියනලදී.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, සත්වහිංසාව මෙනෙහි කරන්නාවූ භික්ෂුහුගේ සිත සත්ව හිංසාවෙහි නොපැමිණෙයිද නොපහදියිද, නොසිටියිද, බැසනොගනියිද කරුණාධ්‍යානය වනාහි මෙනෙහි කරන්නාවූ ඔහුගේ සිත කරුණාධ්‍යානයට පැමිණෙයිද පහදියිද පිහිටයිද බැසගනියිද ඔහුගේ ඒ සිත යහපත් අරමුණට පැමිණෙනලදී. යහපත්කොට වඩනලදී. යහපත්කොට බැසගන්නාලදී. යහපත්කොට නැගීසිටිනලදී. විහිංසාවෙන් වෙන් වූයේ වෙයි. විහිංසාව නිසා දුක්වූ දැවීම් සහිතවූ, යම් ක්ලෙශයක් උපදිත්ද, ඔවුන්ගෙන් හෙතෙම මිදුනේ වෙයි. හෙතෙම ඒ වෙදනාව නොවිඳියි. මේ විහිංසාව කෙරෙන් නික්මීමයයි කියන ලදී.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, රූප මෙනෙහි කරන්නාවූ භික්ෂුහුගේ සිත රූපයන්හි නොපැමිණෙයිද, නොපහදියිද, නොසිටියිද, බැසනොගනියිද, අරූපධ්‍යාන වනාහි මෙනෙහි කරන්නාවූ භික්ෂුහුගේ සිත අරූපධ්‍යානයෙහි පැමිණෙයිද, පහදියිද, පිහිටයිද, බැසගනියිද, ඔහුගේ ඒ සිත අරමුණට යහපත්ව පැමිණෙනලදී යහපත්කොට වඩනලදී. යහපත්ව නැගී සිටිනලදී. බැසගන්නාලදී. රූපයන්ගෙන් මිදුනේ වෙන් වූයේ වෙයි. රූපය නිසා දුක්වූ දැවීම් සහිතවූ, යම් ක්ලේශයක් උපදිත්ද ඔවුන්ගෙන් හෙතෙම මිදුනේවෙයි. හෙතෙම ඒ වේදනාව නොවිඳියි. මේ රූපයන් කෙරෙන් නික්මීමයැයි කියන ලදී.

නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, පඤ්චඋපාදාන ස්කන්ධය (තෘෂ්ණා දෘෂ්ටි දෙකින් අල්වාගනු ලබන ස්කන්ධ පස) මෙනෙහිකරන්නාවූ භික්ෂුහුගේ සිත පඤ්චඋපාදාන ස්කන්ධයෙහි නොපැමිණෙයිද, නොපහදියිද, නොපිහිටයිද, බැසනොගනියිද, අර්හත්ඵල සමාපත්තිය වනාහි මෙනෙහි කරන්නාවූ ඔහුගේ සිත අර්හත්ඵල සමාපත්තියෙහි පැමිණෙයිද, පහදියිද, පිහිටයිද, බැසගනීද ඔහුගේ ඒ සිත අරමුණට යහපත්ව පැමිණෙනලදී. යහපත්කොට වඩනලදී. යහපත්ව නැගීසිටින ලදී. බැසගන්නා ලදී. පඤ්ච උපාදානස්කන්ධයන් ගෙන් මිදුනේ

වෙන්වූයේ වෙයි. පඤ්ච උපාදානස්කන්ධය නිසා දුක්වූ දැවීම් සහිතවූ යම් කෙලෙස් කෙනෙක් උපදිත්ද ඔවුන් ගෙන් හෙතෙම මිදුනේ වෙයි. හෙතෙම ඒ වෙදනාව නොවිඳියි. මේ පඤ්ච උපාදානස්කන්ධයන් කෙරෙන් නික්මීමයයි කියනලදී.

"විමුත්තායතන (මිදීමට කරුණු) පසක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුහට ශාස්තෲන් වහන්සේ හෝ ගරු තන්හි සිටියාවූ තෙරුන් වහන්සේ කෙනෙක් හෝ ධර්මය දෙශනා කරයිද ඇවැත්නි, යම් යම් ආකාරයකින් භික්ෂුහට ශාස්තෲන්වහන්සේ හෝ ගරු තන්හි සිටියාවූ එක්තරා තෙර කෙනෙක් හෝ ධර්මය දෙශනා කෙරේද හෙතෙම ඒ ඒ ආකාරයෙන් ඒ ධර්මයෙහි අර්ථය දැනගන්නේ වෙයිද, බුද්ධධර්මය දැනගන්නේ වෙයිද අර්ථය දන්නාවූද බුද්ධධර්මය දන්නාවූද ඔහුට සතුට උපදියි. හටගත් සතුට ඇත්තහුට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තාහුගේ නාමකය සංසිඳෙයි සංසිඳුනු නාමකය ඇත්තේ සැපය විඳියි, සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි. මේ පළමුවන විමුත්තායතනය (මිදීම) යි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, භික්ෂුහට ශාස්තෲන් වහන්සේ හෝ ගරු තන්හි සිටියාවූ තෙරුන් වහන්සේ කෙනෙක් හෝ ධර්මය දෙශනා නොකෙරෙයි. එහෙත් හෙතෙම ඇසූ පරිදි, දැනගත් පරිදි, ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනා කරයි.

"ඇවැත්නි, යම් යම් පරිද්දෙකින් භික්ෂු තෙම ඇසූ පරිදි දැනගත් පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනා කෙරේද ඒ ඒ පරිද්දෙන් හෙතෙම ඒ ධර්මයෙහි අර්ථය දැන ගන්නේත් වෙයි. බුද්ධධර්මය දැනගන්නේත් වෙයි. අර්ථය දැනගත්තාවූ බුද්ධධර්මය දැනගත්තාවූ ඔහුට සතුට උපදියි. සතුටු වූවහුට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ නාමකය සංසිඳෙයි. සංසිඳුනු නාමකය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි. මේ දෙවන විමුත්තායතනය (මිදීම) යි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, භික්ෂුහට ශාස්තෲන් වහන්සේ හෝ ගරු තන්හි සිටියාවූ එක්තරා තෙර කෙනෙක් හෝ ධර්මය දෙශනාද නොකරත්, ඇසූ පරිදි උගත් පරිදි හෙතෙම

ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනාද නොකරයි. එහෙත් ඇසූ පරිදි, උගත් පරිදි ධර්මය විස්තර වශයෙන් සජ්ජායනා කරයි (නැවත නැවත කියයි.)

"ඇවැත්නි, යම් යම් පරිද්දකින් මහණ තෙම ඇසූ පරිදි ධර්මය විස්තර වශයෙන් සජ්ජායනා කරයිද ඒ ඒ පරිද්දෙන් හෙතෙම ඒ ධර්මයෙහි අර්ථය දැනගත්තේද, බුද්ධ ධර්මය දැනගත්තේද වෙයි. අර්ථය දැනගත්තාවූද, බුද්ධ ධර්මය දැන ගත්තාවූද ඔහුට සතුට උපදියි. සතුටු වූවහුට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තාහුගේ නාමකය සංසිඳෙයි, සංසිඳුනු නාමකය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි. මේ තුන් වෙනි විමුත්තායතනය (මිදීම) යි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, භික්ෂුහට ශාස්තෲන් වහන්සේ හෝ ගරු තන්හි සිටියාවූ කිසියම් තෙර කෙනෙක් හෝ ධර්මදෙශනාද නොකරත්. ඒ භික්ෂුව ඇසූ පරිදි උගත් පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනාද නොකරයි. ඇසූ පරිදි උගත්පරිදි ධර්මය විස්තර වශයෙන් සජ්ජායනාද නොකරයි. එහෙත් ඇසූ පරිදි, උගත් පරිදි, ධර්මය සිතින් කල්පනා කරයි. විමසා බලයි, සලකා බලයි, ඇවැත්නි, යම් යම් පරිද්දෙකින් මහණ තෙම ඇසූ පරිදි, උගත් පරිදි ධර්මය සිතින් කල්පනා කෙරේද විමසා බලාද, සලකා බලාද, ඒ ඒ පරිද්දෙන් හෙතෙම ඒ ධර්මයෙහි අර්ථය දැනගත්තේද, බුද්ධ ධර්මය දැන ගත්තේද වෙයි, අර්ථය දැනගත්තාවූද, බුද්ධධර්මය දැනගත්තාවූද ඔහුට සතුට උපදියි. සතුටුවූවහුට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ නාමකය සංසිඳෙයි, සංසිඳුනු නාමකය ඇත්තේ සැපය විඳියි, සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි, මේ සතරවන විමුත්තායතනය (මිදීම) යි.

"නැවත අනිකක්ද කියමි ඇවැත්නි, භික්ෂුහට ශාස්තෲන් වහන්සේ හෝ ගරුතන්හි සිටියාවූ කිසියම් තෙරුන්වහන්සේ කෙනෙක් හෝ ධර්මය දෙශනාද නොකරත්. ඒ භික්ෂුව ඇසූ පරිදි, උගත් පරිදි, ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනාද නොකරයි. ඇසූ පරිදි, උගත් පරිදි, ධර්මය විස්තර වශයෙන්

සජ්ජායනාද නොකරයි, ඇසූපරිදි උගත් පරිදි, ධර්මය සිතින් කල්පනාද නොකරයි. විමසාද නොබලයි, සලකාද නොබලයි. එහෙත් ඔහු විසින් එක්තරා සමාධිනිමිත්තක් (අට තිස් අරමුණුවලින් ලැබූ එක්තරා සමාධියක්) යහපත්ව ඉගෙන ගන්නා ලද්දේද, යහපත්ව මෙනෙහි කරන ලද්දේද, යහපත්ව සිතින් දරණ ලද්දේද නුවණින් ප්‍රත්‍යක්ෂ කරන ලද්දේද වෙයි.

"ඇවැත්නි, යම් යම් පරිද්දකින් ඔහු විසින් එක්තරා සමාධි නිමිත්තක් හොඳින් උගන්නා ලද්දේ, හොඳින් මෙනෙහි කරන ලද්දේ, හොඳින් සලකා බලන ලද්දේ, ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වේද, ඒ ඒ පරිද්දෙන් හෙතෙම ඒ ධර්මයෙහි අර්ථය දැනගත්තේද බුද්ධධර්මය දැනගත්තේද වෙයි. අර්ථය දැනගත්තාවූද, බුද්ධධර්මය දැනගත්තාවූද, ඔහුට සතුට උපදියි, සතුටු වූවහුට ප්‍රීතිය උපදියි, ප්‍රීති සිත් ඇත්තාහුගේ නාමකය සංසිඳේ, සංසිඳුණු නාම කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි. මේ පස්වන විමුත්තායතනයයි.

"විමුක්තිය (රහත් බව) මුහුකුරු වන්නාවූ සංඥා (හැඟීම්) පසක් වෙත්. අනිත්‍ය සංඥාය, අනිත්‍යයෙහි දුක්ඛ සංඥාය, දුකෙහි අනාත්මසංඥාය, ප්‍රහාණ සංඥාය, විරාග සංඥාය යන පසයි.

"ඇවැත්නි, දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට ප්‍රකාශ කරන ලද්දාවූ මේ පසක් පසක්වූ ධර්මයෝ වෙත්.

"යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝ කල් පවත්නේ වේද, චිරස්ථායී වේද, එසේ සියල්ලන් විසින් එක්ව මේ ධර්මය සජ්ජායනා (එක්ව කීම) කළ යුත්තේය. විවාද නොකළ යුත්තේය. එය බොහෝ දෙනාට හිත පිණිසද බොහෝ දෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙව් මිනිසුන්ට වැඩ පිණිසද සැප පිණිසද වන්නේය.

11. "ඇවැත්නි, දන්නාවූ, දක්නාවූ රහත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් යහපත් කොට ප්‍රකාශ කරන ලද්දාවූ සවැදෑරුම් ධර්ම කෙනෙක් වෙත්.

"යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝකල් පවත්නේ වේද, චිරස්ථායී වේද, එසේ මේ ධර්මය සියල්ලන් විසින් එක්ව සජ්ඣායනා (එක්ව කීම) කළ යුත්තේය. විවාද නොකළ යුත්තේය. එය බොහෝ දෙනාට හිත පිණිසද බොහෝ දෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙව් මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය.

"කවර ධර්ම සයක්ද යත්? ආධ්‍යාත්මික (තමාකොට ගන්නා) ආයතන (කෙලෙස් උපදින හෙතු) සයක් වෙත්, චක්ඛු ආයතනය (ඇස,) සොත ආයතනය (කණ,) ඝාණ ආයතනය (නාසය,) ජිව්හා ආයතනය, (දිව,) කාය ආයතනය (ශරීරය,) මනො ආයතනය (හිත) යන සයයි.

"බාහිරවූ (පිටත්හි කොට ගන්නා) ආයතන සයක් වෙත්. රූප ආයතනය, ශබ්ද ආයතනය, ගන්ධ ආයතනය, රස ආයතනය, ස්පර්ශ ආයතනය, ධර්ම ආයතනය යන සයයි.

"විඤ්ඤාණ කාය (සිත්සමූහ) සයක් වෙත්. චක්ඛුවිඤ්ඤාණය, සොතවිඤ්ඤාණය, ඝාණවිඤ්ඤාණය, කායවිඤ්ඤාණය මනොවිඤ්ඤාණය, යන සයයි.

"ස්පර්ශකායයෝ (ස්පර්ශ සමූහ) සයක් වෙත්. චක්ඛුසම්ඵස්සය, සොතසම්ඵස්සය, ඝාණසම්ඵස්සය, ජිව්හාසම්ඵස්සය, කායසම්ඵස්සය, මනොසම්ඵස්සය යන සයයි.

"වෙදනා කායයෝ (විඳීම් සමූහ) සයක් වෙත්. චක්ඛුසම්ඵස්සයෙන් හටගත් විඳීම, සොතසම්ඵස්සයෙන් හටගත් විඳීම, ඝාණසම්ඵස්සයෙන් හටගත් විඳීම, ජිව්හාසම්ඵස්සයෙන් හටගත් විඳීම, කායසම්ඵස්සයෙන් හටගත් විඳීම, මනොසම්ඵස්සයෙන් හටගත් විඳීම යන සයයි.

"සංඥාකායයෝ (සංඥා සමූහ) සදෙනෙක් වෙත්. රූප සංඥාය, ශබ්ද සංඥාය, ගන්ධ සංඥාය, රසසංඥාය, ස්පර්ශ සංඥාය ධර්මසංඥාය යන සයයි.

"සඤ්චෙතනාකායයෝ (සිත මෙහෙයවීම්) සදෙනෙක් වෙත්. රූපසඤ්චෙතනාය, ශබ්දසඤ්චෙතනාය,

ගන්ධසඤ්චෙතනාය, රසසඤ්චෙතනාය, පොට්ඨබ්බ සඤ්චෙතනාය, ධම්මසඤ්චෙතනාය යන සයයි.

"තෘෂ්ණා (ආශා සමූහ) සදෙනෙක් වෙත්. රූප තෘෂ්ණාය ශබ්ද තෘෂ්ණාය, ගන්ධ තෘෂ්ණාය, රස තෘෂ්ණාය, ස්පර්ශ තෘෂ්ණාය, ධර්ම තෘෂ්ණාය යන සදෙනාය.

"අගාරව (ගරු නොකිරීම්) සදෙනෙක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම ශාස්තෘන් කෙරෙහි උඩඟුව ගෞරව නැතිව වාසය කරයි. ධර්මය කෙරෙහි උඩඟුව ගෞරව නැතිව වාසය කරයි. සංඝයා කෙරෙහි උඩඟුව ගෞරව නැතිව වාසය කරයි. ශික්ෂාවෙහි උඩඟුව ගෞරව නැතිව වාසය කරයි. අප්‍රමාදයෙහි උඩඟුව ගෞරව නැතිව වාසය කරයි. දෙවැදෑරුම් පටිසන්ථාරයෙහි උඩඟුව ගෞරව නැතිව වාසය කරයි. යන මේ සයයි.

"ගාරව (ගරු කිරීම්) සදෙනෙක් වෙත්. මේ ශාසනයෙහි මහණ තෙම ශාස්තෘන් වහන්සේ කෙරෙහි යටහත් පැවතුම් ඇත්තේ ගෞරව සහිතව වාසය කරයි. ධර්මයෙහි යටහත් පැවතුම් ඇත්තේ ගෞරව සහිතව වාසය කරයි. සංඝයා කෙරෙහි යටහත් පැවතුම් ඇත්තේ ගෞරව සහිතව වාසය කරයි. ශික්ෂාවෙහි යටහත් පැවතුම් ඇත්තේ ගෞරව සහිතව වාසය කරයි. අප්‍රමාදයෙහි යටහත් පැවතුම් ඇත්තේ ගෞරව සහිතව වාසය කරයි. දෙවැදෑරුම් පටිසන්ථාරයෙහි යටහත් පැවතුම් ඇත්තේ ගෞරව සහිතව වාසය කරයි යන සදෙනයි.

"සොමනස්සූපවිචාරයෝ (සොම්නස් සහගත කරුණු සොයා බැලීම්) සදෙනෙක් වෙත්. ඇසින් රූප දැක සතුටට කරුණුවූ රූප සොයා බලයි. කණින් ශබ්ද අසා නැහැයෙන් ගන්ධය දැන දිවෙන් රසය විඳ, කයෙන් ස්පර්ශ කොට සිතින් ධර්මය දැන, සතුටට කරුණුවූ ධර්මය සොයා බලයි.

"දොමනස්සූපවිචාරයෝ (අසතුටු සහිත කරුණු සොයා බැලීම්) සදෙනෙක් වෙත්. ඇසින් රූපය දැක අසතුටට කරුණුවූ රූපය සොයා බලයි. කණින් ශබ්දය අසා, නාසයෙන් ගඳ සුවඳ

දැන, දිවෙන් රසය විඳ, කයින් ස්පර්ශය විඳ, සිතින් ධර්ම අරමුණු දැන අසතුටට කරුණුවූ ධර්ම අරමුණු සොයා බලයි.

"උපෙක්ෂා උපවිචාරයෝ (මැදහත් කරුණු සොයාබැලීම්) සදෙනෙක් වෙත්. ඇසින් රූපය දැක, උපෙක්ෂාවට කරුණුවූ රූපය සොයා බලයි. කණින් ශබ්දය අසා, නාසයෙන් ගඳ සුවඳ දැන, දිවෙන් රසය දැන, ශරීරයෙන් ස්පර්ශය විඳ, සිතින් ධර්ම අරමුණු දැන උපෙක්ෂාවට කරුණුවූ ධර්ම අරමුණු සොයා බලයි.

"සාරණීය ධර්මයෝ (සිහි කටයුතු ධර්ම) සදෙනෙක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණහු විසින් මෛත්‍රිසහගත කායකර්මය, එක්ව බ්‍රහ්මචය්‍ය්‍යාවෙහි හැසිරෙන භික්ෂූන්ගේ ඉදිරියේද නොඉදිරියේද පවත්වන ලද්දේ වෙයිද, ප්‍රිය කරන්නාවූ ගරු කරන්නාවූ සිහි කටයුතුවූ මේ ධර්මයද සංග්‍රහය පිණිසද විවාද නොකිරීම පිණිසද නොවෙහෙසීම පිණිසද සමගිය පිණිසද, එක්වීම පිණිසද පවතියි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, භික්ෂූහු විසින් මෛත්‍රී සහගත වාක්කර්මය, එක්ව බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන භික්ෂූන්ගේ ඉදිරියෙහිද නොඉදිරියේද පවත්වන ලද්දේ වෙයිද, සිහි කට යුතුවූ ප්‍රිය කරන්නාවූ, ගරු කරන්නාවූ, මේ ධර්මයද සංග්‍රහය පිණිසද විවාද නොකිරීම පිණිසද නොවෙහෙසීම පිණිසද සමගිය පිණිසද එක්වීම පිණිසද පවතී.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුව විසින් මෛත්‍රී සහගත මනොකර්මය, එක්ව බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන භික්ෂූන්ගේ ඉදිරියෙහිද නොඉදිරියෙහිද ප්‍රිය කරන්නාවූ ගරු කරන්නාවූ සිහි කටයුතුවූ මේ ධර්මයද සංග්‍රහය පිණිසදවිවාද නොකිරීම පිණිසද නොවෙහෙසීම පිණිසද සමගිය පිණිසද එක්වීම පිණිසද පවතී.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, භික්ෂුවට ධාර්මිකවූ, දැහැමින් ලැබුණු යටත්පිරිසෙයින් පාත්‍රයට ලැබුණාවූද යම් ඒ ලාභයෝ වෙත්ද? ඒ භික්ෂුව එබඳු ලාභ, එක්ව මහණදම් පුරණ සිල්වතුන් සමග බෙදා නොගෙන නොවළඳන්නෙක්, බෙදා

සාධාරණකොට වලඳන්නෙක් වන්නේද සිහිකටයුතුවූ, ප්‍රිය කරන්නාවූ, ගරු කරන්නාවූ මේ ධර්මයද සංග්‍රහය පිණිසද අවිවාදය පිණිසද අවිහිංසාව පිණිසද සමගිය පිණිසද එක්වීම පිණිසද පවතියි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම කඩ නොවූ සිදුරු නොවූ කබර නොවූ කැලැල් නොවූ දාස බැවින් මිදුනාවූ, නුවණැත්තන් විසින් පසස්නා ලද්දාවූ, තෘෂ්ණාදියෙන් නොබැඳුණු සමාධිය පිණිස පවත්නාවූ යම් මේ සීලයෝ වෙත්ද එබඳු සීලයන්හි, එකට මහණදම් පුරණ භික්ෂූන් ඉදිරියෙහිද නොඉදිරියෙහිද සීලයෙන් සමාන බවට පැමිණ වාසය කරයිද ප්‍රිය කරන්නාවූ ගරු කරන්නාවූ සිහිකටයුතුවූ මේ ධර්මයද සංග්‍රහය පිණිසද විවාද නොකිරීම පිණිසද නොවෙහසීම පිණිසද සමගිය පිණිසද එක්වීම පිණිසද පවතී.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණතෙම උතුම්වූද නිවණට පමුණුවන්නාවූද ඊට අනුව පිළිපදින්නහුගේ යහපත්ව දුක් නැතිකිරීම පිණිස පවත්නාවූද යම් ඒ දෘෂ්ටියක් ඇත්තීද, එබඳු දෘෂ්ටියෙන්, එකට මහණදම් පුරණ භික්ෂූන් ඉදිරියෙහිද නොඉදිරියෙහිද දෘෂ්ටි සාමාන්‍යයට (දෘෂ්ටියෙන් සම බවට) පැමිණ වාසය කරයිද ප්‍රිය කරන්නාවූ ගරු කරන්නාවූ සිහිකටයුතුවූ මේ ධර්මයද සංග්‍රහය පිණිසද අවිවාදය පිණිසද අවිහිංසාව පිණිසද සමගිය පිණිසද එක්වීම පිණිසද පවතියි (යන සදෙනයි.)

"විවාද මූලයෝ (විවාදයට මුල්) සදෙනෙක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම ක්‍රොධ කරන්නේ බද්ධවෛර (බැඳගත්තරහ) ඇත්තේ වෙයි. ඇවැත්නි, යම් මේ මහණෙක් ක්‍රොධ කරන්නේ බද්ධ වෛර ඇත්තේ වේද, හෙතෙම ශාස්තෘන් වහන්සේ කෙරෙහිද ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැතිව වාසය කරයි. ධර්මය කෙරෙහිද, ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැතිව වාසය කරයි. සංඝයා කෙරෙහිද ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැතිව වාසය කරයි. ශීලයද මනාකොට නොපුරන්නේ වෙයි. ඇවැත්නි, යම් මේ මහණෙක්

ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැතිව වාසය කෙරේද ධර්මය කෙරෙහි ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැතිව වාසය කෙරේද, සංඝයා කෙරෙහි ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැතිව වාසය කෙරේද, ශීලය හොඳින් නොපුරයිද හෙතෙම සංඝයා කෙරෙහි විවාද උපදවයි. ඒ විවාදය බොහෝදෙනාට අහිත පිණිසද බොහෝදෙනාට නොසැප පිණිසද බොහෝදෙනාට අනර්ථ පිණිසද දෙවි මිනිසුන්ට අහිත පිණිසද දුක් පිණිසද වන්නේය.

"ඇවැත්නි, තෙපි ඉදින් මෙබඳුවූ විවාදයට මුල් කාරණයක්, එකට වාසයකරන පිරිසෙහි හෝ පිට පිරිසක හෝ දක්නාහුද ඇවැත්නි, තෙපි එහි ඒ ලාමකවූ විවාද මූලය දුරුකිරීම පිණිස උත්සාහ කරන්නහුය. ඇවැත්නි, ඉදින් තෙපි මෙබඳුවූ විවාද මූලය තම පිරිසෙහි හෝ පිට පිරිසක හෝ නොදක්නාහුද, ඇවැත්නි, තෙපි එහි ලාමකවූ ඒ විවාද මූල මතු නොවැඩීම පිණිස පිළිපදින්නාහුය. මෙසේ මේ ලාමකවූ විවාද මූලයාගේ විනාසය වේ. මෙසේ මේ ලාමකවූ විවාද මූලයාගේ මත්තෙහි නොවැඩීම වේ.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම ගුණමකු වූයේ යුගග්‍රාහී (තමාත් ගුණවතුන් හා සමාන කරන්නෙක්) වෙයිද ඊර්ෂ්‍යාකරන්නෙක් මසුරු වූවෙක් වෙයිද කපටි මායා ඇත්තේ වෙයිද පවිටු ආසා ඇත්තේ මිථ්‍යාදෘෂ්ටික වෙයිද තමා ගත් මතයම තදින් ගන්නේ දැඩිකොට ගන්නේ අත්නොහැරිය හැක්කෙක් වෙයිද, යම් ඒ භික්ෂුවක් තෙම තමන් ගත් මතයම තදින් ගන්නෙක් දැඩිකොට ගන්නෙක් අත්නොහැරිය හැක්කෙක් වේද, හෙතෙම ශාස්තෲන්වහන්සේ කෙරෙහිද, ගෞරව නැත්තේ යටහත් පැවතුම් රහිතව වාසය කරයි. ධර්මය කෙරෙහිද ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැතිව වාසය කරයි, සංඝයා කෙරෙහිද ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැතිව වාසය කරයි. ශීලයද සම්පූර්ණ නොකරයි. ඇවැත්නි, යම් ඒ භික්ෂුවක් තෙම ශාස්තෲන්වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැතිව වාසය කෙරේද, ධර්මය කෙරෙහි ගෞරව

නැත්තේ යටහත් පැවතුම් නැතිව වාසය කෙරේද සංඝයා කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවතුම් නැතිව වාසය කෙරේද, ශික්ෂාව සම්පූර්ණ නොකරයිද, හෙතෙම සංඝයා කෙරෙහි විවාද උපදවයි. ඒ විවාදය බොහෝ දෙනාට අහිත පිණිසද, බොහෝ දෙනාට නොසැප පිණිසද, බොහෝ දෙනාට අනර්ථ පිණිසද, දෙවිමිනිසුන්ට අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

"ඇවැත්නි, ඉදින් තෙපි මෙබඳු විවාද මූලයක් තම පිරිසෙහි හෝ පිටත් පිරිසක හෝ දැක්කාහු නම්, ඇවැත්නි, තෙපි එහි ඒ ලාමකවූ විවාද මූලය (විවාදයට හෙතුව) නැති කිරීම පිණිස උත්සාහ කරන්නාහුය. ඇවැත්නි, ඉදින් තෙපි මෙබඳුවූ විවාද මූලය (විවාදයට හේතුව) තම පිරිසෙහි හෝ පිටත් පිරිසක හෝ නොදක්නාහු නම් ඇවැත්නි, තෙපි එහි පහත්වූ විවාද මූලයක් මතු පහළ නොවීම පිණිස පිළිපදින්නාහුය. මෙසේ මේ ලාමකවූ විවාද මූලයාගේ විනාශය වෙයි. මෙසේ මේ ලාමකවූ විවාද මූලයාගේ මත්තෙහි නොවැඩීම වේ, (යන සයයි)

"ධාතු සයක් වෙත්. පඨවි ධාතුය, ආපො ධාතුය, තෙජො ධාතුය, වායො ධාතුය, ආකාශ (හිස් බව) ධාතුය, විඤ්ඤාණ ධාතුය (යන සයයි.)

"නිස්සරණීය ධාතු (මිදීම් ධාතු) සයක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම මෙසේ කියන්නේය. ඇවැත්නි, මෛත්‍රී සමාධිය වනාහි මා විසින් වඩන ලදී. බොහෝ සේ වඩන ලදී. නැවත නැවත වඩන ලදී. වස්තු වශයෙන් කරණ ලදී, අනුව පවතින ලදී, පුරුදු කරණ ලදී, හොඳින් පටන්ගන්නා ලදී, එතකුදු වුවත්, ක්‍රොධය මාගේ සිත හාත්පසින් මැඩගෙන සිටීයයි (කියයි.) එසේ නොකියවයි ඔහුට කියයුතු වන්නේය. ආයුෂ්මත් තෙමේ මෙසේ නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් කීම සුදුසු නොවේ. භාග්‍යවතුන් වහන්සේ වනාහි මෙසේ නොවදාරන්නාහ. ඇවැත්නි, වඩන ලද්දාවූද, බොහෝසේ වඩන ලද්දාවූද, නැවත නැවත වඩනා ලද්දාවූද, වස්තු වශයෙන් කරණ ලද්දාවූද, ඒ

අනුව හැසිරෙන ලද්දාවූද, පුරුදු කරණ ලද්දාවූද, හොඳින් පටන්ගන්නා ලද්දාවූද, මෛත්‍රී සමාධිය ඇති කල්හි ඔහුගේ හිත ක්‍රෝධය විසින් හාත්පසින් මැඩගෙන සිටියි යන යම් කාරණයක් වේනම් එය නොසිදුවිය හැක්කකි. එසේ වන්නට අවකාශයක් නැත. ඇවැත්නි, යම් මේ මෛත්‍රී සමාධියක් වේද, මෙය ක්‍රොධයාගේ නිස්සරණය වේ. (ක්‍රොධයෙන් මිදීම වෙයි.)

"ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම මෙසේ කියන්නේය. ඇවැත්නි, කරුණා සමාධිය වනාහි මා විසින් වඩන ලදී, බොහෝසේ වඩන ලදී, නැවත නැවත වඩනලදී. වස්තු වශයෙන් කරණලදී, ඒ අනුව හැසිරෙනලදී, පුරුදුකරණ ලදී, හොඳින් පටන්ගන්නාලදී, එතකුදුවුවත් මාගේ සිත විහෙසය (හිංසාකිරීමේ කැමැත්ත) හාත්පස මැඩගෙන සිටීයයි (කියයි.)

"මෙසේ නොකියවයි ඔහුට කියයුතු වන්නේය. ආයුෂ්මත් තෙමේ මෙසේ නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් කීම නොමැනවි. භාග්‍යවතුන් වහන්සේ වනාහි මෙසේ නොවදාරන්නාහ.

"ඇවැත්නි, වඩනා ලද්දාවූද, බොහොසේ වඩනා ලද්දාවූද, නැවත නැවත වඩනාලද්දාවූද, වස්තු වශයෙන් කරණ ලද්දාවූද, ඒ අනුව හැසිරෙන ලද්දාවූද, පුරුදු කරණ ලද්දාවූද, හොඳින් පටන්ගන්නා ලද්දාවූද කරුණා සමාධිය ඇතිකල්හි ඔහුගේ සිත විහෙසය (හිංසා කිරීමේ කැමැත්ත) හාත්පස මැඩගෙන සිටින්නේය යන යම් කාරණයක් වේ නම් එය නොසිදුවිය හැක්කකි. ඇවැත්නි, කරුණා හිත වනාහි විහෙසයාගේ නිස්සරණය මැයි. (හිංසා කිරීමෙන් මිදීමයි.)

"ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම මෙසේ කියන්නේය. ඇවැත්නි, මා විසින් මුදිතා සමාධිය වඩනලදී, බොහෝ සේ වඩනලදී, නැවත නැවත වඩනලදී, වස්තු වශයෙන් කරණ ලදී. ඒ අනුව හැසිරෙනලදී, පුරුදු කරණලදී, හොඳින් පටන්ගන්නා ලදී, එතකුදු වුවත්, අරතිය (නොඇල්ම) මාගේ සිත හාත්පස මැඩගෙන සිටීයයි (කියයි) එසේ නොකියවයි ඔහුට කිය යුතු වන්නේය. ආයුෂ්මත් තෙමේ මෙසේ නොකියාවා.

භාග්‍යවතුන් වහන්සේට දොස් නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් කීම නොමැනවි. භාග්‍යවතුන් වහන්සේ වනාහි මෙසේ නොවදාරන්නාහ.

"ඇවැත්නි, වඩන ලද්දාවූද, බොහෝසේ වඩන ලද්දාවූද, නැවත නැවත වඩනලද්දාවූද, වස්තු වශයෙන් කරණ ලද්දාවූද, ඒ අනුව හැසිරෙන ලද්දාවූද, පුරුදුකරණ ලද්දාවූද, හොඳින් පටන්ගන්නා ලද්දාවූද, මුදිතා සමාධිය ඇති කල්හි අරතිය ඔහුගේ සිත හාත්පස මැඩගෙන සිටින්නේය යන කාරණයක් වේ නම් එය නොසිදුවිය හැක්කකි. ඊට අවකාශයක් නැත. ඇවැත්නි, මුදිතා සමාධිය වනාහි අරතියගේ නිස්සරණය වේමැයි. (නො ඇල්මෙන් මිදීමයි.)

"ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේය. ඇවැත්නි, උපෙක්ෂා සමාධිය වනාහි මා විසින් වඩන ලදී, බොහෝසේ වඩනලදී. නැවත නැවත වඩනලදී. වස්තු වශයෙන් කරණලදී. ඒ අනුව පවතිනලදී. පුරුදු කරන ලදී. හොඳින් පටන්ගන්නාලදී, එතකුදු වුවත් රාගය මාගේ සිත හාත්පස මැඩගෙන සිටීයයි (කියයි.) ඔහුට එසේ නොකියවයි කියයුතු වන්නේය. 'ආයුෂ්මත් තෙමේ මෙසේ නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් කීම නොමැනවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොවදාරන්නාහ, ඇවැත්නි, වඩන ලද්දාවූද, බොහෝ සේ වඩන ලද්දාවූද, නැවත නැවත වඩන ලද්දාවූද, වස්තු වශයෙන් කරන ලද්දාවූද, ඒ අනුව පවත්වන ලද්දාවූද, පුරුදුකරණ ලද්දාවූද, හොඳින් පටන්ගන්නා ලද්දාවූද, උපෙක්ෂා සමාධිය ඇති කල්හි රාගය ඔහුගේ සිත හාත්පස මැඩගෙන සිටින්නේය යන යම් කාරණයක් වේ නම් එය නොසිදුවිය හැක්කකි. ඊට අවකාශයක් නැත. ඇවැත්නි, මේ උපෙක්ෂා සමාධිය රාගයට නිස්සරණය (මිදීම) වේ මැයි.

"ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම මෙසේ කියන්නේය. ඇවැත්නි, අනිමිත්ත චෙතො විමුක්තිය (අර්හත්ඵල සමාපත්තිය) මා විසින් වඩනලදී, බොහෝසේ වඩනලදී නැවත

නැවත වඩනලදී, වස්තු වශයෙන් කරණලදී, ඒ අනුව පවත්නාලදී. පුරුදු කරණලදී, හොඳින් පටන්ගන්නාලදී, එතකුදු වුවත්, මාගේ හිත රාගයට හෙතුවූ ආරම්මණයන්හි හැසිරෙන්නේයයි කියයි. ඔහුට එසේ නොකියවයි කියයුතු වන්නේය. ආයුෂ්මත් තෙමේ මෙසේ නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස්නොකියාවා, භාග්‍යවතුන්වහන්සේට දොස්කීම නොමැනවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොවදාරන්නාහ.

"ඇවැත්නි, වඩන ලද්දාවූද බොහෝසේ වඩන ලද්දාවූද, නැවත නැවත වඩනලද්දාවූද, වස්තු වශයෙන් කරණ ලද්දාවූද, ඒ අනුව පවත්නා ලද්දාවූද, පුරුදු කරණ ලද්දාවූද, හොඳින් පටන්ගන්නා ලද්දාවූද අනිමිත්තචෙතො සමාධිය ඇති කල්හි ඔහුගේ හිත රාගාදියට හෙතුවූ ආරම්මණයන්හි හැසිරෙන්නේය. යන යම් කාරණයක් වේ නම් එය නොසිදුවිය හැක්කකි. ඊට අවකාශයක් නැත. ඇවැත්නි, මේ අනිමිත්තචෙතො විමුක්තිය සියලු නිමිත්තන්ට නිස්සරණය වේමය.

"ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම මෙසේ කියන්නේය. මාගේ 'මම වෙමියි' යන (හැඟීම) පහව ගියේ වෙයි, මෙතෙම 'මම වෙමියි' කියා ගන්නා දෙයක් නොදක්නෙමි. එතකුදුවුවත් කෙසේද කෙසේදැයි ගන්නා සැකය නමැති උල මාගේ සිත හාත්පස මැඩගෙන සිටීයයි (කියයි.)

"ඔහුට මෙසේ නොකියවයි කියයුතු වන්නේය. ආයුෂ්මත් තෙමේ මෙසේ නොකියාවා භාග්‍යවතුන් වහන්සේට දොස් නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් කීම නොමැනවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොවදාරන්නාහ. ඇවැත්නි, 'මම වෙමි'යි යන හැඟීම පහව ගිය කල්හි 'මෙය මම වෙමි'යි, නොදක්නහුට කෙසේද කෙසේදැයි ගන්නා සැකය නමැති උල ඔහුගේ සිත හාත්පස මැඩගෙන සිටින්නේය යන යම් කාරණයක් වෙයිනම් එය සිදුවිය නොහැක්කකි. ඊට අවකාශයක් නැත.

"ඇවැත්නි, මේ 'මම වෙමි'යි යන හැඟීමේ මුල් සිඳීමක් වේද, එය කෙසේද කෙසේදැයි ගන්නා විචිකිච්ඡා සල්ලයාගේ නිස්සරණය (මිදීම) වේමැයි (යන සඳෙනයි.)

"අනුත්තරිය (උතුම් දේ) සයක් වෙත්. දස්සනානුත්තරිය (දැකීම් අතුරෙන් උසස් දැකීම,) සවණානුත්තරිය (ඇසීම් අතුරෙන් උසස් ඇසීම,) ලාභානුත්තරිය (ලැබීම් අතුරෙන් උසස් ලැබීම,) සික්ඛානුත්තරිය, (හික්මීම් අතුරෙන් උසස් හික්මීම,) පාරිචරියානුත්තරිය (උපස්ථාන අතුරෙන් උතුම් උපස්ථානය,) අනුස්සතානුත්තරිය (සිහිකිරීම් අතුරෙන් උතුම් සිහිකිරීම) (යන සයයි.)

"අනුස්මෘති (සිහි කිරීම්) සයක් වෙත්. බුද්ධානුස්මෘතිය, ධර්මානුස්මෘතිය, සංඝානුස්මෘතිය, සීලානුස්මෘතිය, ත්‍යාගානුස්මෘතිය, දෙවතානුස්මෘතිය (යන සයයි.)

"සතත විහරණ (රහතුන්ගේ නිතර වාසය කිරීම්) සයක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම ඇසින් රූපයක් දැක සතුටුද නොවෙයි, නොසතුටුද නොවෙයි, උපෙක්ෂාවෙන් යුක්තව සිහි නුවණින් යුක්තව වාසය කරයි. කණින් ශබ්දය අසා, නැහැයෙන් ගඳ සුවඳ දැන, දිවෙන් රසය විඳ, කයින් ස්පර්ශය දැන, සිතින් ධර්මඅරමුණු දැන සතුටුද නොවෙයි. නොසතුටුද නොවෙයි. උපෙක්ෂාවෙන් යුක්තව සිහි නුවණින් යුක්තව වාසය කරයි. (යන සයයි)

"අභිජාති (ජාති) සයක් වෙත්. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතමෙක් නීච කුලයෙහි උපන්නේම නීච ධර්මය උපදවයි. (දුස් සීල ධර්මය රැස්කරයි.) ඇවැත්නි, මේ ලොකයෙහි ඇතමෙක් හීන කුලයෙහි උපන්නේම උසස් ධර්ම උපදවයි. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැමෙක් පහත් කුලයෙහි උපන්නේද පහත් විපාක දෙන ස්වභාවයද නැති උසස් විපාකදෙන ස්වභාවයද නැති රහත් බව උපදවයි. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතමෙක් උසස් කුලයෙහි උපන්නේ යහපත් ධර්මය උපදවයි. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතමෙක් උසස් කුලයෙහි උපන්නේම පහත් ධර්ම උපදවයි. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැමෙක් උසස් කුලයෙහි උපන්නේ පහත් විපාක දෙන ස්වභාවයද නැති උසස් විපාක දෙන ස්වභාවයද නැති රහත් බව උපදවයි. (යන සයයි)

"නිර්වෙධභාගිය සංඥා (නිවණට පමුණුවන්නාවූ සංඥාවෝ) සයක් වෙත්. අනිත්‍ය සංඥාය, අනිත්‍යයෙහි දුක්ඛ සංඥාය, දුකෙහි අනාත්ම සංඥාය ප්‍රහාණ (දුරුකිරීම) සංඥාය, විරාග (නොඇල්ම) සංඥාය, නිරොධය දක්නාවූ සංඥාය යන සයයි.

ඇවැත්නි, දන්නාවූ, දක්නාවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට ප්‍රකාශ කරණ ලද්දාවූ මේ සයක් සයක්වූ ධර්මයෝ වෙත්.

යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝ කල් පවත්නේ වේද මේ ධර්මය එසේ සජ්ඣායනා (එක්ව කීම) කළ යුත්තේය. විවාද නොකළ යුත්තේය. එය බොහෝ දෙනාට හිත පිණිසද බොහෝ දෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙව් මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය.

(හය බැගින් ඇති කරුණු විසිපහ සමාප්තයි)

---

12. "ඇවැත්නි, දන්නාවූ දක්නාවූ රහත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් හොඳින් ප්‍රකාශ කරණ ලද්දාවූ ධර්ම සතක් ඇත. යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝ කල් පවත්නේ වේද, චිරස්ථායී වේද, එසේ සියල්ලන් විසින් එක්ව මේ ධර්මය සජ්ඣායනා (එක්ව කීම) කළයුත්තේය. විවාද නොකළ යුත්තේය, එය බොහෝ දෙනාට හිත පිණිසද බොහෝ දෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙව් මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය.

"කවර සතක්ද යත්? ආර්‍ය්‍ය (උතුම්) ධන සතක් වෙත්, ශ්‍රද්ධා ධනය, සීල ධනය, හිරි ධනය, ඔත්තප්ප ධනය, සුත ධනය, ත්‍යාග ධනය, ප්‍රඥා ධනය, (යන සතයි.)

"බොජ්ජංග සතක්වෙත්. සති සම්බොජ්ජංගය, ධම්ම විචය සම්බොජ්ජංගය, විරිය සම්බොජ්ජංගය, පීති සම්බොජ්ජංගය උපෙක්ඛා සම්බොජ්ජංගය (යන සතයි.)

"සමාධි පිරිවර ධර්ම සතක් වෙත්. හොඳ දැකීම, හොඳ කල්පනාව, හොඳ වචනය, හොඳ කර්මාන්තය, හොඳ ජීවිකා වෘත්තිය, හොඳ උත්සාහය, හොඳ සිහිය (යන සතයි.*)

"අයහපත් ධර්ම සතක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම ශ්‍රද්ධා නැත්තේ වෙයි. පවට ලජ්ජා නැත්තේ වෙයි, පවට බිය නැත්තේ වෙයි, ඇසූ පිරූ තැන් (උගත්කම) නැත්තේ වෙයි, අලස වෙයි, සිහි මුලාවූයේ වෙයි, ප්‍රඥා නැත්තේ වෙයි, (යන සතයි.)

"යහපත් ධර්ම සතක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම ශ්‍රද්ධා ඇත්තේ වෙයි, පවට ලජ්ජා ඇත්තේ වෙයි, පවට බිය ඇත්තේ වෙයි, බොහෝ ඇසූ පිරූ තැන් (උගත්කම) ඇත්තේ වෙයි, පටන්ගන්නා ලද වීර්යය ඇත්තේ වෙයි, එළඹසිටි සිහි ඇත්තේවෙයි, නුවණ ඇත්තේ වෙයි, (යන සතයි.)

"සත්පුරුෂ ධර්ම සතක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම දෙශනාපාළිය දන්නේද වෙයි. අර්ථ දන්නේද වෙයි, තමා දන්නේද වෙයි, පිළිගැනීමේ පමණ දන්නේද වෙයි, කාලය දන්නේද වෙයි, පිරිස් දන්නේද වෙයි, පුද්ගලයන් දන්නේද වෙයි, (යන සතයි.)

"නිර්දස වස්තු (දස අවුරුද්දක් නැත්තේය යනාදීන් කීමට හෙතුවූ කරුණු) සතක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම ශික්ෂා පිරීමෙහි බලවත් කැමැත්ත ඇත්තේ වෙයි, මත්තෙහිද, ශික්ෂා පිරීමෙහි පහනොවූ කැමැත්ත ඇත්තේ වෙයි. ධර්මනිසාන්තියෙහි (විදර්ශනාවෙහි) බලවත් කැමැත්ත ඇත්තේ වෙයි. මත්තෙහිද විදර්ශනාවෙහි පහනොවූ කැමැත්ත ඇත්තේ වෙයි. ඉච්ඡා විනයෙහි (ආසා දුරු කිරීමෙහි) බලවත් කැමැත්ත ඇත්තේ වෙයි. මත්තෙහිද ආසා දුරුකිරීමෙහි පහනොවූ කැමැත්ත ඇත්තේ වෙයි. පටිසල්ලානයෙහි (තනිව විසීමෙහි) බලවත් කැමැත්ත ඇත්තේ වෙයි. මත්තෙහිද තනිව විසීමෙහි පහනොවූ කැමැත්ත ඇත්තේ වෙයි. වීර්යාරම්භයෙහි (වීර්යය කිරීමෙහි) බලවත් කැමැත්ත ඇත්තේ වෙයි. මත්තෙහිද පටන්ගන්නාලද වීර්යයෙහි පහනොවූ කැමැත්ත ඇත්තේ වෙයි. සතිනෙපක්කයෙහි (සිහියෙහිද නුවණැති බැව්හිද) බලවත් කැමැත්ත ඇත්තේ වෙයි. මත්තෙහිද සිහියෙහි හා නුවණැති බැව්හි පහනොවූ කැමැත්ත ඇත්තේ වෙයි. දෘෂ්ටි ප්‍රතිවෙධයෙහි

(මාර්ග දැකීමෙහි) බලවත් කැමැත්ත ඇත්තේ වෙයි. මත්තෙහිද මාර්ග දැකීමෙහි පහ නොවූ කැමැත්ත ඇත්තේ වෙයි. (යන සතයි*)

"සංඥා සතක් වෙත්. අනිත්‍ය සංඥාය, අනාත්ම සංඥාය, අසුභ සංඥාය, ආදීනව සංඥාය, ප්‍රහාණ සංඥාය, විරාග සංඥාය නිරොධ සංඥාය (යන සතයි.)

"බල සතක් වෙත්. ශ්‍රද්ධා බලය, වීර්යය බලය, හිරි බලය, ස්මෘති බලය, සමාධි බලය, ප්‍රඥා බලය (යන සතයි.)

"විඥානස්ථිති (විඥාන පිහිටන තැන්) සතක් වෙත්. වෙනස් වෙනස් ශරීර ඇති වෙනස් වෙනස් හැඟීම් (ප්‍රතිසන්ධි විඤ්ඤාණ) ඇති සත්වයෝ වෙත්. මනුෂ්‍යයෝද ඇතැම් දෙවියෝද, ඇතැම් විනිපාතිකයෝ (සමහර අසුරයන් හා ප්‍රෙතයෝ) ද, යම්සේද එමෙනි. මේ පළමුවන විඥානස්ථිතියයි. ඇවැත්නි, වෙනස් වෙනස් ශරීර ඇති එක හැඟීම (සමාන ප්‍රතිසන්ධි විඤ්ඤාණ) ඇති සත්වයෝ වෙත්. පළමුවෙනි ධ්‍යානයෙන් උපන්නාවූ බ්‍රහ්මකායික නම් දෙවියෝ යම්සේද එමෙනි. මේ දෙවන විඥානස්ථිතියයි. ඇවැත්නි, සමාන ශරීර ඇති වෙනස් වෙනස් හැඟීම් (ප්‍රතිසන්ධි විඤ්ඤාණ) ඇති සත්වයෝ වෙත්. ආභස්සර දෙවියෝ යම්සේද එමෙනි, මේ තුන්වන (ප්‍රතිසන්ධි විඤ්ඤාණ) විඥානස්ථිතියයි. ඇවැත්නි, සමාන ශරීර ඇති සමාන හැඟීම් (ප්‍රතිසන්ධි විඤ්ඤාණ) ඇති සත්වයෝ වෙත්. සුභ කිණ්හ දෙවියෝ යම්සේද එමෙනි. මේ සතරවන විඥාන ස්ථිතියයි. ඇවැත්නි, සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්ම වීමෙන් ගැටීම් සංඥාවන් නැසීමෙන් වෙනස් වෙනස් සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණියාවූ සත්වයෝ වෙත්. මේ පස් වන විඥානස්ථිතියයි. ඇවැත්නි, සියලු ආකාරයෙන් ආකාසඤ්චායතනය ඉක්මවා විඤ්ඤානය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණියාවූ සත්වයෝ වෙත්. මේ සවන විඥානස්ථිතියයි. ඇවැත්නි, සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි

* සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති යන ධර්ම සතයි.

ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියාවූ සත්වයෝ වෙත්. මේ සත්වන විඥානස්ථිතියයි (යනසතයි.)

"දක්ෂිණාර්හ (දන් පිළිගැනීමට සුදුසු) පුද්ගලයෝ සත් දෙනෙක් වෙත්. උභතොභාග විමුක්තය, ප්‍රඥා විමුක්තය, කායසාක්ෂිය, දෘෂ්ටප්‍රාප්තය, ශ්‍රද්ධා විමුක්තය, ධර්මානුසාරීය, ශ්‍රද්ධානුසාරීය යන (සත් දෙනයි.)

"අනුසය (සිතෙහි බැඳී පවතින කෙලෙස්) සතක් වෙත්. කාමරාගානුසය, ප්‍රතිඝානුසය, දෘෂ්ට්‍යානුසය, විචිකිච්ඡානුසය, මානානුසය, භවරාගානුසය, අවිජ්ජානුසය යන සතයි.

"සංයොජන සතක් වෙත්. අනුනය සංයොජනය, ප්‍රතිඝසංයොජනය, දෘෂ්ටිසංයොජනය, විචිකිච්ඡාසංයොජනය, මානසංයොජනය, භවරාග සංයොජනය, අවිද්‍යා සංයොජනය (යන සතයි.)

"අධිකරණ සමථ (නඩු විසඳීම්) සතක්වෙත්. උපනුපන් අධිකරණයන්ගේ සමථය පිණිස සංසිඳීම පිණිස සම්මුඛා විනය දියයුතුයි. සතිවිනය දියයුතුයි. අමූළ්හවිනය දියයුතුයි. ප්‍රතිඥාවෙන් හෙවත් ඇවතින් කරවිය යුතුය. යෙභුය්‍යසිකාය, තස්සපාපියය්‍යසිකාය, තිණවත්ථාරකය, යන සතයි.

"ඇවැත්නි, දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්ම සත හොඳින් ප්‍රකාශ කරණ ලද්දාහු වෙත්. යම්සේ මේ ශාසන බ්‍රහ්මචය්‍ය්‍යාව බොහෝකල් පවත්නේවේද චිරස්ථායි වේද එසේ සියල්ලන් විසින් එක්ව මේ ධර්මය සජ්ජායනය (එක්ව කීම) කළ යුත්තේය. විවාද නොකළ යුත්තේය. එය බොහෝදෙනාට හිත පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය.

13. ඇවැත්නි, දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් හොඳින් ප්‍රකාශ කරණ ලද්දාවූ ධර්ම අටක් ඇත්තාහ. යම්සේ මේ ශාසන බ්‍රහ්මචය්‍ය්‍යාව බොහෝකල් පවත්නේ වේද චිරස්ථායී වේද එසේ සියල්ලන්

විසින් එක්ව මේ ධර්මය සජ්ඣායනා (එක්ව කීම) කළ යුත්තේය. විවාද නොකළ යුත්තේය. එය බොහෝ දෙනාට හිත පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය. කවර අටක්ද යත්? මිච්ඡත්ත (වැරදි ස්වභා) අටකි. වැරදි දැකීම, වැරදි කල්පනාව, වැරදි වචනය, වැරදි කර්මාන්තය, වැරදි ජීවිකා වෘත්තිය, වැරදි උත්සාහය, වැරදි සිහිය, වැරදි සමාධිය (යන අටයි.) සම්මත්ත (යහපත් ස්වභාවයෝ) අටක් වෙත්. හොඳ දැකීමය, හොඳ කල්පනාව හොඳ වචනය, හොඳ කර්මාන්තය හොඳ ජීවිකාවෘත්තිය, හොඳ උත්සාහය, හොඳ සිහිය, හොඳ සමාධිය යන අටයි.

"දක්ෂිණාර්හ පුද්ගලයෝ අටදෙනෙක් වෙත්. සෝවාන් පුද්ගලයාය, සෝවාන්ඵලය ලබාගැනීම පිණිස පිළිපන් පුද්ගලයාය, සකෘදාගාමි පුද්ගලයාය, සකෘදාගාමිඵලය ලබා ගැනීම පිණිස පිළිපන් පුද්ගලයාය, අනාගාමි පුද්ගලයාය, අනාගාමිඵලය ලබාගැනීම පිණිස පිළිපන් පුද්ගලයාය, අර්හත් පුද්ගලයාය, අර්හත්ඵලය ලබාගැනීම පිණිස පිළිපන් පුද්ගලයාය (යන අටදෙනයි.)

"කුසීත වස්තු අටක්වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණහු විසින් (සිවුරු ආදිය පිළිබඳ) වැඩ කළයුතු වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මා විසින් වැඩ කළයුතු වන්නේය. වැඩ කරන්නාවූ මාගේ ශරීරය ක්ලාන්ත වන්නේය. එබැවින් මම නිදාගන්නෙමියි හෙතෙම නිදාගනියි. නොපැමිණි ධ්‍යාන මාර්ගඵලයට පැමිණීම පිණිස, නොලබන ලද ධ්‍යාන ආදිය ලැබීම පිණිස, නොදුටු ධ්‍යාන ඵල ආදිය දකිනු පිණිස උත්සාහ නොකරයි. මේ පළමුවන කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහු විසින් වැඩ කරණ ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම වැඩ කෙළෙමි. වැඩ කරන්නාවූ මාගේ ශරීරය ක්ලාන්ත විය. එබැවින් මම නිදාගන්නෙමියි හෙතෙම නිදාගනියි. නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලැබූ ධ්‍යානාදිය ලැබීම

පිණිස, නොදුටු මාර්ගඵලාදිය දකිනු පිණිස උත්සාහ නොකරයි. මේ දෙවන කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහු විසින් යායුතු ගමනක් ඇත්තේය. ඔහුට මෙබඳු සිතක් වෙයි. යායුතු ගමනක් ඇත්තේය. යන්නාවූ මාගේ ශරීරය ක්ලාන්ත වන්නේය. එබැවින් මම නිදා ගන්නෙමියි හෙතෙම නිදාගනියි නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිස, නොලබනලද ධ්‍යාන ආදිය ලැබීම පිණිස, නොදුටු ධ්‍යාන ආදිය දැකීම පිණිස වීර්යය නොකරයි. මේ තුන්වන කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහු විසින් ගමනක් යන ලද්දේ වේද, ඔහුට මෙබඳු සිතක් වෙයි. මම ගමනක් ගියෙමි. ගමනක් ගියාවූ මාගේ ශරීරය ක්ලාන්ත වූයේ වෙයි. එබැවින් මම නිදාගන්නෙමියි, හෙතෙම නිදා ගනියි. නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිස නොලබන ලද ධ්‍යාන ආදිය ලැබීම පිණිස නොදුටු ධ්‍යාන ආදිය දැකීම පිණිස උත්සාහ නොකරයි. මේ සතරවන කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම ගමක හෝ නියම් ගමක හෝ පිඬු පිණිස හැසිරෙන්නේ රළුවූ හෝ රසවත්වූ හෝ භොජනය ඇතිතාක් සම්පූර්ණයෙන් නොලබයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම ගමක හෝ නියම් ගමක හෝ පිඬු පිණිස හැසිරෙන්නේ රළුවූ හෝ රසවත්වූ හෝ භොජනය ඇතිතාක් සම්පූර්ණව නොලැබුවෙමි. ඒ මාගේ ශරීරය ක්ලාන්ත වූයේ අකර්මණ්‍ය වේ. එබැවින් මම නිදාගන්නෙමියි හෙතෙම නිදාගනියි. නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිස නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිස උත්සාහ නොකරයි. මේ පස්වන කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම ගමක හෝ නියම් ගමක හෝ පිඬු පිණිස හැසිරෙන්නේ රළුවූ හෝ රසවත්වූ හෝ භොජනය ඇතිතාක් සම්පූර්ණව ලබයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම ගමක හෝ නියම් ගමක හෝ පිඬු පිණිස හැසිරෙන්නේ රළුවූ හෝ රසවත්වූ හෝ භොජනය

ඇතිතාක් සම්පූර්ණව ලදිමි. ඒ මාගේ ශරීරය බරවූයේ කටයුතු කිරීමට අසමර්ථ වූයේ වේ. මාසාචිතයක් මෙනි. (පොඟවනලද මෑ ඇට මෙනි.)

"එබැවින් මම නිදාගන්නෙමියි හෙතෙම නිදාගනියි. නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිස, නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිස, නොදුටු ධ්‍යාන ආදිය දකිණු පිණිස උත්සාහ නොකරයි. මේ සවන කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහට සුළු අසනීපයක් හටගත්තේ වෙයිද, ඔහුට මෙබඳු සිතක් වෙයි. මට සුළු අසනීපයක් හටගත්තේ වෙයි, නිදන්ට සුදුසුකම් ඇත්තේය. එබැවින් මම නිදාගනිමියි හෙතෙම නිදයි. නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිස නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිස, නොදුටු ධ්‍යාන ආදිය ලැබීම පිණිස, නොදුටු ධ්‍යාන ආදිය දකිනු පිණිස වීර්යය නොකරයි, මේ සත්වන කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි, ඇවැත්නි, මහණ තෙම ගිලන්කමින් නැගිටියි. ගිලන්කමින් නැගී සිටි නොබෝ කල් ඇත්තේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම ගිලන්කමින් නැගී සිටියේ, ගිලන් බැවින් නැගී සිටි නොබෝ කල් ඇත්තේ වෙමි. ඒ මාගේ ශරීරය දුර්වල වූයේ කටයුතු කිරීමට අසමර්ථ වූයේ වේ. නිදාගන්ට සුදුසුකම් ඇත්තේය. එබැවින් මම නිදාගනිමියි හෙතෙම නිදාගනියි. නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිස නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිස නොදුටු ධ්‍යාන ආදිය දැකීම පිණිස වීර්යය නොකරයි. මේ අටවන කුසීත වස්තුවයි. (යන අටයි)

"ආරම්භ වස්තු (වීර්යය කිරීමට කරුණු) අටක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණවූ විසින් කර්මය කටයුතු වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මා විසින් සිවුරු කිරීම් ආදි වැඩ කළයුතු වන්නේය. කටයුතු කරන්නාවූ මට බුදුන් වහන්සේගේ අවවාදය සිහිකිරීම අමාරු වෙයි. එබැවින් මම නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිස නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිස නොදුටු ධ්‍යාන ආදිය දැකීම පිණිස වීර්යය

කරමියි හෙතෙම නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිස නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිස නොදුටු ධ්‍යාන ආදිය දැකීම පිණිස උත්සාහ කරයි. මේ පළමුවන ආරම්භ වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහු විසින් කටයුතු කරණ ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම කටයුතු කෙළෙමි. කටයුතු කරන්නාවූ මම බුදුන්ගේ අවවාදය සිහි කරන්ට නොහැකි වීමි, එබැවින් මම නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිස නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිස නොදුටු ධ්‍යාන ආදිය දැකීම පිණිස වීර්යය කරමියි හෙතෙම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලද ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ගඵලාදිය දකිනු පිණිස වීර්යය කරයි. මේ දෙවන ආරම්භ වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහු විසින් ගමනක් යායුතු වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි, මා විසින් ගමනක් යායුතු වන්නේය, මාර්ගයෙහි යන්නාවූ මා විසින් බුදුන්ගේ අවවාදය සිහි කරන්ට පහසු නොවෙයි. එබැවින් මම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලද ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ග ඵලාදිය දකිනු පිණිස වීර්යය කරමියි හෙතෙම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලද ධ්‍යානාදිය ලැබීම පිණිස නොදුටු මාර්ග ඵලාදිය දකිනු පිණිස වීර්යය කරයි. මේ තෙවන ආරම්භ වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහු විසින් ගමන යන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. 'මම ගමනක් ගියෙමි. මග යන්නාවූ මම බුදුන්ගේ අවවාදය සිහි කරන්ට නොහැකිවීමි. එබැවින් මම නොපැමිණි මාර්ග ඵලාදියට පැමිණීම පිණිස, නොලද ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ගඵලාදිය දකිනු පිණිස වීර්යය කරමියි, හෙතෙම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලද ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ග ඵලාදිය දකිනු පිණිස වීර්යය ආරම්භ කරයි. මේ සතරවන ආරම්භ වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම ගමක හෝ නියම් ගමක හෝ පිඬු පිණිස හැසිරෙන්නේ රළුවූ හෝ

රසවත්වූ හෝ භොජනය ඇතිතාක් සම්පූර්ණව නොලබයි. ඔහුට මෙබඳු සිතක් වේ. 'මම ගමකට හෝ නියම්ගමකට හෝ පිඬු පිණිස ගොස් රළුවූ හෝ රසවත්වූ හෝ භෝජනය ඇතිතාක් සම්පූර්ණව නොලදිමි. ඒ මාගේ ශරීරය සැහැල්ලු වූයේ කටයුතු කිරීමට සුදුසු වූයේ වෙයි. එබැවින් මම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලද ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ග ඵලාදිය දකිණු පිණිස වීර්යය ආරම්භ කරයි. මේ පස්වන ආරම්භ වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම ගමක හෝ නියම් ගමක හෝ පිඬු පිණිස හැසිරෙන්නේ රළුවූ හෝ රසවත්වූ හෝ භොජනය ඇතිතාක් සම්පූර්ණව ලබයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම වනාහි ගමකට හෝ නියම් ගමකට හෝ පිඬු පිණිස ගියේ රළුවූ හෝ රසවත්වූ හෝ භොජනය ඇතිතාක් සම්පූර්ණව ලැබුවෙමි. ඒ මාගේ ශරීරය බලවත් වූයේ කටයුතු කිරීමට සමර්ථ වේ. එබැවින් මම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලද ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ග ඵලාදිය දකිණු පිණිස වීර්යය කරමියි හෙතෙම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලද ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ගඵලාදිය දකිනු පිණිස වීර්යය ආරම්භ කරයි මේ සවන ආරම්භ වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, භික්ෂුහට සුලු අසනීපයක් හටගත්තේ වේ. ඔහුට මෙබඳු සිතක් වේ. 'මට මේ ස්වල්ප අසනීපයක් උපන්නේ වෙයි. මේ අසනීපය වැඩිවන්නට හේතු ඇත්තේය. එබැවින් මම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලද ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ගඵලාදිය දකිනු පිණිස වීර්යය කරමියි' හෙතෙම වීර්යය ආරම්භ කරයි. මේ සත්වන ආරම්භක වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම ගිලන්කමින් නැගී සිටියේ, ගිලන්කමින් නැගීසිටි නොබෝ කල් ඇත්තේ වෙයි, ඔහුට මෙබඳු සිතක් වෙයි. 'මම ගිලන්කමින් නැගී සිටියේ, ගිලන්කමින් නැගී සිටි නොබෝ කල් ඇත්තේ

වෙමි. මේ අසනීපය නැවත ඇතිවන්නට ඉඩ ඇත්තේය. එබැවින් මම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලද ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ගඵලාදිය දකිනු පිණිස වීර්යය කරමියි' උත්සාහ කරයි. මේ අටවන ආරම්භ වස්තුවයි. (යන අටයි)

14. "දාන වස්තු (දන් දීමට කරුණු) අටක් වෙත්. දෙමි, දෙමියයි කිය කියා නොසිට එක්වරම දෙමියි කියා දන් දෙයි, නින්දා භය හෝ අපාය භය නිසා දන් දෙයි, මට දුන්නේයයි කියා දන් දෙයි, මතුවට මට දෙන්නේයයි සිතා දැන් දෙයි, දීම හොඳයයි සිතා දන් දෙයි, මම ආහාර පිසිමි, මොවුහු (මහණ බමුණෝ) ආහාර නොපිසත්, පිසන තැනැත්තේ නොපිසන්නවුන්ට දීම සුදුසුයැයි දන් දෙයි, මේ දානය දෙන්නාවූ මාගේ යහපත්වූ කීර්ති ශබ්දය, උස්ව නඟීයයි දන් දෙයි, සිතට අලංකාර පිණිසද, පිරිවර පිණිසද දන් දෙයි (යන අටයි.)

"දානයේ හේතුවෙන් ඇතිවන උත්පත්ති අටක් වෙත්. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතමෙක් මහණෙකුට හෝ, බමුණෙකුට හෝ ආහාරය, පානය, වස්ත්‍රය, යානය, මල් හා සුවඳ විලෙපනය, ආසනය, ආවාසය, පහන් ආදි උපකරණය යන මේ දේ දෙයි. හෙතෙම යමක් දේද, එය ලැබීමට බලාපොරොත්තු වෙයි. හෙතෙම පංච කාම සම්පත්තියෙන් සම්පූර්ණව කාම සම්පත් විඳිමින් වාසය කරන්නාවූ මහ ධනවත් ක්ෂත්‍රියයෙකු හෝ මහ ධනවත් බ්‍රාහ්මණයෙකු හෝ මහ ධනවත් ගෘහපතියෙකු හෝ දකියි.

"ඔහුට මෙබඳු සිතක් වෙයි. 'මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු මහ ධනවත් ක්ෂත්‍රියයන් හෝ මහ ධනවත් බ්‍රාහ්මණයන් හෝ මහ ධනවත් ගෘහපතියන් හෝ අතර උපදින්නෙම් නම්, ඉතා යෙහෙකැයි (කියායි) හෙතෙම ඒ සිත පිහිටුවයි, ඒ සිත අධිෂ්ඨාන කරයි, ඒ සිත වඩයි. පහත්වූ පංචකාමයන්හි ඇළුණු, ඉන්මතු මාර්ග ඵල ලැබීම පිණිස නො වඩනලද ඔහුගේ ඒ සිත එහි ඉපදීම පිණිස පවතියි. එද සිල්වත්හටයයි කියමි. දුස්සීලයා හටයයි නොකියමි. ඇවැත්නි, සිල්වත්හුගේ ප්‍රාර්ථනාව පිරිසිදු බැවින් ඉෂ්ට වේ.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතමෙක් මහණෙකුට හෝ බමුණෙකුට හෝ ආහාරය, පානය, වස්ත්‍රය, යානය, මල් ගඳ විලවුන්ය, සයනාසනය ආවාසය ප්‍රදීප උපකරණය යන මේ දේ දෙයි. හෙතෙම යමක් දේද, එය ලැබීමට බලාපොරොත්තු වෙයි

"චාතුම්මහාරාජික දෙවියෝ, දීර්ඝ ආයුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, සැප බහුලකොට ඇත්තෝයයි ඔහු විසින් අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු චාතුර්මහාරාජික දෙවියන් අතර උපදින්නෙම් නම් ඉතා යෙහෙකැයි කියායි. හෙතෙම ඒ සිත පිහිටුවයි. ඒ සිත අධිෂ්ඨාන කරයි. ඒ සිත වඩයි. පහත්වූ පංචකාමයන්හි ඇළුණු, ඉන් මතු මාර්ගඵල ලැබීම පිණිස නොවඩනලද ඔහුගේ ඒ සිත එහි ඉපදීම පිණිස පවතියි. එද සිල්වත්හටයයි කියමි. දුස්සීලයාහටයයි නොකියමි. ඇවැත්නි, සිල්වත්හුගේ ප්‍රාර්ථනාව පිරිසිදු බැවින් ඉෂ්ට වේ.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැමෙක් මහණෙකුට හෝ බමුණෙකුට හෝ ආහාරය, පානය, වස්ත්‍රය, යානය, මල්ගඳ විලවුන්ය, ආසනය, ප්‍රදීප උපකරණය යන මේ දේ දන් දෙයි. හෙතෙම යමක් දේද, එය ලැබීමට බලාපොරොත්තු වෙයි. තව්තිසා වැසි දෙවියෝ දීර්ඝ ආයුෂ ඇත්තෝ වර්ණ ඇත්තෝ සැප බහුලකොට ඇත්තෝයයි ඔහු විසින් අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. 'මම ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු තව්තිසා වැසි දෙවියන් හා එක්වීමට පැමිණෙන්නෙම් නම් ඉතා යෙහෙකැයි' (කියායි) හෙතෙම ඒ සිත පිහිටුවයි. ඒ සිත අධිෂ්ඨාන කරයි. ඒ සිත වඩයි. පහත්වූ පංචකාම ගුණයන්හි ඇලුණු මත්තෙහි නොවඩන ලද්දාවූ ඔහුගේ ඒ සිත එහි ඉපදීම පිණිස පවතී. එයද සිල්වත්හටයයි කියමි. දුස්සීලයාහටයයි නොකියමි. ඇවැත්නි, සිල්වත්හුගේ ප්‍රාර්ථනාව පිරිසිදු බැවින් ඉෂ්ටවේ.

"ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැමෙක් මහණෙකුට හෝ බමුණෙකුට හෝ ආහාරය, පානය, වස්ත්‍රය, යානය, මල්ගඳ

විලවුන්ය, සයනාසනය, ආවාසය, ප්‍රදීප උපකරණය යන මේ දේ දෙයි. හෙතෙම යමක් දේද එය ලැබීමට බලාපොරොත්තු වෙයි. ඔහු විසින් යාම දෙවියෝ දීර්ඝ ආයුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, සැප බහුලකොට ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි 'මම ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු යාම වැසි දෙවියන්හා එක්වීමට පැමිණෙන්නෙම් නම් ඉතා යෙහෙකැයි' (කියායි.) හෙතෙම ඒ සිත පිහිටුවයි. ඒ සිත අධිෂ්ඨාන කරයි. ඒ සිත වඩයි. පහත්වූ පංචකාම ගුණයන්හි ඇලුණු මත්තෙහි නොවඩන ලද්දාවූ ඔහුගේ ඒ සිත එහි ඉපදීම පිණිස පවතී. එයද සිල්වත්හටයයි කියමි. දුස්සීලයාහටයයි නොකියමි. ඇවැත්නි, සිල්වත්හුගේ ප්‍රාර්ථනාව පිරිසිදු බැවින් ඉෂ්ට වේ.

"ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැමෙක් මහණෙකුට හෝ බමුණෙකුට හෝ ආහාරය, පානය, වස්ත්‍රය, යානය, මල්ගඳ විලවුන්ය, සයනාසනය, ආවාසය, ප්‍රදීප උපකරණය, යන මේ දේ දෙයි. හෙතෙම යමක් දේද, එය ලැබීමට බලාපොරොත්තු වෙයි. තුසිත වැසි දෙවියෝ දීර්ඝ ආයුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, සැප බහුල කොට ඇත්තෝයයි ඔහු විසින් අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු තුසිත දෙවියන් හා එක්වීමට පැමිණෙන්නේ නම් ඉතා යෙහෙකැයි (කියායි) හෙතෙම ඒ සිත පිහිටුවයි. ඒ සිත අධිෂ්ඨාන කරයි. ඒ සිත වඩයි. පහත්වූ පංචකාම ගුණයන්හි ඇලුණු මත්තෙහි නොවඩන ලද්දාවූ, ඔහුගේ ඒ සිත එහි ඉපදීම පිණිස පවතියි. එයද වනාහි සිල්වත්හටයයි කියමි. දුස්සීලයාහටයයි නොකියමි. ඇවැත්නි, සිල්වත්හුගේ ප්‍රාර්ථනාව පිරිසිදු බැවින් ඉෂ්ටවේ.

"ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැමෙක් මහණෙකුට හෝ බමුණෙකුට හෝ ආහාරය, පානය, වස්ත්‍රය, යානය, මල්ගඳ විලවුන්ය, සයනාසනය, ආවාසය, ප්‍රදීප උපකරණය, යන මේ දේ දෙයි. හෙතෙම යමක් දේද, එය ලැබීමට බලාපොරොත්තු වෙයි. නිර්මානරතියෙහි දෙවියෝ දීර්ඝ ආයුෂ ඇත්තෝය, වර්ණ

ඇත්තෝය, සැප බහුල කොට ඇත්තෝයයි ඔහු විසින් අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. 'මම ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු නිර්මානරතී දෙවියන් හා එක්වීමට පැමිණෙන්නේ නම් ඉතා යෙහෙකැයි' (කියායි) හෙතෙම ඒ සිත පිහිටුවයි, ඒ සිත අධිෂ්ඨාන කරයි. ඒ සිත වඩයි. පහත්වූ පංචකාම ගුණයන්හි ඇලුණු මත්තෙහි නොවඩන ලද්දාවූ, ඔහුගේ ඒ සිත එහි ඉපදීම පිණිස පවතී. එයද වනාහි සිල්වත්හටයයි කියමි. දුස්සීලයාහටයයි නොකියමි. ඇවැත්නි, සිල්වත්හුගේ ප්‍රාර්ථනාව පිරිසිදු බැවින් ඉෂ්ටවේ.

"ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැමෙක් මහණෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ ආහාරය, පානය, වස්ත්‍රය, යානය, මල්ගඳ විලවුන්ය, සයනාසනය, ආවාසය, ප්‍රදීප උපකරණය යන මේ දේ දෙයි. හෙතෙම යමක් දෙයිද, ඒ දේ ලැබීමට බලාපොරොත්තු වෙයි. පරනිර්මිතවසවර්ති වැසි දෙවියෝ දීර්ඝ ආයුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, සැප බහුලකොට ඇත්තෝයයි ඔහු විසින් අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. 'මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු පරනිර්මිතවසවර්ති දෙවියන් අතර උපදින්නේ නම්, ඉතා යෙහෙකැයි' (කියායි.) හෙතෙම ඒ සිත පිහිටුවයි. ඒ සිත අධිෂ්ඨාන කරයි. ඒ සිත වඩයි. පහත්වූ පංචකාමයන්හි ඇළුණු, මත්තෙහි මාර්ගඵල පිණිස නොවඩන ලද ඔහුගේ ඒ සිත එහි ඉපදීම පිණිස පවතියි. එයද සිල්වත්හටයයි කියමි. දුස්සීලයාහටයයි නොකියමි. ඇවැත්නි, සිල්වත්හුගේ ප්‍රාර්ථනාව පිරිසිදු බැවින් ඉෂ්ටවේ.

15. "නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැමෙක් මහණෙකුට හෝ බමුණෙකුට හෝ ආහාරය, පානය, වස්ත්‍රය, යානය, මල් හා සුවඳ විලෙපනය, ආසනය, ආවාසය, පහන් උපකරණය යන මේ දේ දෙයි. හෙතෙම යමක් දෙයිද, එය ලැබීමට බලාපොරොත්තු වෙයි, බඹලොව වැසි දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, සැප බහුලව ඇත්තෝයයි ඔහු විසින් අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි, 'මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි බඹලොව

වැසි දෙවියන් අතර උපදින්නෙම් නම් ඉතා යහපති' (කියායි.) හෙතෙම ඒ සිත පිහිටුවයි, ඒ සිත අධිෂ්ඨාන කරයි, ඒ සිත වඩයි, පහත්වූ පංචකාමයන්හි ඇළුණු මත්තෙහි මාර්ගඵල පිණිස නොවඩන ලද ඔහුගේ ඒ සිත එහි ඉපදීම පිණිස පවතියි. එයද සිල්වත්හටය, දුස්සීලයාහට නොවේයයි කියමි. පහවූ කාම රාග ඇත්තාහටය, කාම රාග සහිත වූවහුට නොවේයයි කියමි. ඇවැත්නි, සිල්වත්හුගේ ප්‍රාර්ථනාව පහවූ රාගය ඇති බැවින් ඉෂ්ට වේ. (යන අටයි)

"පිරිස් අටක් වෙත්. ක්ෂත්‍රිය පිරිසය, බ්‍රාහ්මණ පිරිසය, ගෘහපති පිරිසය, ශ්‍රමණ පිරිසය, චාතුර්මහාරාජික පිරිසය, තාවතිංස පිරිසය, මාර පිරිසය, බ්‍රහ්ම පිරිසය (යන අටයි.)

"ලොකධර්ම අටක් වෙත්. ලාභයද, අලාභයද, යසසද, අයසද නින්දාවද, ප්‍රශංසාවද, සැපයද, දුකද (යන අටයි.)

"අභිභායතන (බලය පැවැත්වීම හෙවත් මැඩගෙන සිටීම්) අටක් වෙත්. තමා කෙරෙහි රූපසංඥා ඇති එක් පුද්ගලයෙක් ස්වල්පවූ යහපත් වර්ණ ඇති, අයහපත් වර්ණ ඇති පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩපවත්වා, දනිමි දකිමියි, යන සංඥා ඇත්තේ වේ. මේ පළමුවන අභිභායතන යයි, තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් අප්‍රමාණවූ යහපත් වර්ණ ඇති, අයහපත් වර්ණ ඇති, පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩගෙන දනිමි දකිමියි යන සංඥා ඇත්තේ වෙයි. මේ දෙවන අභිභායතන යයි. තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් ස්වල්පවූ යහපත් වර්ණ ඇති, අයහපත් වර්ණ ඇති පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩගෙන දනිමි දකිමියි යන සංඥා ඇත්තේ වේ. මේ තුන්වන අභිභායතනයයි. තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් අප්‍රමාණවූ යහපත් වර්ණ ඇති අයහපත් වර්ණ ඇති පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩගෙන දනිමි දකිමියි, යන සංඥා ඇත්තේ වේ. මේ සතරවන අභිභායතන යයි. තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් නිල්වූ නිල්පාට ඇත්තාවූ නිල් පෙනීම ඇත්තාවූ නිල් බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. දිය බෙරලිය මල යම්සේ නිල්වේද, නිල්පාට

ඇත්තේද, නිල් පෙනීම ඇත්තේද නිල් බැබලුම් ඇත්තේද, බරනැස් වස්ත්‍රය දෙපසින් මට්ටම් කරණ ලද්දේ හෙවත් මඩනා ලද්දේ යම්සේ නිල්වේද, නිල්පාට වේද, නිල් පෙනීම් නිල් බැබලුම් ඇත්තේද, එපරිද්දෙන්ම තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් නිල්වූ නිල්පාට ඇත්තාවූ, නිල් පෙනීම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යන සංඥාඇත්තේ වේ. මේ පස්වන අභිභායතන යයි. තමා කෙරෙහි අරූප සංඥා ඇති එක් පුද්ගලයෙක් රන්වන්වූ රන්වන් පැහැ ඇත්තාවූ රන්වන් පෙනීම ඇත්තාවූ රන්වන් බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. කිණිහිරිමල යම්සේ රන්වන් වේද රන්වන් පැහැ ඇත්තේද, රන්වන් පෙනීම ඇත්තේද, රන්වන් බැබලුම් ඇත්තේද, බරණැස්හිවූ දෙපැත්තෙන් මට්ටම් කරණ ලද, වස්ත්‍රය රන්වන් වේද, රන්වන් පැහැ ඇත්තේද, රන්වන් දැකුම් ඇත්තේද, රන්වන් බැබලුම් ඇත්තේද, එමෙන්ම තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් රන්වන්වූ, රන්වන්පාට ඇති, රන්වන් පෙනීම ඇත්තාවූ රන්වන් බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩගෙන දනිමි දකිමි යන සංඥා ඇත්තේ වෙයි. මේ සයවන අභිභායතන යයි.

**16.** "තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් ලේ පාටවූ පැහැ ඇති ලේපාට පෙනීම ඇති ලේපාට බැබලුම් ඇති පිටත්හි රූපයන් දකියි. බඳුවදමල යම්සේ ලේවන් වේද ලේවන් පාට ඇත්තේද, ලේවන් පෙනීම ඇත්තේද, ලේවන් බැබලුම් ඇත්තේද, බරණැසෙහිවූ දෙපැත්තෙන් හොඳාකාර මට්ටම් කරණලද ලේවන්වූ වස්ත්‍රය යම්සේ ලේවන් පාට ඇත්තේද, ලේවන් පෙනීම ඇත්තේද ලේවන් බැබලුම් ඇත්තේද, එපරිද්දෙන්ම තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් රතුවූ රතුපාට ඇත්තාවූ රතුපාට පෙනීම ඇත්තාවූ රතුපාට බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යන සංඥා ඇත්තේ වේ. මේ සත්වන අභිභායතන යයි.

"තමා කෙරෙහි අරූපසංඥා ඇති පුද්ගලයෙක් සුදුවූ සුදුපාට ඇත්තාවූ සුදු පෙනීම ඇත්තාවූ සුදු බැබලුම් ඇත්තාවූ පිටත්හි

රූපයන් දකියි. දවහත් (සිකුරු) තරුව යම්සේ සුදුද සුදුපාට ඇත්තීද සුදු පෙනීම ඇත්තීද සුදු බැබලුම් ඇත්තීද බරණැසවූ දෙපසින් මට්ටම් කරණ ලද්දාවූ සුදුවූ වස්ත්‍රය යම්සේ සුදුපාට ඇත්තේද, සුදු පෙනීම ඇත්තේද, සුදු බැබලුම් ඇත්තේද එපරිද්දෙන්ම තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් සුදුවූ සුදු වර්ණ ඇත්තාවූ සුදු පෙනීම ඇත්තාවූ සුදු බැබලීම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යන සංඥා ඇත්තේ වෙයි. මේ අටවන අභිභායතනයයි (යන අටයි.)

"විමොක්ෂ (මිදීම්) අටක් වෙත්. රූපීවූයේ රූපයන් දකියි. මේ පළමුවන විමොක්ෂයයි. තමා කෙරෙහි අරූප සංඥා ඇත්තේ පිටත්හි රූපයන් දකියි. මේ දෙවන විමොක්ෂයයි. සුභයයිම තීරණය කර ගත්තේ වෙයි. මේ තෙවන විමොක්ෂයයි. සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් හැපීම් සංඥාවන් නැසීමෙන් වෙන් වෙන් සංඥාවන් කල්පනා නොකිරීමෙන් ආකාශය අනන්තයයි. ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරයි. මේ සතරවන විමොක්ෂයයි. සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි, විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරයි, මේ පස් වන විමොක්ෂයයි. සියලු ආකාරයෙන් විඤ්ඤානඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මේ සවන විමොක්ෂයයි. සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මේ සත්වන විමොක්ෂයයි. සියලු ආකාරයෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ඉක්මවා සංඥා වෙදයිත නිරොධයට (නිරොධ සමාපත්තියට) පැමිණ වාසය කරයි. මේ අටවන විමොක්ෂයයි. ඇවැත්නි, දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්ම අට මොනවට ප්‍රකාශ කරණ ලද්දේ වෙත්.

"යම්සේ මේ ශාසන බ්‍රහ්මචය්‍ර්‍යාව බොහෝ කල් පවත්නේ වේද චිරස්ථායී වේද එසේ සියල්ලන් විසින් එක්ව මේ ධර්මය

සජ්ජායනා (එක්ව කීම) කළ යුත්තේය. විවාද නොකළ යුත්තේය. එය බොහෝදෙනාට හිත පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය.

(කරුණු අට බැගින් ඇති කොටස නිමි.)

17. "ඇවැත්නි, දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් හොඳින් දෙශනා කරණ ලද්දාවූ ධර්මයෝ නවදෙනෙක් ඇත්තාහ.

"යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝ කල් පවත්නේ වේද චිරස්ථායි වේද, එසේ සියල්ලන් විසින් එක්ව මේ ධර්මය සජ්ජායනා (එක්ව කීම) කළ යුත්තේය. විවාද නොකළ යුත්තේය. එය බොහෝදෙනාට හිත පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය.

"කවර නවදෙනෙක්ද යත්? ආඝාත වස්තු (ක්‍රොධයට කරුණු) නවයක් වෙත් 'මට අවැඩක් කෙළේයයි.' ක්‍රොධය බඳියි. 'මට අවැඩක් කරයි කියා' ක්‍රොධය බඳියි. 'මට අවැඩක් කරන්නේයයි කියා' ක්‍රොධය බඳියි. 'මාගේ ප්‍රියවූ මනාපවූවහුට අවැඩක් කෙළ්ය. අවැඩක් කරයි. අවැඩක් කරන්නේයයි' ක්‍රොධය බඳියි. 'මාගේ අප්‍රියවූ අමනාප වූවහුට යහපතක් කෙළේය, යහපතක් කරයි.' යහපතක් කරන්නේයයි ක්‍රොධය බඳියි. (යන නවයයි)

"ක්‍රොධය දුරුකිරීම් නවයක් වෙත්. 'මට අවැඩක් කළේය ඒ අනිකාගේ අවැඩ නොකිරීම මා විසින් කෙසේ ලැබිය හැකි දැයි' සිතා ක්‍රොධය දුරු කරයි. 'මට අවැඩක් කරයි, ඒ අනිකාගේ අවැඩ නොකිරීම මා විසින් කෙසේ ලැබිය හැකි දැයි' සිතා ක්‍රොධය දුරු කරයි. 'මට අවැඩක් කරන්නේය, ඒ අනිකාගේ අවැඩ නොකිරීම මා විසින් කෙසේ ලැබිය හැකි දැයි' සිතා ක්‍රොධය දුරු කරයි. 'මාගේ ප්‍රියවූ මනාප වූවහුට අවැඩක් කළේය. අවැඩක් කරයි, අවැඩක් කරන්නේය, ඒ අනිකාගේ අවැඩ

නොකිරීම මා විසින් කෙසේ ලැබිය හැකි දැයි’ සිතා ක්‍රොධය දුරු කරයි. ‘මාගේ අප්‍රියවූ අමනාප වූවහුට යහපතක් කළේය. යහපතක් කරයි, යහපතක් කරන්නේය එසේ අප්‍රිය වූවහුට අන්‍යයා විසින් යහපතක් නොකිරීම මා විසින් නොලැබිය හැකියයි’ සිතා ක්‍රොධය දුරු කරයි. (යන නවයයි)

18. “සත්වාවාස (සත්වයන් වාසය කරණ ස්ථාන) නවයක් වෙත්. නොයෙක් ශරීර ඇති නොයෙක් ප්‍රතිසන්ධි විඤ්ඤාණ ඇති සත්වයෝ වෙත්. මනුෂ්‍යයෝද, ඇතැම් දෙවියෝද, ඇතැම් විනිපාතික ප්‍රේතයෝද යම්සේද එමෙනි. මේ පළමුවන සත්වා වාසයයි. ඇවැත්නි, වෙනස් ශරීර ඇති සමානප්‍රතිසන්ධි ඇති සත්වයෝ වෙත්. පළමුවන ධ්‍යානයෙන් උපන්නාවූ බ්‍රහ්මකායික බඹලොව වැසි දෙවියෝ යම්සේද එමෙනි. මේ දෙවැනි සත්වාවාසයයි. ඇවැත්නි, එකසමාන ශරීර ඇති වෙනස් ප්‍රතිසන්ධි විඤ්ඤාණ ඇති සත්වයෝ වෙත්. ආභාස්වර දෙවියෝ යම්සේද එමෙනි. මේ තුන්වන සත්වාවාසයයි.

“ඇවැත්නි, එකසමාන ශරීර ඇති එකසමාන ප්‍රතිසන්ධි විඤ්ඤාණ ඇති සත්වයෝ වෙත්. සුභකිණ්හ දෙවියන් මෙනි. මේ සතරවන සත්වාවාසයයි.

“ඇවැත්නි, හැඟීමක් නැත්තාවූ විඳීමක් නැත්තාවූ සත්වයෝ වෙත්. අසඤ්ඤසත්ත දෙවියන් මෙනි. මේ පස්වන සත්වාවාසයයි.

“ඇවැත්නි, සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් ගැටීම් සංඥාවන් නැසීමෙන් නොයෙක් සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසනඤ්චායතනයට පැමිණියාවූ සත්වයෝ වෙත්. මේ සයවන සත්වාවාසයයි.

“ඇවැත්නි, සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා, විඤ්ඤානය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණියාවූ සත්වයෝ වෙත්. මේ සත්වන සත්වාවාසයයි.

“ඇවැත්නි, සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියාවූ සත්වයෝ වෙත්. මේ අටවන සත්වාවාසයයි.

"ඇවැත්නි, සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණියාවූ සත්වයෝ වෙත්. මේ නවවන සත්වාවාසයයි. (යන නවයයි)

"බ්‍රහ්මචරිය වාසයට නුසුදුසුවූ නොකල් නවයක් වෙත්. ඇවැත්නි, මේ ලොකයෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේද ලොව උපන්නේ වෙයි. කෙලෙස් සංසිඳුවන්නාවූ, කෙලෙස් නැතිකිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ සතර මාර්ගඥාන අවබොධයට යන්නාවූ සුගතයන් වහන්සේ විසින් දැන වදාළවූ ධර්මයද දෙශනා කරනු ලැබේ. මේ පුද්ගලයා නිරයෙහි උපන්නේ වෙයි. (එහෙයින් ඒ) බ්‍රහ්මචරිය වාසයට නුසුදුසුවූ පළමුවන නොකාලය වෙයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේද ලොව උපන්නේ වෙයි. කෙලෙස් සංසිඳුවන්නාවූ, කෙලෙස් නැතිකිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ සතර මාර්ගඥාන අවබොධයට යන්නාවූ සුගතයන් වහන්සේ විසින් දැන වදාළවූ ධර්මයද දෙශනා කරණු ලැබේ. මේ පුද්ගල තෙමේද තිරිසන් යෝනියෙහි උපන්නේ වෙයි. (එහෙයින්) බ්‍රහ්මචරිය වාසයට නුසුදුසුවූ මේ දෙවෙනි නොකාලයයි.

"නැවත අනිකක්ද කියමි, ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේද ලොව උපන්නේ වෙයි. කෙලෙස් සංසිඳුවන්නාවූ සහමුලින් කෙලෙස් නැති කිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ සතර මාර්ගඥාන අවබොධයට යන්නාවූ සුගතයන් වහන්සේ විසින් දැන වදාළවූ ධර්මයද දෙශනා කරනු ලබයි. මේ පුද්ගලතෙමේද ප්‍රෙත ලොකයෙහි උපන්නේ වෙයි. බ්‍රහ්මචරිය වාසයට නුසුදුසුවූ මේ තුන්වන අකාලයයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේද ලොව උපන්නේ වෙයි. කෙලෙස් සංසිඳුවන්නාවූ සහමුලින් කෙලෙස් නැති කිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ සතර මාර්ග ඥානය කරා ගමන්

කරන්නාවූ සුගතයන් වහන්සේ විසින් දැන වදාළාවූ ධර්මයද දෙශනා කරනු ලබයි. මේ පුද්ගල තෙමේද අසුර කායයෙහි උපන්නේ වෙයි. බ්‍රහ්මචරිය වාසයට නුසුදුසුවූ මේ සතර වන අකාලයයි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේද, ලොව උපන්නේ වෙයි. කෙලෙස් සංසිඳුවන්නාවූ සහමුලින් කෙලෙස් නැති කිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ සතර මාර්ග ඥානය කරා ගමන් කරන්නාවූ සුගතයන් වහන්සේ විසින් දැන වදාළාවූ ධර්මයද දෙශනා කරනු ලැබෙයි. මේ පුද්ගලතෙමේද දීර්ඝ ආයුෂ ඇති අසඤ්ඤතලයෙහි හෝ අරූප තලයෙහි හෝ උපන්නේ වෙයි. බ්‍රහ්මචරිය වාසයට නුසුදුසුවූ මේ පස්වන අකාලයයි.

"නැවත අනිකක්ද කියමි ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ ලෝකයේ උපන්නේ වේද, කෙලෙස් සංසිඳු වන්නාවූ සහමුලින් කෙලෙස් නැතිකිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ සතර මාර්ගඥානය අවබොධයට ගමන් කරන්නාවූ සුගතයන් වහන්සේ විසින් දැන වදාළාවූ ධර්මයද දෙශනා කරනු ලැබේද. යම් තැනක භික්ෂූන්ගේද භික්ෂුණීන්ගේද උපාසකයන්ගේද උපාසිකාවන්ගේද පැමිණීමක් නැත්තේද, එබඳුවූ මිලේච්ඡවූ අප්‍රසිද්ධවූ පිටිසර පෙදෙස්වල මේ පුද්ගල තෙමේ උපන්නේ වේද, බ්‍රහ්මචරිය වාසයට නුසුදුසුවූ මේ සයවන අකාලය වේ.

19 "නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේද ලොව උපන්නේ වේ. කෙලෙස් සංසිඳුවන්නාවූ සතර මාර්ගඥානය අවබොධය කරා ගමන්කරන්නාවූ සුගතයන් වහන්සේ විසින් දැන වදාළවූ ධර්මයද දෙශනා කරනු ලබයි. මේ පුද්ගලයාද මධ්‍ය දෙශයෙහි ඉපදුනේ වෙයි, හෙතෙමේද පෙරළුණු දැකුම් ඇති මිථ්‍යාදෘෂ්ටියෙක් වේ. එනම් දීමෙහි විපාක නැත. මහ දන් දීමෙහි විපාක නැත. පිදීමෙහි විපාක නැත. යහපත් අයහපත් වශයෙන් කරණලද කර්මයන්ගේ ඵලයක් විපාකයක් නැත, මෙලොවක් නැත, පරලොවක් නැත,

මවුට උපකාර කිරීමේ ඵල නැත, පියාට උපකාර කිරීමේ ඵල නැත, මැරී උපදින්නාවූ සත්වයෝ නැත. යම් කෙනෙක් මෙලොවද පරලොවද තෙමේ හොඳ නුවණින් දැන අවබොධ කොට ප්‍රකාශ කෙරෙද්ද, එබඳුවූ හොඳ මාර්ගයෙහි ගමන්කළාවූ හොඳ පිළිවෙත පිළිපදින්නාවූ මහණ බමුණෝ ලොකයෙහි නැත කියායි. මේ බ්‍රහ්මචරිය වාසයට නුසුදුසු කාලයවූ සත්වන අකාලයයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේද ලොව උපන්නේ වෙයි. කෙලෙස් සංසිඳුවන්නාවූ, සහමුලින් කෙලෙස් නැති කිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ, සතර මාර්ගඥානය අවබොධය කරා ගමන් කරන්නාවූ සුගතයන්වහන්සේ විසින් දැන වදාළවූ ධර්මයද දෙශනා කරණු ලැබේ. මේ පුද්ගලයාද මධ්‍ය දෙශයෙහි උපන්නේ වෙයි. හෙතෙමේද මෝඩවූ කෙල තොලුවූ හොඳ නරක කියුම්වල අර්ථය දැන ගන්නට බැරි නුවණ නැත්තෙක් වේ. මේ බ්‍රහ්මචරිය වාසයට සුදුසු නොවූ අටවැනි අකාලයයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේද ලොව නූපන්නේ වෙයි. කෙලෙස් සංසිඳු වන්නාවූ, සහමුලින් කෙලෙස් නැතිකිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ, සතර මාර්ගඥානය අවබොධය පිණිස පවත්නාවූ සුගතයන් වහන්සේ විසින් දැන වදාළවූ ධර්මයද දෙශනා කරණු නොලැබේ. මේ පුද්ගල තෙමේද මධ්‍යම දෙශයෙහි ඉපදුනේ වෙයි. හෙතෙමේද මෝඩ නුවූ, කෙලතොලු නොවූ හොඳ නරක කියුම්වල අර්ථය දැනගන්ට සමර්ථවූ නුවණැත්තෙක් වෙයි. මේ බ්‍රහ්මචරියවාසයට නුසුදුසුවූ නව වන අකාලයයි. (යන නවයයි)

"අනුපූර්ව විහරණ (පිළිවෙළින් සමවැදිය යුතු විසීම්) නවයක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම කාමයන් ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති, ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. විතර්ක විචාරයන් ගේ

සංසිඳීමෙන් ද්විතීය ධ්‍යානයට පැමිණ වාසයකරයි. ප්‍රීතියගේද වැළක්මෙන් තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. සැපය දුරුකිරීමෙන් චතුර්ථ ධ්‍යානයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් ගැටීම් සංඥාවන් නැසීමෙන් නොයෙක් සංඥාවන් සිහි නොකිරීමෙන් අනන්තවූ ආකාසයයි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා අනන්තවූ විඤ්ඤාණයයි, විඤ්ඤානඤ්චායතනයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් විඤ්ඤානඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසයකරයි. සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා, සඤ්ඤාවෙදයිත නිරොධයට (නිරොධය සමාපත්තියට) පැමිණ වාසය කරයි. (යන නවයයි)

"අනුපූර්ව නිරොධ (පිළිවෙළින් නැති කිරීම්) නවයක් වෙත්. ප්‍රථම ධ්‍යානයට පැමිණියහුගේ කාම හැඟීම නැතිවේ. ද්විතීය ධ්‍යානයට පැමිණියහුගේ විතර්ක විචාරයෝ නැතිවෙත්. තෘතීය ධ්‍යානයට පැමිණියහුගේ ප්‍රීතිය නැතිවේ. චතුර්ථ ධ්‍යානයට පැමිණියහුගේ ආශ්වාස ප්‍රශ්වාසයෝ නැතිවෙත්. ආකාසානඤ්චායතනයට පැමිණියහුගේ රූප සංඥාව නැතිවේ. විඤ්ඤානඤ්චායතනයට පැමිණියහුගේ ආකාසානඤ්චායතන සංඥාව නැතිවේ. ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියහුගේ විඤ්ඤානඤ්චායතන සංඥාව නැතිවේ. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණියහුගේ ආකිඤ්චඤ්ඤායතන සංඥාව නැති වේ. සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණියහුගේ සංඥාවද විඳීමද නැතිවෙත්. ඇවැත්නි, දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්මයෝ නවදෙන හොඳින් දෙශනා කරණ ලද්දාහු වෙත්.

"යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝ කල් පවත්නේ වේද චිරස්ථායී වේද එසේ මේ ධර්මය සියල්ලන් විසින් එක්ව

සජ්ඣායනා (එක්ව කීම) කළ යුත්තේය. විවාද නොකළ යුත්තේය. එය බොහෝදෙනාට හිත පිණිසද බොහෝ දෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට වැඩ පිණිසද සැප පිණිසද වන්නේය.

(නවය බැගින් ඇති ධර්ම නිමි.)

**20.** "ඇවැත්නි, දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් හොඳින් ප්‍රකාශ කරණ ලද්දාවූ ධර්මයෝ දසදෙනෙක් වෙත්.

"යම්සේ මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව බොහෝ කල් පවත්නේ වේද, එසේ සියල්ලන් විසින් එක්ව මේ ධර්මය, සජ්ඣායනා (එක්ව කීම) කළ යුත්තේය. විවාද නොකළ යුත්තේය. එය බොහෝදෙනාට හිත පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය.

"කවර දසදෙනෙක්ද යත්? නාථකරණ (පිහිටවන) ධර්ම දසයක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම සිල්වත්වේ. ප්‍රාතිමොක්ෂ සංවර (ශික්ෂාපද ශීල) යෙන් සංවර වූයේ වාසය කරයි. ආචාර ගොචර දෙකින් සමන්විත වූයේ ස්වල්ප තරම්වූ වරදවල භය දක්නා ගති ඇති වූයේ ශික්ෂාපදයන් දැඩි කොට ගෙන හික්මෙයි.

"ඇවැත්නි, මහණ තෙම සිල්වත් වේද ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවර වූයේ වාසය කෙරේද, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්ත වූයේ ස්වල්පවූද වරදවල භය දක්නේ ශික්ෂා පදයන්හි සමාදන්ව හික්මේය යන යමක් වේද මෙයද තමාට පිහිටවන ධර්මයක් වේ.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණ තෙම ඇසූ දේ දරන්නාවූ, ඇසූ දේ රැස්කර හිතේ දරා ගන්නාවූ බොහෝ ඇසූ කෙනෙක් වේ. මුල යහපත්වූ මැද යහපත්වූ, කෙළවර යහපත්වූ, අර්ථ සහිතවූ පද සහිතවූ, යම් ඒ ධර්මයක් සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ, බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කෙරෙද්ද එබඳුවූ ධර්මයෝ මොහු

විසින් බොහෝ අසන ලද්දාහු දරණ ලද්දාහු වචනයෙන් පුරුදු කරණ ලද්දාහු, සිතින් කල්පනා කරණ ලද්දාහු, දෘෂ්ටියෙන් හොඳින් අවබෝධ කරණ ලද්දාහු වෙත්. ඇවැත්නි, මහණතෙම බොහෝ ඇසූ කෙනෙක් වේද, යම් මේ ධර්මකෙනෙක් මුල යහපත්ද, මැද යහපත්ද, කෙළවර යහපත්ද, අර්ථ සහිතවූ, ව්‍යංජන සහිතවූ සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කෙරෙද්ද, එබඳුවූ ධර්මයෝ මොහු විසින් බොහෝ කොට අසන ලද්දාහු, දරණ ලද්දාහු, වචනයෙන් පුරුදු කරන ලද්දාහු, සිතින් කල්පනා කරන ලද්දාහු දෘෂ්ටියෙන් හොඳින් අවබොධ කරණ ලද්දාහු වෙත්ද යන යමක් වේද, මේ ධර්මයද තමාට පිහිටවන ධර්මයකි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම යහපත් මිත්‍රයන් යහළු කොට ඇත්තේ, යහපත් මිත්‍රයන් කෙරෙහි නැමීම ඇත්තේ, යහපත් මිත්‍රයන් ඇත්තේ වේ. ඇවැත්නි, යම් හෙයකින් මහණතෙම යහපත් මිත්‍රයන් ඇත්තේ යහපත් මිත්‍රයන් යහළු කොට ඇත්තේ යහපත් මිත්‍රයන් කෙරෙහි නැමීම ඇත්තේ වේද, මේ ධර්මයද තමාට පිහිට වන ධර්මයකි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම සුවච බැවින් හෙවත් කියන දේ අසන ගතියෙන් යුක්ත වූයේ, සුවචයෙක්වේ. නොකිපෙන ගති ඇති අනුශාසනාව ආදරයෙන් පිළිගන්නා කෙනෙක් වෙයි. ඇවැත්නි, මහණතෙම සුවචයෙක් වේද නොකිපී අනුශාසනාව ආදරයෙන් පිළිගන්නේ වේද, යන යමක් වේද, මේද තමාට පිහිට වන ධර්මයකි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම එකට මහණදම් පුරන භික්ෂූන්ගේ යම් ලොකු කුඩා කටයුතු වෙත්ද, එහි දක්ෂවූයෙ කම්මැලි නොවූයේ, ඒ වැඩට යොග්‍ය උපක්‍රම දැනීමෙන් යුක්තවූයේ වැඩ කරන්ටද පිළිවෙළ කරන්ටද සුදුසු වෙයි, ඇවැත්නි, මහණතෙම එකට මහණදම් පුරන භික්ෂූන්ගේ කුඩා මහත් කටයුතු "කිමෙක්දැ"යි අසාකරන කටයුතු වෙත්ද එහි දක්ෂවූයේ, අලස නොවූයේ, එහි උපාය දන්නේ පිළිවෙළ කිරීමට දන්නා නුවණින් යුක්තවූයේ වෙයිද, මේද තමාට පිහිට වන ධර්මයකි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම ප්‍රියවූ කථා ඇත්තේ අභිධර්මයෙහි අභිවිනයෙහි (ඛුද්දක පරිවාරයෙහි හෝ කෙලෙස් සංසිඳුවන කරුණෙහි) මහත් සතුටු ගතිය ඇත්තේ ධර්මය කැමැත්තේ වේ. ඇවැත්නි, මහණ තෙම ධර්මය කැමැත්තේ වේද, ප්‍රියවූ වචන ඇත්තේ වේද, අභිධර්මයෙහි අභිවිනයෙහි මහත්වූ සතුටු ගතිය ඇත්තේය යන යමක් වේද මේද තමාට පිහිටවන ධර්මයකි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම ලැබුන පරිදි, සිවුරුය, පිණ්ඩපාතය, සේනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකර යන මෙයින් සතුටුවූයේ වෙයි, ඇවැත්නි, මහණතෙම ලදපරිදි සිවුරුය පිණ්ඩපාතය සේනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන මෙයින් සතුටු වෙයි යන යමකුත් වේද මේද තමාට පිහිටවන ධර්මයකි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම අකුසල ධර්මයන් දුරුකිරීම පිණිස කුසල ධර්මයන් වැඩීම පිණිස ශක්ති ඇත්තේ දැඩි වීරිය ඇත්තේ කුසල ධර්මයන්හි බහා නොතබනලද වීරිය ඇත්තේ පටන්ගන්නා ලද වීර්යය ඇත්තේ වාසයකරයි. ඇවැත්නි, මහණතෙම අකුසල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස කුසල ධර්මයන්ගේ වැඩීම පිණිස ශක්ති ඇත්තේද දැඩි උත්සාහ ඇත්තේද කුසල ධර්මයන්හි බහා නොතබන ලද බර ඇත්තේ පටන්ගන්නාලද වීර්යය ඇත්තේ වාසය කරයි යන යමකුත් වේද, මේද තමාට පිහිටවන ධර්මයකි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණ තෙම උතුම්වූ සිහියෙන් හා හොඳ නුවණින් යුක්තවූයේ බොහෝ කලකට පෙර කරණ ලද්දද, බොහෝ කලකට පෙර කියන ලද්දද, සිහි කිරීමට, සමර්ථ සිහි ඇත්තේවේ. ඇවැත්නි, මහණතෙම උතුම් සිහියෙන් හා දක්ෂ නුවණින් යුක්තවූයේ බොහෝ කල්හි කරන ලද්දද, බොහෝ කල්හි කියන ලද්දද, සිහිකරන්නේ නැවත නැවත සිහි කරන්නේ සිහි ඇත්තේවේය යන යමකුත් වේද, මේද තමාට පිහිට වන ධර්මයකි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම ඇතිවීම නැතිවීම පිළිබඳ පවත්නාවූ ආයඝීවූ සසර කලකිරීම ඇතිකරන්නාවූ, හොඳාකාර දුක් නැතිකිරීම පිණිස පවත්නාවූ නුවණින් යුක්තවූයේ නුවණැත්තේ වෙයි. ඇවැත්නි, මහණතෙම ඇතිවීම, නැතිවීම පිණිස පවත්නාවූ ආයඝීවූ නිබ්බේධිකවූ හෙවත් සසර කලකිරීම, මනාව දුක් නැති කිරීම පිණිස පවත්නාවූ නුවණින් යුක්ත වූයේ ප්‍රඥාවත් වෙයි යන යමකුත් වේද, මේද තමාට පිහිටවන ධර්මයකි.

**21.** "කසිණායතන දසයක් වෙත්. ඇතමෙක් උඩ, යට, සරස, එකමවූ (දෙකක් නැති) පෘථිවි කසිණය හඳුනයි. ඇතැමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ ආපො කසිණය හඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ තොජො, කසිණය අඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ වායො කසිණය හඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ නීල කසිණය හඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ පීත කසිණය හඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ ලොහිත කසිණය හඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ අවදාත කසිණය හඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ එකමවූ අප්‍රමාණවූ විඤ්ඤාණ කසිණය හඳුනයි, (යන දසයයි)

"අකුසල කර්ම මාර්ග දසයක් වෙත්, සතුන් මැරීමය, සොරකම් කිරීමය, කාමයන්හි වරදවා හැසිරීමය, බොරු කීමය, කේලාම් කීමය, ඵරුෂ වචන කීමය, හිස් වචන කීමය අභිධ්‍යාය (අනුන්ගේ දෙයට ලොභකිරීම) ව්‍යාපාදය, (අනුන් නැසේවා යන කල්පනාව) මිථ්‍යාදෘෂ්ටියය, (යන දසයයි)

"කුසල කර්ම මාර්ග දසයක් වෙත්, සතුන් මැරීමෙන් වැළකීමය, අදත්තාදානයෙන් වැළකීමය, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමය, බොරු කීමෙන් වැළකීමය, කේලාම් කීමෙන් වැළකීමය, ඵරුෂ වචනයෙන් වැළකීමය, හිස් කථාවලින් වැළකීමය, අනුන්ගේ දෙයට ලොභ නොකිරීමය, අනුන් නැසේවායි නොසිතීමය නිවැරදි දෘෂ්ටිය (යන දසයයි.)

22. "ආයර්‍යවාස (උත්තමයන් පමණක් වාසයකරන විසීම්) දසයක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම අංග පසක් දුරුකළේ වෙයි. අංග සයකින් යුක්තවූයේ වෙයි, එක් ආරක්ෂාවක් ඇත්තේ වෙයි, අපස්සෙන (හේත්තුවීම්) සතරක් ඇත්තේ වෙයි, දුරු කළ වෙන වෙන සත්‍යයන් ඇත්තේ වෙයි, සම්පූර්ණයෙන් දුරුකරණ ලද සියලු සෙවීම් ඇත්තේ වෙයි, නොකැළඹුනු කල්පනා ඇත්තේ සැහැල්ලුවූ කායසංස්කාර ඇත්තේ වෙයි. ඇවැත්නි, මහණතෙම කෙසේ නම් දුරුකළ අංග පසක් ඇත්තේ වේද, ඇවැත්නි මේ ශාසනයෙහි මහණහුගේ කාම ආශාව පහකරන ලද්දේ වෙයි, ක්‍රොධය පහකරන ලද්දේ වෙයි. චිත්ත චෛසිකයන්ගේ මැලිකම පහකරන ලද්දේ වෙයි, නොසන්සුන්කම හා පසුතැවීම පහ කරන ලද්දේ වෙයි. සැකය පහකරන ලද්දේ වෙයි, ඇවැත්නි, මෙසේ මහණතෙම දුරුකරන ලද අංග පස ඇත්තේ වෙයි.

"ඇවැත්නි, කෙසේ නම් මහණතෙම අංග සයකින් යුක්ත වූයේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම ඇසින් රූපය දැක සතුටුද නොවෙයි, නොසතුටුද නොවෙයි, සිහි ඇත්තේ මනා දැනුම් ඇත්තේ සුව දුක් දෙකට මැදහත්ව වාසය කරයි, කණින් ශබ්දය අසා නාසයෙන් ගඳ දැන දිවෙන් රස විඳ කයින් ස්පර්ශකොට සිතින් ධර්ම අරමුණු දැන සතුටුද නොවෙයි, නොසතුටුද නොවෙයි. සිහි ඇත්තේ මනා දැනුම් ඇත්තේ, මැදහත් විඳීමෙන් යුක්තව වාසයකරයි. ඇවැත්නි, මෙසේ මහණතෙම අංග සයකින් යුක්තවූයේ වෙයි.

"ඇවැත්නි, මහණතෙමේ එක් ආරක්ෂාවක් ඇත්තේ කෙසේද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සිහිය නමැති ආරක්ෂාව ඇත්තාවූ සිතින් යුක්තවූයේ වෙයි. ඇවැත්නි, මෙසේ මහණතෙම එකම ආරක්ෂාවක් ඇත්තේ වෙයි.

"ඇවැත්නි, කෙසේ නම් මහණතෙම හේත්තුවීම්වූ සතරක් ඇත්තේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම නුවණින් සේවනය කළයුත්තක්ම සේවනය කරයි නුවණින් දැන ඉවසිය යුත්තක්ම ඉවසයි. නුවණින් දැන පහකළ යුත්තක්ම පහකරයි.

හැරදමයි. ඇවැත්නි, මෙසේ මහණතෙම හේත්තුවීම් සතරක් ඇත්තේ වේ.

"ඇවැත්නි, කෙසේ නම් මහණතෙම දුරුකරණ ලද නොයෙක් සත්‍ය ඇත්තේ වේද. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණහු විසින් බොහෝවූ මහණ බමුණන්ගේ වෙන වෙන නොයෙක් සත්‍යයෝ වෙත් නම් ඒ සියල්ල දුරුකරණ ලද්දාහුය, අතිශයින් දුරුකරණ ලද්දාහුය, හැරදමන ලද්දාහුය, වමාරන ලද්දාහුය, මුදාහරින ලද්දාහුය, නසන ලද්දාහුය, දුරලන ලද්දාහුය. ඇවැත්නි, මෙසේ මහණතෙම දුරුකරණ ලද වෙන වෙන නොයෙක් සත්‍ය ඇත්තේ වෙයි.

"ඇවැත්නි, කෙසේ නම් මහණතෙම සම්පූර්ණයෙන් දුරු කරණ ලද සෙවීම් ඇත්තේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණහුගේ කාමයන් සෙවීම නැසුණේ වේ. භවයන් සොයන්නාවූ තණ්හාව නසන ලද්දේ වෙයි. බ්‍රහ්මචරියෙසනය (සදාකාලිකය යනාදීන් ගන්නා මිථ්‍යාදෘෂ්ටිය) පහකරන ලද්දේ වෙයි. ඇවැත්නි, මෙසේ මහණතෙම සම්පූර්ණයෙන් දුරුකළ සෙවීම් ඇත්තේ වේ.

"ඇවැත්නි, කෙසේනම් මහණතෙම නොකැළඹුනු කල්පනා ඇත්තේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණහුගේ කාම කල්පනාව දුරුවූයේ වෙයි. ක්‍රොධ කල්පනාව දුරුවූයේ වෙයි. හිංසා කිරීමේ කල්පනාව දුරුවූයේ වෙයි. ඇවැත්නි, මෙසේ වනාහි මහණතෙම නොකැළඹුනු කල්පනා ඇත්තේ වේ.

"ඇවැත්නි, කෙසේ නම් මහණතෙම සංසිඳුනු කාය සංස්කාර ඇත්තේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සැප දුරුකිරීමෙන්, දුක් දුරුකිරීමෙන් කල් ඇතිවම දොම්නස් සොම්නස් දෙක නැසීමෙන් නිදුක්වූ නොසැපවූ උපෙක්ෂා සිහි දෙදෙනාගේ පිරිසිදු බව ඇති, සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි.

"ඇවැත්නි, මෙසේ මහණතෙම සංසිඳුනු කාය සංස්කාර ඇත්තේ වේ.

"ඇවැත්නි, කෙසේ නම්, මහණ තෙම හොඳින් මිදුනු සිත් ඇත්තේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුහුගේ සිත රාගයෙන් මිදුනේ වෙයි. ද්වෙෂයෙන් මිදුනේ වෙයි. මුලාවෙන් මිදුනේ වෙයි. ඇවැත්නි, මෙසේ වනාහි මහණ තෙම හොඳින් මිදුනාවූ සිත් ඇත්තේ වේ.

"ඇවැත්නි, කෙසේ නම් මහණතෙම හොඳින් මිදුනු ප්‍රඥා ඇත්තේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම 'මා විසින් රාගය නැති කරන ලදී. මුල් සිඳින ලදී. මුදුන කපාදැමූ තල්ගසක් මෙන් කරනලදී. නැතිකරන ලදී. එය නැවත නූපදින ලෙස කරන ලදීයයි දනීද, ද්වෙෂය මා විසින් නැති කරනලදී. මුල්සිඳින ලදී. මුදුන කපාදමනලද තල්ගසක්මෙන් කරන ලදී. නැති කරන ලදී. එය නැවත නූපදින ලෙස කරන ලදීයයි දනීද, මොහය මා විසින් නැතිකරන ලදී. මුල් සිඳිනලදී. මුදුන කපනලද තල් ගසක් මෙන් කරන ලදී, නැති කරන ලදී, එය නැවත නූපදින ලෙස කපන ලදීය යි දනීද. ඇවැත්නි, මෙසේ මහණ තෙම හොඳින් මිදුනු ප්‍රඥා ඇත්තේ වෙයි.

"අශෛක්ෂ ධර්ම (රහත් ඵලයට පැමිණි පුද්ගලයාගේ ධර්ම) දසයක් වෙත්. අශෛක්ෂවූ සම්‍යක්දෘෂ්ටිය, අශෛක්ෂවූ සම්‍යක් සංකල්පය, අශෛක්ෂවූ සම්‍යක් වචනය, අශෛක්ෂවූ සම්‍යක් කර්මාන්තය, අශෛක්ෂවූ සම්‍යක් ආජීවය, අශෛක්ෂවූ සම්‍යක් ව්‍යාමය, අශෛක්ෂවූ සම්‍යක් ස්මෘතිය, අශෛක්ෂවූ සම්‍යක් සමාධිය, අශෛක්ෂවූ සම්‍යක් ඥාණය, අශෛක්ෂවූ සම්‍යක් විමුක්තිය, යනමේ දසයයි.

"ඇවැත්නි, දන්නාවූ, දක්නාවූ, අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්මයෝ දසදෙන හොඳින් ප්‍රකාශ කරන ලද්දාහු වෙත්.

"යම්සේ මේ ශාසන බ්‍රහ්මචය්‍ය්‍යාව බොහෝකල් පවත්නේ වේද, චිරස්ථායී වේද, එසේ මේ ධර්මය සියල්ලන් විසින් එක්ව සජ්ජායනා (එක්ව කීම) කළ යුත්තේය. විවාදනොකළ යුත්තේය. එය බොහෝ දෙනාට හිත පිණිසද බොහෝ දෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ට වැඩ පිණිසද හිත පිණිසද සැප පිණිසද වන්නේය."

එකල්හි භාග්‍යවතුන් වහන්සේ නැගිට ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට කථාකර මෙසේ වදාළහ. ‘ශාරීපුත්‍රය, යහපත, යහපත, ශාරීපුත්‍රය, නුඹ භික්ෂූන්ට යහපත් කොට සංගීති පර්‍ය්‍යායය ප්‍රකාශ කෙළෙහියයි” (වදාළහ.) ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය ප්‍රකාශ කළහ. ශාස්තෘන් වහන්සේ එය අනුමත කළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහුද ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තාහුය.

**තිස්තුන් වැනිවූ සංගීති සූත්‍රය නිමි.**

---

## 34. දසුත්තර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ චම්පා නම් නුවර සමීපයෙහි වූ ගර්ගරා නම් පොකුණු තෙර අසළ පන්සියයක් පමණවූ මහත් භික්ෂු සංඝයා හා සමග වාසය කළාහුය. එකල්හි ආයුෂ්මත් සාරීපුත්‍ර ස්ථවිර තෙමේ “ඇවැත් මහණෙනි” කියා භික්ෂූන්ට කථාකළේය.

ඒ භික්ෂූන් වහන්සේලා “ආයුෂ්මතුන් වහන්සය”යි ආයුෂ්මත් සාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් සාරීපුත්‍ර ස්ථවිර තෙමේ මේ සූත්‍රය වදාළේය.

“සියලු දුක් කෙළවර කිරීමෙන් නිවන් ලැබීම පිණිස විෂම ලොභය ආදි සියලු බැමි සිඳින්නාවූ දසුත්තර ධර්මය හෙවත් කරුණු එකේ පටන් දසයදක්වා ඇති ධර්මය දෙශනා කරමි. ඇවැත්නි, එක ධර්මයක් බොහෝ උපකාර වන්නේය එක් ධර්මයක් වැඩිය යුත්තේය, එක් ධර්මයක් පිරිසිඳ දත යුත්තේය, එක් ධර්මයක් දුරුකට යුත්තේය, එක් ධර්මයක් පිරිහීම පිණිස පවත්නේය. එක් ධර්මයක් විශෙෂ ඵලයට පමුණුවන ස්වභාව ඇත්තේය, එක් ධර්මයක් දුකසේ අවබොධ කටයුත්තේය, එක් ධර්මයක් ඉපදවිය යුත්තේය, එක් ධර්මයක් විශෙෂයෙන් දතයුත්තේය, එක් ධර්මයක් ප්‍රත්‍යක්ෂ කටයුත්තේය.

2. “කවර නම් එක ධර්මයක් බොහෝ උපකාර ඇත්තේ වේද? කුශල ධර්මයන්හි අප්‍රමාද වීමයි, මේ එක ධර්මය බොහෝ

උපකාර වන්නේය. කවර නම් එක ධර්මයක් වැඩිය යුත්තේද? සැපයෙන් යුක්තවූ කායගතාසතිය හෙවත් ශරීරය පිළිබඳ සිහියයි. මේ එක ධර්මය වැඩිය යුත්තේය, කවර නම් එක ධර්මයක් පිරිසිඳ දතයුත්තේද? කාමාදී කෙලෙස්වලට හා උපාදාන (දැඩි ගැනීම්වලට) යන්ට හේතුවූ ස්පර්ශයයි, මේ එක ධර්මය පිරිසිඳ දතයුත්තේය. කවර නම් එක ධර්මයක් දුරුකට යුත්තේද? මමය මාගේය යන අස්මි මානයයි මේ එක ධර්මය දුරුකට යුත්තේය. කවර නම් එක ධර්මයක් පිරිහීම පිණිස පවත්නේද? නුණුවණින් කල්පනා කිරීමය. මේ එක ධර්මය පිරිහීම පිණිස පවත්නේය. කවර නම් එක ධර්මයක් විශෙෂ ඵලයට පමුණුවන ස්වභාව ඇත්තේද? නුවණින් කල්පනා කිරීමය මේ එක ධර්මය විශෙෂ ඵලයට පමුණුවන ස්වභාව ඇත්තේය. කවර නම් එක ධර්මයක් දුකසේ අවබොධ කටයුත්තේද? ආනන්තරික චිත්ත සමාධිය (විදර්ශනාවට අනතුරුව ලැබෙන මාර්ගය) යි. මේ එක ධර්මය දුකසේ අවබෝධ කටයුත්තේය, කවර නම් එක ධර්මයක් ඉපදවිය යුත්තේද? ප්‍රත්‍යවෙක්ෂණ ප්‍රඥාවයි. (මාර්ගඵලාදිය සලකා බලන නුවණයි.) මේ එක ධර්මය ඉපදවිය යුත්තේය, කවර නම් එක ධර්මයක් විශෙෂ නුවණින් දතයුත්තේද? සියලු සත්වයන් ආහාරය නිසා පවත්නා බවයි. මේ එක ධර්මය විශෙෂ නුවණින් දතයුත්තේය. කවර නම් එක ධර්මයක් ප්‍රත්‍යක්ෂ කටයුත්තේද? නොසෙල්විය හැකි චිත්ත විමුක්තියයි කියන ලද අර්හත්ඵල විමුක්තියයි මේ එක ධර්මය ප්‍රත්‍යක්ෂ කටයුත්තේය.

'මෙසේ මේ දශ ධර්මයෝ වනාහි ස්වභාව වශයෙන් පවත්නාහුය. යම්බඳුයැයි වදාරණලද නම් එබඳු ස්වභාව ඇත්තාහුමය. වදාළ ක්‍රමයෙන් අන් පරිද්දකින් නොවන්නාහුය. තථාගතයන් වහන්සේ විසින් මනාකොට අවබෝධ කරණ ලද්දාහුය.

3. "ධර්ම දෙකක් බොහෝ උපකාර වන්නාහුය, ධර්ම දෙකක් වැඩිය යුත්තාහුය, ධර්ම දෙකක් පිරිසිඳ දතයුත්තාහුය, ධර්ම දෙකක් දුරුකට යුත්තාහුය, ධර්ම දෙකක් පිරිහීම පිණිස පවත්නාහුය, ධර්ම දෙකක් විශෙෂ ඵලයට පමුණු වන්නාහුය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ධර්ම දෙකක් දුකසේ අවබෝධ කට යුත්තාහුය. ධර්ම දෙකක් ඉපදවිය යුත්තාහුය. ධර්ම දෙකක් විශෙෂ නුවණින් දතයුත්තාහුය. ධර්ම දෙකක් ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහුය, කවර නම් ධර්ම දෙකක් බොහෝ උපකාර වන්නාහුද? සිහිය හා නුවණ යන දෙකය. මේ ධර්ම දෙක බොහෝ උපකාර වන්නාහුය. කවර නම් ධර්ම දෙකක් වැඩිය යුත්තාහුද? සමථය හා විදර්ශනාව යන දෙකය. මේ ධර්ම දෙක වැඩිය යුත්තාහුය. කවර නම් ධර්ම දෙකක් පිරිසිඳ දතයුත්තාහුද? නාමය හා රූපය යන දෙකය. මේ ධර්ම දෙක පිරිසිඳ දතයුත්තාහුය. කවර නම් ධර්ම දෙකක් දුරුකට යුත්තාහුද? අවිද්‍යාව හා භව ආශාව යන දෙකය. මේ ධර්ම දෙක දුරුකට යුත්තාහුය. කවර නම් ධර්ම දෙකක් පිරිහීම පිණිස පවත්නාහුද? අකීකරු බව හා පවිටු මිත්‍රයන් ඇති බව යන දෙකය. මේ ධර්ම දෙක පිරිහීම පිණිස පවත්නාහුය. කවර නම් ධර්ම දෙකක් ගුණ විශෙෂයට පමුණුවන ස්වභාව ඇත්තාහුද? කීකරු බව හා යහපත් මිත්‍රයන් ඇති බව යන දෙකය. මේ ධර්ම දෙක විශෙෂ භාගිය හෙවත් ගුණ විශෙෂයට පමුණුවන ස්වභාව ඇත්තාහුය. කවර ධර්ම දෙකක් දුකසේ අවබොධ කටයුත්තාහුද? සත්වයන්ගේ කෙලෙසීමට හේතු ප්‍රත්‍යය හා සත්වයින්ගේ පිරිසිදු බවට හේතු ප්‍රත්‍යය යන දෙකය. මේ ධර්ම දෙක දුකසේ අවබොධ කටයුත්තාහුය. කවර නම් ධර්ම දෙකක් ඉපදවිය යුත්තාහුද? ක්ෂයඥානයද, අනුත්පාද ඥාණයද යන දෙකය. මේ ධර්ම දෙක ඉපදවිය යුත්තාහුය. කවර නම් ධර්ම දෙකක් විශෙෂ නුවණින් දතයුත්තාහුද? සංඛත ධාතුවවූ පඤ්චස්කන්ධයද අසංඛත ධාතුවවූ නිර්වාණයද යන දෙකය, මේ ධර්ම දෙක විශෙෂ නුවණින් දතයුත්තාහුය. කවර නම් ධර්ම දෙකක් ප්‍රත්‍යක්ෂ කටයුත්තාහුද? විද්‍යා තුන හා රහත්ඵලය යන දෙකය.

"මේ ධර්ම දෙක ප්‍රත්‍යක්ෂ කටයුත්තාහුය. මෙසේ මේ විසිවැදෑරුම් ධර්මයෝ වනාහි ස්වභා වශයෙන් පවත්නාහුය. යම්බඳුයයි වදාරණ ලද්දනම් එබඳු ස්වභාව ඇත්තාහුය. වදාළ ක්‍රමයෙන් අන් පරිද්දකින් නොවන්නාහුය. තථාගතයන් වහන්සේ විසින් මනාකොට අවබෝධ කරණ ලද්දාහුමය.

4. "ධර්ම තුනක් බොහෝ උපකාර වන්නාහුය ධර්ම තුනක් වැඩිය යුත්තාහුය, පිරිසිඳ දතයුතු ධර්ම තුණක් ඇත්තාහුය, දුරුකටයුතු ධර්ම තුණක් ඇත්තාහුය, පිරිහීම පිණිස පවත්නා ධර්ම තුණක් ඇත්තාහුය, විශෙෂ ඵලයට පමුණුවන ස්වභාව ඇති ධර්ම තුණක් ඇත්තාහුය, දුකසේ අවබොධ කටයුතු ධර්ම තුණක් ඇත්තාහුය. ඉපදවිය යුතු ධර්ම තුණක් ඇත්තාහුය, විශෙෂ නුවණින් දතයුතු ධර්ම තුණක් ඇත්තාහුය, ධර්ම තුණක් ප්‍රත්‍යක්ෂ කටයුත්තාහුය, කවර නම් ධර්ම තුනක් බොහෝ උපකාර වන්නාහුද? සත්පුරුෂයන්ගේ ආශ්‍රය, බණ ඇසීම ධර්මයට අනුව පිළිපැදීම යන තුණය. මේ ධර්ම තුණ බොහෝ උපකාර වන්නාහුය.

"කවර නම් ධර්ම තුණක් වැඩිය යුත්තහුද? සමාධි තුණය. (එනම්) විතර්ක විචාර සහගත (ප්‍රථමධ්‍යාන) සමාධිය, විතර්ක නැති විචාරය පමණක් ඇති (ද්විතීයධ්‍යාන) සමාධිය, විතර්ක විචාර දෙකම නැති (තෘතීය, චතුර්ථ, පඤ්චම ධ්‍යාන) සමාධිය යන තුනය, මේ ධර්ම තුණ වැඩිය යුත්තාහුය,

කවර නම් ධර්ම තුණක් පිරිසිඳ දතයුත්තාහුද? වේදනා තුනය, (එනම්) සුඛවෙදනාවය, දුක් වෙදනාවය, දුක් සැප නැති (උපෙක්ෂා) වෙදනාවය යන තුනය මේ ධර්ම තුණ පිරිසිඳ දතයුත්තාහුය.

"කවර නම් ධර්ම තුනක් දුරුකටයුත්තාහුද? තුන් වැදෑරුම් තෘෂ්ණාවය, එනම් කාමතෘෂ්ණාවය, භවතෘෂ්ණාවය, විභවතෘෂ්ණාවය යන තුනය. මේ ධර්ම තුන දුරුකට යුත්තාහුය.

"කවර නම් ධර්ම තුනක් පිරිහීම පිණිස පවත්නාහුද? අකුසල් මුල් තුණය, (එනම්) ලොභ අකුසලමූලය, දොස අකුසලමූලය, මොහ අකුසලමූලය, යන මේ ධර්ම තුන පිරිහීම පිණිස පවත්නාහුය. (අපායගාමී වන්නාහුය.)

5. "කවරනම් ධර්ම තුනක් විශෙෂ භාගී (ගුණ විශෙෂයට පමුණුවන්නෝ) වෙත්ද? කුසල් මුල් තුණය. (එනම්) අලොභ කුසලමූලය, අදොස කුසලමූලය, අමොහ කුසලමූලය යන තුනය. මේ ධර්ම තුණ විශෙෂභාගී වන්නාහුය.

"කවර නම් ධර්ම තුනක් දුකසේ අවබොධ කටයුත්තාහුද? තුන් වැදෑරුම් නිඃශරණ ධාතු (එතරවීම්) තුනය. කාමයන්ගෙන් එතෙරවීමයයි කියන ලද අනාගාමීමාර්ගය, රූපයන් ගෙන් එතරවීමයයි කියන ලද අර්හත්මාර්ගය, සියලු සංස්කාරයන්ගෙන් එතරවීමයැයි කියන ලද අර්හත්ඵලය යන මේ තුනය. මේ ධර්ම තුණ දුකසේ අවබොධ කටයුත්තාහුය.

"කවර නම් ධර්ම තුනක් ඉපදවිය යුත්තාහුද? තුන් වැදෑරුම් ඥාණයෝය, අතීත ස්කන්ධ කොටස් දන්නා නුවණය, වර්තමාන ස්කන්ධ කොටස් දන්නා නුවණය, අනාගත ස්කන්ධ කොටස් දන්නා නුවණය යන මේ ධර්මතුන ඉපදවිය යුත්තාහුය.

"කවර නම් ධර්ම තුනක් විශෙෂ නුවනින් දතයුත්තාහුද? තුන් වැදෑරුම් ධාතුහුය. කාමධාතුය, රූපධාතුය, අරූපධාතුය යන තුනය. මේ ධර්ම තුන ඉතා විශෙෂ නුවණින් දත යුත්තාහුය.

"කවර නම් ධර්ම තුනක් ප්‍රත්‍යක්ෂ කටයුත්තාහුද? තුන් වැදෑරුම් විද්‍යාවෝය. පෙර විසූ ස්කන්ධයන් දන්නා නුවණ නමැති විද්‍යාවය, සත්වයන්ගේ චුති උත්පත්ති දන්නා නුවණ නමැති විද්‍යාවය, ආශ්‍රවයන් ක්ෂය කරන නුවණ නමැති විද්‍යාවය යන තුනය. මේ ධර්ම තුන ප්‍රත්‍යක්ෂ කටයුත්තාහුය.

"මෙසේ එකාන්තයෙන් විද්‍යමානවූ ඇත්තාවූ එසේම වන්නාවූ වෙනස් නොවන්නාවූ අන් ආකාරයකින් නොවන්නාවූ මේ තිස් ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් යහපත්කොට අවබොධ කරණ ලද්දාහුමය.

**6.** "ධර්මසතරක් බොහෝ උපකාරවන්නාහුය. ධර්මසතරක් වැඩිය යුත්තාහුය. ධර්ම සතරක් පිළිසිඳ දතයුත්තාහුය. ධර්ම සතරක් පහකළ යුත්තාහුය. ධර්ම සතරක් පිරිහීම පිණිස පවත්නාහුය. ධර්ම සතරක් විශෙෂ ගුණ පිණිස පවත්නාහුය. ධර්ම සතරක් දුකසේ අවබොධ කටයුත්තාහ. ධර්ම සතරක් ඉපදවිය යුත්තාහ. ධර්ම සතරක් ප්‍රත්‍යක්ෂ කටයුත්තාහුය. කවර නම් ධර්ම සතරක් බොහෝ උපකාර වන්නාහුද? චක්‍ර හතරය (එනම්) සුදුසු ප්‍රදෙශයෙහි වාසය කිරීමය, සත්පුරුෂයන් සෙවනය

කිරීමය, තමා හොඳ මගෙහි පිහිටීමය. පෙර කළ පින් ඇති බවය යන මේ සතර ධර්මයෝ බොහෝ උපකාර වන්නාහුය.

"කවර නම් සතර ධර්මයක් වැඩිය යුත්තාහුද? සතර සතිපට්ඨාන ධර්මයෝය. එනම් ඇවැත්නි, මේ සස්නෙහි මහණ තෙමේ තම ශරීරයෙහි ශරීරය අනුව දක්නා ස්වභාව ඇතිව පඤ්චස්කන්ධයෙහි ඇලීම හා කිපීම දුරුකොට කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව යහපත් නුවණින් යුක්ත වූයේ සිහියෙන් වාසය කරයි.

"ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්යය ඇතුව, යහපත් ප්‍රඥා ඇතුව සිහියෙන් යුක්තව වේදනාවන්හි ලොභයද කරන ක්‍රොධයද සංසිඳුවාගෙන වේදනාවන්හි වේදනා අනුව දක්වා ස්වභාව ඇතිව වාසය කරයි.

ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම කෙලෙස් තවන වීර්යය ඇතුව, යහපත් ප්‍රඥාව ඇතුව, සිහියෙන් යුක්තව, සිතෙහි ලොභයද, ක්‍රොධයද සංසිඳුවාගෙන සිතෙහි සිත අනුව දක්නා ස්වභාව ඇතුව වාසය කරයි.

"ධර්මයන්හි ධර්මයන් අනුව දකින ස්වභාව ඇත්තේ පඤ්චස්කන්ධ ලොකයෙහි ලොභ දොස දෙදෙන දුරුකොට කෙලෙස් තවන වීර්යයෙන් හා හොඳ නුවණින් යුක්තව සිහි ඇතිව වාසය කරයි. මේ සතිපට්ඨාන ධර්ම සතර වැඩිය යුත්තාහුය.

"කවර නම් ධර්ම සතරක් පිරිසිඳ දතයුත්තාහුද? ඖලාරිකවූ හෝ සියුම්වූ හෝ පිඩුකොට බුදින්නාවූ කබලිඞ්කාර ආහාරයය. දෙවැනිවූ ස්පර්ශ ආහාරයය. තුන්වැනිවූ මනො සඤ්චෙතන ආහාරයය. සතරවැනිවූ විඥාන ආහාරයය යන මේ සතර ධර්මයෝ පිරිසිඳ දතයුත්තාහුය.

"කවර නම් ධර්ම සතරක් දුරු කටයුත්තාහුද? ඕඝ හෙවත් සැඩපහර සතරය. කාම ඕඝය (කාම නමැති සැඩපහර) භව ඕඝය, දෘෂ්ටි ඕඝය, අවිද්‍යාඕඝය, යන ධර්ම සතර දුරුකට යුත්තාහුය.

"කවර නම් ධර්ම සතරක් පිරිහීම පිණිස පවත්නාහුද? යෝග හතරය, කාමයෝගය, භවයෝගය, දෘෂ්ටියොගය, අවිද්‍යායෝගය යන මේ සතර ධර්මයෝ පිරිහීම පිණිස පවත්නාහුය.

7. 'කවර නම් ධර්ම සතරක් ගුණ විශෙෂයට පමුණුවන්නෝද? මිදීම් සතරය. කාමයෝගයෙන් මිදීමය, භවයෝගයෙන් මිදීමය. දෘෂ්ටියෝගයෙන් මිදීමය. අවිද්‍යායෝගයෙන් මිදීමය යන මේ සතර ධර්මයෝ ගුණ විශෙෂයට පමුණුවන ස්වභාව ඇත්තාහුය. කවර නම් ධර්ම සතරක් දුකසේ අවබොධ කටයුත්තාහුද? සමාධි (සිත එකඟකිරීම්) සතරය. හානභාගිය සමාධිය, ඨිතිභාගිය සමාධිය, විශෙෂ භාගිය සමාධිය, නිර්වෙද භාගිය සමාධිය, යන මේ සමාධි සතර දුකසේ අවබොධ කටයුත්තාහුය.'

"කවර නම් ධර්ම සතරක් ඉපදවිය යුත්තාහුද? ඥාන සතරය. ධර්මයෙහි ඤාණය (චතුස්සත්‍යය දක්නාවූ මාර්ගඥාන හා ඵල ඥාන,) අන්වයෙහි ඤාණය (චතුස්සත්‍යය දක්නාවූ ඥානය,) පරිච්ඡෙදයෙහි ඤාණය (අනුන්ගේ සිත් පිරිසිඳ දැන ගන්නා ඥානය,) සම්මුතියෙහි ඤාණය (අවශෙෂ ඥාන) යන සතරය. මේ සතර ධර්මයෝ ඉපදවිය යුත්තාහුය.

"කවර නම් ධර්ම සතරක් විශෙෂ නුවණින් දතයුත්තාහුද? සතර ආර්‍ය්‍යසත්‍යයෝය. දුක්ඛ ආර්‍ය්‍යසත්‍යය, දුක්ඛසමුදය ආර්‍ය්‍ය සත්‍යය, දුක්ඛනිරොධආර්‍ය්‍ය සත්‍යය, දුක්ඛනිරොධ ගාමිණී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය යන මේ සතරය. මේ ධර්ම සතර විශෙෂ නුවණින් දතයුත්තාහුය.

"කවර ධර්ම සතරක් අවබොධ කටයුත්තාහුද? ශ්‍රමණඵල (මහණකමෙහි ඵල) හතරය. සෝවාන්ඵලය, සකෘදාගාමි ඵලය, අනාගාමිඵලය, අර්හත්ඵලය යන සතරය. මේ සතර ඵල ධර්ම අවබොධ කටයුත්තාහුය. මෙසේ පැහැදිලිවූ සත්‍යවූ එසේම වන්නාවූ, වෙනස් නොවන්නාවූ අන් ආකාරයකින් නොවන්නාවූ මේ සතළිස් වැදැරුම් ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් මනාව අවබොධ කරණ ලද්දාහුය.

8. "ධර්ම පහක් බොහෝ උපකාර වන්නාහුය. ධර්ම පහක් පිරිසිඳ දතයුත්තාහ, ධර්ම පහක් දුරු කටයුත්තාහ, ධර්ම පහක් පිරිහෙන ස්වභාව ඇත්තාහ. ධර්ම පහක් විශෙෂ ඵලයට පමුණුවන ස්වභාව ඇත්තාහ, ධර්ම පහක් දුකසේ අවබොධ කටයුතු වන්නාහ, ධර්ම පහක් ඉපදවිය යුත්තාහ, ධර්ම පහක් විශෙෂ නුවණින් දතයුත්තාහ, ධර්ම පහක් තමාම දැකීමෙන් පැහැදිලි කටයුත්තාහුය.

"කවර නම් ධර්ම පහක් බොහෝ උපකාර වන්නාහුද? ප්‍රධානියාංග (වීර්යයකරන මහණහුගේ) අංග පසය, ඇවැත්නි, මේ සස්නෙහි මහණ තෙමේ ශ්‍රද්ධාව ඇත්තෙක් වේද? ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙනුදු අර්හත් නම්යහ. සම්‍යක්සම්බුද්ධ නම්යහ. අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයන් ගෙන් යුක්තයහ (යහපත් ගති ඇති හෙයින්) සුගත නම්යහ. (සියලු ලොව දන්නා හෙයින්) ලොකවිදූ නම්යහ. (ඉන් වැඩි උසස් කෙනෙක් නැති හෙයින්) අනුත්තර නම්යහ. (දමනය නොකට හැකි පුරුෂයන් දමනය කරන හෙයින්) පුරුෂ දම්‍ය සාරථී නම්යහ. (දෙව් මිනිසුන්ට අනුශාසනා කරන හෙයින්) ශාස්තෘ නම්යහ. (චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කළ හෙයින්) බුද්ධ නම්යහ. (රාගාදිය විනාශ කළ හෙයින්) භාග්‍යවත් නම් වන සේකැයි තථාගතයන් වහන්සේගේ සම්‍යක් සම්බොධිය අදහන්නෙක් වෙයි, ආබාධ රහිතයෙක් වෙයි, රොග රහිතයෙක් වෙයි. ඉතා සිසිල් නුවූ ඉතා උණුසුම් නුවූ, මධ්‍යමවූ, වීර්යය වැඩීමට යොග්‍යවූ සමට ආහාර දිරවන ගින්නෙන් යුක්ත වූයේ වෙයි. ශාස්තෘන් වහන්සේ කෙරෙහි හෝ නුවණැති සබ්‍රම්සරුන් (එකට වාසයකරන භික්ෂූන්) කෙරෙහි හෝ තමා පිළිබඳ කරුණු ඇතිසැටියෙන් ප්‍රකාශකරන, කපටි නොවූ රැවටිලි නැත්තෙක් වෙයි. අකුශල දුරුකිරීම පිණිසත් කුසලධර්මයන් ඉපදවීම පිණිසත් ශක්තිමත්ව බලවත් උත්සාහයෙන් යුක්තව කුසල ධර්මයෙහි අත්නොහරිනලද වීර්යය ඇතිව පටන්ගන්නාලද වීර්යය ඇත්තෙක් වෙයි. උතුම්වූ, කලකිරීම් ඇතිකරන්නාවූ, මනාකොට දුක් නැතිකිරීමට පමුණුවන්නාවූ උදයත්ථගාමිනී (ඇතිවීම හා නැතිවීම දන්නා) විදර්ශනා ප්‍රඥාවෙන් යුක්තවූවෙක්

වන්නේය. මේ පස්වැදෑරුම් ධර්මයෝ බොහෝ උපකාරවන්නාහුය.

"කවර නම් ධර්ම පසක් වැඩිය යුත්තාහුද? අංග පසකින් යුත් සම්‍යක් සමාධියය, ප්‍රීති ස්ඵරණතාවය (ප්‍රීතිය පතුරුවමින් පහළවන ප්‍රථම ද්විතී ධ්‍යාන දෙක්හි ප්‍රඥාවය) සුඛස්ඵරණ තාවය (සැප පතුරුවමින් පහලවන ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යානයන්හි ප්‍රඥාවය) චෙතස්ඵරණතාවය (පරසිත් දන්නා නුවණ) ආලොක ස්ඵරණ තාවය (දිවසැප) ප්‍රත්‍යවේක්ෂණ නිමිත්තය (සලකා බලන නුවණ) යන මේ ධර්මපස වැඩිය යුත්තාහුය.

"කවර නම් ධර්ම පසක් පිරිසිඳ දත යුත්තාහුද? උපාදාන ස්කන්ධ පසය, ඒ කවරහුද? රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය, සංස්කාර උපාදාන ස්කන්ධය, විඥාන උපාදානස්කන්ධය. මේ ධර්ම පස පිරිසිඳ දත යුත්තාහුය.

"කවර නම් ධර්ම පසක් දුරු කටයුත්තාහුද? නීවරණ ධර්ම පසය, කාමච්ඡන්ද නීවරණය, ක්‍රොධ නීවරණය, ථීනමිද්ධ නීවරණය, උද්ධච්ච කුක්කුච්ච නීවරණය, විචිකිච්ඡා නීවරණය යන මේ ධර්ම පස දුරු කටයුත්තාහ.

"කවර නම් ධර්ම පසක් පිරිහීම පිණිස වන්නාහුද, පස්වැදෑරුම් චේතොඛිල (සිතෙහි නැනෙන උල් වැනි) ධර්මයෝයි.

"ඇවැත්නි, මේ සස්නෙහි මහණ තෙමේ ශාස්තෲන් වහන්සේ කෙරෙහි සැක කෙරේද කුකුස් උපදවාද නිශ්චය නොකෙරේද නොපහදීද බැසනොගනීද ඇවැත්නි, යම් භික්ෂුවක් ශාස්තෲන්වහන්සේ කෙරෙහි සැක කෙරේද, කුකුස් උපදවාද, නිශ්චය නොකෙරේද, නොපහදීද, බැසනොගනීද ඔහුගේ සිත කෙලෙස් තැවීම පිණිස, (භාවනාවෙහි) නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්යය කිරීම පිණිස උතුම් වීර්යය පිණිස නොනැමෙන්නේය. යමෙකුගේ කෙලෙස් තැවීම පිණිස (භාවනාවෙහි) නැවත නැවත යෙදීම පිණිස, නිතර කිරීමෙන්

උතුම් වීර්යය පිණිස සිත නොනැමෙන්නේ වේද මේ පළමුවෙනි චෙතොඛිලය (සිතෙහි ඇනී තිබෙනඋල)යි.

"ඇවැත්නි, නැවතද භික්ෂු තෙමේ ධර්මයෙහි සැක කෙරේද කුකුස් උපදවාද, නිශ්චය නොකෙරේද, නොපහදීද, බැස නොගනීද ඔහුගේ සිත කෙලෙස් තැවීම පිණිස, (භාවනාවෙහි) නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්යය කිරීම පිණිස, උතුම් පිණිස නොනැමෙන්නේය. යමෙකුගේ කෙලෙස් තැවීම පිණිස (භාවනාවෙහි) නැවත නැවත යෙදීම පිණිස, නිතර වීයසීකිරීම පිණිස, සිත නොනැමෙන්නේ වේද, මේ දෙවන චෙතොඛිලය වන්නේය.

"සංඝයා කෙරෙහි සැක කෙරේද, කුකුස් උපදවාද, නිශ්චය නොකෙරේද, නොපහදීද, බැසනොගනීද ඔහුගේ සිත කෙලෙස් තැවීම පිණිස, (භාවනාවෙහි) නැවත නැවත යෙදීම පිණිස, නිතර වීයසී කිරීම පිණිස, උතුම් වීයසී පිණිස සිත නොනැමෙන්නේය. යමෙකුගේ කෙලෙස් තැවීම පිණිස, (භාවනාවෙහි) නැවත නැවත යෙදීම පිණිස, නිතර වීයසීය පිණිස සිත නොනැමෙන්නේද මේ තුන්වන චෙතොඛීලය වන්නේය.

ශික්ෂාවෙහි සැක කෙරේද, කුකුස් කෙරේද, නිශ්චය නොකෙරේද, නොපහදීද, ඔහුගේ සිත කෙලෙස් තැවීම පිණිස, නිතර වීයසී කිරීම පිණිස, උතුම් වීයසීය පිණිස නොනැමෙන්නේය, යමෙකුගේ කෙලෙස් තැවීම පිණිස (භාවනාවෙහි) නැවත නැවත යෙදීම පිණිස, නිතර වීයසීය කිරීම පිණිස, උතුම් වීයසීය පිණිස සිත නොනැමෙන්නේද මේ සතරවන චෙතොඛිලයයි.

"සබ්‍රම්සරුන් (එකට වසන භික්ෂූන්) කෙරෙහි කිපි සිත් ඇත්තේ, නොසතුටු සිත් ඇත්තේ වේද, උල් වැනි සිත් ඇත්තේද ක්‍රොධයෙන් යුත් සිත් ඇත්තේ ඔහුගේ සිත කෙලෙස් තැවීම පිණිස, (භාවනාවෙහි) නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්යය කිරීම පිණිස, උතුම් වීර්යය පිණිස නොනැමේද මේ පස්වෙනි චේතොඛීලයයි. මේ ධර්ම පස පිරිහීම පිණිස පවත්නාහුය.

"කවර නම් ධර්ම පසක් විශෙෂ ගුණය පිණිස පවත්නාහුද? ඉන්ද්‍රිය පසය. ශ්‍රද්ධා ඉන්ද්‍රිය, වීර්යය ඉන්ද්‍රිය, සති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, ප්‍රඥා ඉන්ද්‍රිය යන මේ ධර්ම පස විශෙෂ ගුණයට පැමිණීම පිණිස වන්නාහුය.

"කවර නම් ධර්ම පසක් දුකසේ අවබොධ කටයුත්තාහුද? පස්වැදෑරුම් නිස්සරණිය (නික්මීම්) ධාතුහුය. ඇවැත්නි, මේ ලෝකයෙහි කාමයන් මෙනෙහි කරන්නාවූ භික්ෂුහුගේ සිත ඒ කාමයන්හි පෙරටුව ගමන් නොකරන්නේද, නොපහදින්නේද, රඳා නොසිටින්නේද, නොබැසගන්නේද, නෛෂ්ක්‍රම්‍යය (කාමයෙන් වෙන්වූ ධ්‍යානය) මෙනෙහි කරන්නාවූ භික්ෂුහුගේ සිත නෛෂ්ක්‍රම්‍යයෙහි පෙරටුව ගමන්කරන්නේද, පහදින්නේද, රඳා සිටින්නේද, බැසගන්නේද, ඔහුගේ ඒ සිත යහපත් අරමුණට පැමිණියේය. මනාව වඩන ලද්දේය. මනාව නැගීසිටියේය. කාමයන්ගෙන් මනාව මිදුනේ වෙන්වූයේ කාමයන් හේතුකොටගෙන දුක්සහිතවූ දැවිලි සහිතවූ යම්බඳු කෙලෙස් කෙනෙක් උපදිත්ද ඒ භික්ෂු තෙමේ ඒ කාමයන්ගෙන් මිදුනේවේ. හෙතෙමේ ඒ වේදනාව නොවිඳින්නේය. මෙය නිස්සරණය (එතරවීම) යයි කියනු ලැබේ.

"ඇවැත්නි, නැවතද ව්‍යාපාදය (ක්‍රොධය) මෙනෙහි කරන්නාවූ භික්ෂුහට ව්‍යාපාදයෙහි සිත පෙරටුව ගමන් නොකරන්නේද, නොපහදින්නේද, රඳා නොසිටින්නේද, නොබැසගන්නේනේද, අව්‍යාපාදය (මෛත්‍රී ධ්‍යානය) මෙනෙහි කරන්නාවූ ඔහුගේ සිත අව්‍යාපාදයෙහි පෙරටුව යන්නේද, පහදින්නේද, රඳා සිටින්නේද, බැසගන්නේද ඔහුගේ ඒ සිත යහපත් අරමුණට පැමිණියේය. මනාව වඩන ලද්දේය. ව්‍යාපාදයෙන් මනාව නැගිටියේය. මනාව මිදෙන ලද්දේ ව්‍යාපාදයෙන් වෙන් වූයේය. ව්‍යාපාදය හේතුකොටගෙන දුක් සහිතවූ දැවීම් සහිතවූ යම්බඳු කෙලෙස් කෙනෙක් උපදිත්ද හෙතෙමේ ඒ ක්ලෙශයන්ගෙන් මිදුනේ වේ. හෙතෙමේ ඒ වේදනාව නොවිඳින්නේ වේ. මෙය ව්‍යාපාදයාගේ නිස්සරණය (එතර වීම) යයි කියන ලද්දේය.

"ඇවැත්නි, නැවතද විහේසය (හිංසා කිරීම) මෙනෙහි කරන්නාවූ භික්ෂුවහට විහේසය පිණිස සිත පෙරටුව ගමන් නොකරන්නේද. නොපහදින්නේද. රඳා නොසිටින්නේද. බැසනොගන්නේද. අවිහේසය (කරුණාධ්‍යානය) වනාහි මෙනෙහි කරන්නාවූ ඔහුගේ සිත අවිහේසය පිණිස පෙරටුව ගමන්කරන්නේද. පහදින්නේද, රඳාසිටින්නේද, මිදෙන්නේද, ඔහුගේ ඒ සිත යහපත් අරමුණට පැමිණියේය. වඩන ලද්දේය. මනාව නැගී සිටියේය. විහේසයෙන් මිදුනේ විහේසයෙන් වෙන් වූයේ වෙයි. විහේසය හේතුකොට ගෙන දුක් සහිතවූ දැවීම් සහිතවූ යම්බඳු කෙලෙස් කෙනෙක් උපදිත්ද හෙතෙමේ ඒ කෙලෙසුන්ගෙන් මිදුනේවේ. හෙතෙමේ ඒ කෙලෙසුන්ගෙන් මිදුනේවේ. හෙතෙමේ එම වේදනාව නොවිඳින්නේ වේ. මේ විහේසයාගේ නිස්සරණයයි කියන ලද්දේය.

"ඇවැත්නි, නැවතද රූපය මෙනෙහි කරන්නාවූ භික්ෂුවහට රූපයන්හි සිත පෙරටුව ගමන් නොකරන්නේද, නොපහදින්නේද, රඳා නොසිටින්නේද, නොබැසගන්නේද, අරූප ධ්‍යානය මෙනෙහිකරන්නාවූ ඔහුට වනාහි අරූපයෙහි සිත පෙරටුව යන්නේද, පහදින්නේද, රඳා සිටින්නේද, බැසගන්නේද, ඔහුගේ ඒ සිත යහපත් අරමුණට පැමිණියේ මනාව වඩනා ලද්දේය. මනාව නැඟී සිටියේය, රූපයන්ගෙන් මනාව මිදුනේ වෙයි, වෙන්වූයේ වෙයි, රූපය හේතුකොටගෙන දුක් සහිතවූ දැවීම් සහිතවූ යම් ඒ කෙලෙස් කෙනෙක් උපදිත්ද හෙතෙමේ ඒ කෙලෙසුන්ගෙන් මිදුණේවේ, ඒ වේදනාව නොවිඳින්නේය, මෙය රූපයන්ගේ නිස්සරණයයි කියන ලද්දේය.

"ඇවැත්නි, නැවතද උපාදානස්කන්ධ පස මෙනෙහි කරන්නාවූ භික්ෂුවගේ සිත උපාදානස්කන්ධයෙහි පෙරටුව නොයන්නේද, නොපහදින්නේද, රඳා නොසිටින්නේද, අර්හත්ඵල සමාධිය මෙනෙහි කරන්නාවූ ඔහුගේ සිත උපාදානස්කන්ධ නිරෝධයෙහි පෙරටුව යන්නේද, පහදින්නේද, රඳා සිටින්නේද, බැසගන්නේද, ඔහුගේ ඒ සිත යහපත් අරමුණට පැමිණියේය, මනාව වඩන ලද්දේය, මනාව නැගී සිටියේය, උපාදානස්කන්ධ පඤ්චකයෙන් මනාව මිදෙන ලද්දේ වෙන්වන

ලද්දේය. උපාදානස්කන්ධ පස හේතුකොටගෙන දුක් සහිතවූ දැවිලි සහිතවූ යම් කෙලෙස් කෙනෙක් උපදිත්ද හෙතෙමේ ඔවුන්ගෙන් මිදුනේ වේ. හෙතෙමේ ඒ වේදනාව නොවිඳින්නේය. මේ උපාදානස්කන්ධ පඤ්චකයාගේ නිස්සරණය (එතර වීම) යයි කියන ලද්දේය. මේ ධර්ම පස දුකසේ අවබෝධ කටයුත්තාහුය.

**9.** "කවර නම් ධර්ම පසක් ඉපදවිය යුත්තාහුද? පඤ්චඥානික සම්‍යක් සමාධියය. (ඥාන පසක් ඇති සම්‍යක් සමාධිය) මේ සමාධිය මේ ආත්මයෙහි සැපද මතු සැප විපාකද ඇත්තේ තමා තුළම ඥානය (දැනීම) ඇති වෙයි. මේ සමාධිය (කෙලෙස් වලින් දුරුවූ හෙයින්) ආර්‍ය්‍යයයිද තණ්හාවෙන් දුරුවූ හෙයින් යයි නිරාමිෂයයිද තමා තුළම දැනීම ඇතිවෙයි. මේ සමාධිය උතුම් පුරුෂයන් විසින් සේවනයකරන ලද්දේයයි තමන් තුළම දැනීම ඇති වෙයි, මේ සමාධිය සාන්තය, ප්‍රණීතය, සංසිඳීමෙන් ලබන ලද්දේය. එකඟබවෙන් ලබන ලද්දේය. උත්සාහයෙන් නිග්‍රහකොට ක්ලෙශයන් වළක්වා ලබන ලද්දක් නොවේ යයි තමා තුළම දැනීම ඇතිවෙයි. ඒ මම වනාහි මේ සමාධියට සිහි ඇත්තේම සමවදිමි. සිහි ඇත්තේම එයින් නැගිටිමියි තමන් තුළම දැනීම ඇතිවෙයි. මේ ධර්ම පස ඉපදවිය යුත්තාහ.

"කවර නම් ධර්ම පසක් යහපත් නුවණින් දතයුත්තාහුද? පස්වැදෑරුම් විමුක්ත්‍යායතනයෝය (මිදීමේ හෙතුය.) ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුහට ශාස්තෲන් වහන්සේ හෝ ගරු තන්හි සිටියාවූ තෙරුන් වහන්සේ කෙනෙක් හෝ ධර්මය දෙශනා කරත්ද ඇවැත්නි, යම් යම් ආකාරයකින් භික්ෂුහට ශාස්තෲන්වහන්සේ හෝ ගරු තන්හි සිටියාවූ එක්තරා තෙර කෙනෙක් හෝ ධර්මය දෙශනා කරත්ද හෙතෙම ඒ ඒ ආකාරයෙන් ඒ ධර්මයෙහි අර්ථය දැන ගන්නේ වෙයිද, දෙශනා පාළිය දැන ගන්නේ වෙයිද අර්ථය දන්නාවූද දෙශනා පාළිය දන්නාවූද ඔහුට සතුට උපදියි. හටගත් සතුට ඇත්තහුට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ නාමකය සංසිඳෙයි. සංසිඳුනු නාමකය ඇත්තේ සැපය විඳියි, සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි, මේ පළමුවන විමුත්තයාතනය (මිදීමේ) හෙතුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, භික්ෂුහට ශාස්තෘන් වහන්සේ හෝ ගරු තන්හි සිටියාවූ තෙරුන් වහන්සේ කෙනෙක් හෝ ධර්මය දෙශනා නොකරත්. එහෙත් හෙතෙම ඇසූ පරිදි, දැනගත් පරිදි, ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනා කරයි.

"ඇවැත්නි, යම් යම් පරිද්දෙකින් භික්ෂු තෙම ඇසූ පරිදි දැනගත් පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනා කෙරේද ඒ ඒ පරිද්දෙන් හෙතෙම ඒ ධර්මයෙහි අර්ථය දැන ගන්නේත් වෙයි. දෙශනා පාළිය දැනගන්නේත් වෙයි. අර්ථය දැනගත්තාවූ දෙශනා පාළිය දැනගත්තාවූ ඔහුට සතුට උපදියි. සතුටු වූවහුට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ නාමකය සංසිඳෙයි. සංසිඳුනු නාමකය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි. මේ දෙවන විමුත්තායතනය (මිදීමේ) හේතුව යි.

"නැවත අනිකක්ද කියමි, ඇවැත්නි, භික්ෂුහට ශාස්තෘන් වහන්සේ හෝ ගරු තන්හි සිටියාවූ එක්තරා තෙර කෙනෙක් හෝ ධර්මය දෙශනාද නොකරත්, ඇසූ පරිදි උගත් පරිදි හෙතෙම ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනාද නොකරයි. එහෙත් ඇසූ පරිදි, උගත් පරිදි ධර්මය විස්තර වශයෙන් සජ්ඣායනා කරයි (නැවත නැවත කියයි.)

**10.** "ඇවැත්නි, යම් යම් පරිද්දකින් මහණ තෙම ඇසූ පරිදි ධර්මය විස්තරවශයෙන් සජ්ඣායනා කරයිද ඒ ඒ පරිද්දෙන් හෙතෙම ඒ ධර්මයෙහි අර්ථය දැනගත්තේද, දෙශනා පාළිය දැන ගත්තේද වෙයි. අර්ථය දැනගත්තාවූද, දෙශනා පාළිය දැන ගත්තාවූද ඔහුට සතුට උපදියි. සතුටුවූවහුට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ නාමකය සංසිඳෙයි, සංසිඳුනු නාමකය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි. මේ තුන්වෙනි විමුත්තායතනය (මිදීමේ හෙතුව) යි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, භික්ෂුහට ශාස්තෘන් වහන්සේ හෝ ගරු තන්හි සිටියාවූ කිසියම් තෙර කෙනෙක් හෝ ධර්මදෙශනාද නොකරත්. ඒ භික්ෂුව ඇසූ පරිදි උගත් පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනාද නොකරයි. ඇසූ පරිදි උගත් පරිදි ධර්මය විස්තර වශයෙන් සජ්ඣායනාද නොකරයි. එහෙත් ඇසූ පරිදි, උගත් පරිදි, ධර්මය සිතින් කල්පනා

කරයි. විමසා බලයි, සලකා බලයි. ඇවැත්නි, යම් යම් පරිද්දෙකින් මහණතෙම ඇසූ පරිදි, උගත් පරිදි ධර්මය සිතින් කල්පනා කෙරේද විමසා බලාද, සලකා බලාද, ඒ ඒ පරිද්දෙන් හෙතෙම ඒ ධර්මයෙහි අර්ථය දැන ගත්තේද, දෙශනා පාළිය දැන ගත්තේද වෙයි, අර්ථය දැනගත්තාවූද, දෙශනා පාළිය දැනගත්තාවූද ඔහුට සතුට උපදියි. සතුටුවූවහුට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ නාමකය සංසිඳෙයි. සංසිඳුනු නාමකය ඇත්තේ සැපය විඳියි, සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි, මේ සතරවන විමුත්තායතනයයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, භික්ෂුහට ශාස්තෘන් වහන්සේ හෝ ගරුතන්හි සිටියාවූ කිසියම් තෙරුන්වහන්සේ කෙනෙක් හෝ ධර්මය දෙශනාද නොකරත්. ඒ භික්ෂුව ඇසූ පරිදි, උගත් පරිදි, ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනාද නොකරයි. ඇසූපරිදි, උගත්පරිදි, ධර්මය විස්තර වශයෙන් සජ්ජායනාද නොකරයි, ඇසූපරිදි උගත්පරිදි, ධර්මය සිතින් කල්පනාද නොකරයි. විමසාද නොබලයි, සලකාද නොබලයි. එහෙත් ඔහු විසින් එක්තරා සමාධිනිමිත්තක් (අටතිස් අරමුණුවලින් ලැබූ එක්තරා සමාධියක්) යහපත්ව ඉගෙනගන්නා ලද්දේද, යහපත්ව මෙනෙහි කරන ලද්දේද, යහපත්ව සිතින් දරණ ලද්දේද නුවණින් ප්‍රත්‍යක්ෂ කරන ලද්දේද වෙයි.

"ඇවැත්නි, යම් යම් පරිද්දකින් ඔහු විසින් එක්තරා සමාධි නිමිත්තක් හොඳින් උගන්නා ලද්දේ, හොඳින් මෙනෙහි කරන ලද්දේ, හොඳින් සලකා බලන ලද්දේ, ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වේද, ඒ ඒ පරිද්දෙන් හෙතෙම ඒ ධර්මයෙහි අර්ථය දැනගත්තේද දෙශනා පාළිය දැනගත්තේද වෙයි. අර්ථය දැනගත්තාවූද, දෙශනා පාළිය දැනගත්තාවූද, ඔහුට සතුටඋපදියි, සතුටුවූවහුට ප්‍රීතිය උපදියි, ප්‍රීතිසිත් ඇත්තහුගේ නාමකය සංසිඳේ, සංසිඳුණු නාම කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟවෙයි. මේ පස්වන විමුත්තායතනයයි. මේ ධර්ම පස විශෙෂ නුවණින් දත යුත්තාහුය.

"කවර නම් ධර්ම පසක් තමාම දැනීමෙන් ප්‍රත්‍යක්ෂ කටයුත්තාහුද? පස්වැදෑරුම් ධර්මස්කන්ධයෝය. ශීලස්කන්ධය,

සමාධිස්කන්ධය, ප්‍රඥාස්කන්ධය, විමුක්තිස්කන්ධය (ඵලඥාන,) විමුක්තිඥානදර්ශනස්කන්ධය (ප්‍රත්‍යවෙක්ෂා ඥාන) යන පසය, මේ ධර්ම පස තමාම දැකීමෙන් ප්‍රත්‍යක්ෂ කටයුත්තාහුය. මෙසේ මේ විද්‍යාමානවූ සත්‍යවූ එසේම වන්නාවූ වෙනස් නොවන්නාවූ අන් පරිද්දකින් නොවන්නාවූ ධර්ම පණසස තථාගතයන් වහන්සේ විසින් මනාව අවබොධකරණ ලද්දාහුය.

11. 'ධර්ම සයක් බොහෝ උපකාර වන්නාහුය. ධර්ම සයක් වැඩිය යුත්තාහ, ධර්ම සයක් පිරිසිඳ දතයුත්තාහ, ධර්ම සයක් දුරුකටයුත්තාහ. ධර්ම සයක් පිරිහීමට පමුණුවන ස්වභාව ඇත්තාහ. ධර්ම සයක් ගුණ විශෙෂයට පමුණුවන ස්වභාව ඇත්තාහ. ධර්ම සයක් දුකසේ අවබොධ කටයුතු වන්නාහ. ධර්ම සයක් ඉපදවිය යුත්තාහ. ධර්ම සයක් විශෙෂ නුවණින් දත යුත්තාහ. ධර්ම සයක් තමාම දැකීමෙන් ප්‍රත්‍යක්ෂ කටයුතු වන්නාහුය.

"කවර නම් ධර්ම සයක් බොහෝ උපකාර වන්නාහුද? සාරණීය ධර්ම සයයි. සාරණීය ධර්මයෝ (සිහි කටයුතු ධර්ම) සදෙනෙක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණහු විසින් මෛත්‍රිසහගත කායකර්මය, (කයින් කරන ක්‍රියා) එක්ව බ්‍රහ්මචය්‍ය්‍යාවෙහි හැසිරෙන භික්ෂූන්ගේ ඉදිරියේද නොඉදිරියේද පවත්වන ලද්දේ වෙයිද, ප්‍රිය කරන්නාවූ ගරු කරන්නාවූ සිහි කටයුතුවූ මේ ධර්මයද සංග්‍රහය පිණිසද විවාද නොකිරීම පිණිසද නොවෙහෙසීම පිණිසද සමගිය පිණිසද, එක්වීම පිණිසද පවතියි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, භික්ෂූහු විසින් මෛත්‍රීසහගත වාක්කර්මය, (වචන) එක්ව බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන භික්ෂූන්ගේ ඉදිරියෙහිද නොඉදිරියේද පවත්වන ලද්දේ වෙයි, සිහිකටයුතුවූ ප්‍රිය කරන්නාවූ, ගරු කරන්නාවූ, මේ ධර්මයද සංග්‍රහය පිණිසද විවාද නොකිරීම පිණිසද නොවෙහෙසීම පිණිසද සමගිය පිණිසද එක්වීම පිණිසද පවතී.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුව විසින් මෛත්‍රී සහගත මනොකර්මය, (සිතන සිතිවිලි) එක්ව බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන භික්ෂූන්ගේ ඉදිරියෙහිද නොඉදිරියේද පවත්වන ලද්දේ වෙයිද ප්‍රියකරන්නාවූද ගරු

කරන්නාවූ සිහි කටයුතුවූ මේ ධර්මයද සංග්‍රහය පිණිසද විවාද නොකිරීම පිණිසද නොවෙහෙසීම පිණිසද සමගිය පිණිසද එක්වීම පිණිසද පවතී.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, භික්ෂුවට ධාර්මිකවූ, දැහැමින් ලැබුණු යටත්පිරිසෙයින් පාත්‍රයට ලැබුණාවූද යම් ඒ ලාභයෝ වෙත්ද, ඒ භික්ෂුව එබඳු ලාභ, එක්ව මහණදම් පුරණ සිල්වතුන් සමග බෙදා නොගෙන නොවළඳන්නෙක්, බෙදා සාධාරණකොට වළඳන්නෙක් වන්නේද සිහිකටයුතුවූ, ප්‍රිය කරන්නාවූ, ගරු කරන්නාවූ මේ ධර්මයද සංග්‍රහය පිණිසද අවිවාදය පිණිසද අවිහිංසාව පිණිසද සමගිය පිණිසද එක්වීම පිණිසද පවතියි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම කඩනොවූ සිදුරු නොවූ කබර නොවූ කැලැල් නොවූ තණ්හා දාස බැවින් මිදුනාවූ, නුවණැත්තන් විසින් පසස්නා ලද්දාවූ, තෘෂ්ණාදියෙන් නොබැඳුණු සමාධිය පිණිස පවත්නාවූ යම් මේ සීලයෝවෙත්ද එබඳු සීලයන්හි, එකට මහණදම් පුරණ භික්ෂූන් ඉදිරියෙහිද නොඉදිරියෙහිද සීලයෙන් සමාන බවට පැමිණ වාසය කරයිද ප්‍රිය කරන්නාවූ ගරු කරන්නාවූ සිහිකටයුතුවූ මේ ධර්මය ද සංග්‍රහය පිණිසද විවාද නොකිරීම පිණිසද නොවෙහෙසීම පිණිසද සමගිය පිණිසද එක්වීම පිණිසද පවතී.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණතෙම උතුම්වූද නිවණට පමුණුවන්නාවූද ඊට අනුව පිළිපදින්නහුගේ යහපත්ව දුක් නැතිකිරීම පිණිස පවත්නාවූද යම් ඒ දෘෂ්ටියක් ඇත්තීද, එබඳු දෘෂ්ටියෙන්, එකට මහණදම් පුරණ භික්ෂූන් ඉදිරියෙහිද නොඉදිරියෙහිද දෘෂ්ටි සාමාන්‍යයට (දෘෂ්ටියෙන් සම බවට) පැමිණ වාසය කරයිද ප්‍රිය කරන්නාවූ ගරු කරන්නාවූ සිහිකටයුතුවූ මේ ධර්මයද සංග්‍රහය පිණිසද අවිවාදය පිණිසද අවිහිංසාව පිණිසද සමගිය පිණිසද එක්වීම පිණිසද පවතියි.

12. "කවර නම් ධර්ම සයක් වැඩිය යුත්තාහුද? ෂට් අනුස්මෘති කරුණු වන්නාහුය. බුද්ධානුස්මෘතිය (බුදු ගුණ සිහි කිරීම,) ධර්මානුස්මෘතිය (දහම් ගුණ සිහිකිරීම,) සංඝානුස්මෘතිය

(සඞ්ඝ ගුණ සිහිකිරීම,) සීලානුස්මෘතිය (සීලය සිහිකිරීම,) ත්‍යාගානුස්මෘතිය (දානය සිහිකිරීම.) දෙවතානුස්මෘතිය (දෙවියන් සාක්ෂියටගෙන ගුණ සිහිකිරීම) (යන සයය) මේ ධර්ම සය වැඩිය යුත්තාහුය.

"කවර නම් ධර්ම සයක් පිරිසිඳ දතයුත්තාහුද? ආද්ධ්‍යාත්මික (තමා පිළිබඳ) ආයතන සයයි. චක්ෂු ආයතනය, ශ්‍රොත ආයතනය, ඝ්‍රාණ ආයතනය, ජිව්හා ආයතනය, කාය ආයතනය, මනස් ආයතනය යන සයය. මේ ධර්මය පිරිසිඳ දතයුත්තාහුය.

"කවර නම් ධර්මසයක් දුරු කටයුත්තාහුද? තෘෂ්ණා සමූහ සයය. රූප තෘෂ්ණාවය, ශබ්ද තෘෂ්ණාවය, ගන්ධ තෘෂ්ණාවය රසතෘෂ්ණාවය, ස්පර්ශ තෘෂ්ණාවය, ධර්ම තෘෂ්ණාවය, මේ ධර්ම සය දුරු කට යුත්තාහුය.

"කවර නම් ධර්ම සයක් හානභාගිය (පිරිහීමට පමුණුවන) ස්වභාව ඇත්තාහුද අගෞරව සයයි. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි උඩඟුව ගෞරව නැතිව වාසය කරයි. ධර්මය කෙරෙහි උඩඟුව ගෞරව නැතිව වාසය කරයි. සංඝයා කෙරෙහි උඩඟුව ගෞරව නැතිව වාසය කරයි. ශික්ෂාවෙහි උඩඟුව ගෞරව නැතිව වාසය කරයි. අප්‍රමාදයෙහි උඩඟුව ගෞරව නැතිව වාසය කරයි. ආමිස ධම්ම යන දෙවැදෑරුම් පටිසන්ථාරයෙහි උඩඟුව ගෞරව නැතිව වාසය කරයි යන මේ සය පිරිහීම පිණිස පවත්නාහ.

"කවර නම් ධර්ම සයක් විශෙෂ භාගිය (ගුණ විශෙෂයට පමුණුවන) ස්වභාව ඇත්තාහුද? ගෞරව කිරීම් සයයි. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි යටහත් පැවතුම් ඇත්තේ ගෞරව සහිතව වාසය කරයි. ධර්මයෙහි යටහත් පැවතුම් ඇත්තේ ගෞරව සහිතව වාසය කරයි. සංඝයා කෙරෙහි යටහත් පැවතුම් ඇත්තේ ගෞරව සහිතව වාසය කරයි. ශික්ෂාවෙහි යටහත් පැවතුම් ඇත්තේ ගෞරව සහිතව වාසය කරයි. අප්‍රමාදයෙහි යටහත් පැවතුම් ඇත්තේ ගෞරව සහිතව වාසය කරයි. ආමිස ධම්ම යන දෙවැදෑරුම් පටිසන්ථාරයෙහි යටහත් පැවතුම් ඇත්තේ ගෞරව

සහිතව වාසය කරයි. යන මේ ධර්ම සය විශෙෂ භාගිය වන්නාහුය.

13. "කවර නම් ධර්ම සයක් දුකසේ ප්‍රතිවෙධ කටයුත්තාහුද? නිස්සරණීය ධාතු සයය. මේ ශාසනයෙහි මහණ තෙම මෙසේ කියන්නේය ඇවැත්නි, මෛත්‍රීසමාධිය වනාහි මා විසින් වඩනලදී. බොහෝසේ වඩනලදී. නැවත නැවත වඩනලදී. වස්තු වශයෙන් කරණලදී, අනුව පවතිනලදී, පුරුදුකරණ ලදී, හොඳින් පටන්ගන්නා ලදී, එතකුදු වුවත්, ක්‍රොධය මාගේ සිත හාත්පසින් මැඩගෙන සිටීයයි (කියයි.) එසේ නොකියවයි ඔහුට කියයුතු වන්නේය. ආයුෂ්මත් තෙමේ මෙසේ නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් කීම සුදුසු නොවේ. භාග්‍යවතුන් වහන්සේ වනාහි මෙසේ නොවදාරන්නාහ. ඇවැත්නි, වඩන ලද්දාවූද, බොහෝසේ වඩන ලද්දාවූද, නැවත නැවත වඩන ලද්දාවූද, වස්තු වශයෙන් කරණ ලද්දාවූද, ඒ අනුව හැසිරෙන ලද්දාවූද, පුරුදු කරණ ලද්දාවූද, හොඳින් පටන්ගන්නා ලද්දාවූද, මෛත්‍රී සමාධිය ඇති කල්හි ඔහුගේ හිත ක්‍රෝධය විසින් හාත්පසින් මැඩගෙන සිටිනු ලැබේ යන යම් කාරණයක් වේනම් එය නොසිදුවිය හැක්කකි. එසේ වන්නට අවකාශයක් නැත. ඇවැත්නි, යම් මේ මෛත්‍රී සමාධියක් වේද, මෙය ක්‍රොධයාගේ නිස්සරණය වේ. (ක්‍රොධයෙන් මිදීම වෙයි.)

"ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම මෙසේ කියන්නේය. ඇවැත්නි, කරුණා සමාධිය වනාහි මා විසින් වඩන ලදී, බොහෝසේ වඩන ලදී, නැවත නැවත වඩන ලදී. වස්තු වශයෙන් කරණලදී, ඒ අනුව හැසිරෙනලදී, පුරුදු කරනලදී, හොඳින් පටන්ගන්නාලදී, එතකුදුවත් මාගේ සිත විහෙසය (හිංසාකිරීමේ කැමැත්ත) හාත්පස මැඩගෙන සිටියයි (කියයි.)

"මෙසේ නොකියවයි ඔහුට කියයුතු වන්නේය. ආයුෂ්මත් තෙමේ මෙසේ නොකියවා, භාග්‍යවතුන් වහන්සේට දොස් නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් කීම නොමැනවි. භාග්‍යවතුන් වහන්සේ වනාහි මෙසේ නොවදාරන්නාහ.

"ඇවැත්නි, වඩන ලද්දාවූද, බොහෝසේ වඩන ලද්දාවූද, නැවත නැවත වඩන ලද්දාවූද, වස්තු වශයෙන් කරණ ලද්දාවූද, ඒ අනුව හැසිරෙන ලද්දාවූද, පුරුදු කරණ ලද්දාවූද හොඳින් පටන්ගන්නා ලද්දාවූද කරුණා සමාධිය ඇතිකල්හි ඔහුගේ සිත විහෙසය (හිංසා කිරීමේ කැමැත්ත) හාත්පස මැඩගෙන සිටින්නේය යන යම් කාරණයක් වේ නම් එය නොසිදුවිය හැක්කකි. ඇවැත්නි, කරුණා හිත වනාහි විහෙසයාගේ නිස්සරණයමැයි, (හිංසා කිරීමෙන් මිදීමයි.)

"ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම මෙසේ කියන්නේය. ඇවැත්නි, මා විසින් මුදිතා සමාධිය වඩනලදී, බොහෝ සේ වඩනලදි, නැවත නැවත වඩනලදී, වස්තු වශයෙන් කරණ ලදී. ඒ අනුව හැසිරෙනලදී, පුරුදු කරණලදී, හොඳින් පටන් ගන්නා ලදී, එතකුදු වුවත්, අරතිය (නොඇල්ම) මාගේ සිත හාත්පස මැඩගෙන සිටීයයි (කියයි) එසේ නොකියවයි ඔහුට කිය යුතු වන්නේය. ආයුෂ්මත් තෙමේ මෙසේ නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් කීම නොමැනවි. භාග්‍යවතුන් වහන්සේ වනාහි මෙසේ නොවදාරන්නාහ.

"ඇවැත්නි, වඩන ලද්දාවූද, බොහෝසේ වඩන ලද්දාවූද, නැවත නැවත වඩන ලද්දාවූද, වස්තු වශයෙන් කරණ ලද්දාවූද, ඒ අනුව හැසිරෙන ලද්දාවූද, පුරුදුකරණ ලද්දාවූද, හොඳින් පටන්ගන්නා ලද්දාවූද මුදිතා සමාධිය ඇති කල්හි අරතිය ඔහුගේ සිත හාත්පස මැඩගෙන සිටින්නේය යන කාරණයක් වේ නම් එය නොසිදුවිය හැක්කකි. ඊට අවකාශයක් නැත. ඇවැත්නි, මුදිතා සමාධිය වනාහි අරතියගේ නිස්සරණය වේමැයි, (නොඇල්මෙන් මිදීමයි.)

14. "ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම මෙසේ කියන්නේය. ඇවැත්නි, උපෙක්ෂා සමාධිය වනාහි මා විසින් වඩනලදී, බොහෝසේ වඩනලදී, නැවත නැවත වඩනලදී. වස්තු වශයෙන් කරණලදී, ඒ අනුව පවතිනලදී, පුරුදුකරණ ලදී, හොඳින් පටන්ගන්නා ලදී. එතකුදු වුවත් රාගය මාගේ සිත හාත්පස මැඩගෙන සිටීයයි (කියයි.) ඔහුට එසේ නොකියවයි

කියයුතු වන්නේය. ආයුෂ්මත් තෙමේ මෙසේ නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් නොකියාවා භාග්‍යවතුන් වහන්සේට දොස් කීම නොමැනවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොවදාරන්නාහ, ඇවැත්නි, වඩන ලද්දාවූද, බොහෝසේ වඩන ලද්දාවූද, නැවත නැවත වඩන ලද්දාවූද, වස්තු වශයෙන් කරන ලද්දාවූද, පුරුදු කරණ ලද්දාවූද, හොඳින් පටන් ගන්නා ලද්දාවූද, උපෙක්ෂා සමාධිය ඇති කල්හි රාගය ඔහුගේ සිත හාත්පස මැඩගෙන සිටින්නේය යන යම් කාරණයක් වේ නම් එය නොසිදුවිය හැක්කකි. ඊට අවකාශයක් නැත. ඇවැත්නි, මේ උපෙක්ෂා සමාධිය රාගයාගේ නිස්සරණය (මිදීම) වේමැයි.

"ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම මෙසේ කියන්නේය. ඇවැත්නි, අනිමිත්ත චෙතො විමුත්තිය (අර්හත්ඵල සමාපත්තිය) මා විසින් වඩනලදී, බොහෝසේ වඩනලදී. නැවත නැවත වඩනලදී, වස්තු වශයෙන් කරණලදී, ඒ අනුව පවත්නාලදී. පුරුදු කරණලදී, හොඳින් පටන්ගන්නාලදී, එතකුදු වුවත්, මාගේ හිත රාගයට හෙතුවූ ආරම්මණයන්හි හැසිරෙන්නේයයි කියයි. ඔහුට එසේ නොකියවයි කියයුතු වන්නේය. ආයුෂ්මත් තෙමේ මෙසේ නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස්නොකියාවා, භාග්‍යවතුන්වහන්සේට දොස් කීම නොමැනවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොවදාරන්නාහ.

"ඇවැත්නි, වඩන ලද්දාවූද, බොහෝසේ වඩන ලද්දාවූද, නැවත නැවත වඩනලද්දාවූද, වස්තු වශයෙන් කරණලද්දාවූද, ඒ අනුව පවත්නා ලද්දාවූද, පුරුදු කරණ ලද්දාවූද, හොඳින් පටන්ගන්නා ලද්දාවූද අනිමිත්තචෙතො සමාධිය ඇති කල්හි ඔහුගේ හිත රාගාදියට හෙතුවූ ආරම්මණයන්හි හැසිරෙන්නේය යන යම් කාරණයක් වේ නම් එය නොසිදුවිය හැක්කකි. ඊට අවකාශයක් නැත. ඇවැත්නි, මේ අනිමිත්තචෙතො විමුත්තිය සියලු නිමිත්තයන්ගේ නිස්සරණය වේමය.

"ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම මෙසේ කියන්නේය. 'මම වෙමියි' යන (හැඟීම) පහව ගියේ වෙයි, මෙතෙම 'මම වෙමියි' කියා ගන්නා දෙයක් නොදක්නෙමි.

එතකුදු වුවත් කෙසේද කෙසේදැයි ගන්නා සැකය නමැති උල මාගේ සිත හාත්පස මැඩගෙන සිටීයයි (කියයි.)

"ඔහුට මෙසේ නොකියවයි කියයුතු වන්නේය. ආයුෂ්මත් තෙමේ මෙසේ නොකියාවා භාග්‍යවතුන් වහන්සේට දොස් නොකියාවා, භාග්‍යවතුන් වහන්සේට දොස් කීම නොමැනවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොවදාරන්නාහ. ඇවැත්නි, 'මම වෙමි'යි යන හැඟීම පහව ගිය කල්හි 'මෙය මම වෙමි'යි නොදක්නහුට කෙසේද කෙසේදැයි ගන්නා සැකය නමැති උල ඔහුගේ සිත හාත්පස මැඩගෙන සිටින්නේය යන යම් කාරණයක් වෙයිනම් එය සිදුවිය නොහැක්කකි. ඊට අවකාශයක් නැත.

"ඇවැත්නි, මේ 'මම වෙමි'යි යන හැඟීමේ මුල් සිඳීමක් වේද, එය කෙසේද කෙසේදැයි ගන්නා විචිකිච්ඡා සල්ලයාගේ නිස්සරණය (මිදීම) වේමැයි මේ සය දුකසේ අවබොධ කට යුත්තාහ.

15. "කවර නම් ධර්ම සයක් ඉපදවිය යුත්තාහුද? සිහි නුවණින් විමසීම් සයය. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම ඇසින් රූපයක් දැක සතුටුද නොවෙයි, නොසතුටුද නොවෙයි, උපෙක්ෂාවෙන් යුක්තව සිහි නුවණින් යුක්තව වාසය කරයි. කණින් ශබ්දය අසා, නැහැයෙන් ගඳ සුවඳ දැන, දිවෙන් රසය විඳ, කයින් ස්පර්ශය දැන, සිතින් ධර්මඅරමුණු දැන සතුටුද නොවෙයි. නොසතුටුද නොවෙයි. උපෙක්ෂාවෙන් යුක්තව සිහි නුවණින් යුක්තව වාසය කරයි. මේ ධර්ම සය ඉපදවිය යුතුය.

"කවර නම් ධර්ම සයක් ඉතා හොඳ නුවණින් දත යුත්තාහුද? අනුත්තරිය (උතුම් දේ) ධර්ම හයයි. දස්සනානුත්තරිය (දැකීම් අතරෙන් උසස් දැකීම,) සවණානුත්තරිය (ඇසීම් අතුරෙන් උසස් ඇසීම,) ලාභානුත්තරිය (ලැබීම් අතුරෙන් උසස් ලැබීම,) සික්ඛානුත්තරිය, (හික්මීම අතුරෙන් උසස් හික්මීම,) පාරිචරියානුත්තරය (උපස්ථාන අතුරෙන් උතුම් උපස්ථානය,) අනුස්සතානුත්තරිය (සිහිකිරීම් අතුරෙන් උතුම් සිහිකිරීම) යන සයයි. මේ ධර්ම සය ඉතා හොඳ නුවණින් දත යුත්තාහුය.

"කවර නම් ධර්ම සයක් තමාම දැකීමෙන් ප්‍රත්‍යක්ෂ කට යුත්තාහුද? අභිඥා සයය. ඇවැත්නි, මේ සස්නෙහි මහණ තෙමේ

නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන්කොට දක්වයි. එකෙක්ව බොහෝසේ වෙයි. බොහෝසේව එකෙක් වෙයි ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට, පර්වතය හරහට, නොහැපෙමින් යයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කෙරෙයි. පක්ෂියකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව පවත්වයි. පිරිසිදුවූ මිනිසත්බව ඉක්මෙව්වාවූ දිවකණින් දුර වූද, ස්වමීපවූද, අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද දෙවැදෑරුම් ශබ්ද අසයි. දුරවූ හෝ ළඟවූ හෝ සත්වයන්ගේ සිත සිය සිතින් පිරිසිඳ දනියි. රාග සහිත සිත රාග සිතයයි දනියි. රාගය පහවූ සිත රාගයෙන් තොරවූ සිතයයි දනියි. ද්වෙෂ සහිත සිත දොස සිතයයි දනියි. ද්වෙෂය පහවූ සිත ද්වෙෂයෙන් තොරවූ සිතයයි දනියි. මොහ සහිත සිත මොහ සිතයයි දනියි. මොහය පහවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුණු සිත හැකුලුණු සිතයයි දනියි, විසිරුණු සිත විසිරුණු සිතයයි දනියි. මහත් බවට ගිය සිත, මහත් බවට ගිය සිත යයි දනියි. මහත් බවට නොගිය සිත, මහත් බවට නොගිය සිතයයි දනියි. කාම සහිත සිත, කාම සහිත සිතයයි දනියි. ලෞකික හිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනියි සමාධි ගතවූ සිත සමාධිගත සිතයයි දනි, සමාධිගත නොවූ සිත සමාධිගත නොවූ සිතයයි දනියි. (ක්ලේශයෙන්) මිදුනු සිත. මිදුනු සිතයයි දනියි. නොමිදුනු සිත නොමිදුනු සිතයයි දනියි.

16. "හෙතෙමේ නොයෙක් ආකාරවූ පෙරවිසූ කඳ පිළිවෙළ සිහිකරන්නේය. හේ කෙසේද යත්: එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් ජාති ලක්ෂගණන්ද අසවල් තැන වූයෙම් මෙබඳු නම් ඇත්තේ, මෙබඳු ගොත්‍ර ඇත්තේ, මෙබඳු වර්ණ ඇත්තේ, මෙබඳු ආහාර ඇත්තේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මෙබඳු සැප දුක් විඳින්නේ, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තේ වීමියයි කියායි. ඒ මම එයින් චුතවූයෙම් අසුවල් තැන උපනිමි. එහිද මෙබඳු නම් ඇත්තේ වීමි. මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේ වීමි, මෙබඳු ආහාර ඇත්තේ වීමි, මෙබඳු සැප දුක් වින්දේ වීමි. මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තේ වීමි. ඒ මම එයින් චුතවූයෙම් මෙහි උපන්නෙමි. මෙසේ ආකාර සහිතව දැක්වීම් සහිතව නානාප්‍රකාරවූ පෙර විසූ ආත්ම සිහි කරයි.

"පිරිසිදුවූ මිනිසත් බව ඉක්මෙව්වාවූ දිව ඇසින් චුත වන්නාවූද උපදින්නාවූ, හීනවූද, උසස්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණවූ, යහපත් ගති ඇත්තාවූද අයහපත් ගති ඇත්තාවූද කම්වූ පරිදි මිය පරලොව යන්නාවූ සත්වයන් දැන ගනීද එබඳුවූ චිත්තසමාධිය ලබයි. මේ පින්වත් සත්වයෝ එකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාග් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනො දුශ්චරිතයෙන් යුක්තවූවාහු, ආර්‍ය්‍යයන්ට දොස් කියන්නාහු, මිසදිටුවූවාහු, මිථ්‍යාදෘෂ්ටි කර්මයන් සමාදන් වූවාහු මරණින් මතු සැපයෙන් පහවූ හෙයින් අපාය නම්වූ දුකට පැමිණීම හෙයින් දුග්ගති නම්වූ, විවසව (හිස යටිකුරුව වැටෙන්නාවූ) නරකයෙහි උපන්නාහුය. මේ පින්වත් සත්වයෝ කයින් කරන සුචරිතයෙන් යුක්තවූවාහු වචනයෙන් කරන සුචරිතයෙන් යුක්තවූවාහු, හිතින් කරන සුචරිතයෙන් යුක්තවූවාහු ආර්‍ය්‍යයන්ට දොස් නොකියන්නාහු සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන්වූවාහු ඔව්හු ශරීරභෙදයෙන්, මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපන්නාහුයයි මෙසේ මිනිස් ඇස ඉක්මවූ, පිරිසුදු දිවැසින්, චුතවන්නාවූද, උපදින්නාවූද හීනවූද, රසවත්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද කම්වූපරිදි පරලොව යන සත්වයන් දැනගනී. කාමාදි ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ චිත්ත විමුක්තියද ප්‍රඥාවිමුක්තියද මේ ආත්මයෙහිම තෙමේ ඉතා හොඳ ප්‍රඥාවෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට එළඹ වාසය කරන්නේය. මේ ධර්ම සය ප්‍රත්‍යක්ෂ කටයුත්තාහුය. මෙසේ විද්‍යමානවූ සත්‍යවූ එසේම

වන්නාවූ වෙනස් නොවන්නාවූ අන්පරිද්දකින් නොවන්නාවූ මේ ධර්මයෝ සැටදෙන තථාගතයන් වහන්සේ විසින් මනාකොට අවබොධකරණ ලද්දාහුය.

17. "ධර්ම සතක් බොහෝ උපකාර වන්නාහුය. ධර්ම සතක් වැඩිය යුත්තාහුය. ධර්ම සතක් පිරිසිඳ දතයුත්තාහුය. ධර්ම සතක් දුරු කටයුත්තාහුය. ධර්ම සතක් පිරිහීමට පමුණුවන ස්වභාව ඇත්තාහුය. ධර්ම සතක් ගුණවිශෙෂය පිණිස පවත්නාහ. ධර්ම සතක් ඉපදවිය යුත්තාහුය. ධර්ම සතක් විශෙෂයෙන් දතයුත්තාහුය. ධර්ම සතක් තමාම දැක ප්‍රත්‍යක්ෂ කටයුත්තාහ.

"කවර නම් ධර්ම සතක් බොහෝ උපකාර වන්නාහුද? ආර්‍ය්‍ය ධන සතය, ශ්‍රද්ධා ධනය, සීල ධනය, හිරි (ලජ්ජා) ධනය, ඔත්තප්ප (බිය) ධනය, ශ්‍රැත ධනය, ත්‍යාග ධනය, ප්‍රඥා ධනය, මේ ධර්ම සත බොහෝ උපකාර වන්නාහුය.

"කවර නම් ධර්ම සතක් වැඩිය යුත්තාහුද? සප්ත බොද්ධ්‍යංග ධර්මයෝය. ස්මෘති සම්බොද්ධ්‍යංගය, ධර්මවිචය සම්බොද්ධ්‍යංගය, වීර්‍යය සම්බොධ්‍යාංගය, ප්‍රීති සම්බොද්ධ්‍යංගය, පස්සද්ධි සම්බොද්ධ්‍යංගය, සමාධි සම්බොද්ධ්‍යංගය, උපෙක්ෂා සම්බොද්ධ්‍යංගය යන මේ බොද්ධ්‍යංග සත වැඩිය යුත්තාහ.

18. "කවර නම් ධර්ම සතක් පිරිසිඳ දතයුත්තාහුද? ඇවැත්නි, විඥානස්ථිති (විඥාන පිහිටන තැන්) සතක් වෙත්. වෙනස් වෙනස් ශරීර ඇති වෙනස් වෙනස් හැඟීම් (ප්‍රතිසන්ධි විඤ්ඤාණ) ඇති සත්වයෝ වෙත්. මනුෂ්‍යයෝද ඇතැම් දෙවියෝද, ඇතැම් විනිපාතිකයෝ (සමහර අසුරයන් හා ප්‍රෙතයෝ) ද, යම්සේද එමෙනි. මේ පළමුවන විඥානස්ථිතියයි. ඇවැත්නි, වෙනස් වෙනස් ශරීර ඇති එක හැඟීම (සමාන ප්‍රතිසන්ධි විඤ්ඤාණ) ඇති සත්වයෝ වෙත්. පළමුවෙනි ධ්‍යානයෙන් උපන්නාවූ බ්‍රහ්මකායික නම් දෙවියෝ යම්සේද එමෙනි. මේ දෙවන විඥානස්ථිතියයි. ඇවැත්නි, සමාන ශරීර ඇති වෙනස් වෙනස් හැඟීම් (ප්‍රතිසන්ධි විඤ්ඤාණ) ඇති සත්වයෝ වෙත්. ආභස්සර දෙවියෝ යම්සේද එමෙනි, මේ තුන්වන විඥානස්ථිතියයි. ඇවැත්නි, සමාන ශරීර ඇති සමාන හැඟීම් (ප්‍රතිසන්ධි විඤ්ඤාණ) ඇති සත්වයෝ වෙත්. සුභකිණ්හ

දෙවියෝ යම්සේද එමෙනි. මේ සතරවන විඥානස්ථිතියයි. ඇවැත්නි, සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් ගැටීම් සංඥාවන් නැසීමෙන් වෙනස් වෙනස් සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණියාවූ සත්වයෝවෙත්. මේ පස්වන විඥානස්ථිතියයි. ඇවැත්නි, සියලු ආකාරයෙන් ආකාසනඤ්චායතනය ඉක්මවා විඤ්ඤානය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණියාවූ සත්වයෝ වෙත්. මේ සයවෙනි විඥානස්ථිතියයි. ඇවැත්නි, සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියාවූ සත්වයෝ වෙත්. මේ සත්වන විඥානස්ථිතිය වන්නීය. මේ ධර්ම සත පිළිබඳ දතයුත්තාහුය.

"කවර නම් ධර්ම සතක් දුරුකටයුත්තාහුද? "අනුසය (සිතෙහි බැඳී පවතින කෙලෙස්) සත වෙත්. කාමරාගානුසය, පටිඝානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය, මානානුසය, භවරාගානුසය, අවිජ්ජානුසය යන මේ ධර්ම සත දුරු කට යුත්තාහුය.

**19.** "කවර නම් ධර්ම සතක් පිරිහීම පිණිස වන්නාහුද සත් අසද්ධර්මයෝය. ඇවැත්නි, මේ සස්නෙහි මහණ තෙමේ ශ්‍රද්ධා නැත්තෙක් වේද, ලජ්ජා නැත්තෙක් වේද, බිය නැත්තෙක් වේද, ඇසූ පිරූ තැන් නැත්තෙක් වේද, කුසීතයෙක් වේද, සිහි මුළාවූවෙක් වේද, නුවණ නැත්තෙක් වේද මේ ධර්ම සත පිරිහීම පිණිස පවත්නාහුය.

"කවර නම් ධර්ම සතක් ගුණවිශෙෂය පිණිස වන්නාහුද? සත් සද්ධර්මයෝය. ඇවැත්නි, මේ සස්නෙහි මහණ තෙමේ ශ්‍රද්ධා ඇත්තෙක් වේද, ලජ්ජා ඇත්තෙක්වේද, බිය ඇත්තෙක් වේද, බහුශ්‍රැතයෙක් වේද, පටන්ගත් වීර්යය ඇත්තෙක් වේද, එළඹ සිටි සිහිය ඇත්තෙක් වේද, ප්‍රඥාවන්තයෙක් වේද යන ධර්ම සත ගුණ විශෙෂය පිණිස පවත්නාහුය.

"කවර නම් ධර්ම සතක් දුකසේ අවබොධ කටයුතු වන්නාහුද? සත් සත්පුරුෂ ධර්මයෝය. ඇවැත්නි, මේ

ශාසනයෙහි මහණ තෙමේ ධර්මය දන්නෙක් වේද, අර්ථය දන්නෙක් වේද, තමා දන්නෙක් වේද, පමණ දන්නෙක් වේද, කාලය දක්නෙක් වේද, පිරිස් දන්නෙක් වේද, පුද්ගලයන් දන්නෙක් වේද, මේ ධර්ම සත දුකසේ අවබොධ කටයුත්තාහුය.

"කවර නම් ධර්ම සතක් ඉපදවිය යුත්තාහුද? සත් සංඥාවෝය, අනිත්‍ය සංඥාවය, අනාත්ම සංඥාවය, අසුභ සංඥාවය, ආදීනව සංඥාවය, ප්‍රහාන සංඥාවය, විරාග සංඥාවය, නිරොධ සංඥාවය. මේ ධර්ම සත ඉපදවිය යුත්තාහුය.

"කවර නම් ධර්ම සතක් විශෙෂ නුවණින් දතයුත්තාහුද? සත් වැරැරුම් නිර්දස වස්තු (දස අවුරුද්දක් නැත්තේය යනාදීන් කීමට හෙතුවූ කරුණු) හුය. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම ශික්ෂා පිරීමෙහි බලවත් කැමැත්ත ඇත්තේ වෙයි. මත්තෙහිද, ශික්ෂා පිරීමෙහි පහනොවූ කැමැත්ත ඇත්තේ වෙයි. ධර්මනිසාන්තියෙහි (විදර්ශනාවෙහි) බලවත් කැමැත්ත ඇත්තේ වෙයි. මත්තෙහිද විදර්ශනාවෙහි පහනොවූ කැමැත්ත ඇත්තේ වෙයි. ඉච්ඡා විනයෙහි (ආසා දුරු කිරීමෙහි) බලවත් කැමැත්ත ඇත්තේ වෙයි. මත්තෙහිද ආසා දුරු කිරීමෙහි පහනොවූ කැමැත්ත ඇත්තේ වෙයි. පටිසල්ලානයෙහි (තනිව විසීමෙහි) බලවත් කැමැත්ත ඇත්තේ වෙයි. මත්තෙහිද තනිව විසීමෙහි පහනොවූ කැමැත්ත ඇත්තේ වෙයි. වීර්යයාරම්භයෙහි (වීර්යය කිරීමෙහි) බලවත් කැමැත්ත ඇත්තේ වෙයි. මත්තෙහිද පටන්ගන්නා ලද වීර්යයෙහි පහනොවූ කැමැත්ත ඇත්තේ වෙයි. සතිනෙපක්කයෙහි (සිහියෙහිද නුවණැති බැව්හිද) බලවත් කැමැත්ත ඇත්තේ වෙයි. මත්තෙහිද සිහියෙහි හා නුවණැති බැව්හි පහනොවූ කැමැත්ත ඇත්තේ වෙයි. දෘෂ්ටි ප්‍රතිවෙධයෙහි (මාර්ග දැකීමෙහි) බලවත් කැමැත්ත ඇත්තේ වෙයි. මත්තෙහිද මාර්ග දැකීමෙහි පහනොවූ කැමැත්ත ඇත්තේ වෙයි. මේ සත්වැදෑරුම් ධර්මයෝ විශෙෂයෙන් දත යුත්තාහුය.

"කවර නම් ධර්ම සතක් ප්‍රත්‍යක්ෂ කටයුතු වන්නාහුද? ක්ෂීණාශ්‍රව බල සතය, ඇවැත්නි, මේ සස්නෙහි රහත් භික්ෂුව විසින් සියලු සංස්කාර ධර්ම තත්වූ පරිද්දෙන් අනිත්‍ය වශයෙන් මනා ප්‍රඥාවෙන් දක්නා ලද්දාහු වෙත්ද, ඇවැත්නි, රහත් භික්ෂුව

විසින් සියලු සංස්කාර ධර්මයන් තත්වූ පරිද්දෙන් අනිත්‍ය වශයෙන් මනා ප්‍රඥාවෙන් දක්නාලදී යන යමක් වේද යම්බඳු බලයකට පැමිණ රහත් භික්ෂු තෙමේ මාගේ කාම ආදී කෙලෙස් නැතිවීයැයි කෙලෙස් නැති බව ප්‍රකාශ කරයි නම් මෙයද රහත් භික්ෂුවගේ බලය වන්නේය. නැවත අනිකක්ද කියමි. රහත් භික්ෂුව විසින් ගිනිඅඟුරු වළකට සමාන කාමයෝ තත්වූ පරිද්දෙන් මනා ප්‍රඥාවෙන් දක්නා ලද්දාහු වෙත්ද ඇවැත්නි, රහත් භික්ෂුව විසින් ගිනි අඟුරු වළකට බඳු කාමයෝ තත්වූ පරිද්දෙන් මනා ප්‍රඥාවෙන් දන්නාලදී යන යමක් වේද, යම්බඳු බලයකට පැමිණි රහත් භික්ෂු තෙමේ මාගේ කාමාදි කෙලෙස් නැතිවීයයි කෙලෙස් නැති බව ප්‍රකාශ කරයි නම් මෙයද රහත් භික්ෂුහුගේ බලයක් වන්නේය. නැවතද ඇවැත්නි, රහත් භික්ෂුව විවේකයට නැමුනාවූ සිත ඇත්තේ වේද, විවේකයට පුරුදුවූ විවේකය වාසභූමිවූ විවෙකයෙහි පිහිටියාවූ සිත ඇත්තේවේද, කෙලෙස්වලට කරුණුවූ ධර්මයන්ගෙන් වෙන්ව ගිහි ගෙයින් නික්මී මෙහි ඇළුනේ වේද, ඇවැත්නි, රහත් භික්ෂුව විවෙකයට නැමුණාවූ සිත ඇත්තේ වේද, විවෙකයට පුරුදුවූ විවෙකයට වාසභූමිවූ විවෙකයෙහි සිටියාවූ සිත ඇත්තේ වේද, කෙලෙස්වලට කරුණුවූ ධර්මයන්ගෙන් වෙන්ව ගිහි ගෙයින් නික්මීමෙහි ඇලුනේ වේද, යන යමක්වේද, යම්බඳු බලයකට පැමිණි රහත් භික්ෂුතෙමේ මාගේ කාමාදි කෙලෙස් නැතිවීයයි කෙලෙස් නැතිබව ප්‍රකාශ කරයි නම් මෙයද රහත් භික්ෂුවගේ බලය වන්නේය.

"නැවතද ඇවැත්නි, රහත් භික්ෂුව විසින් සතර සති පට්ඨානයෝ වඩනා ලද්දාහු මනාව වඩනා ලද්දාහු වෙත්ද, ඇවැත්නි, රහත් භික්ෂුව විසින් සතර සතිපට්ඨානයෝ වඩන ලද්දාහු, මනාව වඩන ලද්දාහු වෙත්ද යන යමක් වේද යම්බඳු බලයකට පැමිණි රහත් භික්ෂුතෙමේ මාගේ කාමාදි කෙලෙස් නැතිවීයයි කෙලෙස් නැති බව ප්‍රකාශ කරයි නම් මෙයද, රහත් භික්ෂුවගේ බලය වන්නේය.

නැවතද ඇවැත්නි, රහත් භික්ෂුව විසින් පඤ්චෙන්ද්‍රියයෝ වඩන ලද්දාහු මනාව වඩන ලද්දාහු වෙද්ද, ඇවැත්නි, රහත්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

භික්ෂුව විසින් පංච ඉන්ද්‍රියයෝ වඩන ලද්දාහු මනාව වඩන ලද්දාහු වෙද්ද යන යම් යමක් වේද යම්බඳු බලයකට පැමිණි රහත් භික්ෂු තෙමේ මාගේ කෙලෙස් නැතිවීයයි, කෙලෙස් නැති බව ප්‍රකාශකරයි නම් මෙයද රහත් භික්ෂුවගේ බලය වන්නේය.

"නැවතද ඇවැත්නි, රහත්භික්ෂුව විසින් සප්තබොද්ධ්‍යංගයෝ වඩන ලද්දාහු හොඳින් වඩන ලද්දාහු වෙද්ද, ඇවැත්නි, රහත් භික්ෂුව විසින් සප්ත බොද්ධ්‍යංගයෝ වඩනා ලද්දාහු මොනවට වඩන ලද්දාහුය යන යමක් වේද, යම්බඳු බලයකට පැමිණි රහත් භික්ෂු තෙමේ මාගේ කෙලෙස් නැතිවීයැයි කෙලෙස් නැති බව ප්‍රකාශ කරයි නම් මෙයද රහත්භික්ෂුවගේ බලය වන්නේය.

"නැවතද ඇවැත්නි, රහත් භික්ෂුව විසින් ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය වඩන ලද්දේ මනාව වඩන ලද්දේ වේද ඇවැත්නි, රහත් භික්ෂුව විසින් ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය වඩන ලද්දේය යහපත් කොට වඩන ලද්දේය යන යමක් වේද යම්බඳු බලයකට පැමිණි රහත් භික්ෂු තෙමේ මාගේ කෙලෙස් නැතිවී යැයි කෙලෙස් නැති බව ප්‍රකාශ කරයි නම් මෙයද රහත් භික්ෂුවගේ බලය වන්නේය. මේ සත්වැදෑරුම් ධර්මයෝ ප්‍රත්‍යක්ෂ (තමාම දැකීම) කටයුත්තාහුය. මෙසේ ඇත්තාවූ සත්‍යවූ එසේමවූ වෙනස් නොවන්නාවූ අන් ආකාරයකින් නොවන්නාවූ සැත්තෑවක් ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් මනාකොට අවබෝධ කරණ ලද්දාහුය.

**පළමුවෙනි බණවර නිමි.**

**20.** "ධර්ම අටක් බොහෝ උපකාර වන්නාහ. ධර්ම අටක් වැඩිය යුත්තාහ, ධර්ම අටක් පිරිසිඳ දත යුත්තාහ. ධර්ම අටක් දුරුකටයුත්තාහ, ධර්ම අටක් පිරිහීම පිණිස වන්නාහ. ධර්ම අටක් විශෙෂ ඵලයට පැමිණීම පිණිස වන්නාහ. ධර්ම අටක් දුකසේ අවබොධ කටයුත්තාහ, ධර්ම අටක් ඉපදවිය යුත්තාහ, ධර්ම අටක් විශෙෂ නුවණින් දත යුත්තාහ. ධර්ම අටක් ප්‍රත්‍යක්ෂ කටයුත්තාහුය.

කවර නම් ධර්ම අටක් බොහෝ උපකාර ඇත්තාහුද, නොලත් මාර්ග බ්‍රහ්මචය්‍ර්‍යාවට මුල්වූ ප්‍රඥාව (තරුණ සමථ විදර්ශනා ප්‍රඥාව හෝ සම්‍යක් දෘෂ්ටිය) ලැබීම පිණිසද ලබන ලද එම ප්‍රඥාව බොහෝසේ වැඩීම පිණිසද විපුල භාවය පිණිසද වැඩීම සම්පූර්ණවීම පිණිසද පවතින්නාවූ හෙතු අට හා ප්‍රත්‍ය අටය. කවර අටෙක්ද? ඇවැත්නි, සස්නෙහි මහණ තෙමේ ශාස්තෲන් වහන්සේ හෝ ඇසුරුකොට වාසය කෙරේද එක්තරා ගරු කටයුතු තෙරුන්වහන්සේ කෙනෙකු ඇසුරුකොට හෝ වාසය කෙරේද උන්වහන්සේ කෙරෙහි තියුණු හිරිඔතප් ඇත්තේ වේද, ප්‍රේමය සහ ගෞරවය ඇත්තේ වේද, මේ පළමුවෙනි හේතුව හා පළමුවෙනි ප්‍රත්‍යය නොලත් මාර්ගබ්‍රහ්මචරියාවට මුල්වූ ප්‍රඥාව ලැබීම පිණිසද ලැබූ ප්‍රඥාව බොහෝසේ වැඩීම පිණිසද විපුල භාවය පිණිසද භාවනාවේ සම්පූර්ණත්වය පිණිසද පවත්නේය. ඒ තෙමේ ශාස්තෲන් වහන්සේ ඇසුරුකොට හෝ එක්තරා ගරු කටයුතු ශ්‍රාවක මිතුරෙකු ඇසුරු කොට හෝ වාසය කෙරේද උන්වහන්සේ කෙරෙහි ඔහුගේ තියුණු හිරිඔතප් ඇත්තේ වේද ප්‍රේමය හා ගෞරවය ඇත්තේ වේද, ඔහු කලින් කල උන්වහන්සේලා කරා එළඹ, ස්වාමීන්වහන්ස, මෙය කෙසේද? මේ පදයෙහි අර්ථය කුමක්දැයි, විචාරන්නේය, ප්‍රශ්න කරන්නේය. ඔහුට ඒ ආයුෂ්මත්හු පැහැදිලි නැති අර්ථය පැහැදිලි කර දෙන්නාහුය. අප්‍රකට අර්ථය ප්‍රකට කර දෙන්නාහුය. නොයෙක් ආකාරවූ සැක කටයුතු ධර්මයන්හි සැක දුරු කරන්නාහුය, මේ දෙවෙනි හේතුව, දෙවෙනි ප්‍රත්‍යය තාම නොලත් මාර්ගබ්‍රහ්මචරියාවට මුල්වූ ප්‍රඥාව ලැබීම පිණිසද ලැබූ ප්‍රඥාව බොහෝසේ වැඩීම පිණිසද විපුල භාවය පිණිසද භාවනාවගේ සම්පූර්ණත්වය පිණිස පවතින්නේය.

"ඒ ධර්මය අසා කායවිවෙකය චිත්තවිවෙකය යන දෙවැදෑරුම් විවෙකයෙන් සම්පූර්ණ කරන්නේය. මේ තුන් වෙනිහේතුව, තුන්වෙනි ප්‍රත්‍යය නොලත් මාර්ගබ්‍රහ්මචරියාවට මුල්වූ ප්‍රඥාව ලැබීම පිණිසද ලැබූ ප්‍රඥාව බොහෝසේ වැඩීම පිණිසද විපුලභාවය පිණිසද භාවනාවගේ සම්පූර්ණත්වය පිණිසද පවතී.

"නැවතද, ඇවැත්නි, මහණතෙමේ සිල්වත් වේද ප්‍රාතිමොක්ෂ සංවර සීලයෙන් සංවරව වාසය කෙරේද ශ්‍රමණයන්ට සුදුසු ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ වේද සුලු වරදෙහි පවා භය දක්නා ස්වභාව ඇත්තේද ශික්ෂා පදයන්හි මනාව හික්මෙන්නේ වේද, මේ සිව්වෙනි හේතුව සිව්වෙනි ප්‍රත්‍යය නොලැබූ මාර්ගබ්‍රහ්මචරියාවට මුල්වූ ප්‍රඥාව ලැබීම පිණිසද ලැබූ ප්‍රඥාව බොහෝසේ වැඩීම පිණිසද විපුල භාවය පිණිසද භාවනාවගේ සම්පූර්ණත්වය පිණිසද පවතී.

"ඇවැත්නි, නැවතද මහණ තෙමේ බහුශ්‍රැතයෙක් වේද (බොහෝ දේ දැනගත්තෙක්) ශ්‍රැතධරයෙක් (ඇසූ දේ දරා සිටින්නෙක්) ශ්‍රැතසන්නිචයෙක් (ඇසූ දේ රැස්කරගෙන සිටින්නෙක්) වේද, යම් ඒ ධර්ම කෙනෙක් මුල යහපත්වූවාහුද මැද යහපත් වූවාහුද කෙළවර යහපත් වූවාහුද අර්ථ සහිත වූවාහුද යහපත් වචන සහිත වූවාහුද හාත්පස සම්පූර්ණවූ පිරිසිදු බ්‍රහ්මචරියාව ප්‍රකාශකරද්ද එබඳුවූ ධර්ම ඔහු විසින් බොහෝ අසන ලද්දාහුවෙත්ද දරන ලද්දාහු වෙත්ද වචනයෙන් පුරුදු කරන ලද්දාහුවෙද්ද, සිතින් සලකාබලන ලද්දාහු වෙත්ද ප්‍රඥාවෙන් මනාව අවබෝධ කරන ලද්දාහුද වෙත්. මේ පස්වෙනි, හේතුව පස්වෙනි ප්‍රත්‍යය නොලත් මාර්ගබ්‍රහ්මචරියාවට මුල්වූ ප්‍රඥාව ලැබීම පිණිසද ලත් ප්‍රඥාව බොහෝ සෙයින් වැඩීම් පිණිසද විපුල භාවය පිණිසද භාවනා වගේ සම්පූර්ණත්වය පිණිසද පවතී.

"නැවතද මහණතෙමේ පටන්ගන්නාලද වීර්යයෙන් යුක්තව අකුශල ධර්මයන් දුරුකිරීම පිණිසද, කුසල් ධර්මයන්ට එළඹීම පිණිසද ශක්තිමත් වූයේ දැඩි උත්සාහයෙන් යුක්තවූයේ කුශල ධර්මයන්හි පසුබට නොවූ වීර්යය ඇතිව වාසය කෙරේද, මේ සයවෙනි හේතුව සයවෙනි ප්‍රත්‍ය නොලත් මාර්ගබ්‍රහ්මචයර්‍යාවට මුලවූ ප්‍රඥාව ලැබීම පිණිසද ලත් ප්‍රඥාව බොහෝ සෙයින් වැඩීම පිණිසද විපුල භාවය පිණිසද භාවනාවගේ සම්පූර්ණත්වය පිණිසද පවතී.

"නැවතද ඇවැත්නි මහණ තෙමේ සිහියෙන් යුක්තවූයේ වේද, මුහුකුරා ගිය උතුම් සිහියෙන් යුක්තවූයේ බොහෝ කලකට

පෙර කළ දේද, බොහෝ කලකට පෙර කියූ දේද සිහි කරන්නේ වේද, මතක ඇත්තේ වේද මේ සත්වෙනි හේතුව සත්වෙනි ප්‍රත්‍යය නොලත් මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වූ ප්‍රඥාව පිණිසද ලැබූ ප්‍රඥාව බොහෝසේ වැඩීම පිණිසද විපුල භාවය ලැබීම පිණිසද භාවනාවගේ සම්පූර්ණත්වය පිණිසද පවත්නේය.

21. "නැවතද ඇවැත්නි, මහණ තෙමේ පඤ්චඋපාදාන ස්කන්ධයන්හි ඇති වීම්, නැතිවීම් දෙක බලමින් වාසය කෙරේද රූපය මෙසේ වන්නේය. රූපයාගේ හටගැනීම මෙසේ වන්නේය. රූපයාගේ විනාසය මෙසේ වන්නේය. වේදනාව මෙසේ වන්නීය. වේදනාවගේ හටගැනීම මෙසේ වන්නේය. වේදනාවගේ විනාසය මෙසේ වන්නේය. සංඥාව මෙසේ වන්නේය. සංඥාවගේ හටගැනීම මෙසේ වන්නේය. සංඥාවගේ නැතිවීම මෙසේ වන්නේය. සංස්කාරයෝ මෙසේ වන්නාහුය. සංස්කාරයන්ගේ හටගැනීම මෙසේ වන්නේය. සංස්කාරයන්ගේ විනාශය මෙසේ වන්නේය. විඥානය මෙසේ වන්නේය. විඥානයාගේ හටගැනීම මෙසේ වන්නේය. විඥානයාගේ විනාශය මෙසේ වන්නේයයි ඇතිවීම හා නැතිවීම බලමින් වාසය කෙරේද මේ අට වැනි හේතුව අටවැනි ප්‍රත්‍ය නොලැබූ මාර්ග බ්‍රහ්මචරියාවට මුල් ප්‍රඥාව ලැබීම පිණිසද ලැබූ ප්‍රඥාව බොහෝ සේ වැඩීම පිණිසද විපුල භාවය පිණිසද, භාවනාවගේ සම්පූර්ණත්වය පිණිසද පවත්නේය. මේ ධර්ම අට බොහෝ උපකාර වන්නාහුය.

"කවර නම් ධර්ම අටක් වැඩිය යුත්තාහුද? ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය තෙමේය, හේ කවරේද? හරි දෘෂ්ටිය, හරි කල්පනාව, හරිවචනය, හරි කර්මාන්තය, හරි ආජීවය, හරි ව්‍යායාමය, හරි ස්මෘතිය, හරි සමාධිය, යනමේ ධර්ම අට වැඩිය යුත්තාහුය.

"කවර නම් ධර්ම අටක් පිරිසිඳ දතයුත්තාහුද? අෂ්ටලොක ධර්මයෝය, ලාභය අලාභය, අපකීර්තිය, කීර්තිය, නින්දාව, ප්‍රසංසාව, සැප, දුක යනමේ ධර්ම අට පිරිසිඳ දත යුත්තාහුය.

"කවර නම් ධර්ම අටක් දුරු කටයුත්තාහුද? වැරදි ස්වභාවයෝ අටය, වැරදි දෘෂ්ටිය, වැරදි කල්පනාව, වැරදි වචනය, වැරදි කර්මාන්තය, වැරදි ආජීවය, වැරදි ව්‍යායාමය

වැරදි ස්මෘතිය, වැරදි සමාධිය යන මේ ධර්ම අට දුරු කටයුත්තාහුය.

**22.** "කවර නම් ධර්ම අටෙක් ගුණයෙන් පිරිහීම පිණිස පවත්නාහුද? කුසීත වස්තු අටක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණහු විසින් (සිවුරු ආදිය පිළිබඳ) කළයුතු වැඩ ඇත්තේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මා විසින් කළයුතු වැඩ ඇත්තේය. වැඩ කරන්නාවූ මාගේ ශරීරය ක්ලාන්ත වන්නේය. එබැවින් මම නිදාගන්නෙමියි හෙතෙම නිදාගනියි. නොපැමිණි ධ්‍යාන මාර්ගඵලයට පැමිණීම පිණිස, නොලබන ලද ධ්‍යාන ආදිය ලැබීම පිණිස, නොදුටු ධ්‍යානඵල ආදිය දකිනු පිණිස උත්සාහ නොකරයි. මේ පළමුවෙනි කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහු විසින් වැඩක් කරණ ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම වැඩක් කෙළෙමි. වැඩක් කළාවූ මාගේ ශරීරය වෙහෙස විය. එබැවින් මම නිදාගන්නෙමියි හෙතෙම නිදාගනියි. නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලැබූ ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ගඵලාදිය දකිනු පිණිස උත්සාහ නොකරයි. මේ දෙවෙනි කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහු විසින් යායුතු ගමනක් ඇත්තේය. ඔහුට මෙබඳු සිතක් වෙයි. යායුතු ගමනක් ඇත්තේය. යන්නාවූ මාගේ ශරීරය වෙහෙස වන්නේය. එබැවින් මම නිදා ගන්නෙමියි හෙතෙම නිදාගනියි. නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිස, නොලබනලද ධ්‍යාන ආදිය ලැබීම පිණිස, නොදුටු ධ්‍යාන ආදිය දැකීම පිණිස උත්සාහ නොකරයි. මේ තුන්වෙනි කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහු විසින් ගමනක් යන ලද්දේ වේද, ඔහුට මෙබඳු සිතක් වෙයි. මම ගමනක් ගියෙමි. ගමනක් ගියාවූ මාගේ ශරීරය වෙහෙස විය. එබැවින් මම නිදාගන්නෙමියි, හෙතෙම නිදාගනියි. නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිස නොලබන ලද ධ්‍යාන ආදිය ලැබීම පිණිස නොදුටු ධ්‍යාන ආදිය දැකීම පිණිස උත්සාහ නොකරයි. මේ සතරවන කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණතෙම ගමක හෝ නියම්ගමක හෝ පිඬු පිණිස හැසිරෙන්නේ කටුකවූ හෝ මිහිරිවූ හෝ භොජනයක් සෑහෙන පමණ නොලබයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම ගමක හෝ නියම්ගමක හෝ පිඬු පිණිස ඇවිද කටුකවූ හෝ මිහිරිවූ හෝ භොජනයක් සෑහෙන පමණ නොලැබුවෙමි. ඒ මාගේ ශරීරය වෙහෙස විය, ක්ලාන්ත විය, එබැවින් මම නිදාගන්නෙමියි හෙතෙම නිදාගනියි. නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිසද නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිසද උත්සාහ නොකරයි. මේ පස්වෙනි කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම ගමක හෝ නියම් ගමක හෝ පිඬු පිණිස ගොස් කටකවූ හෝ මිහිරිවූ හෝ භොජනයක් සෑහෙන පමණ ලබයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම ගමක හෝ නියම් ගමක හෝ පිඬු පිණිස ගොස් කටුකවූ හෝ මිහිරිවූ හෝ භොජනයක් සෑහෙන පමණ ලදිමි. ඒ මාගේ ශරීරය බරවූයේ කටයුතු කිරීමට අසමර්ථවූයේ වේ. පොඟවනලද මෑඇට යම්සේ බරවන්නේද, එමෙනි. එබැවින් මම නිදාගන්නෙමියි හෙතෙම නිදා ගනියි. නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිසද, නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිසද, නොදුටු ධ්‍යාන ආදිය දකිණු පිණිසද උත්සාහ නොකරයි. මේ සයවෙනි කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහට සුළු අසනීපයක් හටගත්තේ වෙයිද, ඔහුට මෙබඳු සිතක් වෙයි. මට සුළු අසනීපයක් වැළඳුනේ වෙයි, නිදන්ට සුදුසුකම් ඇත්තේය. එබැවින් මම නිදාගනිමියි හෙතෙම නිදයි. නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිසද නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිසද, නොදුටු ධ්‍යාන ආදිය දකිනු පිණිසද වීර්යය නොකරයි. මේ සත්වෙනි කුසීත වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම ගිලන්කමින් නැගිටියි. ගිලන්කමින් නැගී සිටි නොබෝ කල් ඇත්තේ වෙයි, ඔහුට මෙබඳු සිතක් වෙයි. මම ගිලන්කමින්

නැගී සිටියේ, ගිලන් බැවින් නැගී සිටි නොබෝකල් ඇත්තේ වෙමි. ඒ මාගේ ශරීරය දුර්වල වූයේ කටයුතු කිරීමට අසමර්ථ වූයේ වෙමි. නිදාගන්ට සුදුසුකම් ඇත්තේය. එබැවින් මම නිදාගනිමියි හෙතෙම නිදාගනියි. නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිසද නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිසද නොදුටු ධ්‍යාන ආදිය දැකීම පිණිසද වීර්යයනොකරයි. මේ අටවෙනි කුසීත වස්තුවයි. (යන අටයි)

23. "කවර නම් ධර්ම අටක් විශෙෂ ගුණ ඉපදවීම පිණිස වන්නාහුද, වීර්යය කිරීමේ කරුණු අටය. ඇවැත්නි, මේ සස්නෙහි මහණහු විසින් වත් පිළිවෙත් කටයුතු වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මා විසින් සිවුරු කිරීම් ආදි කළයුතු වැඩ ඇත්තේය. කටයුතු කරන්නාවූ මට බුදුන් වහන්සේගේ අවවාදය සිහිකිරීම අමාරු වෙයි. එබැවින් මම නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිසද නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිසද නොදුටු ධ්‍යාන ආදිය දැකීම පිණිසද වීර්යයකරමියි හෙතෙම නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිස නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිස නොදුටු ධ්‍යාන ආදිය දැකීම පිණිස උත්සාහ කරයි. මේ පළමුවෙනි වීර්යය වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහු විසින් කටයුතු කරණ ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම කටයුතු කෙළෙමි. කටයුතු කරන්නාවූ මම බුදුන්ගේ අවවාදය සිහි කරන්ට නොහැකි වීමි, එබැවින් මම නොපැමිණි ධ්‍යාන ආදියට පැමිණීම පිණිසද නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිසද නොදුටු ධ්‍යාන ආදිය දැකීම පිණිසද වීර්යය කරමියි හෙතෙම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලත් ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ගඵලාදිය දකිනු පිණිස වීර්යය කරයි. මේ දෙවෙනි වීර්යය වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහු විසින් ගමනක් යායුතු වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි, මා විසින් ගමනක් යායුතු වන්නේය, මාර්ගයෙහි යන්නාවූ මා විසින් බුදුන්ගේ අවවාදය සිහි කරන්ට පහසු නොවෙයි. එබැවින් මම නොපැමිණි

මාර්ගඵලාදියට පැමිණීම පිණිසද, නොලත් ධ්‍යානාදිය ලැබීම පිණිසද, නොදුටු මාර්ග ඵලාදිය දකිණු පිණිසද වීර්යයකරමියි හෙතෙම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිසද, නොලත් ධ්‍යානාදිය ලැබීම පිණිසද නොදුටු මාර්ගඵලාදිය දකිනු පිණිසද වීර්යය කරයි. මේ තුන්වෙනි වීර්යය වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණහු විසින් ගමනක් යන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. 'මම ගමනක් ගියෙමි. මග යන්නාවූ මම බුදුන්ගේ අවවාදය සිහි කරන්ටනොහැකි වීමි. එබැවින් මම නොපැමිණි මාර්ග ඵලාදියට පැමිණීම පිණිසද, නොලත් ධ්‍යානාදිය ලැබීම පිණිසද, නොදුටු මාර්ගඵලාදිය දකිනු පිණිසද වීර්යය කරමියි. හෙතෙම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලත් ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ග ඵලාදිය දකිනු පිණිස වීර්යය කරයි. මේ සතරවෙනි වීර්යය වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම ගමක හෝ නියම් ගමක හෝ පිඬු පිණිස ගොස් කටුකවූ හෝ මිහිරිවූ හෝ භොජනයක් ඇතිතාක් නොලබයි. ඔහුට මෙබඳු සිතක් වේ. 'මම ගමකට හෝ නියම්ගමකට හෝ පිඬු පිණිස ගොස් කටුකවූ හෝ මිහිරිවූ හෝ භෝජනයක් ඇති තාක් නොලදිමි. ඒ මාගේ ශරීරය සැහැල්ලු වූයේ කටයුතු කිරීමට සුදුසු වූයේ වෙයි. එබැවින් මම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිසද, නොලත් ධ්‍යානාදිය ලැබීම පිණිසද, නොදුටු මාර්ග ඵලාදිය දකිණු පිණිසද වීර්යය කරමියි හෙතෙම නොපැමිණි මාර්ග ඵලාදියට පැමිණීම පිණිසද නොලැබූ ධ්‍යාන ආදිය ලැබීම පිණිසද නොදිටු මාර්ගඵලාදිය දකිනු පිණිසද උත්සාහ කරයි. මේ පස්වෙනි වීර්යය වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම ගමක හෝ නියම් ගමක හෝ පිඬු පිණිස ගොස් කටුකවූ හෝ මිහිරිවූ හෝ භොජනයක් ඇතිතාක් ලබයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම වනාහි ගමකට හෝ නියම් මගකට හෝ පිඬු පිණිස ගියේ කටුකවූ හෝ මිහිරිවූ හෝ භොජනයක් ඇතිතාක් ලැබුවෙමි. ඒ

මාගේ ශරීරය බලවත් වූයේ කටයුතු කිරීමට සමර්ථ වේ. එබැවින් මම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිසද, නොලැබූ ධ්‍යානාදිය ලැබීම පිණිසද, නොදුටු මාර්ග ඵලාදිය දකිණු පිණිසද වීර්යය කරමියි හෙතෙම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලැබූ ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ගඵලාදිය දකිනු පිණිස වීර්යය කරයි. මේ හයවෙනි වීර්යය වස්තුවයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, භික්ෂුහට සුලු අසනීපයක් හටගත්තේ වේ. ඔහුට මෙබඳු සිතක් වේ. 'මට මේ ස්වල්ප අසනීපයක් උපන්නේ වෙයි. මේ අසනීපය වැඩිවන්නට හේතු ඇත්තේය. එබැවින් මම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලද ධ්‍යානාදිය ලැබිම පිණිස, නොදුටු මාර්ගඵලාදිය දකිනු පිණිස වීර්යය කරමියි' හෙතෙම වීර්යය කරයි. මේ සත්වෙනි වීර්යය වස්තුවයි.

නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, මහණ තෙම ගිලන්කමින් නැගී සිටියේ, ගිලන්කමින් නැගීසිටි නොබෝ කල් ඇත්තේ වෙයි, ඔහුට මෙබඳු සිතක් වෙයි. 'මම ගිලන්කමින් නැගී සිටියේ, ගිලන්කමින් නැගී සිටි නොබෝ කල් ඇත්තේ වෙමි. මේ අසනීපය නැවත ඇතිවන්නට ඉඩ ඇත්තේය. එබැවින් මම නොපැමිණි මාර්ගඵලාදියට පැමිණීම පිණිස, නොලැබූ ධ්‍යානාදිය ලැබීම පිණිස, නොදුටු මාර්ගඵලාදිය දකිනු පිණිස වීර්යය කරමියි' උත්සාහ කරයි. මේ අටවෙනි වීර්යය වස්තුවයි. මේ ධර්ම අට ගුණ විශෙෂ පිණිස වන්නාහ.

**24.** "කවර නම් ධර්ම අටක් දුකසේ දැනගත යුත්තාහුද? බ්‍රහ්මචරිය වාසයට නුසුදුසුවූ අකල් අටය. ඇවැත්නි, මේ ලොකයෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේද ලොව උපන්නේ වෙයි. කෙලෙස් සංසිඳුවන්නාවූ, කෙලෙස් නැතිකිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ සතර මාර්ගඥාන අවබොධය කරා යන්නාවූ සුගතයන්වහන්සේ විසින් දැන වදාළාවූ ධර්මයද දෙශනා කරනු ලැබේ. මේ පුද්ගලයා නිරයෙහි උපන්නේ වෙයි. (එහෙයින් ඒ) බ්‍රහ්මචරිය වාසයට නුසුදුසුවූ පළමුවන අකාලය වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේද ලොව උපන්නේ වෙයි. කෙලෙස් සංසිඳුවන්නාවූ, කෙලෙස් නැතිකිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ සතර මාර්ගඥාන අවබොධය කරා යන්නාවූ සුගතයන් වහන්සේ විසින් දැන වදාළාවූ ධර්මයද දෙශනා කරණු ලැබේ. මේ පුද්ගල තෙමේද තිරිසන් යෝනියෙහි උපන්නේ වෙයි. (එහෙයින්) බ්‍රහ්මචරිය වාසයට නුසුදුසුවූ මේ දෙවෙනි අකාලයයි.

"නැවත අනිකක්ද කියමි, ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේද ලොව උපන්නේ වෙයි. කෙලෙස් සංසිඳුවන්නාවූ සහමුලින් කෙලෙස් නැති කිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ සතර මාර්ගඥාන අවබොධය කරා යන්නාවූ සුගතයන්වහන්සේ විසින් දැන වදාළාවූ ධර්මයද දෙශනා කරනු ලබයි. මේ පුද්ගලතෙමේද ප්‍රෙත ලොකයෙහි උපන්නේ වෙයි. බ්‍රහ්ම චරිය වාසයට නුසුදුසුවූ මේ තුන්වෙනි අකාලයයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේද, ලොව උපන්නේ වෙයි. කෙලෙස් සංසිඳුවන්නාවූ සහමුලින් කෙලෙස් නැති කිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ සතර මාර්ග ඥානය කරා ගමන් කරන්නාවූ සුගතයන් වහන්සේ විසින් දැන වදාළාවූ ධර්මයද දෙශනා කරනු ලැබෙයි. මේ පුද්ගලතෙමේද දීර්ඝ ආයුෂ ඇති අසඤ්ඤතලයෙහි හෝ අරූප තලයෙහි හෝ උපන්නේ වෙයි. බ්‍රහ්මචරිය වාසයට නුසුදුසුවූ මේ සතරවෙනි අකාලයයි.

නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේද, ලොව උපන්නේ වේද. කෙලෙස් සංසිවඳුන්නාවූ සහමුලින් කෙලෙස් නැති කිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ සතර මාර්ග ඥානය කරා ගමන් කරන්නාවූ සුගතයන් වහන්සේ විසින් දැන වදාළාවූ ධර්මයද දෙශනා කරනු ලැබේද. යම් තැනක භික්ෂූන්ගේද භික්ෂුණීන්ගේද උපාසකයන්ගේද උපාසිකාවන්ගේද පැමිණීමක් නැත්තේද,

එබඳුවූ ම්ලෙච්ඡවූ අප්‍රසිද්ධවූ, පිටිසර පෙදෙස්වල මේ පුද්ගල තෙමේ උපන්නේ වේද බ්‍රහ්මචරිය වාසයට නුසුදුසුවූ මේ පස්වෙනි අකාලය වේ.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේද, ලොව උපන්නේ වේ. කෙලෙස් සංසිවඳුන්නාවූ සතර මාර්ගඥානය අවබොධය කරා ගමන්කරන්නාවූ සුගතයන් වහන්සේ විසින් දැන වදාළාවූ ධර්මයද දෙශනා කරනු ලබයි. මේ පුද්ගලයාද මධ්‍ය දෙශයෙහි ඉපදුනේ වෙයි, හෙතෙමේද පෙරළුණු දැකුම් ඇති මිථ්‍යාදෘෂ්ටියෙක් වේ. එනම් දීමෙහි විපාක නැත. මහදන් දීමෙහි විපාක නැත. පිදීමෙහි විපාක නැත. යහපත් අයහපත් වශයෙන් කරණලද කර්මයන්ගේ ඵලයක් විපාකයක් නැත, මෙලොවක් නැත, පරලොවක් නැත, මවුට උපකාර කිරීමේ ඵල නැත, පියාට උපකාර කිරීමේ ඵල නැත, මැරී උපදින්නාවූ සත්වයෝ නැත. යම් කෙනෙක් මෙලොවද පරලොවද තෙමේ හොඳ නුවණින් දැන අවබොධ කොට ප්‍රකාශ කෙරෙද්ද, එබඳුවූ හොඳ මාර්ගයෙහි ගමන්කළාවූ හොඳ පිළිවෙත පිළිපදින්නාවූ මහණ බමුණෝ ලොකයෙහි නැත කියායි. මේ බ්‍රහ්මචරිය වාසයට නුසුදුසු කාලයවූ සයවෙනි අකාලයයි.

"නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේද ලොව උපන්නේ වෙයි. කෙලෙස් සංසිඳුවන්නාවූ, සහමුලින් කෙලෙස් නැති කිරීමෙන් පිරිනිවීම පිණිස පවත්නාවූ, සතර මාර්ගඥානය අවබොධය කරා ගමන් කරන්නාවූ සුගතයන්වහන්සේ විසින් දැන වදාළාවූ ධර්මයද දෙශනා කරනු ලැබේ. මේ පුද්ගලයාද මධ්‍ය දෙශයෙහි උපන්නේ වෙයි. හෙතෙමේද මෝඩවූ කෙල තොලුවූ හොඳ නරක කියුම්වල අර්ථය දැන ගන්නට බැරි නුවණ නැත්තෙක් වේ. මේ බ්‍රහ්මචරිය වාසයට සුදුසුනොවූ සත්වෙනි අකාලයයි.

නැවත අනිකක්ද කියමි. ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේද ලොව නූපන්නේ වෙයි. කෙලෙස් සංසිඳුවන්නාවූ, සහමුලින් කෙලෙස් නැතිකිරීමෙන් පිරිනිවීම

පිණිස පවත්නාවූ, සතර මාර්ගඥානාවබොධය පිණිස පවත්නාවූ සුගතයන් වහන්සේ විසින් දැන වදාළාවූ ධර්මයද දෙශනා කරණු නොලැබේ. මේ පුද්ගල තෙමේද මධ්‍යම දෙශයෙහි ඉපදුනේ වෙයි. හෙතෙමේද මෝඩ නුවූ, කෙලතොලු නොවූ හොඳ නරක කියුම්වල අර්ථය දැනගන්ට සමර්ථවූ නුවණැත්තෙක් වෙයි. මේ බ්‍රහ්මචරියවාසයට නුසුදුසුවූ අටවෙනි අකාලයයි. මේ ධර්ම අට ප්‍රතිවෙධ කිරීම දුෂ්කරය.

**25.** ඇවැත්නි, කවරනම් ධර්ම අටක් ඉපදවිය යුත්තාහුද? මහා පුරුෂ කල්පනා අටය, මේ ධර්මය තෙමේ අල්පෙච්ඡ (ටිකකින් සතුටුවන) පුද්ගලයාහට වන්නේය. මේ ධර්මය ප්‍රත්‍යය ආදිය බොහෝ කැමති වන්නාහට නොවේ. මේ ධර්මය තෙමේ සන්තුෂ්ට (ලද පමණින් සතුටුවන) පුද්ගලයාහට වන්නේය. මේ ධර්මය තෙමේ අසන්තුෂ්ටයා (ලද පමණින් සතුටු නොවන) හට නොවේ. මේ ධර්මය තෙමේ උසස් විවේක ඇත්තාහටය. මේ ධර්මය තෙමේ සංගණිකා රාමයෙහි (පිරිස් හා කෙලෙස් අතර) ඇලුනහුට නොවේ. මේ ධර්මය පටන් ගත් වීර්‍ය්‍ය ඇත්තාහටය. මේ ධර්මය කුසීතයා හට නොවේ. මේ ධර්මය තෙමේ එළඹසිටි සිහිඇත්තාහුටය. මේ ධර්මය මුළාවූ සිහිඇත්තහුට නොවේ. මේ ධර්මය තෙමේ එකඟවූ සිත් ඇත්තාහටය. මේ ධර්මය තෙමේ එකඟවුනු සිත් ඇත්තහුට නොවේ. මේ ධර්මය අඥානයාහට නොවේ. මේ ධර්මය තෙමේ නුවණැත්තා හටය, මේ ධර්මය ප්‍රමාද නුවූවහුටය. මේ ධර්මය තෙමේ ප්‍රමාද වාසයෙහි යෙදුනහුට නොවේ. මේ ධර්මය නිෂ්ප්‍රපඤ්චයෙහි (තණ්හා දිට්ඨි මානයන් කරණ කොට ප්‍රමාද නොවී මෙහි) ඇලුනහුටය. මේ ධර්මය තෙමේ තණ්හා දිට්ඨි මාන යන ප්‍රමාදයෙහි ඇළුනහුට නොවන්නේයි. මේ ධර්ම අට ඉපදවිය යුත්තාහුය.

**26** "කවර නම් ධර්ම අටෙක් නුවණින් දතයුත්තාහුද? අෂ්ට අභිභායතනයෝයි. තමා කෙරෙහි රූප සංඥා ඇති, එක් පුද්ගලයෙක් ස්වල්පවූ යහපත් වර්ණ ඇති, අයහපත් වර්ණ ඇති පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩ පවත්වා, දනිමි දකිමියි, යන සංඥා ඇත්තේ වේ. මේ පළමුවෙනි අභිභායතනයයි.

"තමාකෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් අප්‍රමාණවූ යහපත් වර්ණ ඇති, අයහපත් වර්ණ ඇති, පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩගෙන දනිමි දකිමියි යන සංඥා ඇත්තේ වෙයි. මේ දෙවෙනි අභිභායතනයයි.

"තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් ස්වල්පවූ යහපත් වර්ණ ඇති, අයහපත් වර්ණ ඇති පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩගෙන දනිමි දකිමියි යන සංඥා ඇත්තේ වේ. මේ තුන්වෙනි අභිභායතනයයි.

"තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් අප්‍රමාණවූ යහපත් වර්ණ ඇති අයහපත්ව වර්ණ ඇති පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩගෙන දනිමි දකිමියි යන සංඥා ඇත්තේ වේ. මේ සතරවන අභිභායතනයයි.

"තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් නිල්වූ නිල්පාට ඇත්තාවූ නිල් පෙනීම ඇත්තාවූ නිල් බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. දියබෙරලිය මල යම්සේ නිල්වේද, නිල්පාට ඇත්තේද, නිල් පෙනීම ඇත්තේද නිල් බැබලුම් ඇත්තේද, බරනැස් වස්ත්‍රය දෙපසින් මට්ටම් කරණ ලද්දේ හෙවත් මඩනා ලද්දේ යම්සේ නිල්වේද, නිල්පාට වේද, නිල් පෙනීම් නිල් බැබලුම් ඇත්තේද, එපරිද්දෙන්ම තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් නිල්වූ නිල්පාට ඇත්තාවූ, නිල් පෙනීම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යන සංඥාඇත්තේ වේ. මේ පස්වෙනි අභිභායතනයයි.

"තමා කෙරෙහි අරූප සංඥා ඇති එක් පුද්ගලයෙක් රන්වන්වූ රන්වන් පැහැ ඇත්තාවූ රන්වන් පෙනීම ඇත්තාවූ රන්වන් බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. කිණිහිරිමල යම්සේ රන්වන් වේද රන්වන් පැහැ ඇත්තේද, රන්වන් පෙනීම ඇත්තේද රන්වන් බැබලුම් ඇත්තේද, බරණැස්හිවූ දෙපැත්තෙන් මට්ටම්කරණ ලද, වස්ත්‍රය රන්වන් වේද, රන්වන් පැහැ ඇත්තේද, රන්වන් දැකුම් ඇත්තේද, රන්වන් බැබලුම් ඇත්තේද, එමෙන්ම තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් රන්වන්වූ,

රන්වන්පාට ඇති, රන්වන් පෙනීම ඇත්තාවූ රන්වන් බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩගෙන දනිමි දකිමි යන සංඥා ඇත්තේවෙයි. මේ සයවෙනි අභිභායතනයයි.

තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් ලේ පාටවූ ලේපාට පැහැ ඇති ලේපාට පෙනීම ඇති ලේපාට බැබලුම් ඇති පිටත්හි රූපයන් දකියි. බඳුවදමල යම්සේ ලේවන් වේද ලේවන් පාට ඇත්තේද, ලේවන් පෙනීම ඇත්තේද, ලේවන් බැබලුම් ඇත්තේද, බරණැසෙහිවූ දෙපැත්තෙන් හොඳාකාර මට්ටම් කරණ ලද ලේවන්වූ වස්ත්‍රය යම්සේ ලේවන් පාට ඇත්තේද, ලේවන් පෙනීම ඇත්තේද ලේවන් බැබලුම් ඇත්තේද, එපරිද්දෙන්ම තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් රතුවූ රතුපාට ඇත්තාවූ රතුපාට පෙනීම ඇත්තාවූ රතු පාට බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යන සංඥා ඇත්තේ වේ. මේ සත්වෙනි අභිභායතනයයි.

"තමා කෙරෙහි අරූපසංඥා ඇති පුද්ගලයෙක් සුදුවූ සුදුපාට ඇත්තාවූ සුදු පෙනීම ඇත්තාවූ සුදු බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. දවහත් (සිකුරු) තරුව යම්සේ සුදුද සුදුපාට ඇත්තීද සුදු පෙනීම ඇත්තීද සුදු බැබලුම් ඇත්තීද බරණැසවූ දෙපසින් මට්ටම් කරණ ලද්දාවූ සුදුවූ වස්ත්‍රය යම්සේ සුදුපාට ඇත්තේද, සුදු පෙනීම ඇත්තේද, සුදු බැබලුම් ඇත්තේද එපරිද්දෙන්ම තමා කෙරෙහි අරූප සංඥා ඇති පුද්ගලයෙක් සුදුවූ සුදු වර්ණ ඇත්තාවූ සුදු පෙනීම ඇත්තාවූ සුදු බැබලීම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යන සංඥා ඇත්තේ වෙයි. මේ අටවෙනි අභිභායතනයයි. මේ ධර්ම අට විශෙෂ නුවණින් දතයුත්තාහුය.

**29.** "කවර නම් ධර්ම අටක් තමාම ප්‍රත්‍යක්ෂකොට දැක්ක යුතු වන්නාහුද? විමොක්ෂ අටය. රූපාවචරධ්‍යානයෙන් යුක්ත වූයේ රූප දකියි. මෙය පළමුවෙනි විමොක්ෂය වන්නේය. තමා කෙරෙහි අරූප සංඥා ඇත්තේ පිටත්හි රූපයන් දකියි. මේ දෙවෙනි විමොක්ෂයයි. සුභයයිම තීරණය කර ගත්තේ වෙයි, මේ තුන්වෙනි විමොක්ෂයයි. සියලු ආකාරයෙන් රූප සංඥාවන්

ඉක්මවීමෙන් හැපීම්සංඥාවන් නැසීමෙන් වෙන් වෙන් සංඥාවන් කල්පනා නොකිරීමෙන් ආකාශය අනන්තයයි. ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරයි. මේ සතරවෙනි විමොක්ෂයයි. සියලු ආකාරයෙන් ආකාසනඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරයි, මේ පස්වෙනි විමොක්ෂයයි. සියලු ආකාරයෙන් විඤ්ඤානඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤාවතනයට පැමිණ වාසය කරයි. මේ සවෙනි විමොක්ෂයයි. සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මේ සත්වෙනි විමොක්ෂයයි. සියලු ආකාරයෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ඉක්මවා සංඥා වෙදයිත නිරොධයට (නිරොධ සමාපත්තියට) පැමිණ වාසය කරයි. මේ අටවෙනි විමොක්ෂයයි. මේ අෂ්ට ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කටයුත්තාහුය. මෙසේ ඇත්තාවූද සත්‍යවූද එසේමවූද වෙනස් නොවන්නාවූද අන්පරිද්දකින් නොවන්නාවූද මේ අසූවක් ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් මනාකොට අවබොධ කරණ ලද්දාහුය.

**30.** ධර්ම නවයක් බොහෝ උපකාර වන්නාහුය. ධර්ම නවයක් වැඩිය යුත්තාහුය. ධර්ම නවයක් පිරිසිඳ දතයුත්තාහුය. ධර්ම නවයක් දුරු කටයුත්තාහුය. ධර්ම නවයක් පිරිහීම පිණිස වන්නාහුය. ධර්ම නවයක් ගුණ විශෙෂයට පැමිණීම පිණිස වන්නාහුය. ධර්ම නවයක් දුකසේ අවබොධ කළයුත්තාහ. ධර්ම නවයක් ඉපදවිය යුත්තාහුය. ධර්ම නවයක් විශෙෂ නුවණින් දතයුත්තාහුය. ධර්ම නවයක් තමාම දැන ප්‍රත්‍යක්ෂ කටයුත්තාහුය.

"කවර නම් ධර්ම නවයක් බොහෝ උපකාර වන්නාහුද? නුවණින් මෙනෙහි කිරීම මුල්කොට ඇති ධර්ම නවයයි. නුවණින් මෙනෙහි කරන්නාහට ප්‍රමොද්‍යය (මද සතුට) උපදී. ප්‍රමොද්‍යයවූවහුට ප්‍රීතිය (බලවත් සතුට) උපදී. ප්‍රීති සිත් ඇත්තහුගේ නාමකය සංසිඳේ. සංසිඳුනු නාමකය ඇත්තේ සැප විඳී. සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි. එකඟවූ සිත ඇති කල්හි ඇති සැටියෙන් දකියි. ඇති සැටියෙන් දකින්නේ

කළකිරෙයි. කළකිරෙන්නේ නොඇලෙයි. නොඇලෙන්නේ සියලු දුකෙන් මිදෙයි. මේ ධර්ම නවය බොහෝ උපකාර වන්නාහුය.

"කවර නම් ධර්ම නවයක් වැඩිය යුත්තාහුද? පිරිසිදුබවට ප්‍රධානවූ අංග නවයයි. ශීල විසුද්ධිය (සිව් පිරිසුදු සීලය) නම්වූ පිරිසුදු බවට ප්‍රධාන අංගය, චිත්තවිසුද්ධිය (විදර්ශනාවට ආසන්න හෙතුවවූ අෂ්ට සමාපත්ති) නම්වූ පිරිසිදු බවට ප්‍රධාන අංගය, දෘෂ්ටි විශුද්ධිය (ප්‍රත්‍ය සහිතව නාම රූප දැකිම) නම්වූ පිරිසිදු බවට ප්‍රධාන අංගය, කංඛාවිතරණ විශුද්ධිය (නාම රූපයන්ගේ ප්‍රත්‍යය දැකීම) නම් පිරිසිදු බවට ප්‍රධාන අංගය, මාර්ගාමාර්ගඥානදර්ශනවිශුද්ධිය (මග නොමග දැනීම) නම්වූ පිරිසිදු බවට ප්‍රධාන අංගය, ප්‍රතිපදාඥානදර්ශනවිශුද්ධිය (තරුණ විදර්ශනාව) නම් පිරිසිදු බවට ප්‍රධාන අංගය, ඥානදර්ශනවිසුද්ධිය (වුට්ඨානගාමිනී විදර්ශනාව) නම්වූ පිරිසිදු බවට ප්‍රධාන අංගය, ප්‍රඥාවිසුද්ධිය (රහත්ඵල නුවණ) නම් පිරිසිදු බවට ප්‍රධාන අංගය වේ. මේ ධර්ම නවය වැඩියයුත්තාහුය.

"කවර නම් ධර්ම නවයක් පිරිසිඳ දතයුත්තාහුද? සත්වා වාස නවයයි. ඇවැත්නි, මේ ධර්ම නවය පිරිසිඳ දතයුතු වන්නාහ. නොයෙක් ශරීර ඇති නොයෙක් ප්‍රතිසන්ධි විඤ්ඤාණ ඇති සත්වයෝ වෙත්. මනුෂ්‍යයෝද, ඇතැම් දෙවියෝද, ඇතැම් විනිපාතික ප්‍රේතයෝද යම්සේද එමෙනි. මේ පළමුවෙනි සත්වාවාසයයි.

"ඇවැත්නි, වෙනස් ශරීර ඇති සමාන ප්‍රතිසන්ධි විඤ්ඤාණ ඇති සත්වයෝ වෙත්. පළමුවන ධ්‍යානයෙන් උපන්නාවූ බ්‍රහ්මකායික බඹලොව වැසි දෙවියෝ යම්සේද එමෙනි. මේ දෙවෙනි සත්වාවාසයයි.

"ඇවැත්නි, එකසමාන ශරීර ඇති වෙනස් ප්‍රතිසන්ධි විඤ්ඤාණ ඇති සත්වයෝ වෙත්. ආභස්වර දෙවියෝ යම්සේද එමෙනි. මේ තුන්වෙනි සත්වාවාසයයි.

"ඇවැත්නි, එකසමාන ශරීර ඇති එකසමාන ප්‍රතිසන්ධි විඤ්ඤාණ ඇති සත්වයෝ වෙත්. සුභකිණ්හ දෙවියන් මෙනි. මේ සතරවෙනි සත්වාවාසයයි.

"ඇවැත්නි, හැඟීමක් නැත්තාවූ විඳීමක් නැත්තාවූ සත්වයෝ වෙත්. අසඤ්ඤසත්ත දෙවියන් මෙනි. මේ පස්වෙනි සත්වාවාසයයි.

"ඇවැත්නි, සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් ගැටීම් සංඥාවන් නැසීමෙන් නොයෙක් සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසනඤ්චායතනයට පැමිණියාවූ සත්වයෝ වෙත්. මේ සයවෙනි සත්වාවාසයයි.

"ඇවැත්නි, සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා, විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණියාවූ සත්වයෝ වෙත්. මේ සත්වෙනි සත්වාවාසයයි.

"ඇවැත්නි, සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියාවූ සත්වයෝ වෙත්. මේ අටවෙනි සත්වාවාසයයි.

"ඇවැත්නි, සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණියාවූ සත්වයෝ වෙත්. මේ නවවන සත්වාවාසයයි. මේ පිරිසිඳ දතයුතු ධර්ම නවය වන්නාහ.

31. කවර නම් ධර්ම නවයක් දුරු කටයුත්තාහුද? තෘෂ්ණාව මුල්කොට ඇති ධර්ම නවයයි. තෘෂ්ණාව නිසා සෙවීම වන්නේය. සෙවීම නිසා ලාභය වන්නේය. ලාභය නිසා විනිශ්චය වන්නේය. විනිශ්චය නිසා ඡන්දරාගය (ඇල්ම) වන්නේය. ඡන්ද රාගය නිසා අනුභවය වන්නේය. අනුභවය නිසා පරිග්‍රහණය (අයිතිකර ගැනීම) වන්නේය. පරිග්‍රහණය නිසා මසුරු බව වන්නේය. මසුරු බව නිසා ආරක්ෂා කිරීම වන්නේය. ආරක්ෂා කිරීම නිසා දඬු ගැනුම්, ආයුධ ගැනුම් කෝලාහල විවාද කේලාම් බොරුකීම්ද නොයෙක් ලාමක අකුශල කර්මයෝද වෙත්. මේ ධර්ම නවය දුරුකට යුත්තාහුය.

"කවර නම් ධර්ම නවයක් හානභාගිය වන්නාහුද? ක්‍රොධ කරුණු නවයයි. 'මට අවැඩක් කෙළේයයි,' ක්‍රොධය බඳියි. 'මට අවැඩක් කරයි කියා' ක්‍රොධය බඳියි. 'මට අවැඩක් කරන්නේ යයි කියා' ක්‍රොධය බඳියි. 'මාගේ ප්‍රියවූ මනාපවූවහුට අවැඩක්

කළේය. අවැඩක් කරයි. අවැඩක් කරන්නේයයි' ක්‍රොධය බඳියි. 'මාගේ අප්‍රියවූ අමනාප වූවහුට යහපතක් කෙළේය. යහපතක් කරයි.' යහපතක් කරන්නේයයි ක්‍රොධය බඳියි.

"ක්‍රොධය දුරුකිරීම් නවයක් වෙත්. 'මට අවැඩක් කළේය. ඒ අනිකාගේ අවැඩ නොකිරීම මා විසින් කෙසේ ලැබිය හැකිදැයි' සිතා ක්‍රොධය දුරු කරයි. 'මට අවැඩක් කරයි, ඒ අනිකාගේ අවැඩ නොකිරීම මා විසින් කෙසේ ලැබිය හැකිදැයි' සිතා ක්‍රොධය දුරු කරයි. 'මට අවැඩක් කරන්නේය. ඒ අනිකාගේ අවැඩ නොකිරීම මා විසින් කෙසේ ලැබිය හැකිදැයි' සිතා ක්‍රොධය දුරු කරයි. 'මාගේ ප්‍රියවූ මනාප වූවහුට අවැඩක් කළේය. අවැඩක් කරයි, අවැඩක් කරන්නේය. ඒ අනිකාගේ අවැඩ නොකිරීම මා විසින් කෙසේ ලැබිය හැකිදැයි' සිතා ක්‍රොධය දුරු කරයි. 'මාගේ අප්‍රියවූ අමනාප වූවහුට යහපතක් කළේය. යහපතක් කරයි, යහපතක් කරන්නේය. එසේ අප්‍රියවූවහුට අන්‍යයා විසින් යහපතක් නොකිරීම මා විසින් නොලැබිය හැකියයි සිතා ක්‍රොධය දුරු කරයි. මේ ධර්ම නවය විශෙෂභාගිය නම් වන්නාහුය.

"කවර නම් ධර්ම නවයක් දුකසේ අවබොධ කටයුත්තාහුද? නානත්ව (නොයෙක් බැව්) නවයයි. ඇස ආදි නොයෙක් ධාතු නිසා රූප ආදියෙහි ගැටීම නමැති නොයෙක් ස්පර්ශ උපදියි. නොයෙක් ස්පර්ශ නිසා නොයෙක් වේදනා උපදියි. නොයෙක් වේදනා නිසා නොයෙක් හැඟීම් උපදියි. නොයෙක් හැඟීම් නිසා නොයෙක් කල්පනා උපදියි. නොයෙක් කල්පනා නිසා නොයෙක් ආශා උපදියි. නොයෙක් ආශා නිසා නොයෙක් දැවිලි උපදියි. නොයෙක් දැවිලි නිසා නොයෙක් සෙවීම් උපදියි. නොයෙක් සෙවීම් නිසා නොයෙක් ලාභ උපදියි. නොයෙක් ලාභ නිසා නොයෙක් ලොභ උපදියි. මේ ධර්ම නවය දුකසේ අවබොධ කළ යුත්තාහ.

"කවර නම් ධර්ම නවයක් ඉපදවිය යුත්තාහුද? හැඟීම් නවයයි. අසුභ හැඟීමය, මරණ හැඟීමය, ආහාරයෙහි පිළිකුල් හැඟීමය, සියලු ලෝකයෙහි අනභිරති (නොඇලීම්) හැඟීමය, අනිත්‍ය හැඟීමය, අනිත්‍යයෙහි දුක් හැඟීමය, දුකෙහි අනාත්ම

හැඟීමය, දුරු කිරීම් හැඟීමය, නොඇලීම් හැඟීමය යනමේ ධර්ම නවය ඉපදවිය යුත්තාහුය.

32. "කවර නම් ධර්ම නවයක් විශෙෂ නුවණින් දතයුතු වන්නාහුද? අනුපූර්වවිහරණ (පිළිවෙළින් සමවැදිය යුතු විසීම්) නවයයි. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාරසහිතවූ විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති, ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් ද්විතීය ධ්‍යානයට පැමිණ වාසයකරයි. ප්‍රීතියගේද වැළක්මෙන් තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. සැපය දුරුකිරීමෙන් චතුර්ථ ධ්‍යානයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් රූපසංඥාවන් ඉක්මවීමෙන් ගැටීම් සංඥාවන් නැසීමෙන් නොයෙක් සංඥාවන් සිහි නොකිරීමෙන් අනන්තවූ ආකාසයයි ආකාසානඤ්චායතනයට පැමිණ වාසයකරයි. සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා අනන්තවූ විඤ්ඤාණයයි, විඤ්ඤානඤ්චායතනයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් විඤ්ඤානඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා, සඤ්ඤාවෙදයිත නිරොධයට (නිරොධ සමාපත්තියට) පැමිණ වාසය කරයි. මේ ධර්ම විශෙෂ නුවණින් දතයුත්තාහුය.

"කවර නම් ධර්ම නවයක් තමාම ප්‍රත්‍යක්ෂ කටයුතු වන්නාහුද? අනුපූර්ව නිරොධ (පිළිවෙළින් නැති කිරීම්) නවයයි. ප්‍රථම ධ්‍යානයට පැමිණියහුගේ කාම හැඟීම නැතිවේ. ද්විතීය ධ්‍යානයට පැමිණියහුගේ විතර්ක විචාරයෝ නැතිවෙත්. තෘතීය ධ්‍යානයට පැමිණියහුගේ ප්‍රීතිය නැතිවේ. චතුර්ථ ධ්‍යානයට පැමිණියහුගේ ආශ්වාස ප්‍රශ්වාසයෝ නැතිවෙත්. ආකාසානඤ්චායතනයට පැමිණියහුගේ රූප සංඥාව නැතිවේ. විඤ්ඤානඤ්චායතනයට පැමිණියහුගේ ආකාසානඤ්චායතන සංඥාව නැතිවේ. ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියහුගේ

විඤ්ඤාණඤ්චායතන සංඥාව නැතිවේ. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණියහුගේ ආකිඤ්චඤ්ඤායතන සංඥාව නැති වේ. සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණියහුගේ සංඥාවද විඳීමද නැතිවෙත්. මේ ධර්ම නවය ප්‍රත්‍යක්ෂ කටයුතු වන්නාහුය. මෙසේ ඇත්තාවූ සත්‍යවූ එසේමවූ වෙනස් නොවන්නාහු අන් පරිද්දකින් නොවන්නාවූ මේ අනූවක් ධර්මයෝ තථාගතයන් වහන්සේවිසින් මනාව අවබොධ කරණ ලද්දාහුය.

"ධර්ම දශයක් බොහෝ උපකාරවන්නාහුය. ධර්ම දශයක් වැඩිය යුත්තාහුය, ධර්ම දහයක් දුරුකට යුත්තාහුය, ධර්ම දශයක් හානභාගික වන්නාහුය, ධර්ම දශයක් විශෙෂ භාගික වන්නාහුය. ධර්ම දශයක් අපහසුවෙන් අවබොධ කළයුතු වන්නාහුය. ධර්ම දශයෙක් ඉපදිය යුත්තාහුය, ධර්ම දශයෙක් විශෙෂ නුවණින් දතයුතු වන්නාහුය. ධර්ම දශයෙක් ප්‍රත්‍යක්ෂ කටයුතු වන්නාහුය.

"කවර නම් ධර්ම දශයෙක් බොහෝ උපකාර වන්නහුද? නාථ කරණ (පිහිටවන) ධර්ම දශයයි.

"ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සිල්වත්වේ. ප්‍රාතිමොක්ෂ සංවර (ශික්ෂාපද ශීල) යෙන් සංවරවූයේ වාසය කරයි. ආචාර ගොචර දෙකින් සමන්විත වූයේ ස්වල්පවූ වරදෙහිද භය දක්නා ගති ඇතිවූයේ ශික්ෂාපදයන් දැඩි කොට ගෙන් හික්මෙයි.

"ඇවැත්නි, මහණතෙම සිල්වත්වේද ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරව වාසය කෙරේද, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්ත වූයේ ස්වල්පවූද වරදවල භය දක්නේ ශික්ෂා පදයන්හි සමාදන්ව හික්මේය යන යමක් වේද මෙයද තමාට පිහිටවන ධර්මයක් වේ.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම ඇසූදේ දරන්නාවූ, ඇසූදේ රැස්කර හිතේ දරා ගන්නාවූ බොහෝ ඇසූ කෙනෙක් වේ. මුල යහපත්වූද මැද යහපත්වූද, කෙළවර යහපත්වූද, අර්ථ සහිතවූද පද සහිතවූද, යම් ඒ ධර්මකෙනෙක් සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ, බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කෙරෙද්ද

එබඳුවූ ධර්මයෝ මොහු විසින් බොහෝ අසන ලද්දාහු දරණ ලද්දාහු වචනයෙන් පුරුදු කරණ ලද්දාහු, සිතින් කල්පනා කරණ ලද්දාහු, ඥානයෙන් හොඳින් අවබෝධ කරණ ලද්දාහු වෙත්. ඇවැත්නි, මහණතෙම ‘බොහෝ ඇසූ කෙනෙක්’ වේද, යම් මේ ධර්මකෙනෙක් මුල යහපත්වූද, මැද යහපත්වූද, කෙළවර යහපත්වූද, අර්ථය සහිතවූද, ව්‍යංජන සහිතවූද, සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශකෙරෙද්ද, එබඳුවූ ධර්මයෝ මොහු විසින් බොහෝ කොට අසන ලද්දාහු, දරණ ලද්දාහු, වචනයෙන් පුරුදු කරන ලද්දාහු, සිතින් කල්පනා කරන ලද්දාහු ඥානයෙන් හොඳින් අවබෝධ කරණ ලද්දාහු වෙත්ද යන යමක් වේද, මේ ධර්මයද තමාට පිහිටවන ධර්මයකි.

“නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම යහපත් මිත්‍රයන් යහළු කොට ඇත්තේ, යහපත් මිත්‍රයන් කෙරෙහි නැමීම ඇත්තේ, යහපත් මිත්‍රයන් ඇත්තේ වේ. ඇවැත්නි, යම් හෙයකින් මහණතෙම යහපත් මිත්‍රයන් ඇත්තේ යහපත් මිත්‍රයන් යහළු කොට ඇත්තේ යහපත් මිත්‍රයන් කෙරෙහි නැමීම ඇත්තේ වේද, මේ ධර්මයද තමාට පිහිට වන ධර්මයකි.

“නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම සුවච බැවින් හෙවත් කියන දේ අසන ගතියෙන් යුක්ත වූයේ, සුවචයෙක්වේ. නොකිපෙන ගති ඇති අනුශාසනාව ආදරයෙන් පිළිගන්නා කෙනෙක් වෙයි. ඇවැත්නි, මහණතෙම සුවචයෙක් වේද නොකිපී අනුශාසනාව ආදරයෙන් පිළිගන්නේ වේද, යන යමක් වේද, මේද තමාට පිහිට වන ධර්මයකි.

“නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම එකට මහණදම් පුරන භික්ෂූන්ගේ යම් ලොකු කුඩා කටයුතු වෙත්ද, එහි දක්ෂ වූයේ කම්මැලි නොවූයේ, ඒ වැඩට යොග්‍ය උපක්‍රම දැනීමෙන් යුක්තවූයේ වැඩ කරන්ටද පිළිවෙළ කරන්ටද සුදුසු වෙයි, ඇවැත්නි, මහණතෙම එකට මහණදම් පුරන භික්ෂූන්ගේ කුඩා මහත් කටයුතු ‘කිමෙක්දැයි’ යි අසා කරන කටයුතු වෙත්ද එහි දක්ෂ වූයේ, අලස නොවූයේ, එහි උපාය දන්නේ පිළිවෙළ කිරීමට දන්නා නුවණින් යුක්ත වූයේ වෙයිද, මේද තමාට පිහිටවන ධර්මයකි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම ප්‍රියවූ කථා ඇත්තේ අභිධර්මයෙහි අභිවිනයෙහි (බුද්දක පරිවාරයෙහි හෝ කෙලෙස් සංසිඳුවන කරුණෙහි) මහත් සතුටු ගතිය ඇත්තේ ධර්මය කැමැත්තේ වේ. ඇවැත්නි, මහණ තෙම ධර්මය කැමැත්තේ වේද, ප්‍රියවූ වචන ඇත්තේ වේද, අභිධර්මයෙහි අභිවිනයෙහි මහත්වූ සතුටු ගතිය ඇත්තේය යන යමක් වේද මේද තමාට පිහිටවන ධර්මයකි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණ තෙම ලැබුන පරිදි, සිවුරුය, පිණ්ඩපාතය, සේනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන මෙයින් සතුටු වූයේ වෙයි, ඇවැත්නි, මහණතෙම ලද පරිදි සිවුරුය, පිණ්ඩපාතය, සේනාසනය, ගිලන්පසය බෙහෙත් පිරිකරය යන මෙයින් සතුටු වෙයි යන යමකුත් වේද මේද තමාට පිහිටවන ධර්මයකි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම අකුසල ධර්මයන් දුරුකිරීම පිණිස කුසල ධර්මයන් වැඩීම පිණිස ශක්ති ඇත්තේ දැඩි වීරිය ඇත්තේ කුසල ධර්මයන්හි බහා නොතබන ලද වීරිය ඇත්තේ පටන්ගන්නා ලද වීර්යය ඇත්තේ වාසය කරයි. ඇවැත්නි, මහණ තෙම අකුසල ධර්මයන්ගේ දුරු කිරීම පිණිස කුසල ධර්මයන්ගේ වැඩීම පිණිස ශක්ති ඇත්තේද දැඩි උත්සාහය ඇත්තේද කුසල ධර්මයන්හි බහා නොතබන ලද බර ඇත්තේ පටන්ගන්නාද වීර්යය ඇත්තේ වාසය කරයි යන යමකුත් වේද, මේද තමාට පිහිටවන ධර්මයකි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණ තෙම උතුම්වූ සිහියෙන් හා හොඳ නුවණින් යුක්තවූයේ බොහෝ කලකට පෙර කරණ ලද්දද, බොහෝ කලකට පෙර කියන ලද්දද, සිහි කිරීමට, සමර්ථ සිහි ඇත්තේවේ. ඇවැත්නි, මහණතෙම උතුම් සිහියෙන් හා දක්ෂ නුවණින් යුක්තවූයේ බොහෝ කල්හි කරන ලද්දද, බොහෝ කල්හි කියන ලද්දද, සිහිකරන්නේ නැවත නැවත සිහි කරන්නේ සිහි ඇත්තේ වේද යන යමකුත් වේද, මේද තමාට පිහිට වන ධර්මයකි.

"නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙම ඇතිවීම නැතිවීම පිළිබඳ පවත්නාවූ ආයයීවූ සසර කලකිරීම

ඇතිකරන්නාවූ, හොඳකාර දුක් නැතිකිරීම පිණිස පවත්නාවූ නුවණින් යුක්තවූයේ නුවණැත්තේ වෙයි. ඇවැත්නි, මහණතෙම ඇතිවීම, නැතිවීම පිණිස පවත්නාවූ ආයඝ්‍යවූ නිබ්බේධිකවූ හෙවත් සසර කලකිරීම, මනාව දුක් නැති කිරීම පිණිස පවත්නාවූ නුවණින් යුක්ත වූයේ ප්‍රඥාවත් වෙයි යන යමකුත් වේද, මේද තමාට පිහිටවන ධර්මයකි. මේ ධර්ම දශය බොහෝ උපකාර වන්නාහුය.

33. "කවර නම් ධර්ම දශයක් වැඩිය යුත්තාහුද දශ කසිණායතනයෝයි. ඇතමෙක් උඩ, යට, සරස, එකමවූ (දෙකක් නැති) පෘථිවි කසිණය හඳුනයි ඇතැමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ ආපොකසිණය හඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ තොජො කසිණය අඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ වායො කසිණය හඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ නීල කසිණය හඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ පීතකසිණය හඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ ලොහිත කසිණය හඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ අප්‍රමාණවූ අවදාත කසිණය හඳුනයි. ඇතමෙක් උඩ යට සරස අද්වයවූ එකමවූ අප්‍රමාණවූ විඤ්ඤාණ කසිණය හඳුනයි, මේ ධර්ම දශය වැඩිය යුත්තාහුය.

"කවර නම් ධර්ම දශයෙක් පිරිසිඳ දත යුත්තාහුද? ආයතන දශයයි. චක්ෂු ආයතනය, රූප ආයතනය, ශ්‍රොත ආයතනය ශබ්ද ආයතනය, ඝ්‍රාණ ආයතනය, ජිව්හා ආයතනය, රස ආයතනය, කාය ආයතනය, ස්පර්ශ ආයතනය යන මේ ධර්ම දශය පිරිසිඳ දත යුත්තාහුය.

"කවර නම් ධර්ම දශයක් දුරු කටයුත්තාහුද? වැරදි ගති දශයයි, වැරදි දැකීම, වැරදි කල්පනාව, වැරදි වචනය, වැරදි කර්මාන්තය, වැරදි ජීවිකාවෘත්තිය, වැරදි ව්‍යායාමය, වැරදි සිහිය, වැරදි සමාධිය, වැරදි නුවණ, වැරදි මිදීම යන මේ දශ ධර්මයෝ දුරු කටයුත්තාහුය.

"කවර නම් ධර්ම දශයක් හානභාගිය වන්නාහුද? දශ අකුශල ධර්ම පථයෝය. සතුන් මැරීමය, සොරකම් කිරීමය,

කාමයන්හි වරදවා හැසිරීමය, බොරු කීමය, කේලාම් කීමය, ඵරුෂ වචන කීමය, හිස් වචන කීමය අභිධ්‍යාය (අනුන්ගේ දෙයට ලොභකිරීම) ව්‍යාපාදය, (අනුන් නැසේවා යන කල්පනාව) මිථ්‍යාදෘෂ්ටියය. මේ දශ ධර්මයෝ හානභාගිය නම් වන්නාහුය.

"කවර නම් ධර්ම දශයක් විශෙෂභාගික නම් වෙත්ද? දශ කුශල කර්ම පථයෝය. සතුන් මැරීමෙන් වැළකීමය, සොරකම් කිරීමෙන් වැළකීමය, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමය, බොරු කීමෙන් වැළකීමය, කේලාම්කීමෙන් වැළකීමය, ඵරුෂ වචනයෙන් වැළකීමය, හිස් කථාවලින් වැළකීමය, අනුන්ගේ දෙයට ලොභ නොකිරීමය, අනුන් නැසේවායි නොසිතීමය, නිවැරදි දෘෂ්ටිය යන මේ දශ ධර්මයෝ විශෙෂ භාගික නම් වන්නාහුය.

"කවර නම් ධර්ම කෙනෙක් දුකසේ දැනගතයුතු වන්නාහුද? ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ වාසය කිරීම් දශය වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම අංග පසක් දුරු කළේ වෙයි. අංග සයකින් යුක්ත වූයේ වෙයි. එක් ආරක්ෂාවක් ඇත්තේවෙයි. අපස්සෙන (හේත්තුවීම්) සතරක් ඇත්තේ වෙයි. දුරුකළ වෙන වෙන සත්‍යයන් ඇත්තේ වෙයි. සම්පූර්ණයෙන් දුරු කරණලද සියලු සෙවීම් ඇත්තේ වෙයි. නොකැළඹුනු කල්පනා ඇත්තේ සැහැල්ලු කායසංස්කාර ඇත්තේ වෙයි.

"ඇවැත්නි, මහණතෙම කෙසේ නම් දුරු කළ අංග පසක් ඇත්තේ වේද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණහුගේ කාම ආශාව පහකරන ලද්දේ වෙයි, ක්‍රොධය පහකරන ලද්දේ වෙයි. චිත්ත චෛතසිකයන්ගේ මැලිකම පහකරන ලද්දේ වෙයි. නොසන්සුන්කම හා පසුතැවීම පහකරන ලද්දේ වෙයි. සැකය පහකරන ලද්දේ වෙයි. ඇවැත්නි, මෙසේ මහණතෙම දුරුකරන ලද අංග පස ඇත්තේ වෙයි.

"ඇවැත්නි, කෙසේ නම් මහණතෙම අංග සියකින් යුක්ත වූයේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම ඇසින් රූපය දැක සතුටුද නොවෙයි, නොසතුටුද නොවෙයි, සිහි ඇත්තේ මනා දැනුම් ඇත්තේ සුව දුක් දෙකට මැදහත්ව වාසය

කරයි, කණින් ශබ්දය අසා නාසයෙන් ගඳ දැන දිවෙන් රස විඳ කයින් ස්පර්ශකොට සිතින් ධර්ම අරමුණු දැන සතුටුද නොවෙයි, නොසතුටුද නොවෙයි. සිහි ඇත්තේ මනා දැනුම් ඇත්තේ, මැදහත් විඳීමෙන් යුක්තව වාසයකරයි. ඇවැත්නි, මෙසේ මහණතෙම අංග සයකින් යුක්තවූයේ වෙයි.

"ඇවැත්නි, මහණතෙමේ එක් ආරක්ෂාවක් ඇතිව වාසය කරයි. කෙසේද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සිහිය නමැති ආරක්ෂාව ඇත්තාවූ සිතින් යුක්තවූයේ වෙයි. ඇවැත්නි, මෙසේ මහණතෙම එකම ආරක්ෂාවක් ඇත්තේ වෙයි.

"ඇවැත්නි, කෙසේ නම් මහණතෙම 'හේත්තුවීම්' සතරක් ඇත්තේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම නුවණින් සේවනය කළයුත්තක්ම සේවනය කරයි. නුවණින් දැන ඉවසිය යුත්තක්ම ඉවසයි. නුවණින් දැන පහකළ යුත්තක්ම පහකරයි හැරදමයි. ඇවැත්නි, මෙසේ මහණතෙම 'හේත්තුවීම්' සතරක් ඇත්තේ වේ.

"ඇවැත්නි, කෙසේ නම් මහණතෙම දුරුකරණ ලද නොයෙක් සත්‍ය ඇත්තේ වේද. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණහු විසින් බොහෝවූ මහණ බමුණන්ගේ වෙන වෙන නොයෙක් සත්‍යයෝ (ඇදහීම්) වෙත් නම් ඒ සියල්ල දුරුකරණ ලද්දාහුය, අතිශයින් දුරුකරණ ලද්දාහුය, හැරදමන ලද්දාහුය, වමාරන ලද්දාහුය, මුදාහරින ලද්දාහුය, නසන ලද්දාහුය, දුරලන ලද්දාහුය. ඇවැත්නි, මෙසේ මහණතෙම දුරුකරණ ලද වෙන වෙන නොයෙක් සත්‍ය ඇත්තේවෙයි.

"ඇවැත්නි, කෙසේ නම් මහණතෙම සම්පූර්ණයෙන් දුරු කරණ ලද සෙවීම් ඇත්තේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණහුගේ කාමයන් සෙවීම නැසුණේ වේ. භවයන් සොයන්නාවූ තණ්හාව නසන ලද්දේ වෙයි. බ්‍රහ්මචරියෙසනය (සදාකාලිකය යනාදීන් ගන්නා මිථ්‍යාදෘෂ්ටිය) පහකරන ලද්දේ වෙයි. ඇවැත්නි, මෙසේ මහණතෙම සම්පූර්ණයෙන් දුරුකළ සෙවීම් ඇත්තේ වේ.

"ඇවැත්නි, කෙසේ නම් මහණතෙම නොකැළඹුනු කල්පනා ඇත්තේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණහුගේ කාම කල්පනාව දුරුවූයේ වෙයි. ක්‍රොධ කල්පනාව දුරුවූයේ වෙයි. හිංසා කිරීමේ කල්පනාව දුරුවූයේ වෙයි. ඇවැත්නි, මෙසේ වනාහි මහණතෙම නොකැළඹුනු කල්පනා ඇත්තේ වේ.

"ඇවැත්නි, කෙසේ නම් මහණතෙම සංසිඳුනු කාය සංස්කාර ඇත්තේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සැප දුරුකිරීමෙන්, දුක් දුරුකිරීමෙන් කල් ඇතිවම දොම්නස් සොම්නස් දෙක නැසීමෙන් නිදුක්වූ නොසැපවූ උපෙක්ෂා සිහි දෙදෙනාගේ පිරිසිදු බව ඇති, සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි.

"ඇවැත්නි, මෙසේ වනාහි මහණතෙම සංසිඳුනු කාය සංස්කාර ඇත්තේ වේ.

"ඇවැත්නි, කෙසේ නම් මහණ තෙම හොඳින් මිදුනු සිත් ඇත්තේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුහුගේ සිත රාගයෙන් මිදුනේ වෙයි. ද්වෙෂයෙන් මිදුනේ වෙයි. මුලාවෙන් මිදුනේ වෙයි. ඇවැත්නි, මෙසේ වනාහි මහණ තෙම හොඳින් මිදුනාවූ සිත් ඇත්තේ වේ.

"ඇවැත්නි, කෙසේ නම් මහණතෙම හොඳින මිදුනු ප්‍රඥා ඇත්තේ වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම 'මා විසින් රාගය නැති කරන ලදී. මුල් සිඳින ලදී. මුදුන කපාදැමූ තල්ගසක් මෙන් කරනලදී. නැතිකරන ලදී. එය නැවත නූපදින ලෙස කරන ලදීයයි දනීද, ද්වෙෂය මා විසින් නැති කරනලදී. මුල්සිඳින ලදී. මුදුන කපාදමනලද තල්ගසක්මෙන් කරන ලදී. නැති කරන ලදී. එය නැවත නූපදින ලෙස කරන ලදීයයි දනීද, මොහය මා විසින් නැතිකරන ලදී. මුල් සිඳිනලදී. මුදුන කපනලද තල් ගසක් මෙන් කරන ලදී, නැති කරන ලදී, එය නැවත නූපදින ලෙස කපන ලදීය යි දනීද, ඇවැත්නි, මෙසේ මහණ තෙම හොඳින් මිදුනු ප්‍රඥා ඇත්තේ වෙයි. මේ ධර්ම දශය දුකසේ අවබොධ කටයුතු වන්නාහුය.

"කවර නම් ධර්ම දශයක් ඉපදවිය යුත්තාහුද? දශ සංඥාවෝය. අසුභ සංඥාවය, මරණ සංඥාවය, ආහාරයෙහි පිළිකුල් සංඥාවය, සියලු ලෝකයෙහි නොඇලීම් සංඥාවය, අනිත්‍ය සංඥාවය, අනිත්‍යයෙහි දුඃඛ සංඥාවය, දුකෙහි අනාත්ම සංඥාවය, ප්‍රහාන සංඥාවය, විරාග සංඥාවය, නිරොධ සංඥාවය, මේ දශ ධර්මයෝ ඉපදවිය යුත්තාහුය.

34. "කවරනම් ධර්ම දශයක් විශෙෂ නුවණින් දතයුත්තාහුද, නිර්ජර වස්තුහු (දිරා යන කරුණු) ය. හරි දැකීම ඇත්තාගේ වැරදි දැකීම දිරා ගියේ වෙයි. වැරදි දැකීම හේතුකොට ගෙන යම් යම් නොයෙක් ලාමක අකශුල ධර්ම හටගන්නාහුය. ඔහුගේ ඒ ලාමක ධර්මද දිරුවාහු වෙත්. හරි දැකීම හේතු කොටගෙණ වනාහි නොයෙක් කුශල ධර්ම වැඩීමෙන් සම්පූර්ණ බවට යන්නාහුය, හරි කල්පනාව ඇත්තහුගේ වැරදි කල්පනාව දිරා ගියේ වෙයි. වැරදි කල්පනාව හේතුකොටගෙණ යම් යම් නොයෙක් ලාමක අකුශල ධර්ම හටගන්නාහුද ඔහුගේ ඒ අකුශල ධර්මයෝ දිරුවාහු වෙත්. හරි කල්පනාව හේතුකොට ගෙණ නොයෙක් කුශල ධර්ම වැඩීමෙන් සම්පූර්ණ බවට යන්නාහු වෙත්. හරි වචන ඇත්තාහුගේ වැරදි වචන දිරා ගියේ වෙයි. වැරදි වචන හේතුකොට ගෙණ යම් යම් නොයෙක් ලාමක අකුශල ධර්ම හටගන්නාහුද ඔහුගේ ඒ අකුසල ධර්මද දිරා ගියේ වෙයි. හරි වචනය හේතුකොටගෙන නොයෙක් කුශල ධර්ම වැඩීමෙන් සම්පූර්ණ බවට යන්නාහුය. හරි කර්මාන්ත ඇත්තහුගේ වැරදි කර්මාන්තය දිරා ගියේ වෙයි. වැරදි කර්මාන්තය හේතුකොට ගෙණ යම් යම් නොයෙක් ලාමක අකුශල ධර්මයෝ හටගන්නාහු ඔහුගේ ඒ අකුශල ධර්ම දිරා ගියේ වෙයි. හරි කර්මාන්තය හේතුකොටගෙණ නොයෙක් කුශල ධර්මද වැඩීමෙන් සම්පූර්ණ බවට යන්නාහුය, හරි ජීවිකාවෘත්තිය ඇත්තහුගේ වැරදි ජීවිකා වෘත්තිය දිරාගියේ වෙයි. වැරදි ජීවිකා වෘත්තිය හේතුකොටගෙණ යම්යම් නොයෙක් ලාමක අකුශල ධර්ම හටගන්නාහුද ඔහුගේ ඒ අකුශල ධර්ම දිරා ගියේ වෙයි. හරි ජීවිකාවෘත්තිය හේතුකොටගෙන නොයෙක් කුශල ධර්ම වැඩීමෙන් සම්පූර්ණ බවට යන්නාහුය, හරි ව්‍යායාම ඇත්තහු

ගේ වැරදි ව්‍යායාමය දිරා ගියේ වෙයි වැරදි ව්‍යායාමය හේතු කොට ගෙණ යම් යම් නොයෙක් ලාමක අකුශල ධර්මයෝ හට ගන්නාහ. ඔහුගේ ඒ අකුශල ධර්මද දිරා ගියේ වෙයි. හරි ව්‍යායාමය හේතුකොටගෙණ බොහෝ කුශල ධර්ම වැඩීමෙන් සම්පූර්ණ බවට යන්නාහුය. හරි සිහිය ඇත්තහුගේ වැරදි සිහිය දිරා ගියේ වෙයි. වැරදි සිහිය හේතුකොටගෙණ යම්යම් නොයෙක් ලාමක අකුශල ධර්ම හටගනිත්. ඔහුගේ ඒ අකුශල ධර්මද දිරා ගියේ වෙයි හරි සිහිය හේතුකොටගෙන බොහෝ කුශල ධර්ම වැඩීමෙන් සම්පූර්ණ බවට යන්නාහුය. හරි හිතේ එකඟකම ඇත්තහුගේ වැරදි හිතේ එකඟකම දිරා ගියේ වෙයි. හරි හිතේ එකඟකම හේතුකොටගෙණ යම් යම් නොයෙක් ලාමක අකුශල ධර්ම හටගනිත්. ඔහුගේ ඒ අකුශල ධර්මද දිරා ගියේ වෙයි. හරි හිතේ එකඟකම හේතු කොටගෙන බොහෝවූ කුශල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණ බවට යන්නාහුය. හරි ඥානය ඇත්තහුගේ වැරදි ඥානය දිරා ගියේ වෙයි. වැරදි ඥානය හෙතුකොටගෙන යම් යම් නොයෙක් ලාමක අකුසල ධර්ම හටගනිත්. ඔහුගේ ඒ ලාමක අකුසල ධර්මද දිරාගියේ වෙයි. හරි ඥානය හෙතුකොට ගෙන බොහෝ කුසල ධර්ම වැඩීමෙන් සම්පූර්ණ වන්නාහුය. හරි මිදීම ඇත්තහුගේ වැරදි මිදීම දිරා ගියේ වෙයි වැරදි මිදීම හේතුකොටගෙන යම් යම් නොයෙක් ලාමක අකුශල ධර්ම හටගනිත්. ඔහුගේ ඒ අකුශල ධර්මද දිරා ගියාහු වෙත්. හරි මිදීම හේතුකොටගෙන බොහෝ කුශල ධර්ම වැඩීමෙන් සම්පූර්ණ බවට යන්නාහුය මේ ධර්ම දශය ඉතා හොඳ නුවණින් දතයුත්තාහුය.

"කවර නම් ධර්ම දශයක් ප්‍රත්‍යක්ෂ (තමාම දැකීම) කටයුතු වන්නාහුද? දශ අශෛක්ෂ ධර්ම (රහත්ඵලයට පැමිණ පුද්ගලයාගේ ධර්ම) යෝය. අශෛක්ෂවූ සම්‍යක්දෘෂ්ටිය, අශෛක්ෂවූ සම්‍යක් සංකල්පය, අශෛක්ෂවූ සම්‍යක් වචනය, අශෛක්ෂවූ සම්‍යක් කර්මාන්තය, අශෛක්ෂවූ සම්‍යක් ආජීවය, අශෛක්ෂවූ සම්‍යක් ව්‍යායාමය, අශෛක්ෂවූ සම්‍යක් ස්මෘතිය, අශෛක්ෂවූ සම්‍යක් සමාධිය, අශෛක්ෂවූ සම්‍යක් ඥාණය, අශෛක්ෂවූ සම්‍යක් විමුක්තිය යන මේ දසයයි.

"ඇවැත්නි, දන්නාවූ, දක්නාවූ, අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්මයෝ දසදෙන හොඳින් ප්‍රකාශ කරන ලද්දාහු වෙත්.

"මේ ධර්ම දශය ප්‍රත්‍යක්ෂ කටයුත්තාහුය. මෙසේ ඇත්තාවූ සත්‍යවූ එසේමවූ වෙනස් නොවන්නාවූ අන් පරිද්දකින් නොවන්නාවූ මේ සියයක් ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් මනාකොට අවබොධ කරන ලද්දාහුයයි වදාළේය. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මේ සූත්‍රය වදාළහ. සතුටු සිත් ඇති භික්ෂූන්වහන්සේලා ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ දේශනාවට විශෙෂයෙන් සතුටු වූවාහුය.

**තිස් හතර වැනිවූ දසුත්තර සූත්‍රය නිමි.**

**පාථික වර්ගයයි**

එහි උදානයයි (හෙවත් සූත්‍ර දැක්වීමයි.) පාථික සූත්‍රයද, උදුම්බරික සීහනාද සූත්‍රයද, චක්‍රවර්ති සීහනාද සූත්‍රයද, අග්ගඤ්ඤ සූත්‍රයද, සම්පසාදනීය සූත්‍රයද, පාසාදික සූත්‍රයද, ලක්ඛණ සූත්‍රයද, සිගාල සූත්‍රයද, ආටානාටිය සූත්‍රයද, සඞ්ගීති සූත්‍රයද, දසුත්තර සූත්‍රයද යන මේ එකොළොස් සූත්‍රයන්ගෙන් යුක්ත වූයේ පාථික වර්ගය යයි කියනු ලැබේ.

**(දීඝනිකාය නිමි.)**